


Scanned with CamScanner

# PERCY JACKSON AND THE
# TITAN'S CURSE

# පර්සි ජැක්සන්
# සහ
# ටයිටන්ගේ ශාපය

Scanned with CamScanner

පරිවර්තකගේ වෙනත් පරිවර්තන

- ඔලිම්පස්හි වීරයෝ I - අතරමං වූ වීරයා
- ඔලිම්පස්හි වීරයෝ II - නෙප්චූන්ගේ පුත්‍රයා
- පර්සි ජැක්සන් සහ අකුණු හොරා
- පර්සි ජැක්සන් සහ රාක්ෂ සයුර
- පර්සි ජැක්සන් උපදෙවි ලිපිගොනු
- පර්සි ජැක්සන් සහ වංගගිරියේ සටන
- පර්සි ජැක්සන් සහ අවසන් ඔලිම්පියානුවා
- සත්ගුණවත් සොරදෙටුවා
- අඟහරුවැසියා

PERCY JACKSON AND THE
# TITAN'S CURSE
Rick Riordan

# පර්සි ජැක්සන් සහ ටයිටන්ගේ ශාපය

පරිවර්තනය
සවින්දි ආරියතිලක

ආශිර්වාද

Scanned with CamScanner

# පර්සි ජැක්සන් සහ ටයිටන්ගේ ශාපය

පරිවර්තනය : සවින්දි ආරියතිලක

ISBN : 978-955-679-078-4

ආශිර්වාද ප්‍රකාශන
නො.70, ගිරිඋල්ල පාර, මීරිගම
දුරකථන : 033 2275419

© Rick Riordan

"Permission for this edition was arranged through the Gallt and Zacker LiteraryAgency LLC"

සියලුම හිමිකම් ඇවිරිණි.

The titan's curse නම් ග්‍රන්ථය සිංහල භාෂාවට පරිවර්තනය කර, මුද්‍රණය කර පළ කිරීම පිළිබඳ සම්පූර්ණ අයිතිය මීරිගම, ගිරිඋල්ල පාරේ, අංක 70 දරණ ස්ථානයේ ආශිර්වාද ප්‍රකාශන ආයතනය සතු වේ. ඇමරිකා එක්සත් ජනපදයේ Gallt and Zacker Literary Agency සමාගම ඇති කරගත් එකඟත්වය මත මෙම පරිවර්තනය සිදුකර ඇත. බුද්ධිමය දේපල පිළිබඳ ශ්‍රී ලංකා නීතිය (2003) සහ ජාත්‍යන්තර නීතිය (2002) යටතේ The titan's curse කෘතියේ වෙනත් සිංහල පරිවර්තනයක් ශ්‍රී ලංකාවේ පළ කිරීමට අයිතියක් නොමැත.

පරිගණක පිටු සැකසුම හා මුද්‍රණය
ආශිර්වාද ප්‍රින්ටර්ස්, 70, ගිරිඋල්ල පාර, මීරිගම.

## පරිවර්තිකාවගෙන්...

Myth Master නොහොත් මිත්‍යා කතා රජු ලෙස හඳුන්වන රික් රියෝඩන්ගේ සාර්ථකම නිර්මාණය වන පර්සි ජැක්සන් කතා මාලාවේ තුන්වෙනි පොත 'පර්සි ජැක්සන් සහ ටයිටන්ගේ ශාපය' නමින් පරිවර්තනය කර ඔබ වෙත ගෙන එන්නේ සතුටිනි.

පර්සි ජැක්සන් සහ අර්ධ-ලෝහිත කඳවුරේ කතා ඔබ වෙත ගෙන ඒමට ගිය ගමනේ දී මට උදවු කළ අය නොසිටින්න, මම ද රාක්ෂයින්ගේ ගොදුරක් වන්නට ඉඩ තිබිණ. මගේ ගමන ආරම්භයේ සිටම මට යෝධ ශක්තියක් වූ කසුන්ව සහ මා ලියන අකුරක් නැර කියවන නැගණිය ශිල්පාව ද, පුංචි කාලයේ පටන් පොත පත කියවීම මට හුරු කළ දෙමාපියන්වත් ආදරයෙන් සිහි කරමි. මේ ගමනට මඟ හසර කියා දුන් ලාල් ජයසුන්දර මහතාටත්, පර්සි ජැක්සන් කතා මාලාව ප්‍රකාශනය කිරීමට සතුටින් බාර ගත් ආශිර්වාද ප්‍රකාශන අධිපති චාමින් විජේරත්න මහතාට සහ මෙලනි අමරතුංග මහත්මියටත් හද පිරි ස්තුතිය පිරිනමමි.

සවින්දි ආරියතිලක
මැදගහවතුර
නාවලපිටිය

Scanned with CamScanner

# 01

# මුළුමනින්ම වැරදුණු මගේ ගලවාගැනීමේ මෙහෙයුම

ශීත ඍතුවේ නිවාඩුවට කලින් සිකුරාදා, රැයක් ගත කරන්න උවමනා දේවල් සහ මාරාන්තික ආයුධ ගමන් මල්ලකට ඇහිරූ මගේ අම්මා මාව අලුත් බෝඩිම් ඉස්කෝලෙකට රැගෙන ගියා. යන අතරමග දී අපි ඇනබෙත්ව සහ තාලියාව වාහනයට නංවා ගත්තා.

නිව්යෝක්වල සිට මයින්වල බාර් හාබර් දක්වා යාමට පැය අටක් ගත වුණා. හිම වැස්සක් අධිවේගී පාරට පහර දෙමින් තිබුණා. ඇනබෙත්, තාලියා සහ මම මාස ගාණකින් මුණ ගැසී තිබුණේ නැහැ. ඒත් මේ හිම කුණාටුව සහ අපි කරන්න සූදානමින් සිටි දේ ගැන සිතුවිල්ල නිසා වැඩිදුර කතා කරන්න බැරි තරමට අපි කලබල වෙලයි හිටියේ. හැබැයි ඒ මගේ අම්මා ඇරෙන්න. කලබල වුණ වෙලාවට එයා වැඩිපුර කරන්නේ තොරතෝංචියක් නැතිව කියවන එක. අන්තිමේ දී අපි වෙස්ටෝවර් හෝල් වෙත ළඟා වෙනකොට කළුවර වැටෙමින් තිබුණා, ඒ වගේම මම පුංචි කාලේ කරපු හැම ලැජ්ජා හිතෙන වැඩක් ගැනම එයා තාලියාටයි ඇනබෙත්ටයි කියලා තිබුණා.

කාරයේ ජනෙල් වීදුරුව මත බැඳුණු මීදුම පිස දමූ තාලියා පිටතට එබිකම් කළා. "ඔහ්, නියමයි, මේක නම් ජොලි වැඩක් වෙයි."

Scanned with CamScanner

වෙස්ටෝවර් හෝල් පෙනුණේ දුෂ්ට තයිටවරයෙකුගේ මාලිගාවක් වගෙයි. කළු ගලෙන් සාදා තිබුණු එයට කුලුනු, පටු ජනේල සහ ලොකු දෙපළ දොරක් තිබුණා. එක් පැත්තකින් මීදුණු විශාල වනාන්තරයටත්, අනෙක් පැත්තෙන් කැලඹෙන අළු පාට සාගරයටත් මායිම් වූ හිමෙන් වැසුණු ප්‍රපාතයක් මුදුනේ එය නැගී සිටියා.

"ඔයාලා එනකල් මම ඉන්න ඕනෑ නැහැ කියලා විශ්වාස ද?" මගේ අම්මා ඇසුවා.

"නෑ, එපා, අම්මේ," මම කිවුවා. "මේකට කොච්චර වෙලා යයි ද මම දන්නෑ. අපිට අවුලක් වෙන්නෙ නැහැ."

"ඒත් ඔයාලා ආපහු එන්නෙ කොහොමද? මම වද වෙන්නෙ ඒ ගැන, පර්සි."

මගේ මූණ රතු වෙන්න එපා කියලා මම ප්‍රාර්ථනා කළා. මගේ සටන්වලට මාව ගෙනියන්නත් අම්මාගෙන් උදවු ඉල්ලන්න වෙලා තියෙන එකම මදැයි.

"ඒකට කමක් නෑ, මිස් ජැක්සන්." ඇනබෙත් දිරිමත් කරන හිනාවක් පෑවා. එයාගේ තඹ කොණ්ඩය නමලා ස්කි කැප් එකක් ඇතුළේ රඳවා තිබුණා. එයාගේ අළු ඇස් සාගරයේ පාටට සමාන වුණා. "අපි එයාව කරදරවලින් ඈත් කරලා තියාගන්නම්."

එයින් මගේ අම්මා ටිකක් සැහැල්ලු වුණා වගෙයි. එයා හිතන විදිහට අට වසර සමත් වුණු, සිහි බුද්ධිය හොඳින් ම තියෙන උප දෙවියා තමයි ඇනබෙත්. එයා නිතරම මාව මැරෙන්න නොදී රැක ගන්න බවත් අම්මා විශ්වාස කළා. ඇත්තටම එයා හරි, ඒත් මමත් ඒකට කැමති වෙන්න ඕනෑ කියලා එයින් අදහස් වෙන්නෙ නැහැ නේ.

"හරි එහෙනම්, දරුවනේ," මගේ අම්මා කිවුවා. "ඔයාලට උවමනා හැමදේම ගත්ත ද?"

"ඔව්, මිස් ජැක්සන්," තාලියා කිවුවා. "අපිව ගෙනැත් ඇරලුවාට ස්තුතියි."

"වැඩිපුර ස්වෙටර්? ඔයාලා ළඟ මගේ සෙල් ෆෝන් අංකේ තියෙනවද?"

"අම්මේ-"

"ඔයාගේ ඇම්බ්‍රෝසියා යි නෙක්ටාරු යි, පර්සි? කඳවුරට කතා කරන්න ඕනෑ වුණොත් පාවිච්චි කරන්න රන් ඩ්‍රච්මා ගත්ත ද?"



"අම්මේ, ඇත්තටම! අපිට කරදරයක් වෙන්නෙ නැහැ. අපි දැන් යමු."

එයින් එයාගේ හිත ටිකක් රිදුණා වගෙයි. මම ඒ ගැන කණගාටු වුණා, ඒත් ඒ කාරයෙන් බහින්න මම සූදානම් වෙලයි හිටියේ. වයස අවුරුදු තුනේ දී මම නාන බේසමේ බැහැලා ඉන්නකොට කොච්චර හුරතල් ද කියලා මගේ අම්මා තව එක කතාවක් හරි කිවුවොත්, හිමේ වළක් හාරලා සීතලට ගල් වෙලා මැරෙනකල් වැලලිලා ඉන්න මම හිතාගෙනයි හිටියේ.

ඇනබෙත් සහ තාලියා මට පිටුපසින් එළියට බැස්සා. අයිස්වලින් සෑදුණු පිහි වගේ සුළඟ මගේ කබාය පසාරු කරගෙන හමා ගියා.

මගේ අම්මාගේ කාරය නොපෙනී ගියාම තාලියා කතා කළා. "ඔයාගේ අම්මා නම් හරිම ෂෝයි, පර්සි."

"එයා ඇත්තටම හොඳයි," මම පිළිගත්තා. "කොහොමද ඔයාගේ විස්තර? ඔයා ඔයාගේ අම්මට කතා කළා ද?"

ඒක කටින් පිට වූ හැටියේ ම, මම ඒක අහන්නේ නැතිව හිටියා නම් හොඳයි කියලා හිතුණා. නපුරු බැල්මෙන් රවා බලන්න තාලියාට හොඳ හැකියාවක් තිබුණා. එයා නිතර ඇඳපු රස්තියාදුකාර පෙනුම ඇති ඇඳුම්- ඒ කියන්නේ මැදින් පැළූ හමුදා ජැකට්, කළු ලෙදර් කලිසම් සහ දම්වැල් ආභරණ සමග කළු ඇස් ආලේපනවලින් හැඩ කළ නිල් පාට තියුණු ඇස් දෙකට ඒ බැල්ම ගොඩක් ඉස්මතු වුණා. ඒත් දැන් එයා මට හෙළුවේ තනිකරම යක්ෂ බැල්මක්.

"ඒකෙන් ඔයාට ඇති වැඩේ මොකක්ද, පර්සි-"

"අපි දැන් ඇතුළට ගියොත් හොඳයි," ඇනබෙත් මැදට පැන්නා. "ග්‍රෝවර් බලාගෙන ඇති."

මාලිගාව දිහා බැලූ තාලියා වෙවුලුවා. "ඔයා හරි. උදවු ඉල්ලලා කෝල් කරන්න මෙහෙදි එයා හොයා ගත්තේ මොනවද කියලයි මට පුදුම."

වෙස්ටෝවර් හෝල් ගොඩනැගිල්ලේ අඳුරු කුලුනු දිහා මම පුදුමයෙන් බලා සිටියා. "මොකක් වුණත් හොඳ දෙයක් නම් වෙන්න බැහැ," මම අනුමාන කළා.

***

Scanned with CamScanner

ඕක් දොර පළු කෙඳිරිගාමින් විවර වෙද්දී අපි තුන්දෙනා හිම කුණාටුවත් අරගෙනම ප්‍රවේශ ශාලාවට ඇතුළු වුණා.

මට කියාගන්න පුළුවන් වුණේ, "වාව්."

එතැන අති විශාලයි. එහි බිත්තිවල යුද කොඩි සහ ප්‍රදර්ශනයට තැබූ ආයුධ පෙළ ගසා තිබුණාඃ පෞරාණික රයිෆල්, යුද කෙටේරි සහ තවත් දේවල් පොකුරක්. මං කියන්නේ, වෙස්ටෝවර් යුද අභ්‍යාස පාසලක් බව මම දැන සිටියා, ඒත් මේ සැරසිලි නම් ඕනෑවට වඩා වැඩියි වගේ. හොඳටම වැඩියි.

මගේ අත සාක්කුවට, මගේ මාරාන්තික බෝල්පොයින්ට් පෑන, රිප්ටයිඩ් දමාගෙන සිටි තැනට ඇදුණා. මෙතැන මොකක් හෝ වරදක් ඇති බව මට දැනටමත් හැඟී තිබුණා. මොකක් හෝ අනතුරක්. තාලියා, එයාගේ ප්‍රියතම මායා භාණ්ඩය වූ රිදී බ්‍රේස්ලටය පිරිමදින්න ගත්තා. අපි දෙන්නම එකම දේ හිතන බව මට තේරුණා. සටනක් අත ළඟයි.

ඇනබෙත් කියන්න ගත්තා, "මට පුදුම කොහෙද-"

අපිට පිටුපසින් දොර මහ හඬක් නගමින් වැහුණා.

"හො-ඳායි," මම මිමිණුවා. "මට හිතෙන්නෙ අපිට ටික වෙලාවක් මෙහෙ ඉන්න වෙයි."

ශාලාවේ අනෙක් කෙළවරෙන් සංගීතය දෝංකාර දෙනවා මට ඇසුණා. ඇහුණු විදියට නම් ඒ නටන්න දාපු සංගීතයක් වගෙයි.

අපේ ආම්පන්න මලු කණුවක් පිටුපස සඟවා අපි ශාලාව ඇතුළට යන්න පටන් ගත්තා. වැඩි දුරක් යන්න කලින්ම මට ගල් පොළොවේ වදින පියවර හඬක් ඇසුණා, ඒත් එක්කම හෙවණැලි අතරින් ගමනේ ආ පිරිමියෙකු සහ ගැහැනියක් අපිට බාධා කළා.

අළු පාට කොණ්ඩා කොටට කපා සිටි ඒ දෙන්නා රතු වාටි ඇති හමුදා මෝස්තරයේ නිල ඇඳුම්වලින් සැරසී සිටියා. ගැහැනු කෙනාට සියුම් දැළි රැවුලක් තිබුණා, පිරිමියා රැවුල මුඩු කර සිටියා. ඒ දෙන්නා දරදඬු වෙලා ඇවිද්දේ හරියට එයාලගේ පිටකොඳුවලට කොසු මිටක් ගැට ගහලා වගෙයි.

"හොඳයි?" ගැහැනු කෙනා ප්‍රශ්න කළා. "ඔයාලා මොනවද මෙතැන කරන්නේ?"



"මේ..." මම මේ ගැන කලින් නොහිතුව බව මට සිහිවුණා. ග්‍රෝවර්ව හොයාගෙන, එයාගේ ප්‍රශ්නය මොකක්ද කියලා දැන ගැනීම ගැන තදින්ම හිතමින් සිටි නිසා ද කොහෙදෝ, රෑ මැද ඉස්කෝලෙකට හොරෙන් රිංගපු ළමයි තුන්දෙනෙක් ගැන කවුරුහරි ප්‍රශ්න කරන්න ඉඩ තියෙන බව මට සහමුලින්ම අමතක වෙලයි තිබුණේ. ඇතුළට යන විදිහ ගැන අපි කාරයේ දී කොහෙත්ම සාකච්ඡා කළේ නැහැ. "මැඩම්, අපි මේ-"

"හා!" පිරිමියා කඩා පනිද්දි මං උඩ ගියා. "නැටුමට අමුත්තන්ට එන්න අවසර නැහැ! ඔහේලව එළියට දානවා!"

එයාගේ උච්චාරණයේ ප්‍රංශ ඌරුවක් තිබුණ ද මන්දා. උස කෙනෙක් වූ එයාට තිබුණේ උකුසු පෙනුම ඇති මූණක්. එයා කතා කරද්දි නාස් පුඩු පිම්බුණා, ඒ නිසා එයාගේ නහය දිහාම නොබලා ඉන්න මට හරිම අමාරු වුණා. ඒ වගේම, එයාට තිබුණේ පාට දෙකක ඇස් දෙකක් - එකක් දුඹුරු, අනෙක නිල් - හරියට මුඩුක්කු පූසෙකුගේ වගෙයි.

එයා අපිව හිම ගොඩට විසි කරන්න සූදානම් වෙන බව මට තේරුණා, ඒත් ඒ වෙලාවේ ඉදිරියට ආව තාලියා හරිම අමුතු දෙයක් කළා.

එයා අසුරක් ගැසුවා. එයින් තියුණු හඬක් පිටවුණා. සමහරවිට ඒ මගේ හිතේ මැවුණු දෙයක් වෙන්න ඇති, ඒත් මට දැනුණේ එයාගේ අතෙන් රැළිති නැංවුණු සුළං පාරක් කාමරය පුරා පැතිරුණා වගෙයි. අපි හැම දෙනාගෙම දැවටුණු ඒ සුළඟින් බිත්තිවල වූ කොඩි සරසර හඬින් සෙලවුණා.

"ඔහ්, ඒත් අපි අමුත්තෝ නෙවෙයි, සර්," තාලියා කිවුවා. "අපිත් මේ ඉස්කෝලෙම අය. ඔයාට මතකයි නේඃ මම තාලියා, මේ ඇනබෙත්, පර්සි. අපි අට වසරේ."

ගුරුවරයා එයාගේ පාට දෙකේ ඇස් හීනි කර බැලුවා. තාලියා මොනවා හිතනවද මම දැන සිටියේ නැහැ. පෙනුණු හැටියට දැන් බොරු කිවුවට දඬුවම් කරලම අපිව එළියට විසි කරයි. ඒත් පිරිමි කෙනා පැකිළෙනවා වගෙයි පෙනුණේ.

එයා සහායිකාව දෙස බැලුවා. "මිස් ගොට්ස්චෝක්, ඔයා මේ ළමයින්ව දන්නව ද?"

අපි වැටී සිටි අනතුර පැත්තකින් තියලා, හිනාව නවත්වා ගන්න මට දිව හපාගන්න සිද්ධ වුණා. ගොට් චෝක් කියලා නමක් තියෙන ගුරුවරියක්? එයා විහිළු කරනවද කොහෙදෝ.

ගැහැනු කෙනා තදින් ඇහිපිය ගැසුවේ හරියට කවුරුහරි එයාව මෝහනයකින් මිදෙව්වා වගෙයි. "මම... ඔව්. මම හිතන්නේ මම දන්නවා, සර්." එයා අපිට රැව්වා. "ඇනබෙත්. තාලියා. පර්සි. ජිම් එකෙන් පිටට ඇවිත් ඔයාලා මොනවද කරන්නේ?"

අපි එයාට උත්තර බඳින්න කලින් තවත් අඩි සද්දයක් ඇසුණා, ඒත් එක්කම ග්‍රෝවර් හති දමමින් දුවගෙන ආවා. "ඔයාලා ඒක කළා! ඔයාලා ආවා-"

ගුරුවරු දකපු හැටියේ එයා නැවතුණා. "ඔහ්, මිසිස් ගොට්ස්චෝක්. ආචාර්ය තෝර්න්! මම,අහ්-"

"මොකද, මිස්ටර් අන්ඩර්වුඩ්?" පිරිමියා ඇසුවා. එයා ග්‍රෝවර්ව තුරුස්සන බව එයා කතා කළ හඬින්ම පැහැදිලි වුණා. "ඔයා මොකක්ද කියන්න හැදුවේ, 'එයාලා ඒක කළා?' මේ ළමයි මෙහෙ ඉන්න අයනේ."

ග්‍රෝවර් තදින් කෙළ ගිල්ලා. "ඔව්, සර්. ඇත්තටම ඔව්, ආචාර්ය තෝර්න්. මම කියන්න හැදුවේ, මට හරි සතුටුයි, එයාලා නැටුම තඟ්ගලා ගත්තා! ඒ පන්ච් එක නම් නියමයි. මෙයාලා තමයි ඒක කළේ!"

ආචාර්ය තෝර්න් අපි දිහා රවා බැලුවා. එයාගේ එක ඇහැක් බොරු එකක් විය යුතු බව මම තීරණය කළා. දුඹුරු පාට එක ද? නිල් පාට එක ද? එයා හිටියේ මාලිගාවේ උසම කුලුනෙන් පහළට අපිව විසි කරන්න හිතිලා වගෙයි, ඒත් ඒ වේලාවේ මිසිස් ගොට්ස්චෝක් හීනෙන් වගේ කතා කළා, "ඔව්, ඒ පන්ච් එක නම් නියමයි. දැන් දුවලා යන්න, නැමෝම. ආයේ එහෙම එළියට ඇවිත් අහුවෙන්නෑ!"

අපි දෙවරක් කියන තුරු බලා සිටියේ නැහැ. අපි "ඔව්, මැඩම්," සහ "ඔව්, සර්," ගොඩකුත් එක්ක සැලියුට් දෙකකුත් ගහලා එතැනින් දිවුවේ ඒ වෙලාවේ එහෙම කළොත් හොඳයි හිතුණ නිසයි.

ශාලාව කෙළවර සංගීත නාදය ඇසෙන දිහාවට ග්‍රෝවර් කඩිමුඩියේ අපිව කැඳවාගෙන ගියා.

ගුරුවරුන්ගේ බැල්ම මගේ පිටුපසින් වැටී ඇති බව දැනුණත්, මම තාලියාට ළං වෙලා පහත් හඬින් කතා කළා, "ඔයා කොහොමද ඒ අපූරු ගහන වැඩේ කළේ?"



"ඔයා අහන්නේ මීදුම ගැන ද? ඒක කරන විදිහ කයිරොන් ඔයාට තවම පෙන්නලා නැද්ද?"

අපහසුකාරී ගුළියක් මගේ උගුරේ හිර වෙනවා වගේ දැනුණා. කඳවුරේ අපේ ප්‍රධාන පුහුණු කරන්නා වුණේ කයිරොන්, ඒත් එයා කවදාවත් මට ඒ වගේ දෙයක් කියලා දීලා නැහැ. ඇයි එයා ඒක මට කියලා නොදී තාලියාට විතරක් ඉගැන්නුවේ?

වීදුරුව මත 'ජිම්' ලෙස සටහන් කළ දොරක් වෙතට ග්‍රෝවර් අපිව ගෙන ගියා. වචන අන්ධතාවය තිබුණත් මට ඒක කියවා ගන්න හැකි වුණා.

"තව පොඩ්ඩෙන් ඉවරයි!" ග්‍රෝවර් කිවුවා. "දෙවියන්ට ස්තූති වෙන්න ඔයාලා මෙහෙ ආවා!"

ඇනබෙතුයි තාලියායි දෙන්නම ග්‍රෝවර්ව වැලඳ ගත්තා. මම එයාට ලොකු පහක් දුම්මා.

මාස ගාණකට පස්සේ එයාව දකින්න ලැබුණු එක ලොකු සතුටක්. එයා ටිකක් උස ගිහින්, රැවුලත් ටිකක් වැවිලා. ඒත් ඒ ඇරෙන්න එයා ඉස්සර මනුස්සයෙක් විදිහට වෙස් වළාගත්තම හිටියා වගේමයි - එයාගේ දුඹුරු පාට කැරලි කොණ්ඩය අතරින් මතු වී ඇති එළු අං දෙක වසාගන්න රතු තොප්පියකුත්, ලොම් පිරුණ කකුල් සහ කුර වසා ගන්න ලිහිල් කලිසම් සහ ස්නීකර් සපත්තු ජෝඩුවකුත් එයා හැඳ පැළඳගෙන සිටියා. එයාගේ කළු ටී-ෂර්ට් එකේ වූ වැකිය කියවා ගන්න මට තත්පර කීපයක් ගියා. එහි තිබුණේ 'වෙස්ටෝවර් හෝල්: ග්‍රන්ට්' කියලා. ඒක ග්‍රෝවර්ට ලැබුණු පට්ටමක් ද නැත්නම් ඉස්කෝලේ ආදර්ශ පාඨය ද කියලා මට හිතාගන්න බැරි වුණා.

"ඉතින් මොකක්ද මේ කලබලේ?" මම ඇසුවා.

ග්‍රෝවර් ගැඹුරු හුස්මක් ගත්තා. "මම දෙන්නෙක්ව හොයා ගත්තා."

"අර්ධ-ලෝහිතයෝ දෙන්නෙක්?" තාලියා ඇසුවේ විස්මයට පත් වෙලයි. "මෙහෙ?"

ග්‍රෝවර් ඔළුව වැනුවා.

එක අර්ධ-ලෝහිතයෙක්ව හොයා ගන්න ලැබෙන එකම දුර්ලභ දෙයක්. මේ අවුරුද්දේ කයිරොන් සැටර්ලාව හදිසි අතිකාල සේවයට යොදවලා, රට පුරා ඉස්කෝලවල හතර වසරේ සිට උසස් පෙළ දක්වා

Scanned with CamScanner

පන්තිවල අලුත් කඳවුරුකරුවෝ විය හැකි අයව හොයන්න යෙදුවා. මේ ගෙවෙමින් තිබුණේ දුෂ්කර කාලයක්. අපිට, අපේ කඳවුරුකරුවෝ ටිකෙන් ටික නැති වුණා. අපිට හොයාගන්න හැකි සෑම අලුත් සටන්කරුවෙක්ම අපිට ඕනෑ කළා. ප්‍රශ්නයකට තිබුණේ ඒ තරම් උප-දෙවිවරු හොයාගන්න නැතිකමයි.

"සහෝදරයෙකුයි සහෝදරියෙකුයි," එයා කිවුවා. "එක් කෙනෙක්ට වයස අවුරුදු දහයයි, අනිත් කෙනාට දොළහයි. එයාලගේ අම්මා තාත්තා කවුද කියලා මම දන්නෑ, ඒත් එයාලා බලගතුයි. කොහොම වුණත් අපිට වැඩි කාලයක් නැහැ. මට උදවු ඕනෑ."

"රාක්ෂයෝ?"

"එකෙක්," ග්‍රෝවර් බය වෙලා වගෙයි. "එයාට සැකයි. මං හිතන්නේ එයාට තවම ඒක සහතික නැහැ, ඒත් මේ වාරේ අන්තිම දවස අද. මට විශ්වාසයි එයා ඒක හරියටම දැන ගන්නකල් එයාලට ඉස්කෝලෙන් පිට වෙන්න දෙන්නෙ නැති වෙයි. සමහරවිට මේක අපේ අන්තිම අවස්ථාව වෙන්න පුළුවන්! මම එයාලට කිට්ටු වෙන්න බලන හැම වෙලාවකම එයා එතැනට ඇවිත් මාව නවත්තනවා. මං දන්නෑ මොනවා කරන්න ද කියලා!"

ග්‍රෝවර් උපදෙස් පතන බැල්මෙන් තාලියා දිහා බැලුවා. ඒ ගැන අහිතක් නොහිතා ඉන්න මම උත්සාහ කළා. ඉස්සර නම් ග්‍රෝවර් උපදෙස් ගන්න බැලුවේ මගේ දිහාවයි. ඒත් තාලියාට ජ්‍යෙෂ්ඨත්වය තිබුණා. ඒ එයාගේ තාත්තා සියුස් නිසා විතරක්ම නෙවෙයි. සැබෑ ලෝකයේ රාක්ෂයින් සමග සටන් කිරීම ගැන තාලියාට අපි කාටත් වඩා අද්දැකීම් තිබුණා.

"හරි," එයා කිවුවා. "මේ අර්ධ-ලෝහිතයෝ දෙන්නා ඉන්නෙ නැටුමෙ ද?"

ග්‍රෝවර් ඔළුව වැනුවා.

"එහෙනම් අපිත් නටමු," තාලියා කිවුවා. "කවුද රාක්ෂයා?"

"ඔහ්," ග්‍රෝවර් කිවුවේ කලබලෙන් වටපිට බලමින්. "ඔයාලට මේ දැන් එයාව මුණ ගැහුණා. උප විදුහල්පති, ආචාර්ය තෝර්න්."

★★★

හමුදා පාසල්වල තිබුණ අමුතුම දේ තමයි: විශේෂ උත්සවයක් තියෙන වෙලාවට එයාලා සම්පූර්ණයෙන් පිස්සු නටන්න පටන් ගන්නවා. මං හිතන්නේ ඒකට හේතුව වෙන්න ඇත්තේ ඉතිරි කාලය පුරාවට කිසිම බුරුලක් නොලැබෙන නිසා ඒවාට හිලව් වෙන්නත් එක්කම පිස්සු නටන්න ඕනෑ කියලා එයාලා හිතන නිසා වෙන්න ඇති.



ව්‍යායාම ශාලාවේ පොළොව පුරා කළු සහ රතු පාට බැලූන් විසිරී තිබුණා. කොල්ලෝ ඒවා එකිනෙකාගේ මුහුණුවලට පයින් ගසා ගනිමින් හෝ බිත්ති සරසා තිබුණු ක්‍රේප් පටිවලින් එකිනෙකාගේ බෙලි හිර කරගන්න දඟලමින් සිටියා. කෙල්ලෝ හැම වෙලාවෙම කරන විදියට මේක්-අප් ගොඩාක් දමාගෙන, ස්පැගටි-ස්ට්‍රැප් ඇඳුම් සහ දිප්තිමත් පාටවල කලිසම් හැඳගෙන, වධක උපකරණවල පෙනුම ඇති සපත්තු පැලඳගෙන සිටියා. ඉඳහිට සැරයක් පිරන්හා මාළු රැනක් වගේ එයාලා යටිගිරියෙන් කෑගහමින්, මුකුළු කරමින් අසරණ කොල්ලෙක්ව වට කරගත්තා. ටිකකින් එයාලා එතැනින් ඉවත් වෙද්දි අර කොල්ලගේ කොණ්ඩෙ රිබන් ගැට ගහලා, මූණ පුරා ලිප්ස්ටික්වලින් කුරුටුබලි ඇඳලා තියෙනවා දකින්න ලැබුණා. සමහර ලොකු කොල්ලෝ හිටියේ මම වගෙයි- අපහසුවෙන්, ව්‍යායාම ශාලාවේ අහුමුළුවල හැංගෙන්න උත්සාහ කරමින් එයාලා හිටියේ ඕනෑම විනාඩියක ජීවිතය බේරාගන්න සටන් කරන්න සිද්ධ වෙයි වගෙයි. ඇත්ත වශයෙන්ම, මගේ පැත්තෙන් බලනවා නම්, ඒක එහෙමයි...

"අර ඉන්නෙ එයාලා." ක්‍රීඩා තරග නරඹන්නන් වෙනුවෙන් සෑදූ පඩිපෙළේ වාඩිවෙලා වාද කරමින් සිටි ළමයි දෙන්නෙක්ව ඔළුවෙන් පෙන්වමින් ග්‍රෝවර් කිවුවා. "බියන්කා සහ නිකෝ ඩි ආන්ජෙලෝ."

ගැහැනු ළමයා පළල් වාටියක් ඇති කොළ පාට තොප්පියක් පැලඳගෙන සිටියේ මූණ හංග ගන්න උවමනාවෙන් වගෙයි. පිරිමි ළමයා එයාගේ මල්ලි බව පැහැදිලිවම පෙනුණා. ඒ දෙන්නටම කළු, සිනිඳු කොණ්ඩා සහ ඔලිව් පාට හමක් තිබුණා. ඒ දෙන්නා කතා කරේ අත් කකුල් ගොඩක් එහෙ මෙහෙ විසි කරමින්. පිරිමි ළමයා මොකක්දෝ කාඩ් කුට්ටමක් අනමින් සිටියා. එයාගේ අක්කා මොකක්හරි දේකට එයාට බණින බව පෙනුණා. එයා සැරින් සැරේ වටපිට බැලුවේ යම්කිසි වරදක් ඇති බව එයාට දැනිලා වගෙයි.

ඇනබෙත් කතා කළා, "එයාලා දන්නව ද... මං අහන්න ගියේ, ඔයා එයාලට කියල ද තියෙන්නේ?"

ග්‍රෝවර් ඔළුව හෙල්ලුවා. "ඔයා දන්නවා නේ ඒක කොහොමද කියලා. එහෙම කළොත් එයාලා තවත් අනතුරේ වැටෙන්න ඉඩ

තියෙනවා. තමන් කවුද කියලා එයාලා තේරුම් ගත්තම එයාලගේ ඉව තවත් බලවත් වෙනවා."

එයා මගේ දිහා බලද්දී මම ඔළුව වැනුවා. අර්ධ-ලෝහිතයන්ගේ 'ඉව' රාක්ෂයින්ට හෝ සැටර්ලාට දැනෙන්නේ කොහොමද කියලා මට කවදාවත් හරියටම තේරුණේ නැහැ, ඒත් අපේ ඉව අපිට මරු කැඳවන්න ඉඩ ඇති බව මම දැන සිටියා. ඒ වගේම ඔයා බලවත් උප-දෙවියෙක් වෙන තරමට, ඔයා රාක්ෂයෙක්ගේ දවල් කෑම වගේ සුවඳ ගහන එකත් වැඩි වෙනවා.

"එහෙනම් ඉතින් අපි එයාලවත් ඇදගෙන මෙතැනින් එළියට පැන ගමු," මම කිව්වා.

මම ඉදිරියට යන්න පටන් ගත්තත් තාලියා මගේ උරහිස උඩින් අතක් තැබුවා. උප විදුහල්පති, ආචාර්ය තෝර්න් නරඹන්නන්ගේ ආසන ළඟම වූ දොරකින් රිංගා ඇවිත් ඩි ආන්ජෙලෝ ජෝඩුව ළඟින්ම සිට ගත්තා. එයා අපේ පැත්තට නොසැලකිලිමත් ලෙසින් ඔළුව වැනුවා. එයාගේ නිල් පාට ඇහැ දිලිසෙනවා වගෙයි පෙනුණේ.

එයාගේ මුහුණේ වූ බැල්ම දකිද්දී මට හිතුණේ තාලියා මීදුමෙන් කළ උප්පරවැට්ටියට එයා කොහෙත්ම අහුවෙලා නැහැ කියලයි. අපි කවුද කියලා එයා සැක කළා. එයා බලා සිටියේ අපි මෙහෙට ආවේ ඇයි කියලා දැනගන්නයි.

"ළමයි දෙන්නා දිහා බලන්න එපා," තාලියා නියෝග කළා. "එයාලව ගන්න හොඳ වෙලාවක් එනකල් අපිට ඉන්න වෙනවා. අපිට එයාලා ගැන උනන්දුවක් නැහැ කියලා බොරුවට අඟවන්න වෙනවා. එයාව ඉව පාරෙන් අහකට හරවමු."

"කොහොමද?"

"අපි තුන්දෙනා බලවත්ම අර්ධ-ලෝහිතයෝ. අපි ළඟපාතක ඉන්නකොට එයාව අවුල් වෙයි. සෙනඟ අතරට කලවම් වෙන්න. සාමාන්‍ය විදිහට හැසිරෙන්න. ටිකක් නටන්න. හැබැයි ළමයි දෙන්නා ගැන ඇහැ ගහගෙන ඉන්න."

"නටන්න?" ඇනබෙත් ඇසුවා.

තාලියා ඔළුව වැනුවා. සංගීතයට කන් යොමු කළ එයා මූණ ඇද කළා. "අග්ග්... මොකාද ජෙස් මැකාර්ට්නිව තේරුවේ?"

ග්‍රෝවර් හිත රිදුණු බැල්මෙන් බැලුවා. "මම."



"ඔහ් මගෙ දෙයියනේ, ග්‍රෝවර්. ඒක මහ ජරාවක් නේ. ඔයාට බැරි වුණා ද ග්‍රීන් ඩේ වගේ කෙනෙක්ගේ සිංදු දාන්න."

"ග්‍රීන් මොකාද?"

"කමක් නෑ. අපි නටමු."

"ඒත් මට නටන්න බෑ නේ!"

"මාත් එක්ක ගියාම පුළුවන් වෙයි," තාලියා කිව්වා. "මෙහෙ එනවා, එළු කොල්ලෝ."

ග්‍රෝවර් කෑගහද්දී තාලියා එයාගේ අතින් ඇදගෙන නටන සෙනග අතරට ගියා.

ඇනබෙත් හිනාවුණා.

"මොකද?" මම ඇසුවා.

"මුකුත් නෑ. තාලියා ආපහු ආව එක ෂෝක්."

ගිය ගිම්හානෙන් පස්සෙ ඇනබෙත් මටත් වඩා උස ගිහින්, ඒක නම් මගේ හිතට කරදරයක් වුණා. ඉස්සර නම් එයා අර්ධ-ලෝහිත කඳවුරු මාලය ඇරෙන්න වෙන කිසිම ආභරණයක් පැලඳුවේ නැහැ, ඒත් දැන් එයා එයාගේ අම්මා, ඇතීනාගේ සංකේතය - බකමූණු හැඩය ගත් කරාබු ජෝඩුවක් දමාගෙන සිටියා. එයා ස්කී කැප් එක ගලවද්දී එයාගේ දිගු තඹ කොණ්ඩය උරහිස්වලින් පහළට කඩා හැලුණා. මොකක්දෝ හේතුවකට එයින් එයාට වැඩිමහලු පෙනුමක් ලැබුණා.

"ඉතින්..." මම කියන්න දෙයක් කල්පනා කළා. තාලියා කිවුවේ අපිට සාමාන්‍ය විදිහට හැසිරෙන්න කියලයි. ඒත් ඔයා අර්ධ-ලෝහිතයෙක් වෙලා, අනතුරුදායක මෙහෙයුමක යෙදිලා ඉන්නකොට සාමාන්‍ය වෙන්නේ මොනවද? "මේ, ළඟදි හොඳ ගොඩනැගිල්ලක් එහෙම සැලසුම් කළේ නැද්ද?"

ගෘහනිර්මාණ ශිල්පය ගැන කතා කරන හැම වෙලාවකම වෙනවා වගේ ඇනබෙත්ගේ ඇස් දෙක දැල්වුණා. "ඔහ්. මගේ දෙයියනේ. පර්සි. මගේ අලුත් ඉස්කෝලෙ දි මම තෝරාගත් විෂයක් විදිහට ත්‍රිමාන සැලසුම්කරණය ගත්තා. ඒකේ ෂෝක් කම්පියුටර් ප්‍රෝග්‍රෑම් එකක් තියෙනවා..."

මැන්හැටන් නගරය මැද එයාට ඉදි කරන්න උවමනා යෝධ ස්මාරකය නිර්මාණය කළ හැටි එයා විස්තර කරන්න ගත්තා. එහි ව්‍යූහ

Scanned with CamScanner

දේවල් ගැන එයා කියවද්දි ආධාරක, ගොඩනැගිල්ලේ මුහුණත් වගේ දේවල් ගැන එයා කියවද්දි මම ඒවට ඇහුම්කන් දෙන්න උත්සාහ කළා. ලොකු වුණාම සුපිරි ගොඩනැගිලි නිර්මාණ ශිල්පියෙක් වෙන්න එයාට උවමනා බව මම දැන සිටියා - එයා වැඩිපුරම කැමති ගණිතය සහ ඓතිහාසික ගොඩනැගිලි වගේ දේවල්වලටයි - ඒත් මට එයා කියපු එක වචනයක්වත් තේරුණේ නම් නැහැ.

ඇත්තම කියනවා නම්, අලුත් ඉස්කෝලෙට එයා ඒ තරම් කැමති බව දැනගත්තාම මගේ බලාපොරොත්තු කඩා වැටුණා. එයා නිව්යෝර්ක්වල ඉස්කෝලෙකට යන්න පටන් ගත්තේ පළවෙනි වතාවටයි. ඉතින් එයාව නිතර මුණ ගැහෙන්න මම බලාපොරොත්තුවෙන් හිටියා. ඒක බෲක්ලින්වල ඇති බෝඩිම් ඉස්කෝලයක් නිසා එයයි තාලියායි දෙන්නම ඒකට බැඳුණේ, එයාලා කරදරේක වැටුනොත් කයිරොන්ට උදවු කරන්න එන්න පුළුවන් තරම් දුරකින් අර්ධ-ලෝහිත කඳවුර තිබුණ නිසයි. ඒක බාලිකා පාසලක් වූ නිසා මට එයාලව දකින්න ලැබුණේම නැති තරම්.

"ඔව්, අහ්, මරු නේ," මම කිවුවා. "එතකොට ඔයා අවුරුද්දේ ඉතුරු ටිකත් නවතිනව ද, අහ්?"

එයාගේ මූණ අඳුරු වුණා. "හොඳයි, සමහරවිට. මට බැරිවුණොත්-"

"හේයි!" තාලියා අපිට කතා කළා. එයා එක්ක නටමින් සිටි ග්‍රෝවර් පැටලී වැටෙමින්, තාලියාගේ කකුල්වලට පයින් ගහමින් හිටියේ මැරෙන්න හිතිලා වගෙයි. අඩු තරමේ එයා බොරු කකුල් දාගෙන හිටිය නිසා එහෙම නටන්න එයාට නිදහසට කාරණයක්වත් තිබුණා. මට එහෙම එකක්වත් නැහැ නේ.

"ඔයාලත් නටන්නකෝ!" තාලියා නියෝග කළා. "ඔහොම බකං නිලාගෙන ඉන්නකොට මෝඩයෝ වගෙයි."

මම කලබලෙන් ඇනබෙත් දිහාවත්, ඊට පස්සේ ව්‍යායාම ශාලාව පුරා කරක් ගහන ගෑනු ළමයින් දිහාවත් බැලුවා.

"හොඳයි?" ඇනබෙත් ඇසුවා.

"මේ, මම කාටද නටන්න කතා කරන්නේ?"

එයා මගේ බඩට ගැහුවා. "මට, පාසි මොළේ."

"ඕහ්. හරි, හරි."



ඉතින් අපි දෙන්නත් නටන්න ගියා. ග්‍රෝවර් සහ තාලියා නටන හැටි මම විපරම් කර බැලුවා. මම එක අතක් ඇනබෙත්ගේ උකුල උඩින් තියාගත්තා, එයා මගේ අනෙක් අත අල්ලගත්තේ හරියට ජූඩෝ පාරකින් මාව බිම දාන්න වගෙයි.

"මම ඔයාව හපන්නෙ නෑ අනේ," එයා කිවුවා. "ඇත්තටම, පර්සි. ඔයාලගෙ ඉස්කෝලෙ නැටුම් උත්සව තිබිලම නැද්ද?"

මම ඒකට උත්තර දුන්නෙ නැහැ. ඇත්තම කියනවා නම් අපේ ඉස්කෝලෙත් ඒවා තිබුණා. ඒත් මම කවදාවත් නටලා නම් නැහැ. සාමාන්‍යයෙන් මමත් මුල්ලකට වෙලා පැසිපන්දු සෙල්ලම් කරන ළමයින්ගෙන් කෙනෙක්.

අපි මිනිත්තු කීපයක් කකුල් අද්දමින් හිටියා. මම පුංචි පුංචි දේවල්වලට අවධානය යොමු කරන්න උත්සාහ කළා, හරියට, ක්‍රේප් පටි සැරසිලි සහ පන්ච් භාජනේ වගේ - ඇනබෙත් මට වඩා උසයි කියන කාරණය, මගේ අත්ලට දාඩිය දාලා ලිස්සන එක සහ මම දිගින් දිගටම එයාගේ කකුල පාගන එක ගැන ඇර වෙන ඕනෑම දේකට මම හිත යොමු කළා.

"ඉස්සර වෙලා ඔයා මොකක්ද කියකියා හිටියේ?" මම ඇහුවා. "ඔයාට ඉස්කෝලේ මොකක්හරි ප්‍රශ්නයක් ද?"

එයා තොල් දෙක තදින් පියවා ගත්තා. "එහෙම එකක් නෙවෙයි. මගේ තාත්තා ගැන."

"අහ්-ඔහ්," ඇනබෙත් සහ එයාගේ තාත්තා අතරේ හොඳ සම්බන්ධයක් නැති බව මම දැන සිටියා. "මං හිතුවේ ඔයාලා දෙන්නා දැන් සමාදාන වෙලා ඇති කියලා. ආයෙමත් ඔයාගේ කුඩම්මා ප්‍රශ්න ඇති කරනව ද?"

ඇනබෙත් සුසුමක් හෙළුවා. "එයා මෙහෙන් යන්න තීරණය කරලා. මම නිව්යෝර්ක්වලට හුරු වෙන්න ගත්තා විතරයි, එයා මේ පළවෙනි ලෝක යුද්ධය ගැන පොතකට කරුණු ගවේෂණය කරන මෝඩ රස්සාවක් බාරගෙන. සැන් ෆ්‍රැන්සිස්කෝවල!"

එයා ඒක කිවුවේ හරියට පාතාල ලෝකයේ වධක භූමිය ගැන, නැත්නම් හේඩීස්ගේ කොට කලිසම් ගැන කියනවා වගෙයි.

"එතකොට එයා ඔයාවත් අරන් යන්න හදනව ද?" මම ඇසුවා.

Scanned with CamScanner

"රටේ අනිත් කෙළවරට," එයා මූසල හඬින් කිවුවා. "අර්ධ-ලෝහිතයන්ට සැන් ෆ්‍රැන්සිස්කෝවල ජීවත් වෙන්න බැහැ. එයා ඒක දැනගෙන ඉන්න ඕනෑ."

"මොකක්? ඇයි බැරි?"

ඇනබෙත් ඇස් කැරකුවා. සමහරවිට, මම විහිළු කරනවා කියලා එයා හිතන්න ඇති. "ඔයා දන්නවා නේ, ඒක එතැනමයි තියෙන්නේ!"

"ඔහ්," මම කිවුවා. එයා මොනවා කියනවද මට කිසිම අදහසක් තිබුණෙ නැහැ, ඒත් මට මෝඩයෙක් වගේ කතා කරන්න ඕනෑ වුණේ නැහැ.

"එතකොට... ඔයා ආපහු කඳවුරේ නවතින්න යනවද, නැත්නම්?"

"ඒක ඊට වඩා බරපතළ දෙයක්, පර්සි. මං... මං හිතන්නෙ මම ඔයාට දෙයක් කියන්න ඕනෑ." එක පාරටම එයා ගල් ගැහුණා. "එයාලා ගිහින්."

"මොනවා?"

මම එයාගේ බැල්ම ලුහුබැන්දා. නරඹන්නන්ගේ ආසනවල අර්ධ-ලෝහිත ළමයි දෙන්නා, බියන්කා සහ නිකෝ තවදුරටත් සිටියේ නැහැ. ඒ අසලම වූ දොර මුළුමනින්ම ඇර දමා තිබුණා. ආචාර්ය තෝර්න් පේන්න හිටියෙත් නැහැ.

"අපි තාලියාවයි ග්‍රෝවර්වයි හොයාගන්න ඕනෑ!" ඇනබෙත් පිස්සුවෙන් වගේ වටපිට බැලුවා..

"ඔහ්, මේ දෙන්නා නටනටා ඉඳලා කොහෙට අතුරුදහන් වුණා ද? ඉක්මනට එන්න!"

එයා සෙනඟ අතරින් දිවුවා. මම එයා පසුපසින් යන්න සූදානම් වෙද්දිම ගෑනු ළමයි රංචුවක් මගේ පාර මැදට ආවා. මම එයාලගේ රිබන් සහ ලිප්ස්ටික් සත්කාරය මග අරින්න වෙන පැත්තකට හැරුණා. මට එතැනින් ගැලවෙන්න ලැබෙද්දි ඇනබෙත් අතුරුදහන් වෙලා. තාලියාව සහ ග්‍රෝවර්ව සොයමින් මම රවුමක් කැරකුණා. ඒත් ඒ වෙනුවට දකින්න ලැබුණු දෙයින් මගේ ඇඟේ ලේ වතුර වුණා.

අඩි පනහක් විතර දුරින් බිම වැටී තිබුණේ බියන්කා ඩි ආන්ජෙලෝ පැලඳගෙන සිටි තොප්පිය වගේම කොළ පාට



තොප්පියක්. ඒ අසලම කාඩ් කීපයකුත් විසිරී තිබුණා. ඒත් එක්කම ආචාර්ය තෝර්න්ව යාන්තමින් මගේ ඇස ගැටුණා. එයා ව්‍යායාම ශාලාවේ විරුද්ධ පැත්තේ දොරෙන් කඩිමුඩියේ පිට වෙමින් සිටියේ ඩි ආන්ජෙලෝ ළමයි දෙන්නව පූස් පැටව් දෙන්නෙක් වගේ කර මුලින් අල්ලාගෙනයි.

මට තවමත් ඇනබෙත්ව දැකගන්න බැරි වුණා, ඒත් එයා තාලියාව සහ ග්‍රෝවර්ව සොයමින් අනෙක් පැත්තට යන්න ඇති බව මම දැන සිටියා.

මමත් එයා පස්සෙ දුවන්නයි සූදානම් වුණේ. ඒත් ඒ වෙලාවේ මට තවත් සිතුවිල්ලක් ආවා, *පොඩ්ඩක් ඉන්න.*

ප්‍රවේශ ශාලාවේ දි තාලියා අසුරකින් කළ විජ්ජාව ගැන ඇහුවාම අන්දබූත වෙලා වගේ මගේ දිහා බලපු එයා දුන්න උත්තරය මට මතක් වුණා: *'ඒක කරන විදිහ කයිරොන් තවම ඔයාට පෙන්නලා නැද්ද?'* දවස බේරගන්න ආව වීරයා දිහා බලනවා වගේ ග්‍රෝවර් තාලියා දිහාවට හැරුණ හැටිත් මට මතක් වුණා.

මම තාලියාව නොරිස්සුවා නෙවෙයි. එයා ඇත්තටම හොඳයි. එයාගේ තාත්තා සියුස් වුණ නිසා එයාට හැමදෙනාගේම සැලකිලි ලැබෙන එක එයාගේ වරදක් නෙවෙයි... ඒ වුණත්, හැම ප්‍රශ්නයක්ම විසඳා ගන්න එයාගේ පස්සෙන් දුවන්න මට ඕනෑ වුණේ නැහැ. ඇරත්, එතැන වැඩි වෙලාවක් තිබුණෙත් නැහැ. ඩි ආන්ජෙලෝ ලා අනතුරක වැටිලා. මම මගේ යාළුවෝ හොයා ගනිද්දි එයාලා අල්ලන්න බැරි තරම් දුර ගිහින් ඉදීවි. මම රාක්ෂයෝ ගැන දැන සිටියා. මට මේක තනියම හසුරුවා ගන්න පුළුවන්.

සාක්කුවෙන් රිප්ටයිඩ් එළියට අරගත් මම ආචාර්ය තෝර්න් පසුපස දිවුවා.

★★★

ඒ දොර ඇරුණේ අඳුරු කොරිඩෝවකටයි. මට පොර බදන හඬකුත්, ඉන්පසුව වේදනාවෙන් කළ ගෙරවුමකුත් ඇසුණා. මම රිප්ටයිඩ්ගේ කොපුව ගැලෙව්වා.

පෑන අඩි තුනක් දිග, ලෙදර් මිටක් ඇති ලෝකඩ ග්‍රීක කඩුවකට හැරෙන තුරු මම එය අල්ලාගෙන සිටියා. යාන්තමින් දිලිසුණු කඩු තලයෙන් නිකුත් වූ රන්වන් එළිය ලොකර් පේළියක් මතට වැටුණා.

Scanned with CamScanner

මම කොරිඩෝව පහළට හෙමින් දිවුවා, ඒත් මම අනෙක් කෙළවරට ළඟා වුණාම එතැන කිසිවෙක් සිටියේ නැහැ. දොරක් ඇර බැලූ මට දකින්න ලැබුණේ මම ආයෙමත් ප්‍රධාන පිවිසුම් ශාලාවට ඇවිත් සිටින බවයි. මම සම්පූර්ණ රවුමක් හැරුණා. මට කොතැනකවත් ආචාර්ය තෝර්න්ව දකින්න ලැබුණේ නැතත්, කාමරයේ අනෙක් කෙළවරේ ඩි ආන්ජෙලෝ ළමයි දෙන්නා සිටියා. බයෙන් ගල් ගැහිලා ඒ දෙන්නා කෙලින්ම බලාගෙන හිටියේ මගේ දිහාවයි.

මම කඩු තුඩ පහත හෙළමින් හෙමින් සීරුවේ ඉදිරියට ගියා. "බය වෙන්න එපා. මම ඔයාලට කරදරයක් කරන්නෙ නෑ."

එයාලා උත්තර දුන්නේ නැහැ. එයාලගේ ඇස් භීතියෙන් පිරී තිබුණා. මොකක්ද එයාලගේ ප්‍රශ්නේ? ආචාර්ය තෝර්න් කොහෙද? සමහරවිට රිප්ටයිඩ් තියෙනවා දැනිලා එයා පනු බහින්න ඇති. දිව්‍යමය ලෝකඩ ආයුධ රාක්ෂයින්ට පෙනෙන්න බැහැ.

"මගේ නම පර්සි," කටහඬ පාලනය කරගන්න උත්සාහ කරමින් මම කිවුවා. "මම ඔයාලව මෙතැනින් අරන් යන්නයි හදන්නේ, පරිස්සම් තැනකට."

බියන්කාගේ ඇස් ලොකු වුණා. එයාගේ අත් මිට මෙළවුණා. එයාගේ බැල්ම ඇඟවූ දේ මම තේරුම් ගනිද්දි පරක්කු වැඩියි. එයා හිටියේ මට බය වෙලා නෙවෙයි. එයා උත්සාහ කළේ මට අනතුරු අඟවන්නයි.

මම වේගයෙන් හැරෙද්දිම මොකක්දෝ වුෂ්! හඬින් ඇදී ආවා. මගේ උරහිස වේදනාවෙන් පුපුරා හැළුණා. යෝධ අතක් වගේ බලයකින් මාව පසුපසට ගස්සා ඔසවා බිත්තියේ හැප්පුවා.

කෲර හිනාවක් ශාලාව පුරා දෝංකාර දුන්නා.

"ඔව්, පර්සියස් ජැක්සන්," ආචාර්ය තෝර්න් කිවුවා. එයාගේ උච්චාරණය මගේ වාසගමේ 'ජ' අකුර තලු ගැසුවා. "ඔහේ කවුද කියලා මම දන්නවා."

මම, මගේ උරහිස ගලවා ගන්න දැඟලුවා. මගේ කබාය සහ කමිසය මොකක්දෝ උලකින් බිත්තියට ඇමිණී තිබුණා - අඩියක් විතර දිග, විසි කළ හැකි කළු කිණිස්සක්. එය මගේ ඇඳුම් අතරින් යද්දි උරහිසේ හම කපාගෙන ගොස් තිබුණා. ඒ කැපුම පිච්චෙනවා



වගෙයි දැනුණේ. මේ වගේ දෙයක් මීට කලිනුත් මම අත්විඳ තිබුණා. විෂ.

හිත ඒකාග්‍ර කරගන්න මම, මටම බල කළා. මම සිහිය නැති කරගන්නෙ නැහැ.

දත් අඳුරු සේයාවක් අපි ඉදිරියට එමින් තිබුණා. ආචාර්ය තෝර්න් මඳ ආලෝකයට අඩිය තැබුවා. එයා තවමත් මනුස්සයෙක් වගේ හිටියත් එයාගේ මුහුණ භූත පෙනුමක් ගත්තා. එයාට කිසිම අඩුපාඩුවක් නැති දත් දෙපළක් තිබුණා, එයාගේ දුඹුරු/නිල් ඇස්වලින් මගේ කඩුවේ එළිය පරාවර්තනය වුණා.

"ජිම් එකෙන් එළියට ආවට ස්තුතියි," එයා කිවුවා. "මට මධ්‍යම පාසල් නැටුම් පෙනෙන්න බැහැ."

මම නැවතත් මගේ කඩුව වනන්න උත්සාහ කළා, ඒත් එයා හිටියේ කඩුව වදින මානයෙන් එපිටයි.

වුෂ්! ආචාර්ය තෝර්න්ට පිටුපස කොතැනකින්දෝ දෙවෙනි කිණිස්සත් විදුණා. ඒත් එයා සෙලවුණු බවක් පෙනුණේ නැහැ. ඒක හරියට අදෘශ්‍යමාන කෙනෙක් එයාට පිටුපසින් හිටගෙන පිහි විසිකරනවා වගෙයි.

මට එහා පැත්තේ සිටි බියන්කා කෑගැසුවා. දෙවෙනි උල එයාගේ මූණෙන් අඟල් බාගයක් දුරින් ගල් බිත්තිය තුළට කිඳා බැස තිබුණා.

"ඔහේලා තුන්දෙනාම මාත් එක්ක එනවා," ආචාර්ය තෝර්න් කිවුවා. "නිශ්ශබ්දව. කීකරුව. එක පුංචි සද්දයක් හරි කළොත්, උදවු ඉල්ලලා කෑගහන්න හරි පොර බදන්න හරි ලෑස්ති වුණොත්, මට කොච්චර හොඳින් ඉලක්කෙට විදින්න පුළුවන් ද කියලා ඔහේලට බලාගන්න ලැබෙයි."

# 02
# මිසයිල විදපු උප විදුහල්පති

තෝර්න් මොන ජාතියේ රාක්ෂයෙක් ද මම දැනගෙන හිටියේ නැහැ, ඒත් එයා වේගවත් වුණා.

සමහරවිට, මගේ පලිහ සක්‍රීය කළොත් මට ආරක්ෂා වෙන්න පුළුවන් වෙයි. මට කරන්න තිබුණේ මගේ අත් ඔරලෝසුව අල්ලන එක විතරයි. ඒත් ඩි ආන්ජෙලෝ ළමයින්ව ආරක්ෂා කරන එක වෙනම ප්‍රශ්නයක්. මට උදවු ඕනෑ වුණා, ඒකට මට මතක් වුණේ එක ක්‍රමයක් විතරයි.

මම ඇස් පියාගත්තා.

"ඔහේ මොනවද කරන්නේ, ජැක්සන්?" තෝර්න් පිම්බා. "දිගටම යනවා!"

ඇස් ඇරිය මම ගාටමින් ඉදිරියට ගියා. "මගේ උරහිස," මම මූසල හඬින් කතා කරන්න උත්සාහ කරමින් බොරුවක් කිවුවා, ඒක එච්චර අමාරු වුණේ නැහැ. "එතැන පිච්චෙනවා වගෙයි."

"බාහ්! මගේ විෂට ඇදුම් කනවා තමයි. ඒකෙන් ඔහේව මැරෙන්නෙ නෑ. යනවා!"

තෝර්න් අපිව එළියට දක්කාගෙන යද්දී, මම හිත ඒකාග්‍ර කරන්න උත්සාහ කළා. මම ග්‍රෝවර්ගේ මූණ හිතේ මවා ගත්තා. මගේ බය සහ අනතුර ගැන මම තදින් හිතුවා. පහුගිය ගිම්හානයේ දී ග්‍රෝවර් අපි දෙන්නා අතරේ සහකම්පන සම්බන්ධයක් සාදා තිබුණා.



එයා කරදරේක වැටුණාම ඒ බව මට දන්වන්න එයා මගේ සිහිනවලට දර්ශන එව්වා. මම දැන සිටි තරමට, අපි දෙන්නා තවමත් හිටියේ සම්බන්ධ වෙලයි, ඒත් මීට කලින් කවදාවත් මම ග්‍රෝවර්ව සම්බන්ධ කරගන්න උත්සාහ කරලා තිබුණේ නැහැ. ග්‍රෝවර් අවදියෙන් ඉන්න වේලාවට ඒක වැඩ කරයි ද කියලවත් මම දැන සිටියේ නැහැ.

හේයි, ග්‍රෝවර්! මම හිතුවා. තෝර්න් අපිව පැහැරගෙන යනවා! එයා විසකුරු කටු විදින යකෙක්! උදවු කරන්න!

තෝර්න් අපිව කැලයට රැගෙන ගියා. පරණ මෝස්තරයේ විදුලි ලාම්පු දැල්වුණ, හිමෙන් වැසුණු අඩි පාරක් දිගේ අපි ගියා. මගේ උරහිස ඇදුම් කෑවා. මගේ ඉරුණ ඇඳුම් අතරින් හමා ගිය සුළඟ කොයි තරම් සීතල ද කියනවා නම් මට දැනුණේ මම පොප්සිකල් එකක් වෙලා වගෙයි.

"ඉස්සරහා එළි පෙහෙළි කරපු තැනක් තියෙනවා," තෝර්න් කිවුවා. "අපි ඔහෙලගේ වාහනේ කැඳවමු."

"මොන වාහනේ ද?" බියන්කා ප්‍රශ්න කළා. "ඔයා අපිව කොහෙද ගෙනියන්නේ?"

"නිශ්ශබ්ද වෙනවා, පණ්ඩිත කෙල්ල!"

"මගේ අක්කට එහෙම කතා කරන්න එපා." නිකෝ කිවුවා. එයාගේ කටහඬ සැලුණත්, එහෙම දෙයක්වත් කියන්න තරම් ධෛර්යයක් එයාට තිබීම ගැන මම පුදුම වුණා.

තෝර්න් පිට කළ ගෙරවුම් හඬ නම් කොහෙත්ම මනුස්ස හඬක් නෙවෙයි. එයින් මගේ බෙල්ල පිටුපස කෙස් පවා කෙලින් වුණා, ඒත් නොනැවතී යන්න මට ම බල කරපු මම හොඳ, පුංචි හිරකාරයෙක් වගේ බොරුවට රඟපෑවා. ඒ අතරවාරයේ, මම පිස්සුවෙන් වගේ මගේ සිතුවිලි ප්‍රක්ෂේපණය කළා- ග්‍රෝවර්ගේ අවධානය ලබා ගත හැකි ඕනෑම දෙයක්ඃ ග්‍රෝවර්! ඇපල්! ටින් කෑන්! ඔය ලොම් පිරුණ පස්සා ගාත් දෙක ඉක්මන් කරලා මෙතැනට එනවා, එන ගමන් ආයුධ සන්නද්ධ යාළුවෝ ටිකකුත් එක්ක එනවා!

"නවතිනවා," තෝර්න් කිවුවා.

ඉදිරියේ කැලය එළි වී තිබුණා. සාගරයට ඉහළින් පිහිටි ප්‍රපාතය මුදුනටම අපි ළඟා වෙලා. අඩු තරමේ, එතැන දි මට අඩි සිය ගාණක් පහළින් සාගරය දැනුණා. රළ කැලඹෙනවා මට ඇසුණා

Scanned with CamScanner

වගේම ලුණු මිශ්‍ර සීතල පෙණ කැටිවල සුවඳත් මට දැනුණා. ඒත් මට පෙනෙන්න තිබුණේ මීදුම සහ අන්ධකාරය විතරයි.

තෝර්න් අපිව ප්‍රපාතය අද්දරට තල්ලු කළා. මම වැටෙන්න යද්දී බියන්කා මාව අල්ලාගත්තා.

"ස්තුතියි," මම මිමිණුවා.

"එයා මොකෙක්ද?" එයා කොඳුරා ඇසුවා. "අපි කොහොමද එයත් එක්ක සටන් කරන්නේ?"

"මම... මම ඒක ගැන තමයි හිතන්නේ."

"මට බයයි," නිකෝ කෙඳිරුවා. එයා මොකක්දෝ අතේ තියාගෙන හිටියා- ලෝහවලින් සෑදූ පුංචි සෙල්ලම් සොල්දාදුවෙක් වගේ දෙයක්.

"කතාව නවත්තනවා!" තෝර්න් කිවුවා. "මගේ පැත්තට හැරෙනවා!"

අපි හැරුණා.

තෝර්න්ගේ පාට දෙකේ ඇස් කෑදර බැල්මෙන් දිලිසුණා. එයා කබාය තුළින් මොකක්දෝ ඇදලා ගත්තා. ඒ දුනු පිහියක් කියලා මම මුලින් හිතුවත්, ඒක ජංගම දුරකථනයක් විතරයි. එයා එහි බොත්තමක් ඔබා කතා කළා, "පැකේජ් එක - ලෑස්තියි!"

අනෙක් අන්තයෙන් නොපැහැදිලි උත්තරයක් ඇසුණා, තෝර්න් වෝකි-ටෝකි ක්‍රමයෙන් ඇමතුම ගන්න බව මම තේරුම් ගත්තා. ජංගම දුරකථනයක් පාවිච්චි කරන රාක්ෂයෙක්- ඒ ගැන හිතද්දී මගේ ඇඟම හිරි වැටුණා.

මම පිටුපසට බැල්මක් හෙළුවේ බෑවුම කොයි තරම් උස ඇති ද හිතමිනුයි.

තෝර්න් මහ හඬින් හිනා වුණා. "ඇත්තටම, පොසෙයිඩන්ගේ පුත්‍රයෝ. පනිනවා! මුහුද ඔය තියෙන්නේ. පැනලා පණ බේරගන්නවා."

"එයා ඔයාට මොකක් කියල ද කතා කළේ?" බියන්කා කෙඳිරුවා.

"මම පස්සේ කියන්නම්," මම කිවුවා.

"ඔයාට සැලසුමක් තියෙනවා, නේ?"



ග්‍රෝවර්! මම තදින් හිතුවා. මාව හොයාගෙන එන්න!

සමහරවිට මට ඩි ආන්ජෙලෝ ළමයි දෙන්නවත් අරගෙනම මුහුදට පනින්න පුළුවන් වෙයි. වැටීමෙන් අපි නොමැරී බේරුනොත්, අපේ ආරක්ෂාවට වතුර පාවිච්චි කරන්න මට පුළුවන්. ඒ වගේ දේවල් මීට කලිනුත් මම කරලා තිබුණා. මගේ තාත්තා හිත හොඳින් හිටියොත් සහ මට ඇහුම්කන් දුන්නොත් එයා අපිට උදවු කරයි. සමහරවිට.

"ඔහේ වතුරට කිට්ටු වෙන්නත් කලින් මං ඔහේව ඉවරයක් කරනවා," තෝර්න් කිවුවේ මගේ හිත කියෙවුවා වගෙයි. "මං කවුද කියලා ඔහේ තවම තේරුම් ගත්තෙ නෑ, නේද?"

එයාට පිටුපසින් වූ වේගවත් චලනයක් එක්කම, වේගයෙන් ඇදී ආව තවත් මිසයිලයක් මගේ කනේ ගෑවී-නොගෑවී ගියා. තෝර්න්ට පිටුපසින් යමක් ගැස්සුණා - ඒක හරියට කැටපෝලයක් වගෙයි, ඒත් ඊට වඩා නම්‍යශීලියි.... හරියට වලිගයක් වගෙයි.

"අවාසනාවකට," තෝර්න් කිවුවා. "පුළුවන් නම්, ඔහේව පණපිටින් ගේන්න කිවුවා. නැත්නම් ඔහේ මෙලහකටත් මැරිලා."

"කාට ද අපිව ඕනෑ?" බියන්කා ප්‍රශ්න කළා. "අපෙන් කප්පමක් ගන්න පුළුවන් කියලා ඔයා හිතනවා නම්, ඔයාට වැරදිලා. අපිට කාත් කවුරුවත් නැහැ. නිකෝයි මමයි..." එයාගේ හඬ ටිකක් බිඳුණා. "අපිට ඉන්නේ අපි විතරයි."

"ආච්චි," තෝර්න් කිවුවා. "දුක් වෙන්නෙපා, පුංචි වදකාරයෝ. ඔහේලට ඉක්මනටම මගේ හාම්පුතාව මුණ ගැහෙයි. ඊට පස්සේ ඔහේලට අලුත්ම පවුලක් ලැබෙයි."

"ලූක්," මම කිවුවා. "ඔහේ වැඩ කරන්නේ ලූක්ට."

මගේ පරණ හතුරාගේ- කීප වතාවක් ම මාව මරන්න හදපු හිටපු යාළුවාගේ නම කියද්දී තෝර්න්ගේ කට අප්පිරියාවෙන් ඇඹරුණා. "සිද්ධ වෙන දේවල් ගැන ඔහේට කිසිම අදහසක් නෑ, පර්සි ජැක්සන්. ඒ ගැන ඔහේට පැහැදිලි කරන එක මම ජෙනරල්ට ඉතුරු කරන්නම්. අද රෑ ඔහේ එයාට ලොකු සේවයක් කරන්නයි යන්නේ. ඔහේව මුණ ගැහෙන්න එයා මග බලාගෙන ඉන්නවා,"

"ජෙනරල්?" මම ඇසුවා. මමත් ඒක ප්‍රංශ උච්චාරණයෙන් ම කියපු බව මට තේරුණේ ඊටත් පස්සෙයි. "මං කිවුවේ... කවුද ජෙනරල්?"

Scanned with CamScanner

තෝර්න් ක්ෂිතිජය දෙසට බැල්මක් හෙළුවා. "අහ්, මෙන්න එනවා, ඔහේලගේ වාහනේ."

හැරිලා බලපු මට දුර ඈත එළියක් දකින්න ලැබුණා, සාගරයට ඉහළින් ඇදෙන පිරික්සුම් පහනක්. ඊට පස්සේ හෙලිකොප්ටරයක තල කැරකෙන හඬ ටිකෙන් ටික ළං වුණා.

"ඔයා අපිව කොහෙද ගෙනියන්න හදන්නේ?" නිකෝ ඇසුවා.

"මේක ගෞරවයක් කියලා හිතනවා, මගේ කොල්ලෝ. බලවත් හමුදාවකට එකතු වෙන්න අවස්ථාව ඔහේට ලැබෙයි! හරියට ඔහේ කාඩ් කුට්ටම්වලිනුයි බෝනික්කන්ගෙනුයි කරන මෝඩ සෙල්ලම වගේ."

"ඒවා බෝනික්කෝ නෙවෙයි! ඒවා චූටි පිළිම! ඒ වගේම ඔයාගේ මහ ලොකු හමුදාවත් අරන්-"

"දූන්, දූන්," තෝර්න් අනතුරු ඇඟෙව්වා. "ඔහෙගේ හිත පස්සෙ වෙනස් වෙලා අපිට එකතු වෙයි, මගේ කොල්ලෝ. හැබැයි එහෙම නොවුණොත්, හොඳයි... අපිට අර්ධ-ලෝහිතයන්ගෙන් ගන්න වෙන ප්‍රයෝජන තියෙනවා. අපිට කන්න දෙන්න රාක්ෂ කටවල් ගොඩාක් තියෙනවා, මහා කැලඹීම පටන් ගෙනයි තියෙන්නේ."

"මහා මොකක්?" මම ඇසුවා. මම සැලසුමක් හදාගන්නකල් එයාගේ කතාව නොනවත්වා තියාගන්න ඕනෑ.

"රාක්ෂයින්ගේ කැලඹීම," තෝර්න් දුෂ්ට හිනාවක් පෑවා. "එයාලගෙන් නරකම, බලවත්ම අය දැන් නැඟිටිනවා. අවුරුදු දහස් ගාණකින් දකින්න ලැබිලා නැති රාක්ෂයෝ. මනුෂ්‍ය වර්ගයාට කිසිම දවසක අත්විඳින්න ලැබිලා නැති විනාශයක් එයාලා ඇති කරාවි. ඉක්මනින්ම, වැදගත් ම රාක්ෂයා - ඔලිම්පස්වල විනාශය ගේන කෙනා අපිට ලැබේවි!"

"හොඳයි," බියන්කා මට කොඳුරා කිවුවා. "එයාට නම් හොඳටම පිස්සු."

"අපිට කන්දෙන් පහළට පනින්න වෙනවා," මම එයාට හෙමින් කිවුවා. "මුහුදට."

"ඔහ්, සුපිරි අදහස. ඔයාටත් හොඳටම පිස්සු."



මට එයා එක්ක වාද කරන්න ඉඩක් නොලැබුණේ ඒ වෙලාවේ අදෘශ්‍යමාන බලයක් වේගයෙන් මගේ ඇඟේ වැදුණු නිසයි.

★★★

ඒ ගැන කල්පනා කරද්දී, ඈනබෙත් වැඩ කර තිබුණේ අති දක්ෂ ලෙසයි. අදෘශ්‍යමාන තොප්පිය දමාගෙන සිටි එයා ඩි ආන්ජෙලෝ ළමයි දෙන්නගේ සහ මගේ ඇඟට පැනලා, අපිව බිමට පෙරළුවා. තත්පරේකින් පංගුවක් ගතවෙන තුරු තෝර්න් පුදුමයෙන් කැලඹී සිටි නිසා එයාගේ පළවෙනි මිසයිල මුරය අපේ ඔළුවලට උඩින් හානියක් නැතිව ඇදී ගියා.

එයින් පසුපසින් පහර දෙන්න තාලියාට සහ ග්‍රෝවර්ට අවස්ථාවක් ලැබුණා - තාලියා, එයාගේ මායා පලිහ, ඒගීස් ලෙළවමින් සිටියා.

තාලියා සටනකට දුවනවා ඔයා දැකලා නැත්නම් ඔයා කවදාවත් ඇත්තටම බය වෙලා නැහැ. ඒ වෙලාවට එයා සාක්කුවේ දමාගෙන යන ඇකිළිය හැකි සෙංකෝල පෙට්ටියෙන් යෝධ හෙල්ලයක් එළියට ගන්නවා. ඒත් බය උපදවන්නේ ඒක නෙවෙයි. එයාගේ පලිහ හදලා තිබුණේ එයාගේ තාත්තා, සියුස්ට ඇතීනාගෙන් ලැබුණු පලිහ - ඒකෙ නමත් ඒගීස් - ආදර්ශයට අරගෙනයි. මේ පලිහේ ලෝකඩ තුළට මෙඩූසාගේ හිස කාවද්දා තිබුණා. එයින් කිසිවෙක් ගල් පිළිමවලට හැරුනේ නැතත්, ඒක කොයි තරම් භයානක ද කියනවා වම්, ඒක දකින ඕනෑම කෙනෙක් පණ එපා කියලා දුවනවා.

ඒ පලිහ දැකපු තෝර්න් පවා බයෙන් ඇකිළිලා ගෙරෙව්වා.

තාලියා, එයාගේ හෙල්ලය අරන් ඉදිරියට පැන්නා. "සියුස් වෙනුවෙන්!"

තෝර්න් ඉවරෙටම ඉවරයි කියලා මං හිතුවා. තාලියා එයාගේ ඔළුවට ඇන්නා, ඒත් දත් නියවා ගෙරවූ තෝර්න් හෙල්ලයට අතින් ගසා ඉවත දැමුවා. එයාගේ අත් වෙනස් වෙලා යෝධ අත් පහුරුවලට හැරුණා, එහි වූ අති විශාල නිය පහුරු තාලියාගේ පලිහේ ගැටෙද්දී ගිනි පුපුරු විසිරුණා. ඒගීස් නොතිබුණා නම් ඒ පාරෙන් තාලියාව පාන් ගෙඩියක් වගේ පෙති ගැහෙන්න තිබුණා. ඒ අතරතුරේ දී ආපස්සට පෙරළිලා, නැවතත් දෙපයින් හිටගන්න තාලියාට හැකි වුණා.

Scanned with CamScanner

පිටපුසින් ඇඹුණු හෙලිකොප්ටරයේ හඬ විනෙත් විත වැඩි වුණා. ඒත් මම හැරිලා බලන්න තරම් එඩිතර වුණේ නැහැ.

තෝමස් තවත් මිසයිල මුරයක් තාලියාට එල්ල කළා. මේ වතාවේ එයා ඒක කළ හැටි මට බලාගන්න ලැබුණා. එයාට වලිගයක් තිබුණා- කෙළවරේ උල් කටු ගොඩක් ඇති, හොඳුනු වලිගයක් වගේ එකක්. ඊගිස්ගේ වැදුණු කටු පසෙකට විසි වුණත්, ඒවා වැදුණු වේගයට තාලියා බිමට ඇද වැටුණා.

ඉදිරියට පැන්න ග්‍රෝවර් බට නළා කුට්ටම තොල් අතර තබාගෙන වාදනය කරන්න පටන් ගත්තා- ඒක මුහුදු මංකොල්ලකාරයින්ට වුණත් නටවන්න හැකි ජාතියේ විකාර සංගීතයක්. තත්පර කීපයක් තුළ දී හිම බිඳගෙන තණකොළ මතු වුණා. කඹ තරම් මහත වල් පැළ තෝර්න්ගේ කකුල්වල එතෙමින්, එයාව පටලවාගත්තා.

ගර්ජනාවක් කළ තෝර්න් වෙනස් වෙන්න පටන් ගත්තා. සැබෑ ස්වරූපයට පත්වෙන තුරුම එයා ලොකු වුණා- එයාගේ මුහුණ තවමත් මිනිස් ස්වරූපයෙන් තිබුණත්, එයාගේ කඳ යෝධ සිංහයෙක් වගේ වුණා. එයාගේ උල් කටු ඇති ලෙදර් වගේ වලිගයෙන් මාරක කටු සෑම දිසාවකටම විදුණා.

"මැන්ටිකෝරයෙක්!" දන් දාගෙනමානව සිටි ඇනබෙත් කිවුවා. අපිව බිම පෙරළා ගනිද්දී එයාගේ නිව්යෝර්ක් යැන්කී තොප් එක ගැලවිලා.

"ඔයාලා කවුද?" බියන්කා ඩි ආන්ජෙලෝ ප්‍රශ්න කළා. "එතකොට අර මොකාද?"

"මැන්ටිකෝර්?" නිකෝ හීල්ලුවා. "එයාට ප්‍රහාර බල තුන්දාහකුත් එක්ක අතිරේක විදීම පහකුත් තියෙනවා!"

එයා මොනවා කියවනව ද මම දනගෙන හිටියේ නැතත්, මට ඒ ගැන වද වෙන්න වෙලාවක් තිබුණේ නැහැ. ග්‍රෝවර්ගේ මායා වල් පැළ පහුරු ගා කඩා දමූ මැන්ටිකෝර් ගොරවමින් අපේ පැත්තට හැරුණා.

"පාත් වෙන්න!" ඇනබෙත් ඩි ආන්ජෙලෝලාව හිමේ සමතලා කෙරෙව්වා. අන්තිම තත්පරයේ දී මට, මගේ පලිහ මතක් වුණා. මම අත් ඔරලෝසුවේ බොත්තමක් ඔබද්දී ඒක සර්පිලාකාරව පිටට කැරකෙමින්, සත ලෝකඩ පලිහකට හැරුණා. මොහොතක් ගත වෙන්න කලින්



ඉගිලී ආ උල් කටු එහි හැපුණු වේගයට ලෝහය ඇඹුණා. මගේ ලස්සන පලිහ, මගේ මල්ලී මට දුන්න තෑග්ග දැරුණු ලෙස කඩතොලු වුණා. ඒකට තවත් ප්‍රහාරයක් දරාගන්න හැකි වෙයි ද මට විශ්වාස වුණේ නැහැ.

කද පහරක් වදින හඬකුත්, වේදනාවෙන් මොර ගසන හඬකුත් මට ඇහුණා. තඩි හඬක් නගමින් ග්‍රෝවර් මගේ ළඟට වැටුණා.

"යටත් වෙනවා!" රාක්ෂයා ගර්ජනා කළා.

"කියටවත් නෑ!" තාලියා පිටියේ එහා කොණේ සිට කෑගැහුවා. එයා රාක්ෂයාට පහර දෙන්න දුවගෙන ආවා. ඒක තත්පරයකට මට හිතුණේ එයා උගව පහාරු කරයි කියලයි. ඒත් ඒ වෙලාවේ මහා හඬකුත්, විදුලි එළි ධාරාවකුත් අපිව පිටුපසින් මතුවුණා. මීදුම අතරින් මතු වූ හෙලිකොප්ටරය ප්‍රපාතයට එපිටින් ඔබන්න ගත්තා. හමුදා මෝස්තරයේ මටසිළුටු, කළු ප්‍රහාරක යානාවක් වූ එහි දෙපස ලේසර්-නියාමක රොකට්වල පෙනුම ඇති යමක් අමුණා තිබුණා. හෙලිකොප්ටරය පාලනය කළේ මිනිස්සු සිය දෙනෙක් විසිනුයි. ඒත් එයාලා මෙතැන මොනවද කරන්නේ? මිනිස්සු රාක්ෂයෝ එක්ක එකට වැඩ කරන්නෙ කොහොමද? පිපිත්තුම් පහන්වල එළියෙන් තාලියාගේ ඇස් නොපෙනී යද්දී මැන්ටිකෝරයා වලිගයෙන් ගසා තාලියාව පැත්තකට විසි කළා. එයාගේ පලිහ පියඹා ගිහින් හිම මත වැටුණා. එයාගේ හෙල්ලය අනෙක් පැත්තට විසි වුණා.

"නෑ!" මම එයාට උදවු කරන්න දිව්වා. එයාගේ පපුවේ වදින්න ගිය උල් පහරක් මම වැළැක්වුවා. මගේ පලිහ අපි දෙන්නට ඉහළින් ඇල්ලුවත්, ඒක ප්‍රමාණවත් නැති බව මම දන සිටියා.

තෝර්න් මහ හඬින් හිනාවුණා. "මේක කොච්චර වැඩකට නැති වැඩක් ද කියලා දන් ඔයාලට පේනවා නේද? යටත් වෙනවා, පුංචි වීරයෝ."

අපි රාක්ෂයෙක් සහ සන්නද්ධ හෙලිකොප්ටරයක් අතරේ හිරවෙලා. අපිට දිනන්න කිසිම අවස්ථාවක් තිබුණේ නැහැ.

ඒ වෙලාවේ මට පැහැදිලි, විනිවිද යන හඬක් ඇසුණා- කැලය තුළ දඩයක්කරුවන්ට හඬ ගසන නළා හඬක්.

* * *

මැන්ටිකෝරයා ගල් ගැහුණා. මොහොතක් ගතවෙන තුරු සුළි හමන හීම. සුළඟ සහ හෙලිකොප්ටරයේ පියාපත් හැර කිසිවෙක් හෝ සෙලවුණේවත් නැහැ.

"නෑ," තෝර්න් කිව්වා. "ඒක වෙන්න බෑ-"

හඳ එළියේ වයිරමක් වගේ මාව පසු කර වේගයෙන් ඇදී ගිය යමක් නිසා එයාගේ වාක්‍ය අතරමඟ නැවතුණා. තෝර්න්ගේ උරහිසෙන් දිලිසෙන රිදී ඊතලයක් පිටව පැන තිබුණා.

වේදනාවෙන් විලාප දෙමින් එයා පිටුපසට විසි වුණා.

"ඔහේලට සාප කරනවා!" ඊතලය ආ කැලය පැත්තට එයා උල් කටු දුසිම් භාගයක් එකවර මුදා හැරියා. ඒත් එකෙණෙහි ම රිදී ප්‍රතිචාර ලෙස අනෙක් පැත්තෙ රිදී ඊතල ඇදී ආවා. එය පෙනුණේ හරියට රළු ඇඳෙනේ දී ඊතල උල් කටුවල වැදිලා, ඒවා දෙකට පළනවා වගෙයි. ඒත් මගේ ඇස් මාව රවට්ටන්න ඇති. කිසිම කෙනෙකුට, අඩු තරමේ කැඩුණු ආපෝලෝ සැමිතගේ ළමයින්ටවත් ඒ තරම් නිවැරදිව ඉලක්කයකට විදින්න බැහැ.

වේදනාවෙන් රළු මුරමින් මැන්ටිකෝරයා උරහිසේ ඇමිණී තිබුණු ඊතලය ඇදලා ගත්තා. එයා හදින් හුස්ම ගත්තා. මම, මගේ කඩුවෙන් එයාට පහරක් ගහන්න උත්සාහ කළා, ඒත් ජෝත්ත තිබුණු තරම් එයාට තුවාල නැහැ. මගේ පහර මග ඇරිය එයා වලිගයෙන් මගේ පලිහට ගහා මාව ගුවනට විසි කළා.

ඒත් එක්කම දුනුවායෝ කැලයෙන් පිටතට ආවා. දුසිමක් විතර හිටි එයාලා හැමෝම ගැහැනු ළමයි. ඒ අතරින් බාලම කෙනාට අවුරුදු දහයක් විතර ඇති. ලොකුම කෙනා මම වගේ අවුරුදු දහ හතරක විතර කෙනෙක් වුණා. රිදී පාට ජර්කා (ඇස්කිමෝවරු අඳින ජැකට්ටු) සහ කලිසම් හැඳ හිටි එයාලා හැමෝම දුනුවලින් සන්නද්ධව හිටියා. මැන්ටිකෝරයාට පහර දෙන්න සූදානමින් ආ එයාලාගේ මුහුණුවලින් පෙනුණේ අධිෂ්ඨානයක්.

"දඩයක්කාරියෝ!" ඇනබෙත් කෑගැහුවා.

"මන්, නියමයි." මට එහා පැත්තේ හිටි තාලියා කෙඳිරුවා.

එයා අදහස් කළ දේ අහන්න මට අවස්ථාවක් ලැබුණේ නැහැ.

වැඩිමල් දුනුවායන්ගෙන් කෙනෙක් දුනුදිය ඇදගෙන ඉදිරියට ආවා. තද පාට හමක් තිබුණු එයා උස, ලස්සන කෙනෙක්.



එයා අනෙක් අයගෙන් වෙනස් වුණේ එයාගේ දිග, තද කොණ්ඩය මුදුනට රිදී වළල්ලක් ගොතා තිබුණු නිසයි. ඒ නිසා එයාව පෙනුණේ පර්සියානු කුමාරිකාවක් වගෙයි. "මරන්න අවසර ද, උත්තමාවියනි?"

එයා කතා කරන්නේ කාට ද කියලා මට හිතාගන්න බැරිවුණේ එයාගේ ඇස් මැන්ටිකෝරයාගෙන් ඉවතට නොගිය නිසයි.

රාක්ෂයා විලාප දුන්නා. "මේක සාධාරණ නැහැ! සෘජු මැදිහත්වීමක්! මේක පෞරාණික නීතිවලට විරුද්ධයි."

"එහෙම නෑ," තවත් ගැහැනු ළමයෙක් කිව්වා. එයා මට වඩා ටිකක් බාලයි වගෙයි, සමහරවිට අවුරුදු දොළහක් හෝ දහතුනක් විතර වයස ඇති. පිටුපසට කර පෝනිටේලයකට ගැට ගැසූ රතු-දුඹුරු පාට කොණ්ඩයකුත්, පුර හඳ වගේ රිදී සහ පාට අසාමාන්‍ය ඇස් දෙකකුත් එයාට තිබුණා. එයාගේ මුහුණ කොච්චර ලස්සන ද කියනවා නම්, මට හුස්ම ගන්නත් අමතක වුණා. ඒත් එයාගේ බැල්මෙන් පළ වුණේ මිත්‍රත්වයක් නැති, අනතුරුදායක බවක්. "හැම කැලේ සතෙක්ම දඩයම් කරන එක මට අයිති වැඩක්. ඒ වගේම ඔහේ, ජරා සතා, ඔහේත් කැලෑ සතෙක්." එයා රිදී වළල්ලක් පැළඳ හිටි වැඩිමල් ගැහැනු ළමයා දෙස බැලුවා. "ෂෝයි, අවසර දෙනවා."

මැන්ටිකෝරයා ගෙරෙව්වා. "මට මෙයාලව පණපිටින් ගන්න බැරි නම්, මරලා හරි ගන්නවා!"

තාලියා සහ මම තෝන්තුවෙන්, දුර්වල වෙලා ඉන්න බව දැන හිටි රාක්ෂයා අපේ ඉදිරියට පැන්නා.

"එපා!" මොරදුන් ඇනබෙත් රාක්ෂයාට පහර දෙන්න පැන්නා.

"පස්සට යනවා, අර්ධ-ලෝහිතයෝ!" රිදී වළල්ල පැළඳි ගැහැනු ළමයා කිව්වා. "ඊතල විදින සීමාවෙන් අයින් වෙනවා!"

ඒ වුණත් රාක්ෂයාගේ පිටට පැන්න ඇනබෙත් එයාගේ කිණිස්ස උගේ කේසර අතරට කිඳා බැස්සුවා. උඩු බිරුව මැන්ටිකෝරයා වලිගය කසයක් වගේ වනමින් වටේ කැරකෙද්දි ඇනබෙත් ජීවිතේ බේරගන්න එල්ලිලා හිටියා.

"පහර දෙනවා!" ෂෝයි අණ කළා.

"එපා!" මම බෙරිහන් දුන්නා.

ඒත් දඩයක්කාරියෝ ඊතල මුදා හැරියා. මුල්ම හිය මැන්ටිකෝරයාගේ බෙල්ලටත්, තවත් එකක් පපුවේත් වැදුණා. මැන්ටිකෝරයා පසුපසට විසි වෙමින් විලාප දුන්නා, "මේක ඉවරයි කියලා හිතන්නෙපා, දඩයක්කාරියේ! මේකට ඔහේට වන්දි ගෙවන්න වෙයි!"

ඒත් එක්කම කාටවත් කිසිවක් කරන්න ඉඩ ලැබෙන්න කලින්, ඇනබෙත් තවමත් පිටේ එල්ලී සිටිද්දී ම, රාක්ෂයා ප්‍රපාතයෙන් පහළ කළුවර තුළට ඇද වැටුණා.

"ඇනබෙත්!" මම මොරදුන්නා.

මම එයා පසුපස දුවන්න පටන් ගත්තා, ඒත් අපේ හතුරෝ අපිව අත ඇරලා තිබුණේ නැහැ. හෙලිකොප්ටරයෙන් නොකඩවා පිටවෙන හඬක්- වෙඩි හඬක් ඇහෙන්න ගත්තා.

දඩයක්කාරියන් පාමුල හිමේ පුංචි හිල් මතු වෙද්දී එයාලා වැඩි දෙනෙක් විසිරී ගියා, ඒත් රතු-දුඹුරු කොණ්ඩයක් තිබුණු ගැහැනු ළමයා සන්සුන්ව හෙලිකොප්ටරය දෙස බැලුවා. "මනුෂ්‍යයින්ට," එයා නිවේදනය කළා, "මම දඩයම් කරනවා බලන්න අවසර නැහැ."

එයා අතක් වේගයෙන් ඉදිරියට තල්ලු කළා, ඒත් එක්කම හෙලිකොප්ටරය දූවිලිවලට පුපුරා ගියා- නෑ, දූවිලිවලට නෙවෙයි. කළු ලෝහය කපුටු රැනකට දිය වෙලා, රෑ අහසේ විසිරී ගියා.

දඩයක්කාරියෝ අපේ පැත්තට ආවා.

තාලියාව දුටු හැටියේ ෙzසෝයි නම් ගැහැනු ළමයා හිටිවනම නතර වුණා. "නුඹ." එයා අප්පිරියාවෙන් වගේ කිවුවා.

"ෙzසෝයි නයිට්ෂේඩ්." තාලියාගේ හඬ කේන්තියෙන් වෙවුලුවා. "හරිම වෙලාවට. හැමදාමත් වගේ."

ෙzසෝයි අපිව පිරික්සන බැල්මෙන් බැලුවා. "අර්ධ-ලෝහිතයෝ හතර දෙනෙකුයි, සැටර් කෙනෙකුයි, මගේ උත්තමාවියනි."

"ඔව්," පුංචි ගැහැනු ළමයා කිවුවා. "මට පේන්නේ, සමහරු කයිරොන්ගේ කඳවුරුකාරයෝ."

"ඇනබෙත්!" මම මොරදුන්නා. "අපිට එයාව බේරගන්න යන්න දෙන්න!"



රතු-දුඹුරු කොණ්ඩකාරිය මගේ දිහාවට හැරුණා. "මට කණගාටුයි, පර්සි ජැක්සන්, ඒත්, ඔයාගේ යාළුවාට උදවු කරන්න පුළුවන්කමක් නැහැ."

මම දෙපයින් නැගිටින්න දඟලුවත්, ගෑනු ළමයි දෙන්නෙක් මාව අල්ලගත්තා.

"ඔයා ඉන්නේ කන්දෙන් පහළට පනින්න සුදුසු තත්ත්වෙක නෙවෙයි," රතු-දුඹුරු කොණ්ඩකාරි කිවුවා.

"මට යන්න දෙනවා!" මම කෑගැසුවා. "ඔහේ හිතන් ඉන්නේ ඔහේ කවුරු කියල ද?"

ෙzසෝයි ඉදිරියට ආවේ මට ගහන්න වගෙයි.

"එපා," අනෙක් ගැහැනු ළමයා නියෝග කළා. "එයා මට අගෞරව කරන්න හදපු බවක් දැනෙන්නේ නෑ, ෙzසෝයි. එයා ඉන්නේ දුකෙන් කැලඹිලා. එයාට තවම තේරිලා නැහැ."

පුංචි ගැහැනු ළමයා මගේ දිහා බැලුවා, එයාගේ ඇස් ශීත සෘතුවේ හඳටත් වඩා සීතල සහ දීප්තිමත් වුණා. "මම තමයි ආර්ටෙමිස්," එයා කිවුවා. "දඩයමට අධිපති දෙවඟන."

Scanned with CamScanner

# 03

# බියන්කා ඩි ආන්ජෙලෝගේ තෝරා ගැනීම

ආචාර්ය තෝර්න් රාක්ෂයෙකුට හැරිලා ඇනබෙත්වත් අරගෙන ප්‍රපාතයෙන් පහළට පනිනවා දැක්කට පස්සේ, තවදුරටත් මාව කම්පනය කරන්න පුළුවන් දෙයක් ඇති කියලා ඔයා හිතන්නෙ නැතිව ඇති. ඒත් මේ අවුරුදු දොළහක කෙල්ල, එයා ආර්ටෙමිස් කියලා කිව්වම, මගේ කටින් පිටවුණේ හරිම බුද්ධිමත් දෙයක්. "ම්ම්... හොඳයි නේ."

ඒත් ග්‍රෝවර් එක්ක බලද්දී ඒක මොකක්ද? අමාරුවෙන් හුස්මක් ඇදලා ගත් එයා දඩිබිඩියේ හිම ගොඩේ දණ ගහගෙන යාතිකා කරන්න පටන් ගත්තා. "ස්තූතියි, ආර්ටෙමිස් උත්තමාවියනි! ඔබතුමී මාර... ඔබතුමී මාරම... මාරයි!"

"නැගිටිනවා, එළු කොල්ලා!" තාලියා සැර කළා. "අපිට වද වෙන්න වෙන දේවල් තියෙනවා. ඇනබෙත් යන්න ගිහින්!"

"හෝව්," බියන්කා ඩි ආන්ජෙලෝ කිව්වා. "පොඩ්ඩක් ඉන්න. ඔය හොඳටම ඇති."

හැමෝම එයා දිහා බැලුවා. එයා මාරුවෙන් මාරුවට අපි හැමෝටම ඇඟිල්ල දිගු කළේ හරියට තිත් යා කරනවා වගෙයි. "කවුද... කවුද ඔයාලා?"

ආර්ටෙමිස්ගේ බැල්ම මෘදු වුණා. "හරිම ප්‍රශ්නය තමයි, මගේ ආදරණීය කෙල්ලේ. ඔයාලා කවුද කියලා අහන එක! ඔයාලගේ දෙමව්පියෝ කවුද?"



තවමත් ආර්ටෙමිස් දිහා ගරුසරු ඇතිව බලා ඉන්න නිකෝ දිහාවට එයා කලබලෙන් බැල්මක් හෙළුවා. "අපේ අම්මයි තාත්තයි මැරිලා," බියන්කා කිව්වා. "අපි අනාථයෝ. අපේ ඉස්කෝලෙට ගෙවන්න බැංකුවක අරමුදලක් තියෙනවා, ඒත්..." එයාගේ කතාව ඇනහිටියා. මං හිතන්නේ අපි එයාගේ කතාව විශ්වාස නොකරන බව එයාට අපේ මුහුණුවලින් ම පැහැදිලි වෙන්න ඇති.

"මොකද?" එයා ප්‍රශ්න කළා. "මං කියන්නෙ ඇත්ත."

"තුඹ අර්ධ-ලෝහිතයෙක්," සෝයි නයිට්ෂේඩ් කිව්වා. එයාගේ උච්චාරණ විලාසය හඳුනා ගන්න අමාරු වුණා. එයා පරණ කාලෙට කතා කළේ හරියට ගොඩක් පරණ පොතක් කියවනවා වගෙයි. "තිගේ දෙමව්පියන්ගෙන් කෙනෙක් මනුෂ්‍යයෙක්. අනෙකා ඔලිම්පියානුවෙක්."

"ඔලිම්පියානුවෙක්... ක්‍රීඩකයෙක්?"

"නෑ," සෝයි කිව්වා. "දෙවිවරුන්ගෙන් කෙනෙක්."

"නියමයි නේ" නිකෝ කිව්වා.

"නෑ!" බියන්කාගේ හඬ වෙවුලුවා. "මේක හොඳ දෙයක් නෙවෙයි!"

නිකෝ නටන්න පටන් ගත්තේ එයාට වැසිකිළි යන්න ඕනෑ වෙලා වගෙයි. "ඩිනාශ හයසියක් කරන්න පුළුවන් අකුණු විදුලියක් සියුස්ට ඇත්තටම තියෙනවද? එයාට එක්ස්ට්‍රා පොයින්ට්ස් ලැබෙනව ද-"

"නිකෝ, කට වහගන්න!" බියන්කා අත් දෙකේ මුහුණ සඟවා ගත්තා. "මේ ඔයාගේ මෝඩ මිතෝමැජික් ගේම් එකක් නෙවෙයි, හරි ද? දෙවියෝ කියලා ජාතියක් නෑ!"

මම ඇනබෙත් ගැන කොච්චර නැවෙමින් හිටියත්- මට කරන්න ඕනෑ කළ එකම දේ එයාව හොයාගෙන යෑම වුණත්- ඩි ආන්ජෙලෝලට අනුකම්පා නොකර ඉන්න මට බැරි වුණා. මම උප-දෙවියෙක් බව මුලින්ම දැනගත් වෙලාවේ දැනුණු හැටි මට මතක් වුණා.

තාලියාටත් ඊට සමාන හැඟීමක් දැනෙන්න ඇති, මොකද එයාගේ ඇස්වල තිබුණු කේන්තිය චුට්ටක් විතර බැහැලා ගියා. "බියන්කා, මං දන්නවා ඒක විශ්වාස කරන්න අමාරුයි. ඒත් දෙවිවරු තවම ඉන්නවා. මාව විශ්වාස කරන්න. එයාලා අමරණීයයි. ඒ වගේම,

එයාලා මනුෂ්‍ය වර්ගයා එක්ක එකතු වෙලා ළමයි බිහි කළා ම, හරියට අපි වගේ ළමයින්ව, මෙහෙමයි... අපේ ජීවිත තියෙන්නේ අනතුරේ."

"අනතුරේ," බියන්කා කිවුවා. "හරියට අර පහළට වැටුණ ගැනු ළමයගෙ වගේ."

තාලියා අහක බලා ගත්තා. අඩු තරමේ ආර්ටෙමිස් පවා දුක් වෙන බව පෙනුණා.

"ඈනබෙත් ගැන බලාපොරොත්තු නැති කරගන්නෙපා," දෙවඟන කිවුවා. "එයා නිර්භීත තරුණියක්. එයාව හොයාගන්න පුළුවන්කමක් තියෙනවා නම්, මම ඒක කරනවා."

"එහෙනම් එයාව හොයාගෙන යන්න අපිට ඉඩ දෙන්නැත්තෙ ඇයි?" මම ඇසුවා.

"එයා අතුරුදන් වෙලා. ඔයාට ඒක දැනෙන්නෙ නැද්ද, පොසෙයිඩන්ගේ පුත්‍රයෝ? මෙතැන මොකක්හරි මායාවක් සිද්ධ වෙනවා. ඒ කොහොමද කියලවත්, ඒකට හේතුව මොකක්ද කියලවත් මම හරියටම දන්නෙ නැහැ, ඒත් ඔයාගේ යාළුවා අතුරුදන් වෙලා."

මට තවමත් ප්‍රපාතයෙන් පහළට පැනලා ඈනබෙත්ව හොයන්න ඕනෑ වුණා, ඒත් ආර්ටෙමිස් නිවැරදියි කියලා මටත් දැනුණා. ඈනබෙත් අතුරුදන් වෙලා. එයා පහළ මුහුදේ ඉන්නවා නම්, මම හිතුවා, මට එයා ඉන්න බව දැනෙනවා.

"ඔඕ!" නිකෝ අතක් එසෙව්වා. "එතකොට ආචාර්ය තෝර්න්ට මොකද වුණේ? ඔයාලා එයාට ඊතලවලින් විදපු හැටි නම් මරු! එයා මැරිල ද?"

"එයා මැන්ටිකෝරයෙක්," ආර්ටෙමිස් කිවුවා. "එයා දැනට විනාශ වෙන්න ඇති කියලා බලාපොරොත්තු වෙන්න පුළුවන්, ඒත් රාක්ෂයෝ කවදාවත් ඇත්තටම මැරෙන්නෙ නැහැ. උන් ආයේ-ආයෙම ප්‍රතිසංස්කරණය වෙනවා, ඒ නිසා උන් ආපහු මතුවෙන හැම වෙලාවකම උන්ව දඩයම් කරන්න ඕනෑ."

"නැත්නම් උන් අපිව දඩයම් කරනවා," තාලියා කිවුවා.

බියන්කා ඩි ආන්ජෙලෝ වෙවුලුවා. "ඒකෙන් පැහැදිලි වෙනවා... නිකෝ, ගිය ගිම්හානේ, ඩී.සී.වල පටු පාරක දි අපිව මරන්න [illegible] ඔයාට මතක ද?"



"එතකොට අර බස් ඩ්‍රයිවර්?" නිකෝ කිවුවා. "අර බැටළු අං තිබුණු කෙනා. මං ඔයාට කිවුවා නේ ඒවා ඇත්ත ඒවා කියලා."

"අන්න ඒ නිසයි ග්‍රෝවර් ඔයාලා ගැන ඇහැ ගහගෙන හිටියේ," මම කිවුවා. "ඔයාලා අර්ධ-ලෝහිතයෝ නම්, ඔයාලව ආරක්ෂා කරන්න."

"ග්‍රෝවර්?" බියන්කා එයා දිහා ඇස් ලොකු කරගෙන බලා සිටියා. "ඔයත් උප-දෙවියෙක් ද?"

"හොඳයි, ඇත්තටම, සැටර් කෙනෙක්." සපත්තු ගලවා පසෙක දැමූ එයා කුර දෙක ප්‍රදර්ශනය කළා. බියන්කා එතැනම කලන්තෙ දාලා වැටෙයි කියලා මට හිතුණා.

"ග්‍රෝවර්, ඔයාගේ සපත්තු ආපහු දාගන්න," තාලියා කිවුවා. "ඔයා එයාව බය කරනවා."

"ඒයි, මගේ කුර පිරිසිදුයි, හරි ද!"

"බියන්කා," මම කතා කළා, "අපි මෙහෙට ආවේ ඔයාලට උදවු කරන්න. ඔයාටයි නිකෝටයි පණ බේරගෙන ජීවත් වෙන්න පුහුණුවක් ඕනෑ. තෝර්න් ඔයාලට මුණ ගැහුණ අන්තිම රාක්ෂයා නෙවෙයි. ඔයාලා කඳවුරට එන්න ඕනෑ."

"කඳවුර?" එයා ඇසුවා.

"අර්ධ-ලෝහිත කඳවුර," මම කිවුවා. "එහෙදි තමයි අර්ධ-ලෝහිතයෝ නොමැරී ජීවත් වෙන විදිහ වගේ දේවල් ඉගෙන ගන්නේ. ඔයාලටත් අපිට එකතු වෙන්න පුළුවන්, කැමති නම් අවුරුද්ද පුරා ම ඉන්නත් පුළුවන්."

"ෂෝක් නේ, අපි යමු!" නිකෝ කිවුවා.

"පොඩ්ඩක් ඉන්න," බියන්කා ඔළුව හෙල්ලුවා. "මට බැහැ-"

"තව විකල්පයක් තියෙනවා," ෙZසෝයි කිවුවා.

"නෑ, වෙන එකක් නෑ!" තාලියා කිවුවා.

තාලියා සහ ෙZසෝයි එකිනෙකාට රවා ගත්තා. එයාලා මොනවා ගැන කතා කරනව ද කියලා මම දැන සිටියේ නැහැ, ඒත් ඒ දෙන්නා අතරේ නරක යටගියාවක් තියෙන බව නම් මට තේරුණා. මොකක්දෝ හේතුවකට, ඒ දෙන්නා එකිනෙකාට තදින් වෛර කරගත්තා.

Scanned with CamScanner

"අපි මේ ළමයින්ට කරදර කළා ඇති," ආර්ටෙමිස් කිව්වා. "ෂෝයි, අපි පැය කීපයක් මෙතැන විවේක ගමු. කූඩාරම් නංවන්න. තුවාල වුණ අයට බෙහෙත් කරන්න. අපේ අමුත්තන්ගේ බඩු ඉස්කෝලෙන් අරන් එන්න."

"එහෙමයි, උත්තමාවියනි."

"එතකොට, බියන්කා, මාත් එක්ක එන්න. මම ඔයත් එක්ක ටිකක් කතා කරන්න කැමතියි."

"එතකොට මම?" නිකෝ ඇහුවා.

ආර්ටෙමිස් පිරිමි ළමයා දෙස සැලකිල්ලෙන් බැලුවා. "බාගදා, ඔයා ආසම කාඩ් සෙල්ලම කරන්නෙ කොහොමද කියලා ග්‍රෝවර්ට පෙන්වන්න ඔයාට පුළුවන් වෙයි. මට විශ්වාසයි ටික වෙලාවකට ඔයාව බලාගන්න ග්‍රෝවර් සතුටු වෙයි... මට කරන උදවුවක් හැටියට?"

නැගිට්ටන්න ගිය ග්‍රෝවර් තව පොඩ්ඩෙන් ඇදගෙන වැටෙනවා. "ඇත්තෙන්ම! එන්න යමු, නිකෝ!"

හිට් පොයින්ට්, සන්නාහ නිලයන් වගේ විකාර ගොඩක් ගැන කියවමින් ඒ දෙන්නා කැලේ පැත්තට ඇදුණා. ආර්ටෙමිස්, අවුල් වෙලා හිටිය බියන්කා සමග ප්‍රපාතය අද්දර දිගේ ඇවිදන් ගියා. දඩයක්කාරියෝ, එයාලගේ ඔලගු දිග හැර තාවකාලික කඳවුරක් හදන්න පටන් ගත්තා. තවත් වරක් තාලියාට රැවූ ෂෝයි වැඩ කටයුතු බලා ගන්න ගියා.

එයා ගිය හැටියේ තාලියා කේන්තියෙන් අඩිය පොළොවේ හැප්පුවා. "මේ දඩයක්කාරියන්ගේ ලැජ්ජා නැතිකම! එයාලා හිතන් ඉන්නේ එයාලා හරි.... අර්ග්හ්!"

"මමත් ඔයාගේ පැත්තේ," මම කිව්වා. "මට විශ්වාස නෑ-"

"ඔහ්හ්, ඔයත් මගේ පැත්තෙ ද?" තාලියා මගේ ඇඟට කඩා පැන්නා. "ඉස්සර වෙලා ජිම් එකේ දී ඔයා මොනවා හිතාගෙන ද වැඩ කළේ, පර්සි? තෝර්න්ව තනියම ඉවරයක් කරන්න පුළුවන් කියලා ද? එයා රාක්ෂයෙක් කියලා ඔයා දැනගෙනයි හිටියේ! අපි ඔක්කොම එකට හිටියා නම්, දඩයක්කාරියන්ව ගාවගන්නැතුව අපිට එයාව විනාශ කරන්න තිබුණා. එහෙනම් ඇනබෙත් තවමත් ඉන්නවා. ඔයා ඒ ගැන හිතලා බැලුවා ද?"

මගේ හකුපාඩා තද වුණා. එයාට කියන්න නරක වචන ටිකක් මගේ හිතට ආවා, මම ඒවා කියන්නත් ඉඩ තිබුණා, ඒත් ඒ වේලාවේ



බිම බලපු මට, මගේ දෙපතුල් ළඟ හිමේ වැතිරී තිබුණු තද නිල් පාට යමක් දකින්න ලැබුණා. ඒ ඇනබෙත්ගේ නිව්යෝර්ක් යැන්කීස් බේස්බෝල් කැප් එක.

තාලියා තවත් වචනයක්වත් කිව්වේ නැහැ. කම්මුලට වැටුණු කඳුළු බිංදුවක් පිහ දමූ එයා ආපසු හැරිලා යන්න ගියේ පොඩි වූ කැප් එක සමඟ මාව තනි කරමින්.

★★★

දඩයක්කාරියෝ විනාඩි කීපයක් ඇතුළත එයාලගේ කඳවුරු බිම සැකසුවා. රිදී පාට සේදවලින් සෑදූ විශාල කූඩාරම් හතක් කඳවුරු ගිනිමැලයේ එක් පසෙක අඩ හඳක හැඩයට ඉදි කර තිබුණා. එක් ගැහැනු ළමයෙක් රිදී බලු නළාවක් පිම්බා, ඒත් එක්කම සුදු වෘකයෝ දුසිමක් කැලයෙන් මතු වුණා. උන් මුර බල්ලෝ වගේ කඳවුර වටේ කැරකෙන්න පටන් ගත්තා. දඩයක්කාරියෝ උන් අතරට යමින්, කිසිම බයක් සැකක් නැතිව උන්ට කෑම දුන්නත්, කූඩාරම් කිට්ටුවට වෙලා ඉන්න එක ඇඟට ගුණයි කියලා මට හිතුණා. උකුස්සෝ අවට ගස්වල වසා අපි දිහා සෝදිසියෙන් බලා සිටියා. උන් සිටියේත් මුර සේවයේ යෙදී බව මට හැඟුණා. අඩු තරමේ කාලගුණය පවා දෙවඟනගේ කැමැත්තට නැමෙනවා වගෙයි පෙනුණේ. වාතය තවමත් සීතල වුණත්, සුළං හැමීම සහ හිම වැටීම නැවතී තිබුණා. ඉතින් ගිනිමැලය ළඟ වාඩි වී සිටීම මුළුමනින්ම වගේ ප්‍රියජනක දෙයක් වුණා.

මුළුමනින්ම වගේ.... ඒත් මගේ උරහිසේ වේදනාව සහ හිතේ වරදකාරී හැඟීම මට පීඩා කළා. ඇනබෙත් අතුරුදහන් වී ඇති බව මට අදහන්න බැරි වුණා. මම තාලියා එක්ක කොයි තරම් තරහෙන් හිටියත්. එයා හරි කියලා මට හැඟුණා, ඒක වුණේ මගේ වැරැද්දෙනුයි.

ව්‍යායාම ශාලාවේ දී ඇනබෙත් මට කියන්න ගියේ මොකක්ද? බරපතළ දෙයක්, එයා කිව්වේ එහෙමයි. දැන් මට කවදාවත් ඒ ගැන හොයාගන්න නොලැබෙන්නත් ඉඩ තියෙනවා. අපි දෙන්නා සිංදු බාගයකට නැටූ හැටි මට සිහිවුණා, ඊට පස්සේ මගේ හදවත තවත් බර වුණා.

කඳවුර අද්දර හිමේ වෘකයෝ අතර කිසිම බයක් නැතිව තාලියා සක්මන් කරන දිහා මම බලා සිටියා. දැන් අඳුරේ ගිලී තිබුණු වෙස්ටෝවර් හෝල් දිහාවට එයා බැල්මක් හෙළුවා. එය කැලයට එපිට

Scanned with CamScanner

කඳු බෑවුම මත නැගී සිටියා. තාලියා හිතනවා ඇත්තේ මොනවද කියලා මම පුදුමයෙන් කල්පනා කළා.

අවුරුදු හතකට කලින්, එයාගේ මරණය නවත්වන්න එයාගේ තාත්තා තාලියාව පයින් ගහකට හරවා තිබුණා. එයා, එයාගේ යාළුවෝ වුණ ලූක්ට සහ ඇනබෙත්ට බේරිලා යන්න වේලාව ලබා දෙන්න රාක්ෂ හමුදාවකට විරුද්ධව තනියම නැගී සිටියා. එයා ආපහු මනුස්සයෙක් වුණේ මාස කීපයකට කලිනුයි. ඉඳහිට සැරයක් එයා කොයි තරම් නිසොල්මන්ව එක තැන හිටගෙන ඉන්නවා ද කියනවා නම්, එයා තවමත් ගහක් ද කියලා ඔයා හිතන්න වුණත් පුළුවන්.

අන්තිමේ දී, දඩයක්කාරියන්ගෙන් කෙනෙක් මගේ ගමන් මල්ල ගෙනැත් දුන්නා. ග්‍රෝවර් සහ නිකෝ ඇවිදින්න ගිහින් ආවා. මගේ තුවාල වුණ අතට බෙහෙත් කරන්න ග්‍රෝවර් උදවු වුණා.

"එතැන කොළ පාට වෙලා!" නිකෝ සතුටින් කෑගැසුවා.

"හෙලවෙන්නැතුව ඉන්න," ග්‍රෝවර් මට කිව්වා. "මම ඒක සුද්ධ කරනකල් මේ ඇම්බ්‍රෝසියා ටිකක් කන්න."

එයා තුවාලයට වෙලුම් දමද්දී මම වේදනාවෙන් ඇකිළුණා, ඒත් ඇම්බ්‍රෝසියා කෑල්ලෙන් සහනයක් ලැබුණා. ගෙදර හදපු බ්‍රවුනීවල රස ගත් ඒක මගේ කටේදිම දියවෙමින් ඇඟ පුරා උණුසුම් හැඟීමක් පැතිරුවා. එය සහ ග්‍රෝවර් පාවිච්චි කළ මායා ආලේපයේ උදවුවෙන් විනාඩි ගාණක් තුළ මගේ උරහිස වඩාත් හොඳ අතට හැරුණා.

නිකෝ, එයාගේ ගමන් මල්ල අවුස්සන්න ගත්තා. ඒක දඩයක්කාරියෝ එයා වෙනුවෙන් අසුරා ඇති බව පැහැදිලි වුණත්, එයාලා කාටවත් නොපෙනී වෙස්ටෝවර් හෝල්වලට රිංගුවේ කොහොමද කියලා නම් මම දන සිටියේ නැහැ. නිකෝ පුංචි ප්‍රතිමා පොකුරක් එළියට අරන් හිම මත තැබුවා - ඒවා ග්‍රීක දෙවිවරුන්ගේ සහ වීරයින්ගේ පුංචි අනුරූයි. ඒවා අතරින් අකුණු විදුලිය අතින් ගත් සියුස්වත්, හෙල්ලයක් දරාගෙන සිටි ඒරීස්වත්, සූර්ය යානයේ නැගී සිටි ඇපලෝව්වත් මම හඳුනාගත්තා.

"ලොකු එකතුවක් නේ," මම කිව්වා.

නිකෝ දත් නියෙව්වා. "මගේ ළඟ එයාලා හැමෝම වගේ ඉන්නවා, තව හොලොග්‍රැෆික් කාඩ්සුත් තියෙනවා! හැබැයි, හොයා ගන්නම නැති දෙතුන්දෙනා ඇර."


"ඔයා ගොඩක් කල් ඉඳන් මේ සෙල්ලම කරනව ද?"

"මේ අවුරුද්දෙ ඉඳලා. අර..." එයාගේ ඇහිබැම් එකට ගැට ගැසුණා.

"මොකක්ද?" මම ඇහුවා.

"මට අමතක වුණා නේ. ඒක හරිම අමුතුයි."

එයා කැලඹිලා වගේ හිටියත්, ඒ ටික වෙලාවකට විතරයි. "හේයි, ඔයා පාවිච්චි කරපු කඩුව මට බලන්න පුළුවන් ද?"

එයාට රිප්ටයිඩ් පෙන්වූ මම කොපුව ගැලවූ සැණින් පෑන කඩුවකට හැරෙන හැටි විස්තර කළා.

"නියමයි! ඒකෙ තීන්ත කවදාවත් ඉවර වෙන්නැද්ද?"

"ම්, මෙහෙමයි, ඇත්තටම මම ඒකෙන් ලියන්නෙ නම් නැහැ."

"ඇත්තටම ඔයා පොසෙයිඩන්ගේ පුතා ද?"

"හොඳයි, ඔව්."

"ඒ කියන්නෙ ඔයාට ගොඩාක් හොඳට රළ පදින්න පුළුවන් ද?"

මම ග්‍රෝවර් දිහා බලද්දී එයා හිටියේ හිනාව හිර කරගන්න තදින්ම උත්සාහ කරමිනුයි.

"දෙයියනේ, නිකෝ," මම කිව්වා. "මම කවදාවත් කරලා බලලා නෑ නේ."

එයාට මගෙන් අහන්න ප්‍රශ්න පත්තරයක්ම තිබුණා. තාලියා සියුස්ගේ දුව නිසා මම එයත් එක්ක ගොඩක් රණ්ඩු කරනවද? මම ඒකට උත්තර දුන්නෙ නැහැ. ඇනබෙත්ගේ අම්මා බුද්ධියට අධිපති ඇතීනා නම්, අර පල්ලමෙන් පහළට වැටෙන්නෙ නැතිව ඉන්නවත් එයා දන්නෙ නැත්තෙ ඇයි? ඒක ඇහුවාම මම නිකෝගේ බෙල්ල මිරිකන්නෙ නැතුව හිටියේ බොහොම අමාරුවෙන්. ඇනබෙත් මගේ ගර්ල් ෆ්‍රෙන්ඩ් ද? මේ වෙලාවේ, මස් රස වැටුණු මල්ලක් ඇතුළට මේ කොල්ලව ඔබලා, වෘකයින්ට කන්න දාන්න මට හිතුණා.

දැන් ඕනෑම තත්පරයක එයා මට හිටි පොයින්ට්ස් කීයක් තියෙනව ද කියලා අහන බව මට තේරුණා, එතකොට මගේ රතු කට්ට පනීවි. ඒත් ඒ වෙලාවේ ෆේසොයි නයිට්ෂේඩ් අපි අසලට ආවා.

"පර්සි ජැක්සන්."

එයාට තද දුඹුරු පාට දෑසක් සහ යාන්තමින් ඉහළට හැරුණු නහයක් තිබුණා. එයා හිසේ පැලඳ සිටි රිදී වළල්ලෙනුත්, එයාගේ මුහුණෙන් පළ වූ ආඩම්බර බැල්මෙනුත් එයාට කොයි තරම් රාජකීය පෙනුමක් උරුම වුණා ද කියනවා නම්, සීරුවෙන් හිටගෙන, "එහෙමයි, මැඩම්," කියන්න හිතේ ඇති වුණ පෙලඹවීම මම යටපත් කරගත්තේ බොහොම අමාරුවෙන්. එයා අප්‍රසන්න බැල්මකින් මාව අධ්‍යනය කළේ හරියට මම එයාට ගෙනියන්න සිදු වුණු කුණු රෙදි මල්ලක් වගෙයි.

"මාත් එක්ක එනවා," එයා කිවුවා. "ආර්ටෙමිස් උත්තමාවිය තා සමග කතා කරන්න කැමැත්තෙන් ඉන්නවා."

* * *

අනෙක් කූඩාරම්වලට වඩා වෙනසක් නොපෙනුණු අන්තිම කූඩාරම වෙතට මාව කැඳවාගෙන ගිය zසෝයි මට ඇතුළට යන්න සන් කළා. මට තවමත් ආර්ටෙමිස් කියලා හිතන්න අමාරු වුණු රතු-දුඹුරු කොණ්ඩකාරිය ළඟින් බියන්කා ඩි ආන්ජෙලෝ වාඩි වී සිටියා.

කූඩාරම ඇතුළ උණුසුම් සහ සුව පහසු වුණා. සේද පලස්වලින් සහ කොට්ටවලින් එහි පොළොව වැසී තිබුණා. එය මැද රන් ගිනි අඟුරු බඳුනක් දල්වෙමින් තිබුණත් එහි ඉන්ධනයක් හෝ දුමක් ඇති බවක් පෙනුනේ නැහැ. දෙවඟනට පිටුපසින් වූ ඔප දැමූ ඕක් මේසයක් මත එයාගේ යෝධ රිදී දුන්න තිබුණා. එය කැටයම් කර තිබුණේ ගැසෙල් මුවෙකුගේ අඟට සමාන වන ලෙසයි. කූඩාරමේ බිත්ති පුරා සත්ව හම් එල්ලා තිබුණා: කළු වලහෙකුගේ, කොටියෙකුගේ වගේම මට හඳුනා ගන්න නොහැකි වුණු තවත් සත්තු කීප දෙනෙකුගේම හම් එතන තිබුණා. මේ දුර්ලභ සත්ව හම් සත්ව අවිහිංසාවාදියෙකුට දකින්න ලැබුණොත් එයාට හෘදයාබාධයක් හැදෙයි කියලා මට හිතුණා. ඒත් ආර්ටෙමිස් කියන්නේ දඩයම්වලට අධිපති දෙවඟන නිසා, එයා මරා දමන ඕනෑම සතෙක්ව නැවත ඇති කරන්න එයාට පුළුවන් ඇති කියලා මට හිතුණා. එයා ළඟින්ම තිබුණේ තවත් සත්ව හමක් කියලා මම මුලින් හිතුවත්, පසුව මට තේරුම් ගියේ ඒ පණ තියෙන සතෙක් කියලයි- දිලිසෙන ලොම් සහ රිදී අං තට්ටුවක් තිබුණු ඒ මුවා ආර්ටෙමිස්ගේ උකුලේ හිස තබාගෙන සතුටින් හිටියා.

"අපිට එකතු වෙන්න, පර්සි ජැක්සන්," දෙවඟන කිවුවා.



මම එයා ඉදිරියේ බිම වාඩි වුණා. දෙවඟන මගේ දිහා ඕනෑකමින් බලා සිටියේ මාව අපහසුවට පත් කරමිනුයි. පුංචි ගෑනු ළමයෙක් හැටියට එයාට තිබුණේ ගොඩක් වියපත් ඇස් දෙකක්.

"මගේ වයස ගැන ඔයා පුදුම වෙලා ද ඉන්නේ?" එයා ඇහුවා.

"අහ්... පොඩ්ඩක් විතර."

"ඕනෑ නම් මට වැඩුණු ගෑනු කෙනෙක් වගේ, ගිනි දල්ලක් වගේ, එහෙමත් නැත්නම් කැමති ඕනෑම දෙයක් වගේ පෙනී ඉන්න පුළුවන්. ඒත් මම කැමති මෙහෙම ඉන්න. මේක තමයි මගේ දඩයක්කාරියන්ගේ සාමාන්‍ය වයස. ඒ වගේම මම අනුග්‍රහ කරන හැම තරුණ ගෑහැනු ළමයෙකුගේම. එයාලා නොමග යන්න කලින්."

"නොමග යනවා?"

"ලොකු වෙනවා. කොල්ලො එක්ක හාද වෙනවා. මෝඩ, කල්පනාවක් නැති, විශ්වාස කරන්න බැරි අය වෙනවා. තමන්වම අමතක වෙනවා."

"ඔහ්."

zසෝයි ආර්ටෙමිස්ගේ දකුණු පසින් වාඩි වුණා. එයා මට රවන්න ගත්තේ හරියට ආර්ටෙමිස් දැන් කියපු දේවල් ඔක්කොටම වැරදිකාරයා මම වගෙයි, හරියට කොල්ලෙක් වීම මගේ සොයා ගැනීමක් වගෙයි.

"මගේ දඩයක්කාරියෝ ඔයාව සුහදව පිළිගන්නෙ නැත්නම්, එයාලට සමාව දෙන්න," ආර්ටෙමිස් කිවුවා. "අපි, අපේ කඳවුරට කොල්ලෙක්ව වැද්ද ගන්නෙ කලාතුරකින්. සාමාන්‍යයෙන් පිරිමි ළමයින්ට දඩයක්කාරියෝ එක්ක කිසිම සම්බන්ධකමක් තියාගන්න තහනම්. අන්තිම වතාවට මේ කඳවුර දැකපු කොල්ලා..." එයා zසෝයි දිහා බැලුවා. "කොයි කෙනා ද ඒ?"

"කොලරාඩෝවල කොල්ලා," zසෝයි කිවුවා. "ඔබතුමී එයාව ජැකලොප් (උතුරු ඇමරිකානු ජනප්‍රවාදයේ එන ඇන්ටිලොප් අං ඇති හාවෙක්.) කෙනෙක්ට හැරෙව්වා."

"අහ්, ඔව්." ආර්ටෙමිස් තෘප්තිමත් ලෙස ඔළුව වැනුවා. "මම ජැකලොප්ලා හදන්න ආසයි. කොහොම වුණත්, පර්සි, මම ඔයාට එන්න කිවුවේ මැන්ටිකෝරයා ගැන තව විස්තර අහන්න. රාක්ෂයා

Scanned with CamScanner

කියපු... ම්, ප්‍රශ්නකාරී දේවල් වගයක් ගැන බියන්කා රපෝර්තු කළා. මම කැමතියි ඒවා ඔයාගෙන්ම දැනගන්න."

ඉතින් මම එයාට කතාව කිවුවා.

මගේ කතාව ඉවර වුණා ම ආර්ටෙමිස් කල්පනාබරව එයාගේ රිදී දුන්න මත අතක් තැබුවා. "මට බය, මේක තමයි උත්තරේ."

ෂෝයි ඉදිරියට නැමුණා. "ඉව ද, මගේ උත්තමාවියනි?"

"ඔව්."

"මොන ඉව ද?" මම ඇසුවා.

"මට අවුරුදු දහස් ගාණකින් දඩයම් කරන්න ලැබිලා නැති එවුන් දැන් ආයෙමත් ඇවිස්සෙන්න පටන් ගෙන." ආර්ටෙමිස් තොල් මැතිරුවා. "මට අමතක ම වෙලා හිටපු එවුන්."

එයා ඕනෑකමින් මගේ දිහා බලා සිටියා. "අද රෑ අපි මෙතැනට ආවේ මැන්ටිකෝරයෙක්ගේ ඉව දැනිලා, ඒත් මම හොයන රාක්ෂයා ඌ නෙවෙයි. තෝර්න් හරියටම කියපු දේවල් මට ආපහු කියන්න."

"ම්... මට මධ්‍යම පාසල් නැටුම් පෙනෙන්න බැහැ.'"

"නෑ, නෑ. ඊට පස්සේ."

"එයා කිවුවා ජෙනරල් කියලා කෙනෙක් මට මේ දේවල් පැහැදිලි කරලා දෙයි කියලා."

ෂෝයිගේ මුහුණ සුදුමැලි වුණා. ආර්ටෙමිස් වෙත හැරුණ එයා මොකක්දෝ කියන්න ගියත්, ආර්ටෙමිස් අතක් එසෙව්වා.

"කියාගෙන යන්න, පර්සි," දෙවඟන කිවුවා.

"හොඳයි, ඊට පස්සෙ මහා හැඳිගෑමක්-"

"කැලඹීමක්," බියන්කා නිවැරදි කළා.

"ඔව්. ඊට පස්සෙ එයා, 'ඉක්මනින් ම, වැදගත්ම රාක්ෂයා - ඔලිම්පස්වල විනාශය ගේන කෙනා අපිට ලැබේවි' කිවුවා."

දෙවඟන පිළිමයක් තරම් නිසොල්මන් වුණා.

"සමහරවිට එයා බොරු කියන්න ඇති," මම කිවුවා.



ආර්ටෙමිස් ඔළුව හෙල්ලුවා. "නෑ, බොරු නෙවෙයි. මම සලකුණු තේරුම් ගන්න පරක්කු වුණා වැඩියි. මම මේ රාක්ෂයා දඩයම් කරන්නම ඕනෑ."

ෂෝයි හිටියේ බය නොවී ඉන්න තදින් ම උත්සාහ කරනවා වගෙයි, කොහොම වුණත් එයා ඔළුව වැනුවා. "අපි මේ දැන්ම පිටත් වෙමු, මගේ උත්තමාවියනි."

"නැහැ, ෂෝයි. මම මේක තනියම කරන්න ඕනෑ."

"ඒත්, ආර්ටෙමිස්-"

"මේ කටයුත්ත දඩයක්කාරියන්ට වුණත් අනතුරුදායක වැඩියි. මම, මගේ සෙවිල්ල පටන් ගන්න ඕනෑ කොහෙන් ද කියලා ඔයා දන්නවා නේ. ඔයාලට මාත් එක්ක එහෙට යන්න බැහැ."

"එහ්... එහෙමයි, උත්තමාවියනි."

"මම මේ සතාව හොයාගන්නවා," ආර්ටෙමිස් ගිවිසුම් දුන්නා. "දක්ෂිණායනයට කලින් මම ඌව ඔලිම්පස්වලට අරන් එනවා. අපි ඉන්නේ කොච්චර ලොකු අනතුරක ද කියලා දෙවියන්ගේ මන්ත්‍රණ සභාවට ඔප්පු කරන්න මට ඒ සාක්ෂිය ඇති වෙයි."

"රාක්ෂයා මොකා ද කියලා ඔයා දන්නව ද?" මම ඇසුවා.

ආර්ටෙමිස් දුන්න තදින් අල්ලගත්තා. "මම හිතනවා වැරදි වෙන්න කියලා අපි යාඥා කරමු."

"දෙවඟනන්ටත් යාඥා කරන්න පුළුවන් ද?" මම ඇසුවේ, මීට කලින් කවදාවත් මම ඒ ගැන හිතලා තිබුණෙ නැති නිසයි.

ආර්ටෙමිස්ගේ තොල් අතරේ හිනාවක් ඇති වී, නැතිවුණා. "මම යන්න කලින්, පර්සි ජැක්සන්, ඔයාට පවරන්න පුංචි වැඩක් මගේ ළඟ තියෙනවා."

"ඒකෙ ජැකලොප් කෙනෙක්ට හැරෙන්න එහෙමත් තියෙනව ද?"

"අයියෝ, නැනේ. ඔයා දඩයක්කාරියන්ව අර්ධ-ලෝහිත කඳවුරට ඇරලන්න ඕනෑ. මම ආපහු එනකල් එයාලට එතැන පරිස්සමෙන් ඉන්න පුළුවන්."

"මොකක්?" ෂෝයි දොඩවන්න ගත්තා. "ඒත්, ආර්ටෙමිස්, අපි එතැනට වෛර කරනවා. අපි එතැන නැවතුණ අන්තිම වතාවේ-"

Scanned with CamScanner

"ඔව්, මම දන්නවා," ආර්ටෙමිස් කිව්වා. "ඒත් මට විශ්වාසයි ඩයනයිසියස් ඒ වගේ පුංචි, අහ්, වැරදි වැටහීමකට හිතේ කෝන්තරයක් තියාගෙන නැතුව ඇති. ඔයාලට උවමනා ඕනෑම වෙලාවක කැබින් අංක අට පාවිච්චි කරන්න ඔයාලට අයිතිය තියෙනවා. ඇරත්, ඔයාලා පුච්චලා දාපු කැබින් එක එයාලා ආපහු හදලා කියලා මට ආරංචියි."

ටෙසෝයි මෝඩ කඳවුරුකාරයෝ ගැන මොනවදෝ කෙඳිරුවා.

"එතකොට දැන්, තව අන්තිම තීරණයක් ගන්න තියෙනවා." ආර්ටෙමිස් බියන්කා වෙත හැරුණා. "ඔයා හිත හදාගත්ත ද, මගේ කෙල්ලේ?"

බියන්කා පැකිළුණා. "මම තාම ඒ ගැන හිතනවා."

"පොඩ්ඩක් ඉන්න," මම කිව්වා. "හිතන්නෙ මොනවා ගැන ද?"

"එයාලා... එයාලා මටත් දඩයක්කාරියන්ට එක වෙන්න කතා කළා."

"මොකක්?! ඒත් ඔයාට බැහැ. ඔයා අර්ධ-ලෝහිත කඳවුරට ඇවිත් කයිරොන්ගෙන් පුහුණු වෙන්න ඕනෑ. ඔයාට පණ බේරගෙන ජීවත් වෙන්න ඉගෙන ගන්න පුළුවන් එකම ක්‍රමේ තමයි ඒක."

"ගෑනු ළමයෙකුට තියෙන එකම ක්‍රමේ ඒක විතරක් නෙවෙයි," ටෙසෝයි කිව්වා.

මට මගේ කන් අදහා ගන්න බැරි වුණා. "බියන්කා, කඳවුර නියමයි! එහෙ පෙගසස් ඉස්තාල, කඩු සටන් පිට්ටනි එහෙමත් තියෙනවා. තව... මං කියන්නෙ, දඩයක්කාරියන්ට එකතු වෙලා ඔයාට මොනවද ලැබෙන්නේ?"

"මුල ඉඳන් කියනවා නම්," ටෙසෝයි කතා කළා, "අමරණීයත්වය."

මම එයා දෙසත්, ඊට පස්සේ ආර්ටෙමිස් දෙසත් බලා සිටියා. "එයා විහිළු කරනවා, නේද?"

"ටෙසෝයි කිසිම දෙයක් ගැන විහිළු කරන්නෙ කලාතුරකින්," ආර්ටෙමිස් කිව්වා. "මගේ දඩයක්කාරියෝ මම යන අනතුරුදායක ගමන්වලට එනවා. එයාලා තමයි මගේ සේවිකාවෝ, මගේ යාළුවෝ, මාත් එක්ක යුද්දෙට යන සහෝදරියෝ. එයාලා මට පක්ෂපාතී වෙන්න එක පාරක් දිවුරුවා ම, ඇත්තටම එයාලා අමරණීය වෙනවා... හැබැයි ඒ



එයාලා සටනක දී නොමැරුණොත් විතරයි, ඒත් එහෙම වෙන්න ඉඩක් ඇත්තෙම නැති තරම්. එහෙමත් නැත්නම් එයාලා දිවුරුම කැඩුවොත්."

"මොන දිවුරුම ද?" මම ඇසුවා.

"ප්‍රේම සම්බන්ධතාවලින් සදහට ම ඈත් වෙලා ඉන්න," ආර්ටෙමිස් කිව්වා. "කවදාවත් නොවැඩී ඉන්න, කවදාවත් විවාහ නොවෙන්න. සදහටම කන්‍යාවක්ව ඉන්න."

"ඔයා වගේ?"

දෙවඟන ඔළුව වැනුවා.

එයා කියන දේ හිතේ මවා ගන්න මම උත්සාහ කළා. අමරණීය වෙන්න. මධ්‍යම පාසල් ගෑනු ළමයි එක්ක සදහටම ජීවත් වෙන්න. මට ඒ ගැන හරියටම තේරුම් ගන්න බැරි වුණා. "එතකොට ඔයා රට වටේ ගිහිල්ලා අර්ධ-ලෝහිතයන්ව බඳවා ගන්නවා-"

"අර්ධ-ලෝහිතයෝ විතරක් නෙවෙයි," ටෙසෝයි බාධා කළා. "ආර්ටෙමිස් උත්තමාවිය උත්පත්තිය ගැන භේද සලකන්නෙ නැහැ. දෙවඟනට ගෞරව කරන ඕනෑම කෙනෙක්ට එකතු වෙන්න පුළුවන්. අර්ධ-ලෝහිතයින්ට, දේවතාවියන්ට, මනුෂ්‍ය දූරිවියන්ට-"

"එතකොට ඔයා මොන කෙනෙක් ද?"

ටෙසෝයිගේ ඇස්වල තරහක් දැල්වුණා. "ඒක තට අදාළ දෙයක් නෙවෙයි, කොල්ලෝ. වැදගත් ම කාරණේ තමයි, බියන්කා කැමති නම්, අපිට එකතු වෙන්න එයාට පුළුවන්. ඒක එයාගේ තෝරා ගැනීම."

"බියන්කා, මේක පිස්සුවක්," මම කිව්වා. "ඔයාගේ මල්ලිට මොකද වෙන්නේ? නිකෝට දඩයක්කාරයෙක් වෙන්න බැහැ නේ."

"කොහෙත්ම බැහැ," ආර්ටෙමිස් මගේ කතාවට එකඟ වුණා. ''එයා කඳවුරට යාවි. අවාසනාවට, කොල්ලන්ට කරන්න පුළුවන් හොඳම දේ ඒක විතරයි."

"හේයි!" මම විරෝධය පෑවා.

"ඔයාට කාලෙන් කාලෙට එයාව දකින්න ලැබේවි," ආර්ටෙමිස් බියන්කාගේ හිත හැදුවා. "ඒත් ඔයාට වගකීම්වලින් නිදහස ලැබෙනවා. කඳවුරේ උපදේශකයෝ එයාව බලා ගනී. ඒ වගේම ඔයාට අලුත් පවුලක් ලැබෙනවා. අපිව."

Scanned with CamScanner

"අලුත් පවුලක්," බියන්කා හීනෙන් වගේ කියෙවුවා. "වගකීම්වලින් නිදහස් වෙනවා."

"බියන්කා, ඔයාට මේක කරන්න බැහැ," මම කිවුවා. "ඒක පිස්සුවක්."

එයා ෂෝයි දිහා බැලුවා. "එහෙම කරන්න තරම් ඒක වටිනව ද?"

ෂෝයි ඔළුව වැනුවා. "ඔව්."

"මම මොනවද කරන්න ඕනෑ?"

"මේක කියන්න," ෂෝයි එයාට කිවුවා, "'මම, මාව ආර්ටෙමිස් දෙවඟනට කැප කරනවා.'"

"මම... මම, මාව ආර්ටෙමිස් දෙවඟනට කැප කරනවා."

"'මම පිරිමි ඇසුරට පිටුපා, සදාකාලික කන්‍යාභාවය පිළිගෙන, දඩයමට එකතු වෙනවා.'"

බියන්කා ඒ වචන නැවතත් කිවුවා. "එච්චර ද?"

ෂෝයි ඔළුව වැනුවා. "ආර්ටෙමිස් උත්තමාවිය තීගේ පොරොන්දුව පිළිගත්තොත්, බන්ධනය සිදුවෙනවා."

"මම එය පිළිගන්නවා," ආර්ටෙමිස් කිවුවා.

ගිනි අඟුරු බඳුනේ ගිනි දළු උස් වී, කාමරය පුරා රිදී පාට දීප්තියක් පැතිරුණා. බියන්කාගේ පෙනුමේ නම් වෙනසක් වුණේ නැහැ. ඒත් ගැඹුරු හුස්මක් ගත් එයා ඇස් පළල් කර ඇරියා. "මම... ශක්තිමත් වුණා වගේ දැනෙනවා."

"සාදරෙන් පිළිගන්නවා, සහෝදරී," ෂෝයි කිවුවා.

"ඔයාගේ පොරොන්දුව මතක තියාගන්න," ආර්ටෙමිස් කිවුවා. "දැන් ඒක තමයි ඔයාගේ ජීවිතය."

මට කතා කරගන්න බැරි වුණා. මට දැනුණේ මම වැරදිකාරයෙක් වගෙයි. ඒ වගේම මුළුමනින් ම පරාජිතයෙක් වගෙයි. මම මෙච්චර දුරක් ආවේ, මේ තරම් වද වින්දේ, අන්තිමේ දී අමරණීය ගෑනු ළමයින්ගේ සංගමේකට බියන්කාව දීලා යන්න ද කියලා මට විශ්වාස කරන්නත් බැරි වුණා.



"බලාපොරොත්තු නැති කරගන්නෙපා, පර්සි ජැක්සන්," ආර්ටෙමිස් කිවුවා. "ඩි ආන්ජෙලෝලාව ඔයාලගේ කඳවුරට අරන් යන්න ඔයාට තවමත් පුළුවන්. නිකෝ කැමති නම්, එයාට එහෙ නවතින්න පුළුවන්."

"නියමයි," මම කිවුවේ අවිනීත නොවෙන්න උත්සාහ කරමින්. "අපි එහෙට යන්නෙ කොහොමද?"

ආර්ටෙමිස් ඇස් වසාගත්තා. "එළි වෙන්න ළඟයි, ෂෝයි, කඳවුර ගලවන්න. ඔයාලා ඉක්මනින්, පරිස්සමෙන් ලෝන්ග් අයිලන්ඩ්වලට යන්න ඕනෑ. මම, මගේ සහෝදරයාගේ වාහනේ කැඳවන්නම්."

ඒ අදහසට ෂෝයි ඒ හැටි කැමැත්තක් පෙන්වූයේ නැතත්, ඔළුව වැනූ එයා බියන්කාට එයා පසුපස එන්න කියලා ගියා. යන අතරේ බියන්කා මගේ ඉදිරියේ නැවතුණා. "මට කණගාටුයි, පර්සි. ඒත් මට මේක ඕනෑ. මට ඇත්තටම, ඇත්තටම ඕනෑ."

ඊට පස්සේ අවුරුදු-දොළහේ-දෙවඟන ළඟ මාව තනි කරලා එයා පිටවුණා.

"ඉතින්," මම මූණ පුලුටු කරගෙන කතා කළා. "අපිට ඔයාගේ සහෝදරයාගේ වාහනේ යන්න ලැබෙනවා, හහ්?"

ආර්ටෙමිස්ගේ රිදී ඇස් දිලිසුණා. "ඔව්, කොල්ලෝ. ඔයාට පේනවා නේ, වදකාර සහෝදරයෝ ඉන්නේ බියන්කා ඩි ආන්ජෙලෝට විතරක් නෙවෙයි. ඔයාට මගේ වගකීමක් නැති නිවුන් සහෝදරයා, ඇපලෝ මුණගැහෙන්න වෙලාව ඇවිත්."

# 04

# තාලියා නිව් ඉංග්ලන්ඩ්වලට ගිනි තැබුවා

ඉර උදා වෙන්න ළඟ බව ආර්ටෙමිස් සහතික කළත්, එයා මාව මෝඩයා කළා වෙන්නත් පුළුවන්. එදා වෙන කවදාටත් වඩා සීතල, අඳුරු සහ හිමෙන් වැසුණු දවසක් වුණා. කඳු මුදුනේ වූ වෙස්ටෝවර් හෝල්වල විදුලි එළියක් දල්වෙන එක ජනේලයක්වත් පේන්න තිබුණේ නැහැ. ඩි ආන්ජෙලෝලා සහ ආචාර්ය තෝර්න් අතුරුදහන් වී ඇති බව තවමත් අනෙක් ගුරුවරුන්ට දැනගන්න ලැබිලා නැති ද හිතලා මම පුදුම වුණා. එයාලා ඒක හොයාගන්න වේලාවට මේ අහළ පහළ ඉන්න මට ඕනෑ වුණේ නැහැ. මගේ වේලාවටම, මිසිස් ගොට්ස්චෝක්ට මතක තියෙන එකම නම 'පර්සි ජැක්සන්' වෙයි. ඊට පස්සේ පොලීසිය මාව රට පුරා හොයන්න පටන් ගනීවි... ආයෙම සැරයක්.

දඩයක්කාරියෝ කඳවුර හැදුව ඉක්මනින්ම වගේ ආපසු ගැලෙව්වා. මම වෙවුලමින් හිමේ සිටගෙන සිටියා. ඒත් දඩයක්කාරියන්ට නම් සීතලෙන් කිසිම අපහසුවක් ඇති බවක් පෙනුණේ නැහැ. ආර්ටෙමිස් පෙරදිගට දෑස් යොමාගෙන හිටියේ යමක් බලාපොරොත්තුවෙන් වගෙයි. බියන්කා පැත්තක වාඩි වී නිකෝ සමග කතා කරමින් සිටියා. එයා දඩයක්කාරියන්ට එකතු වීමට ගත් තීරණය ගැන පැහැදිලි කරන බව නිකෝගේ අඳුරු වුණ මුහුණෙන්ම පෙනුණා. තමන්ගේ මල්ලිව ඒ විදියට අත ඇරලා දාන්න තරම් එයා කොච්චර ආත්මාර්ථකාමී ද නොහිතා ඉන්න මට බැරි වුණා.



තාලියා සහ ග්‍රෝවර් නැඟිට ඇවිත් මගේ ළඟ තෙරපෙමින් හිටගත්තේ දෙවඟන හමු වී කළ කතාබහේ දී සිදු වූ දේවල් දැනගන්න උවමනාවෙනුයි.

මම සිද්ධ වුණ දේවල් විස්තර කළා ම, ග්‍රෝවර් සුදුමැලි වුණා. "දඩයක්කාරියෝ අන්තිමට කඳවුරට ආපු වතාව නම් එච්චර හොඳ වුණේ නැහැ."

"එයාලා මෙතැනට ආවෙ කොහොමද?" මම පුදුම වුණා. "මං කියන්නේ, එයාලා එක පාරටම මෙතැනින් මතු වුණා නේ."

"ඒ මදිවට බියන්කාත් එයාලට එකතු වෙලා," තාලියා කිවුවේ කලකිරිලා වගෙයි. "මේ හැමදේම ෙzසෝයිගේ වැරැද්ද. ඒ ඔළුව ඉදිමිච්ච, වැදගැම්මකට නැති-"

"එයාට දොස් කියන්න පුළුවන් කාට ද?" ග්‍රෝවර් කිවුවා. "ආර්ටෙමිස් එක්ක සදහටම ඉන්නකොට?" එයා ලොකු සුසුමක් හෙළුවා.

තාලියා ඇස් කැරකුවා. "මේ සැටර්ලා නම්. ඔයාලා හැමෝම ඉන්නේ ආර්ටෙමිස්ට ආදරෙන් බැඳිලා. එයා කවදාවත් ඔයාලට ආදරේ කරන්නෙ නැහැ කියලා ඔයාලට තේරෙන්නෙ නැද්ද?"

"ඒත් එයා ගොඩාක්.... සොබාදහමට බරයි," ග්‍රෝවර් අවසිහියෙන් කියෙව්වා.

"ඔයා නම් මහ නට් එකක්," තාලියා කිවුවා.

"ඔව්," ග්‍රෝවර් හීනෙන් වගේ කියෙවුවා. "ෆ්‍රූට් ඇන්ඩ් නට්."

***

අන්තිමේ දී අහස ආලෝකමත් වෙන්න ගත්තා. "වේලාවටම වගේ," ආර්ටෙමිස් කෙඳිරුවා. "සීත කාලෙට එයා වස කම්මැලියි."

"ඔයා, මේ, ඉර පායනකල් ද බලන් ඉන්නේ?" මම ඇසුවා.

"ඔව්. මගේ සහෝදරයා එනකල්."

මට නොහික්මුණු විදිහට හැසිරෙන්න ඕනෑ වුණේ නැහැ. මං අදහස් කළේ, මම ඇපලෝ - නැත්නම් සමහර වෙලාවට හෙලියොස්- ලොකු සූර්ය යානයක් අහස හරහා පදවාගෙන යනවා කියන

ජනප්‍රවාදය අහලා තිබුණා. ඒත්, ඇත්තටම ඉර කියන්නේ සැතපුම් බිලියන ගාණක් ඈතින් තියෙන තරුවක් කියලත් මම දැනගෙන හිටියා. සමහර ග්‍රීක මිත්‍යා කතා සැබෑවක් බවට පත්වෙනවා මම අත්දැකලා තිබුණා තමයි, ඒ වුණත්... ඇපලෝ ඉර පදවන්නේ කොහොමද කියලා නම් මට කොහෙත්ම හිතාගන්න බැරි වුණා.

"ඒක ඔයා හිතනවා වගේ නෙවෙයි," ආර්ටෙමිස් කිවුවේ මගේ හිත කියෙවුවා වගෙයි.

"ඔහ්, හොඳයි," මම සැහැල්ලු වෙන්න පටන් ගත්තා. "ඒ කියන්නේ, එයා ඇවිල්ලා-"

එක්වරම ක්ෂිතිජය පුරා රැස් දහරාවක් පැතිරුණා. උණුසුම් වායු දහරාවක්.

"බලන්න එපා," ආර්ටෙමිස් උපදෙස් දුන්නා. "එයා ගාල් කරනකල් එපා."

ගාල් කරනකල්?

මම ඇස් වෙනතකට හරවා ගනිද්දී, අනෙක් ළමයිනුත් ඒකම කරනවා දකින්න ලැබුණා. මගේ ශීත කබාය උණු වෙලා වැගිරෙනවා වගේ දැනෙන තුරුම ආලෝකය සහ උණුසුම වැඩි වුණා. ඊට පස්සෙ එක්වරම එළිය නිවී ගියා.

මම ඒ දිහා බැලුවා. මට දකින්න ලැබුණ දේ විශ්වාස කරන්නත් බැරි වුණා. එතැන තිබුණේ මගේ කාරයයි. හොඳයි, ඇත්තටම, මට ඕනෑ කළ කාරය. ඒක රතු පාට, වහලය එසවිය හැකි, මැසරාටි ස්පයිඩර් කාරයක්. ඒක කොච්චර අපූරු ද කියනවා නම් ඒක දිලිසුණා. ඒත් එක්කම, ඒක දිලිසෙන්නේ ලෝහ ගිනියම් වී ඇති නිසා කියලා මට තේරුණා. මැසරාටිය වටා හරි රවුමක හැඩයට හිම දිය වී තිබුණා, දැන් මම තණකොළ උඩ හිටගෙන සිටීමටත්, මගේ සපත්තු තෙත් වී තිබීමටත් හේතුව එයින් පැහැදිලි වුණා.

කාරයේ රියැදුරා හිනාවක් පාමින් එළියට බැස්සා. එයාට තිබුණේ අවුරුදු දහ හතක හෝ දහ අටක විතර පෙනුමක්. එක තත්පරයකට, එයා මගේ පරණ හතුරා ලූක් ද කියලා මට නොසන්සුන් හැඟීමක් දැනුණා. මේ කොල්ලටත් තිබුණේ එයාට වගේම වැලි පාට කොණ්ඩයක් සහ කඩවසම් පෙනුමක්. ඒත් ඒ ලූක් නෙවෙයි. මෙයා ඊට වඩා උසයි, ඒ වගේම ලූක්ගේ වගේ මෙයාගේ කම්මුලේ කැළැලකුත්



නැහැ. එයාට දීප්තිමත් සහ සෙල්ලක්කාර හිනාවක් තිබුණා. ලූක් නම් මේ දවස්වල කරන්නේ රවන එකයි, විරිත්තන එකයි විතරයි. මැසරාටි රියැදුරා කලිසමකින්, අත් නැති ටී-ෂර්ට් එකකින් සහ සපත්තු කුට්ටමකින් සැරසී සිටියා.

"වාව්," තාලියා මිමිණුවා. "ඇපලෝ මාර හොට් නේ."

"ඉතින් එයා ඉර දෙවියා නේ," මම කිවුවා.

"මං කිවුවේ එහෙම නෙවෙයි."

"චූටි නගෝ!" ඇපලෝ කතා කළා. එයාගේ දත් තව ටිකක් සුදු වුණා නම්, සූර්ය යානය නැතුවම එයාට අපිව අන්ධ කරන්න තිබුණා. "ඉතින් කොහොමද? ඔයා කෝල් කරන්නෙත් නෑ. ලියුමක් ලියන්නෙත් නෑ. මම බය වෙලා හිටියේ!"

ආර්ටෙමිස් සුසුමක් හෙළුවා. "මම හොඳින්, ඇපලෝ. ඒ වගේම මම ඔයාගේ නංගි නෙවෙයි."

"හේයි, මම නේ මුලින් ඉපදුණේ."

"අපි නිවුන්නු! අපි මේ ගැන අවුරුදු කී දාහක්. වාද කරන්න ඕනෑ ද-"

"ඉතින් මොකද මෙහෙ වෙන්නේ?" එයා බාධා කළා. "මේ කෙල්ලො ටිකත් එක්ක. මට පේන්නේ, ඔයාලා හැමෝටම දුනු ශිල්පය ගැන උපදෙස් ඕනෑ වෙලා වගේ?"

ආර්ටෙමිස් දත්මිටි කෑවා. "මට උදවුවක් ඕනෑ. මට දඩයමක් කරන්න තියෙනවා, තනියම. ඔයා මගේ යාළුවන්ව අර්ධ-ලෝහිත කඳවුරට අරන් යන්න ඕනෑ."

"අනිවා, සහෝ!" ඊට පස්සේ එයා අතක් ඔසවමින් හැමදේම නවත්තන්න සංඥා කළා. "මට හයිකු කවියක් (පද පේළි තුනක කෙටි කවි වර්ගයක්.) එනවා දැනෙනවා."

දඩයක්කාරියෝ හැමෝම කෙඳිරි ගෑවා. පෙනුණු හැටියට, මීට කලිනුත් එයාලට ඇපලෝව මුණ ගැහිලා තියෙනවා වගෙයි.

උගුර පෑදුව එයා අතක් තාලෙට එසෙව්වා.

"කොළ තණකොළ හිම බිඳියි.

ආර්ටෙමිස් මගේ සහය යදියි.

Scanned with CamScanner

මම හරිම ඉස්තරම්."

එයා දත් නියවාගෙන, අපි අත්පුඩි ගහනකල් බලා සිටියා.

"අන්තිම පේළියේ මාත්‍රාව වැරදියි," ආර්ටෙමිස් කිවුවා.

ඇපලෝ රැව්වා. "එහෙමද?"

"ඔව්. *'මගේ ඔළුව හරිම තඩියි'* කියලා දැම්මොත් කොහොමද?"

"නෑ, නෑ, ඒක හරියන්නෑ. හ්ම්ම්..." එයා තනියම කොඳුරන්න ගත්තා.

ZEසෝයි නයිට්ෂේඩ් අපි දිහාවට හැරුණා. "ඇපලෝ උතුමා ජපානෙට ගිහින් ආව දවසේ ඉඳන් හයිකු කවි කියවනවා. හැබැයි එයා ලිමරික් ගිහින් ආව කාලේ තරම් මේක නරක නැහැ. *එකමත්තෙක කාලෙක ස්පාර්ටාවෙන් ආ දෙවඟනක් සිටියා,* කියලා පටන් ගන්න තව එක කවියක් හරි මට ඇහුණොත්-"

"මං හොයාගත්තා!" ඇපලෝ නිවේදනය කළා. "*මම නම් හරිම අපූරුයි.* ඒකෙ මාත්‍රාව ගැළපෙනවා!" එයා තමන් ගැනම ගොඩාක් සතුටු වෙමින් නැමී ආචාර කළා. "එතකොට, දැන්, සහෝ. ඔයා කිවුවේ දඩයක්කාරියන්ව එක්ක යන්න කියලා නේ? නියම වෙලාව. මම මේ යන්න ලෑස්ති වුණා විතරයි."

"මේ උප-දෙවිවරුන්ටත් යන්න ඕනෑ," ආර්ටෙමිස් අපිව පෙන්වමින් කිවුවා. "කයිරොන්ගේ කඳවුරුකාරයෝ ටිකක්."

"අවුලක් නෑ!" ඇපලෝ අපිව පරීක්ෂා කළා. "අපි බලමු... තාලියා, නේ? මම ඔයා ගැන හැමදේම අහලා තියෙනවා."

තාලියා රතු වුණා. "හායි, ඇපලෝ උතුමාණෙනි."

"සියුස්ගේ කෙල්ල, නේ? ඒ කියන්නෙ ඔයා මගේ අර්ධ සහෝදරී. ගහක් වෙලා හිටියා, නේ? ඔයා ආපහු ආවට සතුටුයි. ලස්සන කෙල්ලෝ ගස්වලට හැරෙන එක මට පේන්න බැරි වැඩක්. කොල්ලෝ, මට මතකයි එක සැරයක්-"

"සහෝදරයා," ආර්ටෙමිස් කතා කළා. "ඔයා දැන් ගියොත් හොඳයි."

"ඔහ්, හරි." ඊට පස්සේ මගේ දිහා බලපු එයාගේ ඇස් හීනි වුණා. "පර්සි ජැක්සන්?"

"ඔව්. මං කිවුවේ... ඔව්, සර්."



ගැටවරයෙකුට 'සර්' කියලා කතා කරන එක නුහුරු වුණත්, අමරණීය අයට කතා කරද්දී පරිස්සම් වෙන්න මම ඉගෙන ගෙන තිබුණා. එයාලා ලේසියෙන් හිත් අමනාප කරගන්නවා. ඊට පස්සේ එයාලා වටපිටාවේ තියෙන දේවල් කුඩු කරනවා.

ඇපලෝ මගේ දිහා සැලකිල්ලෙන් බලා සිටියත්, මුකුත් කිව්වේ නැහැ. ඒක නම් ටිකක් බය හිතෙන දෙයක් වුණා.

"හොඳයි!" ඇන්තිමේට එයා කිවුවා. "දැන් හැමෝවම පටව ගත්තොත් හොඳයි නේ? වාහනේ යන්නෙ එක පැත්තකට විතරයි- බටහිරට. ඔයාට ඒක මග ඇරුණොත්, මග ඇරුණාම තමයි."

මම මැසරාටිය දිහා බැලුවා, ඒකෙ යන්න ඉඩ තිබුණේ දෙන්නෙකුට විතරයි. ගමන යන්න අපි විසිදෙනෙක් විතර හිටියා.

"මරු කාර් එක," නිකෝ කිවුවා.

"ස්තුතියි, පොඩ්ඩෝ," ඇපලෝ කිවුවා.

"ඒත් අපි ඔක්කොම මේකෙ යන්නෙ කොහොමද?"

"ඔහ්," ඒ ගැන ඇපලෝට මතක් වුණේ එතකොටයි. "හොඳයි, ඔව්. ස්පෝර්ට්ස් කාර් එක වෙනස් කරන්න මම කැමතිම නැහැ, ඒත් මට හිතෙන්නේ..." කාරයේ යතුරු කැරැල්ල අතට ගත් එයා එහි ආරක්ෂක සංඥා බොත්තම එබුවා. *චර්ප්, චර්ප්.*

මොහොතකින් කාරය නැවතත් දීප්තිමත්ව බබළන්න පටන් ගත්තා. දීප්තිය පහ වී ගියාම දකින්න ලැබුණේ මැසරාටි කාරය අපි ඉස්කෝලේ පැසිපන්දු තරගවලට යන්න පාවිච්චි කරන ටර්ට්ල් ටොප් බසයකට හැරී ඇති හැටියි.

"හරි," එයා කිවුවා. "හැමෝම නගින්න."

දඩයක්කාරියන්ට බඩු පටවන්න ZEසෝයි නියෝග කළා. එයා, එයාගේ කඳවුරු උපකරණ මල්ල අතට ගනිද්දී ඇපලෝ කතා කළා, "ඕක මෙහෙට දෙන්න, වස්තුවේ. මම ගෙනියන්නම්."

ZEසෝයි පස්සට පැන්නා. එයාගේ ඇස් දරුණු ලෙස දැල්වුණා.

"සහෝදරයා," ආර්ටෙමිස් දොස් කිවුවා. "ඔයාට මගේ දඩයක්කාරියන්ට උදවු කරන්න බැහැ. ඔයාට එයාලා දිහා බලන්නවත්, එයාලා එක්ක කතා කරන්නවත්, එයාලට උකුළු මුකුළු කරන්නවත් බැහැ. ඒ වගේම, එයාලට වස්තුව කියලා කතා කරන්නත් ඔයාට බැහැ."

Scanned with CamScanner

ඇපලෝ දැන් දෙපසට විහිදුවා. "සමාවෙන්න. මට අමතක වුණා. කොහොමහරි, ඔයා කොහෙද යන්න හදන්නෙ, සහෝ?"

"දඩයමේ," ආර්ටෙමිස් කිවුවා. "ඒකෙන් ඔයාට වැඩක් නැහැ."

"මම හොයාගන්නම්කෝ. මම හැමදේම දකිනවා. හැමදේම දන්නවා."

ආර්ටෙමිස් මහ හඬින් නහයෙන් පිම්බා. "මෙයාලව ගිහින් දාන එක විතරක් කරන්නකෝ, ඇපලෝ. වටපිටාව අවුල් කරන්නෙ එහෙම නෑ."

"නෑ, නෑ! මම කවදාවත් එහෙම කරන්නෑ."

ඇස් කැරකූ ආර්ටෙමිස් ඊට පස්සේ අපි දිහා බැලුවා. "දක්ෂිණායනයේ දී මට ඔයාලව දකින්න ලැබෙයි. ෂෝයි, දඩයක්කාරියන්ව ඔයාට බාරයි. හොඳින් වැඩ කරන්න. මම කරන විදිහට කරන්න."

ෂෝයි කෙලින් වුණා. "එහෙමයි, මගේ උත්තමාවිය."

දණ ගසාගත් ආර්ටෙමිස් අඩි සටහන් හොයනවා වගේ පොළොව අත ගෑවා. ආපසු නැගිටිද්දී එයාගේ මුහුණේ තිබුණේ කරදරකාරී බැල්මක්. "ගොඩක් ලොකු අනතුරක්. මේ සතාව හොයා ගන්නම වෙනවා."

කැලය දිහාවට දිව ගිය එයා හිම සහ හෙවණැලි අතරට දිය වුණා.

ආපසු හැරුණු ඇපලෝ යතුරු කැරැල්ල ඇඟිල්ලකින් කරකවමින් දත් නියෙව්වා. "ඉතින්, ඉතින්," එයා කිවුවා. "කාට ද ඕනෑ වාහනේ එළවන්න?"

★★★

දඩයක්කාරියෝ වාහනයට ගොඩ වුණා. එයාලා ඇපලෝ සහ අනෙක් වසංගත වාහක පිරිමින්ගෙන් හැකිතාක් ඈත්වෙලා, වාහනයේ පසුපසම අසුනේ හිරවී වාඩි වුණා. වාහනයේ ඉදිරි කොටසේ සිටි අපි ළඟ නිකෝව තියලා බියන්කාත් එයාලට එකතු වුණා. ඒක නපුරු වැඩක් කියලා මට හිතුණත් නිකෝට නම් ඒ ගැන වගක් නෑ වගෙයි.

"මේක නම් මරේ මරු!" රියැදුරු අසුනේ උඩ පනිමින් නිකෝ කිවුවා. "ඇත්තටම මේ ඉර ද? මං හිතන් හිටියේ හෙලියොස්, සෙලෙන්



දෙන්නා ඉර, හඳ කියලා. සමහර වෙලාවට ඒ එයාලයි, සමහර වෙලාවට ඒ ඔයයි, ආර්ටෙමිසුයි වෙන්නෙ කොහොමද?"

"කප්පාදු කිරීම," ඇපලෝ කිවුවා. "ඒක පටන් ගත්තේ රෝමන්කාරයෝ. එයාලට මේ දේවස්ථාන ඔක්කොටම පූජා තියන්න බැරි නිසා, එයාලා හෙලියොස්වයි, සෙලෙන්වයි පැත්තකට දාලා, ඒ දෙන්නගේ රාජකාරිත් අපේ වැඩ ගොඩට දැම්මා. මගේ සහෝට හඳ ලැබුණා. මට ඉර ලැබුණා. මුල දී නම් ඒක මහ වදයක් වුණා, ඒත් අඩු තරමේ මට මේ කාර් එකවත් ලැබුණා නේ."

"ඒත් කොහොමද ඒක වැඩ කරන්නේ?" නිකෝ ඇසුවා. "මං හිතන් හිටියේ ඉර කියන්නේ ගිනි ගන්න තඩි ගෑස් බෝලයක් කියලා!"

තනියම හිනාවුණ ඇපලෝ නිකෝගේ කොණ්ඩය ඇවිස්සුවා. "මට හිතෙන්නේ ඔය කටකතාව පැතිරෙන්න ඇත්තේ ආර්ටෙමිස් මට ගිනි ගන්න තඩි ගෑස් බෝලෙ කියලා කතා කරන්න පුරුදු වෙලා හිටපු නිසා වෙන්නැති. ඇත්තටම, පොඩ්ඩෝ, ඒක රඳා පවතින්නේ ඔයා කතා කරන්නේ තාරකා විද්‍යාවෙන් ද නැත්නම් දර්ශන විද්‍යාවෙන් ද කියන කාරණේ උඩ. ඔයාට තාරකා විද්‍යාව පැත්තෙන් කතා කරන්න ද ඕනෑ? බැහ්, මොකක්ද ඒකෙ තියෙන ජොලිය? මිනිස්සු ඉර ගැන හිතන විදිය ඔයාට කතා කරන්න ඕනෑ ද? අහ්, අන්න ඒක නම් ආසා හිතෙන වැඩක්. එයාලා ගොඩක් ඉර එක්ක යනවා... එර්ර්, කතාවට කියන්නේ එහෙමයි. ඒක එයාලව උණුසුම් කරනවා, එයාලගේ වගාවන් වවනවා, එන්ජින්වලට බලශක්තිය දෙනවා, හැමදේම වඩාත්, හොඳයි, ප්‍රබෝධමත් කරනවා. මේ කරත්තය හදලා තියෙන්නෙ මිනිස්සු ඉර ගැන දැකපු හීනවලින්, පොඩ්ඩෝ. ඒක බටහිර ශිෂ්ටාචාරය තරම්ම පරණයි. හැම දවසකම, ඒක අහස හරහා නැගෙනහිරෙන් බටහිරට පදවාගෙන ගිහින්, පුංචි මිනිස් ජීවිත එළිය කරනවා. මිනිස්සු දකින විදිහට, මේ කරත්තයෙන් ඉරේ බලය විද්‍යාමාන වෙනවා. තේරුණා ද?"

නිකෝ ඔළුව වැනුවා. "නැහැ."

"හොඳයි, එහෙනම්, මේක ගොඩාක් බලවත්, ගොඩාක් අනතුරුදායක, සූර්ය බලයෙන් වැඩ කරන කාර් එකක් කියලා හිතාගන්නකෝ."

"මට එළවන්න පුළුවන් ද?"

"බැහැ. පුංචි වැඩියි."

Scanned with CamScanner

"ඕ! ඕ!" ග්‍රෝවර් අතක් එසෙව්වා.

"ම්ම්, නැහැ," ඇපලෝ කිවුවා. "ලොම් වැඩියි." එයාගේ බැල්ම මාව පසුකර ගිහින් තාලියා ළඟ නැවතුණා.

"සියුස්ගේ දුව!" එයා කිවුවා. "අහසට අධිපති. නියමයි."

"ඔහ්, නෑ." තාලියා ඔළුව හෙල්ලුවා. "එපා, ස්තුතියි."

"මෙහෙ එන්න," ඇපලෝ කිවුවා. "ඔයාගේ වයස කීය ද?"

තාලියා පැකිළුණා. "මම දන්නෑ."

දුක්බර වුණත් ඒ කතාව ඇත්තක්. එයාව ගහකට හැරිලා තිබුණේ වයස අවුරුදු දොළහේදියි, ඒත් ඒ මීට අවුරුදු හතකට කලින්. එතකොට, අවුරුදුවලින් බැලුවොත්, එයාට දැන් දහ නමයක් වෙන්න ඕනෑ. ඒත් එයාට තවමත් දැනුණේ වයස අවුරුදු දොළහක් වගෙයි. එයා දිහා බලද්දී අපිට පෙනුණේ එයා ඒ අතරමැද වයසක ඉන්නවා වගෙයි. කයිරොන්ට තේරුම් කළ හැකි වූ තරමට, තාලියා ගහක් වෙලා හිටපු කාලයේදිත් නොනැවතී වයස්ගත වෙලා, ඒත් ඒක සිදු වෙන්න ඇත්තේ මන්දගාමීවයි.

ඇපලෝ ඇඟිල්ලකින් තොලට තට්ටු කරගත්තා. "ඔයාට පහළොවයි, දාසය ලබන්න ළඟයි."

"ඔයා කොහොමද ඒක දන්නේ?"

"හේයි, මම තමයි අනාවැකිවලට අධිපති දෙවියා. මම ඒවා දන්නවා. තව සතියකින් විතර ඔයාට දාසය ලබනවා."

"ඒ මගේ උපන්දිනේ! දෙසැම්බර් විසි එක."

"ඒ කියන්නෙ ආධුනික රියැදුරු බලපත්‍රයකින් වාහන එළවන්න ඔයාට වයස ඇති."

තාලියා කලබලෙන් කකුල් මාරු කළා. "අහ්-"

"ඔයා කියන්න හදන දේ මම දන්නවා," ඇපලෝ කිවුවා. "සූර්ය යානය පදවනවා වගේ ගෞරවයක් ලබන්න තරම් ඔයා සුදුසු නැහැ කියලා නේ."

"මං කියන්න හැදුවෙ ඒක නෙවෙයි."

"බය වෙන්න දෙයක් නෑ! මයින්වල ඉඳලා ලෝන්ග් අයිලන්ඩ්වලට තියෙන්නෙ බොහොම පොඩි දුරක්. ඒ වගේම, මම



පුහුණු කරවපු අන්තිම ළමයට වෙච්ච දේ ගැනත් වද වෙන්න ඕනෑ නැහැ. ඔයා සියුස්ගේ දුව නේ. එයා ඔයාව අහසෙදිම කුඩු කරන්නෙ නැති වෙයි."

ඇපලෝ මහ හඬින් හිනා වුණා. අපි නම් එයාගේ හිනාවට හවුල් වුණේ නැහැ.

තාලියා විරෝධය පාන්න උත්සාහ කළත්, 'බැහැ' කියන වචනය උත්තරයක් විදිහට බාරගන්න ඇපලෝ කොහෙත්ම සූදානම් වුණේ නැහැ. එයා උපකරණ පුවරුවේ වූ බොත්තමක් තද කළා, ඒත් එක්කම සුළං ආවරණය මුඳුනින් සංඥුවක් ඉහළට මතු වුණා. මට ඒක කියවන්න සිද්ධ වුණේ ආපස්සටයි. වචන අන්ධතාවය ඇති කෙනෙක් හැටියට ඒක ඉදිරියට කියවනවාට වඩා වැඩි වෙනසක් නම් නැහැ. එයින් පෙන්නුම් කළේ 'අවවාදයයි : ආධුනික රියැදුරෙක්' බව මට හොඳටම විශ්වාසයි.

ඒක අරන් යමු! ඇපලෝ තාලියාට කිවුවා. "ඔයාට පුළුවන්!"

★★★

ඒ වෙලාවේ මට ඉරිසියාවක් දැනුණු බව මම පිළිගන්න ඕනෑ. වාහන පදවන්න ලැබෙන තුරු මම හිටියේ ඉවසිල්ලක් නැතිවයි. වෙරළබඩ පාර පාළුවට ගිය හේමන්තයේ දී මගේ අම්මා මාව මොන්ටවුක්වලට කැඳවාගෙන ගියා. එහිදී එයා මට එයාගේ මැස්ඩා රථය පදවන්න උත්සාහ කරන්නත් ඉඩ දුන්නා. මං කියන්නේ, ඇත්තටම, ඒක ජපන් වාහනයක්- මේක සූර්ය යානය කියලා මං දන්නවා, ඒත් මොකක්ද තියෙන්න පුළුවන් වෙනස?

"වාහනේ රත් වෙන්නෙ වේගයට සමානවයි," ඇපලෝ උපදෙස් දුන්නා. "ඒ නිසා හෙමීට පටන් ගන්න, ඒ වගේම වේගය වැඩි කරන්න කලින් සෑහෙන උසකට යන්න මතක තියාගන්න."

තාලියා සුක්කානම කොයි තරම් තදින් මිරිකා ගත්ත ද කියනවා නම්, එයාගේ ඇඟිලි කෙළවර සුදු පාටට හැරුණා. එයා හිටියේ අසනීප වෙන්න වගෙයි.

"මොකක්ද ප්‍රශ්නේ?" මම එයාගෙන් ඇසුවා.

"මුකුත් නෑ," එයා ගැහෙමින් කිවුවා. "ම්- මුකුත් ප්‍රශ්නයක් නෑ."

Scanned with CamScanner

එයා සුක්කානම ආපස්සට ඇද්දා. එය පැත්තකට ඇල වෙද්දී, බසය වේගයෙන් උඩු අතට ඇල වුණේ මාව ආපස්සට විසි කරමිනුයි. මම මොකක්දෝ මෘදු දෙයක් උඩට ඇද වැටුණා.

"ඌයි," ග්‍රෝවර් කෑගැසුවා.

"සමා වෙන්න."

"හෙමින්!" ඇපලෝ කිවුවා.

"සමා වෙන්න!" තාලියා කිවුවා. "මම ඒක පාලනේ කරගෙනයි ඉන්නේ!"

මම අමාරුවෙන් දෙපයින් හිටගත්තා. ජනේලයෙන් පිටත බැලූ මට දකින්න ලැබුණේ අපි ඉහළ නැංවූ එළිමහන් බිමේ වූ ගස් වළල්ලක් දුම් දමන හැටියි.

"තාලියා," මම කතා කළා, "ඇක්සලරේටරය බුරුල් කරන්න."

"මට මේක පුළුවන්, පර්සි," එයා දත්මිටි කාගෙන කිවුවත් ඒක බිමටම පාගගෙන හිටියා.

"බුරුල් කරන්න," මම එයාට කිවුවා.

"මම බුරුල්!" එයා කිවුවා. ඒත් එයා කොයි තරම් දරදඬු වෙලා හිටිය ද කියනවා නම්, එයාව පෙනුණේ ලීවලින් හදලා වගෙයි.

"ලෝන්ග් අයිලන්ඩ්වලට යන්න අපි දකුණට යන්න ඕනෑ," ඇපලෝ කිවුවා. "වමට කපන්න."

මට ආයෙමත් ග්‍රෝවර්ගේ ඇඟට වැටෙන්න සලස්වමින් තාලියා සුක්කානම ගැස්සුවා. ග්‍රෝවර් වේදනාවෙන් කෑගැසුවා.

"අනිත් වමට," ඇපලෝ යෝජනා කළා.

ආපසු ජනේලයෙන් පිටත බලලා මම කරගත්තේ ලොකු වැරැද්දක්. අපි දැන් සිටියේ ගුවන් යානයක් යන උඩින්- කොයි තරම් උසින් ද කියනවා නම් අහසත් පෙනුණේ කළු පාටින්.

"අහ්..." ඇපලෝ කියද්දි, එයා කටහඬ සන්සුන් කරගන්න එයාටම බල කරනවා කියලා මට හැඟුණා. "තව චුට්ටක් පහළට, වස්තුවේ. කේප් කොඩ් ගල්වෙන තරම් සීතලයි."

තාලියා සුක්කානම ඇල කරා. එයාගේ මූණ හුණු වගේ සුදුමැලි පාටට හැරිලා, නළල පුරා දාඩිය බිංදු මතු වෙලා තිබුණා.



එයාට මොකක්දෝ ලොකු ප්‍රශ්නයක් තිබුණා. මීට කලින් මම කවදාවත් එයාව මේ විදිහට දැකලා තිබුණේ නැහැ.

බසය පහළට වැටෙන්න ගනිද්දී කවුදෝ යටිගිරියෙන් බෙරිහන් දුන්නා. සමහරවිට ඒ මම වෙන්නැති. දැන් අපි පැයට සැතපුම් දාහක වේගයෙන් කෙලින්ම අත්ලාන්තික් සාගරය දෙසට ඇද වැටෙමින් සිටියා. නිව් ඉංග්ලන්ඩ් වෙරළ තීරය අපේ දකුණු පැත්තෙන් පෙනෙන්න තිබුණා. ඒ මදිවට බසය ඇතුළේ උණුසුම වැඩිවෙන්න ගත්තා. ඇපලෝව බසය පිටුපස කොහේටදෝ විසි වී තිබුණත්, එයා ආසන දිගේ බඩගාමින් ආපහු ඉදිරියට එන්න ගත්තා.

"සුක්කානම ගන්නකෝ!" ග්‍රෝවර් එයාට බැගෑපත් වුණා.

"බය වෙන්න දෙයක් නෑ," ඇපලෝ කිවුවත්, එයත් හිටියේ සෑහෙන බය වෙලා වගෙයි. "එයා ඉගෙන ගන්න ඕනෑ - හෝ!"

එයා දකිමින් සිටි දේ මටත් පෙනුණා. අපිට පහළින් තරමක් හිමෙන් වැසී නිව් ඉංග්ලන්ඩ් නගරය තිබුණා. අඩු තරමේ, මුල දී ඒක තිබුණේ හිමෙන් වැහිලයි. මම බලා සිටිද්දී ම ගස්වල, වහල උඩ සහ වැටවල් උඩ තිබුණු හිම දිය වී ගියා. පල්ලියක කොතක් දුඹුරු පාටට හැරී දුම් දමන්න පටන් ගත්තා. උපන්දින කේක් ගෙඩියක ගැසූ ඉටි පන්දම් වගේ මුළු නගරය පුරාම තැන් තැන්වලින් දුම්රොටු ඉහළ නඟිමින් තිබුණා. ගස්වලට සහ වහලවලට ගිනි ඇවිළුණා.

"උඩට යන්න!" මම මොර ගැසුවා.

තාලියාගේ ඇස්වල තිබුණේ වල්මත් බැල්මක්. එයා නැවත වරක් සුක්කානම ආපස්සට අදිද්දී මම අල්ලගෙන හිටියා. අපි ඉහළ නැගෙද්දී, නගරයේ පැතිරුණ ගින්න හදිසි සීත සුළං ධාරාවකට හසු වී නිවී යනවා මට පිටුපස ජනේලයෙන් පෙනුණා.

"අන්න!" ඇපලෝ පෙන්වූවා. "ලෝන්ග් අයිලන්ඩ්, කෙලින්ම ඉස්සරහින්. අපි වේගය අඩු කරමු, කෙල්ලේ. කාටවත් දැන්ම මැරෙන්න ආසාවක් නෑනේ."

උතුරු ලෝන්ග් අයිලන්ඩ් වෙරළ තීරය දෙසට තාලියා අකුණක් වගේ පාත් වුණා. දෙණිබිමෙන්, කැලෑවෙන් සහ වෙරළෙන් සමන්විත අර්ධ-ලෝහිත කඳවුර පිහිටා තිබුණේ එතැනයි. එහි භෝජන මණ්ඩපයත්, කැබින් සහ රංගාවාටයත් මට දැකගත හැකි වුණා.

Scanned with CamScanner

"මම මේක පාලනේ කරන් ඉන්නේ," තාලියා කෙඳිරුවා. "මම මේක පාලනේ කරන් ඉන්නේ."

අපිට තිබුණේ තවත් යාර සිය ගාණක දුරක් විතරයි.

"බ්‍රේක්," ඇපලෝ කිවුවා.

"මට මේක කරන්න පුළුවන්."

"බ්‍රේක්!!"

තාලියා තිරිංග පෑගුවා. ඒත් එක්කම අංශක හතලිස් පහක් ඇල වූ සූර්ය බසය 'ජබෝස්' හඬ නගමින් කඳවුරේ ඔරු පදින විලට ඇද වැටුණා. විලෙන් වාෂ්ප පිඹින්න ගත්තේ භීතියට පත් වූ ජල දෙවඟනෝ කීපදෙනෙකුට, එයාලා බාගෙට විදූ වේවැල් කූඩාත් අරන් වතුරෙන් ගොඩට බඩ ගාන්න සලස්වමින්.

නොපිට පෙරළී, බාගෙට උණු වූ ඔරු දෙකක් සමග බසය වතුර මතුපිටට ආවා.

"හොඳයි," ඇපලෝ නිර්භීත හිනාවක් පාමින් කිවුවා. "ඔයා කිවුවා හරි, මගෙ කෙල්ලේ. ඔයා හැමදේම පාලනය කරගත්තා! දැන් අපි ගිහින් බලමු අපි කවුරුහරි වැදගත් කෙනෙක්ව එහෙම තම්බලා ද කියලා, හරි ද?"

# 05
# මට වතුර යටට දුරකථන ඇමතුමක් ගත්තා

මීට කලින් කවදාවත් මට ශීත සෘතුවේ දී අර්ධ-ලෝහිත කඳවුර දකින්න ලැබී තිබුණේ නැහැ. එහි හිම වැටිලා තියෙනවා දැකලා මම පුදුම වුණා.

මේකනේ වැඩේ, අපේ කඳවුරේ කාලගුණය පාලනය වුණේ මායාවකින්. ඉතින්, අධ්‍යක්ෂක මිස්ටර් ඩීට උවමනා නැති කිසිම දේකට බැම්වලින් මෙපිටට එන්න ඉඩක් තිබුණේ නැහැ. ඒ නිසා එහි ඉර පායලා, උණුසුම්ව ඇති කියලා මම බලාපොරොත්තු වුණා. ඒත් ඒ වෙනුවට කඳවුරට යාන්තමින් හිම පතනය වෙන්න ඉඩ හැර තිබුණා. කරත්ත ධාවන පථ සහ ස්ට්‍රෝබෙරි කෙත් තුහිනවලින් වැහිලා. කැබින් කාමර සියල්ලක්ම නත්තල් විදුලි බුබුළු රැහැන් වගේ චූටි නිවෙන-දැල්වෙන එළිවලින් සරසා තිබුණා. හැබැයි මේවා නම් ඇත්තම ගිනි බෝල වගෙයි පෙනුණේ. කැලයේ තවත් එළි දිලිසෙනවා පෙනුණා. මේ හැමදේම අතරින් පුදුමාකාරම දේ වුණේ, බෙහෙත් ගල්වා සංරක්ෂණය කළ මමියක් තුළ හිරවී සිටි ඔරකල්ගේ වාසස්ථානය වූ මහ ගෙදර අට්ටාලයේ ජනේලයෙනුත් ගිනිමැලයක් දැල්වෙනවා පෙනුණු එකයි. එතැනට වෙලා ඩෙල්ෆිගේ ආත්මයත් මාෂ්මෙලෝස් පුච්චනව ද හිතලා මම පුදුම වුණා.

"වාව්," බසයෙන් බහිමින් නිකෝ කෑගැසුවා. "අර නගින බිත්තියක් ද?"

"ඔව්," මම උත්තර දුන්නා.

Scanned with CamScanner

"ඇයි ඒක දිගේ ලාවා වැක්කෙරෙන්නේ?"

"අභියෝගය ටිකක් වැඩි කරන්න. එන්න යමු. මම ඔයාලට කයිරොන්ව මුණ ගස්සන්නම්. ෂෙසාර්යි, ඔයාට මුණ ගැහිලා තියෙනව ද-"

"මම කයිරොන්ව දන්නවා," ෂෙසාර්යි දරදඬුව කිවුවා. "එයාට කියන්න අපි කැබින් අංක අටේ ඉන්නවා කියලා. දඩයක්කාරියනි, මා පසුපස එනු."

"මම ඔයාලට පාර පෙන්වන්නම්," ග්‍රෝවර් ඉදිරිපත් වුණා.

"අපි පාර දන්නවා."

"ඔහ්, ඇත්ත ද, ඒක කරදරයක් නෙවෙයි. ඔයා දන්නෙ නැත්නම්, මෙහෙ දී අතරමං වෙන්න ලේසි-" ඔරුවක හැප්පිලා වැටුණත් එයාගේ කියවිල්ල නම් නැවතුනේ නැහැ. "-ඉස්සර මගේ එළු තාත්තා කියන්න පුරුදු වෙලා හිටියේ එහෙමයි! එන්න යමු!"

ෂෙසාර්යි ඇස් දෙක කැරකුවා, ඒත් මට හිතෙන්නේ, ග්‍රෝවර්ගෙන් ගැලවීමක් නොලැබෙන බව එයාටම තේරුම් යන්න ඇති. ගමන් මලු සහ දුනු කරේ දමාගත් දඩයක්කාරියෝ කැබින් දිහාවට පිටත් වුණා. යන ගමන් බියන්කා ඩි ආන්ජෙලෝ ඉදිරියට නැමිලා එයාගේ මල්ලිගේ කනට යමක් කෙඳිරුවා. එයා උත්තරයක් බලාපොරොත්තුවෙන් නිකෝ දිහා බැලුවත්, නිකෝ තරහෙන් රවලා අහක බලා ගත්තා.

"පරිස්සමෙන් ඉන්න, වස්තුවේ!" දුර යන දඩයක්කාරියන්ට කෑගසා කියූ ඇපලෝ මට ඇහැක් ගැහුවා. "අර අනාවැකි ගැන බලාගෙන, පර්සි. අපි ඉක්මනටම ආපහු මුණ ගැහෙයි."

"ඒ කිවුවේ?"

පිළිතුරු දෙනවා වෙනුවට එයා ආපසු බසය තුළට පැන්නා. "පස්සෙ වෙලාවක හම්බ වෙමු, තාලියා," එයා කෑගසා කිවුවා. "ඒ වගේම, අහ්, හොඳ ළමයෙක් වෙන්න!"

එයා තාලියාට අමුතු හිනාවක් පෑවේ හරියට තාලියා නොදන්න දෙයක් එයා දන්නවා වගෙයි. ඊට පස්සෙ දොර වැසූ එයා එන්ජිම පණ ගැන්වූවා. උණුසුම් වායු දහරාවක් සමග සූර්ය යානය එතැනින් පිට වෙද්දී මම අනෙක් පැත්තට හැරුණා. මම ආපසු හැරී බලද්දී විලෙන් දුම් දමමින් තිබුණා. කැලයට ඉහළ අහසට පියාසර කළ රතු



මැසරාටි කාරයක් දීප්තිමත්ව බබළමින් ඉහළටම නැගී හිරු කිරණක් තුළ නොපෙනී ගියා.

නිකෝ තවමත් හිටියේ තරහෙන් වගෙයි. එයාගේ අක්කා එයාට මොනවා කියන්න ඇති ද, මම පුදුමයෙන් කල්පනා කළා.

"කවුද කයිරොන් කියන්නේ?" එයා ඇසුවා. "මගේ ළඟ එයාගේ රූපයක් නැනේ."

"අපේ ක්‍රියාකාරකම් අධ්‍යක්ෂක," මම කිවුවා. "එයා... හොඳයි, ඔයාම බලාගන්නකෝ."

"අර දඩයක්කාර කෙල්ලෝ එයාට කැමති නැත්නම්," නිකෝ කිවුවා. "මට ඒ ඇති. අපි යමු."

★★★

කඳවුර ගැන මම දෙවෙනියට පුදුම වුණේ එය හිස් වී ඇති හැටි දැකලයි. මං අදහස් කළේ, කඳවුරුකරුවෝ බොහෝමයක් දෙනා පුහුණුවීම් කරන්නේ ගිම්හාන කාලයේ දී විතරයි කියලා මං දැනගෙන හිටියා. අවුරුද්ද පුරා ම කඳවුරේ ඉන්නේ තමන්ටම කියලා ගෙදරක් නැති, අවුරුද්දම කඳවුරේ ගත කරන අය සහ මෙතැනින් පිටවුණොත් රාක්ෂ ප්‍රහාරවලට තදින්ම ගොදුරු වෙන්න ඉඩ ඇති අය විතරයි. ඒත්, එයාලාගෙන්වත් වැඩි දෙනෙක් නැහැ වගෙයි.

හෙෆාස්ටස් කැබිනයේ චාර්ල්ස් බෙකන්ඩොර්ෆ් කඳවුරු ආයුධ ගබඩාව ඉදිරියේ වූ කම්මලේ ගිනි අවුලමින් ඉන්නවා මම දැක්කා. හර්මීස් කැබිනයේ ස්ටොල් සහෝදරයෝ, ට්‍රැවිස් සහ කොනර් කඳවුරු ගබඩාවේ අගුලේ මළකඩ සුද්ධ කරමින් සිටියා. ඒරීස් කැබිනයේ ළමයි කීපදෙනෙක් කැලය අද්දර සිටි වන දේවතාවෝ එක්ක හිම බෝල සටනක යෙදී සිටියා. කඳවුරටම හිටියේ එයාලා විතරයි. අඩු තරමේ, ඒරීස් කැබිනයේ මගේ පරණ තරහකාරි, ක්ලැරිස්වත් පේන්න හිටියේ නැහැ.

රතු සහ කහ ගිනි බෝල වැල්වලින් මහ ගෙදර සරසා තිබුණා. ඒවා පියස්සට උණුසුම ලබා දුන්නත්, එයින් කිසිවකට ගිනි ඇවිළුනේ නම් නැහැ. ගේ ඇතුළේ උඳුන තුළ ගින්නක් සටපට හඬ නගමින් ඇවිළුණා. උණු චොකලට් සුවඳක් සුළඟේ දැවටී ආවා. සාලයේ කඳවුරු

අධ්‍යක්ෂක, මිස්ටර් ඩී සහ කයිරොන් නිසොල්මනේ කාඩ් ක්‍රීඩාවක නියැළී සිටියා.

ශීත සෘතුව වෙනුවෙන් කයිරොන්ගේ දුඹුරු පාට රැවුල ගනව වැවී තිබුණා. එයාගේ කැරලි කොණ්ඩයත් තරමක් දිගු වෙලා. මේ අවුරුද්දේ එයා ගුරුවරයෙක් වගේ පෙනී සිටියේ නැහැ, ඒ නිසා එයාට සාමාන්‍ය ඇඳුමෙන් සැරසෙන්න බාධාවක් නැති වෙන්න ඇති. කුර සලකුණු මෝස්තරයක් වැටුණු ස්වෙටරයක් හැඳ සිටි එයා ඔඩොක්කුව මතින් දමාගෙන සිටි බ්ලැන්කෙට්ටුවෙන් එයාගේ රෝද පුටුව මුළුමනින්ම වගේ ආවරණය වී තිබුණා.

අපිව දැක්කම එයා හිනාවුණා. "පර්සි! තාලියා! අහ්, එතකොට මෙයා වෙන්න ඕනෑ-"

"නිකෝ ඩි ආන්ජෙලෝ," මම කිවුවා. "එයයි, එයාගේ අක්කයි අර්ධ-ලෝහිතයෝ."

කයිරොන් සැනසුම් සුසමක් හෙළුවා. "එහෙනම්, ඔයාලා වැඩේ කළා."

"හොඳයි..."

එයාගේ හිනාව මැළවුණා. "මොකක්ද ප්‍රශ්නේ? එතකොට ඇනබෙත් කෝ?"

"ඔහ්, දරුවෝ," මිස්ටර් ඩී කම්මැලි හඬින් කිවුවා. "තවත් කෙනෙක් නැති වුණා කියලා නම් කියන්නෙපා."

මම මිස්ටර් ඩීට අවධානය නොදක්වා ඉන්න උත්සාහ කළත්, එයා හැඳ සිටි නියෝන් තැඹිලි පාට කොටි පුල්ලි වැටුණු උණුසුම් ඇඳුම් කට්ටලය සහ දිවීමට පලඳින දම් පාට සපත්තු කුට්ටම (හරියට එයාගේ අමරණීය ජීවිතේ දී එයා එක දවසක්වත් දුවලා තියෙනවා වගෙයි.) නිසා එයාව නොසලකා හරින්න අමාරු වුණා. එයාගේ කළු කැරලි කොණ්ඩය මත රන් ලෝරල් පලඳනාවක් පැත්තකට ඇලවී තිබුණා. ඒ කියන්නේ කලින් කාඩ් අත දිනන්න ඇත්තේ එයායි.

"ඒ කිවුවේ?" තාලියා ඇසුවා. "තව කවුද නැති වුණේ?"

ඒ වෙලාවෙම, ග්‍රෝවර් පිස්සු හැදිලා වගේ හිනාවෙමින් කාමරයට දුවගෙන ආවා. එයාගේ එක ඇහැක් කළුතලා වෙලා, කම්මුලක අතුල් පාරක් වගේ පෙනුණු රතු පාට ඉරි වැටිලා තිබුණා. "දඩයක්කාරියෝ ඔක්කොම පදිංචියට ගියා!"



කයිරොන් රවා බැලුවා. "දඩයක්කාරියෝ, එහ්? මට පේන්නේ අපිට ගොඩක් දේවල් කතා කරන්න තියෙනවා වගෙයි." එයාගේ බැල්ම නිකෝ දිහාවට හැරුණා. "ග්‍රෝවර්, බාගදා, ඔයා අපේ පුංචි යාළුවාව ඇතුළට එක්ක ගිහින්, අපේ මග පෙන්වීමේ චිත්‍රපටිය පෙන්නුවොත් හොඳයි."

"ඒත්... ඔහ්, හරි. ඔව්, සර්."

"මග පෙන්වීමේ චිත්‍රපටිය?" නිකෝ ඇසුවා. "ඒක පවුලේ චිත්‍රපටියක් ද, වැඩිහිටියන්ගේ එකක් ද? මොකද, බියන්කා ටිකක් තදයි."

"ඒක දහතුනෙන් ඉහළ අයගේ එකක්," ග්‍රෝවර් කිවුවා.

"මරු!" නිකෝ හරිම සතුටින් ග්‍රෝවර් පස්සෙ ගියා.

"දැන්!" කයිරොන් තාලියාට සහ මට කිවුවා, "බාගදා, ඔය දෙන්නා වාඩිවෙලා අපිට මුළු කතාවම කිවුවොත් හොඳයි."

★★★

අපේ කතාව ඉවර වුණාම කයිරොන් මිස්ටර් ඩී වෙතට හැරුණා. "අපි දැන්ම ඇනබෙත්ව හොයන්න යවන්න ඕනෑ."

"මම යන්නම්," තාලියායි මමයි එකටම කිවුවා.

මිස්ටර් ඩී හුස්මක් ඇදලා ගත්තා. "කොහෙත්ම නෑ!"

තාලියායි මමයි දෙන්නම මැසිවිලි නගන්න පටන් ගත්තත් මිස්ටර් ඩී අතක් එසෙව්වා. අපි කටවල් වසා නොගත්තොත් මොකක් හෝ නරක, දේවමය දෙයක් වෙන්න ඉඩ ඇති බව අඟවමින් එයාගේ ඇස්වල දම් පාට කෝප ගින්නක් මතු වුණා.

"ඔයාලා මට කියපු දේවල් එක්ක බලද්දී," මිස්ටර් ඩී කිවුවා, "මේ වැඩේදිත් අපි පරාදයි. අපිට, අහ්, ඛේදජනක විදියට ඇනබෙල්ව නැති වුණා-"

"ඇනබෙත්," මම කඩා පැන්නා. ඇනබෙත් වයස අවුරුදු හතේ ඉඳන් මේ කඳවුරේ ඉන්න කෙනෙක්, ඒත් මිස්ටර් ඩී තවමත් එයාගේ නම දන්නේ නෑ වගේ බොරුවට අඟවනවා.

"ඔව්, ඔව්," එයා කිවුවා. "ඒ මදිවට, එයාගේ හිලව්වට ඔයාලා අරන් ඇවිත් තියෙන්නේ වදකාර චුට්ටං කොල්ලෙක්ව. ඉතින්, වැඩකට නැති ගලවා ගැනීමේ මෙහෙයුමකට යවලා තවත් අර්ධ-ලෝහිතයෝ

ටිකක් අවදානමේ දාන්න තරම් හේතුවක් මට පේන්නෙ නැහැ. ඇති කෙල්ල මෙලහකටත් මැරිලා ඇති."

මට මිස්ටර් ඩීගේ බෙල්ල මිරිකන්න ඕනෑ වුණා. කඳවුරු අධ්‍යක්ෂක විදිහට අවුරුදු සීයක් වේලි වේලි ඉන්න සියුස් එයාව මෙහෙට එවපු එක නම් කොහෙත්ම සාධාරණ නැහැ. ඔලිම්පස්වලදී නරක විදිහට හැසිරුණාට දඬුවමක් විදිහට එයාව මෙහෙට එවලා තිබුණත්, දැන් ඒක අපි හැමෝටම දඬුවමක් වෙලයි තිබුණේ.

"ඇනබෙත් තවමත් ජීවතුන් අතර ඉන්නවා වෙන්න පුළුවන්," කයිරොන් කිව්වා, ඒත් සුබවාදීව කතා කරන්න එයාට වුණත් අමාරු බව මට තේරුණා. ඇනබෙත්, එයාගේ තාත්තා සහ කුඩම්මා එක්ක ජීවත් වෙන්න තවත් වතාවක් උත්සාහ කරන්න යන්න කලින් එයාව ඇති දැඩි කර තිබුණේ කයිරොන් විසිනුයි. "එයා ගොඩක් බුද්ධිමත් කෙනෙක්. එයා... එයා අපේ හතුරෝ ළඟ නම්, එයාලගෙන් පුළුවන් තරම් කල් ගන්න එයා උත්සාහ කරයි. වෙන එකක් තියා, ඇනබෙත් එයාලට එකතු වෙන්න කැමතියි වගේ බොරුවට අඟවන්නත් ඉඩ තියෙනවා."

"ඒක ඇත්ත," තාලියා කිව්වා. "ලූක්ට එයාව පණපිටින් තියාගන්න ඕනෑ වෙයි."

"මේ ප්‍රශ්නෙ දී," මිස්ටර් ඩී කිව්වා, "මට බය, එතැනින් තනියම පැනලා එන්න තරම් එයාට බුද්ධිමත් වෙන්න වෙයි."

මම මේසයෙන් නැඟිට්ටා.

"පර්සි," කයිරොන්ගේ හඬ පිරිලා තිබුණේ අනතුරු ඇඟවීමෙන්. මිස්ටර් ඩී කියන්නේ පැටලෙන්න හොඳ කෙනෙක් නෙවෙයි කියලා මගේ හිතේ කොණක තිබුණා. අඩු තරමේ මම වගේ ආවේගශීලී ඒ.ඩී.එච්.ඩී. ළමයෙකුටවත් එයා බුරුලක් දෙන්නෙ නැහැ. ඒත් මට කොයි තරම් තරහා ගියා ද කියනවා නම් මම ඒ ගැන කිසිම සැලකිල්ලක් දැක්වූයේ නැහැ.

"තව කඳවුරුකාරයෙක් නැති කරගන්න ඔයා සතුටු ඇති," මම කිව්වා. "අපි හැමෝම නැතිවෙලා යනවා නම් ඔයා ඊටත් වඩා කැමති ඇති!"

මිස්ටර් ඩී ඇනුමක් යටපත් කරගත්තා. "ඔයා කියන්න දඟලන්නේ මොකක්ද?"



"ඔව්," මම ගෙරෙව්වා. "දඬුවමක් විදියට ඔයාව මෙහෙට එවපු පළියට, ඔයා කම්මැලි අමනයෙක් වෙලා හරියන්නෑ! ඔයත් මේ ශිෂ්ටාචාරයට අයිතියි. ඔයා අපිට පොඩි උදව්වක් හරි කරන්න බැලුවොත් නරක ද!"

තත්පරයක් ගතවෙන තුරු ගින්නේ සටපට හඬ හැර අනෙක් සියල්ල නිහඬ වුණා. මිස්ටර් ඩීගේ දෑස්වලට වැටුණු එළිය එයාට දුෂ්ට පෙනුමක් ලබා දෙමින් පරාවර්තනය වුණා. එයා මොනවදෝ කියන්න කට ඇරියා- සමහරවිට, මාව කුඩුපට්ටම් වෙලා යන්න ශාපයක් වෙන්න ඇති- ඒත් ඒ වෙලාවෙම නිකෝ කාමරයට කඩා පැන්නා. ග්‍රෝවර් එයාගේ පස්සෙන් දුවගෙන ආවා.

"මරේ මරු!" කයිරොන් දෙසට අත දිගු කරගෙන නිකෝ මොර දුන්නා. "ඔයා... ඔයා නරාශ්වයෙක්!"

කයිරොන් අමාරුවෙන් හිනාවුණා. "ඔව්, මිස්ටර් ඩි ආන්ජෙලෝ, ඔයා සතුටු නම්. ඒ වුණත්, අහ්, මුල්ම හමුවේ දී මේ රෝද පුටුවට වෙලා මනුස්ස පෙනුමෙන් ඉන්නයි මම වැඩිපුර කැමති."

"එතකොට, වාව්!" එයා මිස්ටර් ඩී දිහා බැලුවා. "ඔයා තමයි වයින්කාරයා? හිතාගන්නත් බැහැ!"

මගෙන් ඇස් ඉවතට ගත් මිස්ටර් ඩී නිකෝ දිහා අප්පිරියාවෙන් වගේ බැලුවා. "වයින්කාරයා?"

"ඩයනයිසියස්, හරි නේ? ඔහ්, වාව්! මගේ ළඟ ඔයාගේ පිළිමෙකුත් තියෙනවා."

"මගේ පිළිමයක්."

"මගේ මිතෝමැජික් සෙල්ලමේ. තව හොලොෆොයිල් කාඩ් එකකුත් තියෙනවා! ඔයාගේ පහරදීම්වලට ලැබෙන්නෙ පොයින්ට්ස් පන්සීයක් විතරක් නිසා, වැඩකටම නැති දේව කාඩ් එක ඔයා කියලා හැමෝම හිතුවට, මම නම් හිතන්නෙ ඔයාගේ බලයන් ෂෝක් කියලා!"

"අහ්," එයාගේ කතාවෙන් මිස්ටර් ඩී අන්දමන්ද වුණා වගෙයි, මට හිතෙන හැටියට ඒකෙන් මගේ ජීවිතේ බේරුණා. "හොඳයි, ඒක... සතුටක්."

"පර්සි," කයිරොන් ඉක්මනින් කිව්වා, "ඔයයි තාලියායි දූන් කැබින්වලට යන්න. හෙට හවසට අපි කොඩිය අල්ලන තරගය තියනවා කියලා කඳවුරුකාරයින්ට දන්වන්න."

Scanned with CamScanner

"කොඩිය අල්ලන තරගයක්?" මම ඇසුවා. "ඒත් අපිට එච්චර."

"ඒක චාරිත්‍රයක්," කයිරොන් කිවුවා. "අඩයක්කාරියෝ ආවම සුහද තරගයක් පවත්වනවා."

"ඔව්," තාලියා කෙඳිරුවා. "ඒක හරිම සුහද තරගයක් වෙන්නැති."

එයාගේ සෙල්ලමේ දී හැම දෙවියෙකුටම ලැබෙන ආරක්ෂක ලකුණු ගැන දොඩවන තිකෝට රවාගෙන සිටි මිස්ටර් ඩීව කයිරොන් ඔළුවෙන් පෙන්නුවා. "දැන් මෙතැනින් දුවන්න," කයිරොන් අපිට කිවුවා.

"ඔහ්, හරි," තාලියා කිවුවා. "එන්න යමු, පර්සි."

මාව මරන්න ඕනෑ බව ඩයනයිසියස්ට මතක් වෙන්න කලින් තාලියා මාව ඇදගෙන මහ ගෙදරින් එළියට ගියා.

★★★

"ඔයා දැනටමත් ඒරිස්ව තරහා කරගෙනයි ඉන්නේ," අපි කැබින් දිහාවට ගාටද්දී තාලියා මට මතක් කළා. "ඔයාට තවත් අමරණීය තරහකාරයෙක් ඕනෑ ද?"

ඇත්තටම එයා හරි. කඳවුරුකාරයෙක් විදිහට මම ගත කළ පළවෙනි ගිම්හානයේදීම මම ඒරිස් එක්ක රණ්ඩුවකට පැටළුණා. දැන් එයයි එයාගේ ළමයිනුයි මාව මරන්න අවස්ථාවක් ලැබෙනකල් බලා සිටියා. ඉතින්, ඩයනයිසියස්වත් තරහා කරගන්න මට ඕනෑ වුණේ නැහැ.

"සමා වෙන්න," මම කිවුවා. "මට ඒ වෙලාවේ ඉවසගන්න බැරි වුණා. ඒක හරිම අසාධාරණයි."

ආයුධ ගබඩාව ළඟ නැවතුණු එයා දෙණිබිම හරහා අර්ධ-ලෝහිත කඳු මුදුනට බැල්මක් හෙළුවා. පහළම අත්තේ දිස්නය දෙන රන් බැටළු ලොම් සළුව දරාගෙන එයාගේ පයින් ගහ තවමත් එතැන තිබුණා. කඳවුරේ බැමි තවමත් ගහේ මායාවෙන් ආරක්ෂා වුණත්, තවදුරටත් එය තාලියාගේ ජීවය බලයක් ලෙස පාවිච්චි කළේ නැහැ.

"කිසිම දෙයක් සාධාරණ නැහැ, පර්සි," තාලියා කෙඳිරුවා. "සමහර වෙලාවට මට හිතෙනවා..."

එයා වාක්‍ය අවසන් කළේ නැහැ. ඒත් එයාගේ හඬ කොයිතරම් දුක්බර වුණා ද කියනවා නම්, මට එයා ගැන කණගාටු හිතුණා. එයාගේ



පිළිවෙළක් නැති කළු කොණ්ඩයත්, කළු පාට රස්තියාදුකාර ඇඳුම් සහ ඇගේ දවටාගෙන සිටි පරණ ලොම් කබායත් නිසා එයාව පෙනුණේ සුදු පාට දර්ශන තලයක අතරමං වුණ යෝධ කළු කපුටෙක් වගෙයි.

"අපි ඇනබෙත්ව ආපහු ගේනවා," මම පොරොන්දු වුණා. ''හැබැයි ඒ කොහොමද කියලා නම් මම තවම දන්නෑ."

"මුලින්ම, ලූක් නැතිවෙලා කියලා මට දැනගන්න ලැබුණා," එයා කිවුවා. "දැන් ඇනබෙත්-"

"එහෙම හිතන්නෙපා."

"ඔයා හරි," එයා කෙලින් වුණා. "අපි ක්‍රමයක් හොයාගමු."

එතැනින් එහා පැසිපන්දු පිටියේ දඩයක්කාරියෝ කීපදෙනෙක් පැසිපන්දු සෙල්ලම් කරමින් සිටියා. එක්කෙනෙක් ඒරිස් කැබිනයේ කොල්ලෙක් එක්ක වාදයක පැටලී සිටියා. ඒරිස් ළමයා. එයාගේ කඩුව අතට අරන්; ඒ වගේම දඩයක්කාරියත් හිටියේ ඕනෑම තත්පරයක පැසිපන්දුව පසෙක දමා දුනු ඊතල අතට ගන්න සූදානමෙන් වගෙයි.

"මම ඒ ගැන බලාගන්නම්," තාලියා කිවුවා. "ඔයා කැබින් වටේ රවුමක් යන්න. හෙට කොඩිය අල්ලන තරගේ ගැන හැමෝටම කියන්න."

"හරි එහෙනම්. ඔයා කණ්ඩායම් නායකයා වෙන්න ඕනෑ."

"නෑ, නෑ," එයා කිවුවා. "කඳවුරේ වැඩි කාලයක් හිටියේ ඔයා නේ. ඔයා ඒක කරන්න."

"අපිට පුළුවන් වෙයි, අහ්.... සම-නායකයෝ වගේ වෙන්න."

ඒ අදහස ගැන මට දැනුණු හැඟීම ම එයාටත් දැනුණ බව එයාගේ මූණෙන්ම පෙනුණා, ඒත් එයා ඔළුව වැනුවා.

එයා පැසිපන්දු පිටිය දිහාවට පිටත් වෙද්දී මම ආයෙමත් කතා කළා, "හේයි, තාලියා."

"ඇයි?"

"වෙස්ටෝවර්වල සිද්ධ වෙච්ච දේට මට කණගාටුයි. ඔයාලා එනකල් මට ඉන්න තිබුණා."

"ඒකට කමක් නෑ, පර්සි. මම වුණත් ඒකම කරන්න තිබුණා." එයා ඇගේ බර කකුලකින් කකුලකට මාරු කළේ හරියට තවත් මොනවහරි කියනව ද, නැද්ද කියලා හිතනවා වගෙයි. "ඔයා දන්නවා

Scanned with CamScanner

නේ, ඔයා මගේ අම්මා ගැන ඇහුව ම, මම ඔයාගේ ඇඟට කඩා පැන්නා. ඒක මේ... අවුරුදු හතකට පස්සෙ මම එයාව හොයාගෙන ගියා, එතකොට මට දැනගන්න ලැබුණා එයා ලොස් ඇන්ජලීස්වල දී මැරුණා කියලා. එයා, මේ... එයා ගොඩාක් බීමට ඇබ්බැහි වෙලා හිටියා. ඉතින් ආරංචියේ හැටියට, අවුරුදු දෙකකට විතර කලින් දවසක් එයා ගොඩාක් රෑ වෙලා වාහනේ එළවද්දී..." තාලියා තදින් ඇහිපිය ගැසුවා.

"මට කණගාටුයි."

"ඔව්, හොඳයි. අපි... අපි දෙන්නා කවදාවත් කිට්ටුවෙන් හිටියේ නැහැ. මට වයස අවුරුදු දහයෙ දි මම ගෙදරින් පැනලා ආවා. ලූක්යි ඇනබෙතුයි එක්ක එහෙ මෙහෙ දුව දුව හිටපු ඒ අවුරුදු දෙක තමයි මගේ ජීවිතේ හොඳම කාලේ. ඒ වුණත්-"

"එහෙනම් ඒ නිසා තමයි ඔයාට සූර්ය යානේ එළවන්න අමාරු වුණේ."

එයා මගේ දිහා පරිස්සමෙන් බැලුවා. "මොකක්ද ඔයා අදහස් කළේ?"

"ඒ වෙලාවේ ඔයා දරදඬු වෙලා හිටියේ. ඔයාට අම්මා ගැන මතක් වුණ නිසා සුක්කානම අතට ගන්න ඕනෑ වෙන්න නැතුව ඇති."

මම කියපු දේ ගැන මම පසුතැවුණා. තාලියාගේ අනතුරුදායක බැල්ම කේන්ති ගිය සියුස්ගේ බැල්මට සමාන වුණා- හරියට ඕනෑම විනාඩියක එයාගේ ඇස් වෝල්ට් මිලියන ගාණක් විදියි වගෙයි..

"ඔව්," එයා කෙඳිරුවා. "ඔව්, එහෙම වෙන්න ඕනෑ."

ඒරිස් කඳවුරුකාරයා සහ දඩයක්කාරිය කඩුවෙන් සහ පැසිපන්දුවකින් එකිනෙකාව මරාගන්න උත්සාහ කරමින් සිටි දිහාවට එයා හෙමින් හෙමින් ඇදුණා.

★★★

ඔයාගේ ජීවිතේ දී ඔයාට දකින්න ලැබෙන පුදුමාකාරම ගොඩනැගිලි එකතුව වෙන්න ඉඩ ඇත්තේ කඳවුරේ කැබින් පොකුරයි. එතැන සුදු කුලුනු ඇති ගොඩනැගිලි වූ සියුස්ගේ සහ හේරාගේ කැබින් අංක එක සහ දෙක මැදිකර, දෙවිවරු පස්දෙනාගේ කැබින් වම් පැත්තටත්, දේවතාවියන්ගේ කැබින් පහ දකුණු පැත්තටත්, මැද මිදුල



සහ බාබකියු උඳුන මැදිවන ලෙසින් යූ අකුරේ හැඩයට පෙළගස්වා තිබුණා.

කොඩිය ඇල්ලීමේ තරගය ගැන දන්වමින් මම රවුමක් ගියා. මම මහ දවාලේ නිදාගෙන සිටි ඒරිස් ළමයෙක්ව ඇහැරුවා ම, එතැනින් තොලොංචි වෙනවා කියලා එයා මට මොර දුන්නා. ක්ලැරිස් කොහෙද කියලා මම එයාගෙන් ඇහුවා. "එයා කයිරොන්ගේ ගවේෂණයකට ගියා. ඒක රහසක්!"

"එයා හොඳින් ද?"

"මාසෙකින් විතර එයා ගැන ආරංචියක් නැහැ. එයා මෙහෙයුමේ දී අතුරුදහන් වෙලා. හරියට දැන් මෙතැනින් ගියේ නැත්නම් ඔහේට වෙනවා වගේ!"

එයාට ආපහු නිදාගන්න ඉඩ අරින්න මම තීරණය කළා.

අන්තිමේ දී, මම කැබින් අංක තුන, පොසෙයිඩන්ගේ කැබිනයට ආවා. ඒක කොරල් පොසිල සහ සිප්පි කටු කාවැදුණු මුහුදු ගල්වලින් සෑදූ, අළු පාට කොට ගොඩනැගිල්ලක්. එය ඇතුළත වූ මගේ ඇඳ ඇර අනෙක් සියල්ල සුපුරුදු විදිහටම හිස් වුණා. මගේ කොට්ටය අසලම බිත්තියේ මිනටෝර් අඟ එල්ලා තිබුණා.

මම ඇනබෙත්ගේ බේස්බෝල් කැප් එක මගේ ගමන් මල්ලෙන් පිටට අරන් ඇඳ අසල මේසය උඩින් තැබුවා. එයාව හොයාගත්තා ම මම ඒක එයාට දෙනවා. ඒ වගේම මම කොහොමහරි එයාව හොයාගන්නවා.

මම, මගේ අත් ඔරලෝසුව ගලවා, පලිහ සක්‍රිය කළා. එය සර්පිලාකාරව පිටට විහිදෙද්දී මහ හඬින් කිරි කිරි ගෑවා.

තෝර්න්ගේ උල් කටුවලින් පිත්තල මුහුණතේ තැන් දුසිමක් විතර පලුදු වෙලා. එයින් එක පලුද්දක් පලිහ සම්පූර්ණයෙන් පිටට විහිදීමට බාධා කළා. ඒ නිසා මගේ පලිහ පෙනුණේ කෑලි දෙකක් අඩු පීසා එකක් වගෙයි. මගේ මල්ලි කැටයම් කර තිබුණු ලස්සන පින්තූර ඔක්කොම තැළිලා. ඇනබෙත් සහ මම හයිඩ්‍රා සමග සටන් කරන කැටයමේ මාව පෙනුණේ උල්කාපාතයකින් ඔළුව හිල්වුණ කෙනෙක් වගෙයි. මිනටෝර් අඟ ළඟ අනෙක් කොක්කේ මම පලිහ එල්ලුවා, ඒත් දැන් ඒක දිහා බලන්නත් දුක හිතෙන තරම්. සමහරවිට ඒක ආපහු හදලා දෙන්න හෙෆාස්ටස් කැබිනයේ බෙකන්ඩෝර්ෆ්ට පුළුවන් වෙයි.

කඳවුරේ සිටි හොඳම ආයුධ සාදන්නා එයයි. ඊ කැම වෙලාවට මම ඒ ගැන එයාගෙන් අහන්න හිතුවා.

මම පලිහ දිහා බලන් ඉන්න අතරේ මට අමුතු ගොර ගොර හඬක් ඇහුණා- මගේ කාමරයට අලුතින් අංගයක් එකතු වී ඇති බව මට දකින්න ලැබුණේ එතකොටයි. කැබිනය කෙළවරේ අළු පාට මුහුදු ගල්වලින් සෑදූ ලොකු බේසමක් තිබුණා. ගලේ කැටයම් කළ මාළුවෙකුගේ හිසකින් එහි කෙමිය සාදා තිබුණා. ඌගේ කටින් වතුර පාරක්- ලුණු වතුර උල්පතක් දිය කඩිත්තට වැස්සුණා. ඒ වතුර උණු ඇති, මොකද එයින් හුමාල ස්නානය කරන තටාකයකින් වගේ සීතල වාතයට වාෂ්ප පිටවුණා.

එයින් කාමරය පුරා මුහුදේ සුවඳ මුසු නැවුම් බවක් පැතිරුණේ උණුසුම් ගිම්හානයේ හැඟීමක් දනවමිනුයි. මම තටාකය ළඟට ගියා. එහි තුණ්ඩුවක්වත් අමුණා නොතිබුණත්, ඒක පොසෙයිඩන්ගෙන් තෑග්ගක් කියලා මම දැනගෙන සිටියා.

මම වතුර දිහා බලා කතා කළා, "ස්තූතියි, තාත්තේ."

වතුර මතුපිට රැළි නැගුණා. තටාකය පතුලේ කාසි- රන් ඩ්‍රැච්මා දුසිමක් විතර දිලිසෙමින් තිබුණා. මේ වතුර මල තිබුණේ මොනවට ද කියලා මට තේරුණේ ඒ වෙලාවේදියි. ඒක තිබුණේ මට මගේ පවුලේ අය සමග පණිවුඩ හුවමාරු කරගන්නයි.

මම ළඟම වූ ජනේලය විවර කළාම, සීත සුළඟ ඉරාගෙන ආ ඉර එළිය මීදුම හරහා වැටී දේදුන්නක් මැවූවා. මම උණු වතුරට අත දමා රන් කාසියක් පිටට ගත්තා.

"අයිරිස්, ඕ දේදුන්නට අධිපති දේවතාවියනි," මම කන්නලව් කළා, "මගේ පූජාව බාරගන්න."

මම කාසිය මීදුම තුළට විසි කරද්දී එය අතුරුදහන් වුණා. මුලින්ම කාට කතා කරන්න ද අදහසක් නැති බව මට සිහිවුණේ ඊටත් පසුවයි.

මගේ අම්මට? ඒක 'හොඳ පුතෙක්' කරන ජාතියේ වැඩක් තමයි, ඒත් එයා තවම මං ගැන වද වෙන්න පටන්ගෙන නැතුව ඇති. මම එක දිගට දවස් ගාණක්, නැත්නම් සති ගාණක් අතුරුදහන් වෙන එක දැන් එයාට හුරු දෙයක් වෙලයි තිබුණේ.



මගේ තාත්තට? මට එයා එක්ක ඇත්තටම කතා කරන්න ලැබිලා දැන් සෑහෙන කාලයක්- අවුරුදු දෙකක් විතර ගතවෙලා. ඒත් දෙවි කෙනෙකුට අයිරිස්-පණිවුඩයක් යවන්නවත් අපිට පුළුවන් ද? මම කවදාවත් එහෙම කරන්න උත්සාහ කරලා තිබුණේ නැහැ. ඒකෙන් එයාලා කේන්ති ගන්නවා ද, හරියට බඩු විකුණන ආයතනවලින් ඇමතුම් ආවම වගේ?

මම ටිකක් වෙලා දෙපැත්තට වැනුණා. ඊට පස්සේ මම හිත හදාගත්තා.

"මට ටයිසන්ව පෙන්වන්න," මම ඉල්ලුවා. "සයික්ලොප්ස් කම්මල්වල ඉන්නේ."

නළියමින් දිලිසුණ මීදුම මැදින් මගේ අර්ධ සහෝදරයාගේ රූපය මතු වුණා. එයා ගින්නෙන් වටවෙලා හිටිය විදියට, එයා සයික්ලොප්ස් කෙනෙක් නොවුණා නම් ලොකු ප්‍රශ්නයක් වෙනවා. එයා කිණිහිරට නැමී ගිනියම් වූ කඩු තලයක් තලමින් සිටියා. එයාගේ ඇඟ වටේ ගිනි පුපුරු විසිරෙමින්, ගිනි දළු සුළි නැංවුණා. එයාට පිටුපසින් කිරිගරුඬ රාමුවක් ඇති ජනේලයක් තිබුණා, ඊට එපිටින් පෙනුණේ අඳුරු නිල් පාට වතුර පිරුණු සමුදුරු පතුලයි.

"ටයිසන්!" මම මොර දුන්නා.

යකඩ තලන හඬ සහ ගින්නේ ගිගුරුම නිසා මුලින් එයාට මාව ඇහුනේ නැහැ.

"ටයිසන්!!"

එයා හැරිලා බැලුවා, ඒත් එක්කම එයාගේ තනි ඇහැ ලොකු වුණා. එයා කහ පාට බොල්ලෑ දත් නියවා කට පුරා හිනාවුණා. "පර්සී!!"

කඩු තලය බිම දමා මගේ දිහාවට දුවගෙන ආ එයා මාව වැලඳ ගන්න උත්සාහ කළා. දර්ශනය බොඳ වෙද්දී, මම ඉබේටම පස්සට පැන්නා. "ටයිසන්, මේක අයිරිස්-මැසේජ් එකක්. මම ඇත්තටම මෙතැන නැහැ."

"ඔහ්," එයා ආපසු දර්ශන පථයට ආවේ අපහසුවට පත්වෙලා වගෙයි. "ඔහ්, මම ඒක දැනගෙන හිටියා. ඔව්."

"ඔයාට කොහොමද?" මම ඇසුවා. "ඔයාගේ රස්සාව කොහොමද?"

Scanned with CamScanner

එයාගේ ඇහැ සතුටින් දිල්වුණා. "මම රස්සාවට ආසයි! බලන්න!" එයා ගිනියම් කඩු තලය අහුලා ගත්තා. "මේක හැදුවෙ මම!"

"හරිම ෂෝක් නේ."

"මම ඒකෙ මගේ නමත් කෙටුවා. මෙන්න මෙතන."

"නියමයි. අහන්න, ඔයා තාත්තා එක්ක ගොඩක් කතා කරනව ද?"

ටයිසන්ගේ හිනාව මැකී ගියා. "වැඩිය නැහැ. තාත්තිට වැඩ වැඩියි. එයා යුද්දෙ ගැන වද වෙනවා."

"ඒ කිවුවේ?"

ටයිසන් සුසුමක් පිට කළා. එයා කඩු තලය ජනේලයෙන් පිටට දමුවා ම එතැන උතුරන බුබුළු වලාවක් හැදුණා. ටයිසන් ආපහු එය ඇතුළට ගනිද්දී ලෝහය සිසිල් වී තිබුණා. "නාකි මුහුදු ආත්ම කරදර කරනවා. එයිජියොස්. ඔසිනස් වගේ කට්ටිය."

එයා කියමින් සිටි දේ ගැන මම තරමක් දැනගෙන හිටියා. එයා අදහස් කළේ ටයිටන්වරුන්ගේ යුගයේ දී සාගරය පාලනය කළ අමරණීය අය ගැනයි. ඒ ඔලිම්පියානුවෝ බලය අත්පත් කරගන්න කලිනුයි. ටයිටන් රජා, ක්‍රෝනොස් සමග එයාගේ පාක්ෂිකයිනුත් ශක්තිමත් වෙමින් සිටි මේ කාලයේ එයාලත් ආපහු ඇවිත් කියන ආරංචිය නම් කොහෙත්ම හොඳ එකක් වුණේ නැහැ.

"මට කරන්න පුළුවන් දෙයක් තියෙනව ද?" මම ඇසුවා.

ටයිසන් දුක්බරව ඔළුව හෙල්ලුවා. "අපි කිඳුරු මිනිස්සුන්ට ආයුධ හදනවා. එයාලට හෙට වෙද්දී තවත් කඩු දාහක් ඕනෑ." කඩු තලය දෙස බැලූ ටයිසන් සුසුමක් හෙළුවා. "නාකි ආත්ම නරක බෝට්ටුව රකිනවා."

"ප්‍රින්සස් ඇන්ඩ්‍රොමීඩා?" මම ඇසුවා. "ලූක්ගේ බෝට්ටුව?"

"ඔව්. එයාලා ඒක හොයාගන්න අමාරු කරනවා. තාත්තගේ කුණාටුවලින් ආරක්ෂා කරනවා. එහෙම නැත්නම් මෙලහකටත් එයා ඒක කුඩු කරලා."

"ඒක කුඩු කරන්න තියෙනවා නම් හොඳයි තමයි."

හදිසියේ යමක් සිහියට ආවා වගේ ටයිසන් උද්‍යෝගිමත් වුණා. "ඇනබෙත්! එයා ඔතැන ඉන්නව ද?"



"ඔහ්, හොඳයි..." මට දැනුණේ මගේ හදවත පෙරළෙන බෝලයක් වගෙයි. ටයිසන් හිතාගෙන හිටියේ පීනට් බටර්වලට පස්සේ එයාට හමුවුණ හොඳම දේ ඇනබෙත් කියලයි. ඒ වගේම එයා පීනට් බටර්වලට තදින්ම ආදරේ කළා. ඉතින් එයා අතුරුදහන් වෙලා කියලා ටයිසන්ට කියන්න මට හිත හදාගන්න බැරි වුණා. එයා අඬන්න පටන් ගත්තොත් එයාගේ ගින්න පවා නිවෙන්න ඉඩ තිබුණා. "හොඳයි, නෑ... එයා දැන් මෙතැන නැනේ."

"එයාට මම හලෝ කිවුවා කියන්න!" එයා දීප්තිමත් හිනාවක් පෑවා. "හලෝ ඇනබෙත්!"

"හරි." මගේ උගුරේ හිර වෙනවා වගේ දැනුණු ගුළිය ගිලගන්න මම දඟලුවා. "මම ඒක කරන්නම්."

"තව, පර්සි, නරක බෝට්ටුව ගැන වද වෙන්නෙපා. ඒක ඈතට යනවා."

"ඒ කිවුවේ?"

"පැනමා ඇළට! ඈතම ඈතට."

මම රවා බැලුවා. ලූක් මොකටද ඒ රාක්ෂයෝ අරක් ගත්ත නැව ඒ තරම් පහළට අරගෙන යන්නේ? අපි එයාව අන්තිම වතාවට දකිද්දී එයා නැගෙනහිර වෙරළ කිට්ටුවෙන් යාත්‍රා කරමින්, අර්ධ-ලෝහිතයෝ බඳවා ගනිමින්, එයාගේ රාක්ෂ හමුදාව පුහුණු කරවමිනුයි හිටියේ.

"හරි එහෙනම්," මම කිවුවත්, මට අස්වැසුමක් දැනුණේ නම් නැහැ. "ඒක... හොඳයි. මං හිතන්නේ."

කම්මල තුළින් ගැඹුරු හඬක් මට තේරුම් ගත නොහැකි වූ යමක් කියා ගිගුරුවා. ටයිසන් බයේ ඇකිළුණා. "ආපහු වැඩ පටන් ගන්න වෙනවා! නැත්නම් ලොක්කට තරහා යයි. සුබ පැතුම්, සහෝදරයා!"

"හරි, තාත්තට කියන්න-"

ඒත් මම කියලා ඉවර වෙන්න කලින් දසුන නළියමින් වියැකී ගියා. ආපසු මගේ කැබිනයේ තනි වුණ මට වෙන කවරදාටත් වඩා පාළුවක් දැනෙන්න ගත්තා.

★★★

එදා රෑ කෑම වෙලාවේ දි මම හිටියේ අන්ත මුස්පේන්තුවෙක් වගෙයි.

මං කිවුවේ, හැමදාමත් වගේම එදාත් කෑම නම් ඉස්තරම් වුණා. බා'බකියු, පීසා සහ කවදාවත් හිස් නොවෙන සෝඩා කුසලාන තියෙද්දී තව මොනවද ඕනෑ? පන්දම් සහ ගිනි අඟුරු භාජනවලින් එළිමහන් භෝජන මණ්ඩපය උණුසුම් වුණා, ඒත් අපි හැමෝටම වාඩි වෙන්න සිද්ධ වුණේ අපේ කැබින් සහායකයෝ සමගයි, ඒ කියන්නේ පොසෙයිඩන්ගේ මේසයේ මම තනි වුණා. සියුස්ගේ මේසයේ තාලියා තනිව සිටියා, ඒත් අපි දෙන්නට එකට වාඩි වෙන්න කඳවුරු නීති-රීති ඉඩ දුන්නේ නැහැ. හෙෆාස්ටස්, ඒරීස් සහ හර්මීස් කැබින්වලට නම් කඳවුරුකාරයෝ කීප දෙනා ගාණේ හිටියා. නිකෝ ස්ටොල් සහෝදරයෝ සමග වාඩි වී සිටියේ, තමන්ගේ ඔලිම්පියානු අම්මා හෝ තාත්තා ගැන නොදන්න අලුත් කඳවුරුකාරයින්ට හර්මීස් කැබිනයේ රැඳෙන්න සිද්ධ වෙන නිසයි. මිතොමැජික් සෙල්ලමට වඩා පෝකර් ක්‍රීඩාව හොඳයි කියලා නිකෝට ඒත්තු ගන්වන්න ස්ටොල් සහෝදරයෝ දතකමින් හිටියා. පැරදෙන්න තරම් සල්ලියක් නිකෝ ළඟ නැතුව ඇති කියලා මම බලාපොරොත්තු වුණා.

භෝජන මණ්ඩපයේ ඇත්තටම විනෝද වෙන බව පෙනුණේ ආර්ටෙමිස්ගේ මේසයේ අය විතරයි. දඩයක්කාරියෝ සතුටින් පිරුණු ලොකු පවුලක් වගේ කමින්, බොමින්, මහ හඬින් හිනා වෙමින් හිටියා. එයාලගේ අම්මා වගේ ZEසෝයි මේසයේ මුලසුන ගෙන සිටියා. එයා අනෙක් අය වගේ මහ හඬින් හිනා නොවුණත්, සැරින් සැරේට මඳ සිනා පෑවා. එයාගේ රිදී ලෙෆ්ටිනන්ට් පටිය කළු කෙස් අතරේ දිස්න දුන්නා. හිනා වෙද්දී එයා වඩාත් ලස්සන බව මට හිතුණා. බියන්කා ඩි ආන්ජෙලෝත් හරිම සතුටින් ඉන්නවා වගෙයි පෙනුණේ. පැසිපන්දු පිටියේ දි ඒරීස් ළමයෙක් එක්ක රණ්ඩුවට පැටළුණු ලොකු ගෑනු ළමයාගෙන් එයා අත්පොර බදන හැටි ඉගෙන ගන්න උත්සාහ කරමින් සිටියා. ලොකු ගෑනු ළමයා හැම වටයකදීම එයාව පැරදුවත්, එයාට ඒ ගැන වගක් නැහැ වගෙයි.

අපි කෑම ගෙන අවසන් වුණාම, චාරිත්‍රානුකූලව සව්දිය පිරූ කයිරොන් ආර්ටෙමිස්ගේ දඩයක්කාරියන්ව නිල වශයෙන් පිළිගත්තා. එයට ලැබුණු අත්පොලසන් හඬ සෑහෙන උදාසීන වුණා. ඊට පස්සේ, පසුදා රෑට පැවැත්වීමට නියමිතව තිබුණු 'සුහද' කොඩිය ඇල්ලීමේ තරගය ගැන එයා නිවේදනය කළා. ඒකට නම් සෑහෙන හොඳ ප්‍රතිචාර ලැබුණා.



එයින් පසු, වේලපහින් උදාවෙන ශීත සෘතුවේ තවත් රැයක් පහන් කරන්න අපි, අපේ කැබින් බලා ඇදුණා. මම හිටියේ මහන්සියෙන් හෙම්බත් වෙලයි, ඒ නිසාම මට පහසුවෙන් නින්දට වැටෙන්න හැකි වුණා. ඒක හොඳ දෙයක් වුණත්, නරකකට තිබුණේ මට නපුරු හීනයක් පෙනුණු එකයි. අඩු තරමේ මගේ මිනුම්වලින් බැලුවත් ඒක නරකම නරක හීනයක්.

★★★

අඳුරු කඳු බෑවුමක, ඝන මීදුමෙන් වැසී ඇනබෙත් සිටියා. එතැන දැනුණේ හරියට පාතාල ලෝකය වගෙයි, මොකද එසැණින්ම එතැන දැනුණේ හරියට පාතාල ලෝකය වගෙයි, මොකද එසැණින්ම වැසුණු තැන්වලදී මට දැනෙන භීතිය මතු වෙන්න ගත්තා. ඒ වගේම හිසට ඉහළින් මට අහස දැක ගන්නත් බැරි වුණා- ඒ වෙනුවට වැසුණු, ඝන අඳුර පමණක් තිබුණේ හරියට මම ගුහාවක් තුළ ඉන්නවා වගෙයි.

ඇනබෙත් බෑවුමේ ඉහළට යන්න වෙහෙසුණා. වටපිටාව පුරා කළු ගරුඬ ගලින් සෑදූ ග්‍රීක කුලුනුවල පරණ නටඹුන් විසිරී තිබුණේ යම්කිසි දෙයක් විසින් අතිවිශාල ගොඩනැගිල්ලක් කෑලිවලට පුපුරුවා හැරලා වගෙයි.

"තෝර්න්!" ඇනබෙත් කෑගැසුවා. "ඔයා කොහෙද? ඇයි ඔයා මාව මෙතැනට අරන් ආවේ?" කැඩුණු තාප්පයක් උඩින් බඩගෑව එයා කඳු මුඳුනට ළඟා වුණා.

ඒත් එක්කම එයා මහ හඬින් හීල්ලුවා.

එතැන සිටියේ ලූක්. එයා සිටියේ වේදනාවෙන්.

ගල් සහිත බිමක ඇද වැටී සිටි එයා, නැගිටින්න උත්සාහ කරමින් සිටියා. එයා වටා තවත් ඝන වී පෙනුණු අඳුර මැදින් මීදුම් කැරලි කෑදර ලෙස සුළි නැංවූවා. එයාගේ ඇඳුම් වැරහැලි වෙලා; එයාගේ මූණ හීරිලා, දාඩියෙන් පෙඟිලා තිබුණා.

"ඇනබෙත්!" එයා කතා කළා. "මට උදවු කරන්න! කරුණාකරලා!"

ඇනබෙත් එයා ළඟට දිවුවා.

මම එයාට කෑගසා අනතුරු අඟවන්න උත්සාහ කළා: *එයා ද්‍රෝහියෙක්! එයාව විශ්වාස කරන්න එපා!*

ඒත් සිහිනයේ දී මගේ කටහඬ වැඩ කළේ නැහැ.

ඇනබෙත්ගේ ඇස්වල කඳුළු පිරුණා. එයා ලූක්ගේ මූණ අතගාන්න වගේ අතක් ඉදිරියට දිගු කළා. ඒත් අන්තිම තත්පරයේ දී එයා පසුබැහුවා.

"මොනවද සිද්ධ වුණේ?" එයා ඇහුවා.

"එයාලා මාව මෙතැන දාලා ගියා." ලූක් කෙඳිරි ගෑවා. "කරුණාකරලා. ඒක මාව මරනවා."

එයාට තිබුණු කරදරය මොකක්ද කියලා මට දැනගන්න බැරි වුණා. මට පෙනුණේ එයා අදෘශ්‍යමාන බලවේගයකට විරුද්ධව සටන් කරනවා වගෙයි. හරියට ගත මීදුම එයාව මැරෙන්න මඩවනවා වගෙයි.

"මං මොකටද ඔයාව විශ්වාස කරන්නේ?" ඇනබෙත් ඇහුවා. එයාගේ කටහඬ වේදනාවෙන් පිරිලා.

"ඔයාට එහෙම කරන්න බැහැ." ලූක් කිවුවා. "මම ඔයාට ගොඩාක් නපුරු වුණා. ඒත් ඔයා මට උදවු නොකළොත් මං මැරෙයි."

*එයාට මැරෙන්න අරින්න,* මට බෙරිහන් දෙන්න ඕනෑ වුණා. ලූක් කිසිම හිතක් පපුවක් නැතිව අපිව මරන්න සෑහෙන වතාවක් උත්සාහ කළා. ඇනබෙත්ගෙන් අඹ ඇටේක තරම් උදවුවක් ගන්නවත් එයා වටින්නෙ නැහැ.

ඒ වෙලාවේ ලූක්ට ඉහළින් වූ අන්ධකාරය කැලිවලට කැඩෙන්න ගත්තේ හරියට භූමිකම්පාවකට හසු වූ ගුහා පියස්සක් වගෙයි. යෝධ කළු ගල් පතුරු ඇද හැලෙන්න පටන් ගත්තා. ඉරි තැල්මක් මතු වෙද්දිම ඇනබෙත් වේගයෙන් ඇතුළට පැන්නා. ඒත් එක්කම මුළු සිවිලිම ම කඩා වැටුණා. ඒත් ඇනබෙත් කොහොමදෝ එය රඳවා ගත්තා- ටොන් ගාණක් බර ගල් ගොඩක්. ඒක එයාගෙත් ලූක්ගෙත් ඇඟට වැටෙන්න නොදී ඇනබෙත් එයාගේ ශක්තියෙන් ඔසවාගෙන සිටියා. ඒක වෙන්න බැරි වැඩක්. එයාට කොහෙන්ද එච්චර හයියක්.

පැත්තකට පෙරළී එතැනින් ගැලවුණ ලූක් හති දැම්මා. "ස්තුතියි," එයා අමාරුවෙන් කියාගත්තා.

"මේක අල්ලගෙන ඉන්න මට උදවු කරන්න," ඇනබෙත් කෙඳිරි ගෑවා.

ලූක් හුස්ම ඇල්លුවා. එයාගේ මූණ කුණු, දාඩියවලින් වැහිලා. එයා අමාරුවෙන් හිටගත්තා.



"මට ඔයා ගැන බලාපොරොත්තු තියාගන්න පුළුවන් කියලා මම දැනගෙන හිටියා." දෙදරන අඩුර ඇනබෙත්ව පොඩි කර දමන්න තර්ජනය කරද්දී ලූක් එතැනින් යන්න පටන් ගත්තා.

"මට උදවු කරන්න!" ඇනබෙත් බැගෑපත් වුණා.

"ඔන්, ලූක් වෙන්නෙපා," ලූක් කිවුවා. "ඔයාට උදවු මග එනවා. මේ ඔක්කොම සැලසුමේ කොටසක්. ඒ අතර කාලයේ දී, මැරෙන්නැතුව ඉන්න බලන්න."

ඇනබෙත්ව පොළොවට තෙරපමින් අඳුරු සිවිලිම නැවතත් කඩා හැලෙන්න පටන් ගත්තා.

* * *

මම ඇඳ ඇතිරිලි පතුරුගාමින් වේගයෙන් කෙලින් වී ඇඳේ වාඩි වුණා. උල්පතේ ලුණු වතුර කැලතෙන හඬ ඇරෙන්න මගේ කැබිනය මුළුමනින්ම නිහඬව තිබුණා. රෑ මැදියම පසු වුණේ දැන් බව මගේ ඇඳ අසල මේසය මත වූ ඔරලෝසුව පෙන්වූවා. ඒක හීනයක් විතරක් වුණත් මට කාරණා දෙකක් ගැන සහතික වුණා: ඇනබෙත් දරුණු අනතුරක වැටිලා. ඒ වගේම ඒකට වග කියන්න ඕනෑ ලූක්.

# 06

# පරණ මළගිය යාළුවෙක් එළියට ආවා

ඊළඟ දවසේ උදේ කෑමෙන් පස්සේ මම හීනය ගැන ග්‍රෝවර්ට කිවුවා. අපි හිටියේ තණ පිට්ටනියේ වාඩිවෙලා, සැටර්ලා හිමේ වන දෙවඟනන්ව ලුහුබඳින දිහා බලගෙනයි. සැටර්ලා එයාලව අල්ලා ගත්තොත් හාද්දක් දෙන්න දෙවඟනෝ පොරොන්දු වෙලා තිබුණත්, සැටර්ලට එච්චර හපන්කමක් කරන්න බැරි වුණා. සාමාන්‍යයෙන් එයාලා කළේ සැටර් කෙනෙක්ට දුම් දාගෙන පස්සෙන් දුවගෙන එන්න ඇරලා, එක පාරටම හිමෙන් වැහුණ ගහකට හැරෙන එකයි. එතකොට එන වේගෙන්ම ගහේ හොම්බ ඇන ගන්න අසරණ සැටර්ගේ ඇඟ උඩට හිම ගොඩකුත් වැටෙනවා.

මගේ නපුරු හීනය ගැන මම ග්‍රෝවර්ට විස්තර කළා ම එයා කකුලේ ලොම් කැටියක් ඇඟිල්ලකින් කරකවන්න ගත්තා.

"ගුහා සිවිලිමක් එයාගේ උඩට කඩන් වැටුණා?" එයා ඇසුවා.

"ඔව්. මොන කෙහෙම්මලක් ද ඒකෙන් කියවෙන්නේ?"

ග්‍රෝවර් ඔළුව හෙල්ලුවා. "මන්දා. ඒත් ෂෙසෝයි දැකලා තිබුණ හීනෙන් පස්සේ-"

"හෝව්. මොකක්ද ඔයා කිවුවේ? ෂෙසෝයිත් ඒ වගේ හීනයක් දැකලා ද?"



"මං... මං හරියට ම දන්නෑ. පාන්දර තුනට විතර එයා මහ ගෙදරට ඇවිල්ලා, කයිරොන්ට කතා කරන්න ඕනෑ කියලා සද්දයක් දැම්මා. එයා හිටියේ හොඳටෝම බය වෙලා වගේ."

"පොඩ්ඩක් ඉන්න. ඔයා කොහොමද ඒක දන්නේ?"

ග්‍රෝවර් රතු වුණා. "මං හිටියේ ආර්ටෙමිස්ගේ කැබින් එක ඉස්සරහ පොඩි කුඩාරමක් ගහගෙන."

"ඒ මොකටද?"

"නිකං. මේ දන්නැද්ද, එයාලා කිට්ටුවෙන් ඉන්න වගේ."

"ඔයා නම් කුර තියෙන කුකුළෙක්."

"මම එහෙම නෑ! කොහොමහරි, මම එයාගේ පස්සේ මහ ගෙදරට ගිහින්, පඳුරක් අස්සෙ හැංගිලා හැමදේම බලාගෙන හිටියා. ආර්ගස් එයාට ඇතුළට යන්න ඉඩ දුන්නෙ නැති වුණාම එයා ලොකු කලබැගෑනියක් කළා. ඒක නම් බලාගෙන ඉන්නත් බය හිතුණා."

මම ඒ සිද්ධිය හිතේ මවාගන්න උත්සාහ කළා. ආර්ගස් කියන්නේ කඳවුරේ ප්‍රධාන ආරක්ෂක නිලධාරියා- එයා මුළු ඇඟ පුරාම ඇස් තියෙන, සද්දන්ත හාදයෙක්. මොකක්හෝ බරපතළ දෙයක් සිද්ධ වෙනවා නම් ඇර එයා පෙන්න ඉන්නේ කලාතුරකින්. එයයි ෂෙසෝයි නයිට්ෂේඩුයි අතරේ සටනක් වෙනවා නම් මම නම් දිනන පැත්තට ඔට්ටු අල්ලන්නේ නැහැ.

"ඉතින් ෂෙසෝයි මොනවද කිවුවේ?" මම ඇසුවා.

ග්‍රෝවර් මූණ පුලුටු කරගත්තා. "මේකනේ, කලබල වුණ වෙලාවට එයා කතා කරන්නේ හරිම පරණ තාලෙට, ඉතින් එයා කියන ඒවා තේරුම් ගන්න ටිකක් අමාරු වුණා. ඒත් ආර්ටෙමිස් කරදරේක වැටිච්ච කතාවකුයි, දඩයක්කාරියන්ව උවමනා කතාවකුයි කිවුවා. ඊට පස්සෙ එයා ආර්ගස්ට මොළේ තැම්බිච්ච ජඩයා කියලත් කිවුවා... මං හිතන්නේ ඒක නම් නරකයි. ඊට පස්සේ ආර්ගස් එයාට-"

"හෝව්, පොඩ්ඩක්. ආර්ටෙමිස් කරදරේක වැටෙන්නෙ කොහොමද?"

"මම... හොඳයි, අන්තිමේ දී කයිරොන් පිජාමා එකයි, වලිගෙ ගහපු කැරලි කටුයි පිටින්ම එළියට ඇවිත්-"

"එයා වලිගෙට කැරලි කටු ගහනවා?"

ග්‍රෝවර් අතින් කට වසාගත්තා.

"සමා වෙන්න," මම කිව්වා. "ඊට පස්සේ?"

"හොඳයි, zසෝයි කිව්වා එයාට ඒ වෙලාවෙම කඳවුරෙන් පිට වෙන්න අවසර ඕනෑ කියලා. කයිරොන් බැහැ කිව්වා. ආර්ටෙමිස්ගෙන් නියෝග ලැබෙනකල් එයාලට කඳවුරට වෙලා ම ඉන්න කියපු බව එයා zසෝයිට මතක් කළා. එතකොට එයා කිව්වා-" ග්‍රෝවර් තදින් කෙළ ගිල්ලා. "එයා කිව්වා 'අපි කොහොමද එතුමියගෙන් නියෝග ලබාගන්නේ, ආර්ටෙමිස් නැති වෙලා නම්' කියලා."

"නැති වෙලා කියන්නේ? එයාට පාර වැරදිලා වත් ද?"

"නෑ. මං හිතන්නෙ එයා අදහස් කළේ අතුරුදහන් වෙලා කියන එක. උස්සලා. පැහැරගෙන."

"පැහැරගෙන?" ඒ අදහස හිතට වද්දගන්න මම උත්සාහ කළා. "කවුරුහරි අමරණීය දෙවඟනක්ව පැහැර ගන්නෙ කොහොමද? ඒක කරන්න පුළුවන් වැඩක් ද?"

"හොඳයි, ඔව් ඉතින්. මං කියන්නේ, පර්සෙෆොන්ට එහෙම වුණා නේ."

"ඒ වුණාට එයා නම් ඉතින් මල්වලට අධිපති දෙවඟන ද කොහෙදෝ නේ."

ග්‍රෝවර් අමනාපයෙන් වගේ බැලුවා. "වසන්ත කාලෙට."

"ඕනෑ එකක්. ආර්ටෙමිස් එයාට වඩා ගොඩාක් බලවත්. එයාව පැහැර ගන්න පුළුවන් කාට ද? ඒ වගේම මොකටද?"

ග්‍රෝවර් මූසල විදිහට ඔළුව හෙල්ලුවා. "මං දන්නෑ. ක්‍රෝනොස් ද?"

"එයාට දැන්ම එච්චර බලවත් වෙන්න බැහැ. එයාට පුළුවන් ද?"

අපි අන්තිම වතාවට දකිනකොට එයා හිටියේ චූටි චූටි කෑලි ගොඩක් වෙලා. මෙහෙමයි... අපිට ඇත්තටම එයාව දකින්න ලැබුණේ නම් නැහැ. අවුරුදු දහස් ගාණකට ඉස්සර, ටයිටන්වරු සහ දෙවිවරු අතර ඇති වූ මහා යුද්ධයෙන් පස්සේ, දෙවිවරු ක්‍රෝනොස්ව එයාගෙම දෑකැත්තෙන් පෙති ගහලා, කෑලි ටික ටාටරස්වලට විසි කළා. ඒක නිකං දෙවිවරුන්ගේ හතුරන්ව දාන්න තියෙන පතුලක් හොයාගන්න නැති කුණු කුඩයක් වගේ තැනක්. ගිම්හාන සෘතු දෙකකට කලින්



ක්‍රෝනොස් අපිව රවට්ටලා ඒ ආගාධයේ කට ළඟට ම ගෙන්වා ගත්තා. තව පොඩ්ඩෙන් එයා අපිවත් ඒක ඇතුළට ම ඇදලා ගන්නවා. ඊට පස්සේ, ගිය ගිම්හානයේ දී, ලූක්ගේ රාක්ෂ සංචාරක නැවේ දී අපිට රත්තරන් මිනී පෙට්ටියක් දකින්න ලැබුණා. එයාලගේ පැත්තට අලුතෙන් කෙනෙක් එකතු වෙන වාරයක් ගාණේ ටයිටන් රජාගේ කෑල්ලෙන් කෑල්ල ආගාධයෙන් පිටතට ගෙන්වනවා කියලා ලූක් පාරම් බෑවේ එතකොටයි. මිනිස්සුන්ට හීනවලින් බලපෑම් කරලා, එයාලව රවට්ටන්න ක්‍රෝනොස්ට පුළුවන්කම තිබුණා, ඒත් තවමත් සුඹුළු කොළ රොඩු ගොඩක් වගේ ඉන්න එයා ශරීර ශක්තියෙන් ආර්ටෙමිස්ව පරදවන්නෙ කොහොමද කියලා නම් මට හිතාගන්න බැරි වුණා.

"මං දන්නෙ නැහැ," ග්‍රෝවර් කිව්වා. "මං හිතන්නේ ක්‍රෝනොස් ප්‍රතිසංස්කරණය වෙලා නම්, කාටහරි ඒක දැනගන්න ලැබෙයි. දෙවිවරු මීට වඩා කලබල වෙයි. ඒ කොහොම වුණත්, මේක නම් හරි අමුතුයි, zසෝයි ඔයයි දෙන්නම එකම රෑ නරක හීන දකපු එක. ඒක හරියට-"

"එවා සම්බන්ධයි වගේ," මම කිව්වා.

මිදුණු පිට්ටනිය කෙළවරක, රතු කොණ්ඩයක් ඇති රුක් දේවතාවියක් එළවමින් සැටර් කෙනෙක් කුරවලින් ලිස්සා ගියා. මුකුළු හිනාවක් පෑව රුක් දේවතාවිය සැටර් ළඟට එද්දි ම අත් ඉදිරියට දිගු කළා. *පොප්!* එයා ස්කොච් පයින් ගහකට හැරෙද්දී, අධි වේගයෙන් ගිය සැටර් ගහේ කඳ සිපගත්තා.

"අහ්, ආදරේ," ග්‍රෝවර් හීනෙන් වගේ කිව්වා.

මම නපුරු හීනයක් දකලා පැය දෙක තුනක් ඇතුළත zසෝයිටත් නරක හීනයක් පෙනීම ගැන මම කල්පනා කළා.

"මම zසෝයි එක්ක කතා කරන්න ඕනෑ," මම කිව්වා.

"ම්, ඊට කලින්..." ග්‍රෝවර් කබා සාක්කුවෙන් මොකක්දෝ එළියට ගත්තා. ඒක ගමන් විස්තර ඇති පොත් පිංචක් වගේ තුනට නැමූ ලියවිල්ලක්. "ඔයා කියපු දේ මතක ද - දඩයක්කාරියෝ එක පාරට ම වෙස්ටෝවර්වල දී මතු වුණ විදිය ගැන? මට හිතෙන්නේ, එයාලා අපි ගැන ඔත්තු බලලා."

"ඔත්තු බලලා? මොකක්ද ඒකේ තේරුම?"

එයා මට පොත් පිංච දුන්නා. එහි තිබුණේ ආර්ටෙමිස්ගේ දඩයක්කාරියන් ගැන විස්තරයක්. පිට කවරයේ '*ඔබේ අනාගතය වෙනුවෙන්*

*නිවැරදි ම තෝරා ගැනීම!'* ලෙස සටහන්ව තිබුණා. ඇතුළේ දඩයම් කරන, රාක්ෂයින්ව ලුහුබඳින සහ දුනු හරඹ දක්වන තරුණ ගැහැනු ළමයින්ගේ පින්තූර තිබුණා. තව, *සෞඛ්‍ය ප්‍රතිලාභ! අමරණීයත්වය සහ එයින් ඔබට ලැබෙන දේ! කොල්ලන්ගෙන් නිදහස් හෙටක්!* වගේ මාතෘකාත් තිබුණා.

"මම මේක හොයා ගත්තෙ ඇනබෙත්ගේ මල්ලෙ තිබිලා," ග්‍රෝවර් කිවුවා.

මම එයා දිහා බලාගෙන හිටියා. "මට තේරෙන්නෙ නැහැ."

"හොඳයි, මට පේන හැටියට... සමහරවිට ඇනබෙත් එයාලට බැඳෙන්න හිත හිතා ඉන්නැති."

★★★

ඒ ආරංචිය මම හොඳින් දරාගත්තා කියලා කියන්න මම කැමතියි.

ඒත් ඇත්තම කියනවා නම්, මට ආර්ටෙමිස්ගේ දඩයක්කාරියෝ එකින් එකාගේ බෙලි මිරිකන්න ඕනෑ වුණා. දවසේ ඉතිරිය පුරා කාර්යබහුල වෙන්න මම උත්සාහ කළා, ඒත් ඇනබෙත් ගැන හිතල ම මගේ හිත ලෙඩ වුණා. මම හෙල්ල විසි කිරීම පුහුණුවීමේ පන්තියට ගියා. එතැන දී මම මෙලෝ සිහියක් නැතුව ඉලක්කයට හෙල්ලය විසි කරලා තිබුණේ එතැන උපදේශක විදිහට හිටපු ඒරීස් කඳවුරුකාරයා පාරෙන් ඉවත් වෙන්නත් කලින්නුයි. එයාගේ කලිසම හිල් කරාට මම සමාව ඉල්ලුවා, ඒ කොහොම වුණත් එයා මාව බඩු අහුරන්න යැව්වා.

මම පෙගසස් ඉස්තාලයට ගියත්, එතැන ඇෆ්‍රොඩයිට් කැබිනයේ සිලේනා බියුරෙගාඩ් දඩයක්කාරියක් එක්ක වාදයක පැටලී සිටියා. ඒකට පැටලෙන්නැතිව ඉන්න එක හොඳයි කියලා මම තීරණය කළා.

එයින් පස්සේ හිස් කරත්ත නැවතුම්පොළේ වාඩිවුණ මම බුම්මගෙන හිටියා. පහළ දුනු ශිල්ප අඩවියේ කයිරොන් ඉලක්ක පුහුණුවීමට මග පෙන්වනවා පෙනුණා. කතා කරන්න හොඳම කෙනා එයා බව මම දැන සිටියා. සමහරවිට එයා මට දැනමුතුකමක් දේවි, ඒත් මොකක්දෝ හේතුවකට මම පසුබැවා. හැමදාමත් වගේ ම මෙතැනදීත් කයිරොන් මාව ආරක්ෂා කරන්න උත්සාහ කරයි කියලා මට හැඟුණා. එයා දන්න හැමදේම මට කියන්නේ නැති වෙයි.



මම අනෙක් පැත්ත බැලුවා. අර්ධ-ලෝහිත කඳු මුදුනේ මිස්ටර් ඩී සහ ආර්ගස් රන් සළුව ආරක්ෂා කරන මකර පැටියාට කෑම කවමින් සිටියා. ඒක දකිද්දී මට අදහසක් පහළ වුණා: ඒ වෙලාවේ මහ ගෙදර කවුරුවත් නැතුව ඇති. මට මග පෙන්වීමක් ලබා ගත හැකි තව කෙනෙක්... තව දෙයක් එතැන තිබුණා.

මහ ගෙදරට දුව ගොස් පඩිපෙළ නගිද්දී මගේ කන් ඇතුළේ ලේ පිරිලා ගිගුම් දුන්නා. මීට කලින් මම මේ දේ කරලා තිබුණේ එක වරක් විතරයි. මම තවමත් ඒක හීනෙන් දැකලා බය වුණා. බිම් දොර ඇරගත් මම අට්ටාලයට ගොඩ වුණා.

මට මතක තිබුණු විදිහට ම ඒ කාමරේ කළුවරෙන්, දූවිල්ලෙන් සහ සුන්බුන්වලින් පිරිලා තිබුණා. එතැන රාක්ෂයින්ගේ දත් පාරවල් වැදුණු පලිහවල්, යක්ෂයින්ගේ ඔළුවේ හැඩේට තලය නැමුණු කඩු, පුළුන් පිරවූ හාර්පිලාගේ සහ දීප්තිමත් තැඹිලි පාට පොළඟෙකුගේ වියළුණු හම් වගේ දේවල් තිබුණා.

එතැනින් එහා, ජනේලය ළඟ කකුල් තුනේ බංකුවක් මත බතික් ගවුමකින් සැරසුණු නාකි ගෑනු කෙනෙකුගේ ඇකිළී රැළි ගැසුණු මමිය තිබුණා. එයා තමයි ඔරකල්.

එයා ඉදිරියට යන්න මම, මටම බල කරා. මීට කලින් වතාවේ සිදු වූ විදිහටම එයාගේ කටින් කොළ පාට දුමක් පිටවෙන තුරු මම බලා සිටියත් කිසිවක් වුණේ නැහැ.

"හායි," මම කතා කළා, "අහ්, ඉතින්, මොනවද වෙන්නේ?"

මම කතා කළේ කොයි තරම් මෝඩ තාලෙට ද කියලා හිතෙද්දී මම ඇකිළුණා. මැරිලා, අට්ටාලෙක කොටු වෙලා ඉන්න මමියකට මොනවා වෙන්න ද? ඒත් ඔරකල්ගේ ආත්මය කොහේ හෝ තියෙන බව මම දැන සිටියා. ඒක දඟර ගැසී නිදා ඉන්න සර්පයෙක් වගේ මේ කාමරයේ කොතැන හෝ ඇති බව මට දැනුණා.

"මට ප්‍රශ්නයක් තියෙනවා," මම හඬ ටිකක් වැඩි කරලා කිවුවා. "මට ඇනබෙත් ගැන දැන ගන්න ඕනෑ. මම කොහොමද එයාව බේරගන්නේ?"

උත්තරයක් නැහැ. අට්ටාලයේ අපිරිසුදු ජනේලය හරහා ඇල වී වැටුණු ඉර එළියෙන් වාතය පුරා නටන දූවිලි අංශු එළිය වුණා.

මම තවත් ටිකක් වෙලා බලා සිටියා.

Scanned with CamScanner

ඊට පස්සෙ මට තරහා ගියා. මළ මිනියක්වත් මට උදවු කරන්නෙ නැහැ.

"හොඳයි," මම කිවුවා. "කමක් නෑ. මම ම ඒක හොයාගන්නම් කෝ."

අනෙක් පැත්ත හැරුණ මම සිහිවටන ගොඩ ගැසූ ලොකු මේසයක හැප්පුණා. මම කලින් වතාවේ එද්දී තිබුණටත් වඩා ඒක තවත් හැඩිවෙලා වගෙයි. වීරයෝ එක එක ජාතියේ දේවල් අට්ටාලයේ ගොඩ ගැසුවාඃ තව දුරටත් කැබින්වල තියාගන්න උවමනා නැති ගවේෂණ ඵලක, දුක්බර මතකයන් සිහි ගන්වන සිහිවටන වගේ හැමදෙයක්ම. මෙහි කොතැනක හෝ ලූක්, එයාගේ මුහුණේ කැළැල් ඇති කළ මකර නියපොත්ත දමා ඇති බව මම දන සිටියා.

එතැන ලේබලයක් ඇලවූ කැඩුණු කඩු මිටක් තිබුණාඃ *මෙය බිදී ලෙරෝයි මරණයට පත්වුණේ 1999දියි.*

ඒත් එක්කම මට ලේබලයක් ඇමුණූ රෝස පාට සේද කර ලේන්සුවක් දකින්න ලැබුණා. ඇමුණුම අහුලාගත් මම එය කියවන්න උත්සාහ කළාඃ

ඇෆ්‍රොඩයිට් දෙවඟනගේ කර ලේන්සුව.

ඩෙන්වර්, ජල උද්‍යානයේ දී සොයා ගත්තේ ඇනබෙත් චේස් සහ පර්සි ජැක්සන් විසිනි.

මම ලේන්සුව දිහා ඇසිපිය නොහෙළා බලා සිටියා. මට ඒක සහමුලින් ම අමතක වෙලයි තිබුණේ. අවුරුදු දෙකකට කලින් මගේ අතින් මේක උදුරා ගත්ත ඇනබෙත්, *'ඔහ් නෑ. ආදර මායාවන් ඔයාට එපා!'* වගේ මොකක්දෝ කතාවක් කිවුවා.

මම හිතන් හිටියේ එයා ඒක විසි කරන්න ඇති කියලයි. ඒත් ඒක තවමත් මෙතැන. මේ මුළු කාලය පුරාවට ම එයා ඒක ළඟ තියාගෙන හිටිය ද? එහෙනම් දැන් එයා ඒක අට්ටාලයට ගෙනැත් දැම්මෙ ඇයි?

මම මමිය වෙතට හැරුණා. එයා හෙලවුනේවත් නැතත්, දැන් එයාගේ මූණ හරහා වැටී තිබුණ හෙවණැලිවලින් පෙනුණේ එයා බිහිසුණු ලෙස හිනා වෙනවා වගෙයි.

ලේන්සුව බිම දැමූ මම පිටවීම දිහාවට දුවන්නේ නැතුව හෙමින් යන්න උත්සාහ කළා.

***



එදා රෑ කෑමෙන් පස්සේ, කොඩිය ඇල්ලීමේ තරගයෙන් දඩයක්කාරියන්ව පරාද කරන්න මම තදින්ම සූදානම් වෙලයි හිටියේ. එදා තරගය පොඩියට පවත්වන්නයි සූදානම් වුණේඃ තරගයට සහභාගී වුණේ බියන්කා ඩි ආන්ජෙලෝ ඇතුළු දඩයක්කාරියන් දහතුන්දෙනෙක් සහ ඒ තරම් කඳවුරුකරුවන් කණ්ඩායමක් විතරයි.

ෂෝයි නයිට්ෂේඩ් හිටියේ සෑහෙන හිත් අමාරුවකින් වගෙයි. එයා සැරින් සැරේට කයිරොන් දෙසට නුරුස්සන බැලුම් හෙළුවේ හරියට කයිරොන් එයාට මේක කරන්න සැලැස්සුවා කියලා විශ්වාස කරන්නත් බැහැ වගෙයි. අනෙක් දඩයක්කාරියනුත් වැඩි සතුටකින් ඉන්න බවක් පෙනුණේ නැහැ. කලින් දවසේ වගේ විහිළු කරමින් හිනා වෙන්න උත්සාහ නොකළ එයාලා භෝජන මණ්ඩපයේ එකට පොදි ගැහිලා, සන්නාහවල පටි තද කරගන්න අතරේ සැකයෙන් වගේ එකිනෙකාට මොනවදෝ කොඳුරා ගත්තා. එයාලගෙන් සමහරු අඬලා වගෙත් පෙනුණා. මං හිතන්නේ ෂෝයිට දකින්න ලැබුණු හීනය ගැන එයා හැමෝටම කියන්න ඇති.

අපේ කණ්ඩායමට බෙකන්ඩොර්ෆ් සහ තවත් හෙෆාස්ටස් කොල්ලෝ දෙන්නෙකුත්, ඒරිස් කැබිනයේ කීපදෙනෙකුත් (ඒත් ක්ලැරිස් පේන්න නැති එක නම් තවමත් නුහුරු දෙයක් වුණා), හර්මීස් කැබිනයේ ස්ටොල් සහෝදරයෝ සහ නිකෝත්, ඇෆ්‍රොඩයිට් ළමයි කීපදෙනෙකුත් හිටියා. ඇෆ්‍රොඩයිට් කැබිනයටත් තරගයට එකතු වෙන්න උවමනා වීම නම් හරිම අමුතු දෙයක්. මොකද, සාමාන්‍යයෙන් එයාලා කළේ පැත්තකට වෙලා ඉඳගෙන ඕපදූප කියකියා, ගඟට එබිලා හැඩවැඩ බලන එක විතරයි. ඒත් අපි ආර්ටෙමිස්ගේ දඩයක්කාරියන්ට විරුද්ධව තරග වදින බව දැනගත්තා ම එයාලා තරගයට එන්න ලොකු උනන්දුවක් පෑවා.

"මං එයාලට පෙන්නන්නම් 'වැදගැම්මකට නැති ආදරේ' තරම," යුද සන්නාහයේ පටි තද කරමින් සිලේනා බියුරෙගාඩ් ගෙරෙව්වා. "මං උන්ව කුඩු කරලා දානවා!"

ඉතිරිව සිටියේ තාලියා සහ මම විතරයි.

"මම පහර දෙන්නම්," තාලියා කිවුවා. "ඔයා ආරක්ෂාව ගැන බලාගන්න."

"ඔහ්," මම පස්ස ගැහුවේ මමත් ඒ කතාව ම කියන්න ලෑස්ති වුණ නිසයි, හැබැයි අනෙක් පැත්තට. "ඔයාට හොඳ පලිහක් එහෙමත් තියෙන නිසා ඔයා ආරක්ෂාව ගැන බලා ගත්තොත් හොඳයි කියලා හිතෙන්නැද්ද?"

තාලියා දැනටමත් ඒගිස් අතේ බැඳගෙන හිටියා, ඒක දැකපු අපේ කණ්ඩායමේ ම අයට පවා මෙඩූසාගේ හිස ඉදිරියේ බයේ වකුටු නොවී ඉන්න අමාරු වුණා.

"හොඳයි, මම හිතුවේ ඒකෙන් හොඳ පහරදීමක් කරන්න පුළුවන් වෙයි කියලා," තාලියා කිවුවා. "ඇරත්, රැකවලෙක් විදිහට වැඩ කරලා ඔයාට පුරුදුයි නේ."

එයා මට කොලොප්පම් කරනව ද කියලා මට හිතාගන්න බැරි වුණා. කොඩිය අල්ලන තරගයක දී රැකවලෙක් විදිහට ඉඳලා මට තිබුණේ දරුණු අද්දැකීම් ටිකක්. මගේ පළවෙනි අවුරුද්දේ දී, ඇනබෙත් මාව ඇමකට පාවිච්චි කරලා තිබුණා. එදා මම හෙලි පාරකින් හිල් වෙලා, නැත්නම් යම බල්ලෙක්ට අහුවෙලා නොමැරී බේරුනේ නූලෙන් වගේ.

"ඔව්, ප්‍රශ්නයක් නැහැ," මම බොරුවක් කිවුවා.

"නියමයි." ආපසු හැරුණු තාලියා, නියපොතු කඩාගන්නේ නැතිව යුද සන්නාහය ඇඳගන්න දඟලමින් සිටි ඇෆ්‍රොඩයිට් ළමයින්ට උදවු කරන්න ගියා. නිකෝ ඩි ආන්ජෙලෝ දත් තිස් දෙකම නියවාගෙන මගේ ළඟට දුවගෙන ආවා.

"පර්සි, මේක නම් නියමයි!" එයාගේ හිසේ තිබුණු නිල් පිහාටුවක් ඇමුණූ ලෝකඩ යුධ හිස්වැසුම එයාගේ ඇස්වලට රූටා ආවා, එයාට ලැබී තිබුණ උර තහඩුව එයා වගේ දෙගුණයක් විතර ලොකු කෙනෙකුට හරියන එකක්. මෙහෙට ආව මුල් ම වතාවේ මටත් මෙහෙම විහිළු පෙනුමක් තියෙන්න ඇති ද හිතලා මම පුදුම වුණා. අවාසනාවකට, මට හිතෙන්නේ එහෙම වෙන්න ඇති.

නිකෝ, එයාගේ කඩුව අමාරුවෙන් එසෙව්වා. "අපිට අනිත් කණ්ඩායමේ අයව මරන්න ලැබෙනව ද?"

"හොඳයි... නැහැ."

"ඒත් දඩයක්කාරියෝ කියන්නෙ අමරණීය අය නේ?"



"එහෙම වෙන්නෙ එයාලා සටනක දී මැරුනේ නැත්නම් විතරයි. ඇරත්-"

"අපිව මැරිලා වැටුණ ගමන් ආපහු පණ එනවා නම් මරු නේ, එතකොට අපිට දිගටම සටන් කරන්න පුළුවන්, තව-"

"නිකෝ, මේක සෙල්ලමක් නෙවෙයි. මේවා ඇත්තම කඩු. මේවගෙන් තුවාල වෙන්න පුළුවන්."

එයා බලාපොරොත්තු කඩවෙලා වගේ මගේ දිහා බලා සිටියා, මම කතා කළේ මගේ අම්මා වගේ කියලා මට තේරුණේ එතකොටයි. හපොයි. ඒක නම් හොඳ ලකුණක් නෙවෙයි.

මම නිකෝගේ උරහිසට තට්ටුවක් දැම්මා. "හේයි, අවුලක් නෑ. කණ්ඩායමේ අය එක්කම ඉන්නකෝ. ටෙසෝයිගේ පාරෙන් ඈත්වෙලා ඉන්න. අපි නියම වැඩක් දෙන්නයි යන්නේ."

මණ්ඩපයේ පොළොව කයිරොන්ගේ කුර වැදී දෙදරුවා.

"වීරයිනී!" එයා කතා කළා. "ඔයාලා නීති-රීති දන්නවා නේ! ඇළ පාර තමයි සීමාව. නිල් කණ්ඩායම- අර්ධ-ලෝහිත කඳවුරු පිල- කැලේ බටහිර පැත්තට. ආර්ටෙමිස්ගේ දඩයක්කාරියෝ- රතු කණ්ඩායම- කැලේ නැගෙනහිර පැත්තට. තරග තීරක සහ යුද බිමේ වෛද්‍යවරයා විදිහට මම වැඩ කරනවා. කරුණාකරලා, ඕනෑකමින් අංගවිකල කිරීම් කරන්නෙපා! මායා භාණ්ඩ පාවිච්චි කරන්න පුළුවන්. දැන් තම තමන්ට නියමිත තැන්වලට යන්න!"

"ෂෝක් නේ." මට එහා පැත්තේ ඉඳන් නිකෝ රහසින් කිවුවා. "මොන වගේ මායා බඩු ද? මටත් එකක් හම්බවෙයි ද?"

එයාට මායා භාණ්ඩයක් ලැබෙන්නෙ නැහැ කියලා මම කියන්න ලෑස්ති වෙනකොට ම තාලියා කතා කළා, "නිල් කණ්ඩායම! මාත් එක්ක යමු!"

ජයඝෝෂා නැගූ එයාලා එයා පසුපස ගියා. එයාලට ඉස්සර වෙන්න මට දුවන්න වුණා, ඒ මදිවට මම කාගෙදෝ පලිහක හැප්පිලා වැටෙන්න ගියා, ඉතින් මාව පෙනුණේ සම-නායකයෙකුට වඩා මෝඩයෙක් වගෙයි.

★★★

අපි සියුස්ගේ මුෂ්ටිය මුඳුනේ අපේ කොඩිය රැඳවූවා. ඒක කැලයේ බටහිර කොටසේ පිහිටි ගල් ගෙඩි ගොඩක්. ඔයා හරි

පැත්තෙන් ඒක දිහා බැලුවොත්, ඒක පෙනෙන්නේ මිටි ගුලි කරගෙ යෝධ අතක් පොළොවෙන් ඉහළට මතුවෙලා වගෙයි. හැබැයි මඟා වෙන ඕනෑම පැත්තකින් බැලුවොත් ඒක පේන්නේ යෝධ මුව බෙ ගොඩක් වගෙයි. ඒත් සියුස්ගේ නමින් නම් කර තිබුණු ඒතැන අනෙක් නමින් හඳුන්වන්න කයිරොත් අපිට ඉඩ දුන්නේ නැහැ, මොකද සියුස් කියන්නේ වැඩිය විහිළු තේරෙන කෙනෙක් නෙවෙයි නේ.

කොහොම වුණත් ඒතැන කොඩියක් සිටුවන්න හොඳ තැනක් වුණා. එහි මුදුන් ගල් කුට්ටිය අඩි විස්සක් විතර උස, නගින්න හොඳටම අමාරු එකක්. ඒ නිසා නීතියේ හැටියට ම කොඩිය හොඳින් පේන්න රඳවන්නත්, ඊට යාර දහයක් ඈතින් මුරකරුවෝ රඳවන්න සිදුවීමත් අපිට කොහෙත්ම ගැටළුවක් වුණේ නැහැ.

නිකෝගේ ආරක්ෂාව ගැන හිතලා මම එයාව බෙකන්ඩෝර් සහ ස්ටෝල් සහෝදරයෝ සමග රැකවල් රාජකාරියට යෙදෙව්වා.

"එයාලව රවට්ටන්න කණ්ඩායමක් අපි වම් පැත්තෙන් යවනවා," තාලියා කණ්ඩායමට කිව්වා. "සිලේනා, ඔයා තමයි ඒකෙ නායකයා."

"තේරුණා!"

"ඔයා ලෝරල්වයි ජේසන්වයි අරන් යන්න. එයාලට හොඳට දුවන්න පුළුවන්. දඩයක්කාරියෝ වටේ ලොකු රවුමක් දුවන්න, එයාලව පුළුවන් තරම් ඔයාලගේ පැත්තට ගෙන්න ගන්න. මම කට්ටියක් එක්ක දකුණු පැත්තෙන් ඇවිත් වටලලා, එයාලව පුදුම කරලා අල්ල ගන්නම්."

හැමෝම ඔළුව වැනුවා. ඒ සැලසුම නම් සුපිරි එකක් වගෙයි, ඒ වගේම තාලියා ඒක කිව්වේ කොයි තරම් ආත්ම විශ්වාසයෙන් ද කියනවා නම්, ඒක අකුරට ම හරියයි කියලා විශ්වාස නොකර ඉන්න අපිට බැරි වුණා. තාලියා මගේ දිහා බැලුවා. "තව මොනවහරි එකතු කරන්න තියෙනව ද, පර්සි?"

"ම්, ඔව්. මුරට ඉන්න අය හොඳ සෝදිසියෙන් ඉන්න. අපිට ඉන්නෙ මුරකාරයෝ හතර දෙනෙකුයි, ඔත්තුකාරයෝ දෙන්නෙකුයි විතරයි. මේ වගේ ලොකු කැලෑවකට ඒ ගාණ මදි. මම වටේ යනවා. කාටහරි උදවු ඕනෑ වුණොත් කෑගහන්න."

"ඒ වගේම තමන්ගේ මුරපොළ දාලා යන්න එපා!" තාලියා කිව්වා.



"ඔයාලට රත්තරන් වටින අවස්ථාවක් ලැබුණොත් ඇරෙන්න," මම එකතු කළා.

තාලියා එරෙව්වා. "තමන්ගේ තැනින් හෙලවෙන්නැතුව හිටියම ඇති."

"හරි, හැබැයි-"

"පර්සි!" තාලියා මගේ අත අල්ලද්දි, මට කරන්ට් වැදුණා. මං කිව්වේ, ශීත සෘතුවේ දී ඕනෑම කෙනෙකුට ස්ථිතික කම්පන ඇති කරන්න පුළුවන් තමයි. ඒත් තාලියා එහෙම කරද්දි ගොඩක් රිදෙනවා. මං හිතන්නේ ඒකට හේතුව වෙන්න ඇත්තේ එයාගේ තාත්තා අකුණු විදුලිවලට අධිපති නිසා වෙන්නැති. මිනිස්සුන්ගේ ඇහි බැම් පුච්චන කෙනෙක් හැටියට තාලියා නමකුත් හදාගෙන තිබුණා.

"සමා වෙන්න," තාලියා කිව්වත්, එයාගේ කටහඬේ නම් කණගාටුවක ලකුණක්වත් තිබුණේ නැහැ. "දැන්, හැමෝටම පැහැදිලියි ද?"

හැමු දෙනාම ඔළුව වැනුවා. අපි, අපේ පුංචි කණ්ඩායම්වලට බෙදුණා. හොරණෑව නාද වෙද්දි තරගය පටන් ගත්තා.

සිලේනාගේ කණ්ඩායම වම් පැත්තට ගිහින් කැලය තුළට අතුරුදහන් වුණා. තත්පර කීපයක් ගතවෙන්න දුන් තාලියාගේ කණ්ඩායම දකුණු පැත්තට දිවුවා.

මොනවාහරි සිද්ධ වෙනකල් මම බලාගෙන හිටියා. මම සියුස්ගේ මුෂ්ටිය මුදුනට නැගලා කැලෑව හොඳින් පෙනෙන තැනක් හොයාගත්තා. මැන්ටිකෝරයා සමග සටන සිදු වුණ වේලාවේ දඩයක්කාරියෝ කුණාටුවක් වගේ කැලෑව තුළින් ආ හැටි මට මතක් වුණා. ඒ නිසා මම ඒ වගේ දේකට- අපිව විනාශ කරන්න ඉඩ ඇති විශාල ප්‍රහාරයකට සූදානමින් සිටියා. ඒත් කිසිවක් සිදු වුණේ නැහැ.

මට සිලේනා සහ එයාගේ ඔත්තුකාරයෝ දෙන්නව යාන්තමින් දැකගන්න ලැබුණා. තාලියාගෙන් ඉවතට, එළිමහන් බිමක් හරහා දිව ගිය එයාලව දඩයක්කාරියෝ පස්දෙනෙක් ලුහුබඳිමින් සිටියා.

සැලසුම වැඩ කරනවා වගෙයි පෙනුණේ. ඒත් ඒ වේලාවේ දී දුනු මානාගෙන දකුණු පැත්තට යන තවත් දඩයක්කාරියෝ රංචුවක් මට දකින්න ලැබුණා. එයාලා තාලියාව හොයාගෙන වගෙයි.

"මොනවද වෙන්නේ?" මගේ ළඟට බඩගාන්න දඟලමින් නිකෝ ඇසුවා.

මගේ හිත වේගයෙන් දුවන්න ගත්තා. තාලියාට කියටවත් එතැනට යන්න බැරි වෙයි, ඒත් දූන් දඩයක්කාරියෝ විසිරිලා. ඒ තරම් සෙනඟක් කණ්ඩායම් දෙකකට බෙදිලා ගියා නම්, එයාලගේ මධ්‍යස්ථානය සම්පූර්ණයෙන් ම ඇරිලා ඇති, මට එතැනට වේගයෙන් යාගන්න පුළුවන් වුණොත්....

මම බෙකන්ඩොර්ෆ් දිහා බැලුවා. "ඔයාලට බලකොටුව අල්ලන් ඉන්න පුළුවන් ද?"

බෙකන්ඩොර්ෆ් නහයෙන් පිම්බා. "මොකද බැරි?"

"මම ඇතුළට යනවා."

ස්ටොල් සහෝදරයින්ගේ සහ නිකෝගේ ජයඝෝෂා මැද මම සීමා මායිම දිහාවට දිවුවා.

හැකි උපරිම වේගයෙන් දුවමින් සිටි මට ලොකුකමක් දැනුණා. ඇළ පාර උඩින් මම සතුරු බල ප්‍රදේශයට පැන්නා. එයාලගේ රිදී කොඩිය ඉදිරියෙන් ලෙළ දෙනවා මට පෙනුණා. ඒක ආරක්ෂා කරන්න හිටියේ එක මුරකාරියක් විතරයි, එයත් මම ගිය පැත්ත දිහා බැලුවේවත් නැහැ. මගේ දකුණු පසින් හා වම් පසින් කැලය තුළ සටන් කරන හඬ මට ඇසුණා. මම කොහොමහරි ඒක කළා.

අන්තිම විනාඩියේ දී මුරකාරිය හැරුණා. ඒ බියන්කා ඩි ආන්ජෙලෝ. එයාගේ ඇස් ලොකු වෙද්දී ම මම එයාගේ ඇඟේ හැප්පුණා. එයා හිම උඩ හතර ගාතෙන් ඇද වැටුණා.

"සමා වෙන්න!" මම මොර දුන්නා. ගහ උඩ තිබුණු රිදී සේද කොඩිය උගුලුවා පහළට අරගෙන මම ආපහු දුවන්න ගටන් ගත්තා.

බියන්කා උදවු ඉල්ලා කෑගහද්දී මම යාර දහයක් විතර දුවලත් ඉවරයි. මම හිතුවේ මං නිදහස් කියලයි.

*වූෂ්!* මගේ වළලුකර හරහා වේගයෙන් ඇදී ගිය රිදී රැහැනක් ළඟම වූ ගහට ඇමුණුනා. ඒක දුන්නකින් විදපු පැටලුම් කම්බියක්! මම නවතින්න හිතන්නත් කලින්, ඒකේ පැටලිලා හොම්බ කට සමතලා කරගත්තා.

"පර්සි!" මගේ වම් පැත්තේ කොතැනින්දෝ තාලියා මොර දුන්නා. "මොනවද ඔය කරන්නේ?"



එයා මගේ ළඟට එන්න කලින් එයාගේ කකුල් දෙක ළඟ ඊතලයක් පුපුරා ගියේ කහ පාට දුම් වලාවකින් එයාගේ පිරිස වෙලා ගනිමිනුයි. එයාලා කහිමින් නහය කට වසා ගත්තා. දුමේ ගඳ කැලය හරහා මටත් දැනුණා- ඒක දරුණු ගෙන්දගම් ගඳක්.

"සාධාරණ නෑ!" තාලියා හුස්ම ඇල්ලුවා. "ෆාර්ට් ඊතල පාවිච්චි කරන එක සදාචාර විරෝධියි!"

දනිපනි ගා නැගිටපු මම ආයෙමත් දුවන්න පටන් ගත්තා. තව යාර තුන හතරයි, ඊට පස්සෙ තරගේ මගේ අතේ.

තවත් ඊතල මගේ කන ළඟින් ඇදී ගියා. එක පාරටම කොහෙන්දෝ මතු වුණ දඩයක්කාරියක් මට පිහියකින් කෙටුවත්, ඒ පහර මග ඇරිය මම නොනැවතී දිවුවා.

ඇළේ අපේ පැත්තෙන් මොර දෙන හඬවල් මට ඇසුණා. බෙකන්ඩොර්ෆ් සහ නිකෝ මගේ පැත්තට දුවගෙන ආවා. මම හිතුවේ එයාලා මාව පිළිගන්න එනවා කියලයි, ඒත් එයාලා කාවදෝ ලුහුබඳින බව ඊට පස්සේ මම දැක්කා- කිසිම කරදරයක් නැතිව කඳවුරුකාරයින්ව මග අරිමින්, ෆෙසෝයි නයිට්ෂේඩ් චීටාවෙක් තරම් වේගයෙන් මගේ පැත්තට දුවගෙන ආවා. එයාගේ අතේ අපේ කොඩිය තිබුණා.

"නෑ!" මොරදුන් මම වේගය උපරිමයෙන් වැඩි කළා.

මමු ඇළට අඩි දෙකක් දුරින් ඉඳිද්දී, ඇළට උඩින් පැන්න ෆෙසෝයි මාවත් පෙරළාගෙන එයාගේ පැත්තට පය ගැසුවා. දෙපිලේම අය ඇළ අසලට රැස් වෙද්දී දඩයක්කාරියෝ ජයඝෝෂා කළා. මූණ දෙල් කරගෙන කයිරොන් කැලෑවෙන් මතු වුණා. එයාගේ පිටේ ස්ටොල් සහෝදරයෝ දෙන්නා හිටියා. පෙනුණු හැටියට ඒ දෙන්නගෙම ඔළුවලට සැර පාරවල් වැදිලා වගෙයි. කොනර් ස්ටොල්ගේ හිස්වැසුම දෙපසින් ඇන්ටනා දෙකක් වගේ ඊතල ඇමිණී තිබුණා.

"දඩයක්කාරියෝ ජයග්‍රහණය කරනවා!" කයිරොන් කිසිම සතුටක් නැතිව කිවුවා. ඊට පස්සේ එයා හීන් හඬින් කෙඳිරුවා, "එක දිගට පනස් හය වෙනි වතාවටත්."

"පර්සියස් ජැක්සන්!!" කඩාගෙන බිඳගෙන මගේ දිහාවට එමින් තාලියා මොර දුන්නා. එයා ළඟින් කුණු බිත්තර ගඳ හැමුවා. එයා කේන්තියෙන් කොයි තරම් වියරු වැටිලා හිටිය ද කියනවා නම්, එයාගේ යුද සන්නාහයෙන් නිල් පාට පුපුරු විසි වුණා. ඒගිස් නිසා

Scanned with CamScanner

හැමදෙනාම බයේ ඇකිළෙමින් පස්සට වුණා. මමත් ඒ දේම නොකර හිටියේ හරිම අමාරුවෙන්.

"දෙයියන්ගෙ නාමෙට, ඔහේ මොනවද හිතුවෙ කියනවා?" එයා ගර්ජනා කළා.

මම අත් මිටි ගුළි කරගත්තා. එක දවසකට ඉවසන්න ඇති තරම් දේවල් මට වෙලයි තිබුණේ. මට මේකත් ඉවසන්න ඕනෑ වුණේ නැහැ.

"මම කොඩිය ගත්තා, තාලියා!" මම ඒක එයාගේ මූණට වැනුවා. "ඉඩක් දකපු ගමන් මම ඇවිල්ලා ඒක ගත්තා!"

"මම එයාලගේ මූලස්ථානෙට ම ගියා!" තාලියා මොර ගැහුවා. "එතකොට කොඩිය අතුරුදහන් වෙලා. ඔහේ හොස්ස දාන්නැතුව හිටිය නම් අපිට දිනන්න තිබුණා."

"ඔයා හැමදේම ඔයාටම තියාගත්තම හරි ද!"

"ඔහ්, දැන් එතකොට මම ද වැරදිකාරයා?"

"මම එහෙම කිව්වෙ නෑ නේ."

"ආර්ග්හ්!" තාලියා මාව තල්ලු කළා, ඒත් එක්කම මගේ ඇඟ පුරා විදුලියක් පැතිරී ගිහින්, මාව අඩි දහයක් පසුපස වතුරට විසි වුණා. කඳවුරුකරුවෝ සමහරෙක් හීල්ලුවා. දඩයක්කාරියෝ දෙතුන් දෙනෙක් හිනාවල් තද කරගත්තා.

"සමා වෙන්න!" තාලියා කිව්වේ සුදුමැලි වෙමින්. "මම හිතලා නෙවෙයි-"

මගේ කන් ඇතුළේ කෝපය ගර්ජනා කළා. ඇළෙන් ඉහළට නැඟුණු රැල්ලක් තාලියාගේ මූණට කඩා වැදී, එයාව ඉහේ සිට දෙපතුලටම නැවුවා.

මම හිටගත්තා. "ඔව්," මම ගෙරෙව්වා. "මමත් හිතලා නෙවෙයි ඒක කළේ."

තාලියා තද හුස්මක් ගත්තා.

"ඔය ඇති!" කයිරොන් නියෝග කළා.

ඒත් තාලියා, එයාගේ හෙල්ලය දිගු කළා. "තව ඕනෑ ද, පාසි මොළේ?"



කොහොමහරි, ඇනබෙත් මට ඒ නම කිව්වට මම ගණන් ගත්තේ නැහැ- අඩු තරමේ, මම ඒකට හුරුවෙලයි හිටියේ- ඒත් තාලියාගේ කටින් ඒක අහන්න නම් මම කොහෙත්ම කැමති වුණේ නැහැ.

"ඉතින් එනවා, පයින්කෝන් මූණිච්චි!"

මම රිප්ටයිඩ් එසෙව්වා, ඒත් මට, මාව ආරක්ෂා කරගන්න ඉඩක් ලැබෙන්න කලින් තාලියා මොර ගැහුවා, ඒත් එක්කම අහසින් පාත්වුණ විදුලියක් එයාගේ හෙල්ලයේ දැවටී, මගේ පපුවේ තදින් වැදුණා.

මාව වේගයෙන් ඉන්දවුණා. මට මොනවදෝ පිච්චෙන ගඳක් දැනුණා; ඒ මගේම ඇඳුම් ද කොහෙදෝ.

"තාලියා!" කයිරොන් කිව්වා. "ඔය හොඳටම ඇති!"

දෙපයින් හිටගත් මම මුළු ඇළටම ඉහළ නැගෙන්න නියෝග කළා. ගැලුම් සිය ගාණක වතුර යෝධ අයිස් පුනීලයක් වගේ කැරකෙමින් ඉහළ නැගුණා.

"පර්සි!" කයිරොන් බැගෑපත් වුණා.

මම ඒකෙන් තාලියාට දමලා ගහන්න හදනකොට ම කැලය තුළින් මතු වුණු දේ දකලා මගේ කේන්තියත්, හිතේ ඒකාග්‍රතාවයත් එකවිටම නැති වුණා. වතුර ආපහු ඇළ පතුලට ඇද වැටුණා. හොඳටෝම පුදුම වුණ තාලියා මම බලා ඉන්නේ මොකක් දිහා ද බලන්න හැරුණා.

යමෙක්... යමක් අපි දිහාවට එමින් සිටියා. එය අඳුරු කොළ පාට මීදුමකින් වැසී තිබුණා, ඒත් එය ළඟට එද්දී කඳවුරුකාරයෝ සහ දඩයක්කාරියෝ හීල්ලුවා.

"මේක වෙන්න බැරි වැඩක්," කයිරොන් කිව්වා. එයා ඒ තරම් කලබලෙන් කතා කරනවා මීට කලින් කවදාවත් මට ඇහිලා නැහැ. "ඒක... එයා කවදාවත් අට්ටාලෙන් බැහැලා නැහැ. කවදාවත් නැහැ."

ඒ කොහොම වුණත්, ඔරුකල්ව දරාගෙන සිටි වේළුණු මමිය කකුල් අද්දවමින් සෙනඟ මැදටම ආවා. අපේ කකුල් වටේ කැරලි ගැසුණු මීදුමෙන් හිම, අප්පිරියා සහගත කොළ පාටකට හැරුණා.

අපි කිසිවෙක් සෙලවෙන්නවත් එඩිතර වුණේ නැහැ. ඒත් එක්කම එයාගේ කටහඬ මගේ ඔළුව ඇතුළේ රැව් දෙන්න ගත්තා.

Scanned with CamScanner

පෙනුණු හැටියට, අනෙක් අයටත් ඒ හඬ ඇහිලා වගෙයි. මොකද කිපදෙනෙක් ම අත්වලින් කන් තද කරගත්තා.

*ඩෙල්ෆි හී ආත්මය මමයි,* කටහඬ කිවුවා. *ෆීබස් ඇපලෝගේ අනාගත වක්තෘ ද, අති බලැති පොළඟාගේ මාරයා ද මමයි.*

සීතල, මළ දෑස්වලින් මාව නිරීක්ෂණය කළ ඔරැකල් ඉන්පසුව ඉතා පැහැදිලි ලෙස ජෙසෝයි නයිට්ෂේඩ් වෙතට හැරුණා. *ප්‍රවේශ වනු. ගවේෂකය, විමසනු.*

ජෙසෝයි තදින් කෙළ ගිල්ලා. "මගේ දේවතාවියට උදවු කරන්න මම මොනවද කරන්න ඕනෑ?"

ඔරැකල්ගේ කට ඇරී, කොළ පාට මීදුමක් එළියට වැගිරුණා. මට නොපැහැදිලි කඳු ගැටයකුත්, මුඩු ගල් කුළක් ළඟ සිටින ගැහැනු ළමයෙකුත් දකින්න ලැබුණා. ඒ ආර්ටෙමිස්. හැබැයි එයාව දම්වැල්වලින් ඔතලා, ගල්කුළට විලංගු දමා තිබුණා. දණ ගසාගෙන සිටි එයා ප්‍රහාරකයෙකුගෙන් ආරක්ෂා වෙන්න වගේ දෑත් ඉහළට ඔසවාගෙන සිටියා. ඒ වගේම එයා හිටියේ වේදනාවෙන් වගෙයි. ඔරැකල් කතා කළා:

බටහිර යදම් ලූ දෙවඟන වෙතට පස්දෙනෙකු යනු ඇත,
වැසි නැති දේශයේ දී එකෙකු නැති වනු ඇත,
ඔලිම්පස් නසන්නා පියමං දක්වනු ඇත,
දිනුම උදෙසා කඳවුරුකරුවෝ හා දඩයක්කාරියෝ එක්වනු ඇත,
ටයිටන්ගේ ශාපයට එකෙකු එදිරි වනු ඇත,
මව් පිය අතින් එකෙකු නැසෙනු ඇත.

ඊට පස්සේ අපි බලා සිටිද්දී ම සුළි නැංවූ මීදුම යෝධ කොළ පාට සර්පයෙක් වගේ මම්මියේ කට තුළට රිංගුවා. ගලක් උඩ වාඩි වූ ඔරැකල් අට්ටාලයේ ඉන්නවා වගේ, තවත් අවුරුදු සීයක් වුණත් මේ ඇළ ළඟ ඉන්න යනවා වගේ නිසල වුණා.

# 07
# අශ්වයා ඇර අනෙක් හැමෝම මට වෛර කළා

පහළට ආව විදිහට ම ඔරැකල් ආපහු අට්ටාලෙට ගියා නම් මොකද වෙන්නේ?

ඒ වෙනුවට එයාව උස්සගෙන යන්න ග්‍රෝවර්වයි මාවයි තෝරගත්තා. හැබැයි ඒ අපි දෙන්නා වඩාත් ම ජනප්‍රිය අය නිසා නම් නෙවෙයි.

"එයාගේ ඔළුව බලාගෙන!" අපි පඩිපෙළ උඩට යද්දී ග්‍රෝවර් අනතුරු ඇඟෙව්වා. ඒත් එතකොට පරක්කු වැඩියි.

*බොන්ක්!* මගේ අතින් එයාගේ කරෝලයක් වගේ මූණ බිම් දොරේ රාමුවේ වදිද්දී දූවිලි ඇවිස්සුණා.

"අහ්, කොල්ලෝ," මම එයාව බිමින් තබා සිදු වූ හානිය පරීක්ෂා කළා. "මං මොනවාහරි කැඩුව ද දන්නෑ?"

"මටත් කියන්න බැහැ," ග්‍රෝවර් පිළිගත්තා.

අපි දෙන්නා හති දාගෙන, දාඩිය පෙරාගෙන එයාව උඩට අරන් ගිහින්, එයාගේ කකුල් තුනේ බංකුව උඩ වාඩි කළා. මමියක් ඔච්චර බර ඇති කියලා කවුද හිතුවේ?

Scanned with CamScanner

එයා මට කතා කරන්නේ නැති වෙයි කියලා මම හිතුවා, ඇත්තට ම මම හරි. අන්තිමේ දී එතැනින් එළියට ඇවිත්, අට්ටාලයේ දොර වසා දැමුවාට පස්සේ මට පුදුම අස්වැසිල්ලක් දැනුණේ.

"හොඳයි," ග්‍රෝවර් කිවුවා. "ඒක නම් මළ ජරාවක්."

මං ගැන හිතලා එයා සිදු වූ දේවල් සැහැල්ලුවෙන් ගන්න උත්සාහ කරන බව මම දැන සිටියා. ඒත් මට දැනුණු පහත් හැඟීම නම් අඩු වුණේ නැහැ. තරගයේ දී අපි දඩයක්කාරියන්ට පැරදුණාට දැන් මුළු කඳවුරේ ම අය මාත් එක්ක තරහෙන් ඇත්තේ. ඒ මදිවට ඔරැකල් අලුත් අනාවැකියකුත් දිග ඇරියා. ඒක හරියට ඩෙල්ෆි හී ආත්මයට මාව අහකටම දාන්න ඕනෑ වෙලා වගෙයි. මගේ ප්‍රශ්නය තඹ සතේකට මායිම් නොකරපු එයා ෂෙසෝයිට කතා කරන්න හැතැප්ම බාගයක් දුර ගාට ගාටා ආවා. ඒ වගේම එයා ඇනබෙත් ගැන කිසිම සඳහනක්, අඩු තරමේ ඉඟියක්වත් කළේ නැහැ.

"කයිරොන් මොනවා කරයි ද?" මම ග්‍රෝවර්ගෙන් ඇසුවා.

"මම දන්නෙත් නැහැ." එයා හිමෙන් වැසුණු කඳු යාය දිහා දෙවෙනි තට්ටුවේ ජනේලය හරහා කල්පනාබරව බැලුවා. "මට මෙහෙන් පිටවෙලා යන්න ඕනෑ."

"ඇනබෙත්ව හොයන්න ද?"

මං කියන දේට අවධානය දෙන්න එයාට ටිකක් අමාරු වුණා. ඊට පස්සේ එයාගේ මූණ රතු වුණා. "ඔහ්, හරි. ඒකටත් එක්ක තමයි. ඇත්තටම."

"ඇයි?" මම ඇසුවා. "ඔයා මොනවද හිත හිතා හිටියේ?"

එයා නොසන්සුන්ව කුර ගැසුවා. "මැන්ටිකෝරයා කියපු කතාවක් ගැන, මහා කැලඹීම ගැන. මම හිතුවේ... ආදිකාලීන බලවේග ඔක්කොම අවදි වෙනවා නම්, සමහරවිට... සමහරවිට ඒවා ඔක්කොම දුෂ්ඨ ඒවා නොවෙන්නත් පුළුවන්."

"ඔයා කියන්නේ පෑන් ගැන."

මට දැනුණේ මම ටිකක් ආත්මාර්ථකාමී වෙලා වගෙයි, මොකද ග්‍රෝවර්ගේ ජීවිතේ පරමාර්ථය ගැන මට සහමුලින්ම අමතක වෙලයි තිබුණේ. සොබාදහමට අධිපති දෙවියා මීට අවුරුදු දෙදහකට කලින් අතුරුදහන් වෙලා. එයා මැරිලා කියලා කට කතාවක් තිබුණත්, සැටර්ලා ඒක විශ්වාස කළේ නැහැ. පෑන්ව ඉන්න තැනකින් හොයාගන්න



එයාලා අධිෂ්ඨාන කරගෙනයි හිටියේ. එයාලා සියවස් ගාණක් තිස්සේ ප්‍රතිඵලයක් නැතිව පෑන්ව සොයමින් යනවා. ඒ වගේම, පෑන්ව හොයාගන්න කෙනා තමන් කියලා ග්‍රෝවර් තදින් ම විශ්වාස කළා. මේ අවුරුද්දේ, කයිරොන් හැම සැටර් කෙනෙක්වම අර්ධ-ලෝහිතයෝ සෙවීමේ හදිසි රාජකාරිවල යෙදවූ නිසා ග්‍රෝවර්ට, එයාගේ ගවේෂණය දිගටම කරගෙන යන්න ඉඩක් ලැබී තිබුණේ නැහැ. ඒ නිසාම එයා පිස්සු වැටිලයි ඉන්න ඇත්තේ.

"මම මංසලකුණු මැකිලා යන්න ඉඩ ඇරියා," එයා කිවුවා. "මට නිතරම ඉස්පාසුවක් නැති ගතියක් දැනෙනවා. හරියට මම මොකක්හරි වැදගත් දෙයක් මග අරිනවා වගේ. එයා මේ කොහේහරි තැනක ඉන්නවා. මට ඒක දැනෙනවා."

මොනවා කියන්න ද මට තේරුනේ නැහැ. එයාව දිරිමත් කරන්න මට ඕනෑ වුණත් ඒක කරන්නෙ කොහොමද මම දැන සිටියේ නැහැ. මගේ සර්වශුභවාදය කැලේ දී අපේ කොඩිය අල්ලා ගැනීමේ බලාපොරොත්තුවත් එක්කම හිමවලට යටවෙලයි තිබුණේ.

මම කිසිවක් කියන්න කලින්, තාලියා සද්ද කරමින් පඩිපෙළ දිගේ උඩට ආවා. දැන් එයා නිල වශයෙන් මාත් එක්ක කතා කරන්නෙ නැහැ, ඒ වුණත් ග්‍රෝවර් දිහා බලපු එයා, "පර්සිට කියන්ඩ පල්ලෙහාට එන්න කියලා," කිවුවා.

"ඒ මොකටද?" මම ඇසුවා.

"එයා මොනවාහරි කිවුව ද?" තාලියා ග්‍රෝවර්ගෙන් ඇසුවා.

"ම්... එයා අහනවා මොකටද කියලා."

"අනාවැකිය ගැන සාකච්ඡා කරන්න ඩයනයිසියස් කැබින් නායකයින්ගේ රැස්වීමක් කැඳෙව්වා," එයා කිවුවා. "අවාසනාවට, ඒකට පර්සිවත් ඕනෑ."

★★★

ක්‍රීඩා කාමරයේ පින්ග්-පොන්ග් මේසයක් වටේට අපි රැස්වුණා. ඩයනයිසියස් අතක් වනා ස්නැක් වර්ග සැපයුවා: චීස් විස්, ක්‍රැකර්ස් සහ රතු වයින් බෝතල් කීපයක්. ඊට පස්සේ, වයින් එයාට තහනම් බවත්, අපෙන් වැඩි දෙනෙක් බාල වයස්කාරයෝ බවත් කයිරොන් එයාට මතක් කළා. සුසුමක් හෙළූ මිස්ටර් ඩී අසුරක් ගසද්දී වයින් බෝතල් ඩයට් කෝක්වලට හැරුණා. කාටවත් ඒවා ඕනෑ වුණෙත් නැහැ.

Scanned with CamScanner

මිස්ටර් ඩී සහ කයිරොන් (රෝද පුටුවේ සිටි) මේසයේ එක් කොණක වාඩි වුණා. ෙZසෝයි සහ බියන්කා ඩි ආන්ජෙලෝ (එයා දැන් ෙZසෝයිගේ පුද්ගලික සහායිකාව වෙලයි හිටියේ.) අනෙක් කොණ ගත්තා. තාලියා, ග්‍රෝවර් සහ මම දකුණු පස වාඩි වෙද්දි, අනෙක් කැබින් නායකයෝ- බෙකන්ඩොර්ෆ්, සිලේනා බියුරෙගාඩ් සහ ස්ටොල් සහෝදරයෝ- වම් පසින් වාඩි වුණා. ඒරීස් කැබිනයෙනුත් නියෝජිතයෙක් එවන්න නියමිතව තිබුණත්, දඩයක්කාරියන්ගේ කරුණාවන්තකමට ස්තුති වෙන්න කොඩිය අල්ලන තරගයේ දී එයාලා හැමෝගෙම අඬු කැඩිලා, දැන් අසනීප කාමරයේ ප්‍රතිකාර ගන්න බව දන්වා තිබුණා.

ෙZසෝයි ධනාත්මක කතාවකින් රැස්වීම පටන් ගත්තා. "මේක තේරුමක් නැති වැඩක්."

"චීස් විස්!" ග්‍රෝවර් හීල්ලුවා. එයා ක්‍රැකර්ස් සහ පින්ග්-පොන්ග් බෝල අතට අරන් ඒවාගේ චීස් විස් තවරන්න පටන් ගත්තා.

"කතා කර කර ඉන්න කාලයක් නැහැ," ෙZසෝයි කියාගෙන ගියා. "අපේ දෙවඟනට අපිව ඕනෑ. දඩයක්කාරියෝ පුළුවන් තරම් ඉක්මනට පිටත් වෙන්න ඕනෑ."

"පිටත් වෙලා කොහේ යන්න ද?" කයිරොන් ඇසුවා.

"බටහිරට!" බියන්කා කිවුවා. දඩයක්කාරියෝ සමග ගත කළ දවස් දෙක තුනට එයා වෙනස් වී ඇති තරම මාව විමතියට පත් කළා. දැන් එයාගේ කොණ්ඩයත් ෙZසෝයිගේ වගේ කරලකට ගොතා තිබුණු නිසා, මට එයාගේ මුහුණ හොඳින් දැකගන්න ලැබුණා. එයාගේ නහය පුරා ලප ගොඩක් විසිරී තිබුණා. එයාගේ කළු ඇස් ප්‍රසිද්ධ කෙනෙක්ව නොපැහැදිලි ලෙස මගේ මතකයට නැඟුවත්, ඒ කවුද කියලා මට හිතාගන්න බැරි වුණා. ඒ වගේම, එයා පෙනුම ගැන වඩාත් උනන්දු වෙනවා වගෙයි පෙනුණේ. අනෙක් දඩයක්කාරියන්ගේ වගේම එයාගේ හමත් යාන්තමින් දිලිසුනේ හඳ එළිය නාලා වගෙයි. "ඔයාලට අනාවැකිය ඇහුණා නේ. *'බටහිර යදම් ලූ දෙවඟන වෙනට පස් දෙනෙකු යනු ඇත.'* අපිට දඩයක්කාරියෝ පහක් අරගෙන යන්න පුළුවන්."

"ඔව්," ෙZසෝයි එකඟ වුණා. "ආර්ටෙමිස්ව ප්‍රාණ ඇපකාරියක් විදිහට රඳවාගෙන! අපි කොහොමහරි එතුමියව හොයාගෙන නිදහස් කරන්න ඕනෑ."



"පුරුදු විදිහට ම, ඔයාලට දෙයක් මග ඇරිලා," තාලියා කිවුවා. "*'දිනුම උදෙසා කඳවුරුකරුවෝ සහ දඩයක්කාරියෝ එක්වනු ඇත.'* ඒ කියන්නේ අපි දෙගොල්ලො එකතු වෙලා මේක කරන්න ඕනෑ."

"නෑ!" ෙZසෝයි කිවුවා. "දඩයක්කාරියන්ට තිගේ උදවු ඕනෑ නැහැ."

"'ඔයාගේ'," තාලියා අවලාද නැගුවා. "කිසිම කෙනෙක් අවුරුදු තුන්සීයකින් විතර 'තිගේ' කියන වචනේ පාවිච්චි කරලා නැහැ, ෙZසෝයි. කාලෙත් එක්ක යන්න පුරුදු වෙන්න."

ෙZසෝයි ඒ වචනය කටට හුරු කරගන්න වගේ කල් මැරුවා. "ඔ-ය-ගේ. අපිට ඔ-ය-ගේ උදවු ඕනෑ නෑ."

තාලියා ඇස් කැරකුවා. "අතෑරලා දාන්ඩ."

"මට බය, අනාවැකියේ කියන්නේ ඔයාලට අපේ උදවු ඕනෑ කියලා." කයිරොන් කිවුවා. "කඳවුරුකාරයෝයි, දඩයක්කාරියෝයි එකමුතු වෙලා වැඩ කරන්න ඕනෑ."

"එයාලා එහෙම කරන්න ඕනෑ ද?" කල්පනාබරව කියූ මිස්ටර් ඩී, එයාගේ ඩයට් කෝක් එක නාහෙ ළඟට අරන් කැලතුවේ හරියට ඒකෙ හොඳ සුවඳක් තියෙනවා වගෙයි. "'*එකෙකු නැති වනු ඇත. එකෙකු නැසෙනු ඇත.*' මේක හරිම නපුරු පාටයි, නැද්ද? ඔයාලා එකමුතු වෙන්න උත්සාහ කරන නිසාම වැඩ වැරදුනොත් මොකද කරන්නේ?"

"මිස්ටර් ඩී," කයිරොන් සුසුමක් හෙළුවා. "මං මේ දැනගන්න අහන්නේ, ඇත්තටම ඔයා කාගේ පැත්තෙ ද?"

ඩයනයිසියස් ඇහිබැමි එසෙව්වා. "සමා වෙන්න, මගේ ආදරණීය නරාශ්වයෝ. මම උදවු කරන්න හැදුවා විතරයි."

"අපිට එකතු වෙලා වැඩ කරන්න වෙනවා," තාලියා ඇට්ටර තාලෙට කිවුවා. "මමත් ඒකට කැමති නෑ තමයි, ෙZසෝයි, ඒත් අනාවැකි ගැන දන්නවනේ. ඒකකට විරුද්ධව සටන් කරන්න ඔයාට ඕනෑ ද?"

ෙZසෝයිගේ මූණ ඇඹුල් වුණා, ඒත් තාලියා නියම තැනට ඇණේ ගැහුවා කියලා මට තේරුණා.

"අපි පරක්කු වෙන්න හොඳ නෑ," කයිරොන් අනතුරු ඇඟෙව්වා. "අද ඉරිදා. මේ සිකුරාදා, දෙසැම්බර් විසි එක තමයි දක්ෂිණායනය."

"ඔහ්, නියමයි," ඩයනයිසියස් කෙඳිරුවා. "තවත් මොට්ට වාර්ෂික රැස්වීමක්."

"ඒකට ආර්ටෙමිසුත් ඉන්නම ඕනෑ," ZEසෝයි කිව්වා. "ක්‍රෝනොස්ගේ දාසයන්ට විරුද්ධව පියවර ගැනීම ගැන මන්ත්‍රණ සභාවේ වාදයට එයා අත්‍යවශ්‍ය කෙනෙක්. එයා ගියේ නැත්නම්, දෙවිවරු කිසිම තීරණයක් නොගෙන ඉඳීවි. අපිට යුද්ධයට සූදානම් වෙන්න තියෙන තවත් අවුරුද්දක් නැති වෙයි."

"ඔයා කියන්න හදන්නේ දෙවිවරුන්ට එකතු වෙලා වැඩ කරන්න බැහැ කියල ද, කෙල්ලේ?" ඩයනයිසියස් ඇසුවා.

"ඔව්, ඩයනයිසියස් උතුමාණෙනි."

මිස්ටර් ඩී ඔළුව වැනුවා. "නිකං ඇහුවේ. ඇත්ත වශයෙන්ම ඔයා හරි. කියාගෙන යන්න."

"මමත් ZEසෝයිගේ කතාවට එකඟයි," කයිරොන් කිව්වා. "දක්ෂිණායන මන්ත්‍රණ සභාවට ආර්ටෙමිස්ගේ පැමිණීම ගොඩක් වැදගත්. අපිට එයාව හොයාගන්න තියෙන්නේ සතියක කාලයක් විතරයි. බාගදා ඊටත් වඩා වැදගත් වෙයි එයා දඩයම් කරන්න ගිය රාක්ෂයා ඉන්න තැන හොයාගන්න එක. දැන්, මේ ගවේෂණයට යන්නෙ කවුද කියලා අපි තීරණය කරන්න ඕනෑ."

"තුනයි දෙකයි," මම කිව්වා.

හැමෝම මගේ දිහා බැලුවා. අඩු තරමේ තාලියාට මාව ගණන් නොගෙන ඉන්නත් අමතක වුණා.

"අපි පස් දෙනෙක්ටයි යන්න කියලා තියෙන්නේ," සබකෝලයක් හිතට දැනෙද්දී මම කිව්වා. "දඩයක්කාරියෝ තුනයි, අර්ධ-ලෝහිත කඳවුරෙන් දෙකයි යමු. ඒක ඕනෑවටත් වඩා සාධාරණයි."

තාලියා සහ ZEසෝයි බැල්මක් හුවමාරු කර ගත්තා.

"හොඳයි," තාලියා කිව්වා. "ඒකෙ තේරුමක් තියෙනවා."

ZEසෝයි ගෙරෙව්වා. "දඩයක්කාරියෝ ඔක්කොම අරන් යන්න තියෙනවා නම් මම ගොඩක් කැමතියි. අපිට පිරිස් බලය ඕනෑ වෙයි."

"ඔයාලට දෙවඟන ගිය පාර හොයාගෙන යන්න වෙනවා," කයිරොන් එයාට මතක් කරලා දුන්නා. "ළහිලහියේ යන්න වෙනවා. ඒකත් එකටම, ආර්ටෙමිස් බටහිරට යන්න ඇත්තේ මේ දුර්ලභ රාක්ෂයා



මොකා වුණත්, ඌගේ ඉව පාර දිගේ. ඔයාලටත් ඒ දේම කරන්න වෙයි. අනාවැකිය පැහැදිලියි නේ: 'ඔලිම්පස් නසන්නා පියමං දක්වනු ඇත.' මෙහෙම වෙලාවක ඔයාලගේ ස්වාමිදුව මොනවා කියයි ද? 'දඩයක්කාරියෝ ගොඩකින් ඉව මැකෙනවා.' පුංචි කණ්ඩායමක් තමයි හොඳම."

පින්ග්-පොන්ග් පිත්තක් අතට ගත් ZEසෝයි ඒක දිහා ඕනෑකමින් බලා සිටියේ මුලින් ම ඒකෙන් ගහන්නේ කාට ද කියලා හිතාගන්න බැරුව වගෙයි. "මේ රාක්ෂයා - ඔලිම්පස් නසන්නා. මම ආර්ටෙමිස් උත්තමාවිය එක්ක අවුරුදු ගාණක් දඩයම් කරලා තියෙනවා, ඒත් මේ සතා මොකාද කියලා මට කිසිම අදහසක් නැහැ."

හැමෝම ඩයනයිසියස් දිහාවට හැරුණා, මං හිතන්නේ ඒකට හේතුව එතැන හිටපු එකම දෙවියා එයා නිසාත්, දෙවිවරු ගොඩක් දේවල් දන්නවා කියන නිසාත් වෙන්න ඇති. එයා වයින් සඟරාවක් පෙරළමින් සිටියත්, හැමෝම නිශ්ශබ්ද වුණ නිසා ඔළුව ඔසවා බැලුවා. "හොඳයි, මගේ දිහා බලන්නෙපා. මතක නේ? මම තරුණ දෙවියෙක්. මම ඔය පරණ රාක්ෂයෝ ගැනයි, දූවිලි වැදිච්ච ටයිටන්ලා ගැනයි මතක තියන් ඉන්නෑ. උන් පාර්ටිවල දී කතාබහ කරන්න වටින එවුන් නෙවෙයි."

"කයිරොන්," මම කතා කළා, "මේ රාක්ෂයා මොකා ද කියලා ඔයාට කිසිම අදහසක් නැද්ද?"

කයිරොන් තොල් තදින් පියවා ගත්තා. "මට අදහස් කීපයක්ම තියෙනවා, හැබැයි ඒ එකක්වත් හොඳ ඒවා නම් නෙවෙයි. උදාහරණයකට, ටයිෆොන්ව මේ විස්තරේට ගැළපෙනවා. එයා ඇත්තටම ඔලිම්පස් නසන්නෙක්. එහෙම නැත්නම් කේටෝ කියන මුහුදු රාක්ෂණිව. ඒත් මේ දෙන්නගෙන් එක්කෙනෙක් හරි කැලඹෙනවා නම්, අපිට ඒක දැනගන්න ලැබෙනවා. එයාලා අහස උසට ඇති ගොඩනැගිලි තරම් ලොකු සමුද්‍ර රාක්ෂයෝ. එහෙම වුණා නම් ඔයාගේ තාත්තා පොසෙයිඩන් මෙලහකටත් අනතුරු අඟවලා. මට බය මේ රාක්ෂයා ඊට වඩා අපිට අමතක වෙලා ගිය එකෙක් ද කියලා. බාගදා, ගොඩක් බලවත් එකෙක් වෙන්නත් පුළුවන්."

"ඒක නම් ඔයාලට මූණ දෙන්න වෙන බරපතළ ප්‍රශ්නයක්," කොනර් ස්ටොල් කිව්වා. එයා 'අපිට' නොකියා 'ඔයාලට' කියපු විදිහට මම කැමති වුණා. "ඒකෙන් කියවෙන විදිහට පස් දෙනාගෙන් දෙන්නෙක්වත් මැරෙන්නයි යන්නේ."

Scanned with CamScanner

"*'වැසි නැති දේශයේ දී එකෙකු නැති වනු ඇත.'*" බෙකන්ඩොර්ෆ් කිව්වා. "මම ඔයාලා වුණා නම්, මම කරන්නේ කාන්තාරවලින් ඈත්වෙලා ඉන්න එක."

එයට එකඟතාවය පළ කරන කෙදිරුම් හඬවල් කිපයක් ඇසුණා.

"එතකොට *'ටයිටන්ගේ ශාපයට එකෙකු එඳිරි වනු ඇත,'*" සිලේනා කිව්වා. "ඒකෙ තේරුම මොකක් වෙන්නැති ද?"

කයිරොන් සහ Ζසෝයි සැක සහිත බැල්මක් හුවමාරු කරගන්නවා මට දකින්න ලැබුණා. ඒත් එයාලගේ හිත්වල වැඩ කළ අදහස මොකක් වුණත්, ඒක අපිත් එක්ක බෙදාගත්තේ නැහැ.

"*'මව් පිය අතින් එකෙකු නැසෙනු ඇත,'*" චිස් චිස් සහ පින්ග්-පොන්ග් බෝල කටේ පුරවගෙන ග්‍රෝවර් කිව්වා. "ඒක වෙන්නෙ කොහොමද? කාගේ අම්මා තාත්තා ද එයාලව මරන්නේ?"

මේසය වටේ බරපතළ නිහැඬියාවක් පැතිරුණා.

තාලියා දිහාවට ඉක්මන් බැල්මක් හෙළමින් මම පුදුම වුණේ මම හිතමින් සිටි දේම එයත් හිතනවා ඇති ද කියලයි. අවුරුදු ගාණකට කලින්, මීළඟට අවුරුදු දාසය ලබන ලොකු තුන්කට්ටුවේ - ඒ කියන්නේ සියුස්ගේ, පොසෙයිඩන්ගේ හෝ හේඩීස්ගේ ළමයා ගැන කයිරොන්ට අනාවැකියක් ලැබී තිබුණා. එහි කියා තිබුණු හැටියට දෙවිවරුන්ගේ පැවැත්ම හෝ විනාශය තීරණය කරන්නේ ඒ ළමයායි. ඒ හේතුව නිසාම, දෙවෙනි ලෝක යුද්ධයෙන් පස්සේ ලොකු තුන්කට්ටුව තවත් ළමයි බිහි නොකරන්න දිව්රා තිබුණා. ඒ කොහොම වුණත් තාලියායි මමයි ඉපදුණා, දැන් අපි දෙන්නම දාසය වෙනි උපන්දිනේට ටිකෙන් ටික ළං වෙමින් සිටියා.

ගිය අවුරුද්දේ ඇනබෙත් සමග කළ කතාබහක් මගේ මතකයට නැඟුණා. මම ඔය කියන තරම් අනතුරුදායක කෙනෙක් වෙන්න ඉඩ තියෙනවා නම් දෙවිවරු මාව මරලා දාන්නෙ නැත්තෙ ඇයි කියලා මම එයාගෙන් ඇහුවා.

*'ඔයාව මරලා දාන්න සමහර දෙවිවරු කැමතියි,'* එදා ඇනබෙත් කිව්වා. *'ඒත් එයාලා පොසෙයිඩන්ව තරහා කරගන්න බය ඇති.'*

තමන්ගේ අර්ධ-ලෝහිත දරුවාට විරුද්ධ වෙන්න ඔලිම්පියානු අම්මා කෙනෙකුට හෝ තාත්තා කෙනෙකුට පුළුවන් ඇති ද? සමහර



වෙලාවට, එයාලට මැරෙන්න ඉඩ අරින එක එයාට පහසුවක් වෙනවා ඇති ද? ඒ ගැන වද වෙන්න සිද්ධ වෙන එකම අර්ධ-ලෝහිතයෝ වෙන්නේ තාලියා සහ මම විතරයි. ලෝක පියවරුන්ගේ දවසේ පොසෙයිඩන්ගේ සිප්පි කටු මෝස්තරයක් වැටුණ ටයි එකක්වත් යවන්න තිබුණා කියලා මට හදිසියේ ම හිතෙන්න ගත්තා.

"මේකෙදි මරණයක් සිද්ධ වෙයි," කයිරොන් නිගමනයකට බැස්සා. "අපි දන්නෙ එච්චරයි."

"ඔන්, නියමයි!" මිස්ටර් ඩී කිව්වා.

හැමෝම එයා දිහා බැලුවා. එයා හරිම අහිංසක තාලෙට වයින් විචාරක සඟරාවෙන් ඔළුව ඔසවා බැලුවා. "අන්, පිනොට් නොයිර් වර්ගය ආපහු එන්නයි යන්නේ. මං කියන ඒවා ගණන් ගන්නෙපා."

"පර්සි හරි," සිලේනා බියුරෙගාඩ් කිව්වා. "කැඳවුරුකාරයෝ දෙන්නෙක් යන්න ඕනෑ."

"ඔන්, ඇත්තට," Ζසෝයි ඇනුම්පදයක් කිව්වා. "මං හිතන්නේ තුඹ ඒකට කැමැත්තෙන් ඉදිරිපත් වෙනවා ඇති?"

සිලේනා රතු වුණා. "දඩයක්කාරියෝ එක්ක මම කොහෙවත් යන්නෑ. මගේ දිහා බලන්නෙපා!"

"ඇෆ්‍රොඩයිට්ගේ දුවෙක් කියනවා, එයා දිහා බලන්න එපාලු," Ζසෝයි සමච්චල් කරා. "තිගේ අම්මා මොනවා නොකියයි ද?"

සිලේනා වාඩි වී සිටි තැනින් නැගිටින්න ගියත් ස්ටොල් සහෝදරයෝ එයාව ආපසු පුටුවට ඇදලා ගත්තා.

"ඕක නවත්තනවා," බෙකන්ඩොර්ෆ් කිව්වා. බරපතළ කටහඬක් ඇති ලොකු හාදයෙක් වූ එයා වැඩිය කතාබහ කරන කෙනෙක් නෙවෙයි. ඒත් එයා කතා කරන්න ගත්තම, හැමෝම එයාට ඇහුම්කන් දුන්නා. "අපි දඩයක්කාරියන්ගෙන් පටන් ගමු. ඔයාලගෙන් යන තුන්දෙනා කවුද?"

Ζසෝයි නැගිට්ටා. "ඇත්ත වශයෙන් ම, මම යනවා, ඒ වගේම මම ෆීබිවත් අරන් යනවා. අපිට ඉන්න හොඳම මංසලකුණු හොයන්න තමයි එයා."

"ඔය කියන්නේ අර මිනිස්සුන්ගේ ඔළුවලට ගහන්න කැමති තඩි කෙල්ල ද?" ට්‍රැවිස් ස්ටොල් පරිස්සමෙන් ඇහුවා.

ෙZසෝයි ඔළුව වැනුවා.

"මගේ හෙල්මට් එකේ ඊතල ඇමුණුවේ එයා නේ?" කොනරුත් එකතු වුණා.

"ඔව්," ෙZසෝයි සැර වුණා. "ඇයි?"

"නෑ, නිකං," ට්‍රැවිස් කිවුවා. "අපි එයාට දෙන්න කියලා කඳවුරු ගබඩාවෙන් ටී-ෂර්ට් එකක් ගත්තා." එයා රිදී පාට ලොකු ටී-ෂර්ට් එකක් ඔසවා පෙන්වූවා. එය මැද 'ආර්ටෙමිස් සඳ දෙවඟන - හේමන්ත දඩයම් චාරිකාව 2002' සමග ජාතික වනෝද්‍යාන නාමාවලියක් මුද්‍රණය කර තිබුණා. "මේක දුර්ලභ එකක්. එයා මේකට ආසාවෙන් හිටියේ. ඔයාට පුළුවන් ද මේක එයාට ගිහින් දෙන්න?"

ස්ටොල් අයියා-මලෝ දෙන්නා මේ එන්නේ නම් හොඳකට නෙවෙයි කියලා මට තේරුණා. එයාලා හැම වෙලාවෙම එහෙමයි. ඒත් මම එයාලා ගැන දන්න තරම් ෙZසෝයි නම් දැනගෙන හිටියේ නැහැ වගෙයි. සුසුමක් හෙළූ එයා ටී-ෂර්ට් එක ගත්තා. "මම කියකියා හිටියා වගේ, මම ෆීබිව අරන් යනවා. ඒ වගේම බියන්කාත් එනවා නම් මම කැමතියි."

බියන්කා පුදුමයෙන් තිගැස්සුණා. "මම? ඒත්... මම හොඳටම අලුත් කෙනෙක් නේ. මගෙන් කිසිම වැඩක් නැතිවෙයි."

"තීගෙන් වැඩක් තියෙයි," ෙZසෝයි බල කරා. "තී ගැන ඔප්පු කරන්න මීට වඩා හොඳ විදිහක් නැහැ."

බියන්කා කට වහගත්තා. මට එයා ගැන කණගාටු හිතුණා. අවුරුදු දොළහේ දී මට ලැබුණු පළවෙනි ගවේෂණය මට සිහි වුණා. එතකොට මටත් දැනුණේ කිසි සූදානමක් නැති බවක්. සමහරවිට, පොඩි මාන්නයකුත් දැනුණා තමයි, ඒත් ඊටත් වඩා අමනාපයක් සහ බයක් දැනුණා. මේ වෙලාවේ බියන්කාගේ ඔළුව ඇතුළේ වැඩ කරන්නෙත් ඒ දේවල් ම බව මට තේරුම් ගියා.

"එතකොට කඳවුරුකාරයන්ගෙන්?" කයිරොන් ඇසුවා. එයාගේ ඇස් මගේ ළඟ නැවතුණත්, එයා හිතමින් සිටි දේ තේරුම් ගන්න මට බැරි වුණා.

"මම!" වේගයෙන් නැගිටපු ග්‍රෝවර් පින්ග්-පොන්ග් මේසයේ හැප්පුණා. එයා ඔඩොක්කුවේ හැලී තිබුණු ක්‍රැකර් කුඩු සහ පින්ග්-



පොන්ග් බෝල කෑලි පිහ දැමුවා. "ආර්ටෙමිස්ට උදවු කරන ඕනෑම දේකට!"

ෙZසෝයි නහය ඇකිළුවා. "මං නම් හිතන්නෑ, සැටර්. නුඹ අඩු තරමේ අර්ධ-ලෝහිතයෙක්වත් නෙවෙයි."

"ඒත් එයා කඳවුරේ කෙනෙක්," තාලියා කිවුවා. "ඒ වගේම එයාට සැටර් කෙනෙකුගේ ඉවයි, වන ලැහැබේ මායා බලයයි තියෙනවා. ඔයාට දැන් ඉව අල්ලන සිංදුව වාදනය කරන්න පුළුවන් ද, ග්‍රෝවර්?"

"සම්පූර්ණයෙන්ම!"

ෙZසෝයි දෙගිඩියාවෙන් වැනුණා. ඉව අල්ලන සිංදුව මොකක්ද කියලා මම දැනගෙන හිටියෙ නැහැ, ඒත් ඒක හොඳ දෙයක් කියලා ෙZසෝයි හිතන බව පෙනුණා.

"හරි එහෙනම්," ෙZසෝයි කිවුවා. "එතකොට දෙවෙනි කඳවුරුකාරයා?"

"මම." නැගී සිටි තාලියා, එයාට අභියෝග කරන්නේ කවුද බලන්න වගේ වටේට බැල්මක් හෙළුවා.

දැන්, මෙහෙමයි, සමහරවිට මට ගණිතය වැඩිය බැරුව ඇති, ඒත් කණ්ඩායමට උවමනා පස්දෙනා සම්පූර්ණයි කියලා හදිසියේ ම මට තේරුම් ගියා, එතකොට මට කණ්ඩායමේ ඉඩක් නැහැ. "හෝව්, තත්පරයක් ඉන්න," මම කිවුවා. "මටත් යන්න ඕනෑ."

තාලියා මුකුත් කිවුවේ නැහැ. තවමත් මාව අධ්‍යයනය කරමින් සිටි කයිරොන්ගේ දෑස් දුක්බර වුණා.

"ඔහ්," හදිසියේ ම ප්‍රශ්නය තේරුම්ගත් ග්‍රෝවර් කිවුවා. "හෝ, ඔව් නේ. මට අමතක වුණා! පර්සිට යන්නම වෙනවා. මම හිතුවෙ නැහැ... මම නවතින්නම්. මගේ තැනට පර්සි යන්න ඕනෑ."

"එයාට බැහැ," ෙZසෝයි කිවුවා. "එයා කොල්ලෙක්. කොල්ලෙක් එක්ක දඩයක්කාරියන්ට ගමන් යන්න මම ඉඩ තියන්නෑ."

"ඔයාලා මෙහෙට ආවෙත් මගෙත් එක්ක නේ," මම එයාට මතක් කරලා දුන්නා.

"ඒක කෙටි කාලීන හදිසි අවස්ථාවක්. ඒ වගේම ඒක කරන්න අණ කළේ දෙවඟනමයි. මම කීයටවත් කොල්ලෙක් එක්ක අනතුරුවලට මූණ දෙමින්, රට හරහා යන්නෙ නැහැ."

"එතකොට ග්‍රෝවර්?" මම ප්‍රශ්න කළා.

ෙසෝයි ඔළුව හෙල්ලුවා. "එයාව ගණන් ගන්න බැහැ. එයා සැටර් කෙනෙක්. ඒ කියන්නෙ එයා කොල්ලෙක් නෙවෙයි."

"හේයි!" ග්‍රෝවර් විරෝධය පෑවා.

"මට යන්නම ඕනෑ," මම කිවුවා. "මම මේ ගවේෂණයට එකතු වෙන්න ම ඕනෑ."

"ඇයි ඒ?" ෙසෝයි ඇසුවා. "තාගේ යාළුවා ඇනබෙත් නිසා ද?"

මගේ මූණ රතු වෙනවා වගේ මට දැනුණා. හැමෝම මගේ දිහා බලා ඉන්න එක මට පෙනෙන්න බැරි වැඩක්. "නෑ! මං කිවුවේ, ටිකක් විතර. මටත් යන්නම ඕනෑ කියලා මට දැනෙනවා!"

කවුරුවත් මගේ පැත්තට කතා කළේ නැහැ. මිස්ටර් ඩී කම්මැලිකමෙන් දිගටම සඟරාව කියෙව්වා. සිලේනා, ස්ටොල් සහෝදරයෝ සහ බෙකන්ඩොර්ෆ් මේසය දිහාවට ඇස් හරවා ගත්තා. බියන්කා අනුකම්පාවෙන් මගේ දිහා බැලුවා.

"නෑ," ෙසෝයි නීරස ලෙස කිවුවා. "මම තදින් ම කියනවා, උවමනා ම නම් මම සැටර්ව එක්ක යන්නම්, හැබැයි පිරිමි වීරයෙක්ව නම් කියටවත් බැහැ."

කයිරොන් සුසුමක් හෙළුවා. "මේ ගවේෂණය ආර්ටෙමිස් වෙනුවෙන්. ඒ නිසා තමන්ගේ සහායකයින්ව තෝරාගන්න දඩයක්කාරියන්ට ඉඩ දෙන්න වෙනවා."

මගේ කන් දෙක රත් වෙනවා වගේ දැනෙද්දී මම ආපසු වාඩි වුණා. ග්‍රෝවර් සහ තවත් කීපදෙනෙක් මගේ දිහා අනුකම්පාවෙන් බලා ඉන්න බව මම දන සිටියා, ඒත් මට එයාලගේ ඇස් දිහා බලන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. කයිරොන් රැස්වීම අවසන් කරන තුරු මම වාඩිවෙලා හිටියා.

"හරි එහෙනම්," එයා කිවුවා. "ෙසෝයි, ෆීබි සහ බියන්කා එක්ක තාලියා සහ ග්‍රෝවර් යනවා. හෙට එළි වෙද්දී ඔයාලට පිටත් වෙන්න පුළුවන්. ඒ වගේම දෙවිවරු-" එයා ඩයනයිසියස් දෙසට බැල්මක් හෙළුවා. "-මෙතැන ඉන්න කෙනාත් ඇතුළුව- ඔයාලා සමඟ රැඳේවා."

***



එදා රෑ මම කෑමට ගියේ නැහැ, ඒක මම කරපු වැරැද්දක් කියලා මට හිතුණේ කයිරොන් සහ ග්‍රෝවර් මාව හොයාගෙන ආව නිසයි.

"පර්සී, මට සමා වෙන්න!" ඇඳේ මගේ ළඟින් වාඩි වෙමින් ග්‍රෝවර් කිවුවා. "මං හිතුවෙ නැහැ එයාලා- ඔයා- ඇත්තමයි!"

එයා නහය ඉහළට අදින්න පටන් ගත්තා, මම එයාගේ හිත හැදුවෙ නැත්නම් එයා කෑමොර දෙමින් අඬන්න, නැත්නම් මගේ මෙට්ටෙ කන්න පටන් ගන්න බව මට තේරුණා. කලබල වුණ වෙලාවට ගේ දොර බඩු කන එක එයාගේ පුරුද්දක්.

"ඒකට කමක් නෑ," මම බොරුවට කිවුවා. "ඇත්තමයි, එහෙම වුණ එක හොඳයි."

ග්‍රෝවර්ගේ යටි තොල සැලුණා. "මම නිකමටවත් හිතුවෙ නැහැ... මම කල්පනා කළේ ආර්ටෙමිස්ට උදවු කරන එක ගැන විතරයි. ඒත් මම පොරොන්දු වෙනවා, මම ඇනබෙත්ව හැමතැනම හොයනවා. මට එයාව හොයාගන්න පුළුවන් නම්, මම ඒක කරනවා."

මගේ පපුවේ හැරෙනවා වගේ දැනුණු ලොකු ආවාටය නොසලකා හරින්න උත්සාහ කරමින් මම ඔළුව වැනුවා.

"ග්‍රෝවර්," කයිරොන් කතා කළා. "බාගදා, ඔයාට පුළුවන් වෙයි ද මට පර්සි එක්ක වචනයක් කතා කරන්න දෙන්න?"

"හරි," එයා නහය ඉහළට ඇද්දා.

කයිරොන් බලාගෙන හිටියා.

"ඔහ්," ග්‍රෝවර් කිවුවා. "ඔයා අදහස් කළේ තනියම ද. හොඳයි, කයිරොන්." එයා අඬන්න වගේ මගේ දිහා බැලුවා. "ජේනවා නේ? කාටවත් එළුවෙක්ව ඕනෑ නෑ."

එයා කමිස අතට නහය පූරමින් දොර දිහාවට ගියා.

සුසුමක් හෙළූ කයිරොන්, එයාගේ අශ්ව කකුල්වලින් දණ ගසාගත්තා. "පර්සි, මට අනාවැකි තේරෙනවා කියලා බොරුවට පෙන්වන්න ඕනෑ නැහැ."

"ඔව්." මම කිවුවා. "හොඳයි, සමහරවිට ඒ ඒවගේ කිසිම තේරුමක් නැති නිසා වෙන්නැති."

Scanned with CamScanner

කාමරයේ කෙළවරක හඬ නගමින් තිබුණු මුහුදු වතුර උල්පතට කයිරොන්ගේ බැල්ම යොමු වුණා. "මේ ගවේෂණයට යවන්න මගේ මුල්ම තේරීම තාලියා නොවෙන්න තිබුණා. එයා හරිම අපරීක්ෂාකාරී කෙනෙක්. එයා හිතන්නැතුව වැඩ කරනවා. එයා ඕනෑවටත් වඩා තමන් ගැන විශ්වාස කරනවා."

"ඔයාගේ තේරීම මම වෙන්න තිබුණ ද?"

"ඇත්තම කියනවා නම්, නැහැ." එයා කිවුවා, "ඔයයි තාලියායි දෙන්නම එක වගේ."

"බොහෝම ස්තුතියි."

එයා හිනාවුණා. "වෙනසකට තියෙන්නේ තාලියාට තරම් ඔයාට, ඔයා ගැන විශ්වාසයක් නැහැ. ඒක හොඳ වෙන්නත් පුළුවන්, නරක වෙන්නත් පුළුවන්. ඒත් මට එක දෙයක් කියතැකිඃ ඔය දෙන්නම එකට යන එක අනතුරුදායකයි."

"අපිට ඒක පාලනය කරගන්න තිබුණා."

"අද හවස ඇළ ළඟ දී ඔයාලා පාලනය කරගත්තා වගේ ද?"

මම උත්තර දුන්නේ නැහැ. එයා මට කට උත්තර නැති කළා.

"බාගදා, ඔක්කොම වෙන්නෙ හොඳටයි කියලා අපි හිතමු," කයිරොන් කල්පනාබරව කිවුවා. "ඔයාට පුළුවන් නිවාඩුවට අම්මා ළඟට යන්න. අපිට ඔයාව ඕනෑ වුනොත් කෝල් කරන්නම්."

"ඔව්," මම කිවුවා. "සමහරවිට."

මම රිප්ටයිඩ් සාක්කුවෙන් අරගෙන ඇඳ ළඟ මේසය උඩින් තැබුවා. පෙනුණු හැටියට, ඒකෙන් නත්තල් කාඩ් ලියනවට වඩා දෙයක් කරන්න මට බැරි වෙයි.

පෑන දකපු හැටියේ කයිරොන්ගේ මුහුණ පුළුටු වුණා. "මේ ගමනට ඔයාව එක්ක යන්න ටෙසා්යිගේ කිසිම කැමැත්තක් නැති එකේ පුදුම වෙන්න දේකුත් නැහැ, මගෙ හිතේ. ඔය විශේෂ ආයුධය ඔයා ළඟ තියෙද්දී."

එයා අදහස් කළ දේ මට තේරුම් ගන්න බැරි වුණා. මීට ගොඩක් කාලෙකට කලින් එයා මට මේ මායා කඩුව දුන් වෙලාවේ කියපු දෙයක් මගේ සිහියට නැගුණාඃ *මේ කඩුවට තියෙන්නේ ඛේදනීය ඉතිහාසයක්. ඒ නිසා අපි ඒ ගැන කතා නොකර ඉමු.*



මට එයාගෙන් ඒ ගැන අහන්න ඕනෑ වුණා, ඒත් එතකොටම සෑදල මල්ලෙන් රන් ඩ්‍රච්මාවක් ඇදලා ගත්ත කයිරොන් ඒක මට දුමුවා. "ඔයාගේ අම්මට කතා කරන්න, පර්සි. හෙට උදේට ඔයා ගෙදර එනවා කියලා එයාට දන්වන්න. ඒ වගේම, අහ්, මේක කිවුවා කියලා ඇති වැඩකුත් නෑ... ඒත්, මේ ගවේෂණයට මමත් ඉදිරිපත් වෙන්නයි ගියේ. අනාවැකියේ අන්තිම පේළිය නොතිබුණා නම්, මමත් යනවා."

"*'මව් පිය අතින් එකෙකු නැසෙනු ඇත.'* ඔව්."

මට ඒ ගැන අමුතුවෙන් අහන්න ඕනෑ වුණේ නැහැ. කයිරොන්ගේ තාත්තා දුෂ්ඨ ටයිටන් රජා, ක්‍රෝනොස් කියලා මම දැනගෙන හිටියා. කයිරොන් මේ ගවේෂණයට ගියොත්, අන්තිම පේළියේ තේරුමට ගැළපෙන දෙයක් වෙන්න තිබුණා. ක්‍රෝනොස් කියන්නේ කිසිම කෙනෙක් ගැන, අඩු තරමේ එයාගෙම දරුවෝ ගැනවත් සැලකිල්ලක් දක්වන කෙනෙක් නෙවෙයි.

"කයිරොන්," මම කතා කළා. "ටයිටන්ගේ ශාපය මොකක්ද කියලා ඔයා දන්නවා, එහෙම නේද?"

එයාගේ මූණ කළු වුණා. ඇඟිලිවලින් පපුව පහුරු ගෑව එයා අත ඉදිරියට තල්ලු කළා- ඒ යක්ෂ බලවේග එළවීමට කරන පරණ අභිනයක්. "අනාවැකියෙන් අදහස් වෙන්නේ මම හිතන දේ නොවෙන්න කියලා අපි ප්‍රාර්ථනා කරමු. දැන්, සුබ රාත්‍රියක්, පර්සි. ඔයාගේ වෙලාව ඒවි. මම ඒක දන්නවා. ඒ නිසා හදිස්සි වෙන්න උවමනාවක් නැහැ."

එයා 'ඔයාගේ වෙලාව ඒවි' කියලා කිවුවේ හරියට මිනිස්සු ඔයාගේ මැරෙන වෙලාව අඟවන්න කතා කරනවා වගෙයි. කයිරොන් අදහස් කළේ ඒ පැත්තෙන් ද කියලා මම දැනගෙන හිටියේ නැහැ, ඒ වුණත් එයාගේ ඇස්වල තිබුණු බැල්ම දැක්කම මට ඒක අහන්න බය හිතුණා.

★★★

ලුණු වතුර උල්පත ළඟ හිටගෙන කයිරොන් දුන් කාසිය පිරිමදිමින් මම කල්පනා කළේ අම්මට කියන්නේ මොනවද කියලයි. මට කරන්න පුළුවන් හොඳම වැඩේ මුකුත් නොකර ඉන්න එක කියලා තවත් වැඩිහිටියෙකුගේ කටින් අහගන්න මට ඕනෑ වුණේ නැහැ. ඒ වුණත් මගේ අම්මාත් මේ විස්තර දැනගන්න එක හොඳයි කියලා මට හිතුණා.

Scanned with CamScanner

අන්තිමේ දී, මම ගැඹුරු හුස්මක් අරන් කාසිය විසි කළා. "ඔ දේවතාවියනි, මගේ පූජාව බාරගන්න."

මීදුම නළියමින් දිලිසුණා. නාන කාමරයෙන් ඇදී ආ ආලෝකය දේදුන්නක් යාන්තමින් මවන්න ප්‍රමාණවත් වුණා.

"මට සැලී ජැක්සන්ව පෙන්වන්න," මම කිවුවා. "නැගෙනහිර ඉහළ කොටස, මැන්හැටන්."

ඒත් එක්කම මීදුම තුළින් මතු වුණේ මම කොහෙත්ම බලාපොරොත්තු නොවූ දර්ශනයක්. අපේ මුළුතැන්ගෙයි මේසය ළඟ වාඩි වී සිටි මගේ අම්මා ළඟම කවුදෝ.... පිරිමියෙකුත් සිටියා. ඒ දෙන්නා පිස්සුවෙන් වගේ හිනාවෙමින් සිටියා. ඒ දෙන්නා මැදින් ලොකු පාඩම් පොත් මිටියක් තිබුණා. ඒ පිරිමි කෙනා, අනේ මන්දා, අවුරුදු තිස් ගාණක් විතර වයස, තරමක් දිග ලුණු-ගම්මිරිස් වගේ කළු-සුදු කොණ්ඩයක් ඇති කෙනෙක්. එයා කළු ටී-ෂර්ට් එකකට උඩින් දුඹුරු පාට ජැකට්ටුවක් දමාගෙන සිටියා. එයා නිකං නළුවෙක් වගෙයි- හරියට රූපවාහිනී කතාවල ඉන්න රහස් මෙහෙයුමක යෙදෙන පොලිස්කාරයෙකුගේ චරිතයට රඟපාන කෙනෙක් වගෙයි.

කිසිවක් කියාගන්න බැරි තරමට මම පුදුමයෙන් ගල් ගැසුණා, වාසනාවට මගේ අයිරිස්-පණිවුඩය සැලකිල්ලට ලක් නොවෙන තරමට ඒ දෙන්නා හිනාවෙමිනුයි සිටියේ.

පිරිමි කෙනා කතා කළා, "සැලී, ඔයා නම් කැරලිකාරියක්. ඔයාට තව වයින් ඕනෑ ද?"

"අහ්, එපා. ඔයාට ඕනෑ නම් ගන්න."

"ඇත්තටම, මට ඕනෑ ඔයාගේ බාත්රූම් එක පාවිච්චි කරන්න. කමක් නැද්ද?"

"සාලෙ එහා කෙළවරේ." අම්මා කිවුවේ හිනා නොවී ඉන්න උත්සාහ කරමින්.

හිනාවක් පෑව නළුවා වගේ හාදයා එතනින් පිට වුණා.

"අම්මේ!" මම කතා කළා.

එයා කොච්චර ගැස්සුණා ද කියනවා නම් තව පොඩ්ඩෙන් මේසේ උඩ තිබුණු පොත් ටිකත් පෙරළෙනවා. අන්තිමේ දී එයා මාව දැක්කා. "පර්සි! ඔහ් පැටියෝ! හැමදේම හොඳින් ද?"



"ඔයා මොනවද කරන්නේ?" මම ප්‍රශ්න කළා.

එයා තදින් ඇහිපිය සැලුවා. "ගෙදරවැඩ." ඒත් එක්කම මගේ මුහුණේ වූ බැල්ම එයා තේරුම් ගත් බව පෙනුණා. "ඔහ්, රත්තරනේ, එයා මේ පෝල්-මම්, මිස්ටර් බ්ලෝෆිස්. එයත් මගේ ලේඛන වැඩමුළුවලට එන කෙනෙක්."

"මිස්ටර් බ්ලෝෆිෂ් (මාළුවෙක්)?"

"බ්ලෝෆිස්. තව විනාඩියෙන් එයා ආපහු එයි, පර්සි. මොකක්ද ප්‍රශ්නෙ කියලා මට කියන්න."

මට මොකක්හරි ප්‍රශ්නයක් ඇති හැම වෙලාවක ම එයාට ඒක තේරෙනවා. මම එයාට ඇනබෙත් ගැන කිවුවා. අනෙක් දේවලුත් කිවුවා තමයි, ඒත් වැඩිපුරම කිවුවේ ඇනබෙත් ගැනයි.

මගේ අම්මාගේ ඇස්වල කඳුළු පිරුණා. මං ගැන හිතලා එයා නාඬා ඉන්න තදින් ම උත්සාහ කරන බව මට තේරුණා, "අනේ, පර්සි...."

"ඔව්. එයාලා කියනවා මට කරන්න පුළුවන් කිසිම දෙයක් නැහැලු. ඒ නිසා මට ගෙදර එන්න වෙයි වගේ."

එයා අතේ තියාගෙන සිටි පැන්සල ඇඟිලි අතරේ කැරකුවා. "පර්සි, ඔයා ගෙදර එනවා නම් මම කැමතියි තමයි-" අම්මා සුසුමක් පිට කළේ එයා ගැනම තරහෙන් වගෙයි. "-ඔයාගේ පරිස්සම තරම් මට උවමනා වෙන දෙයක් නැහැ, ඒ වුණත් ඔයා එක දෙයක් තේරුම් ගන්න ඕනෑ. ඔයාට කරන්න උවමනා දේ ඔයා කරන්න ඕනෑ."

මම එයා දිහා පුදුමයෙන් බලා සිටියා. "ඒ කිවුවේ?"

"මං කියන්නේ, ඇත්තටම, ඔයා මුළු හිතින්ම විශ්වාස කරනව ද එයාව බේරගන්න ඔයා උදවු කරන්න ඕනෑ කියලා? ඔයාට හිතෙනව ද කරන්න ඕනෑ හරිම දේ ඒක කියලා? මොකද මම ඔයා ගැන දන්නවා, පුතේ. ඔයාගේ හදවත හැම වෙලාවෙම තියෙන්නේ හරිම තැන. ඒ නිසා ඒකට ඇහුම්කන් දෙන්න."

"ඔයා... ඔයා කියන්නේ මට යන්න කියල ද?"

මගේ අම්මා තොල් අකුළා ගත්තා. "මං ඔයාට කියන්නේ... කරන්න ඕනෑ මොනවද කියලා මගෙන් අහන්න ඕනෑ නැති තරම් ඔයා දැන් ලොකුයි. මං ඔයාට කියන්නේ ඔයා කරන්න තීරණය කරන

Scanned with CamScanner

දේ අනතුරුදායක වුණත්, මම ඔයාට උදවු කරනවා. මම මෙහෙම කියනවා කියලා මට ම විශ්වාස කරගන්න බැහැ."

"අම්මේ-"

සාලය කෙළවර වැසිකිළියට වතුර පිරෙන හඬ ඇසුණා.

"මට වැඩි වෙලාවක් නැහැ," මගේ අම්මා කිවුවා. "පර්සි, ඔයා මොන තීරණය ගත්තත්, මම ඔයාට ආදරෙයි. ඒ වගේම මම දන්නවා, ඇනබෙත් වෙනුවෙන් කරන්න පුළුවන් හොඳම දේ ඔයා කරනවා."

"ඔයා කොහොමද ඔච්චර විශ්වාසෙන් කියන්නේ?"

"මොකද, එයත් ඔයා වෙනුවෙන් ඒ දේ ම කරන නිසා."

ඒ කතාවත් සමග මීදුම හරහා අත වැනූ අම්මා සම්බන්ධතාවය විසුරුවා හරිද්දී මට අවසානයට දකින්න ලැබුණේ එයාගේ අලුත් යාළුවා මිස්ටර් බ්ලෝෆිෂ් හිනා වෙමින් එන හැටියි.

★★★

මම නින්දට වැටුණා මතක නැතත්, දකින්න ලැබුනු හීනය නම් හොඳට මතකයි.

මම ආපසු හිස් ගල් ගුහාවට ගොස් සිටියා. එහි විශාල, පහත් සිවිලිම මට ඉහළින් තිබුණා. ගල් කුට්ටි ගොඩක් වගේ පෙනුණු අඳුරු ගොඩක බරට ඇනබෙත් දණ ගසාගෙන සිටියා. එයා කතා කරගන්නත් බැරි තරමට හෙම්බත් වෙලා. එයාගේ කකුල් වෙවුලුවා. ඕනෑම තත්පරයක එයාගේ ශක්තිය සිඳී ගිහින්, ගුහා සිවිලිම එයාගේ උඩට ඇද වැටෙන බව මට තේරුණා.

"අපේ මිනිස් අමුත්තියට කොහොමද?" පිරිමි කටහඬක් දෝංකාර දුන්නා.

ඒ ක්‍රෝනොස් නම් නෙවෙයි. ක්‍රෝනොස්ට තිබුණේ පිහි තලයක් ගලක අතුල්ලනවා වගේ කර්කශ, ලෝහමය හඬක්. මීට කලින් බොහෝ වතාවක් සිහිනවලින් ඒ හඬ මට සරදම් කරනවා මට අහන්න ලැබී තිබුණා. ඒත් මේ කටහඬ ඊට වඩා ගැඹුරු සහ පහත් ස්වරයක් ගත්තේ හරියට බේස් ගිටාරයක් වගෙයි. එහි බලයට පොළොව වෙවුලුම් කෑවා.



ලූක් හෙවණැලි අතරින් මතු වුණා. ඇනබෙත් ළඟට දුවගෙන ගිහින් දණ ගසාගත් එයා අදිසි මිනිහා දිහා බැලුවා. "එයා දුර්වල වෙනවා. අපි ඉක්මන් කරන්න ඕනෑ."

කුහකයා. හරියට එයා ඇනබෙත් ගැන වද වෙනවා වගෙයි.

ගැඹුරු කටහඬ කෙකර ගෑවා. එහි අයිතිකාරයා හිටියේ මගේ හීනයේ කෙළවර හෙවණැලි අතරේයි.

ඊට පස්සේ මස් පිරුණු අතකින් කාවදෝ ඉදිරියට තල්ලු කළා- ඒ ආර්ටෙමිස්- එයාගේ අත් කකුල් දිව්‍යමය ලෝකඩ දම්වැල්වලින් බැඳ තිබුණා.

මට හිල්ලුණා. එයාගේ රිදී ඇඳුම් ඉරිලා, කඩමාල්ලක් වෙලා. එයාගේ මූණේ සහ අත්වල කීප පොළක්ම කැපී, තුවාල වී දෙවිවරුන්ගේ රන් පාට ලේ- අයිකෝර් වැගිරුණා.

"කොල්ලා කියපු දේ නුඹට ඇහුණා නේ," හෙවණැලි අතර සිටි පිරිමියා කිවුවා. "තීරණයක් ගන්නවා!"

ආර්ටෙමිස්ගේ ඇස් කේන්තියෙන් දැල්වුණා. එයා දම්වැල් පුපුරුවා නොදමන්නේ ඇයි කියලවත්, එතැනින් චුත වී නොයන්නේ ඇයි කියලවත් මම දැන සිටියේ නැහැ. ඒත් පෙනුණු හැටියට නම්, එයාට එහෙම කරන්න හැකියාවක් නැහැ වගෙයි. සමහරවිට, දම්වැල් එයාට බාධාවක් වෙන්න ඇති, නැත්නම් ඒ අඳුරු භයානක තැන මොකක් හෝ මායාවක් ක්‍රියාත්මක වෙන්න ඇති.

ඇනබෙත් දිහා බලද්දී දෙවඟනගේ මුහුණට සාහසික බැල්මක් ආරූඪ වුණා. "ගෑනු ළමයෙකුට මෙහෙම වධ දෙන්න ඔහේට කොහෙන් ආව හයියක් ද!"

"එයා ඉක්මනට මැරිලා යයි," ලූක් කිවුවා. "ඔයාට පුළුවන් එයාව බේරගන්න."

ඇනබෙත් විරෝධය පාමින් දුබල හඬක් පිට කළා. මට දැනුණේ මගේ හදවත ඇඹරිලා ගැට ගැහෙනවා වගෙයි. මට එයා ළඟට දුවන්න ඕනෑ වුණත් මට හෙලවෙන්නවත් බැරි වුණා.

"මගේ අත් ලිහනවා," ආර්ටෙමිස් කිවුවා.

ලූක්, එයාගේ කඩුව, බැක්බයිටර් පිටට අරන් එක ගුර පහරකින් ම දෙවඟනගේ මාංචු බිඳ දැමුවා.

ඇනබෙත් වෙතට දිවූ ආර්ටෙමිස් එයාගේ කර මත තිබුණු බර ඔසවා ගත්තා. බිමට ඇද වැටුණු ඇනබෙත් වෙවුලමින් එතැන ම වැතිරී සිටියා. කළු ගල් පර්වතයේ බර දරාගන්න උත්සාහ කරමින් ආර්ටෙමිස් දත කද්දී හෙවණැලි අතර සැඟවී සිටි කෙනා කෙකර ගෑවා. "නුඹව පරද්දන්න ලේසි තරමට ම නුඹ ගැන කලින් අනාවැකි කියන්නත් ලේසියි, ආර්ටෙමිස්."

"ඔහේ මාව පුදුම කළා," බරින් මිරිකෙමින් දෙවඟන කිවුවා. "ආයේ එහෙම වෙන්නෑ."

"කොහෙත්ම නෑ," පිරිමියා කිවුවා. "දැන් නුඹව පාරෙන් අයින් කරලා දාලා ඉවරයි! ළමිස්සියෙකුට උදවු නොකර ඉන්න නුඹට බැහැ කියලා මම දැනගෙන හිටියා. කොහොම වුණත්, නුඹගේ විශේෂත්වෙ ඒක නේ, කෙල්ලේ."

ආර්ටෙමිස් කෙඳිරි ගෑවා. "ඔහේ කරුණාව කියන වචනේ තේරුමවත් දන්නැති ඌරෙක්."

"ඒකට නම්," පිරිමියා කිවුවා, "අපිට එකඟ වෙන්ඩ පුළුවන්. ලූක්, දැන් ගෑනු ළමයව මරලා දානවා."

"එපා!" ආර්ටෙමිස් කෑගැසුවා.

ලූක් පැකිළුණා. "එයා - එයාගෙන් අපිට තව ප්‍රයෝජන ගන්න පුළුවන්, සර්... තවත් ඇමකට."

"බාහ්! නුඹ ඇත්තටම එහෙම හිතනව ද?"

"ඔව්, ජෙනරල්. එයාලා මේ කෙල්ලව හොයාගෙන එයි. මට ඒක විශ්වාසයි."

පිරිමියා ඒ ගැන සලකා බැලුවා. "එහෙනම් ඩ්‍රැකනෙයි එයාව මුර කරපුදෙන්. වෙච්ච තුවාලවලින් එයා මැරෙන්නැතුව හිටියොත්, දක්ෂිණායනය වෙනකල් එයාව තියාගන්නවා. ඊට පස්සේ, අපි සැලසුම් කරපු විදිහට ම අපේ බිලි පූජාව සිද්ධ වුණොත්, එයාගේ ජීවිතේ වැඩකට නැති එකක් වෙනවා. මිනිස්සු ඔක්කෝගෙම ජීවිත වැඩකට නැති වෙනවා."

ඇනබෙත්ගේ බෙලහීන සිරුර ඔසවාගත් ලූක් එයාව දෙවඟනගෙන් ඉවතට රැගෙන ගියා.



"ඔහේ බලාපොරොත්තු වෙන රාක්ෂයාව ඔහේට කවදාවත් හොයාගන්න ලැබෙන්නෑ," ආර්ටෙමිස් කිවුවා. "ඔහේගෙ සැලසුම් වතුරෙ යනවා."

"නුඹ දන්න තරම තමයි," පිරිමියා හෙවණැලි අතරින් කිවුවා. "දැනටමත්, නුඹගේ ආදරණීය සේවිකාවෝ ටික නුඹව හොයන්න ගවේෂණයක් පටන්ගෙන. එයාලා කෙලින්ම මගේ අතට එයි. දැන්, අපිට සමාවෙන්ඩෝනේ, අපිට දුර බැරක යන්ඩ තියෙනවා. අපි නුඹගේ දඩයක්කාරියන්ට ආචාර කරලා, එයාලගේ ගවේෂණය... අමාරු කරන්ඩ එපැයි."

අඳුර තුළ දෝංකාර දුන් පිරිමියාගේ හිනා හඬට පොළොවත් දෙදුරුම් කද්දී, මුළු ගුහා සිවිලිම ම කඩා වැටෙන්න යනවා වගෙයි පෙනුණේ.

★★★

මම ගැස්සිලා ඇහැරුණා. මට මහ හඬින් තඩිබාන හඬක් ඇහුණා කියලා හොඳටෝම විශ්වාස වුණා. මම කැබිනය වටේට බැල්මක් හෙළුවා. තවමත් එළිය වැටිලා නැහැ. මුහුදු වතුර උල්පත තවමත් හඬ නගමින් තිබුණා. කැලයෙන් ඇසුණු බකමූණෙකුගේ හූම් හඬත්, ඈත වෙරළේ රළ වදින හඬත් ඇර මුළු පරිසරය පුරාම නිහැඬියාව රජ කළා. හඳ එළියෙන් මේසය මත තිබුණු ඇනබෙත්ගේ නිව්යෝර්ක් යැන්කීස් කැප් එක පෙනුණා. මම ඒක දිහා තත්පරයක් විතර බලා ඉඳිද්දී ආයෙමත්: *ඩොග්. ඩොග්.*

කවුරුහරි, නැත්නම් මොකෙක්හරි මගේ දොරට තඩිබාමින් සිටියා. රිප්ටයිඩ් ඩැහැගත් මම ඇඳෙන් බිමට පැන්නා.

"හලෝ?" මම කතා කළා.

*වොක්. වොක්.*

මම හෙමින් සීරුවේ දොර ළඟට ඇදුණා. රිප්ටයිඩ්ගේ කොපුව ගලවා, එක පාරටම දොර ඇරිය මට දකින්න ලැබුණේ මගේ මූණ දිහා බලා ඉන්න කළු පෙගසස් කෙනෙක්.

*හෝව්, බොස්!* එයා කඩු තලයෙන් ඉවතට කුර තබද්දී එයාගේ හඬ මගේ හිත ඇතුළේ කතා කළා. *මට දැන් ම මැරෙන්ඩ බැරියෝ!*

එයාගේ කළු පියාපත් තැති ගැන්මෙන් දෙපසට විහිදෙද්දී, එයින් නැගුණු හුළඟට මාව අඩියක් විතර පස්සට තල්ලු වුණා.

Scanned with CamScanner

"බ්ලැක්ජැක්," හිතට සහනයක් වගේම පොඩි තරහවකුත් දනෙද්දී මම කිවුවා. "මේ මහ ය!"

බ්ලැක්ජැක් නහයෙන් පිම්බා. *එහෙම නෑ, බොස්. දැන් වෙලාව පාන්දර පාන්දර පායි. ඔයා මොකද නාම නිදි?*

"මම කී සැරයක් ඔයාට කියන්න ඕනෑ ද? මට බොස් කියලා කතා කරන්න එපා."

*ඔයාගේ කැමැත්තක්, බොස්. ඔයා තමයි මිනිහා. ඔයා තමයි මගේ අංක එක.*

නිදිමත පහ කරගන්න ඇස් පොඩි කළ මම, අශ්වයාට මගේ සිතුවිලි කියවන්න ඉඩ නොදෙන්න උත්සාහ කළා. පොසෙයිඩන්ගේ පුතා වුණාම තිබුණ ප්‍රශ්නය ඒකයිඃ එයා මුහුදු රළවලින් අශ්වයින්ව නිර්මාණය කළ නිසා, අශ්වයෝ සහ අශ්වයින්ට සම්බන්ධ සතුන්ව තේරුම් ගැනීමේ හැකියාව මට තිබුණා. ඒත් ප්‍රශ්නයකට තිබුණේ එයාලටත් මාව තේරුම් ගන්න හැකි වුණු එකයි. සමහර වෙලාවට, හරියට බ්ලැක්ජැක්ගේ සිදුවීමේ දී වගේ, එයාලා මාව අත ඇරියෙම නැහැ.

මෙහෙමයි, ගිය ගිම්හානයේ දී ලූක්ගේ නැවේ හිරකාරයෙක් විදිහට හිටපු බ්ලැක්ජැක්ට එතැනින් පැනගන්න ලැබුණේ අපි එතැන පොඩි කලබලයක් ඇති කරපු නිසයි. ඇත්තම කියනවා නම්, ඒකට මම ඒ හැටි දෙයක් කළේ නැහැ, ඒ වුණත් බ්ලැක්ජැක්, එයාගේ ජීවිතේ බේරුවාට මට ණයගැති වුණා.

"බ්ලැක්ජැක්," මම කතා කළා. "ඔයාට ඉස්තාලෙට වෙලා ඉන්න කියලා නේද තියෙන්නේ."

*පුහ්, ඉස්තාලේ. කයිරොන් ඉස්තාලෙට වෙලා ඉන්නවා ඔයා දැකලා තියෙනව ද?*

"හොදයි... නැහැ."

*ඒකනේ. අහන්ඩ, ඔයාගේ උදවු උවමනා තවත් චුට්ටි මුහුදු යාළුවෙක්ව අපිට හම්බ වුණා.*

"ආයෙමත්?"

*ඔව්. මම හිපොකැම්පිට කිවුවා ඔයාව එක්ක එන්නම් කියලා.*

මට කෙඳිරි ගෑවුණා. මම වෙරළ කිට්ටුව ඉන්න ඕනෑම වෙලාවක, ප්‍රශ්න විසඳාගන්න හිපොකැම්පිලා මගෙන් උදවු ඉල්លුවා. එයාලට තිබුණේ හරි හරි ප්‍රශ්නඃ වැල්ලට ගොඩ ගහපු තල්මස්සු, මාළු



දැල්වල පැටළුණු මුහුදු ඌරෝ, නියපොත්තේ කතුමහ කැඩුණු දිය කිඳුරියෝ- මේ හැමදෙනාම මට වතුර යටට ඇවිත් උදවු කරන්න කියලා කතා කළා.

"කමක් නෑ," මම කිවුවා. "මම එන්නම්."

*ඔයා තමයි හොඳම කෙනා, බොස්.*

"මට බොස් කියන්න එපා කිවුවා නේද!"

බ්ලැක්ජැක් මෘදු හේෂාරාවයක් කළා. සමහරවිට ඒ එයා හිනාවුණා වෙන්න ඇති.

මම, මගේ සුවපහසු ඇඳ දිහා බැලුවා. පාවිච්චියට ගන්න බැරි තරමට පලුදු වූ මගේ ලෝකඩ පලිහ තවමත් බිත්තියේ එල්ලෙමින් තිබුණා. ඒ වගේම මගේ මේසය මත ඇනබෙත්ගේ යැන්කි කැප් එක තිබුණා. දැනුණු හදිසි පෙලඹවීමක් නිසා මම ඒ කැප් එක සාක්කුවට ඔබාගත්තා. මං හිතන්නේ ඒ වෙද්දිත්, මට සෑහෙන කාලෙකට ආපහු මගේ කැබින් එකට එන්න නොලැබේවි කියන හැඟීම මගේ හිතේ තියෙන්න ඇති.

Scanned with CamScanner

# 08

# මම අනතුරුදායක පොරොන්දුවක් දුන්නා

බ්ලැක්ජැක් මාව වෙරළට රැගෙන ගියා, ඇත්තටම ඒ ගමන නම් නියමයි. පියාඹන අශ්වයෙකුගේ පිටේ නැගලා, මුහුදු හුළඟින් මගේ කොණ්ඩය ඇවිස්සෙන්න දීලා, හිරිකඩ මගේ මුහුණේ වදිද්දි පැයට සැතපුම් සියයක වේගයෙන් රළවලට උඩින් ඉගිලෙන එක- ඒක රළ පදින එක පරාදයි.

මෙතැන. වේගය අඩු කළ බ්ලැක්ජැක් රවුමක් කැරකුණා. කෙළින්ම පහළ.

"ස්තුතියි," මම එයාගේ පිට මතින් අයිස් වගේ සීතල මුහුදට කරණමක් ගැසුවා.

පහුගිය අවුරුදු දෙකේ දී ඒ වගේ ත්‍රාසජනක වැඩ කරන්න මම ටිකෙන් ටික හුරු වුණා. ඕනෑම වේලාවක වතුර යට ඕනෑම තැනකට යන්න මට කරන්න තිබුණේ මාව ඉදිරියට තල්ලු කරන්න කියලා දියවැල්වලින් ඉල්ලන එක විතරයි. මට කිසිම කරදරයක් නැතිව වතුර යට දී හුස්ම ගැනීමේ හැකියාව තිබුණා, ඒ වගේම වතුරේ දී මගේ ඇඳුම් තෙත් වෙන්නේ මට උවමනා නම් විතරයි.

මම අඳුර තුළට කිමිදුණා.

අඩි විස්සක්, තිහක්, හතළිහක් ගැඹුරට ගියත් පීඩනයෙන් මට අපහසුවක් දැනුනේ නැහැ. මට කිමිදිය හැකි ගැඹුරේ සීමාවක්



තියෙනව ද බලන්න මම කවදාවත් උත්සාහ කරලා නැහැ. ඇලුමිනියම් කෑන් එකක් වගේ චප්ප නොවී අඩි දෙසීයකට වඩා ගැඹුරට කිමිදෙන්න සාමාන්‍ය මිනිස්සුන්ට නම් හැකියාවක් නැති බව මම දැන සිටියා. ඒ වගේම, රෑක මේ තරම් ගැඹුරක දී මට කිසිවක් නොපෙනිය යුතු වුණත්, ජීවින්ගේ උණුසුමත්, දියවැල්වල සීතලත් මට දැකගත හැකි වුණා. ඒක විස්තර කරන්න අමාරු දෙයක්. සාමාන්‍යයෙන් අපිට පේනවට වඩා ඒක වෙනස් වුණත්, එක් එක් දේවල් තිබෙන්නේ මොන මොන තැන්වල ද කියන්න මට හැකියාව තිබුණා.

මුහුදු පතුලට කිට්ටු වෙද්දි හිපොකැම්පිලා- මාළු වලිග ඇති අශ්වයෝ- තුන්දෙනෙක් පෙරළුණු බෝට්ටුවක් වටේ කැරකෙන හැටි මට දකින්න ලැබුණා. හිපොකැම්පිලා කියන්නේ බලාගෙන ඉන්න ආසා හිතෙන සත්තු ජාතියක්. එයාලගේ මාළු වලිග අඳුරේ එළිය විහිදුවමින් දේදුනු පාටින් දිලිසුණා. සුදු පාට කේශර ඇති එයාලා වතුර හරහා පිම්මේ ගියේ අකුණු කුණාටුවකට බයේ දුවන අශ්වයෝ වගෙයි. මොකක්දෝ දෙයක් එයාලව කලබල කරලා තිබුණා.

තවත් කිට්ටුවට යද්දි මට ගැටළුව දැකගන්න ලැබුණා. අඳුරු රූපයක්- මොකෙක්දෝ සතෙක්- මාළු දැලක පැටලී, කඳෙන් බාගයක් බෝට්ටුවට යටවී සිටියා. ඒක ට්‍රෝලර් යාත්‍රාකරුවන් හැමදේම එකවර අල්ලගන්න පාවිච්චි කරන ආකාරයේ විශාල දැලක්. ඒ වගේ දැල්වලට මම වෛර කළා. ඒවා ඩොල්ෆින්ලාව සහ මුහුදු ඌරන්ව ගිල්වා දමනවා මදිවට, ඉඳලා හිටලා ඒවාගේ පුරාණ මිත්‍යා සතුනුත් පැටලුණා. දැල පැටළුණාම මෝඩ ධීවරයෝ කරන්නේ දැල කපලා දාලා, පැටලී ඉන්න අසරණ සතාට මැරෙන්න අරින එකයි.

පෙනුණු හැටියට, මේ අසරණ සතා ලෝන්ග් අයිලන්ඩ් මුහුදු පතුලේ කුණු රොඩු අවුස්සමින් ඉදිද්දි කොහොමදෝ ගිලුණු මාළු බෝට්ටුවක දැලක පැටලිලා වගෙයි. එයින් ගැලවෙන්න සතා දඟලද්දි බෝට්ටුව එහා මෙහා වෙලා, සතාව ඒකටත් යට වෙන්න ඇති. දැන්, ලොකු ගලක් මත රැඳී තිබුණු සුන්බුන් වූ බෝට්ටු කඳ පැද්දෙමින්, පැටලුණු සතාගේ උඩට කඩා වැටෙන්න තර්ජනය කරමින් තිබුණා.

උදවු කරන්න උවමනාව තිබුණත්, ඒක කරන්නේ කොහොමද අදහසක් නැතිව හිපොකැම්පිලා උමතුවෙන් රවුමට පිහිනමින් සිටියා. ඒත් එක්කෙනෙක් දැල කටින් හපන්න උත්සාහ කරමින් සිටියා, එයාලා හිපොකැම්පිලාගේ දත් හැදිලා තිබුණේ කඹ හපන්න නෙවෙයි. එයාලා

Scanned with CamScanner

ගොඩක් ශක්තිමත් සතුන් වුණත්, එයාලට වැඩ කරන්න අත් තිබුණේ නැහැ, ඒ වගේම එයාලා එච්චර (ෂ්ෂ්ෂ්...) මොළේ ඇති අයත් නෙවෙයි.

*ඌව ගලවන්න, උතුමාණෙනි!* මාව දැකපු හැටියේ එක හිපොකැම්පියෙක් කිවුවා. අනෙක් අයත් එයාට එකතු වුණා.

පැටලී සිටි සතාව හොඳින් බලාගන්න මම කිට්ටුවට පිහිනා ගියා. මුල දී මම හිතුවේ ඒ හිපොකැම්පි පැටියෙක් කියලයි. මීට කලිනුත් මම එයාලා දෙතුන් දෙනෙක්වම බේරාගෙන තිබුණා. ඒත් ඒ වෙලාවේ ආගන්තුක හඬක්, වතුර යට දී අහන්න නොලැබෙන හඬක් මට ඇසුණා.

"උම්බෑ...!"

කිට්ටුවට ම පිහිනා ගිය මට දකින්න ලැබුණේ එළදෙනක්. මං කිවුවේ... මනාටියෝ වගේ මුහුදු හරක් ගැන මම අහලා තිබුණා තමයි, ඒත් මෙතැන හිටියේ පිටුපස කඳ කොටස සර්පයෙකුගේ හැඩය ගත් ඇත්තම එළදෙනක්. සුදු පාට හොම්බකුත්, දුඹුරු පාට ලොකු දුක්බර ඇස් දෙකකුත් පිහිටි එයාගේ ඉදිරි කය කළු ලොම් ඇති වසු පැටියෙකුගේ වගෙයි- ඒ වගේම එයාගේ පසු කය හැදිලා තිබුණේ යෝධ ආඳෙකුගේ වගේ ඉහළින් සහ පහළින් වරල් පේළියක් ඇති කළු-දුඹුරු සර්ප වලිගයකිනුයි.

"හෝව්, පුංචි යාළුවා," මම කතා කළා. "ඔයා කොහෙ ඉඳල ද ආවේ?"

සතා දුක්බරව මගේ දිහා බැලුවා. "උම්බෑ!"

ඒත් මට එයාගේ සිතුවිලි තේරුම් ගන්න හැකියාවක් තිබුණේ නැහැ. මම දන්නේ අශ්ව භාෂාව විතරයි නේ.

*ඌ මොකෙක්ද කියලා අපි දන්නෙ නැහැ, උතුමාණෙනි,* හිපොකැම්පියා කිවුවා. *මේ දවස්වල එක එක ජාතියේ අමුතු සත්තු කැලඹෙනවා.*

"ඔව්," මම කෙඳිරුවා. "මටත් ආරංචියි."

මම රිප්ටයිඩ්ගේ කොපුව ගැලවූ සැණින් සම්පූර්ණ දිගට වැඩුණු කඩු තලය අඳුර තුළ දිලිසෙන්න ගත්තා.

තැතිගත් සර්ප එළදෙන දැලෙන් ගැලවෙන්න දඟලන්න පටන් ගත්තා, එයාගේ ඇස් භීතියෙන් පිරුණා. "හෝව්. හෝ..ව්!" මම කිවුවා. "මම ඔයාට කරදර කරන්නෙ නැහැ! මට දැල කපන්න ඉඩ දෙන්නකෝ."



ඒත් නොනවත්වාම දඟලපු සර්ප එළදෙන දැලේ තව තවත් පැටලුණා. මුහුදු පතුලේ රොන් මඩ කලතමින් බෝට්ටු කඳ ඇල වෙන්න ගත්තේ සර්ප එළදෙනගේ ඇඟ උඩට පෙරළෙන්න අනතුරු අඟවමිනුයි. කුලප්පු වෙලා හේෂාරාවය කරමින් එහෙ මෙහෙ දඟලන්න ගත් හිපොකැම්පිලාගෙනුත් උදව්වක් නම් වුණේ නැහැ.

"හරි, හරි!" මම කිවුවා. මම කඩුව පැත්තකට දාලා මට පුළුවන් තරම් සන්සුන් හඬින් කතා කළේ හිපොකැම්පිලාගේ සහ සර්ප එළදෙනගේ බය තුනී කරන්නයි. වතුර යට දී කුලප්පු වුණ සතුන්ගේ කුරවලට තැලෙන්න පුළුවන් ඇති ද මම දැන සිටියේ නැහැ, කොහොම වුණත් මට ඒක හොයාගන්න කිසිම උවමනාවක් තිබුණෙත් නැහැ. "ඔක්කොම හරි. කඩුව නැහැ. දැක්කනේ? කඩුව නැහැ. අපි හොඳ දේවල් ගැන හිතමු. මුහුදු තණකොළ. එළදෙන අම්මා. එළවළු විතරක් කන මිනිස්සු."

මම කියමින් සිටි දේවල් සර්ප එළදෙනට තේරුණා ද කියලා නම් මට විශ්වාසයක් නැහැ, ඒත් මම කතා කළ ස්වරයට ඌ ප්‍රතිචාර දැක්වූවා. හිපොකැම්පිලා නම් තවමත් දඟ කරමින් සිටියා, ඒත් එයාලා වේගයෙන් මගේ වටේ කැරකෙන එක නතර කළා.

*ඌව ගලවන්න, උතුමාණෙනි!* එයාලා කන්නලව් කළා.

"ඔව්," මම කිවුවා. "මම ඒක කරන්නම්. මම මේ හිතනවා."

ඒ වුණත් කඩු තලයක් දැකපු හැටියේ බය වෙන මේ සර්ප එළදෙනව (ඌ 'එළදෙනක්' වෙන්න ඇති කියලා මම තීරණය කළා.) මම කොහොමද නිදහස් කරන්නේ? ඒක හරියට එයා මීට කලිනුත් කඩු දැකලා තියෙන නිසා, ඒවා කොයි තරම් අනතුරුදායක ද කියලා දැනගෙන හිටියා වගේ.

"හරි එහෙනම්," මම හිපොකැම්පිලාට කිවුවා. "හරියටම මම කියන විදිහට ඔයාලා තල්ලුවක් දෙන්න ඕනෑ."

අපි මුලින්ම බෝට්ටුවෙන් පටන් ගත්තා. ඒක ඒ තරම් පහසු වුණේ නැහැ, ඒත් අශ්ව බල තුනක ශක්තියේ උදව්වෙන් පුංචි සර්ප එළදෙනගේ ඇඟ උඩට බෝට්ටුවේ සුන්බුන් ඇද වැටෙන්න ඉඩක් නොතබා බෝට්ටු කඳ එතැනින් ඉවත් කරන්න අපිට පුළුවන් වුණා. ඊට පස්සෙ මම දැල ගලවන්න පටන් ගත්තා. එහි කොටසින් කොටස පැටලුම් ලිහමින්, ඊයම් බරු සහ බිලී කොකු දිග අරිමින් මම සර්ප එළදෙනගේ කුර වටා තිබුණු ගැට ගැලවූවා. ඒ වැඩේට කල්පයක් විතර

ගියා- මං කිවුවේ, ඒක මගේ වීඩියෝ ගේම් කන්ට්‍රෝලරයේ වයර්වල පැටලුම් ලිහනවටත් වඩා හපන්. ඒ මුළු කාලය පුරාවටම, උම්බෑ ගාමින් විලාප දෙන මාළු වැස්සිට මම නොනවත්වාම කතා කරමින්, එයාට කරදරයක් නොවෙන බව කිවුවා.

"ඔක්කොම හරි, බෙසී," මම කිවුවා. ඒ නමින් එයාට කතා කරන්න පටන් ගත්තේ ඇයි කියලා නම් මගෙන් අහන්න එපා. ඒක එළදෙනකට ගැළපෙන නමක් කියලා මට හිතුණා. "හොඳ එළදෙන. ෂෝයි එළදෙන."

අන්තිමේ දී, මුළුමනින්ම ලිහුණු දැල තුළින් පිහිනා පිටට ආ සර්ප එළදෙන සතුටින් කරණමක් ගැසුවා.

හිපොකැම්පිලා ප්‍රීතියෙන් හේෂාරාවය කළා. *ස්තූතියි, උතුමාණෙනි!*

"උම්බෑ...!" මගේ ඇගේ හොම්බ පිරිමදිමින් සර්ප එළදෙන. එයාගේ දුඹුරු පාට ලොකු ඇස්වලින් මට මොනවදෝ කිවුවා.

"ඔව්," මම කිවුවා. "ඔක්කොම හරි. පැටියෝ. හොඳයි... කරදරවලින් ඈත්වෙලා ඉන්න."

ඒකෙන් මට මතක් වුණේ, මම කොයි තරම් වෙලා වතුර යට හිටිය ද? අඩු තරමේ පැයක්වත්. මම ඇඳිරි නීතිය කඩ කළ බව ආර්ගස් සහ හාර්පිලා හොයාගන්න කලින් මම ආපහු මගේ කැබින් එකට යන්න ඕනෑ.

මම පිහිනා ගොස් වතුරෙන් උඩට මතු වුණා. එසැණින් ම පහළට ආ බ්ලැක්ජැක් මට එයාගේ බෙල්ලේ එල්ලෙන්න දුන්නා.

ගුවනට නැඟුණු එයා මාව වෙරළ දිහාවට රැගෙන යන්න පටන් ගත්තා.

*වැඩේ හරි ද බොස්?*

"හරි. අපි මොකෙක්ද මන්දා පැටියෙක්ව බේරගත්තා. ඒකට හොඳ වෙලාවක් ගියා. තව පොඩ්ඩෙන් මම කුර පාරකුත් කනවා."

*හොඳ වැඩ කරන්න කොහොමත් අමාරුයි තමයි, බොස්. ඔයා මේ වැඩකට නැති මාවත් බේරගත්තේ, නැද්ද?*

මට, මගේ හීනය ගැන නොහිතා ඉන්න බැරි වුණා; ඇනබෙත්ගේ පණ නැති සිරුර ලූක්ගේ අතේ තිබුණු විදිහ. මම මෙතැනට වෙලා රාක්ෂ පැටව් බේරමින් හිටියට, මට මගේ යාළුවාව බේරගන්න බැරි වුණා.



බ්ලැක්ජැක් මගේ කැබිනය පැත්තට පියාසර කරද්දී මම නිකමට වගේ භෝජන මණ්ඩපය දිහා බැලුවා. එතැන මට කෙනෙක්ව- කුලුනක් පිටිපස්සේ හොරගල් අහුලන කොල්ලෙක්ව දකින්න ලැබුණා.

ඒ නිකෝ. ඒත් තවම එළි වෙලාවත් නැහැ නේ. උදේ කෑමට තව ගොඩක් වෙලා තිබුණා. ඉතින් එයා මොනවද එතැන කරන්නේ?

මම පැකිළුණා. තවත් නම් නිකෝගේ මිතොමැජික් සෙල්ලම ගැන අහන්න මට කිසිම ආසාවක් තිබුණේ නැහැ. ඒත් එතැන මොකක්හරි අවුලක් තිබුණා. එයා බිම ඇනතියාගෙන හිටපු විදිහෙන්ම මට ඒක තේරුණා.

"බ්ලැක්ජැක්," මම කතා කළා, "මාව අතනින් බස්සන්නකෝ? අර කණුව පිටිපස්සෙන්."

★★★

තව පොඩ්ඩෙන් මම වැඩේ වණ කරගන්නවා.

මම නිකෝට පිටුපසින් වූ පඩිපෙළ නැගගෙන ගියා. එයා කොහොමටවත් මාව දැක්කේ නැහැ. කුලුන පිටුපස සැඟවී, හොරෙන් එබිකම් කරමින් සිටි එයාගේ අවධානය සම්පූර්ණයෙන් ම යොමු වී තිබුණේ කෑම ශාලාව දිහාවටයි. අඩි පහක් දුරින් සිටි මම 'ඔයා මොකද කරන්නේ?' කියලා මහ හඬින් අහන්න හදනකොට ම, මට යමක් තේරුණා; එයා සිටියේ දඩයක්කාරියෝ ගැන ඔත්තු බලමිනුයි.

එතැන හඬවල්- කෑම මේසයක වාඩි වී සිටි ගැහැනු ළමයි දෙන්නෙක් කතා කරන හඬවල් ඇසුණා. මේ මහ පාන්දර? හොඳයි, එහෙනම් එයා අරුණෝදයට අධිපති දෙවඟනවත් වෙන්න ඕනෑ.

ඇනබෙත්ගේ මායා කැප් එක සාක්කුවෙන් පිටට ගත් මම එය දමා ගත්තා.

මට කිසිම වෙනසක් දැනුනේ නැතත්, අත් ඔසවා බලද්දී මට තවදුරටත් ඒවා දකගන්න බැරි වුණා. මම අදෘශ්‍යමාන වෙලා.

හොරෙන් හොරෙන් ඉදිරියට ගිය මම නිකෝව පසු කළා. කළුවර නිසා මට ගැහැනු ළමයින්ව හොඳින් නොපෙනුණත්, එයාලගේ කටහඬ මම හඳුනා ගත්තා: ඒ ෆෙසෝයි සහ බියන්කා. ඒ දෙන්නා වාද කරනවා වගෙයි ඇසුණේ.

"ඒක සනීප කරන්න බැහැ," ෆෙසෝයි කියමින් සිටියා. "මේ හදිස්සියේ නම් කොහොමත් බැහැ."

"ඒත් කොහොමද ඒක වුණේ?" බියන්කා ඇහුවා.

"සතතිරු විහිළුවක්." ෂෝයි ගෙරෙව්වා. "අර හර්මීස් කැබින් එකේ ඉන්න ස්ටෝල් කොල්ලො දෙන්නා. තරාශ්ව ලේ ඇසිඩ වගේ. ඒක හොඳන්න කෙනෙක් නැහැ. එයාලා ආර්ටෙමිස් දඩයම් චාරිකාව … ඒක ඇතුළට ඒවා ඉහලා."

"ඒක නම් හරිම දරුණු වැඩක්!"

"එයාගේ පණ බේරෙයි," ෂෝයි කිවුවා. "ඒත් එයාට දරුණු … නිසා සති ගාණක් ඇඳට වැටිලා ඉන්න වෙයි. එයාට මේ … යන්න බැහැ. දැන් ඉන්නේ මමයි… සිසී විතරයි."

[illegible]



බියන්කා නිහඬ වුණා. "ඔයා තාලියාට ඔයාගේ හීනේ ඉතුරු ටිකත් කිවුවොත් හොඳයි."

"නෑ. ඒකෙන් වෙන හොඳක් නැහැ."

"ඒත් මේ ජෙනරල් ගැන ඔයාගේ සැකය හරි නම්-"

"ඒ ගැන කතා කරන්නේ නැහැ කියලා තී මට වචනයක් දුන්නා නේද," ෂෝයි කිවුවා. එයාගේ හඬේ තිබුණේ තද වේදනාවක්. "අපිට ඉක්මනටම ඒක හොයාගන්න ලැබෙයි. දැන් එන්න. එළි වෙන්න ළඟයි."

නිකෝ ඉක්මනින් එයාගේ පාරෙන් ඉවත් වුණා. එයා මටත් වඩා වේගවත්.

ගැනු ළමයි දෙන්නා වේගයෙන් පඩිපෙළ පහළට දුවගෙන එද්දී, තව පොඩ්ඩෙන් ෂෝයි මගේ ඇඟේ හැප්පෙනවා. හිටිවනම නැවතුණු එයා ඇස් පටු කරගත්තා. එයාගේ අතක් දුන්න වෙතට ඇදුණත්, බියන්කා එයාට කතා කළා. "මහ ගෙදර ලයිට් දාලා. ඉක්මන් කරන්න!"

ෂෝයි එයා පසුපස මණ්ඩපයෙන් පිටතට ගියා.

★★★

නිකෝ හිතමින් සිටි දේ මට තේරුණා. ගැඹුරු හුස්මක් ගත් එයා, එයාගේ අක්කා පසුපස දුවන්න සූදානම් වෙද්දී ම අදෘශ්‍යමාන තොප්පිය ගැලවූ මම කතා කළා. "ඔහොම ඉන්න."

මාව හොයාගෙන මිදුණු පඩි මත වේගයෙන් කැරකුණු එයා තව පොඩ්ඩෙන් ලිස්සා වැටෙනවා. "ඔයා කොහෙන්ද කඩා පාත් වුණේ?"

"මමත් ඔච්චර වෙලා මෙතැන ම තමයි හිටියේ. ජේන්නැතුව."

එයා 'ජේන්නැතුව' වචනය තොල් මැතිරුවා. "වාව්. මරුනේ."

"ෂෝයි, ඔයාගේ අක්කයි මෙතැන කියලා ඔයා කොහොමද දැනගත්තේ?"

එයා රතු වුණා. "ඒ දෙන්නා හර්මීස් කැබින් එක ළඟින් යනවා මට ඇහුණා. මට… මට කඳවුරේ දී හොඳට නින්ද යන්නෙ නැහැ. ඒ නිසා මට අඩි සද්දයි, එයාලා කසුකුසු ගාන සද්දයි ඇහුණා. ඉතින් මම එයාලා පස්සෙන් ආවා."

"එතකොට දැන් ඔයා හිතන්නේ එයාලා පස්සෙන් ගවේෂණයටත් යන්න," මම අනුමාන කළා.

"ඔයා කොහොමද ඒක දැනගත්තේ?"

"මොකද, එයා මගේ අක්කා වුණා නම් මමත් ඒ දේම කරන්න හිතයි. ඒත් ඔයාට එහෙම කරන්න බැහැ."

එයා විරෝධය පාන බැල්මකින් බැලුවා. "මම පොඩි නිසා ද?"

"එයාලා ඔයාට ඉඩ දෙන්නැති නිසා. එයාලා ඔයාව අල්ලගෙන, ආපහු මෙහාටම එවයි. ඒ වගේම... ඔව්, ඔයා පොඩි වැඩියි තමයි. ඔයාට මැන්ටිකෝරයාව මතක ද? ඒ වගේ තව ගොඩක් එවුන් එහෙ ඉදියි. ඊටත් වඩා භයානක එවුන්. සමහර වීරයින්ට මැරෙන්නත් සිද්ධ වෙයි."

එයාගේ උරහිස් එල්ලා වැටුණා. එයා කකුලකින් කකුලකට මාරු වුණා. "සමහරවිට ඔයා හරි ඇති. ඒත්, මං වෙනුවට ඔයාට යන්න පුළුවන් නේ."

"මොකක්ද කිවුවේ?"

"ඔයාට කාටවත් පේන්නැතුව යන්න පුළුවන්!"

"දඩයක්කාරියෝ කොල්ලන්ට කැමති නැහැ," මම එයාට සිහිපත් කළා. "එයාලා දැන ගත්තා මං-"

"එයාලට දැනගන්න අරින්න එපා. නොපෙනී ම ඉන්න. මගේ අක්කා ගැන ඇහැ ගහගෙන ඉන්න! ඔයාට ඒක කරන්න ම වෙනවා, අනේ?"

"නිකෝ-"

"කොහොම වුණත් ඔයා යන්න නේ හිතන් ඉන්නේ, හා නැද්ද?"

මට නැහැ කියන්න ඕනෑ වුණා, ඒත් එයා මගේ ඇස් දිහා බලා ඉඳිද්දී මට බොරුවක් කියන්න බැරි වුණා.

"ඔව්," මම කිවුවා. "මම ඇනබෙත්ව හොයාගන්න ඕනෑ. එයාලට මාව උවමනා නැති වුණත්, මම එයාලට උදවු කරන්නම ඕනෑ."



"මම ඔයාව නතර කරන්නෑ," එයා කිවුවා. "ඒත් මගේ අක්කව පරිස්සම් කරනවා කියලා ඔයා පොරොන්දු වෙන්න ඕනෑ."

"මම... මේ වගේ ගමනක දී ඒක පොරොන්දු වෙන්න අමාරු දෙයක්, නිකෝ. ඇරත්, එයා එක්ක ZEසෝයි, ග්‍රෝවර්, තාලියා-"

"පොරොන්දු වෙන්න," එයා බල කළා.

"මම, මට පුළුවන් උපරිමෙන් කරන්නම්. මම ඒක පොරොන්දු වෙනවා."

"එහෙනම්, දැන් යන්න!" එයා කිවුවා. "සුබ පැතුම්!"

ඒක නම් මහ පිස්සුවක්. මම බඩු අහුරගත්තෙවත් නැහැ. මගේ ළඟ තිබුණේ කැප් එක, කඩුව සහ හැඳ සිටි ඇඳුම් විතරයි. මේ උදේ මම මැන්හැටන්වල අපේ ගෙදර යනවා කියලයි තිබුණේ. "කයිරොන්ට කියන්න-"

"මම මොකක්හරි ගොතලා කියන්නම්," නිකෝ කපටි හිනාවක් පෑවා. "මම ඒකට දක්ෂයි. දැන් යන්න!"

ඇනබෙත්ගේ කැප් එක දමා ගනිමින් මම දිවුවා. ඉර පායා එද්දි, මම අදෘශ්‍යමාන වුණා. නියම වේලාවට අර්ධ-ලෝහිත කඳු මුඳුනට ගිය මට දකින්න ලැබුණේ කඳවුරේ වෑන් එක ගොවිපොළ පාරේ ඈත නොපෙනී යන හැටියි. ආර්ගස් ගවේෂණ කණ්ඩායම නගරයට අරන් යනවා වෙන්න ඇති. එයින් පස්සේ ගමනේ ඉතිරි එයාලට තනියම යන්න වේවි.

මගේ හිතේ වරදකාරී හැඟීමක් වගේම ගොන්කමක් කළා කියන හැඟීමත් කොනිති ගහන්න වුණා. දැන් මම කොහොමද එයාලා එක්කම යන්නේ? වෑන් එක පස්සෙ දුවල ද?

ඒ වෙලාවේ මට යෝධ තටු යුගලක් වදින හඬක් ඇසුණා. බ්ලැක්ජැක් මගේ ළඟට ගොඩ බැස්සා. එයා අයිස් අතරින් මතු වී තිබුණු තණ පඳුරු කීපයක් ඕනෑවට එපාවට වගේ ලෑටි ගාන්න ගත්තා.

*මං හිතනවා හරි නම්, බොස්, ඔයාට මෙහෙන් පැනලා යන්න අශ්වයෙක් ඕනෑ වෙලා ඉන්නේ. මොකද කියන්නේ?*

කෘතවේදීතාවය පළ කරන වචනවලින් මගේ උගුර පැටළුණා. ඒත් මම අමාරුවෙන් කියාගත්තා. "ඔව්. එහෙනම් අපි පියාඹමු."

09

# මම පිල්ලි වවන හැටි ඉගෙන ගත්තා

දහවලක පෙගසස් කෙනෙක් පදවනවා නම් ඔයා පරිස්සම් වෙන්න ඕනෑ, නැත්නම් ඔයා නිසා ලෝන්ග් අයිලන්ඩ් අධිවේගී පාරේ බරපතළ රිය අනතුරක් වුණත් වෙන්න පුළුවන්. ඒ නිසා මට බ්ලැක්ජැක්ව වලාකුළුවලට ඉහළින් රඳවා ගන්න වුණා. වාසනාවකට වගේ, මේ ශීත සෘතුව නිසා වලාකුළු තිබුණේ ඒ තරම් උසකින් නෙවෙයි. සුදු පාට අර්ධ-ලෝහිත කඳවුරු වෑනය පෙනෙන මානයේ රැඳෙන්න උත්සාහ කරමින් අපි වේගයෙන් ඉදිරියට ගියා. අයිස් වගේ වැහි බිඳු මගේ හමට කටු අනිද්දී උඩු ගුවනේ සීතල පොළොවේ දී දැනෙනවාටත් වඩා දරුණුවට දැනුණා.

කඳවුරු ගබඩාවේ විකුණන්න තිබුණ තැඹිලි පාට අර්ධ-ලෝහිත කඳවුරු උණුසුම් යට ඇඳුමක් අරන් නාවේ අපරාදේ කියලා මට හිතෙන්න ගත්තා. ඒත් ෆීබි සහ නරාශ්ව ලේ ඉහපු ටී-ෂර්ට් එකේ කතාව ඇහුවට පස්සේ, තවදුරටත් එයාලගේ බඩු ගැන විශ්වාස කරන්න මගේ හිත ඉඩ දුන්නෙ නැහැ.

අපිට දෙවතාවක් ම වෑනය මග ඇරුණා, ඒත් එයාලා මුලින් ම මෑන්හැටන්වලට යාවි කියලා මට හැඟුණා. ඉතින් ආපහු එයාලව හොයාගන්න ඒ හැටි අමාරු වුනේ නැහැ.

නිවාඩු කාලය නිසා පාරේ වාහන තදබදය ගොඩක් දරුණුවට තිබුණා. ඉතින් එයාලා නගරයට ඇතුළු වෙද්දී උදේ



වරුවෙන් බාගයක් ම ගෙවී අවසන්. ක්‍රයිස්ලර් ගොඩනැගිල්ල මුදුනට කිට්ටුවෙන් බ්ලැක්ජැක්ව ගොඩ බැස්සවූ මම සුදු පාට කඳවුරු වෑනය බස් නැවතුම්පොළට ඇතුළු කරාවි හිතමින් බලා සිටියත්, එය නොනැවතී ධාවනය වුණා.

"ආර්ගස් එයාලව කොහෙද අරන් යන්නේ?" මම කෙඳිරුවා.

*ඔහ්, ආර්ගස් නෙවෙයි එළවන්නේ, බොස්. බ්ලැක්ජැක් මට කිවුවා. ඒ අර කෙල්ල.*

"මොන කෙල්ල ද?"

*අර දඩයක්කාර කෙල්ල. රිදී පාට ඔටුන්නක් වගේ එකක් ඔළුවෙ දාගෙන ඉන්න කෙනා.*

"ෂෝයි?"

''එයා තමයි. හේයි, අර බලන්න! අතන ඩෝනට් කඩයක් තියෙනවා. අපි ගිහිල්ලා මොනවාහරි ගමුකෝ?''

පියාඹන අශ්වයෙක්ව ඩෝනට් කඩයකට අරන් ගියොත් අහල පහල ඉන්න හැම පොලිස් නිලධාරියෙකුට ම පපුවෙ අමාරුව හැදෙන්න පුළුවන් කියලා බ්ලැක්ජැක්ට පැහැදිලි කරන්න මම උත්සාහ කළත්, එයාට ඒක තේරුනේ නැහැ වගෙයි. මේ අතරවාරයේ දී වෑනය හෙමින් සීරුවේ ලින්කන් උමඟ දෙසට ඇදුණා. ෂෝයිට රිය පදවන්න පුළුවන් ඇති කියලා මම නිකමටවත් හිතලා තිබුණේ නැහැ. මං කියන්නේ, එයාට අවුරුදු දාසයක පෙනුමක්වත් නැහැ නේ. ඒත් ඉතින් එයා අමරණීය කෙනෙක් නේ. එයාට ඇත්තේ නිව්යෝර්ක් රියැදුරු බලපත්‍රයක් ද, එහෙම නම් එයාගේ උපන් දිනය සටහන් කර ඇත්තේ කොහොමද හිතලා මම පුදුම වුණා.

"හොඳයි," මම කිවුවා. "අපි එයාලා පස්සේ යමු."

අපි ක්‍රයිස්ලර් ගොඩනැගිල්ල මුදුනින් පනින්න සූදානම් වෙද්දී එක පාරටම කුලප්පු වී හේශාරාවය කළ බ්ලැක්ජැක්ගේ පිටෙන් තව පොඩ්ඩෙන් මම වැටෙනවා. මොකක්දෝ දෙයක් මගේ කකුලේ සර්පයෙක් වගේ එතෙන්න ගත්තා. මම කඩුව අතට ගත්තා. ඒත් මම පහළ බලද්දී, එතැන කිසිම සර්පයෙක් නැහැ. ගොඩනැගිල්ලේ ගල් අතර පැළුම්වලින් වැල්- මිදි වැල් පැන නගිමින් තිබුණා. ඒවා

බ්ලැක්ජැක්ගේ කකුල් වටා එතෙමින්, මගේ කකුල්වලට කස පහර දෙමින් අපිට හෙලවෙන්නවත් ඉඩක් නැති කළා.

"බැරක් යනවා වගේ?" මිස්ටර් ඩී ඇසුවා.

එයා ගොඩනැගිල්ලට හේත්තු වී සිටියත්, එයාගේ දෙපා අහසේ පාවෙමින් තිබුණා. එයාගේ කොටි පුල්ලි මෝස්තරයක් වැටුණු උණුසුම් ඇඳුම් කට්ටලය හා කළු කොණ්ඩය සුළඟ සමග පොර බැදුවා.

*දෙයියන්ටම ඔප්පු වෙච්චාවේ! බ්ලැක්ජැක් මොරදුන්නා. මේ වයින්කාරයා නේ!*

මිස්ටර් ඩී කේන්තියෙන් සුසුමක් පිට කළා. "මට 'වයින්කාරයා' කියන ඊළඟ මිනිහා, නැත්නම් අශ්වයා මර්ලොට් බෝතලයක් වෙලා තමයි නවතින්නේ."

"මිස්ටර් ඩී," මිදි වැල් නොනවත්වා මගේ කකුල් වටේ එතෙද්දී මම කටහඬ සන්සුන් කරගන්න උත්සාහ කළා. "ඔයාට මොනවද ඕනෑ?"

"ඔහ්, මට මොනවද ඕනෑ? බාගදා, ඔයා හිතුව ද අවසර නැතුව කඳවුරෙන් පැනලා ගියා ම මේ අමරණීය, මහා බලගතු කඳවුරු අධ්‍යක්ෂකට ඒක දැනෙන්නෙ නැති වෙයි කියලා?"

"හොඳයි... සමහරවිට."

"පියාඹන අශ්වයා නැතුව ඔහේව මේ බිල්ඩිමෙන් පහළට තල්ලු කරලා බලන්න ඕනෑ ඔය චණ්ඩිකම්වල තරම."

මම දැත් මිටි කරගත්තා. කට පරිස්සම් කරගන්න ඕනෑ බව මම දැන සිටියා, ඒත් මිස්ටර් ඩී ලෑස්ති වුණේ මාව මරන්න, නැත්නම් මාව කඳවුරට ඇදගෙන ගිහින් ලැජ්ජා කරන්න. ඒ දෙකෙන් එකක්වත් මට උවමනා වුණේ නැහැ. "ඇයි ඔයා මට ඔච්චරටම වෛර කරන්නේ? මම මොකක්ද කරපු වැරැද්ද?"

එයාගේ දෑස් තුළ දම් පාට ගිනි දැල් නැටුවා. "ඔයා වීරයෙක්, කොල්ලෝ. මට ඒ හේතුව හොඳටෝම ඇති."

"මට මේ ගවේෂණයට යන්නම ඕනෑ! මට මගේ යාළුවන්ට උදවු කරන්න තියෙනවා. ඔයා කොහොමද ඒ වගේ දෙයක් තේරුම් ගන්නේ!"



*මේ... බොස්. බ්ලැක්ජැක් බයෙන් කතා කළා. අඩි නමසීයක් උඩ අහසේ මිදිවැල්වලින් එතිලා ඉන්නකොට, ඔයිට වඩා හොඳින් කතා කළොත් හොඳ නැද්ද.*

මිදි වැල් තවත් තදින් මගේ වටේ එතුණා. අපිට පහළින්, සුදු වෑනය තව තවත් ඈතට ඇදුණා. ඉක්මනින් ම ඒක නොපෙනී යාවි.

"මම මීට කලින් කවදාවත් ඔයාට අරියඩ්නිගේ කතාව කියලා තියෙනව ද?" මිස්ටර් ඩී ඇසුවා. "ක්‍රීට්වල හිටපු ලස්සන තරුණ කුමාරිකාව ගැන? එයත්, එයාගේ යාළුවන්ට උදවු කරන්න කැමති කෙනෙක්. ඇත්ත වශයෙන් කියනවා නම්, එයා තිසියස් කියලා තරුණ වීරයෙකුට උදවු කළා; එයත් පොසෙයිඩන්ගේ පුතෙක්. අරියඩ්නි එයාට දුන්න මායා නූල් බෝලේ උදවුවෙන් තමයි එයා වංගගිරියෙන් එළියට එන්න පාර හොයාගත්තේ. ඊට පස්සේ තිසියස් එයාට දුන්න තෑග්ග මොකක්ද කියලා දන්නව ද?"

මොකක් දුන්නත් මට මොකද! කියලා උත්තර දෙන්න මගේ කට කැසුවත්, ඒක මිස්ටර් ඩීගේ කතන්දරේ ඉක්මනින් ඉවර කරන්න රුකුලක් නොවෙන බව මට තේරුණා.

"ඒ දෙන්නා කසාද බඳින්නැති," මම කිවුවා. "ඊට පස්සේ සතුටින් ජීවත් වෙන්නැති. කතාව ඉවරයි."

මිස්ටර් ඩී අවඥාසහගත බැල්මක් හෙළුවා. "කොහෙත්ම නෑ. තිසියස් එයාව විවාහ කරගන්නවා කිවුවා. එයා අරියඩ්නිව නැවක නග්ගගෙන ඇතින්ස්වලට යන්න පිටත් වුණා. යන අතරමග තිබුණු නක්සෝස් කියන පුංචි දූපතේ දී එයා... මොකද කළේ දන්නව ද? එයා අරියඩ්නිව තනි කරලා යන්න ගියා. මට එයාව හොයාගන්න ලැබුණේ එතැනදී, ඔයා දන්නවා නේ. තනි වෙලා. හිත බිඳිලා. ඉවසා ගන්න බැරි දුකෙන් අඬ අඬා හිටියා. එයා හැමදේම අතෑරලා, දන්න කියන හැමෝටම පිටුපාලා මේ කමකට නැති තරුණ වීරයාට උදවු කළත්, එයා මේ කෙල්ලව කැඩිච්ච සෙරෙප්පුවක් වගේ වීසි කරලා දැම්මා."

"ඒක වැරදියි තමයි," මම කිවුවා. "ඒත් අවුරුදු දාස් ගාණකට කලින් සිද්ධ වුණ දේකට මං මොනවා කරන්න ද?"

මිස්ටර් ඩී නොසැලකිලිමත් ලෙසින් මගේ දිහා බැලුවා. "මම අරියඩ්නි එක්ක ආදරෙන් බැඳුණා, කොල්ලෝ. එයාගේ බිඳුණ හදවත මම හැදුවා. එයා මැරුණාම, මම එයාව ඔලිම්පස්වල මගේ අමරණීය

සිරිදු කරගත්තා. එයා තවමත් මං එතකල් බලන් ඉන්නවා. [illegible] මේ විකාර කඳවුරේ ගෙවන්න තියෙන එපා කරපු අවුරුදු සිය [illegible] වුණාම මට ආපහු එයා ළඟට යන්න පුළුවන්."

මම එයා දිහා පුදුමයෙන් බලා සිටියා. "ඔයා... ඔයා [illegible] බැඳල ද ඉන්නේ? ඒත් මං හිතන් හිටියේ ඔයා වන දෙවඟනක් [illegible] එළවන්න ගිහින් අමාරුවේ වැටුණා කියලා-"

"මං කියන්නෙ, ඔයාලා වගේ වීරයෝ කවදාවත් [illegible] වෙන්නෙ නැහැ. දෙවිතොල්ලෝ කිසි කමකට නැහැ කියලා ඔයාලා අපිට දොස් කියනවා. ඒත් ඔයාලා, තමන් ගැනම හිතලා බැලුවා නම් පෙනෙයි. ඔයාලා කරන්නේ තමන්ට ඕනෑ දේ අරගෙන, තමන් උවමනා අයව පාවිච්චි කරලා වැඩේ කරගෙන, ඊට පස්සෙ තමන් වටේ ඉන්න හැමෝටම ද්‍රෝහි වෙන එක. ඉතින් වීරයින්ට මගේ හිතේ කිසිම ආදරයක් නැතුවට ඔයා මට දොස් කියන්න එපා. ඔයාලා කෙළෙහිගුණයක් නැති ආත්මාර්ථකාමී ජාතියක්. මගේ [illegible] බොරු ද කියලා අරියඩ්නිගෙන්. නැත්නම් මීඩියාගෙන් අහලා බලන්න. එහෙමත් නැත්නම් ෙzසෝයි නයිට්ෂේඩ්ගෙන් අහන්න."

"ඇයි ඔයා ෙzසෝයිගෙන් අහන්න කිවුවේ?"

එයා මගේ ප්‍රශ්නය නොසලකා හරිමින් [illegible] "[illegible]. ඔයාගේ මෝඩ යාළුවෝ පස්සෙ දුවනවා."

මගේ කකුල් වටේ එති තිබුණු මිදි වැල් ලිහී ගියා.

ඒක විශ්වාස කරගන්න බැරිව මම තදින් ඇහිපිය ගැහුවා. "ඔයා... ඔයා මට යන්න දෙනවා ද? [illegible]"

"[illegible] කියවුණ විදිහට අපි තරමේ [illegible] [illegible]

[illegible]

[illegible]



මම ඔළුව වැනුවා, ඒ වුණත් මිස්ටර් ඩී මාව ආපහු කඳවුරට ඇදගෙන ගියා නම් මම මෙච්චර වද නොවී ඉන්න තිබුණා. එයා මට යන්න දුන්නා කියන්නේ, මේ ගවේෂණයේ දී අපිව තැළිලා, පොඩිවෙලා යන්න සෑහෙන ඉඩක් තියෙනවා කියලා එයා ඇත්තටම විශ්වාස කරනවා කියන එකයි.

"ඉක්මන් කරමු, බ්ලැක්ජැක්," මම කිවුවේ මවාගත් ප්‍රීතිමත් හඬකින්. "නිව් ජර්සිවලින් මම ඔයාට ඩෝනට් අරන් දෙන්නම්."

★★★

ඇත්තම කියනවා නම්, නිව් ජර්සිවලදී මම එයාට ඩෝනට් අරන් දුන්නෙ නැහැ. ෙzසෝයි පිස්සු හැදිලා වගේ දකුණට වාහනය පදවාගෙන ගියා, අන්තිමේ දී විවේකයක් ගන්න එයා වාහනය නතර කරද්දී අපි මෙරිලන්ඩ්වලටත් ඇතුළු වෙලා. මහන්සියෙන් හෙම්බත්ව සිටි බ්ලැක්ජැක් පොළොවට කඩා වැටුණා.

*මට අවුලක් නැහැ, බොස්. එයා හති දැමුවා. මේ... මේ හුස්මක් ගන්නා විතරයි.*

"මෙතැන ම ඉන්න," මම එයාට කිවුවා. "මම යනවා ඔත්තු බලන්න."

අදෘශ්‍යමාන තොප්පිය දමාගත් මම ළඟම තිබුණු වෙළඳ සැල දෙසට ගියා. හොරෙන් හැංගී නොයා ඉන්න මට ගොඩක් අමාරු වුණා. කාටවත් මාව නොපෙනෙන බව දිගටම මගේ හිතට සිහිපත් කර දෙන්න මට සිදු වුණා. ඒ අතරේම මිනිස්සුන්ට මගේ ඇඟේ හැප්පෙන්න ඉඩ නොතියා, එයාලගේ පාරෙන් ඈත් වී ගමන් කරන්නත් මට සිද්ධ වුණා.

වෙළඳ සැලට තුළට ගිහින් උණුසුම් වෙලා, උණු චොකලට් කෝප්පයකුත් බොන්න මම හිතුවා. මගේ සාක්කුවේ මාරු සල්ලි ටිකක් තිබුණා. මට ඒක කවුන්ටරය උඩ තියලා එන්න පුළුවන්. මම අතට ගත්තම කෝප්පයත් අදෘශ්‍යමාන වෙයි ද, නැත්නම් මට පාවෙන උණු චොකලට් ප්‍රශ්නෙකට මූණ පාන්න වෙයි ද හිතලා මම පුදුම වෙමින් ඉඳිද්දී, මගේ සැලසුම විනාශ කරමින් එතැනට ෙzසෝයි, තාලියා, බියන්කා සහ ග්‍රෝවර් ආවා.

"ග්‍රෝවර්, ඔයාට විශ්වාස ද?" තාලියා අසමින් සිටියා.

"මෙහෙමයි... සෑහෙන විශ්වාසයි. සීයට අනූ නවයක්ම. නැහැ. සීයට අසූ පහක් විතර."

"එතකොට ඔයා මේක කළේ ඕක් ගෙඩිවලින්?" බියන්කා ඇසුවේ එයාට ඒක විශ්වාස කරන්න බැහැ වගෙයි.

එයින් ග්‍රෝවර් අමනාප වූ බව පෙනුණා. "ඒක විරාගත පාර හොයන මන්තරයක්. මං කිවුවේ, මම ඒක හරියට කරන්න ඇති කියලා මට සෑහෙන විශ්වාසයි."

"ඩී.සී.වලට මෙහෙ ඉඳන් හැතැප්ම හැටක් විතර තියෙනවා," බියන්කා කිවුවා. "නිකෝයි, මමයි..." එයා රැවුවා. "අපි එහෙ ජීවත් වුණා. ඒක... ඒක හරි අමුතුයි. මට ඒක අමතක වෙලා."

"මම මේකට කැමති නැහැ," ෂෙසෝයි කිවුවා. "අපි කෙලින්ම බටහිරට යන්න ඕනෑ. අනාවැකියෙ කිවුවේ බටහිර කියලා."

"ඔහ්, හරියට ඔයාගේ මං සලකුණු හොයන හැකියාව මීට වඩා හොඳයි වගේ ද?" තාලියා ගෙරෙව්වා.

ෂෙසෝයි එයා ඉදිරියට අඩියක් තැබුවා. "නුඹ මගේ හැකියාවට අභියෝග කරනව ද, කුස්සි කෙල්ල? දඩයක්කාරියක් වුණාම කොහොමද කියලා තිට කිසිම අදහසක් නැහැ."

"ඔහ්, කුස්සි කෙල්ල! ඔහේ මට ද කුස්සි කෙල්ල කිවුවේ? ඒ මොන කෙහෙම්මලට ද?"

"හෝව්, හෝව්, ඔය දෙන්නා," ග්‍රෝවර් කලබලෙන් කිවුවා. "අයියෝ. ආයෙත් නම් එපා!"

"ග්‍රෝවර් හරි." බියන්කා කිවුවා. "ඩී.සී. තමයි අපේ හොඳම තුරුම්පුව."

ෂෙසෝයිට නම් එහෙම හිතුණ බවක් පෙනුනේ නැහැ, ඒත් එයා අකමැත්තෙන් වුණත් ඔළුව වැනුවා. "හරි එහෙනම්. අපි දිගටම යමු."

"ඔහේගෙ වාහන එළවිල්ලෙන් අපිටත් පොලිස් කූඩුවේ නවතින්න වෙයි." තාලියා අවලාද නැගුවා. "ඔයාට වඩා මට අවුරුදු දාසයට කිට්ටු පෙනුමක් තියෙනවා."



"වෙන්නැති," ෂෙසෝයි එකටෙක කිවුවා. "ඒත් මම වාහන හදන්න පටන් ගත්ත කාලේ ඉඳලම වාහන එළවලා තියෙනවා. දැන් අපි යමු."

★★★

වෑනය ලුහුබඳිමින් බ්ලැක්ජැක් සහ මම දකුණට පියාසර කරන අතරේ, ෂෙසෝයි කළේ විහිළුවක්වත් ද හිතලා මම පුදුම වුණා. මෝටර් රථ මුලින්ම නිපදවන්න පටන් ගත්තේ කොයි කාලෙ ද කියලා මම හරියටම දැනගෙන හිටියේ නැහැ. ඒත් මම හිතුව විදිහට ඒ ප්‍රාග් ඓතිහාසික යුගයේ- මිනිස්සු කළු-සුදු රූපවාහිනී නරඹමින්, ඩයිනසෝරයෝ දඩයම් කරමින් සිටි කාලේ වෙන්න ඕනෑ.

ඇත්තටම ෂෙසෝයිගේ වයස කීය ද? කලින් මිස්ටර් ඩී කිවුවේ මොකක් ගැන ද? වීරයෝ නිසා එයාට ලැබුණු නරක අද්දැකීම මොකක් වෙන්නැති ද?

අපි වොෂින්ටන් ඩී.සී. වෙත ළඟා වෙද්දී, බ්ලැක්ජැක් වේගය අඩු කරමින් පහත බසින්න පටන් ගත්තා. එයා තදින් හුස්ම ගනිමින් සිටියා.

"ඔයා හොඳින් ද?" මම එයාගෙන් ඇසුවා.

*හොඳින්, බොස්. මට... මට හමුදාවක් එක්ක වුණත් හැප්පෙන්න පුළුවන්.*

"ඔයා කතා කරන විදිහට නම් එහෙම හිතෙන්නෑ," හදිසියේ ම මට වරදකාරී හැඟීමක් දැනෙන්න ගත්තා. මම දවසකින් බාගයක් ම එයාට අධිවේගී පාරේ වාහනවල වේගයෙන් පියාඹන්න සැලැස්වූවා. පියාඹන අසෙකුට වුණත්, ඒක දුෂ්කර වැඩක්.

*මං ගැන වද වෙන්නෙපා, බොස්! මං හයිය හත්තිය තියෙන පොරක්.*

එයා නිවැරදි බව මට හැඟුණා, ඒත් ඒ වගේම බ්ලැක්ජැක් බිමට ඇදගෙන වැටුනත්, දුක් ගැනවිල්ලක් නොකියන බවත් මම තේරුම් ගෙන සිටියා. එහෙම වෙනවා දකින්න මට ඕනෑ වුණේ නැහැ.

වාසනාවට, වෑනයේ වේගය අඩු කරන්න ගත්තා. පොටෝමැක් ගඟ තරණය කළ එය වොෂින්ටන් මධ්‍යයට ඇතුළු වුණා. ගුවන් මුර සංචාර, මිසයිල වගේ දේවල් ගැන හදිසියේ ම මගේ හිතට බයක් දැනෙන්න ගත්තා. ඒ වගේ ආරක්ෂක අංග ක්‍රියා කරන හැටි මම

Scanned with CamScanner

හරියටම දැන සිටියේ නැහැ. ඒ වගේම, සාමාන්‍ය හමුදා රේඩාරයකට පෙගසි කෙනෙක්ව හසු වේවි ද කියලාවත් මට විශ්වාසයක් තිබුණේ නැහැ. ඒ කොහොම වුණත් මට අහසේ දී හමුදා ඉලක්කයක් වෙන්න කොහෙත්ම උවමනා වුණේ නැහැ.

"මාව මෙහෙන් බස්සන්න," මම බ්ලැක්ජැක්ට කිවුවා. "දැන් ළං වුණා ඇති."

බ්ලැක්ජැක් කොයි තරම් වෙහෙසට පත් වී සිටියා ද කියනවා නම්, එයා කිසිම පැමිණිල්ලක් කළේ නැහැ. වොෂින්ටන් ස්මාරකය අසලට වැටුණු එයා මාව තණ පිට්ටනියට බැස්සවූවා.

එතැන සිට වැනයට තිබුණේ වීදි කීපයක දුරක් විතරයි. ෂෙසෝයි එය ගැටි බැම්මක් අසල ගාල් කර තිබුණා.

මම බ්ලැක්ජැක් දිහා බැලුවා. "ඔයා ආපහු කඳවුරට යනවා නම් මම කැමතියි. ගිහිල්ලා ටිකක් විවේක ගන්න. හොඳ තණකොළ ටිකක් කන්න. මට ප්‍රශ්නයක් වෙන එකක් නැහැ."

බ්ලැක්ජැක් ඔළුව ඇල කර බැලුවේ අවිශ්වාසයෙන් වගෙයි. *ඔයාට විශ්වාස ද, බොස්?*

"ඔයා කරපු හරිය හොඳටෝම ඇති," මම කිවුවා. "මට අවුලක් වෙන්නෑ. ඔයාට ටොන් එකක් ස්තුතියි."

*පිදුරු ටොන් එකක්වත් නම්, බ්ලැක්ජැක් කල්පනා කරා. ඔන්න කමක් නෑ. හරි එහෙනම්. හැබැයි පරිස්සමෙන්, බොස්. එයාලා මෙහෙට ආවේ මම වගේ මිත්‍රශීලී කඩවසම් කෙනෙක්ව මුණ ගැහෙන්න නම් නෙවෙයි කියලා මට හිතෙනවා.*

මම පරිස්සම් වෙන්න පොරොන්දු වුණා. ඊට පස්සේ අහසට නැගුණු බ්ලැක්ජැක් ස්මාරකය වටා දෙවරක් කැරකී, වලාකුළු අතරේ නොපෙනී ගියා.

මම සුදු වැනය දිහා සෝදිසියෙන් බැලුවා. හැමෝම එයින් එළියට බසිමින් සිටියා. ගොඩනැගිලි සංකීර්ණයේ වූ විශාල ගොඩනැගිලිවලින් එකකට ග්‍රෝවර් අත දිගු කර පෙන්වූවා. තාලියා හිස වැනුවා, ඒත් එක්කම හතර දෙනාම සීතල සුළඟ මැදින් ඉදිරියට ඇදෙන්න පටන් ගත්තා.

එයාලා පසුපස යන්න ගියත් මම හිටිවනම නැවතුණා.



වීදියකට එහා, කළු සෙඩාන් කාරයක දොර ඇරුණා. හමුදා මෝස්තරයට කැපූ අළු පාට කොණ්ඩයක් ඇති පිරිමියෙක් එයින් එළියට බැස්සා. එයා කළු පිට කබායක් සහ අඳුරු අව් කණ්ණාඩි යුවළක් පැලඳගෙන සිටියා. දැන්, සමහරවිට වොෂින්ටන්වල හැම තැනම මේ වගේ අය ඇති කියලා ඔයා හිතනවා ඇති. ඒත් මේ කාරයම අධිවේගී පාරේ දකුණට එනවා දෙතුන් වතාවක් ම දකින්න ලැබුණු බව මට සිහිවුණා. ඒක වැනය ලුහුබැඳගෙන ඇවිත්.

ජංගම දුරකථනයක් අතට ගත් පිරිමියා එයට මොනවදෝ කිවුවා. ඉන්පසු වටේටම බැල්මක් හෙළා වටපිටාව පැහැදිලි බව තහවුරු කරගත් එයා මගේ යාළුවෝ ගිය දිහාවට යන්න පටන් ගත්තා.

නරකම ආරංචිය මේකයි: එයා මගේ පැත්තට හැරෙද්දි මම එයාගේ මුහුණ හඳුනා ගත්තා. ඒ ආචාර්ය තෝර්න්, වෙස්ටෝවර් හෝල්වල හිටපු මැන්ටිකෝරයා.

★★★

අදෘශ්‍යමාන වන කැප් එක දමාගත් මම සෑහෙන පරතරයක් තබාගෙන තෝර්න්ව ලුහුබැන්දා. මගේ හදවත වේගයෙන් ගැහෙන්න ගත්තා. ප්‍රපාතය පහළට වැටීමෙන් එයා බේරුණා නම්, ඇනබෙත්වත් නොමැරී බේරෙන්න ඇති. ඒ කියන්නේ මගේ හීනය නිවැරදියි. එයා තවමත් පණ පිටින්, හිරකාරියක් විදිහට රඳවාගෙන ඇති.

තෝර්න් මගේ යාළුවන්ගෙන් සෑහෙන පරතරයක් තබාගෙන, එයාලට නොපෙනී යන්න වග බලා ගත්තා.

අන්තිමේ දී, ග්‍රෝවර් එක් විශාල ගොඩනැගිල්ලක් ඉදිරියේ නැවතුණා: *'ජාතික ගුවන් සහ අභ්‍යවකාශ කෞතුකාගාරය.'* ස්මිත්සෝනියන් ආයතනය! මීට අවුරුදු මිලියනයකට විතර කලින් මම අම්මත් එක්ක මෙතැනට ඇවිත් තිබුණා, ඒත් ඒ කාලේ මේ හැම දෙයක්ම මීට වඩා ලොකුවටයි පෙනුණේ.

තාලියා දොර දිහා බැලුවා. එය විවෘතව තිබුණත් අධික සීතලත්, පාසල් නිවාඩු කාලයත් නිසා ඇතුළට යන අය වැඩි දෙනෙක් සිටියේ නැහැ. එයාලා හෙමින් සීරුවේ ඇතුළට ලිස්සා ගියා. ආචාර්ය තෝර්න් තරමක් පැකිළුණා. ඊට හේතුවක් මට හිතාගන්න බැරි වුණත් එයා ගොඩනැගිලි කෞතුකාගාරය ඇතුළට ගියේ නැහැ. ආපසු හැරුණු එයා ගොඩනැගිලි සංකීර්ණයේ අනෙක් පැත්තට ගියා. තත්පරේකින් පංගුවක දී තීරණයක් ගත් මම එයා පසුපස ගියා.

පාර පැනපු එයා ස්වාභාවික ඉතිහාසය කෞතුකාගාරයේ පඩි නඟින්න පටන් ගත්තා. එහි දොරේ ලොකු දැන්වීමක් එල්ලා තිබුණා. මුලින් මම හිතුවේ එහි සටහන් කර ඇත්තේ 'පුද්ගලික අවශ්‍යතාවයකට වස දමා ඇත' කියලයි. ඊට පස්සේ ඒක 'වස' නෙවෙයි 'වසා' විය යුතුයි කියලා මට තේරුණා.

වඳ වී ගිය යෝධ සතුන්ගේ සහ ඩයිනොසෝර්ලාගේ ඇටසැකිලි පිරුණු කුටියක් හරහා මම තෝර්න්ව ලුහුබැඳගෙන ඇතුළට ගියා. ඉදිරියෙන් වූ වසා දැමූ දොරක් පිටුපසින් කතා කරන හඬවල් ඇසුණා. දොරට මෙපිටින් මුර භටයෝ දෙන්නෙක් රැඳවා සිටියා. එයාලා තෝර්න්ට දොර විවර කරද්දී, දොර වසා දමන්න කලින් ඇතුළට රිංගා ගන්න මට දුවන්න සිද්ධ වුණා.

ඇතුළත මට දකින්න ලැබුණු දේ කොයි තරම් භයානක ද කියනවා නම් තව පොඩ්ඩෙන් මම මහ හඬින් හූල්ලලා, එයාලගේ අතටම අහු වෙනවා.

උඩු මහල වටා සඳලුතලයක් දිවෙන ලොකු, රවුම් කාමරයකට මම ගොස් සිටියා. අඩු තරමේ මනුෂ්‍ය මුර භටයෝ දුසිමක් විතරත්, රාක්ෂණියෝ- කකුල් වෙනුවට දෙබිඩි සර්ප කඳන් ඇති උරග ගැහැනු- දෙන්නෙකුත් සඳලුතලයේ මුරට හිටියා. මම මීට කලිනුත් එයාලව දැකලා තිබුණා. ඇනබෙත් එයාලට කිවුවේ 'ස්කයිතියන් ඩ්‍රැකනෙයි' කියලයි.

ඒත් නරකම දසුන වුණේ ඒක නෙවෙයි. සර්ප ගැහැනු දෙන්නා මැද සිටගෙන සිටියේ- එයා එක එල්ලේ බලා සිටියේ මගේ දිහා කියලා මට දිවුරන්න වුණත් පුළුවන්- මගේ පරණ හතුරා, ලූක්. එයාගේ පෙනුම දරුණු වුණා. එයාගේ හම සුදුමැලි වෙලා, කහ පාට කොණ්ඩය අළු පාටට හැරිලා තිබුණේ හරියට මාස කීපයක් තුළ දී එයා අවුරුදු දහයකින් වයසට ගිහින් වගෙයි. එයාගේ ඇස්වල තරහෙන් දැල්වෙන එළිය සහ කාලෙකට ඉස්සර මකර නිය පහරකින් කම්මුලේ ඇති වූ කැළැල තවමත් තිබුණා. ඒත් දැන් ඒ තුවාල කැළැල කැත රතු පාටකට හැරී තිබුණේ මෑතක දී ඒක ආයෙමත් පැරිලා වගෙයි.

එයා අසලම සෙවණැලිවලට මුවා වෙලා තවත් කෙනෙක් වාඩිගෙන සිටියා. මට එයාගෙන් දැකගන්න හැකි වුණේ වාඩි වී සිටි සිංහාසනයක් වගේ පුටුවේ රන් ආලේපිත ඇන්ද මත තබාගෙන සිටි අතේ ඇඟිලි ටික විතරයි.



"හොඳයි?" වාඩි වී සිටි පිරිමියා ඇසුවා. ඒ කටහඬ මට හීනෙන් ඇසුණු හඬට සමාන වුණා- ක්‍රෝනොස්ගේ වගේ ඇඟ හිරිවට්ටන හඬක් නොවූ එය ගැඹුරු හා බැරෑරුම් හඬක් වුණේ හරියට පොළොව කතා කරනවා වගෙයි. එයා මොර ගසමින් කතා නොකළත් එයාගේ හඬින් මුළු කාමරයම පිරුණා.

තෝර්න්, එයාගේ අව් කණ්ණාඩි ගැලෙව්වා. එයාගේ පාට දෙකේ ඇස් දෙක උද්‍යෝගයෙන් දිලිසෙමින් තිබුණා. දරදඬු ලෙස නැමී ආචාර කළ එයා, ඉන්පසුව එයාගේ අමුතු ප්‍රංශ උච්චාරණයෙන් කතා කළා: "එයාලා මෙහෙට ආවා, ජෙනරල්."

"මං ඒක දන්නවා, මෝඩයෝ," පිරිමියාගේ හඬ රැව් දුන්නා. "ඒත් කොහෙද?"

"රොකට් කෞතුකාගාරේ."

"ගුවන් සහ අභ්‍යවකාශ කෞතුකාගාරේ," ලූක් නොරිස්සුමෙන් වගේ නිවැරදි කළා.

තෝර්න් ලූක්ට රැව්වා. "එහෙමයි, සර්."

ලූක්ට සර් කියලා කතා කරන අතරේ ම තෝර්න්, එයාගේ උල් කටුවලින් ලූක්ව උල තියාවි කියලා මට හිතුණා.

"කී දෙනෙක් ද?" ලූක් ඇසුවා.

තෝර්න් ඒක නෑහුණා වගේ හිටියා.

"කී දෙනෙක් ද?" ජෙනරල් ප්‍රශ්න කළා.

"හතරයි, ජෙනරල්," තෝර්න් කිවුවා. "සැටර්, ග්‍රෝවර් අන්ඩර්වුඩ්. කළු කුරු කොණ්ඩයක් තියෙන, අර- ඔයාලා කොහොමද ඒක කියන්නේ- අර රස්තියාදුකාර ඇඳුම් අඳින, භයානක පලිහක් තියන් ඉන්න කෙල්ලයි."

"තාලියා," ලූක් කිවුවා.

"තව කෙල්ලො දෙන්නෙක්- දඩයක්කාරියෝ. එක්කෙනෙක් රිදී වළල්ලක් දාගෙන ඉන්නවා."

"ඒකිව මම දන්නවා," ජෙනරල් කිවුවා.

කාමරයේ සිටි හැමදෙනාම අපහසුවෙන් එහෙ මෙහෙ වුණා.

"මට උන්ව ගන්න දෙන්න," ලූක් ජෙනරල්ට කිව්වා. "අපිට ඕනෑවටත් වඩා-"

"ඉවසනවා," ජෙනරල් කිව්වා. "දැනටමත් උන්ට බඩ කට පිරෙන්න හම්බ වෙනවා ඇති. උන්ගේ වැඩ වැඩි කරන්ඩ මම දැනටමත් පුංචි යාළුවෙක් යවලා තියෙන්නේ."

"ඒත්-"

"අපිට නුඹව අවදානමේ දාන්ඩ බැහැ, මගේ කොල්ලෝ."

"ඔව්, කොල්ලෝ," කෘෘර හිනාවක් පාමින් තෝර්න් කිව්වා. "ඔහේ අවදානමේ දාන්න දුර්වල වැඩියි. මට උන්ව ඉවරයක් කරන්න ඉඩ දෙන්න."

"නෑ." ජෙනරල් පුටුවෙන් නැගිට්ටා, ඒත් එක්කම මට පළමු වතාවට එයාව දැකගන්න ලැබුණා.

උස, මාංශ පේශීන්ගෙන් පිරුණු කෙනෙක් වූ එයාට ලා දුඹුරු පාට හමක් සහ පිටුපසට පීරූ කළු කොණ්ඩයක් තිබුණා. වෝල් ස්ට්‍රීට්වල (කොටස් වෙළඳපොලේ) ඉන්න අය අඳින මෝස්තරයේ මිල අධික දුඹුරු පාට සිල්ක් ඇඳුම් කට්ටලයකින් සැරසී සිටියත්, මේ හාදයා තැරැව්කාරයෙක් කියලා නම් ඔයාට වැරදිලාවත් හිතෙන්නෙ නැති වෙයි. දාමරික මුහුණකුත්, යෝධ උරහිසුත් ඇති එයාට තිබුණේ කොඩි කණුවක් වුණත් පහසුවෙන් දෙකට කඩන්න හැකි දෑතක්. එයාගේ ඇස් ගල් වගෙයි. මට දැනුණේ මම පණ තියෙන ප්‍රතිමාවක් දිහා බලන් ඉන්නවා වගෙයි. එයාට හෙලවෙන්නවත් පුළුවන්කමක් තිබුණු එක පුදුමයක් වුණා.

"නුඹ වතාවකුත් මගේ වැඩ වැරැද්දුවා, තෝර්න්," එයා කිව්වා.

"ඒත්, ජෙනරල්-"

"සමාවට කාරණා එපා!"

තෝර්න් ඇකිළුණා. හමුදා පුහුණු පාසලේ දී එයා කළු නිල ඇඳුමෙන් සැරසී සිටිනවා මුලින් ම දකිද්දී තෝර්න්ට බය උපදවන පෙනුමක් තියෙන බව මට හිතුණත්, දැන් ජෙනරල් ඉදිරියේ සිටගෙන සිටිද්දී එයාව පෙනුණේ පඹයෙක් වගෙයි. නියම චණ්ඩියා වුණේ ජෙනරල්. එයාට නිල ඇඳුම් ඕනෑ වුණේ නැහැ. එයා අණ දෙන්නම උපන් කෙනෙක් වගෙයි පෙනුණේ.



"නුඹගේ අදක්ෂකම්වලට නුඹව ටාටරස්වලට විසි කරන්ඩයි වටින්නේ," ජෙනරල් කිව්වා. "ලොකු දෙවිවරු තුන්දෙනාගේ ළමයින්ගෙන් එකෙක්ව අල්ලන් එන්ඩ මම නුඹව යැව්වම නුඹ මට ඇතීනාගේ කැහැටු දුවෙක්ව උස්සන් ආවා."

"ඒත් ඔයා මට වාඩුව ගන්න දෙන්න පොරොන්දු වුණා," තෝර්න් විරෝධය පෑවා. "මගේම බලඇණියක් දෙන්න!"

"ක්‍රෝනොස් උතුමාගේ ජ්‍යෙෂ්ඨ සේනාධිපති මමයි," ජෙනරල් කිව්වා. "මම මගේ උප නිලධාරියෝ විදිහට තෝරගන්නේ මට ප්‍රතිඵල අරන් එන අයව විතරයි! අපේ සැලසුම් යාන්තමින් හරි බේරුණේ ලූක් නිසයි. දැන් මගේ දෑහට නොපෙනී යනවා, තෝර්න්, පස්සෙ මම නුඹට කරන්ඩ පොඩි වැඩක් හොයලා දෙන්නම්."

තෝර්න්ගේ මුහුණ ක්‍රෝධයෙන් දම් පාටට හැරුණා. එයා කටින් පෙණ හලන්න, නැත්නම් උල් කටු විදින්න පටන් ගනීවි කියලා මම හිතුවා. ඒත් එයා කළේ නුහුරට හිස නමා ආචාර කරලා කාමරයෙන් පිට වී ගිය එකයි.

"දැන්, මගෙ කොල්ලෝ," ජෙනරල් ලූක් වෙත හැරුණා. "අපි මුලින් ම කරන්ඩ ඕනෑ අර්ධ-ලෝහිත තාලියාව තනි කරන එක. ඊට පස්සේ අපි හොයන රාක්ෂයා එයා ළඟට එයි."

"දඩයක්කාරියන්ව අයින් කරන එක අමාරු වැඩක් වෙයි," ලූක් කිව්වා. "ZZසෝයි නයිට්ෂේඩ්-"

"ඒකිගේ නම කියන්ඩ එපා!"

ලූක් තදින් කෙළ ගිල්ලා. "ස-සමා වෙන්න, ජෙනරල්. මම නිකං-"

ජෙනරල් අතක් වනා එයාව නිහඬ කළා. "මම නුඹට පෙන්වන්නම්, මගේ කොල්ලෝ, අපි දඩයක්කාරියන්ව වනසන්නෙ කොහොමද කියලා."

එයා පහළ තට්ටුවේ සිටි මුරකරුවෙකුට අත දිගු කළා. "ඔහේ දත් ගෙනාව ද?"

ඒ කොල්ලා පිඟන් මැටි පොච්චියක් අරන් පැකිළෙමින් ඉදිරියට ආවා. "ඔව්, ජෙනරල්!"

"ඒවා පැළ කරනවා," එයා කිව්වා.

Scanned with CamScanner

කාමරය මැද ලොකු පස් ගොඩක් තිබුණා, මං හිතන්නේ එතැන තවත් ඩයිනොසෝර් ප්‍රදර්ශන භාණ්ඩයක් රඳවන්නයි තියෙන්න ඇත්තේ. පෝච්චිය තුළින් සුදු පාට උල් දත් පිටතට ගත් මුරකරුවා ඒවා පස්වලට යට කරන හැටි මම සැකයෙන් බලා සිටියා, එයා ඒවා මත පස් තුනී කරද්දී ජෙනරල් දුෂ්ට ලෙස හිනා වුණා. ආපස්සට අඩියක් තැබූ මුරකරුවා අත්වල වූ පස් පිස දැමුවා. "ලෑස්තියි, ජෙනරල්!"

"විශිෂ්ටයි! ඒවාට වතුර දානවා, ඊට පස්සේ අපි එයාලට ගොදුරෙ ඉව බලන්ඩ දෙමු."

මුරකරුවා ඩේසි මල් පින්තාරු කළ පුංචි ටින් මල් බාල්දියක් අතට ගත්තා. ඒත් අමුත්තකට තිබුණේ එයා එයින් වත් කළේ වතුර නොවුණ එකයි. එයින් වැගිරුණු තද රතු පාට දියරය පැණි බීමක් නම් නෙවෙයි කියලා මට හිතුණා.

පස්වලින් බුබුළු දමන්න පටන් ගත්තා.

"ඉක්මනටම," ජෙනරල් කිවුවා, "මම නුඹට පෙන්වන්නම්, ලූක්, නුඹගේ පුංචි බෝට්ටුවේ ඉන්න හමුදාව වැදගැම්මකට නැති එවුන් කරවන සෙබළු ටිකක්."

ලූක් අත් මිටි කරගත්තා. "මගේ කණ්ඩායම පුහුණු කරවන්න මම අවුරුද්දක්ම මහන්සි වුණා! ප්‍රින්සස් ඇන්ඩ්‍රොමීඩා කන්දට කිට්ටු වුණා ම, එයාලා තමයි හොඳම-"

"හා." ජෙනරල් කිවුවා. "නුඹගෙ හේවායෝ ක්‍රෝනොස් උතුමාට හොඳ ආරක්ෂකයෝ ටිකක් වෙයි කියලා මමත් පිළිගන්නවා. ඒ වගේම නුඹට, ඇත්ත වශයෙන්ම, නුඹටත් කරන්න කාර්ය භාරයයක් තියෙයි-"

ජෙනරල් එහෙම කියද්දී ලූක්ගේ මූණ තවත් සුදුමැලි වුණා කියලා මට හිතුණා.

"-ඒත් මගේ නායකත්වය යටතේ ක්‍රෝනොස් උතුමාගේ බලකායන් සිය ගුණයකින් වැඩි වෙයි. අපිව නවත්වන්ඩ කාටවත් බැරි වෙයි. බලාගනිල්ලා! මගේ මහා මිනී මරණ යන්ත්‍රවල තරම!"

පස් පුපුරාගෙන යමක් මතුවෙන්න ගත්තා. මම බයෙන් පස්සට වුණා.



දතක් පැළ කළ සෑම තැනකින්ම පස් තුළින් සතෙක් එළියට එන්න පෙරළි කළා. මුලින්ම එළියට ආව සතා හඬ ගෑවා: "ඥාව්?"

ඒ පූස් පැටියෙක්. කොටියෙකුගේ වගේ ඉරි වැටුණු තැඹිලි පාට චූටි පූසි පැටියෙක්. ඊට පස්සෙ තවත් එකා බැගින් උඩට මතු වූ පූස් පැටව් දුසිමක් විතර පස් ගොඩේ පෙරළි පෙරළි සෙල්ලම් කරන්න ගත්තා.

හැමදෙනාම අවිශ්වාසයෙන් ඇස් ලොකු කරගෙන උන් දිහා බලා සිටියා. ජෙනරල් ගෙරෙව්වා. "මේ මොක්කු ද? හුරතල් පූස් පැටව්? නුඹ කොහෙන්ද ඒ දත් ටික හොයාගත්තේ?"

දත් රැගෙන ආ මුරකරුවා බයේ ඇකිළුණා. "ප්‍රදර්ශන කුටියෙන්, සර්! ඔයා කියපු විදිහටම. සේබර් දත් ඇති කොටියා-"

"නෑ, මී හරකෝ! මං කිවුවේ ටිරැනොසෝරස් කියලා! මේ... මේ එපා කරපු චූටි බූල් සත්තු ටිකත් එකතු කරගෙන එළියට අරන් යනවා. ආයේ මගේ දෑහට ජේන්ඩ මේ පැත්ත පළාතක එනවා එහෙම නෙවෙයි."

භීතියට පත් වූ මුරකරුවා මල් බාල්දිය බිම දමා, පූස් පැටව් ටිකත් එකතු කරගෙන කාමරයෙන් ඉගිළුණා.

"නුඹ," ජෙනරල් තවත් මුරකරුවෙකුට අත දිගු කළා. "මට හරි දත් අරන් එනවා, දැන්ම ම!"

ලැබුණු අණ ඉටු කිරීමට අලුත් මුරකරුවා එතැනින් දිව්වා.

"මන්ද බුද්ධිකයෝ," ජෙනරල් කෙඳිරුවා.

"ඔන්න ඔය නිසා තමයි මම මනුෂ්‍යයින්ව පාවිච්චි කරන්නැත්තේ," ලූක් කිවුවා. "උන්ව විශ්වාස කරන්න බැහැ."

"උන්ගේ හිත් දුර්වලයි, ලේසියෙන් කුලියට ගන්ඩ පුළුවන්. ඒ වගේම දරුණුයි," ජෙනරල් කිවුවා. "මම නම් උන්ට ආසයි."

විනාඩියකට පසු, ලොකු උල් දත් පොකුරක් අතින් අරන් මුරකරුවා කඩිමුඩියේ කාමරයට ආවා.

"විශිෂ්ටයි," ජෙනරල් කිවුවා. සඳලුතලයේ ගරාදි වැට මතට නැගපු එයා අඩි විස්සක් පහළට පැන්නා.

Scanned with CamScanner

එයා පය ගැසූ තැන කිරිගරුඬ පොළොව ඉරි තැළුවා. කෙලින් වුණ එයා මූණ වේදනාවෙන් අකුලගෙන උරහිස් අතුල්ල ගත්තා. "මගේ බෙල්ලෙ උලුක්කුවට හෙණ ගහපි."

"තව හොට් පෑඩ් එකක් ගේන්න ද, සර්?" මුරකරුවෙක් ඇහුවා. "තව ටයිලෙනෝල් ටිකක්?"

"එපා! මේක ඇරිලා යයි." සිල්ක් ඇඳුම් කට්ටලයේ දූවිලි පිස දැමූ ජෙනරල් දත් ටික ඩැහැගත්තා. "මේක මම ම කරන්නම්."

එක දතක් ඔසවා බැලූ එයා හිනා වුණා. "ඩයිනොසෝර් දත්-හා! අර මෝඩ මිනිස්සු තමන් සත්තකේ මකර දත් තියෙනවා කියලවත් දන්නෑ. නිසං ම මකරෙකුගේ දතුත් නෙවෙයි. මේවා පෞරාණික සයිබරිස්ගේම දත්! මේවා නියමෙට වැඩ කරයි."

එයා ඒවා දොළහක් පස් තුළ පැළ කරා. ඉන්පසුව මල් බාල්දිය අහුලා ගත් එයා පස් මතට රතු දියර ඉහලා, කෑනය පැත්තකට දමා දත් දෙපසට විහිදුවා. "නැගිටිනු!"

පස් ගොඩ සැලුණා. පොළොවෙන් ඉහළට පැන නැගුණු එක් ඇටකෝටු අතක් වාතය ග්‍රහණය කරගන්න දඟලුවා.

ජෙනරල් සඳලුතලය දෙස බැලුවා. "ඉක්මනට, නුඹ ළඟ ඉව තියෙනව ද?"

"ඔව්, උතුමාණෙනි," සර්ප ගැහැනුන්ගෙන් එකෙක් කිවුවා. එයා දඩයක්කාරියන් පලඳින වර්ගයේ රිදී පාට රෙදි කර පටියක් පිටට ගත්තා.

"විශිෂ්ටයි," ජෙනරල් කිවුවා. "මගේ යුද හටයින්ට එක පාරක් ඉව වැටුණා ම, එයාලා ඒ ඉවේ අයිතිකාරයාට ගැලවිලා යන්ඩ නම් ඉඩක් දෙන්නෙ නැහැ. එයාලව නවත්වන්ඩ කිසිම දේකට- අර්ධ-ලෝහිතයෝ, දඩයක්කාරියෝ දන්න කිසිම ආයුධයකට බැහැ. එයාලා දඩයක්කාරියන්වයි උන්ගේ යාළුවන්වයි කීතු කීතු කරලා දායි. ඔක මෙතනට දානවා!"

එයා එහෙම කියද්දී ම ඇටසැකිලි පොළොව බිඳගෙන ඉහළට ආවා. ජෙනරල් පැළ කරපු එක දතකට එකා ගාණේ සෙබළු දොළොස් දෙනෙක් එතැන සිටියා. එයාලා ඔයා හොල්මන් චිත්‍රපටිවල දැකලා තියෙන ඇටකෝටුවන්ට කොහෙත්ම සමානකමක් නැහැ. එයාලගේ සම් මස් වැඩෙමින් මම බලා ඉඳිද්දීම මිනිස්සුන්ට හැරුණත් එයාලට



තිබුණේ අළු පාට හමක් සහ කහ පාට ඇස්. එයාලා අලුත් මෝස්තරයේ ඇඳුම්- අළු පාට අත්ගොබ කැපී පෙනෙන කමිස, කැමෝ කලිසම් සහ සටන්වලට පලඳින බූට්වලින් සැරසී සිටියා. ඔයා හොඳින් ළං වී නොබැලුවොත් එයාලා ඇත්තම මිනිස්සු කියලා ඔයාට හිතෙයි, ඒත් එයාලගේ විනිවිද පෙනෙන හමට යටින් ඇටකටු දිලිසුණේ හරියට එක්ස්-රේ රූප වගෙයි.

එයින් එකෙක් කෙලින්ම මගේ දිහා බලා සිටිද්දී කිසිම අදෘශ්‍යමාන කැප් එකකට උන්ව රවට්ටන්න බැරි වෙන බව මම දැනගත්තා.

සර්ප ගැහැනිය අතේ තිබුණු කර පටිය පහළට දැමුවා ම, ඒක සැලෙමින් ජෙනරල්ගේ අත දිහාවට පාවී ආවා. එයා ඒක යුද හටයෝ අතට දුන් සැණින් එයාලා ZEසෝයිව සහ අනෙක් අයව හොයාගෙන ගිහින් දඩයම් කරාවි.

මට හිතහිතා ඉන්න වෙලාවක් තිබුණේ නැහැ. වේගයෙන් දිව ගිය මම, මගේ උපරිම වෙර යොදා යුද හටයෝ දිහාවට පනින අතරේ කර පටිය ගුවනේදී ම ඩැහැ ගත්තා.

"මේ මොකද?" ජෙනරල් ගර්ජනා කළා.

මම ඇටසැකිලි යුද හටයෙකුගේ පාමුලට ඇද වැටෙද්දී එයා කටින් පිම්බා.

"අනවසරයෙන් ඇතුළු වුණ එකෙක්," ජෙනරල් ගෙරෙව්වා. "අන්ධකාරයේ හැංගිලා ඉන්න එකෙක්. දොරවල් වහපල්ලා!"

"ඒ පර්සි ජැක්සන්!" ලූක් මොර දුන්නා. "එයා වෙන්නම ඕනෑ."

මම පිටවීම දෙසට දුවන්න ගත්තා. ඒත් මට මොකක්දෝ ඉරෙන හඬක් ඇසෙද්දී ඇටසැකිලි සෙබළා මගේ කමිස අතෙන් පදාසයක් ඉරාගත් බව මට තේරුණා. ආපසු හැරී බැලූ මට දකින්න ලැබුණේ ඒ සෙබළා රෙදි කෑල්ල නහය ළඟට ගෙන ඉව කර බලා අනෙක් අය අතටත් ඒක දෙන හැටියි. මට බෙරිහන් දෙන්න ඕනෑ වුණත්, ඒකට ඉඩක් තිබුණේ නැහැ. මම වැහෙමින් තිබුණු දොරෙන් රිංගා එළියට පැන ගනිද්දී ම මට පිටුපසින් මුරකරුවෝ එය වසා දැමුවා.

ඊට පස්සේ මම පණ එපා කියලා දුවන්න පටන් ගත්තා.

Scanned with CamScanner

## 10

# මම රොකට් යාත්‍රා කීපයක් කඩා දැමුවා

මම ගොඩනැගිලි සංකීර්ණය හරහා පස්ස නොබලා දිවුවා. ගුවන් හා අභ්‍යවකාශ කෞතුකාගාරය තුළට කඩා වැදුණු මම එහි පිවිසුම් ශාලාව පසු කළාම අදෘශ්‍යමාන වන කැප් එක ගලවා දැමුවා.

කෞතුකාගාරයේ ප්‍රධාන කොටස වුණේ රොකට් සහ ගුවන් යානා සිවිලිමේ එල්ලූ විශාල ශාලාවක්. එය වටා මට්ටම් තුනක සඳලුතල සාදා තිබුණු නිසා නරඹන්නන්ට ප්‍රදර්ශන භාණ්ඩ විවිධ උස මට්ටම්වලින් දැක ගැනීමේ හැකියාව තිබුණා. එතැන සෙනඟකට සිටියේ පවුල් දෙක තුනක උදවියත්, නිවාඩු කාලයේ පාසල් චාරිකාවකට ඇවිත් වගේ පෙනුණු ළමයි කණ්ඩායමකුත් විතරයි. එතැනින් පිටවෙන්න කියලා ඒ හැමෝටම කෑගහන්න මට ඕනෑ වුණා. ඒත් මම එහෙම කළොත් එයාලා මාව පොලීසියට අල්ලා දෙයි කියලා මට හිතුණා. මම තාලියාව, ග්‍රෝවර්ව සහ දඩයක්කාරියන්ව හොයාගන්න ඕනෑ. ඕනෑම විනාඩියක, ඇටසැකිලි සෙබළු මේ කෞතුකාගාරය ආක්‍රමණය කරාවි, ඊට පස්සේ උන් කෞතුකාගාරයේ සිරි නරඹලා නතර වෙයි කියලා නම් මට හිතුනේ නැහැ.

දුවගෙන දුවගෙන ගිය මම තාලියාගේ ඇඟේ හැප්පුණා- ඒක වුණේ මෙහෙමයි: මම ඉහළම සඳලුතලයේ පඩිපෙළ දිගේ දුවගෙන යද්දී එයාගේ ඇඟේ හැප්පුණාම, එයාව ඇපලෝ අභ්‍යවකාශ කැප්සියුලයක් උඩට පෙරළුණා.



ග්‍රෝවර් පුදුමයෙන් මොර දුන්නා.

මම, මගේ සමබරතාවය නැවත ලබා ගන්නත් කලින් Zසෝයි සහ බියන්කා මගේ පපුවට ඊතල මැනුවා. එයාලගේ දුනු කොහෙන් මතු වුණා ද මන්දා. මම කවුද කියලා තේරුම් ගත්තට පස්සෙත් Zසෝයි දුන්න පහත දාන්න උනන්දු වුණේ නැහැ. "නුඹ! මෙහාටත් ආවේ මොන හයියකට ද?"

"පර්සී!" ග්‍රෝවර් කිවුවා. "දෙයියන්ට ස්තුති වේවා."

Zසෝයි රවා බැලුවා ම එයා රතු වුණා. "මං කියන්න ගියේ, ඇයි දෙයියනේ ඔයා මෙහාට ආවේ!"

"ලූක්," මම හුස්මක් ගන්න දඟලමින් කිවුවා. "එයා මෙහෙ."

එසැණින් ම තාලියාගේ ඇස්වල වූ කේන්තිය දිය වී ගියා. එයා, එයාගේ රිදී බ්‍රේස්ලටය මත අත තැබුවා. "කොහෙද?"

ස්වාභාවික ඉතිහාසය කෞතුකාගාරයේ සිටි තෝර්න්, ලූක් සහ ජෙනරල් ගැන මම එයාලට කිවුවා.

"ජෙනරල් මෙහෙට ඇවිත්?" Zසෝයි ඇසුවේ තෝන්තුවෙන් වගෙයි. "ඒක වෙන්න බැහැ! නුඹ කියන්නෙ බොරු."

"මං මොකටද බොරු කියන්නේ? බලන්න, අපිට ඒ හැටි වෙලාවක් නැහැ. ඇටකෝටු සෙබළු-"

"මොකක්?" තාලියා ප්‍රශ්න කළා. "කී දෙනෙක් ද?"

"දොළහක්," මම කිවුවා. "ඒ විතරක් නෙවෙයි. අර මිනිහා, ජෙනරල් කිවුවා ඔයාලගේ වැඩ වැඩි කරන්න මොකෙක්වදෝ මෙහෙට එවනවා කියලා. රාක්ෂයෙක්ව."

තාලියා සහ ග්‍රෝවර් අතරේ බැල්මක් හුවමාරු වුණා.

"අපි ආර්ටෙමිස්ගේ අඩි පාර දිගේ ආවේ," ග්‍රෝවර් කිවුවා. "ඒක ආවේ මෙහෙට කියලා මට සෑහෙන විශ්වාසයි. මොකෙක්හරි බලගතු රාක්ෂයෙකුගේ ඉවක්... මේ අබිරහස් රාක්ෂයා මොකාද කියලා හොයාගන්න එයා මෙතැන නවතින්න ඇති. ඒත් අපිට තවම නම් මුකුත් හොයාගන්න බැරි වුණා."

"Zසෝයි," බියන්කා කතා කළේ කලබලෙන්, "ඒ ජෙනරල් ම නම්-"

Scanned with CamScanner

"එහෙම වෙන්න බැහැ!" ෂෙසෝයි කඩා පැන්නා. "පර්සි දකින්න ඇත්තේ අයිරිස්-මැසේජ් එකක්, නැත්නම් වෙන මොකක්හරි මිරිඟුවක්."

"මිරිඟුවකට කිරිගරුඬ පොළොවක් කඩන්න බැහැ," මම එයාට කිවුවා.

ෂෙසෝයි ගැඹුරු හුස්මක් අරන් සන්සුන් වෙන්න උත්සාහ කළා. එයා මේක පෞද්ගලික කාරණයක් කරගෙන තියෙන්නේ ඇයි කියලවත්, ජෙනරල් කියන මිනිහව එයා දන්නෙ කොහොමද කියලවත් මට තේරුනේ නැහැ, ඒ වුණත් ඒ ගැන අහන්න මේ වෙලාව නෙවෙයි කියලා මට හිතුණා. "ඇටසැකිලි සෙබළු ගැන පර්සි කිවුවෙ ඇත්ත නම්," එයා කිවුවා. "අපිට වාද කරකර ඉන්න වෙලාවක් නැහැ. උන් තමයි නරකම, භයානකම එවුන්. අපි දැන්ම පිටත් වෙන්න ඕනෑ."

"හොඳ අදහසක්," මම කිවුවා.

"මම තට නෙවෙයි කිවුවෙ, කොල්ලෝ," ෂෙසෝයි කිවුවා. "තා මේ ගවේෂණයේ කොටස්කාරයෙක් නෙවෙයි."

"හේයි, මං දඟලන්නේ ඔයාලගේ ජීවිත බේරන්න!"

"ඔයාට නැවිත් ඉන්න තිබුණේ, පර්සි," තාලියා මූණ කළු කරගෙන කිවුවා. "ඒත් දැන් ඔයා ආව එකේ, අපි එක්ක යමු. අපි දැන් වෑන් එකට යමු."

"ඒක තිගේ තීරණයක් නෙවෙයි!" ෂෙසෝයි එයාගේ ඇඟට ගොඩ වුණා.

තාලියා එයාට රැවුවා. "ඔයා මෙතන ලොක්කා නෙවෙයි, ෂෙසෝයි. ඔයාට කොච්චර වයස වුණත් මට කමක් නෑ! ඔයා තවමත් ඔළුව ඉදිමිච්ච පොඩි කෙල්ලෙක් විතරයි!"

"කොල්ලො සම්බන්ධ වැඩවලදී නුඹට මොළේ කලදක්වත් නැහැ," ෂෙසෝයි තරහෙන් ගෙරෙව්වා. "එයාලව අත අරින්න නුඹට කවදාවත් බැහැ!"

තාලියා බලා සිටියේ ෂෙසෝයිගේ මූණ සමතලා කරන්න වගෙයි. ඒත් ඒ වෙලාවේ හැමදෙනාම ගල් ගැහුණා. මට ඇසුණු ගෙරවුම් හඬ කොයි තරම් ගැඹුරු ද කියනවා නම්, මං හිතුවේ රොකට් එන්ජිමක් පණ ගැන්විලා කියලයි.



අපිට පහළින් වැඩිහිටියෝ කිප දෙනෙක් බෙරිහන් දුන්නා. එක චූටි ළමයෙක් සතුටින් කෑගසන හඬ ඇසුණා: "කිටියෙක්!"

මොකෙක්දෝ අති විශාල සතෙක් බෑවුම දිගේ ඉහළට දිව ආවා. පිකප් ට්‍රක් රථයක් තරම් ලොකු එකාට රිදී නිය පහුරු සහ දිලිසෙන රන් ලොම් තිබුණා. මම මීට කලින් වතාවක් මේ සතාව දැක තිබුණා. අවුරුදු දෙකකට කලින්, කෝච්චියෙන් යන අතරමග දී මට මේ සතාගේ ඡායා මාත්‍රයක් දකින්න ලැබුණා. දැන්, වඩාත් ළඟට දකිද්දී ඌ ඊටත් වඩා ලොකුවටයි පෙනුණේ.

"නේමියන් සිංහයා," තාලියා කිවුවා. "හෙලවෙන්නැතුව ඉන්න."

සිංහයා කොයි තරම් සද්දෙට ගර්ජනා කළා ද කියනවා නම් මගේ කෙස් පවා ඉගිලුණා. ඌගේ උල් දත් පෙනුණේ මළ නොකන වානේවලින් හදලා වගෙයි.

"මම කියද්දී බෙදිලා යමු," ෂෙසෝයි කිවුවා. "ඌව කලබල කරලා තියාගන්න බලන්න."

"කවදා වෙනකල් ද?" ග්‍රෝවර් ඇසුවා.

"මම ඌව මරන්න ක්‍රමයක් හිතනකල්. යන්න!"

රිප්ටයිඩ්ගේ කොපුව ගැලවූ මම වම් පසට පෙරළුණා. ඊතල මාව පසු කරගෙන උරුවම් බාමින් ඇදී ගියා. ග්‍රෝවර්, එයාගේ බට නළා කුට්ටමෙන් තියුණු ට්වීට්-ට්වීට් හඬක් වාදනය කළා. හැරී බැලූ මට දකින්න ලැබුණේ ෂෙසෝයි සහ බියන්කා ඇපලෝ කැප්සියුලය උඩට නගින හැටියි. එයාලා එකක් පසුපස එකක් ඊතල විද්දත්, ඒ හැමෙකක්ම සිංහයාගේ ලෝහමය ලොම්වල වැදී කිසිම හානියක් නොකර කුඩු වී ගියා. කැප්සියුලයට ගැසූ සිංහයා එය පැත්තකට ඇල කරද්දී දඩයක්කාරියන්ව පසුපසට විසි වුණා. ඊට පස්සේ උමතු, භයානක නාදයක් වාදනය කරමින් සිටි ග්‍රෝවර් දෙසට ඌ හැරුණා, ඒත් තාලියා ඒගීස්ව ඉදිරියට දිගු කරගෙන සිංහයාගේ පාර හරස් කරද්දී ඌ පස්සට පැන්නා. "*ගර්ර්ර්!*"

"හයි-යාහ්!" තාලියා කෑගැසුවා. "පස්සට යනවා!"

සිංහයා ගොරවමින් හිස් අවකාශය පහුරු ගෑවත් ඌ පසුබැස්සේ හරියට පලිහෙන් ගිනි පිට වෙනවා වගෙයි.

Scanned with CamScanner

තාලියා ඌව පාලනය කරගත්තා කියලා එක තත්පරයකට මට හිතුණා. ඒත් ඊළඟ තත්පරයේ සිංහයා වකුටු වෙන ආකාරයත්, ඌගේ ගාත්වල පේශි තද වෙන ආකාරයත් මට දකින්න ලැබුණා. සිදුවීමට යන දේ තේරුම් ගන්න තරම් මම අපේ ගෙවල් කිට්ටුව පාරවල්වල ඉන්න පූසන්ගේ පොර කාගැනීම් දැකලා තිබුණා. සිංහයා කඩා පනින්න සූදානම් වෙන බව මට තේරුණා.

"හේයි!" මම මොර ගැහුවා. ඒ වෙලාවේ මගේ හිතේ වැඩ කළේ මොනවද කියන්න මම දන්නෙ නැහැ, ඒත් මම සතාට පහර දෙන්න පැන්නා. ඒ වෙලාවේ මට ඕනෑ වුණේ ඌව මගේ යාළුවන්ගෙන් ඉවත් කරන්න විතරයි. මම රිප්ටයිඩ්ගෙන් ඌගේ ඇළපතට හොඳ පහරක් එල්ල කළා. හරි නම් ඒ පහරින් ඌව පෙති ගැහෙන්න ඕනෑ. ඒත් මහ හඬක් නගමින් ඌගේ ලොම්වල වැදුණු තලයෙන් ගිනි පුපුරු විසි වුණා විතරයි.

සිංහයා ඌගේ නියවලින් මාව පහුරු ගාද්දී මගේ කබායේ පළුවක්ම ඉරී ගියා. මම රොඩ් වැට දිහාවට පසුබැස්සා. ඒත් එක්කම ඌ මගේ ඇඟට පැන්නා- රාත්තල් දාහක රාක්ෂයෙක් මගේ ඇඟට පනිද්දී මම වෙන මොනවා කරන්න ද? ආපසු හැරුණ මම රොඩ් වැට උඩින් පහළට පැන්නා.

පරණ පත්තයේ පිදි පාට ගුවන් යානයක් උඩට මම පය ගැහුවා. වේගයෙන් පැද්දුණු එය පැත්තකට ඇල වෙද්දී තව පොඩ්ඩෙන් මාව [illegible] පුහක් පහළ පොළොවට ඇද වැටෙනවා.

[illegible] මගේ ඔළුව ළඟින් ගියා. සිංහයාත් [illegible] උඩට පැන්නා. ඒත් එක්කම ගුවන් යානය [illegible] [illegible] යන්න ගත්තා.

සිංහයා [illegible] පහරක් දෙද්දී මම ඊළඟ ප්‍රදර්ශන භාණ්ඩය [illegible] අභ්‍යවකාශ යානයක් උඩට පැන්නා. [illegible] දකින්න ලැබුණා- ඌගේ [illegible] [illegible] මට පෙනුණා.

[illegible] මම හිතුවා. ඌගේ ලොම් නිසා [illegible] [illegible] ඌගේ කට ඇතුළට පහර දෙන්න මට [illegible] රාක්ෂයා [illegible]



වුණු එකයි. කැලිවලට පෙති ගැහෙන්නේ නැතිව ඌගේ නිය පහුරු සහ ගාත් අතරින් ඌට ළං වෙන්න මට පුළුවන්කමක් තිබුණේ නැහැ.

"ටෙසා්යි!" මම කෑගැහුවා. "කට ඉලක්ක කරන්න!"

රාක්ෂයා ඉදිරියට පැන්නා. ඌව පසුකර ඇදී ගිය ඊතලයට සතාව මුළුමනින්ම මග ඇරුණා. මම අභ්‍යවකාශ යානයේ සිට බිම තිබූ පෘථිවියේ යෝධ ආකෘතියක් උඩට පැන්නා. රුසියාව දිගේ පහළට රූටා ගිය මම ඉක්වදෝරයෙන් බිමට පැන්නා.

ගර්ජනාවක් කළ නේමියන් සිංහයා අභ්‍යවකාශ යානය උඩ වාරු වුණා, ඒත් ඌගේ බර දරාගන්න බැරුව එක් රුහැනක් බිඳුණා. ප්‍රදර්ශන භාණ්ඩය ඔරලෝසුවක බට්ටා වගේ පහළට එල්ලී පැද්දෙද්දී සිංහයා ලෝක ගෝලයේ උත්තර ධ්‍රැවය උඩට පැන්නා.

"ග්‍රෝවර්!" මම මොර දුන්නා. "මිනිස්සු අයින් කරන්න!"

ළමයි රංචු බෙරිහන් දෙමින් එහෙ මෙහෙ දුවමින් සිටියා. ග්‍රෝවර් එයාලව රාක්ෂයාගෙන් ඈතට ගෙනියන්න උත්සාහ කරන අතරේ අනෙක් රුහැනත් බිඳී අභ්‍යවකාශ යානය බිමට කඩා වැටුණා. තාලියා දෙවෙනි තට්ටුවේ ගරාදි වැට මතින් ලෝක ගෝලයේ මට විරුද්ධ පැත්තට පැන්නා. සිංහයා අපි දෙන්නා දිහාම සැලකිල්ලෙන් බැලුවේ මුලින්ම මරන්නේ කාවද කියලා හිතාගන්න බැරුව වගෙයි.

අපිට ඉහළින් දුනු මානාගෙන සිටි ටෙසා්යි සහ බියන්කා විදින්න හොඳ කෝණයක් හොයමින් වටේට කැරකුණා. "පැහැදිලි ඉලක්කයක් ගන්න බැහැ!" ටෙසා්යි මොර ගසා කිවුවා. "ඌගේ කට තව ටිකක් ඇරවන්න බලන්න."

ලෝක ගෝලය මුදුනේ සිටි සිංහයා දත් නියවා ගෙරෙව්වා.

මම වටේටම ඇස් යැවුවා. විකල්පයක්. මට ඕනෑ කළේ...

තෑගි කඩේ. පුංචි කාලේ අම්මා එක්ක මෙහෙට ආව ගමනේ නොපැහැදිලි මතකයක් මගේ හිතේ තිබුණා. එදා මම තෑගි කඩේ තිබුණු දෙයක් අම්මගෙන් ඉල්ල ගත්තා. ඊට පස්සේ ඒක ගත්තේ අපරාදේ කියලා මටම හිතුණා. තෑගි කඩේ තවමත් ඒවා විකුණනවා නම්...

"තාලියා," මම කතා කළා. "ඌට යන්න දෙන්නෙපා."

එයා මූණ කළු කරගෙන ඔළුව වැනුවා.

"හයි-යාහ්!" එයා දිගු කළ හෙල්ලයෙන් නිකුත් වූ නිල් පාට විදුලි ධාරාව සිංහයාගේ වලිගයේ වැදුණා.

"ගර්ර්ර්ර්!" ඒ පැත්තට හැරුණු සිංහයා කඩා පැන්නා. පැත්තකට පෙරළුණු තාලියා රාක්ෂයාට කිට්ටු වෙන්න නොදී පලිහ ඉදිරියට දිගු කරද්දී, මම තැගි කඩේ හොයාගෙන දිව්වා.

"මේක සිහිවටන ගන්න වෙලාවක් නෙවෙයි, කොල්ලෝ!" ෂෙසෝයි මොර දුන්නා.

කඩය තුළට කඩා වැදුණු මම ටී-ෂර්ට් රාක්ක පෙරළමින්, අඳුරේ-දිලිසෙන-ග්‍රහලෝක ගොඩගසා තිබුණු මේස උඩින් පැන්නා. වෙළඳ සේවිකාව මට කිසිම විරෝධයක් නොපෑවේ මුදල් යන්ත්‍රය පිටුපස සැඟවී ඉන්න එක එයාට ඊට වඩා වැදගත් වුණ නිසා වෙන්න ඇති.

අන්න! කෙළවරේ බිත්තියේ දිලිසෙන රිදී පාට පැකට්ටු රාක්ක ගණන් පුරවා තිබුණා. මට සොයාගන්න හැකි සෑම වර්ගයකම පැකට්ටුවලින් දෑත පුරවා ගත් මම කඩයෙන් එළියට දිව්වා.

ෂෙසෝයි සහ බියන්කා තවමත් රාක්ෂයා උඩට ඊතල වැසි වස්සවමින් සිටියත්, එයින් කිසිම වැඩක් වුණේ නැහැ. තමන්ගේ කට ඕනෑවට වඩා අරින්නේ නැතිව ඉන්න සිංහයා පරිස්සම් වෙනවා වගෙයි පෙනුණේ. ඌ නිය පහුරුවලින් පහර දෙමින් තාලියාව හපා කන්න පැන්නා. සිංහයා, ඌගේ ඇස් දෙක පවා පටු පැළුම් දෙකක් තරමට හීනි කරගෙනයි සිටියේ. රාක්ෂයාට හෙල්ලෙන් ඇන්න තාලියා ආපස්සට ගියා. සිංහයා එයා දිහාවට ගියා.

"පර්සි," එයා කතා කළා, "ඔයා කරන්න හදන දේ මොකක් වුණත්-"

ගර්ජනා කළ සිංහයා ගැසූ පහරට එයාව ටයිටන් රොකට්ටුවක් දෙසට උඩින් විසි වුණා. එයාගේ ඔළුව ලෝහයේ වදිද්දී එයාව පොළොවට ලිස්සා වැටුණා.

"හේයි!" මම සිංහයාට මොර දුන්නා. පහර දෙන්න බැරි තරම් ඈතක සිටි නිසා මම අවදානමක් ගත්තා: මම රිප්ටයිඩ් පිහියක් වගේ වේගයෙන් දමා ගැසුවා. ඒක සිංහයාගේ පැත්තක වැදී බිම වැටුණත්, රාක්ෂයාගේ අවධානය ගන්න එය ප්‍රමාණවත් වුණා. මගේ දිහාවට හැරුණ ඌ ගෙරෙව්වා.



ඌට උවමනා තරම් කිට්ටු වෙන්න තිබුනේ එකම විදිහයි. මම සිංහයා ඉදිරියට දිව්වා, සිංහයාත් මගේ ඉදිරියට දුවගෙන එද්දි මම අභ්‍යවකාශ කෑම පැකට්ටුවක්- සෙලෝපේන් දවටනයක එතූ, මුදවා වියළන ලද ස්ට්‍රෝබෙරි පුඩිං කුට්ටියක් ඌගේ කට ඇතුළට විසි කළා.

ඇස් ලොකු කරගත් සිංහයා කෙස් ගුළියක් ගිලපු පූසෙක් වගේ වමාරන්න ගත්තා. ඌට දොස් කියන්නත් බැහැ. පොඩි කාලේ අභ්‍යවකාශ කෑම කන්න උත්සාහ කරද්දි මටත් ඔය විදිහටම දැනුණ බව මට මතක තිබුණා. ඒ කෑම නම් තනිකරම ජරාවක්.

"ෂෙසෝයි, ලෑස්ති වෙන්න!" මම මොර දුන්නා.

මට පිටුපසින්, මිනිස්සු බෙරිහන් දෙන හඬ මට ඇසුණා. ග්‍රෝවර්, එයාගේ නළාවෙන් තවත් බිහිසුණු තාලයක් වයමින් සිටියා. මම සිංහයාගෙන් ඉවතට බඩගාගෙන ගියා. අභ්‍යවකාශ කෑම පැකට්ටුව අමාරුවෙන් ගිලගත් ඌ මට හෙළුවේ තනිකරම වෛරයෙන් පිරුණු බැල්මක්.

"කෑම වෙලාව!" මම මොර දුන්නා.

මට ගර්ජනා කරන්න ගිහින් ඌ කරගත්තේ ලොකු වැරැද්දක්, ඒ වෙලාවේ අයිස්ක්‍රීම් සැන්ඩ්විච් එකක් ඌගේ උගුරට දමන්න මට පුළුවන් වුණා. බේස්බෝල් ක්‍රීඩාවට ඒ හැටි කැමැත්තක් නොදැක්වූවත්, වාසනාවකට වගේ මට ඉලක්කයට විසි කරන්න හොඳ හැකියාවක් තිබුණා. සිංහයා වැමෑරීම නතර කරන්නත් කලින් මම තවත් රස දෙකක අයිස්ක්‍රීම් දෙකකුත්, මුදවා වියළූ ස්පැගටි රෑ කෑම පැකට්ටුවකුත් ඌගේ උගුරට දැමුවා.

සිංහයාගේ ඇස් එළියට පැන්නා. කට පළලට ඇරගෙන පස්සා ගාත්වලින් සිටගත් ඌ මගෙන් ඈතට යන්න දැඟලුවා.

"දැන්!" මම මොර දුන්නා.

එසැණින්ම පියඹා ආ ඊතල දෙකක්, හතරක්, හයක් වැදී සිංහයාගේ තල්ල හිල් වුණා. වියරුවෙන් ඒ මේ අත දැඟලූ සිංහයා ආපස්සට ඇද වැටී නිසල වුණා.

කෞතුකාගාරය පුරා අනතුරු ඇඟවීමේ නළා විලාප දුන්නා. මිනිස්සු පිටවීමේ දොරටුව ළඟ පොරකන්න ගත්තා. කුලප්පු වූ ආරක්ෂක නිලධාරියෝ සිදුවෙමින් පවතින දේ ගැන කිසිම අදහසක් නැතිව එහෙ මෙහෙ දුවමින් සිටියා.

තාලියා ළඟ දණගසාගත් ග්‍රෝවර් එයාට නැගිටින්න උදවු කළා. ටිකක් තෝන්තු වෙලා වගේ හිටියත් එයාට වෙන ආබාධයක් නැහැ වගෙයි. සඳලුතලයෙන් පහළට පැන්න ෆෙසා්යි සහ බියන්කා මගේ ළඟට ගොඩබෑවා.

ෆෙසා්යි පරිස්සමෙන් මගේ දිහා බැලුවා. "ඒක නම්... මරු උපාය."

"ඒයි, ඒක වැඩ කළා නේ."

එයා වාද කළේ නැහැ.

සමහර වෙලාවට මැරුණ රාක්ෂයින්ට වෙනවා වගේ සිංහයාත් දිය වී යන බව පෙනුණා. අන්තිමේට ඉතුරු වුණේ ඌගේ ලොම් වැස්ම විතරයි. ලොම් වැස්ම පවා සාමාන්‍ය සිංහයෙකුගේ හමක් තරමට ඇකිළෙනවා වගෙයි පෙනුණේ.

"ඒක ගන්න," ෆෙසා්යි මට කිවුවා.

මම එයා දිහා බලා සිටියා. "මොකක්ද, සිංහයාගේ හම ද? ඒක නිකං සත්ත්ව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් වගේ නෙවෙයි ද?"

"ඒක සටනකින් දිනාගත් දෙයක්," එයා මට කිවුවා. "ඒක තට අයිති දෙයක්."

"ඌව මැරුවෙ ඔයා නේ," මම කිවුවා.

යාන්තමින් හිනාවෙමින් එයා ඔළුව හෙල්ලුවා. "මං හිතන්නෙ ඒක කළේ තගේ අයිස්ක්‍රීම් සැන්ඩ්විච් එක. ඒක තමයි සාධාරණ, පර්සි ජැක්සන්. ඒ හම ගන්න."

මම ඒක අතට ගත්තා; ඒක හිතාගන්නත් බැරි තරම් සැහැල්ලු වුණා. එහි ලොම් මෘදු සහ සිනිඳු වුණා. ඒවාට කඩු තලයක් නවත්වන්න හැකියාවක් ඇති කියලා නම් මට කොහෙත්ම දැනුනේ නැහැ. මම බලා සිටියදිම සිංහ හම කබායකට හැරුණා- රන්-දුඹුරු පාට දිග කබායකට.

"මං කැමති මෝස්තරයක් නම් නෙවෙයි," මම මිමිණුවා.

"අපි මෙතැනින් යන්න ඕනෑ," ග්‍රෝවර් කිවුවා. "ගාඩ්ලා වැඩි වෙලාවක් අන්දබූත වෙලා ඉන්නෙ නැති වෙයි."



ආරක්ෂක නිලධාරියෝ අපිව අත්අඩංගුවට ගන්න දුවගෙන ආවේ නැති එක කොයි තරම් අමුතුයි ද කියලා මුල්ම වතාවට මට තේරුණා. එයාලා අපි දිහාවට ඇරෙන්න අනෙක් හැම දිහාවකටම කලබලෙන් දිවුවේ හරියට පිස්සුවෙන් වගේ යමක් හොයනවා වගෙයි. කීපදෙනෙක් දුවගෙන ගිහින් බිත්තිවලත්, අනෙක් අයගේ ඇඟේත් හැප්පුණා.

"ඔයා ද ඒක කළේ?" මම ග්‍රෝවර්ගෙන් ඇසුවා.

එයා ඔළුව වැනුවේ තරමක් අපහසුවට පත්වෙලා වගෙයි. "ඒක කලබැගෑනි ඇති කරන චූටි සිංදුවක්. මං බැරි මැනිලෝගේ සිංදුවක් ගැහුවා. ඒක හැම වෙලාවෙම වැඩ කරනවා. ඒත් ඒක තියෙන්නෙ තත්පර ගාණක් විතරයි."

"අපිට දැන් තියෙන ලොකුම ප්‍රශ්නේ ගාඩ්ලා නෙවෙයි," ෆෙසා්යි කිවුවා. "අර බලන්න."

තණ පිටිය හරහා ඇවිද එන මිනිස්සු කණ්ඩායමක් මට කෞතුකාගාරයේ වීදුරු බිත්තිය හරහා දකින්න ලැබුණා. අළු පාට හමුදා ඇඳුමෙන් සැරසුණු අළු පාට මිනිස්සු කණ්ඩායමක්. එයාලගේ ඇස් දැකගන්න බැරි තරම් දුරින් එයාලා සිටියත්, එයාලගේ බැල්ම කෙලින්ම යොමු වී තිබුණේ මගේ දිහාවට බව මට දැනුණා.

"යන්න," මම කිවුවා. "උන් එන්නෙ මාව දඩයම් කරන්න. මම උන්ව වෙන පැත්තකට හරවන්නම්."

"නෑ," ෆෙසා්යි කිවුවා. "අපි එකටම යමු."

මම එයා දිහා බැලුවේ පුදුමයෙන්. "ඒත්, ඔයා කිවුවේ-"

"දැන් නුඹත් මේ ගවේෂණයේ කොටස්කාරයෙක්," ෆෙසා්යි අමනාපයෙන් වගේ කිවුවා. "මං ඒකට කැමති නැහැ, ඒත් ඉරණම වෙනස් කරන්න බැහැ. ගවේෂණයේ පස්වෙනි සාමාජිකයා තමයි නුඹ. ඒ වගේම අපි කීයටවත් අපේ කෙනෙක් මග දාලා යන්නෙ නැහැ."

Scanned with CamScanner

# 11

# ග්‍රෝවර්ට ලැම්බොගිනියක් ලැබුණා

හෙලිකොප්ටරය දකින්න ලැබෙද්දී අපි සිටියේ පොටෝමැක් හරහා ගමන් කරමිනුයි. ඒක අපිට වෙස්ටෝවර් හෝල්වල දී දකින්න ලැබුණා වගේ ම කළු පාට හමුදා මාදිලියේ එකක්. ඒක කෙලින්ම ආවේ අපේ දිහාවටයි.

"එයාලා වෑන් එක දන්නවා," මම කිවුවා. "අපිට ඒක මග ඇරලා යන්න වෙනවා."

zසෝයි අධිවේගී පාරට වාහනය දැමුවා. හෙලිකොප්ටරය ටිකෙන් ටික කිට්ටු වුණා.

"සමහරවිට හමුදාවෙන් ඒකට වෙඩි තියලා බිම දායි," ග්‍රෝවර් බලාපොරොත්තු සහගතව කිවුවා.

"මට පේන්නෙ හමුදාවේ අය හිතයි ඒකත් එයාලගේ එකක් කියලා," මම කිවුවා. "කොහොම වුණත්, ජෙනරල්ට මිනිස්සුන්ව පාවිච්චි කරන්න පුළුවන් වුණේ කොහොමද?"

"කුලී හේවායෝ," zසෝයි රළු හඬින් කිවුවා. "සල්ලි ලැබෙනවා නම් ඕනම ජරා වැඩක් කරන්න කැමති මිනිස්සු ඉන්නවා."

"ඒත් එයාලා වැඩ කරන්නෙ කාට ද කියලා ඒ මිනිස්සුන්ට පේන්නැද්ද?" මම ඇසුවා. "එයාලා වටේටම ඉන්න රාක්ෂයින්ව එයාලට පේන්නැද්ද?"



zසෝයි ඔළුව හෙල්ලුවා. "මීදුම හරහා එයාලට කොච්චරක් පේනව ද කියන්න මං දන්නෑ. ඇත්ත දැනගත්තත් එයාලට ඒක ප්‍රශ්නයක් වෙයි ද කියලා මට නම් සැකයි. සමහර වෙලාවට මිනිස්සු රාක්ෂයින්ටත් වඩා භයානකයි."

මාර්ග තදබදය අතරින් අපි ගියාට වඩා සෑහෙන හොඳ වේගයකින් හෙලිකොප්ටරය නොනැවතී ආවා.

ඇස් පියාගත් තාලියා යාඥා කරන්න ගත්තා. "හේයි, තාත්තේ. දැන් අකුණු විදුලියක් එවන්න බැරි ද, කරුණාකරලා?"

ඒත් අහසේ හිමෙන් පිරුණු අළු පාට එලෙසම තිබුණා. ප්‍රයෝජනවත් විය හැකි අකුණු කුණාටුවක් අහලකවත් පෙනුනේ නැහැ.

"අතන!" බියන්කා කිවුවා. "අර වාහන ගාලට!"

"අපිව කොටු වෙයි," zසෝයි කිවුවා.

"මාව විශ්වාස කරන්නකෝ," බියන්කා කිවුවා.

zසෝයි වාහන පිරුණු වීදි දෙකක් හරහා දකුණු ගං ඉවුරේ තිබුණු සාප්පු සංකීර්ණයක රථ ගාලට වාහනය පදවාගෙන ගියා. එතැන දී වාහනය අත් හැර දැමූ අපි බියන්කා පසුපස ටික දුරක් ගියා.

"උමං දුම්රිය නැවතුම්පොළක්," බියන්කා කිවුවා. "අපි දකුණට යමු. ඇලෙක්සැන්ඩ්‍රියාවට."

"ඕනෑ එකක්," තාලියා එකඟ වුණා.

ප්‍රවේශපත් මිල දී ගත් අපි කවුරුහරි ලුහුබැඳගෙන එනවා ද දැනගන්න විටින් විට පස්ස හැරී බලමින් කරකැවෙන කඩුල්ල හරහා ඇතුළු වුණා. විනාඩි කීපයකට පස්සේ අපි වොෂින්ටන් ඩී.සී.වලින් දකුණු දෙසට දිවෙන දුම්රිය තුළ ආරක්ෂිතව සිටියා. අපේ දුම්රිය පොළොව මතුපිටට එද්දී රථ ගාලට ඉහළින් හෙලිකොප්ටරය තවමත් කැරකෙන හැටි අපිට දකින්න ලැබුණා. ඒ වුණත් ඒක අපි පසුපස ආවේ නැහැ.

ග්‍රෝවර් සුසුමක් පිට කළා. "නියම වැඩේ, බියන්කා. උමං කෝච්චිය ගැන හිතපු එක."

බියන්කා සතුටට පත් වුණා වගෙයි. "ඔව්, හොඳයි. ගිය ගිම්හානෙදි නිකෝයි මමයි යනකොට ඒක දැක්කා. ඇත්තටම ඒක දැකලා මම ගොඩාක් පුදුම වුණා මට මතකයි, මොකද අපි ඩී.සී.වල ජීවත් වුණ කාලේ ඒක මෙහෙ තිබුණේ නැහැ."

ග්‍රෝවර් නළල රැළි කරගත්තා. "අලුත් එකක්? ඒත් ඒ දුම්රියපොළ සෑහෙන පරණ පාටයි නේ."

"මටත් හිතෙනවා," බියන්කා කිව්වා. "ඒත් මාව විශ්වාස කරන්න, අපි පුංචි කාලේ මෙහෙ ඉන්නකොට උමං කෝච්චි තිබුණේ නැහැ."

තාලියා වාඩි වී සිටි තැනින් ඉදිරියට වුණා. "විනාඩියක් ඉන්න. උමං කෝච්චි පාරවල් එකක්වත් තිබුණේ නැහැ?"

දැන්, මම ඩී.සී. ගැන කිසි දෙයක් දන්නෙ නැහැ තමයි. ඒත් මෙහෙ උමං දුම්රිය පද්ධතිය අවුරුදු දොළහකට වඩා පරණ බව නම් මට පෙනුණා. මං හිතන්නේ අනෙක් අයත් ඒ දේම හිතමින් ඉන්න ඇති, මොකද එයාලත් හිටියේ පැටලිලා වගෙයි.

"බියන්කා," ෂෝයි කතා කළා. "කොච්චර කාලෙකට කලින් ද..." එයාගේ කතාව අතරමග නතර වුණා. හෙලිකොප්ටරයේ හඬ ආයෙමත් ළඟ ළඟම ඇහෙන්න ගත්තා.

"අපි කෝච්චි මාරු කරන්න ඕනෑ," මම කිව්වා. "ඊළඟ නැවතුම්පොළෙන්."

ඊළඟ පැය බාගය පුරාවට අපි හිතුවේ එතැනින් පැනගන්න ක්‍රමයක් ගැන විතරයි. අපි දෙවරක්ම දුම්රිය මාරු කළා. අපි කොහේ යනවා ද මට කිසිම අදහසක් තිබුණේ නැතත් සෑහෙන වෙලාවකට පස්සේ අපිට හෙලිකොප්ටරය මග අරින්න පුළුවන් වුණා.

අවාසනාවකට, අන්තිමේ දී අපි දුම්රියෙන් බහින්න තෝරගෙන තිබුණේ බඩු ගබඩා සහ දුම්රිය පාරවල් ඇර වෙන කිසිවක් නැති කර්මාන්ත කලාපයකුයි. එහි බලන බලන අත හිමෙන් වැසී තිබුණා. ඒ පළාත අනෙක් තැන්වලටත් වඩා සීතලයි වගෙයි. ඒ නිසාම මගේ අලුත් සිංහ ලොම් කබාය ගැන මම සතුටු වුණා.

අපි දුම්රිය අංගනයේ එහෙ මෙහෙ ඇවිද්දේ තවත් මගී දුම්රියක් තියේවි ද බලන්නයි. ඒත් එතැන තිබුණේ බඩු ප්‍රවාහනය



කරන ගැල් කෝච්චි ගොඩක් විතරයි. ඒවාගෙනුත් වැඩි කොටසක් හිමෙන් වැසී තිබුණේ හරියට ඒවා අවුරුදු ගාණකින් ඒ තැන්වලින් හෙලවිලාවත් නැහැ වගෙයි.

කසළ කෑනයක දැල්වූ ගිනි ගොඩක් ළඟ යාචක මනුස්සයෙක් හිටගෙන හිටියා. අපිව දැකලා දුක හිතිල ද කොහෙදෝ එයා දත් නැති ලොකු කටින් හිනාවෙලා අපිට කතා කළා, "ඔහේලට ගිනි තපින්ට ඕනැයි? මෙහෙට එන්ට!"

අපි එයාගේ ගිනි ගොඩ වටේ පොදි ගැසුණා. තාලියාගේ දත් ඇඳි කටකට ගාලා ගැහෙමින් තිබුණා. "ත්-හොඳයි, මේක ත්-නියමයි," එයා කිව්වා.

"මගේ කුර සීතලට ගල් වෙලා," ග්‍රෝවර් නාහෙන් ඇඬුවා.

"කකුල්," යාචක මනුස්සයා ගැන හිතලා මම එයාව නිවැරදි කළා.

"අපි කඳවුරට කතා කළා නම් හොඳයි," බියන්කා කිව්වා. "කයිරොන්-"

"නෑ," ෂෝයි බාධා කළා. "අපිට තවත් උදවු කරන්න එයාලට බැහැ. අපි තනියම මේ ගවේෂණය සම්පූර්ණ කරන්න ඕනෑ."

මම දුම්රිය අංගනය වටේට දුක්බර බැල්මක් හෙළුවා. බටහිර ඈත කොණේ කොහේහරි තැනක ඇනබෙත් අනතුරක වැටිලා. ආර්ටෙමිස්ව දම්වැල්වලින් හිර කරලා. ලෝකේ විනාශ කරන රාක්ෂයෙක් නිදහස් වෙන්නත් ළඟයි. ඒත් අපිට ඩී.සී.වල කෙළවරක හිර වෙලා, පාරේ ඉන්න මනුස්සයෙකුගේ ගිනි මැලයකින් ගිනි තපින්න වෙලා.

"ඔහේලා දන්නවැයි," යාචක මනුස්සයා කිව්වා, "ඔහේලට කවදාවත් යාළුවෝ නැත්තටම නැති වෙන්නෑ." එයාගේ මූණේ කුණු ගෑවිලා, රැවුල හැඩපළු ගෙතිලා තිබුණත් එයාට තිබුණේ කරුණාවන්ත බැල්මක්. "ඔය ළමයින්ට ඕනෑ බටහිරට යන්ට කෝච්චියක් ද?"

"ඔව්, සර්," මම කිව්වා. "එහෙම එකක් ගැන ඔයා දන්නව ද?"

එයා කුණු තැවරුණ අතක් දිගු කළා.

එයා පෙන්වූ දිසාව බැලූ මට එක පාරටම දකින්න ලැබුණේ හිමවලින් නොවැසුණු දිලිසෙන බඩු කෝච්චියක්. වානේ දැල්වලින්

Scanned with CamScanner

ආවරණය කළ මෝටර් රථ ප්‍රවාහනය කරන කෝච්චියක් වූ එය තුළ තට්ටු තුනක් පුරවා කාර් තිබුණා. බඩු පෙට්ටියේ පැත්තක නමක් ගසා තිබුණා: **සන් වෙස්ට් ලයින්**.

"ඒක නම්... ගැළපෙනවා," තාලියා කිවුවා. "ස්තූතියි, අහ්..."

එයා යාචක මනුස්සයා වෙතට හැරුණත්, ඒ මනුස්සයා යන්න ගිහින්. අපි ඉදිරියේ තිබූ කසළ කෑනය සීතල සහ හිස් වී තිබුණේ හරියට ඒ මනුස්සයා ගිනි දලු ටිකත් අරගෙන ගිහින් වගෙයි.

***

පැයකට පසුව අපි බටහිර බලා යමින් සිටියා. දැන් රියැදුරා කවුද කියන එක අපි කාටවත් ප්‍රශ්නයක් නොවුණේ, අපි හැමෝටම සුඛෝපභෝගී කාරය බැගින් තිබුණු නිසයි. ටෙසෝයි සහ බියන්කා උඩම තට්ටුවේ තිබුණු ලෙක්සස් කාරයක් තුළට පැන්නා. ග්‍රෝවර් ලැම්බොගිනියක වාඩි වී ධාවන තරගයක යෙදෙන රියැදුරෙකුගේ චරිතය රඟපාන්න ගත්තා. තාලියා කළු මර්සිඩීස් රථයක රේඩියෝවේ වයර් එකට අමුණා එය ක්‍රියාත්මක කළ නිසා අපිට ඩී.සී. සිට විකාශනය කළ ඕල්ඩ්-රොක් සංගීත නාලිකාවලට සවන් දෙන්න ලැබුණා.

"මාත් එන්න ද?" මම එයාගෙන් ඇසුවා.

එයා උරහිස් ඇකිළුවා, ඉතින් මම රියැදුරු අසුන ළඟ අනෙක් අසුනට ගොඩ වුණා.

රේඩියෝවේ වයිට් ස්ට්‍රයිප්ස්ලාගේ ගීතයක් වාදනය වෙමින් තිබුණා. මම ඒ සිංදුව දැනගෙන ඉන්න එකම හේතුව වුණේ මගේ ළඟ තිබුණු සී.ඩී එකතුවෙන් අම්මා කැමති එකම තැටිය එය වූ නිසයි. අම්මා ගැන හිතද්දී මට දුක හිතුණා, මොකද මෙදා නත්තලට මට ගෙදර යන්න ලැබෙන පාටක් තිබුණේ නැහැ නේ. එච්චර කල් මට ජීවත් වෙන්නවත් බැරි වෙයි වගේ.

"කබාය ලස්සනයි," තාලියා මට කිවුවා.

එයින් ලැබුණු උණුසුමට ස්තූතිවන්ත වෙමින් මම දුඹුරු පාට කබාය තවත් තදින් ඇඟ වටේ ඔතාගත්තා. "ඔව්. ඒත් අපි හොයාගෙන ආව රාක්ෂයා නේමියන් සිංහයා නෙවෙයි නේ."

"කොහෙත්ම නෑ. අපිට තව සෑහෙන දුර යන්න වෙනවා."



"මේ අබිරහස් රාක්ෂයා මොකා වුණත්, ඌ ඔයා ළඟට එනවා කියලා ජෙනරල් කිවුවා. එයාලට ඔයාව කණ්ඩායමෙන් ඈත් කරලා, තනි කරන්න ඕනෑ වුණා. එතකොට රාක්ෂයා ඔයා හොයාගෙන ආවම ඔයාට තනියම සටන් කරන්න වෙනවා නේ."

"එයා එහෙම කිවුව ද?"

"හොඳයි, ඒ වගේ කතාවක් කිවුවා."

"ඒක නියමයි. ඇමක් වෙන්න මං හරි ආසයි."

"මේ රාක්ෂයා මොකාද කියලා කිසිම අදහසක් නැද්ද?"

එයා මූසල විදිහට ඔළුව හෙල්ලුවා. "ඒත් අපි යන්නෙ කොහෙද කියලා ඔයා දන්නවා, නේද? සැන් ෆ්‍රැන්සිස්කෝ. ආර්ටෙමිසුත් යන්න ගියේ එහෙට."

නැටුම වේලාවේ දී ඇනබෙත් කියූ දෙයක් මගේ මතකයට ආවා: එයාගේ තාත්තා සැන් ෆ්‍රැන්සිස්කෝවලට යන්න සූදානම් වුණත් එයාට කොහෙත්ම එහෙට යන්න බැහැ කියලා එයා කිවුවා. අර්ධ-ලෝහිතයන්ට එහෙ ජීවත් වෙන්න බැරිලු.

"ඇයි?" මම ඇසුවා. "සැන් ෆ්‍රැන්සිස්කෝ ඔච්චරටම නරක ඇයි?"

"දොම්නසේ කන්ද ඒ කිට්ටුව තියෙන නිසා එහෙ මීදුම ගොඩාක් ගනයි. ටයිටන් මායාවල්- ඉතුරු වෙලා තියෙන ටික-තවමත් එහෙ තියෙනවා. ඒ පළාතට රාක්ෂයෝ ඇදිලා එන විදිහ ඔයාට විශ්වාස කරන්නත් බැරි වෙයි."

"මොකක්ද දොම්නසේ කන්ද?"

තාලියා ඇහිබැමක් එසෙව්වා. "ඇත්තටම ඔයා දන්නේ නැද්ද? අර මෝඩ ටෙසෝයිගෙන් අහලා බලන්න. එයා තමයි හොඳටම දන්නේ."

එයා ඉදිරි වීදුරුවෙන් පිටතට රවා ගත්තා. එයා කියමින් සිටි කතාවේ තේරුම අහන්න මට ඕනෑ වුණත්, මෝඩයෙක් වගේ කතා කරන්න මට ඕනෑ වුණේ නැහැ. තාලියා මට වඩා දන්නවා කියලා හිතද්දී දැනුණ හැඟීමට මම චුට්ටක්වත් කැමති වුණේ නැහැ. ඒ නිසා මම කට පියාගෙන හිටියා.

Scanned with CamScanner

සැඳෑ හිරු එළිය බඩු කෝච්චියේ දූල් ගැසූ බිත්තිය හරහා පෙරී ඇවිත් තාලියාගේ මුහුණ මත හෙවණැල්ලක් ඇති කළා. එයා ෆෙසෝයිට වඩා කොයි තරම් වෙනස් ද කියලා මම හිතුවා - ෆෙසෝයි හරිම චාරිත්‍රානුකූල සහ ගතානුගතික කුමාරිකාවක් වගෙයි, තාලියා කැරලිකාරියක් වගෙයි. ඒත් ඒ දෙන්නටම පොදු දේකුත් තිබුණා. ඒ එයාලගේ මුරණ්ඩුකම. මේ වෙලාවේ, මූණ අඳුරු කරගෙන හෙවණැලි අතරේ වාඩි වී සිටි තාලියාව පෙනුණෙත් දඩයක්කාරියක් වගෙයි.

ඒ වෙලාවේ හදිසියේම ඒක මගේ හිතට වැදුණා: "එහෙනම් ඒ නිසා තමයි ඔයා ෆෙසෝයිට කැමති නැත්තේ."

තාලියා රවා බැලුවා. "මොකක්ද?"

"දඩයක්කාරියෝ ඔයාවත් එයාලට බඳවගන්න හදන්න ඇති," මම අනුමාන කළා.

එයාගේ ඇස් අනතුරුදායක ලෙස දිප්තිමත් වුණා. එයා මට දෙකක් ඇනලා මර්සිඩීස් එකෙන් එළියට ඇදලා දායි කියලා මට හිතුණා, ඒත් එයා කළේ සුසුමක් පිට කළ එක විතරයි. "මමත් තව පොඩ්ඩෙන් එයාලට එකතු වෙනවා," එයා පිළිගත්තා. "වතාවක් ලූක්ටයි, ඇනබෙත්ටයි මටයි එයාලව මුණ ගැහුණා. එතකොට ෆෙසෝයි මාව නම්ම ගන්න දඟලුවා. තව පොඩ්ඩෙන් මාත් එයාගේ කීම අහනවා. ඒත්..."

"ඒත්?"

තාලියාගේ ඇඟිලි සුක්කානම වටා තදින් එතුණා. "එහෙම කරනවා නම් මට ලූක්ව අත අරින්න වුණා."

"ඔහ්."

"ෆෙසෝයි මමයි රණ්ඩු වුණා. එයා කිවුවා මම මෝඩ වෙනවා කියලා. මම, මගේ තේරීම ගැන පසුතැවෙයි කියලත් එයා කිවුවා. එයා කිවුවා කවදාහරි දවසක ලූක් මට රිද්දයි කියලා."

වානේ තිරය හරහා මම ඉර එළිය දිහා බලා සිටියා. අපි සෑම තත්පරයකම වේගය වැඩි කරමින් යනවා වගෙයි පෙනුණේ- පරණ චිත්‍රපටි ප්‍රක්ෂේපණ යන්ත්‍රයකින් වගේ හෙවණැලි ඇති වී නැති වුණා.

"ඒක නම් දරුණුයි," මම කිවුවා. "ෆෙසෝයි හරි කියලා පිළිගන්න එක අමාරු වැඩක්."



"එයා වැරදියි! ලූක් කවදාවත් මට රිද්දුවේ නැහැ. කවදාවත්ම නැහැ."

"අපිට එයත් එක්ක සටන් කරන්න සිද්ධ වෙයි," මම කිවුවා. "ඒක මග අරින්න ක්‍රමයක් නැහැ."

තාලියා උත්තර දුන්නේ නැහැ.

"ඔයා ළඟකදී එයාව දැකලා නැනේ," මම අනතුරු ඇඟෙව්වා. "මං දන්නවා ඒක විශ්වාස කරන්න අමාරුයි. ඒත්-"

"මට කරන්න සිද්ධ වෙන දේ මං කරනවා."

"ඒකෙ තේරුම එයාව මරන්න වෙන එක වුණත්?"

"මට උදවුවක් කරනව ද," එයා කිවුවා. "මගේ කාර් එකෙන් එළියට යන්න."

මට එයා ගැන කොයි තරම් දුක හිතුණ ද කියනවා නම්, මම එයත් එක්ක වාද කරන්න ගියේ නැහැ.

මම එතැනින් යද්දී එයා ආයෙමත් කතා කළා, "පර්සි."

මම ආපසු හැරී බලද්දී එයාගේ ඇස් රතුවෙලා තිබුණා, ඒත් ඒ තරහට ද දුකට ද කියලා මට හිතාගන්න බැරි වුණා. "ඇනබෙත්ටත් දඩයක්කාරියන්ට එකතු වෙන්න ඕනෑ වුණා. සමහරවිට ඒ ඇයි කියලා ඔයා හිතලා බැලුවොත් හොඳයි."

මම ඊට ප්‍රතිචාර දක්වන්න කලින් එයා පැති වීදුරුව වසා මාව කපා දැමුවා.

★★★

මම ග්‍රෝවර්ගේ ලැම්බොගිනියේ රියැදුරු අසුනේ වාඩි වුණා. ග්‍රෝවර් පිටුපස අසුනේ නින්දට වැටී සිටියා. එයා පොයිසන් අයිවි (විෂ අයිවි) සිංදුව වාදනය කරද්දී ඒ පැළයක් ලෙක්සස් කාරයේ වායු සමීකරණයෙන් මතු වුණාට පස්සේ එයා බට නළා සංගීතයෙන් ෆෙසෝයිගේ සහ බියන්කාගේ හිත් දිනාගන්න උත්සාහ කිරීම අත ඇර දමා තිබුණා.

බැස යන ඉර දිහා බලාගෙන මම ඇනබෙත් ගැන හිතුවා. මම නිදාගන්න බය වුණා. නින්දට වැටුනොත් හීන පෙනේවි කියලා මගේ හිත වද වුණා.

"ඔහ්, හීනවලට බය වෙන්නෙපා," මට එහා පැත්තෙන් කටහඬක් ඇසුණා.

මම හැරිලා බැලුවා. කොහොමහරි දුම්රිය අංගනයේ සිටි යාචක මනුස්සයා මගේ ළඟ අනෙක් අසුනේ වාඩිවෙලා ඉන්නවා දකිද්දී මට පුදුම හිතුනේ නැහැ. එයා හැඳ සිටි කලිසම කොයි තරම් පරණ වෙලා ද කියනවා නම් ඒකේ පාට සේදී සුදු පාටට හැරිලා තිබුණා. එයාගේ කබායේ තැනින් තැන ඉරිලා, පිරවුම් එළියට පැනලා තිබුණා. එයාට තිබුණේ ට්‍රක් රථයකට අහු වුණ ටෙඩී බෙයාර් කෙනෙකුගේ පෙනුමක්.

"හීන නොතිබුණා නම්," එයා කිවුවා, "අනාගතය ගැන මම දන්න දේවල්වලින් බාගයක්වත් මට දැනගන්න ලැබෙන්නෙ නැහැ. ඒවා ඔලිම්පස් ටැබ්ලොයිඩ් පත්තරවලටත් වඩා හොඳයි." උගුර පෑදුව එයා අතක් තාලෙට එසෙව්වා:

"ස්වප්නයන් පොඩ්කාස්ට් එකක් වගේ,

සත්‍යය මගේ සවනට ඩවුන්ලෝඩ් කරයි.

ඒවා මට මරු මරු දේවල් පවසයි."

"ඇපලෝ?" මම අනුමාන කළේ, ඒ තරම් කැත හයිකු කවි කියන්න වෙන කාටවත් බැරි නිසයි.

එයා තොල් මත ඇඟිල්ලක් තැබුවා. "මං වෙස් වළාගෙන ඉන්නේ. මට ෆ්‍රෙඩ් කියලා කතා කරන්න."

"ෆ්‍රෙඩ් කියලා දෙවි කෙනෙක්?"

"එහ්, මේකනේ... සියුස් අපිට සමහර නීති දාලා තියෙනවා. 'මනුෂ්‍ය ගවේෂණවලට අත තියන්න එපා' වගේ ඒවා. අඩු තරමේ මොකක්හරි ලොකු වරදක් වෙලා තිබුණත් එහෙමයි. ඒත් මගේ චූටි නංගිට කරදර කරන්න කාටවත් බැහැ. කාටවත්ම බැහැ."

"එහෙනම්, ඔයාට පුළුවන් ද අපිට උදවු කරන්න?"

"ෂ්... මම දැනටමත් කරලා තියෙන්නේ. ඔයා නිකමටවත් එළිය බැලුවෙ නැද්ද?"

"මේ කෝච්චිය! අපි කොච්චර වේගයෙන් ද යන්නේ?"

ඇපලෝ කෙකර ගෑවා. "උවමනා තරම් වේගයෙන්. අවාසනාවට, අපිට වැඩි වෙලාවක් නැහැ. දැනටමත් ඉර බහින්න



පටන්ගෙන. ඒත් මං හිතන විදිහට, ඔයාලව අඩු තරමේ ඇමරිකාව හරහා සෑහෙන දුරක් ගෙනියන්නවත් අපිට පුළුවන් වෙයි."

"ඒ වුණත් ආර්ටෙමිස් කොහෙද ඉන්නේ?"

එයාගේ මූණ අඳුරු වුණා. "මං ගොඩක් දේවල් දන්නවා, ඒ වගේම ගොඩක් දේවල් දකිනවා. ඒත් ඒක ගැන නම් මමවත් දන්නෙ නැහැ. එයාව... මගෙන් මුවා කරලා තියෙන්නේ. මං ඒකට චුට්ටක්වත් කැමති නැහැ."

"එතකොට ඇනබෙත්?"

එයා ඇහිබැම අකුළා බැලුවා. "ඔහ්, ඔය කියන්නේ අර නැතිවුණ කෙල්ල නේද? හ්ම්ම්. මං දන්නෙ නැහැ."

ඒ ගැන තරහා නොගෙන ඉන්න මම උත්සාහ කළා. දෙවිවරු මිනිස්සුන්ව- අඩු තරමේ අර්ධ-ලෝහිතයන්වවත් වැදගත් ලෙස සලකන්නේ නැති බව මම දැන සිටියා. මොකද එයාලත් එක්ක බලද්දී අපිට තියෙන්නේ හරිම කෙටි ජීවිත නේ.

"එතකොට, ආර්ටෙමිස් හොයාගෙන ගිය රාක්ෂයා?" මම ඇසුවා. "ඌ මොකාද කියලා ඔයා දන්නව ද?"

"නෑ," ඇපලෝ කිවුවා. "ඒත් ඌ ගැන දන්නවා ඇති කියලා හිතන්න පුළුවන් කෙනෙක් ඉන්නවා. ඔයාලා සැන් ෆ්‍රැන්සිස්කෝවලට ගියාමත් රාක්ෂයාව හොයාගන්න බැරි වුණොත් මුහුදේ මහල්ලා, නෙරෙයස්ව හොයාගන්න. එයාට දිග මතකයකුයි තියුණු ඇහැකුයි තියෙනවා. සමහර වෙලාවට මගේ ඔරැකල්ගෙන් හැංගිලා තියෙන දැනුම එයා ළඟ තියෙනවා."

"ඒත් ඔරැකල් ඔයාගෙ නේ," මම විරෝධය පෑවා. "ඉතින් අපිට අනාවැකියේ තේරුම කියන්න ඔයාට බැරි ද?"

ඇපලෝ සුසුමක් හෙළුවා. "ඔයා කරන්නේ චිත්‍ර ශිල්පියෙක්ට එයාගේ චිත්‍රය තේරුම් කරන්න, එහෙමත් නැත්නම් කවියෙකුට එයාගේ කවිය තේරුම් කරන්න කියනවා වගේ වැඩක්. ඒකෙන් අරමුණ විනාශ වෙනවා. තේරුම පැහැදිලි වෙන්නේ සෙවීම තුළින් විතරයි."

"තව විදිහකට කියනවා නම්, ඔයා දන්නෙ නැහැ."

ඇපලෝ, එයාගේ අත් ඔරලෝසුව පරීක්ෂා කළා. "අහ්, වෙලාව බලන්නකෝ! මට දුවන්න වෙනවා. ඔයාට ආයෙමත් උදවු

Scanned with CamScanner

කරන්න ලැබෙයි ද කියලා මට සැකයි, පර්සි, ඒත් මම කියපු දේ මතක තියාගන්න! ටිකක් නිදාගන්න! ඔයා ආපහු ආවම, ඔයාලගේ ගමන ගැන හොඳ හයිකු කවියක් අහන්න මං බලාගෙන ඉන්නවා!"

මට මහන්සි නැති බවත්, මගේ ජීවිතේටම මම හයිකු කවියක් හදලා නැති බවත් එයාට කියන්න මට ඕනෑ වුණා, ඒත් ඊට කලින් ඇපලෝ අසුරක් ගැසුවා. ඊට පස්සේ මගේ ඇස් ඉබේටම පියවුණා.

★★★

සිහිනයෙන් මම වෙන කවුදෝ කෙනෙක් වෙලා හිටියා. පරණ මෝස්තරයේ විකාර ග්‍රීක කබායක් හැඳ සිටි මම ලෙදර් ලේස් සෙරෙප්පු ජෝඩුවක් පැලඳගෙන සිටියා. නේමියන් සිංහයාගේ හම කබායක් වගේ කර වටේ ඔතාගෙන මම දුවමින් සිටියා. කවුදෝ ගෑනු ළමයෙක් මගේ අතින් ඇදගෙන දිවුවා.

"ඉක්මන් කරන්න!" එයා කිවුවා. එයාගේ මුහුණ පැහැදිලිව දකගන්න බැරි තරමට කළුවර වුණත්, එයාගේ හඬේ තිබුණු බය මට පැහැදිලිව ඇසුණා. "එයා අපිව හොයා ගනී!"

අපිට ඉහළින් රෑ අහසේ තරු මිලියන ගාණක් බබළමින් තිබුණා. අපි දුවමින් සිටි උස් තණ පඳුරු අතරින් මල් වර්ග දහස් ගාණක සුවඳ හමා ගියා. එය ලස්සන උද්‍යානයක් වුණත්, ගැහැනු ළමයා එය හරහා මාව ඇදගෙන දිවුවේ අපි මැරෙන්න ළඟයි වගෙයි.

"මම බය නැහැ," මම එයාට කියන්න උත්සාහ කළා.

"ඔයා බය වෙන්න ඕනෑ!" මාව ඇදගෙන යමින් එයා කිවුවා. එයාට පිට දිගේ පහළට ගොතා දැමූ දිග කළු කොණ්ඩයක් තිබුණා. එයාගේ සේද ලෝගුව තරු එළියට යාන්තමින් දිලිසුණා.

අපි කන්දේ ඉහළට දිවුවා. එයා කටු පඳුරක් පිටුපසට මාව ඇදලා ගත්තා. අපි දෙන්නම හති දමමින් බිම ඉඳගත්තා. ගෑනු ළමයා ඒ තරම් බයවෙලා ඉන්නෙ ඇයි කියලා මට හිතාගන්න බැරි වුණා. උයනට තිබුණේ සාමකාමී පෙනුමක්. ඒ වගේම මට ශක්තිමත් බවක් දැනුණා. මීට කලින් කවදාවත් මට ඒ තරම් ශක්තියක් දැනිලා නැහැ.

"දුවන්න උවමනාවක් නැහැ," මම එයාට කිවුවා. ඉස්සරට වඩා ගැඹුරු වී තිබුණු මගේ කටහඬට ආත්ම විශ්වාසයකුත් එකතු වී තිබුණා. "මම, මගේ අත් දෙකෙන් රාක්ෂයෝ දාස් ගාණක් පරද්දලා තියෙනවා."



"මේකාට එහෙම කරන්න බැහැ," ගෑනු ළමයා කිවුවා. "ලැඩොන් ගොඩාක් ශක්තිමත්. ඔයා වටෙන් කන්ද මුදුනට ගිහින් මගේ තාත්තා ළඟට යන්න. ඒක තමයි එකම පාර."

එයාගේ හඬේ වූ වේදනාව මාව පුදුම කළා. එයාගේ බලවත් සැලකිල්ලෙන් මට දැනුණේ එයා මං ගැන ගොඩාක් හිතනවා වගෙයි.

"මට ඔයාගේ තාත්තව විශ්වාස නැහැ," මම කිවුවා.

"එහෙම කරන්නත් එපා," ගෑනු ළමයා මගේ කතාවට එකඟ වුණා. "ඔයාට එයාව රවට්ටන්න වෙයි. ඒත් ඔයාට තෑග්ග කෙලින්ම ගන්න බැහැ. ඔයාට මැරෙන්න වෙයි!"

මම තනියම හිනා වුණා. "එහෙනම් ඇයි ඔයා මට උදවු කරන්නැත්තේ, ලස්සන කෙල්ලේ?"

"මට... මට බයයි. ලැඩොන් මාව නවත්තයි. මගේ සහෝදරියෝ, එයාලා දැනගත්තොත්... මාව පවුලෙන් අයින් කරයි."

"එහෙනම් කරන්න දෙයක් නෑ," නැගී සිටි මම දෑත් එකට ඇතිල්ලුවා.

"ඉන්න." ගෑනු ළමයා කිවුවා.

එයා තීරණයක් ගන්න බැරුව දුක් වෙනවා වගෙයි පෙනුණේ. ටිකකින් වෙවුලන අතක් එසවූ එයා කොණ්ඩයේ ගසාගෙන සිටි දිග සුදු පාට හාරිච්චියක් ගලවා ගත්තා. "ඔයාට සටන් කරන්න වුණොත්, මේක ගන්න. මේක මට දුන්නේ මගේ අම්මා, ප්ලියෝනී. එයා සමුදුරේ දියණියක්, ඒ නිසා සමුදුරේ බලය මේක ඇතුළේ තියෙනවා. මගේ අමරණීය බලය."

ගෑනු ළමයා කටුවට පිඹිද්දී යාන්තමින් දිලිසුණු එය ඔප දැමූ මුතුබෙලි කටුවක් වගේ තරු එළියෙන් දිස්නය දෙන්න ගත්තා.

"මේක ගන්න," එයා කිවුවා. "මේක ආයුධයක් කරගන්න."

මම හිනාවුණා."කොණ්ඩා කටුවකින්? මේකෙන් ලැඩොන්ව මරන්නෙ කොහොමද, ලස්සන කෙල්ලේ?"

"සමහරවිට බැරි වෙයි," එයා පිළිගත්තා. "ඒත් ඔයා මුරණ්ඩු වෙන්න හදනවා නම්, මට දෙන්න පුළුවන් මෙච්චරයි."

Scanned with CamScanner

ගෑනු ළමයාගේ හඬ මගේ හදවත මෙළෙක් කළා. මම කොණ්ඩා කටුව අතට ගත්තා, ඒත් එක්කම එය බරෙන් වැඩි වෙමින් දිගු වී මගේ අතේදීම හුරු පුරුදු ලෝකඩ කඩුවක් බවට පත් වුණා.

"හොඳට සමබර කරපු එකක්," මම කිවුවා. "ඒත් සාමාන්‍යයෙන් මම පාවිච්චි කරන්න කැමති මගේ අත් දෙක විතරයි. මේ තලේට මම මොකක්ද දාන නම?"

"ඇනාක්ලුස්මස්," ගෑනු ළමයා දුක්බරව කිවුවා. "කෙනෙක්ව පුදුම කරමින් හදිසියේ කඩා වදින රළ පහර. ඔයා හිතන්නත් කලින් ඒකෙන් ඔයාව මුහුදට ගසාගෙන යනවා."

මට එයාට ස්තුති කරන්න ඉඩක් ලැබෙන්න කලින්, තණකොළ පෑගෙන හඬකුත්, රෝදයක හුළං යනවා වගේ පිඹින හඬකුත් ඇහෙන්න ගත්තා. "පරක්කු වැඩියි! එයා මෙතැනට ඇවිල්ලා!" ගෑනු ළමයා කිවුවා.

★★★

මම වේගයෙන් කෙලින් වී ලැම්බොගිනියේ රියැදුරු අසුනේ වාඩි වුණා. ග්‍රෝවර් මගේ අත සොලවමින් සිටියා.

"පර්සි," එයා කතා කළා. "දැන් උදේ වෙලා. කෝච්චිය නතර වෙලා. එන්න යමු!"

මම නිදිමත පළවා හරින්න උත්සාහ කළා. තාලියා, ෆෙසෝයි සහ බියන්කා දැනටමත් වාහනේ තිර ඉහළට ඔසවා තිබුණා. පිටත පයින් ගස්වලින් පුල්ලි වැටුණු, හිමෙන් වැසුණු කඳු මුදුන් දෙකක් අතරින් රතු පාටින් ඉර පායා එමින් තිබුණා.

මගේ සාක්කුවෙන් පෑන පිටට ගත් මම ඒ දිහා පුදුමයෙන් බලා සිටියා. ඇනාක්ලුස්මස්, ඒ පෞරාණික ග්‍රීක භාෂාවෙන් රිප්ටයිඩ් - එහෙමත් නැත්නම් රළ ඉරන්නා හඳුන්වන නම. පෙනුම වෙනස් වුණත්, මට සිහිනයෙන් දකින්න ලැබුණේ මේ කඩුවම බව මට විශ්වාස වුණා.

ඒ වගේම මට තවත් දෙයක් ගැන විශ්වාස වුණා. මට දකින්න ලැබුණු සිහිනයේ සිටි ගෑනු ළමයා තමයි ෆෙසෝයි නයිට්ෂේඩ්.

# 12
# මම උෟරෙක් එක්ක හිමේ ලිස්සා ගියා

කඳු අතර ඉදි වූ හිමේ ලිස්සා යන ක්‍රීඩාව කරන්නන්ගේ පුංචි නගරයක් අසලට අපි ළඟා වුණා. 'ක්ලවුඩ්ෆෝර්ට්, නිව් මෙක්සිකෝ වෙත සාදරයෙන් පිළි ගනිමු!' එහි පුවරුවක් පෙන්නුම් කළා. එහි වාතය සීතල සහ තුනී වුණා. කැබින්වල වහල මතත්, පාරවල් දෙපසත් අපිරිසිදු හිම ගොඩ ගැසී තිබුණා. උදෑසන දීප්තිමත් වුණත්, දෙණිය පුරා උස්ව නැගී සිටි පයින් ගස්වලින් වැටුණු තද කළු හෙවණැල්ලෙන් පොළොව අඳුරු වුණා.

සිංහ ලොම් කබාය පැලඳගෙන සිටියත්, දුම්රිය මාර්ගයේ සිට ප්‍රධාන වීදිය දක්වා තිබූ සැතපුම් බාගයක විතර දුර යද්දී මාව සීතලට ගල් වුණා. ඇවිදගෙන යන අතරේ ම කලින් රෑයේ ඇපලෝ සමග සිදු වූ කතාබහ- එයා සැන් ෆ්‍රැන්සිස්කෝවල දී අපිට නෙරෙයස්ව හොයාගන්න කියූ බව මම ග්‍රෝවර්ට කිවුවා.

ග්‍රෝවර් තරමක් නොසන්සුන් වුණා වගෙයි පෙනුණේ. "ඒක හොඳයි, මං හිතන්නේ. ඒත් ඔක්කොටම කලින් අපි එහෙට යන්න එපැයි."

අපිට ඇති අවස්ථාවන් ගැන හිතලා අධෛර්යමත් නොවී ඉන්න මම උත්සාහ කළා. ග්‍රෝවර්ව බය ගන්වන්න මට ඕනෑ වුණේ නැහැ, ඒත් දේව මන්ත්‍රණ සභාව පවත්වන්න කලින් ආර්ටෙමිස්ව ගලවා ගන්නවා ඇරෙන්න තවත් ලොකු කර්තව්‍යයක් කරන්න අපිට ඇති කාලය ටිකෙන් ටික ගෙවී යන බව මම දැන සිටියා. ඇනබෙත්ව පණ

Scanned with CamScanner

පිටින් තියාගත්තේ දක්ෂිණායනය වෙන තුරු විතරයි කියලයි ජෙනරල් කිවුවේ. ඒ කියන්නේ සිකුරාදා, තව දවස් හතරයි. ඒ වගේම එයා බිලි පූජාවක් ගැනත් මොකක්දෝ කිවුවා. ඒ කතාව නම් කොහෙත්ම මගේ හිතට ඇල්ලුවේ නැහැ.

අපි නගරය මැද නැවතුණා. එතැන දී එහි තිබුණු සෑම දෙයක්ම වගේ දැකගන්න හැකි වුණාඃ ඉස්කෝලයක්, සංචාරක කඩවල් සහ ආපන ශාලා පොකුරක්, හිමේ ලිස්සන ක්‍රීඩාව කරන්න එන අය වෙනුවෙන් සෑදූ කැබින් කීපයක් සහ සිල්ලර බඩු කඩයක්.

"නියමයි," තාලියා වටපිට බලමින් කිවුවා. "බස් නෑ, කුලී වාහන නෑ, පිටවෙන්න කිසිම විදිහක් නෑ."

"අන්න කෝපි කඩයක්!" ග්‍රෝවර් කිවුවා.

"ඔව්," ෂෙසා්යි කිවුවා. "කෝපි හොඳයි."

"එතකොට පේස්ට්‍රිස්," ග්‍රෝවර් හීනෙන් වගේ කිවුවා. "තව ඉටි කොළත් ඇති."

තාලියා සුසුමක් හෙළුවා. "හරි. එහෙනම් ඔය දෙන්නා ගිහින් අපිටත් එක්ක කෑම අරන් එන්න. පර්සියි, මමයි බියන්කායි සිල්ලර බඩු කඩේ බලන්නම්. සමහරවිට එයාලා අපිට පාර කියලා දෙයි."

විනාඩි පහළොවකින් සිල්ලර බඩු කඩේ ළඟ දී ආපහු මුණ ගැහෙන්න අපි එකඟ වුණා. බියන්කා අපිත් එක්ක යන්න ටිකක් අදිමදි කළත්, අන්තිමේ දී එයත් ආවා.

කඩය ඇතුළේ දී අපිට ක්ලවුඩ්ෆෝර්ට් ගැන වටිනා තොරතුරු ටිකක්- ඒ කියන්නේ, හිම මත ලිස්සා යන්න උවමනා තරම් හිම වැටිලා නැති බව, කඩේ ඩොලරයකට එක ගාණේ රබර් මීයෝ විකුණන්න ඇති බව සහ අපිටම කාරයක් නැත්නම් මේ නගරයෙන් පිට වෙන්න පහසු ක්‍රමයක් නැති බව දැනගන්න ලැබුණා.

"ඔයාලාට ඇලමොගොර්ඩොවලින් ටැක්සියක් ගෙන්න ගන්න පුළුවන්," ලියන්නා අඩමානයෙන් වගේ කිවුවා. "ඒ ටවුම තියෙන්නෙ කන්ද පාමුල, හැබැයි ඒකත් එන්න පැයක්වත් යයි. ඒ වගේම ඩොලර් දෙතුන් සීයක් වියදම් වෙයි."

ලියන්නා ගොඩාක් පාළුවෙන් ඉන්නවා වගේ පෙනුණ නිසා මම එයාගෙන් රබර් මීයෙක් මිල දී ගත්තා. ඊට පස්සෙ අපි කඩයෙන් එළියට ඇවිත් දොර ළඟ සිටගත්තා.



"මරේ මරු," තාලියා ගෙරෙව්වා. "මම පාර දිගේ ගිහිල්ලා බලනවා අනිත් කඩවල්වල ඉන්න අය මොනවා කියයි ද කියලා."

"ඒත් අර මනුස්සයා කිවුවේ-"

"මං දන්නවා," එයා මට කිවුවා. "ඒ වුණාට කමක් නෑ මම ගිහින් බලනවා."

මම එයාට යන්න දුන්නා. හිත කලබල වුණාම දැනෙන නොසන්සුන්කම මම දැන සිටියා. අපිට උපතින්ම පිහිටන රණ බිමට හැඩ ගැහුණු ප්‍රතිරූපය නිසා අර්ධ-ලෝහිතයෝ හැමෝටම අවධානය අඩු වීමේ ගැටළුවට මූණ පාන්න වුණා. ඒ නිසා අපිට කවදාවත් යමක් සිදුවන තුරු බලාගෙන ඉන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. ඒ වගේම, කලින් රැයේ ලූක් ගැන අපි දෙන්නා අතරේ ඇති වූ කතාබහ නිසා තාලියා ඉන්නේ හිතේ අමාරුවෙන් කියලා මට හිතුණා.

බියන්කායි මමයි නුහුරට හිටගෙන හිටියා. මං අදහස් කළේ... ගෑනු ළමයි එක්ක කතා කරලා මට කොහෙත්ම හුරුවක් තිබුණේ නැහැ, ඒ වගේම මීට කලින් කවදාවත් මම බියන්කා එක්ක තනියම ඉඳලත් නැහැ. ඉතින් දැන් එයා දඩයක්කාරියෙකුත් වෙලා ඉන්න එකේ, එයත් එක්ක මොනවා කතා කරන්න ද කියලා මට හිතාගන්න බැරි වුණා.

"මීයා ෂෝක්," අන්තිමේ දී එයා කිවුවා.

මම ඒක ගරාදි වැට උඩින් තැබුවා. සමහරවිට කඩේට තව ගනුදෙනුකාරයෝ අද්දවා ගන්න ඒකට පුළුවන් වෙයි. "ඉතින්... දඩයක්කාරියක් වෙලා ඉන්න එක හිතට ඇල්ලුව ද?" මම ඇසුවා.

එයා තොල් තදින් පියවා ගත්තා. "මං එයාලට එකතු වුණාට ඔයා තාමත් තරහෙන් ද ඉන්නේ?".

"නෑත්. ඔයා සතුටින් ඉන්නවා නම්... ඒ ඇති."

"ආර්ටෙමිස් උත්තමාවිය නැතුව 'සතුටින් ඉන්නවා' කියන්න අමාරුයි. ඒත් දඩයක්කාරියක් වෙලා ඉන්න එක ඇත්තටම නියමයි. කොහොම වුණත් මට ඉස්සරට වඩා තැම්පත් ගතියක් දැනෙනවා. මගේ වටේ තියෙන හැම දෙයක්ම ඉස්සරට වඩා හෙමින් වෙනවා වගෙයි පේන්නේ. මං හිතන්නේ ඒක වෙන්නැති අමරණීයත්වය."

එයාගේ වෙනසක් හොයාගන්න උත්සාහ කරමින් මම එයා දිහා බලා සිටියා. එයා කලින් හිටියට වඩා සාමකාමීව, ආ

විශ්වාසයෙන් ඉන්න බව ඇත්තටම පෙනුණා. එයා තව දුරටත් කොළ පාට තොප්පියකින් මූණ මුවා කරගන්න දඟලුවේ නැහැ. කොණ්ඩය පිටුපසට කර ගැට ගසාගෙන සිටි එයා කතා කරද්දී මගේ ඇස් දිහා එක එල්ලේ බැලුවා. ඇඟ පුරා පැතිරුණු හිරිවැටීමක් සමග මට තේරුම් ගියේ තව අවුරුදු පන්සීයකට නැත්නම් දාහකට පසුවත් බියන්කා ඩි ආන්ජෙලෝ අද ඉන්න විදිහටම ඉඳීවි කියලයි. මම මැරුණ තැන්වල පැළ වුණ ගසුත් මැරුණට පස්සෙත් එයා මේ විදිහටම අවුරුදු දොළහක කෙල්ලෙකුගේ පෙනුම ඇතිව, තවත් අර්ධ-ලෝහිතයෙක් එක්ක කතා කරමින් ඉඳීවි.

"නිකෝට මං ගත්ත තීරණය තේරෙන්නෙ නැහැ," බියන්කා මිමිණුවා. ඒකට කමක් නෑ කියලා මං කියනවා අහන්න බලාපොරොත්තුවෙන් වගේ එයා මගේ දිහා බැලුවා.

"එයාට ප්‍රශ්නයක් නැති වෙයි," මම කිවුවා. "අර්ධ-ලෝහිත කඳවුරට පොඩි ළමයි ගොඩාක් එනවා. එයාලා ඇනබෙත්වත් එහෙම බලාගත්තා."

බියන්කා ඔළුව වැනුවා. "අපිට එයාව හොයාගන්න ලැබෙයි කියලා මං හිතනවා. මං කිවුවේ, ඇනබෙත්ව. ඔයා වගේ යාළුවෙක් ලබන්න එයා වාසනාවන්තයි."

"ඒ ගැන මොකට කියනවද."

"ඔයා, ඔයාටම දොස් කියාගන්නෙපා, පර්සි. ඔයා මාවයි, මගේ මල්ලිවයි බේරගන්න ඔයාගේ ජීවිතේ අවදානමේ දැම්මා. මං කියන්නේ, ඒක ඇත්තටම නිර්භීත වැඩක්. මට ඔයාව මුණ ගැහිලා තිබුණේ නැත්නම්, නිකෝව කඳවුරේ දාලා එන්න මට හිත හදාගන්න බැරි වෙන්න තිබුණා. එතැන ඉන්නේ ඔයා වගේ අය නම්, නිකෝට හොඳින් ඉන්න පුළුවන් වෙයි කියලා මට හිතුණා. ඇත්තටම ඔයා හොඳ කෙනෙක්."

එයාගේ ප්‍රශංසාවෙන් මම පුදුම වුණා. "කොඩිය අල්ලන තරගෙ දී මම ඔයාට ගහලා බිම දැම්මා වුණත්?"

එයා මහ හඬින් හිනාවුණා. "හරි. ඒක ඇරුණම, ඔයා හොඳ කෙනෙක්."

යාර දෙසීයක් විතර ඇතින් පේස්ට්‍රි පිරවූ මලු සහ බීම අරගෙන ග්‍රෝවර් සහ ㅤzසෝයි කෝපි කඩයෙන් පිටතට එනවා පෙනුණා.



එයාලා දැන්ම එන්නෙ නැත්නම් හොඳයි කියලා මට හිතුණා. හිතට අමුත්තක් දැනුණත්, මම බියන්කා එක්ක කතා කරන්න කැමති බව මට තේරුම් ගියා. එයා ඒ තරම් නරක නෑ. කොහොම වුණත්, එයා zසෝයි නයිට්ෂේඩ්ට වඩා නම් ගොඩාක් හිතවත් කෙනෙක්.

"එතකොට, ඔයාගෙයි නිකෝගෙයි කතාව මොකක්ද?" මම එයාගෙන් ඇසුවා. "වෙස්ටෝවර්වලට කලින් ඔයාලා ගියේ මොන ඉස්කෝලෙට ද?"

එයා ඇහිබැමි අකුළා ගත්තා. "මං හිතන්නේ ඒක ඩී.සී.වල තිබුණ බෝඩිම් ඉස්කෝලයක්. ඒක දැනෙන්නේ ගොඩාක් කාලෙකට කලින් වුණ දෙයක් වගෙයි."

"ඔයාලා කවදාවත් ඔයාලගේ අම්මා තාත්තා එක්ක ජීවත් වෙලා නැද්ද? මං කිවුවේ ඔයාගේ මනුෂ්‍ය අම්මා හරි තාත්තා හරි එක්ක?"

"අපිට කිවුවේ අපේ අම්මයි තාත්තයි මැරිලා කියලා. අපිට බැංකුවක අරමුදලක් තිබුණා. මං හිතන්නේ, ඒකේ සල්ලි ගොඩාක් තියෙන්න ඇති. අපි ගැන හොයලා බලන්න ඉඳලා හිටලා නීතිඥයෙක් ආවා. ඊට පස්සෙ නිකෝටයි මටයි ඒ ඉස්කෝලෙන් අස්වෙන්න සිද්ධ වුණා."

"ඒ ඇයි?"

එයාගේ ඇහිබැමි එකට ගැට ගැසුණා. "අපිට වෙන කොහෙටදෝ යන්න සිද්ධ වුණා. ඒක වැදගත් වැඩක් කියලා මට මතකයි. අපිට සෑහෙන දුරක් යන්න වුණා. ඊට පස්සේ අපි එක හෝටලේක සති කීපයක් නැවතිලා හිටියා. ඊට පස්සේ... අනේ මන්දා. එක දවසක් අපිව එක්ක යන්න වෙන නීතිඥයෙක් ආවා. අපිට පිට වෙන්න කාලේ හරි කියලා එයා කිවුවා. එයා ඩී.සී. හරහා නැගෙනහිරට අපිව අරගෙන ආවා. ඊට පස්සේ මයින්වලට එක්ක ආවා. ඊටත් පස්සෙ තමයි අපි වෙස්ටෝවර්වලට යන්න පටන් ගත්තේ."

ඒක නම් හරිම අමුතු කතාවක්. ඒත් ඇත්තටම, බියන්කා සහ නිකෝ කියන්නේ අර්ධ-ලෝහිතයෝ දෙන්නෙක් නේ. ඉතින් එයාලගේ ජීවිතේ කිසිම දෙයක් සාමාන්‍ය වෙන්නෙ කොහොමද?

"එතකොට ඔයාගේ ජීවිතේ වැඩි හරියක් ඔයා කළේ නිකෝව බලා ගත්ත එක ද?" මම ඇසුවා. "ඔය දෙන්නා විතරක් තනියම?"

Scanned with CamScanner

එයා ඔළුව වැනුවා. "ඒ හින්දා තමයි මට දඩයක්කාරියන්ට එකතු වෙන්න මේ තරම් තදින් ඕනෑ වුණේ. මං කියන්නේ, ඒක ආත්මාර්ථකාමී වැඩක් කියලා මං දන්නවා. ඒත මට, මගේම කියලා ජීවිතයකුයි යාළුවෝයි ඕනෑ වුණා. මං තිකෝට ආදරෙයි- මාව වැරදියට තේරුම් ගන්නෙපා- මට ඕනෑ කළේ පැය විසි හතර පුරාම අක්කා කෙනෙක් නොවී ඉන්න ජීවිතේ මොන වගේ ද කියලා දැනගන්න විතරයි."

පහුගිය ගිම්හානයේ දී, මට සයික්ලොප්ස් මල්ලි කෙනෙක් ඉන්න බව හොයාගන්න ලැබුණා ම දැනුණු හැඟීම ගැන මම කල්පනා කළා. බියන්කා කියමින් සිටි දේ තේරුම් ගන්න මට ඒ තරම් අපහසු වුණේ නැහැ.

"ෂෙසා්යි ඔයාව විශ්වාස කරනවා වගෙයි පේන්නේ," මම කිවුවා. "කොහොමහරි, ඔයාලා මොනවා ගැන ද කතා කරකර හිටියේ- මේ ගවේෂණයේ අනතුරුදායක දෙයක් ගැන?"

"කවදා ද?"

"ඊයේ උදේ කෑම ගන්න මණ්ඩපයෙ දී," මගේ කට වහගන්න කලින් මට කියවුණා. "ජෙනරල් ගැන මොකක්දෝ කිවුවේ?"

එයාගේ මූණ අඳුරු වුණා. "ඔයා කොහොමද... අර අද්‍යශ්‍යමාන කැප් එක. ඔයා අපේ කතාව හොරෙන් අහගෙන හිටියා නේද?"

"නෑ! මං කිවුවේ, ඇත්තටම නෙවෙයි. මං නිකං-"

බීම සහ පේස්ට්‍රිස් අරන් එතැනට ආව ෂෙසා්යි සහ ග්‍රෝවර් නිසා මම ගැලවුණා. එයාලා බියන්කාටයි මටයි උණු චොකලට්ුත්, එයාලට කෝපිත් ගෙනැත් තිබුණා. මට ලැබුණු බ්ලූබෙරි මෆින් එක කොයි තරම් රස ද කියනවා නම්, බියන්කාගේ රැවිලි එරවිලි මම ගණන් ගත්තෙවත් නැහැ.

"අපි පාර හොයන මන්තරේ කරලා බැලුවොත් හොඳයි," ෂෙසා්යි කිවුවා. "ග්‍රෝවර්, නුඹ ළඟ තව ඕක් ගෙඩි තියෙනව ද?"

"ම්ම්..." ග්‍රෝවර් කෙඳිරුවා. එයා හිටියේ පරළු මෆින් එකක් දවටනයත් එක්කම හපමින්නුයි. "මං හිතන්නේ ඇති. මට තව ඕනෑ-"

එක පාරටම එයා ගල් ගැහුණා.



මොකද වුණේ කියලා මම එයාගෙන් අහන්න හදනකොට ම ශීත ඍතුව මැද අතරමං වූ වසන්ත සමයේ සුළඟක් වගේ උණුසුම් සුළං රැල්ලක් අපිව පසු කර හමා ගියා. ඒ නැවුම් වාතය කැලෑ මල් සුවඳින් සහ ඉර එළියෙන් පදම් වී තිබුණා. ඒ වගේම තවත් දෙයක්- හරියට යමක් කියන්න උත්සාහ කරන, අනතුරු අඟවන්න උත්සාහ කරන කටහඬක් වගේ දෙයකුත් එහි දැවටී තිබුණා.

ෂෙසා්යි හීල්ලුවා. "ග්‍රෝවර්, තගේ කෝප්පය!"

ග්‍රෝවර් කුරුල්ලන්ගේ රූපවලින් සරසා තිබුණු එයාගේ කෝපි කෝප්පය අත හැරියා. ඒත් එක්කම කෝප්පයෙන් ගැලවුණු කුරුල්ලෝ එයින් ඉවතට පියඹා ගියා- චූටි පරෙවියෝ රැනක්. මගේ රබර් මීයා හීන් හඬින් කෑගැසුවා. ඌ ගරාදි වැට උඩින් ගස් අතරට බයෙන් පැනලා දිවුවා- ඇත්තම ලොම්, ඇත්තම රැවුල් ගස් එක්ක.

හිම මත දුම් දමමින් තිබුණු කෝපි කෝප්පය අසලට ග්‍රෝවර් ඇද වැටුණා. අපි එයාව වට කරගෙන ඇහැරවන්න උත්සාහ කළා. එයාගේ ඇහිපිය වේගයෙන් ගැහෙද්දී එයා කෙඳිරි ගෑවා.

"හේයි!" පාර දිගේ දිව එමින් තාලියා කතා කළා. "මම මේ... ග්‍රෝවර්ට මොකද වුණේ?"

"මං දන්නෑ," මම කිවුවා. "එයා ඇදගෙන වැටුණා."

"ඌ...හ්," ග්‍රෝවර් කෙඳිරි ගෑවා.

"හොඳයි, එයාව නැගිට්ටවන්න!" තාලියා කිවුවා. එක අතකට හෙල්ලය ගෙන සිටි එයා සැරින් සැරේ පස්ස හැරී බැලුවේ හරියට කවුරුහරි එයාව පන්නගෙන ඇවිත් වගෙයි. "අපි මෙහෙන් පිට වෙන්න ඕනෑ."

★★★

අපි නගර සීමාවට ළඟා වෙද්දී මුල්ම ඇටසැකිලි සෙබළු දෙන්නා මතු වුණා. පාර දෙපස ඇති ගස් අතරින් උන් දෙන්නා එළියට ආවා. අළු පාට හමුදා ඇඳුම් වෙනුවට උන් දැන් නිව් මෙක්සිකෝ ප්‍රාන්ත පොලිසියේ නිල් පාට නිල ඇඳුම් හැඳ සිටියා, ඒත් උන්ගේ විනිවිද පෙනෙන හම සහ කහ පාට ඇස් නම් වෙනස් වී තිබුණේ නැහැ.

උන් පිස්තෝල පිටට ඇදලා ගත්තා. ඇත්තම කියනවා නම්, මමත් පිස්තෝලෙකින් වෙඩි තියන්න ඉගෙන ගන්න ආසාවෙන්

Scanned with CamScanner

හිටියේ, ඒත් ඇටසැකිලි සෙබළු, උන්ගේ පිස්තෝල මට එල්ල කරනවා දැක්කාම ඒ ආසාව නැති වෙලා ගියා.

තාලියා, එයාගේ බ්‍රේස්ලටයට තට්ටු කළා. එයාගේ අතේ සර්පිලාකාරව කැරකෙමින් ඒගිස් පණ ගැසුවත්, සෙබළු ඒකට බයේ ඇකිළුනේ නැහැ. උන්ගේ දිලිසෙන කහ පාට ඇස් කෙලින්ම මාව විනිවිද ගියා.

මම රිප්ටයිඩ් ඇදලා ගත්තා, ඒත් තුවක්කුවලට විරුද්ධව ඒකෙන් ප්‍රයෝජනයක් තියේවි ද මට විශ්වාසයක් තිබුණේ නැහැ.

ටෙසා්යි සහ බියන්කා එයාලගේ දුනු මැනුවා, ඒත් කලන්තෙ හැදිලා ඇඟට වාරු වෙලා හිටපු ග්‍රෝවර් නිසා බියන්කාට ඒ වැඩේ අමාරු වුණා.

"පහු බහින්න," තාලියා කිවුවා.

අපි එහෙම කරන්න පටන් ගත්තා- ඒත් ඒ වෙලාවේ මට අතු රිකිළි හෙලවෙන හඬක් ඇසුණා. පාරේ අපිට පිටුපසින් තවත් ඇටසැකිලි සෙබළු දෙන්නෙක් මතු වුණා. දැන් අපිව වට කරලා.

අනෙක් ඇටකෝට්ටෝ කොහෙද හිතලා මම පුදුම වුණා. ස්මිත්සෝනියන් ආයතනයේ දී මට උන් දුසිමක් ම දකින්න ලැබුණා නේ. ඒ වේලාවේ එක සෙබළෙක් ජංගම දුරකථනයක් කට ළඟට අරන් කතා කරන්න ගත්තා.

ඒත් ඒකට කතා කරනවා කියන්න බැහැ. එයාගේ කටින් පිට වුණේ වියළි දත් ඇටකටුවක වදිනවා වගේ කටකට-ක්ලික් ක්ලික් හඬවල් ටිකක් විතරයි. ඉක්මනින්ම, සිදුවෙමින් පැවතුණ දේ මට තේරුම් ගියා. ඇටකෝට්ටෝ අපිව හොයාගෙන බෙදිලා ගිහින්. මේ සෙබළු දැන් උන්ගේ සහෝදරයින්ව කැඳවනවා. ඉක්මනින්ම උන් ඔක්කොම අපිව වට කරයි.

"ඒක ළඟයි," ග්‍රෝවර් කෙඳිරි ගෑවා.

"ඒක මෙතන," මම කිවුවා.

"නෑ," එයා තදින් කිවුවා. "තෑග්ග. වනාන්තරයෙන් ලැබුණ තෑග්ග."



එයා දොඩවමින් සිටි දේ මට නොතේරුණත්, එයා සිටි තත්ත්වය ගැන මම වද වුණා. කතා කරගන්නවත් බැරුව ඉන්න එයා කොහොම සටන් කරන්න ද.

"අපිට එකාට-එකා යන්න වෙනවා," තාලියා කිවුවා. "උන්ගේ හතරයි. අපේ හතරයි. එතකොට සමහරවිට උන් ග්‍රෝවර්ව ගණන් ගන්නැති වෙයි."

"එකඟයි," ටෙසා්යි කිවුවා.

"වනාන්තරේ!" ග්‍රෝවර් කෙඳිරි ගෑවා.

හමා ආ උණුසුම් සුළඟෙන් ගස් කොළන් සරසර ගෑවත්, මම ඇටකෝට්ටන්ගෙන් ඇස් ඉවතට ගත්තේ නැහැ. ඇනබෙත්ගේ ඉරණම ගැන ජෙනරල් උදම් ඇනූ හැටි මට සිහි වුණා. ලූක් එයාට ද්‍රෝහි වූ හැටි මට සිහි වුණා.

ඒත් එක්කම මම පහර දෙන්න පැන්නා.

පළවෙනි සෙබළා වෙඩි තැබුවා. ඒත් එක්කම කාලය මන්දගාමී වුණා. පිස්තෝලයෙන් නිකුත් වූ උණ්ඩය මම දැක්කා කියලා කියන්නෙ නැහැ, ඒ වුණත් එය ඇදී එන මග මට මුහුදේ දියවැල් ගමන් කරනවා දැනෙන විදිහටම දැනුණා. මම, මගේ කඩු තලයේ කෙළවරෙන් එය වෙනතකට හරවා නොනැවතී ඉදිරියට දිවුවා.

ඇටසැකිලි සෙබළා බැටන් පොල්ලක් ඇදලා ගනිද්දී මම එයාගේ අත් වැලමිට ළඟින් කපා දැමුවා. ඊට පස්සෙ එයාගේ ඉණ හරහා රිප්ටයිඩ්ගෙන් පහරක් ගැසූ මම කඳ දෙකට වෙන් කළා.

කඳෙන් මිදුණු ඇටකටු ගල් අතර පොළොව මතට හඬ නගමින් ඇද වැටුණා. එසැණින්ම නැවතත් සෙලවෙන්න පටන් ගත් ඒවා ඉබේටම එකලස් වෙන්න ගත්තා. දෙවෙනි සෙබළා දත් ඇදී එකට හප්පා සද්ද කරමින් මට වෙඩි තියන්න උත්සාහ කළත්, මම එයාගේ පිස්තෝලයට ගසා ඈතට විසි කළා.

මම සෑහෙන හොඳින් වැඩේ කරගෙන යනවා කියලා හිතුවත් ඒ පිටුපසින් සෙබළු දෙන්නෙක් මට වෙඩි තියන තුරු විතරයි.

"පර්සී!" තාලියා බෙරිහන් දුන්නා.

මම පාරේ මුණින් අතට ඇද වැටුණා. ඒත් ටිකකින් මට දෙයක් තේරුම් ගියා... මම මැරිලා නැහැ. උණ්ඩ ගැටීමෙන් ඇති වූ බලපෑම

මට දැනුණේ පිටුපසින් කවුරුහරි මාව තල්ලු කරා වගෙයි, ඒත් එයින් මට කිසිම තුවාලයක් වෙලා නැහැ.

නේමියන් සිංහ ලොම්! මගේ කබාය වෙඩි නොවදින එකක්!

තාලියා දෙවෙනි සෙබළාට පහර දුන්නා. ෂෙසා්යි සහ බියන්කා තුන් වෙනියාට සහ හතර වෙනියාට ඊතල විදින්න පටන් ගත්තා. ඒ අතරේ ග්‍රෝවර් පැත්තක හිටගෙන ගස් දිහාවට දෑත් දිගු කරගෙන බලන් හිටියේ එයාට ඒවා බදාගන්න ඕනෑ වෙලා වගෙයි.

අපිට වම් පස කැලය තුළින් බුල්ඩෝසරයක් එනවා වගේ පොඩි පට්ටම් වෙන හඬක් ඇසුණා. සමහරවිට ඇටකෝට්ටන්ට උදවු එනවා වෙන්න ඇති. දෙපයින් සිටගත් මම බැටන් පොලු පහරකින් බේරෙන්න පැත්තකට පැන්නා. මම දෙකට කැපූ ඇටකෝට්ටා දැනටමත් ප්‍රතිසංස්කරණය වෙලා, මගේ පස්සෙ එමින් සිටියා.

උන්ව නවත්වන්න කිසිම ක්‍රමයක් තිබුණේ නැහැ. ෂෙසා්යි සහ බියන්කා උන්ගේ ඔළු ඉලක්ක කර ඊතල විද්දත් ඒවා උන්ගේ හිස් ඔළු කටු තුළින් විනිවිද ගියා විතරයි. එකෙක් බියන්කාට පහර දෙන්න පැන්නා. එයා ඉවරයි කියලා මම හිතුවත් එසැණින්ම දඩයම් පිහිය ඇදගත් එයා සෙබළාගේ පපුව මැද්දට ඇන්නා. ඒත් එක්කම මුළු ඇටසැකිල්ලම ගිනි දලුවලින් වැසී ඇවිලී ගොස් පුංචි අළු ගොඩක් සහ පොලිස් නිල ලාංඡනයක් විතරක් ඉතුරු වුණා.

"නුඹ කොහොමද ඒක කළේ?" ෂෙසා්යි ඇසුවා.

"මං දන්නෑ," බියන්කා කලබල වෙලා කිවුවා. "වාසනාව ද?"

"හොඳයි, එහෙනම් ආයමත් ඒක කරන්න!"

බියන්කා නැවත උත්සාහ කළත්, ඉතිරිව සිටි ඇටසැකිලි තුන්දෙනා දැන් එයාගෙන් පරිස්සම් වෙන්න වග බලා ගත්තා. උන් බැටන් පොල්ලේ දුරින් ඉඳගෙන දිගින් දිගටම අපිව පස්සට තල්ලු කළා.

"සැලැස්මක් එහෙම තියෙනව ද?" පහු බහින අතරේ ම මම ඇසුවා.

කාගෙන්වත් උත්තරයක් ලැබුණේ නැහැ. ඇටසැකිලි සෙබළුන්ට පිටුපසින් ගස් හෙලවෙන්න ගත්තා. අතු රිකිළි බිඳෙන හඬකුත් ඇසුණා.



"තෑග්ගක්," ග්‍රෝවර් කෙඳිරුවා.

ඒත් එක්කම ප්‍රබල ගර්ජනාවක් කරමින් මගේ ජීවිතේට දකින්න ලැබුණු ලොකුම ඌරා පාරට පැන්නා. ඌ රෝස පාට, හොටු පෙරෙන හොම්බකුත් ඔරුවක් තරම් ලොකු දළ දෙකකුත් තිබුණු අඩි තිහක් උස වල් ඌරෙක්. ඌගේ පිට දුඹුරු පාට දළ ලොම්වලින් වැසී තිබුණා. ඌගේ ඇස්වල තිබුණේ කේන්තියෙන් වියරු වැටුණු පෙනුමක්.

"ඊ...වී!" මොර ගැසූ ඌරා ඇටසැකිලි තුන දළවලින් රේක්ක ගසා පැත්තකට දමද්දී, ඒ පහරේ බලයට ගස්වලටත් උඩින් විසි වී ගිය උන් තුන්දෙනා කන්දේ පැත්තක හැප්පිලා කුඩු පට්ටම් වුණා.

ඌරා අපේ පැත්තට හැරුණා.

තාලියා හෙල්ලය එසෙව්වත් ග්‍රෝවර් මොර දුන්නා, "ඌව මරන්නෙපා!"

අපිට පහර දෙන්න සූදානමෙන් ඌරා ගොරවමින් පොළොව පහුරු ගෑවා.

"ඒ එරයිමන්තියන් ඌරා," ෂෙසා්යි කිවුවේ කලබල නොවී ඉන්න උත්සාහ කරමින්. "අපිට ඌව මරන්න පුළුවන් වෙයි කියලා මං නම් හිතන්නෑ."

"ඒක තෑග්ගක්," ග්‍රෝවර් කිවුවා. "වනාන්තරයෙන් ලැබුණු ආශිර්වාදයක්!"

"ඊව්!" ගෑ ඌරා, ඌගේ දළ වැනුවා. ෂෙසා්යි සහ බියන්කා එයින් ඉවතට පැන්නා. අධිවේගී ඌරු ප්‍රවාහනයට අහුවෙලා ග්‍රෝවර්වත් කන්දට විසි නොවෙන්න මට එයාව පැත්තකට තල්ලු කරන්න සිද්ධ වුණා.

"ඔව්, ආශිර්වාදයක් ම තමයි!" මම කිවුවා. "බෙදිලා යමු!"

අපි එක එක පැතිවලට දිවුවා, මොහොතක් ගත වෙන තුරු ඌරා අන්දබූත වෙලා හිටියා.

"ඌට ඕනෑ අපිව මරන්න!" තාලියා කිවුවා.

"ඇත්තටම," ග්‍රෝවර් කිවුවා. "ඌ කුළු ගැන්නිලා ඉන්නේ!"

"එතකොට ඒක ආශිර්වාදයක් වෙන්නෙ කොහොමද?"

ඒක සාධාරණ ප්‍රශ්නයක් වගේ මට පෙනුණත්, එයින් අමනාප වූ ඌරා එයාට පහර දෙන්න පැන්නා. එයා මම හිතුවටත් වඩා

ගොඩාක් වේගවත් වුණා. ඌරාගේ කුරවලින් ඉවතට පෙරළුණු එයා සතාගේ පිටුපසින් නැගී සිටියා. ඒ අතරේ ඌරා දළවලින් පහර දී 'ක්ලවුඩ්ගෝර්ඩ් වෙත සාදරයෙන් පිළිගනිමු' පුවරුව කුඩු කර දැමුවා.

මේ වල් ඌරා ගැන පුරාණ කතාව මතක් කරගන්න උත්සාහ කරමින් මම, මගේ මොළය පහුරු ගෑවා. එක පාරක් හර්කියුලිස් මේ සතා එක්ක සටන් කළා කියලා මට සෑහෙන විශ්වාස වුණත්, එයා ඌව පැරදුවේ කොහොමද කියලා නම් මට මතක් කරගන්න බැරි වුණා. හර්කියුලිස් ඌව ආන්බාන් කරගන්න කලින් ඌ ග්‍රීක නගර කීපයක්ම විනාශ කළ බවත් මගේ මතකයේ යන්තමින් තිබුණා. ක්ලවුඩ්ගෝර්ඩ් යෝධ වල් ඌරු ප්‍රහාරවලට රක්ෂණාවරණයක් අරන් ඇති කියලා මම බලාපොරොත්තු වුණා.

"දිගටම යමු!" ෆෙසෝයි මොර දුන්නා. එයයි බියන්කායි විරුද්ධ පැතිවලට දිවුවා. ග්‍රෝවර්, එයාගේ බට නළා වාදනය කරමින් ඌරා වටේ නටද්දී ඌ ගොරවමින් එයාගේ බඩවැල් එළියට අදින්න දඟලුවා. ඒත් ලොකුම අවාසනාවන්තයාගේ තෑග්ග ලැබුණේ තාලියාටයි මටයි. ඌරා අපේ පැත්තට හැරෙද්දී තාලියා ආරක්ෂාවට ඒගීස් ඔසවා ලොකු වැරැද්දක් කරගත්තා. මෙඩූසාගේ ඔළුව දැකපු ඌරා කේන්තියෙන් වියරු වැටී කෑගැසුවා. සමහරවිට ඒක දැකලා ඌට, ඌගේ නෑයෙක්වත් මතක් වෙන්න ඇති. කොහොම වුණත්, වල් ඌරා අපිව එළවන්න ගත්තා.

අපිට ඌරාට වඩා වේගයෙන් දුවන්න පුළුවන් වුණේ අපි කන්දේ ඉහළට දිවූ නිසාත්, අපි ගස් අතරින් රිංගමින් දුවද්දී ඌට ඒවා පෙරළාගෙන එන්න සිදුවුණ නිසාත් විතරයි.

කන්දේ අනෙක් පැත්තේ බාගෙට හිමේ වැළලුණු පරණ රේල් පාරක් මම හොයාගත්තා.

"මේ පැත්තට," තාලියාගේ අතින් අල්ලාගත් මම රේල් පාර දිගේ දුවද්දී, දළ බෑවුම දිගේ ලිස්සා වැටිවැටී ඌරා අපිව ලුහුබැන්දා. දෙවියන්ට ස්තුති වෙන්න, ඌගේ කුර හැදිලා තිබුණෙ මේ වගේ ගමන්වලට නෙවෙයි.

අපිට ඉදිරියෙන් වසා දැමූ උමඟක් මට දකින්න ලැබුණා. ඊට එපිටින් දොරුවක් හරහා ඉදි කළ පරණ පලංචි පාලමක් තිබුණා. ඒක දැකපු මට පිස්සු අදහසක් පහළ වුණා.

"මගේ පස්සෙන් එන්න!"



තාලියාගේ වේගය අඩු වුණා. එයාට හේතුව අහන්න මට වෙලාවක් තිබුණේ නැහැ. ඒත් මම එයාගේ අතින් ඇදගෙන යද්දී අකමැත්තෙන් වුණත් එයා මගේ පසුපස ආවා. අපිට පිටුපසින් ටොන් දහයක් බර ඌරු යුද්ධ ටැංකියක් පසින් ගස් පෙරළමින්, කුරවලින් ගල් ගෙඩි කුඩු කරමින් අපිව පැන්නුවා.

තාලියායි මමයි උමඟ තුළින් දුව ගොස් අනෙක් පැත්තෙන් එළියට ආවා.

"නෑ!" තාලියා බෙරිහන් දුන්නා.

එයා අයිස් වගේ සුදු පාටට හැරිලා. අපි දැන් හිටියේ පාලම අද්දරටම ඇවිල්ලයි. අපිට පහළින් කන්ද අඩි හැත්තෑවක් විතර ගැඹුරු, හිමෙන් පිරුණු දොරුවකින් කෙළවර වුණා.

වල් ඌරා දැන් ළඟ ළඟම ආවා.

"ඉක්මන් කරන්න!" මම කිවුවා. "ඒකට අපේ බර දරාගන්න පුළුවන් වෙයි, මං හිතන්නේ."

"මට බැහැ!" තාලියා මොර දුන්නා. එයාගේ ඇස් බයෙන් වියරු වැටිලා.

වසා දමා තිබුණු උමඟ තුළට කඩා වැදුණු වල් ඌරා එය කඩා බිඳ දමමින් උපරිම වේගයෙන් දිව ආවා.

"දැන්!" මම තාලියාට මොර දුන්නා.

පහළ බැලූ එයා තදින් කෙළ ගිල්ලා. ඒ වෙලාවේ එයා කොළ පාටට හැරෙමින් හිටියා කියලා මට දිවුරන්න වුණත් පුළුවන්. ඒ ඇයි කියලා කල්පනා කරන්න කාලයක් මට තිබුණේ නැහැ. වල් ඌරා උමඟ හරහා කෙලින්ම අපේ දිහාවට දුව එමින් සිටියා. සැලසුම් අංක දෙකඃ මම තාලියාව බිමට පෙරළා, අපි දෙන්නවම පාලම කෙළවරින් කන්ද පහළට වැටෙන්න සැලැස්වූවා. අපි ඒගීස්ව හිමේ ලිස්සා යන පුවරුවක් වගේ පාවිච්චි කරමින් ගල් ගෙඩි, මඩ සහ හිම මතින් පහළට ලිස්සා ගියා. වල් ඌරා නම් එච්චර වාසනාවන්ත වුණේ නැහැ; ඌට දුවගෙන ආව වේගයට හැරෙන්න බැරි වුණා, ඉතින් ටොන් දහයක් බර රාක්ෂයා චූටි පලංචි පාලම උඩින් දුවගෙන යද්දි, ඌගේ බරට ඒක මැදින් නැමුනා. වල් ඌරා මර හඬ නගමින් හතර අතට හිම ඉහිරවාගෙන දොරුව පතුලේ හිම කණ්ඩියක් තුළට ඇද වැටුණා.

Scanned with CamScanner

තාලියායි මමයි ලිස්සා ගොස් නතර වුණා. අපි දෙන්නම හති දැමුවා. මගේ ඇඟේ කැපුම් තුවාලවලින් ලේ ගැලුවා. තාලියාගේ කොණ්ඩයේ පයින් කුරු ඇමිණී තිබුණා. අපිට එහා පැත්තේ වල් ඌරා මර හඬ දිදී දඟලමින් සිටියා. මට දකින්න ලැබුණේ උගේ දළ ලොම් වැසුණු පස්ස පැත්ත විතරයි. ඌගේ ඉතිරිය සම්පූර්ණයෙන්ම හිමේ යට වෙලා. ඌට තුවාල වී ඇති බවක් පෙනුනේ නැතත් ඌට එතැනින් හෙලවෙන්නවත් හැකියාවක් තිබුණෙත් නැහැ.

මම තාලියා දිහා බැලුවා. "ඔයා උස තැන්වලට බයයි නේ."

දැන් අපි පරිස්සමෙන් කඳු පාමුලට ළඟා වී සිටි නිසා එයාගේ ඇස්වලට ආයෙමත් සුපුරුදු තරහා ගිය බැල්ම ඇවිත් තිබුණා. "මෝඩ කතා කියන්නෙපා."

"එහෙනම් ඒ හින්දා තමයි ඔයා ඇපලෝ බස් එකේ දී අච්චර බය වුණේ. ඇයි ඔයා ඒ ගැන කිවුවෙ නැත්තේ?"

ගැඹුරු හුස්මක් ඇද ගත් එයා ඊට පස්සේ කොණ්ඩයේ රැඳුණු පයින් කොළ ගසා දැමුවා. "ඔයා මේ ගැන කාටහරි කියලා තිබුණොත්, අම්මපා මං-"

"නෑ, නෑ," මම කිවුවා. "අවුලක් නෑ. ඒක නිකං මේ... අහසට අධිපති සියුස්ගේ දුව උස තැන්වලට බයයි කිවුවම?"

මට දෙකක් ඇනලා, හිමට සමතලා කරන්න වගේ එයා බලා ඉඳිද්දී ග්‍රෝවර් කෑගහන හඬ ඇසුණා. "හෙලෝ...?"

"අපි පල්ලෙහා...!" මම කෑගැසුවා.

විනාඩි කීපයකට පසුව සෝයි, බියන්කා සහ ග්‍රෝවර් අපිට එකතු වුණා. අපි එතැන හිටගෙන වල් ඌරා හිමේ දඟලන හැටි බලා සිටියා.

"වනාන්තරයෙන් ලැබුණු ආශිර්වාදයක්," ග්‍රෝවර් කිවුවත්, දැන් එයා හිටියේ කැලඹිලා වගෙයි.

"මම එකඟයි," සෝයි කිවුවා. "අපි ඌව පාවිච්චි කරන්න ඕනෑ."

"ඔහොම ඉන්න," තාලියා නොරිස්සුමෙන් කිවුවා. එයා හිටියේ මේ දැන් නත්තල් ගහක් එක්ක සටන් කරලා පැරදිලා වගෙයි. "මේ



ඌරු තඩියා ආශිර්වාදයක් කියලා ඔයාලා ඔය තරම් විශ්වාස කරන්නේ මොකද?"

ග්‍රෝවර් වල්මත් වෙලා වගේ බැලුවා. "ඌ තමයි අපිව බටහිරට ගෙනියන්නේ. මේ වල් ඌරාට කොච්චර වේගයෙන් යන්න පුළුවන් ද කියලා ඔයාලා දන්නව ද?"

"ජොලි වැඩක් නේ," මං කිවුවා. "හරියට... ඌරු කව්බෝයිලා වගේ."

ග්‍රෝවර් ඔළුව වැනුවා. "අපි ඌගේ පිටට නගින්න ඕනෑ. මට... මට වටපිට බලන්න තව වෙලාව තිබුණා නම් හොඳයි. ඒත් ඒක දැන් නැති වෙලා."

"මොකක්ද නැති වුණේ?"

ග්‍රෝවර්ට මාව ඇහුනේ නැහැ වගෙයි. වල් ඌරා ළඟට ඇවිදගෙන ගිය එයා ඌගේ පිට උඩට නැග්ගා. ඌ දැනටමත් හිමෙන් තරමක් පිටට ඇවිත් හිටියා. ඌ එතැනින් සම්පූර්ණයෙන් ගැලවුණා ම නම් ආයේ ඌව නතර කරනවා බොරු. බට නළා කුට්ටම පිටට ගත් ග්‍රෝවර් එයින් කුලප්පු කරවන තාලයක් වයමින් ඌරා ඉදිරියට ඇපල් ගෙඩියක් විසි කළා. පාවී ගිය ඇපල් ගෙඩිය ඌගේ හොම්බේ වැදී විසි වුණා. ඌරා පිස්සුවෙන් වගේ ඒක අල්ලගන්න දැඟලුවා.

"ස්වයංක්‍රීය පණ ගැන්නුමක්," තාලියා මිමිණුවා. "මරු."

අමාරුවෙන් එතැනට ගිය එයා ග්‍රෝවර්ගේ පිටුපසට පැන්නා, එයින් පසුවත් ඉතිරි අපි හැමෝටම සෑහෙන ඉඩක් ඌරාගේ පිටේ තිබුණා. සෝයි සහ බියන්කා ඌරාගේ ඉදිරියට ගියා.

"තත්පරයක් ඉන්න," මම කිවුවා. "ග්‍රෝවර් කියවන්නෙ මොනවා ගැන ද කියලා ඔයාලා දන්නව ද- මේ වනාන්තරේ ආශිර්වාදය ගැන?"

"ඇත්ත වශයෙන්ම," සෝයි කිවුවා. "නුඹට ඒක හුළඟෙන් දැනුනේ නැද්ද? ඒක ගොඩාක් ප්‍රබලයි... ඒ බලය ආයෙමත් මට දැනෙයි කියලා මං කවදාවත් හිතුවෙ නැහැ."

"මොන බලය ද?"

මෙහෙමත් තකතීරුවෙක් කියලා හිතනවා වගේ එයා මගේ දිහා බලා සිටියා. "වනාන්තරේට අධිපතිගේ, ඇත්ත වශයෙන්ම. වල් ඌරා එනකොට, එක මොහොතකට මට පෑන් ඉන්න බව දැනුණා."

Scanned with CamScanner

# 13

# අපි දෙව්වරුන්ගේ කසළ ගොඩට ආවා

අපි ඉර බහින තුරුම ඌරාගේ පිටේ ගමන් කළා. ඊටත් වඩා නම් ඒ ගමන දරාගන්න මගේ පස්සට බැරි වෙන්න තිබුණා. යෝධ වාතේ මුරුසුවක් උඩ නැගලා මුළු දවස පුරාම බොරළු පාරක යන හැටි හිතේ මවා ගන්න. වල් ඌරාගේ පිටේ යන එකත් අන්න ඒ තරම් සැප පහසුයි.

අපි සැතපුම් කීයක් දුර ගියා ද, මට කිසිම අදහසක් තිබුණේ නැහැ. ඒත් ටිකෙන් ටික කඳුකරය ඈත නොපෙනී ගිහින්, වේලී ගිය තැනිතලා බිමකට අපි ඇතුළු වුණා. අපි කාන්තාරය හරහා පිම්මේ යද්දී තණ පඳුරු හා වන ලැහැබ් ටිකෙන් ටික අඩු වෙන්න ගත්තා.

රෑ බෝ වෙද්දී ඇළ ඉවුරක නැවතුණු වල් ඌරා මහ හඬින් නහයෙන් පිම්බා. මඩ වතුර බිවූ ඌ පොළොවෙන් පතොක් ගහක් උදුරාගෙන කටුත් එක්කම කන්න පටන් ගත්තා.

"එයාට යන්න පුළුවන් දුර මෙච්චරයි," ග්‍රෝවර් කිව්වා. "එයා කන අතරේ අපි බහින්න ඕනෑ."

කාටවත් ඒ ගැන පැහැදිලි කිරීමක් ඕනෑ වුණේ නැහැ. වල් ඌරා පතොක් ගස් උගුලුවා ගන්න මහන්සි වෙන අතරේ අපි ඌගේ පිටෙන් බැස්සා. ඊට පස්සේ අපි කරගැට මතු වූ කකුල්වලින් පුළුවන් තරම් ඈතට බකල ගහමින් ගියා.



තුන් වෙනි පතොක් ගහත් ගිල දමා, තවත් වරක් මඩ වතුර බිවූ ඌරා හඬ නගමින් රාම තෙල් පිට කර, ආපසු හැරී නැගෙනහිර දෙසට පිම්මේ දිව්වා.

"ඌ වැඩිපුර කැමති කඳුකරේට ද කොහෙදෝ," මම අනුමාන කළා.

"ඌට දොස් කියන්න බැහැ," තාලියා කිව්වා. "බලන්න."

අපිට ඉදිරියෙන් තිබුණේ වැලිවලින් බාගෙට වැසුණු මං තීරු දෙකක පාරක්. ඊට විරුද්ධ පැත්තේ තිබුණේ නගරයක් වෙන්න බැරි තරම් පුංචි ගොඩනැගිලි පොකුරක්: පුවරුවලින් ජනේල ආවරණය කළ ගෙයක්, ෆෙසෝයි තයිට්ෂේඩ් ඉපදෙන්නත් කලින් ඉඳලා මෙතැන තිබුණා වගේ පෙනුම ඇති කඩයක් සහ දොරට උඩින් 'ගිලා ක්ලොව්, ඇරිසෝනා' ලෙස සටහන් කළ නාම පුවරුවක් එල්ලූ සුදු පාට, කටු බදාම බිත්ති ඇති තැපැල් කන්තෝරුවක්. ඊට එපිටින් කඳු වැටි පේළියක් දකින්න ලැබුණා... ඒත් ඒවා සාමාන්‍ය කඳු වැටි නොවෙන බව ටිකකින් මට තේරුම් ගියා. මේ වගේ තැනිතලාවක ඒ වගේ කඳු පිහිටන්නේ නැහැ. ඒ කඳු සෑදී තිබුණේ පරණ කාර්, උපකරණ සහ අනෙකුත් ඉවත දමන ලෝහ ගොඩවල්වලිනුයි. ඒක තෙරක් නැති කසළ ගොඩක් වගෙයි පෙනුණේ.

"වාව්," මම කිව්වා.

"මෙතැනින් කාර් එකක් කුලියට ගන්න නම් බැරි වෙයි කියලා මගේ හිත කියනවා," තාලියා කිව්වා. එයා ග්‍රෝවර් දිහා බැලුවා. "ඔයාගේ සාක්කුවේ තව වල් ඌරෙක් එහෙම නැතුව ඇති නේ?"

ග්‍රෝවර් බයෙන් සැකෙන් හුළඟ ඉව කළා. ඕක් ගෙඩි කීපයක් එළියට ගත් එයා ඒවා වැලි උඩට දමා, බට නළා වාදනය කරන්න ගත්තා. ඒත් එක්කම ඒවා රටාවක් මවමින් ඉබේටම නැවත සකස් වුණා. ඒ රටාව මොකක්ද කියලා මට කොහෙත්ම හිතාගන්න බැරි වුණත් ග්‍රෝවර් ඕනෑකමින් ඒ දිහා බලා සිටියා.

"ඒ අපි," එයා කිව්වා. "අර අතන තියෙන ගෙඩි පහ."

"මම කොයි එක ද?" මම ඇසුවා.

"අර ඇද වෙලා තියෙන චූටි එක," ෆෙසෝයි යෝජනා කළා.

"ඔත්, කට වහගන්නවා."

Scanned with CamScanner

"මෙතැන තියෙන පොකුර," ග්‍රෝවර් වම් පැත්තට අත දිගු කරමින් කිව්වා. "ඒ කරදරයක්."

"රාක්ෂයෙක් ද?" තාලියා ඇසුවා.

ග්‍රෝවර් හිටියේ නොසන්සුන් වෙලා වගෙයි. "මට කිසිම ගඳක් දැනෙන්නෙ නැහැ නේ, ඒක තමයි හිතාගන්න බැරි. ඒත් ඕක් ගෙඩි බොරු කියන්නෙ නැහැ. අපේ ඊළඟ අභියෝගය..."

එයා කෙලින්ම කසළ කඳු දිහාවට අත දිගු කළා. ඉර එළිය සම්පූර්ණයෙන්ම වාගේ වියැකී ගොස් තිබුණු ඒ වෙලාවේ ලෝහ කඳු පෙනුණේ පිටසක්වල ලෝකයක දසුනක් වගෙයි.

★★★

කඳවුරක් සාදා රැය ගත කර, පසුදා උදේට කසළ ගොඩට බහින්න අපි තීරණය කළා. මේ කළුවරේ කුණුවල කිමිදෙන්න අපි කාටවත් ඕනෑ වුණේ නැහැ.

ෆෙසෝයි සහ බියන්කා, එයාලගේ ගමන් මලුවලින් නිදන මලු පහක් සහ මෙට්ට එළියට ගත්තා. එයාලා ඒක කළේ කොහොමද කියලා මට හිතාගන්න බැරි වුණේ එයාලගේ ගමන් මලු ගොඩාක් පුංචි නිසයි. ඒත් ඒ තරම් බඩු ගොඩක් රඳවා ගන්න ඒකට මායාවක් කරලා තියෙන්න ඇති. එයාලගේ දුනු සහ ඊතල කොපුවලටත් මායා බලයක් තියෙන බව මගේ සැලකිල්ලට හසු වී තිබුණා. ඇත්තටම මම ඒ ගැන වැඩිය නොහිතුවත්, දඩයක්කාරියන්ට ඕනෑ වෙලාවට ඒවා එයාලගේ කරේ මතු වුණා. ඒ වගේම ඒවා උවමනා නැති වෙලාවට ඉබේටම අතුරුදහන් වුණා.

රාත්‍රිය ඉක්මනින්ම සීතල වෙන්න ගත්තා, ඉතින් ග්‍රෝවරුයි මමයි දිරාපත් වුණ ගෙදරින් පරණ ලෑලි එකතු කරගෙන ආවා. තාලියා ඒවාට විදුලි පහරක් ගසා ගිනි මැලයක් දැල්වූවා. නොබෝ වේලාවකින් ම අපි කොහේටවත් නැති හොල්මන් නගරයක් මැද ඉන්න පුළුවන් තරම් සුව පහසුවට හිටියා.

"තරු පායලා," ෆෙසෝයි කිව්වා.

එයා කිව්වා හරි. රෑ අහස තැඹිලි පාටට හරවන නගරවල විදුලි එළි නැති මේ පළාතට ඉහළින් තරු මිලියන ගණනක් පායා දිලිසුණා.

"පුදුම ලස්සනක්," බියන්කා කිව්වා. "මම කවදාවත් ඇත්තටම ක්ෂීර පථය දැකලා තිබුණේ නැහැ."



"මේක ඒ හැටි දෙයක් නෙවෙයි," ෆෙසෝයි කිව්වා. "ඉස්සර කාලේ මීටත් වඩා තිබුණා. මිනිස්සුන්ගේ ආලෝක දූෂණය නිසා දැන් මුළු තරු රටා පිටින් ම අතුරුදහන් වෙලා."

"ඔයා කතා කරන්නේ හරියට ඔයා මනුස්සයෙක් නෙවෙයි වගේ නේ," මම කිව්වා.

ෆෙසෝයි ඇහි බැමක් එසෙව්වා. "මම දඩයක්කාරියක්. ලෝකයේ වනගත තැන්වලට සිද්ධ වෙන දේ ගැන මං දුක් වෙනවා. තා ගැනත් ඒ කතාවම කියන්න පුළුවන් ද?"

"ඔයා ගැනත්," තාලියා නිවැරදි කළා. "තා නෙවෙයි."

"ඒත් 'ඔයා' කියලා පාවිච්චි කරන්නේ වාක්‍යයක් පටන් ගන්න නේ."

"ඒ වගේම ඉවර කරද්දිත්," තාලියා කිව්වා. "තා, තෝ නෙවෙයි ඔයා කියන්න."

ෆෙසෝයි කේන්තියෙන් අත් දෙපසට විසි කළා. "මේ භාෂාව මට ජේන්න බැහැ. ඒක හරිම ඉක්මනට වෙනස් වෙනවා!"

ග්‍රෝවර් සුසුමක් හෙළුවා. එයා තවමත් තරු දිහා බලා සිටියේ හරියට ආලෝක දූෂණ ප්‍රශ්නය ගැන කල්පනා කරනවා වගෙයි. ''පෑන් හිටියා නම්, මේ හැම දෙයක් ම ආපහු හරි ගස්සයි."

ෆෙසෝයි දුක්බරව ඔළුව වැනුවා.

"සමහරවිට ඒක කෝපි නිසා වෙන්න ඇත්තේ," ග්‍රෝවර් කිව්වා. "මම කෝපි බිබී ඉන්නකොට තමයි හුළඟ ආවේ. සමහරවිට මම තව කෝපි බිව්වා නම්..."

ක්ලවුඩ්ෆෝර්ට්වල දී සිදු වූ දේට කෝපිවල සම්බන්ධයක් නැහැ කියලා මට හොඳටම විශ්වාස වුණා, ඒත් ඒක ග්‍රෝවර්ට කියන්න මට හිත දුන්නෙ නැහැ. හුළඟ හමා එද්දී හදිසියේ ම පණ ලැබුණු රබර් මීයා සහ චූටි කුරුල්ලෝ ගැන මම කල්පනා කළා. ''ග්‍රෝවර්, ඒ පෑන්මයි කියලා ඔයා ඇත්තටම හිතනව ද? මං කියන්නේ, ඔයා කැමති එහෙම වෙනවට කියලා මං දන්නවා."

"එයා අපිට උදවු එව්වා," එයා තදින් කිව්වා. "ඒ කොහොමද කියලවත්, මොකටද කියලවත් මම දන්නෙ නැහැ. ඒත් ඒ එයා තමයි. මේ ගවේෂණය ඉවර වුණාම, මම ආපහු නිව් මෙක්සිකෝවලට ගිහිල්ලා

Scanned with CamScanner

කෝපි ගොඩාක් බොනවා. අවුරුදු දෙදාහකින් අපිට ලැබුණු හොඳම මග පෙන්වීම තමයි ඒක. මම කිට්ටුවටම ගියා."

ග්‍රෝවර්ගේ බලාපොරොත්තු විනාශ කරන්න අකමැති නිසා මම ඒකට උත්තර දුන්නෙ නැහැ.

"මට දැනගන්න ඕනෑ," තාලියා බියන්කා දිහා බලමින් කිවුවා, " ඔයා කොහොමද පිල්ලියක් විනාශ කළේ කියලා. ඒ වගේ තව ගොඩක් මේ අහළ පහළම ඉන්නවා. උන් එක්ක සටන් කරන්නෙ කොහොමද කියලා අපි හොයා ගන්න ඕනෑ."

බියන්කා ඔළුව හෙල්ලුවා. "මං දන්නෑ. මම ඒකාගෙ පපුවට ඇන්න ගමන් ඌව ගිනි ගත්තා."

"සමහරවිට ඔයාගේ පිහියේ මොකක්හරි විශේෂත්වයක් ඇති," මම කිවුවා.

"ඒක මගේ එක වගේමයි," ෘෙසෝයි කිවුවා. "දිව්‍යමය ලෝකඩ. ඒත් මගේ එකෙන් සෙබළුන්ට ඒ වගේ බලපෑමක් වුණේ නැහැ."

"සමහරවිට ඇටකෝට්ටන්ගේ එක විශේෂ තැනකට අනින්න ඕනෑ ඇති," මම කිවුවා.

හැම දෙනාගේම අවධානය එයා වෙතට යොමු වී තිබුණු නිසා ද කොහෙදෝ බියන්කා සිටියේ අපහසුවෙන් වගෙයි.

"ඒකෙන් කමක් නෑ," ෘෙසෝයි එයාට කිවුවා. "අපි උත්තරේ හොයාගමුකෝ. ඒ අතරවාරේ, අපි ඊළඟට කරන දේ සැලසුම් කරන්න ඕනෑ. මේ කහළ ගොඩෙන් එහා පැත්තට ගියාම අපි දිගටම බටහිරට යන්න ඕනෑ. පාරක් හොයා ගන්න පුළුවන් වුණොත්, අපිට ළඟම තියෙන නගරයට යන්න පුළුවන් වෙයි. මං හිතන්නෙ ඒ ලාස් වේගාස් වෙන්න ඇති."

ඒ නගරයේ දී ග්‍රෝවර්ටයි මටයි නරක අද්දැකීම්වලට මූණ දෙන්න වුණු බව කියලා විරෝධය පාන්න මම සූදානම් වුණත් බියන්කා ඉස්සර වුණා.

"නෑ!" එයා කිවුවා. "එහෙ නම් බැහැ!"

එයා බයෙන් කැලඹිලා බලා සිටියේ හරියට මේ දැන් රෝලර් කෝස්ටරයක පල්ලමකින් වැටුණා වගෙයි.

ෘෙසෝයි රවා බැලුවා. "ඇයි?"



බියන්කා සැලෙන හුස්මක් ගත්තා. "මං... මං හිතන්නේ අපි ටික කාලයක් එහෙ නැවතිලා හිටියා. නිකෝයි මමයි. අපි ගමනේ යන අතරේ. ඊට පස්සේ, මට මතක නෑ..."

හදිසියේ ම මට මහා නරක සිතුවිල්ලක් ආවා. නිකෝ සහ බියන්කා ටික කාලයක් හෝටලයක නැවතී සිටි කතාවක් එයා කියූ බව මට සිහි වුණා. මම ග්‍රෝවර්ගේ ඇස් දිහා බලද්දී එයත් ඒ දේම හිතන බව මට තේරුණා.

"බියන්කා," මම කතා කළා. "ඔයා නැවතිලා හිටපු හෝටලේ... ඒකෙ නම ලෝටස් හෝටලය සහ කැසිනෝව ද?"

එයාගේ ඇස් ලොකු වුණා. "ඔයා කොහොමද ඒක දන්නේ?"

"ඔහ්, නියමයි," මම කිවුවා.

"පොඩ්ඩක් ඉන්න," තාලියා කිවුවා. "මොකක්ද ලෝටස් කැසිනෝව?"

"අවුරුදු දෙකකට කලින්," මම කිවුවා, "ග්‍රෝවරුයි ඇනබෙතුයි මමයි ඒකෙ හිර වුණා. ඒක හදලා තියෙන්නෙ ඔයාට ආයේ කවදාවත් ඒකෙන් පිට වෙන්න ඕනෑ නොවෙන විදිහට. අපි ඒක ඇතුළේ පැයක් විතර ඉඳලා එළියට ඇවිත් බලනකොට දවස් පහක් ගිහින්. ඒකෙ දී කාලය ගතවීම වේගවත් කරනවා."

"නෑ," බියන්කා කිවුවා. "ඒක වෙන්න බැරි වැඩක්."

"ඔයා කිවුවා නේද කවුදෝ ඇවිල්ලා ඔයාලව එළියට ගත්තා කියලා?" මම ඇසුවා.

"ඔව්."

"එයාගේ පෙනුම මොන වගේ ද? එයා මොනවද කිවුවේ?"

"මට... මට මතක නෑ. අනේ, මට ඒ ගැන කතා කරන්න ඕනෑ නෑ."

ෘෙසෝයි වාඩි වී සිටි තැනින් ඉදිරියට නැමෙද්දී එයාගේ ඇහි බැම් කල්පනාවෙන් එකට ගැට ගැසී තිබුණා. "පහුගිය ගිම්හානේ තී යනකොට වොෂින්ටන් ඩී.සී. වෙනස් වෙලා තිබුණා කියලා කිවුවා නේද? එහෙ උමං පාරවල් තිබුණා කියලත් තීට මතක තිබුණේ නැහැ නේ."

"ඔව්, ඒත්-"

"බියන්කා," ෂෙසා්යි කිවුවා. "නුඹට දැන් ඇමරිකාවේ ඉන්න ජනාධිපතිගේ නම කියන්න පුළුවන් ද?"

"මෝඩ ප්‍රශ්න අහන්නෙපා," කියපු බියන්කා ජනාධිපතිගේ නම නිවැරදිව කිවුවා.

"එතකොට ඊට කලින් හිටපු ජනාධිපති කවුද?" ෂෙසා්යි ඇසුවා.

බියන්කා ටික වෙලාවක් කල්පනා කළා. "රූස්වෙල්ට්."

ෂෙසා්යි තදින් කෙළ ගිල්ලා. "තියඩෝර් ද, ෆ්‍රැන්ක්ලින් ද?"

"ෆ්‍රැන්ක්ලින්," බියන්කා කිවුවා. "එෆ්.ඩී.ආර්."

"ඒ කිවුවෙ එෆ්.ඩී.ආර්.ඩ්‍රයිව් එකක් වගේ ද?" මම ඇසුවා. මොකද ඇත්තම කියනවා නම් මම දැනගෙන හිටපු එකම එෆ්.ඩී.ආර්. ඒක විතරයි.

"බියන්කා," ෂෙසා්යි කතා කළා, "අන්තිමට හිටපු ජනාධිපති එෆ්.ඩී.ආර්. නෙවෙයි. එයා හිටියේ අවුරුදු හැත්තෑවකට විතර කලින්."

"ඒක වෙන්න බැහැ," බියන්කා කිවුවා. "මම... මම එච්චර වයස නැහැ."

එයා, එයාගේ අත් දෙක දිහා බලාගෙන හිටියේ ඒවා රැළි වැටිලා නැති බව සැක හැර දැනගන්න වගෙයි.

තාලියාගේ ඇස් දුක්බර වුණා. මං හිතන්නේ, ගෙවී යන කාලයෙන් ටිකකට පැත්තකට ඇදලා ගත්තාම දැනෙන විදිහ එයත් දැනගෙන ඉන්න ඇති. "ඒකට කමක් නෑ, බියන්කා, වැදගත්ම දේ තමයි ඔයයි නිකෝයි පරිස්සමෙන් ඉන්න එක. ඔයාලා ඒකෙන් එළියට ආවා නේ."

"ඒත් කොහොමද?" මම ඇසුවා. "අපි පැයක් විතර ඒකෙ ඉඳලත් පැන ගත්තෙ බොහොම අමාරුවෙන්. එච්චර කාලයක් ඉඳලා ඔයාලා කොහොමද එළියට පැන ගත්තේ?"

"මං ඔයාට කිවුවා නේ," බියන්කා හිටියේ දැන් අඬන්න වගෙයි. "කවුදෝ මනුස්සයෙක් ඇවිත් කිවුවා එළියට යන්න කාලෙ හරි කියලා. ඊට පස්සෙ-"

"ඒත් කවුද? ඇයි එයා එහෙම කළේ?"

ඒකට එයාගෙන් උත්තරයක් ලැබෙන්න කලින්, පාරෙන් ආව සැර එළියක් අපි මතට වැටුණා. කාරයක ඉදිරිපස ප්‍රධාන ලාම්පු



කොහෙන්දෝ මතු වුණා. අපිට ආයෙමත් උදවු කරන්න ඇපලෝ එනවා ඇති කියලා මම බලාපොරොත්තු වුණා, ඒත් ඒ වාහනයේ එන්ජිම සූර්ය යානයට වඩා ගොඩාක් හඬ අඩුයි, ඒ ඇරත්, දැන් රෑ වෙලා නේ. අපි, අපේ නිදන මලු අරගෙන පාරෙන් ඉවත් වෙද්දි මීනි සුදු පාට ලිමොසිනයක් ඇවිත් අපි ඉදිරියේ නතර වුණා.

★★★

මගේ ඉදිරියේ ලිමොසිනයේ පසුපස දොර ඇරුණා. මට පැත්තකට පැන ගන්න ඉඩක් ලැබෙන්නත් කලින් කඩු තුඩක් මගේ බෙල්ලට තද වුණා.

ෂෙසා්යි සහ බියන්කා දුනු ඇද ගන්නා හඬ මට ඇසුණා. කඩු තලයේ අයිතිකාරයා කාරයෙන් බිමට බහිද්දී මම හෙමින් සීරුවේ පස්සට වුණා. මට එහෙම කරන්න වුණේ එයා කඩු තුඩ තව තවත් මගේ නිකට යටින් තද කළ නිසයි.

එයා කෲර හිනාවක් පෑවා. "දැන් හෙමින් සීරුවේ වගෙයි වැඩ, මැට්ටෝ?"

එයා හමුදා මෝස්තරයට කොණ්ඩය කැපූ, මෝටර් සයිකල්කරුවන් අඳින ලෙදර් ජැකට්ටුවකුත්, කළු කලිසමක් සහ මාංශ පේශී උලුප්පා පෙන්වන සුදු කමිසයකුත් හැඳ සටනට පලඳින බූට් ජෝඩුවක් පැලඳ සිටි ලොකු පිරිමියෙක්. අව් කණ්ණාඩි යුවලකින් එයාගේ දෑස් ආවරණය වී තිබුණත් ඒවාට පිටුපසින් ඇති දේ මම දැන සිටියා- ගිනි දැලුවලින් පිරුණු හිස් ඇස් කෙවෙණි දෙකක්.

"ඒරීස්," මම ගෙරෙව්වා.

යුද්ධයට අධිපති දෙවියා මගේ යාළුවෝ දිහාවට බැල්මක් හෙළුවා. "පහසුවෙන් ඉන්නවල්ලා."

එයා අසුරක් ගසද්දී මගේ යාළුවන්ගේ ආයුධ බිමට වැටුණා.

"මේක මිතුරු හමුවක්," එයා කඩු තලය තවත් ටිකක් මගේ බෙල්ලට තද කළා. "ඇත්ත වශයෙන්ම, ඔහේගේ ඔළු ගෙඩිය ජය සලකුණක් විදිහට අරන් යන්ඩ තියෙනවා නම් මම කැමතියි, ඒත් කෙනෙක්ට ඔහේව බලන්ඩ ඕනෑලු. ඒ වගේම මම කවදාවත් නෝනා කෙනෙක් ඉස්සරහ මගේ හතුරන්ගේ බෙලි කපන්නෙ නැහැ."

"මොන නෝන ද?" තාලියා ඇසුවා.

Scanned with CamScanner

ඒරීස් එයා දිහා බැලුවා. "හොඳයි, හොඳයි. ඔහේ ආපහු ආවා කියලා මට අහන්ඩ ලැබුණා."

කඩුව පහත දාමූ එයා මාව පැත්තකට තල්ලු කළා.

"සියුස්ගේ දුව, තාලියා," ඒරීස් ඇද කරමින් කිව්වා. "ඔහේ එකතු වෙලා ඉන්නෙ හොඳ කට්ටියකට නම් නෙවෙයි."

"ඔයා මොකටද ආවේ, ඒරීස්?" එයා ඇහුවා. "කවුද කාර් එකේ ඉන්නේ?"

හැමෝගෙම අවධානය ලැබීම ගැන සතුටු වෙමින් ඒරීස් හිනා වුණා. "ඔහ්, මං හිතන්නෙ ඔහේලගෙන් ඉතුරු අයව නම් එයාට ඕනෑ නැහැ. විශේෂයෙන්ම මෙයාලව." එයා ටෙසෝයිව සහ බියන්කාව නිකටෙන් පෙන්වූවා. "ඔහේලා ගිහින් අර කඩෙන් මොනවා හරි කාලා ආවොත් නරක ද? මම පර්සිව එක්ක යන්නේ විනාඩි දෙක තුනකට විතරයි."

"අපි එයාව නුඹ ළඟ තනියම දාලා යන්නෙ නැහැ, ඒරීස් උතුමාණෙනි," ටෙසෝයි කිව්වා.

"ඇරත්," ග්‍රෝවර් අමාරුවෙන් කියාගත්තා, "ඒ කඩේ වහලා නේ."

ඒරීස් නැවතත් අසුරක් ගැසුවා. ඒත් එක්කම කඩේ ඇතුළේ විදුලි බුබුළු දල්වෙන්න ගත්තා. දොරේ ගසා තිබූ 'වසා ඇත' පුවරුව 'විවෘතයි' පැත්තට හැරුණා. "ඔහේ මොකක්ද කිව්වේ, එළු කොල්ලෝ?"

"යන්න," මම, මගේ යාළුවන්ට කිව්වා. "මං මේක බලා ගන්නම්."

මම දනෙමින් තිබුණාට වඩා ආත්ම විශ්වාසයකින් කතා කරන්න උත්සාහ කළා. ඒත් ඒරීස්ව ගොනාට අන්දවන්න පුළුවන් වුණා කියලා නම් මට හිතුනේ නැහැ.

"කොල්ලා කියපු දේ ඔහේලට ඇහුණා නේ," ඒරීස් කිව්වා. "එයා හයිය තියෙන ලොකු පොරක්. එයාට හැම දේම බලාගන්ඩ පුළුවන්."

අකමැත්තෙන් වුණත් මගේ යාළුවෝ හෝටලය පැත්තට ඇදුණා. අප්පිරියාවෙන් මගේ දිහා බලා හිටපු ඒරීස් ඊට පස්සේ ලිමොසිනයේ දොර ඇරියා. "ඇතුළට යනවා, මැට්ටෝ," එයා කිව්වා.



"ඒ වගේම හොඳට හැසිරෙන්ඩ මතක තියාගන්නවා. එයා මං වගේ හැදියාවක් නැතිකමට සමාව දෙන කෙනෙක් නෙවෙයි."

***

කාරය තුළ සිටි ගැහැනු කෙනා දකිද්දී මගේ කට ඉබේටම ඇරුණා.

මට මගේ නම අමතක වුණා. මම ඉන්නෙ කොහෙද කියලත් අමතක වුණා. මට කතා කරන්න පවා අමතක වුණා.

එයා රතු සැටින් ගවුමකින් සැරසී සිටියා, චූටි කැරලි ගොඩකට සකසා තිබූ එයාගේ කොණ්ඩය දිය ඇල්ලක් වගේ කඩා හැලුණා. මම මේ තරම් කාලෙකට දැක තිබුණු ලස්සනම මුහුණ එයාට තිබුණා. කිසිම අඩුවක් නැති මේක්-අප් එක, දීප්තිමත් ඇස්, හදේ අඳුරු පැත්ත වුණත් එළිය කරවන හිනාව.

ඒ ගැන ආයෙමත් කල්පනා කරද්දී, එයා කවුරු වගේ ද කියලා මට කියන්න බැහැ. එහෙමත් නැත්නම් එයාගේ කොණ්ඩයේ හෝ ඇස්වල පාට කියන්නත් මට බැහැ. ඔයාට හිතා ගන්න පුළුවන් ලස්සනම නිළියව මතක් කරගන්න. මේ දෙවඟන ඊටත් වඩා දහ ගුණයකින් ලස්සනයි. ඔයා කැමතිම කොණ්ඩයේ පාට, ඇස්වල පාට තෝරා ගන්න. මේ දෙවඟනට ඒවා තිබුණා.

එයා මට හිනා වෙද්දී, එක මොහොතකට එයාව ඇනබෙත් වගේ පෙනුණා. ඊට පස්සේ මම පහ වසරේ ඉන්නකොට ආසම නිළියගේ පෙනුම ගත්තා. ඊටත් පස්සේ... හොඳයි, ඔයාට තේරෙනවා නේ.

"අහ්, ඔයා ආව ද, පර්සි," දෙවඟන කිව්වා. "මම ඇෆ්‍රොඩයිට්."

එයා ඉදිරියේ තිබුණු අසුනට ලිස්සා ගිය මම කතා කරන්න උත්සාහ කළා, "අම්...අහ්...ගහ්."

එයා හිනා වුණා. "ඔයා හරිම ස්වීට් නේ. මේක ටිකක් අල්ල ගන්නකෝ."

කෑම පිඟානක් තරම් ලොකු ඔප දැමූ කණ්ණාඩියක් මගේ අතට දුන් එයා මට ඒක එයාගේ පැත්තට අල්ලගෙන ඉන්න සැලැස්වූවා. එයා ඉදිරියට නැමී තොල් ආලේපනය මාත්තු කරන්න ගත්තත් මට නම් කිසිම අඩුපාඩුවක් පෙනුනේ නැහැ.

Scanned with CamScanner

"ඔයා මෙහෙට ආවේ ඇයි කියලා දන්නව ද?" එයා ඇහුවා.

මට ප්‍රතිචාර දක්වන්න ඕනෑ වුණා. මට සම්පූර්ණ වාක්‍යයක් කියාගන්න බැරි ඇයි? එයා ගෑනු කෙනෙක් විතරයි නේ. ලස්සනම ලස්සන ගෑනු කෙනෙක්. එයාගේ ඇස් උල්පත් වතුර පිරුණු පොකුණු වගෙයි... වාව්.

මම, මගේ අත තදින් කොනිත්තා ගත්තා.

"මං... මං දන්නෑ," මට කියාගන්න හැකි වුණා.

"ඔහ්, වස්තුවේ," ඇෆ්‍රොඩයිට් කිවුවා. "තවමත් නැහැ කියනව ද?"

කාරයෙන් පිටත ජ්‍රීස් තනියම හිනා වෙනවා මට ඇහුණා. අපි කතා කරන හැම වචනයක් ම එයාට ඇහෙනවා ඇති කියලා මට හැඟුණා. එයා එතැන ඉන්න බව මතක් වෙද්දිත් මගේ තරහා ඇවිස්සුණා, ඒක මගේ හිත පැහැදිලි කර ගන්න උදවුවක් වුණා.

"ඔයා කියන්නේ මොනවා ගැන ද කියලා මම දන්නෙ නැහැ," මම කිවුවා.

"හොඳයි එහෙනම්, ඔයා මේ ගවේෂණයට ආවේ ඇයි?"

"ආර්ටෙමිස්ව හිර කරගෙන ඉන්න නිසා!"

ඇෆ්‍රොඩයිට් ඇස් කැරකුවා. "ඔහ්, ආර්ටෙමිස්. අනේ. ඒ ගැන කතා කරලා වැඩක් නැහැ. මං කියන්නේ, එයාලට දෙවඟනක්ව පැහැරගෙන යන්න ඕනෑ වුණා නම්, එයා හිතා ගන්නත් බැරි තරම් ලස්සන කෙනෙක් වෙන්න ඕනෑ කියලා ඔයාට හිතෙන්නෙ නැද්ද? ආර්ටෙමිස්ව හිර කරගෙන ඉන්න අසරණයෝ ගැන මට දුකයි. එපා වෙලා ඇති!"

"ඒත් එයා රාක්ෂයෙක්ව හොයාගෙනයි ගියේ," මම විරෝධය පෑවා. "නරකම නරක රාක්ෂයෙක්ව. අපිට ඌව හොයාගන්න තියෙනවා!"

ඇෆ්‍රොඩයිට් මට කණ්ණාඩිය තවත් ටිකක් ඉහළට ඔසවා අල්ල ගන්න සැලැස්වූවා. එයාට ඇස් කොණක ඇහැට නොපෙනෙන අඩුවක් හොයා ගන්න ලැබිලා වගේ ඇස් ආලේපන නැවත තැවරුවා. "හැම වෙලාවෙම මොකෙක්හරි රාක්ෂයෙක්. ඒත් මගේ ආදරණීය පර්සි, ඒ



නිසා තමයි අනිත් අය මේ ගවේෂණයට එකතු වුණේ. මම වැඩියෙන් උනන්දු වෙන්නෙ ඔයා ගැන."

මගේ හදවත වේගයෙන් ගැහෙන්න ගත්තා. මට උත්තර දෙන්න උවමනා නොවුණත්, එයාගේ ඇස් මගේ කටින් පිළිතුර ඇදලා ගත්තා. "ඇනබෙත් කරදරේක වැටිලා."

ඇෆ්‍රොඩයිට් උද්‍යෝගිමත් වුණා. "අන්න හරි!"

"මම එයාට උදවු කරන්න ඕනෑ," මම කිවුවා. "මට එහෙම හීන පෙනුණා."

"අහ්, ඔයා එයාව හීනෙනුත් දකිනවා! අනේ හරි ෂෝක් නේ!"

"නෑ! මං කිවුවේ... මං අදහස් කළේ ඒක නෙවෙයි."

එයා කටින් ටස්ක්-ටස්ක් හඬක් නැගුවා. "පර්සි, මම ඔයාගේ පැත්තේ. කොහොම හරි, ඔයා මෙතැන ඉන්නෙ මම නිසයි."

මම එයා දිහා පුදුමයෙන් බලා සිටියා. "මොකක්?"

"ස්ටොල් සහෝදරයෝ ෆීබිට දුන්න වස ගාපු ටී-ෂර්ට් එක," එයා කිවුවා. "ඔයා හිතුවෙ ඒක අහම්බෙන් වුණ දෙයක් කියල ද? ඔයාව හොයන්න බ්ලැක්ජැක්ව එවපු එක? ඔයාට කඳවුරෙන් හොරෙන් පනින්න උදවු කරපු එක?"

"ඔයා ද ඒවා කළේ?"

"ඇත්ත වශයෙන්ම! මොකද මේ දඩයක්කාරියෝ නම් කොච්චර එපා කරපු අය ද! කොහේවත් ඉන්න රාක්ෂයෙක් හොයන්න ගවේෂණයකුයි, බ්ලාහ්-බ්ලාහ්-බ්ලාහ්. ආර්ටෙමිස්ව බේරගන්නයි. මං කියන්නේ. එයා අතුරුදහන් වෙලා ම හිටපුදෙන්. ඒත් සැබෑ ආදරය වෙනුවෙන් ගවේෂණයක්-"

"තත්පරයක් ඉන්න, මම කීයටවත් කිවුවෙ නැහැ-"

"ඔහ්, මගෙ වස්තුවේ. ඔයා ඒක කියන්න උවමනා නැහැ. ඔයා දන්නව ද ඇනබෙත් දඩයක්කාරියන්ට එකතු වෙන්න කිට්ටු වෙලා හිටියෙ කියලා?"

මම රතු වුණා. "මට විශ්වාස නැහැ-"

"එයා ලැස්ති වුණේ එයාගේ ජීවිතේ පැත්තකට විසි කරලා දාන්න! එතකොට ඔයා, මගෙ දරුවෝ, ඔයාට පුළුවන් එයාව ඒකෙන් ගලවා ගන්න. ඒක නම් හරිම රොමැන්ටික්!"

කෝපි ගොඩාක් බොනවා. අවුරුදු දෙදාහකින් අපිට ලැබුණු හොඳම මග පෙන්වීම තමයි ඒක. මම කිට්ටුවටම ගියා."

ග්‍රෝවර්ගේ බලාපොරොත්තු විනාශ කරන්න අකමැති නිසා මම ඒකට උත්තර දුන්නෙ නැහැ.

"මට දැනගන්න ඕනෑ," තාලියා බියන්කා දිහා බලමින් කිවුවා, " ඔයා කොහොමද පිල්ලියක් විනාශ කළේ කියලා. ඒ වගේ තව ගොඩක් මේ අහළ පහළම ඉන්නවා. උන් එක්ක සටන් කරන්නෙ කොහොමද කියලා අපි හොයා ගන්න ඕනෑ."

බියන්කා ඔළුව හෙල්ලුවා. "මං දන්නෑ. මම ඒකාගෙ පපුවට ඇන්න ගමන් ඌව ගිනි ගත්තා."

"සමහරවිට ඔයාගේ පිහියේ මොකක්හරි විශේෂත්වයක් ඇති," මම කිවුවා.

"ඒක මගේ එක වගේමයි," Zසෝයි කිවුවා. "දිව්‍යමය ලෝකඩ. ඒත් මගේ එකෙන් සෙබළුන්ට ඒ වගේ බලපෑමක් වුණේ නැහැ."

"සමහරවිට ඇටකෝට්ටන්ගේ එක විශේෂ තැනකට අනින්න ඕනෑ ඇති," මම කිවුවා.

හැම දෙනාගේම අවධානය එයා වෙතට යොමු වී තිබුණු නිසා ද කොහෙදෝ බියන්කා සිටියේ අපහසුවෙන් වගෙයි.

"ඒකෙන් කමක් නෑ," Zසෝයි එයාට කිවුවා. "අපි උත්තරේ හොයාගමුකෝ. ඒ අතරවාරේ, අපි ඊළඟට කරන දේ සැලසුම් කරන්න ඕනෑ. මේ කහළ ගොඩෙන් එහා පැත්තට ගියාම අපි දිගටම බටහිරට යන්න ඕනෑ. පාරක් හොයා ගන්න පුළුවන් වුණොත්, අපිට ළඟම තියෙන නගරයට යන්න පුළුවන් වෙයි. මං හිතන්නෙ ඒ ලාස් වේගාස් වෙන්න ඇති."

ඒ නගරයේ දී ග්‍රෝවර්ටයි මටයි නරක අද්දැකීම්වලට මූණ දෙන්න වුණු බව කියලා විරෝධය පාන්න මම සූදානම් වුණත් බියන්කා ඉස්සර වුණා.

"නෑ!" එයා කිවුවා. "එහෙ නම් බැහැ!"

එයා බයෙන් කැලඹිලා බලා සිටියේ හරියට මේ දැන් රෝලර් කෝස්ටරයක පල්ලමකින් වැටුණා වගෙයි.

Zසෝයි රවා බැලුවා. "ඇයි?"



බියන්කා සැලෙන හුස්මක් ගත්තා. "මං... මං හිතන්නේ අපි ටික කාලයක් එහෙ නැවතිලා හිටියා. නිකෝයි මමයි. අපි ගමනේ යන අතරේ. ඊට පස්සේ, මට මතක නෑ..."

හදිසියේ ම මට මහා නරක සිතුවිල්ලක් ආවා. නිකෝ සහ බියන්කා ටික කාලයක් හෝටලයක නැවතී සිටි කතාවක් එයා කියූ බව මට සිහි වුණා. මම ග්‍රෝවර්ගේ ඇස් දිහා බලද්දී එයත් ඒ දේම හිතන බව මට තේරුණා.

"බියන්කා," මම කතා කළා. "ඔයා නැවතිලා හිටපු හෝටලේ... ඒකෙ නම ලෝටස් හෝටලය සහ කැසිනෝව ද?"

එයාගේ ඇස් ලොකු වුණා. "ඔයා කොහොමද ඒක දන්නේ?"

"ඔහ්, නියමයි," මම කිවුවා.

"පොඩ්ඩක් ඉන්න," තාලියා කිවුවා. "මොකක්ද ලෝටස් කැසිනෝව?"

"අවුරුදු දෙකකට කලින්," මම කිවුවා, "ග්‍රෝවරුයි ඇනබෙතුයි මමයි ඒකෙ හිර වුණා. ඒක හදලා තියෙන්නෙ ඔයාට ආයේ කවදාවත් ඒකෙන් පිට වෙන්න ඕනෑ නොවෙන විදිහට. අපි ඒක ඇතුළේ පැයක් විතර ඉඳලා එළියට ඇවිත් බලනකොට දවස් පහක් ගිහින්. ඒකෙ දී කාලය ගතවීම වේගවත් කරනවා."

"නෑ," බියන්කා කිවුවා. "ඒක වෙන්න බැරි වැඩක්."

"ඔයා කිවුවා නේද කවුදෝ ඇවිල්ලා ඔයාලව එළියට ගත්තා කියලා?" මම ඇසුවා.

"ඔව්."

"එයාගේ පෙනුම මොන වගේ ද? එයා මොනවද කිවුවේ?"

"මට... මට මතක නෑ. අනේ, මට ඒ ගැන කතා කරන්න ඕනෑ නෑ."

Zසෝයි වාඩි වී සිටි තැනින් ඉදිරියට නැමෙද්දී එයාගේ ඇහි බැම් කල්පනාවෙන් එකට ගැට ගැසී තිබුණා. "පහුගිය ගිම්හානේ තී යනකොට වොෂින්ටන් ඩී.සී. වෙනස් වෙලා තිබුණා කියලා කිවුවා නේද? එහෙ උමං පාරවල් තිබුණා කියලත් තීට මතක තිබුණේ නැහැ නේ."

"ඔව්, ඒත්-"

Scanned with CamScanner

"බියන්කා," ෂෙසා්යි කිවුවා. "නුඹට දැන් ඇමරිකාවේ ඉන්න ජනාධිපතිගේ නම කියන්න පුළුවන් ද?"

"මෝඩ ප්‍රශ්න අහන්නෙපා," කියපු බියන්කා ජනාධිපතිගේ නම නිවැරදිව කිවුවා.

"එතකොට ඊට කලින් හිටපු ජනාධිපති කවුද?" ෂෙසා්යි ඇසුවා.

බියන්කා ටික වෙලාවක් කල්පනා කළා. "රූස්වෙල්ට්."

ෂෙසා්යි තදින් කෙළ ගිල්ලා. "තියඩෝර් ද, ෆ්‍රෑන්ක්ලින් ද?"

"ෆ්‍රෑන්ක්ලින්," බියන්කා කිවුවා. "එෆ්.ඩී.ආර්."

"ඒ කිවුවෙ එෆ්.ඩී.ආර්.ඩ්‍රයිව් එකක් වගේ ද?" මම ඇසුවා. මොකද ඇත්තම කියනවා නම් මම දැනගෙන හිටපු එකම එෆ්.ඩී.ආර්. ඒක විතරයි.

"බියන්කා," ෂෙසා්යි කතා කළා, "අන්තිමට හිටපු ජනාධිපති එෆ්.ඩී.ආර්. නෙවෙයි. එයා හිටියේ අවුරුදු හැත්තෑවකට විතර කලින්."

"ඒක වෙන්න බැහැ," බියන්කා කිවුවා. "මම... මම එච්චර වයස නැහැ."

එයා, එයාගේ අත් දෙක දිහා බලාගෙන හිටියේ ඒවා රැළි වැටිලා නැති බව සැක හැර දැනගන්න වගෙයි.

තාලියාගේ ඇස් දුක්බර වුණා. මං හිතන්නේ, ගෙවී යන කාලයෙන් ටිකකට පැත්තකට ඇදලා ගත්තාම දැනෙන විදිහ එයත් දැනගෙන ඉන්න ඇති. "ඒකට කමක් නෑ, බියන්කා, වැදගත්ම දේ තමයි ඔයයි නිකෝ්යි පරිස්සමෙන් ඉන්න එක. ඔයාලා ඒකෙන් එළියට ආවා නේ."

"ඒත් කොහොමද?" මම ඇසුවා. "අපි පැයක් විතර ඒකෙ ඉඳලත් පැන ගත්තෙ බොහොම අමාරුවෙන්. එච්චර කාලයක් ඉඳලා ඔයාලා කොහොමද එළියට පැන ගත්තේ?"

"මං ඔයාට කිවුවා නේ," බියන්කා හිටියේ දැන් අඬන්න වගෙයි. "කවුදෝ මනුස්සයෙක් ඇවිත් කිවුවා එළියට යන්න කාලෙ හරි කියලා. ඊට පස්සේ-"

"ඒත් කවුද? ඇයි එයා එහෙම කළේ?"

ඒකට එයාගෙන් උත්තරයක් ලැබෙන්න කලින්, පාරෙන් ආව සැර එළියක් අපි මතට වැටුණා. කාරයක ඉදිරිපස ප්‍රධාන ලාම්පු



කොහෙන්දෝ මතු වුණා. අපිට ආයෙමත් උදවු කරන්න ඇපලෝ එනවා ඇති කියලා මම බලාපොරොත්තු වුණා, ඒත් ඒ වාහනයේ එන්ජිම සූර්ය යානයට වඩා ගොඩාක් හඬ අඩුයි, ඒ ඇරත්, දැන් රෑ වෙලා නේ. අපි, අපේ නිදන මලු අරගෙන පාරෙන් ඉවත් වෙද්දි මිනී සුදු පාට ලිමොසිනයක් ඇවිත් අපි ඉදිරියේ නතර වුණා.

★★★

මගේ ඉදිරියේ ලිමොසිනයේ පසුපස දොර ඇරුණා. මට පැත්තකට පැන ගන්න ඉඩක් ලැබෙන්නත් කලින් කඩු තුඩක් මගේ බෙල්ලට තද වුණා.

ෂෙසා්යි සහ බියන්කා දුනු ඇද ගන්නා හඬ මට ඇසුණා. කඩු තලයේ අයිතිකාරයා කාරයෙන් බිමට බහිද්දී මම හෙමින් සීරුවේ පස්සට වුණා. මට එහෙම කරන්න වුණේ එයා කඩු තුඩ තව තවත් මගේ නිකට යටින් තද කළ නිසයි.

එයා කෲර හිනාවක් පෑවා. "දැන් හෙමින් සීරුවේ වගෙයි වැඩ, මැට්ටෝ?"

එයා හමුදා මෝස්තරයට කොණ්ඩය කැපූ, මෝටර් සයිකල්කරුවන් අඳින ලෙදර් ජැකට්ටුවකුත්, කළු කලිසමක් සහ මාංශ පේශී උලුප්පා පෙන්වන සුදු කමිසයකුත් හැඳ සටනට පලඳින බූට් ජෝඩුවක් පැලඳ සිටි ලොකු පිරිමියෙක්. අව් කණ්ණාඩි යුවලකින් එයාගේ දෑස් ආවරණය වී තිබුණත් ඒවාට පිටුපසින් ඇති දේ මම දැන සිටියා- ගිනි දැලුවලින් පිරුණු හිස් ඇස් කෙවෙණි දෙකක්.

"ඒරීස්," මම ගෙරෙව්වා.

යුද්ධයට අධිපති දෙවියා මගේ යාළුවෝ දිහාවට බැල්මක් හෙළුවා. "පහසුවෙන් ඉන්නවල්ලා."

එයා අසුරක් ගසද්දී මගේ යාළුවන්ගේ ආයුධ බිමට වැටුණා.

"මේක මිතුරු හමුවක්," එයා කඩු තලය තවත් ටිකක් මගේ බෙල්ලට තද කළා. "ඇත්ත වශයෙන්ම, ඔහේගේ ඔළු ගෙඩිය ජය සලකුණක් විදිහට අරන් යන්ඩ තියෙනවා නම් මම කැමතියි, ඒත් කෙනෙක්ට ඔහේව බලන්ඩ ඕනෑලු. ඒ වගේම මම කවදාවත් නෝනා කෙනෙක් ඉස්සරහ මගේ හතුරන්ගේ බෙලි කපන්නෙ නැහැ."

"මොන නෝනා ද?" තාලියා ඇසුවා.

Scanned with CamScanner

ඒරිස් එයා දිහා බැලුවා. "හොඳයි, හොඳයි. ඔහේ ආපහු ආවා කියලා මට අහන්ඩ ලැබුණා."

කඩුව පහත දමූ එයා මාව පැත්තකට තල්ලු කළා.

"සියුස්ගේ දුව, තාලියා," ඒරිස් ඇද කරමින් කිවුවා. "ඔහේ එකතු වෙලා ඉන්නෙ හොඳ කට්ටියකට නම් නෙවෙයි."

"ඔයා මොකටද ආවේ, ඒරිස්?" එයා ඇසුවා. "කවුද කාර් එකේ ඉන්නේ?"

හැමෝගෙම අවධානය ලැබීම ගැන සතුටු වෙමින් ඒරිස් හිනා වුණා. "ඔහ්, මං හිතන්නෙ ඔහේලගෙන් ඉතුරු අයව නම් එයාට ඕනෑ නැහැ. විශේෂයෙන්ම මෙයාලව." එයා ෆ්‍රෙසෝයිව සහ බියන්කාව නිකටෙන් පෙන්වූවා. "ඔහේලා ගිහින් අර කඩෙන් මොනවා හරි කාලා ආවොත් නරක ද? මම පර්සිව එක්ක යන්නේ විනාඩි දෙක තුනකට විතරයි."

"අපි එයාව නුඹ ළඟ තනියම දාලා යන්නෙ නැහැ, ඒරිස් උතුමාණෙනි," ෆ්‍රෙසෝයි කිවුවා.

"ඇරත්," ග්‍රෝවර් අමාරුවෙන් කියාගත්තා, "ඒ කඩේ වහලා නේ."

ඒරිස් නැවතත් අසුරක් ගැසුවා. ඒත් එක්කම කඩේ ඇතුළේ විදුලි බුබුළු දැල්වෙන්න ගත්තා. දොරේ ගසා තිබූ 'වසා ඇත' පුවරුව 'විවෘතයි' පැත්තට හැරුණා. "ඔහේ මොකක්ද කිවුවේ, එළු කොල්ලෝ?"

"යන්න," මම, මගේ යාළුවන්ට කිවුවා. "මං මේක බලා ගන්නම්."

මම දැනෙමින් තිබුණාට වඩා ආත්ම විශ්වාසයකින් කතා කරන්න උත්සාහ කළා. ඒත් ඒරිස්ව ගොනාට අන්දවන්න පුළුවන් වුණා කියලා නම් මට හිතුනේ නැහැ.

"කොල්ලා කියපු දේ ඔහේලට ඇහුණා නේ," ඒරිස් කිවුවා. "එයා හයිය තියෙන ලොකු පොරක්. එයාට හැම දේම බලාගන්ඩ පුළුවන්."

අකමැත්තෙන් වුණත් මගේ යාළුවෝ හෝටලය පැත්තට ඇදුණා. අප්පිරියාවෙන් මගේ දිහා බලා හිටපු ඒරිස් ඊට පස්සේ ලිමොසිනයේ දොර ඇරියා. "ඇතුළට යනවා, මැට්ටෝ," එයා කිවුවා.



"ඒ වගේම හොඳට හැසිරෙන්ඩ මතක තියාගන්නවා. එයා මං වගේ හැදියාවක් නැතිකමට සමාව දෙන කෙනෙක් නෙවෙයි."

★★★

කාරය තුළ සිටි ගැහැනු කෙනා දකිද්දී මගේ කට ඉබේටම ඇරුණා.

මට මගේ නම අමතක වුණා. මම ඉන්නෙ කොහෙද කියලත් අමතක වුණා. මට කතා කරන්න පවා අමතක වුණා.

එයා රතු සැටින් ගවුමකින් සැරසී සිටියා, චූටි කැරලි ගොඩකට සකසා තිබූ එයාගේ කොණ්ඩය දිය ඇල්ලක් වගේ කඩා හැලුණා. මම මේ තරම් කාලෙකට දැක තිබුණු ලස්සනම මුහුණ එයාට තිබුණා. කිසිම අඩුවක් නැති මේක්-අප් එක, දීප්තිමත් ඇස්, හදේ අඳුරු පැත්ත වුණත් එළිය කරවන හිනාව.

ඒ ගැන ආයෙමත් කල්පනා කරද්දී, එයා කවුරු වගේ ද කියලා මට කියන්න බැහැ. එහෙමත් නැත්නම් එයාගේ කොණ්ඩයේ හෝ ඇස්වල පාට කියන්නත් මට බැහැ. ඔයාට හිතා ගන්න පුළුවන් ලස්සනම නිළියව මතක් කරගන්න. මේ දෙවඟන ඊටත් වඩා දහ ගුණයකින් ලස්සනයි. ඔයා කැමතිම කොණ්ඩයේ පාට, ඇස්වල පාට තෝරා ගන්න. මේ දෙවඟනට ඒවා තිබුණා.

එයා මට හිනා වෙද්දී, එක මොහොතකට එයාව ඇනබෙත් වගේ පෙනුණා. ඊට පස්සේ මම පහ වසරේ ඉන්නකොට ආසම නිළියගේ පෙනුම ගත්තා. ඊටත් පස්සේ... හොඳයි, ඔයාට තේරෙනවා නේ.

"අහ්, ඔයා ආව ද, පර්සි," දෙවඟන කිවුවා. "මම ඇෆ්‍රොඩයිට්."

එයා ඉදිරියේ තිබුණු අසුනට ලිස්සා ගිය මම කතා කරන්න උත්සාහ කළා, "අම්...අහ්...ගහ්."

එයා හිනා වුණා. "ඔයා හරිම ස්වීට් නේ. මේක ටිකක් අල්ල ගන්නකෝ."

කෑම පිඟානක් තරම් ලොකු ඔප දැමූ කණ්ණාඩියක් මගේ අතට දුන් එයා මට ඒක එයාගේ පැත්තට අල්ලගෙන ඉන්න සැලැස්වූවා. එයා ඉදිරියට නැමී තොල් ආලේපනය මාත්තු කරන්න ගත්තත් මට නම් කිසිම අඩුපාඩුවක් පෙනුනේ නැහැ.

"ඔයා මෙහෙට ආවේ ඇයි කියලා දන්නව ද?" එයා ඇසුවා.

මට ප්‍රතිචාර දක්වන්න ඕනෑ වුණා. මට සම්පූර්ණ වාක්‍යයක් කියාගන්න බැරි ඇයි? එයා ගෑනු කෙනෙක් විතරයි නේ. ලස්සනම ලස්සන ගෑනු කෙනෙක්. එයාගේ ඇස් උල්පත් වතුර පිරුණු පොකුණු වගෙයි... වාව්.

මම, මගේ අත තදින් කොනිත්තා ගත්තා.

"මං... මං දන්නෑ," මට කියාගන්න හැකි වුණා.

"ඔහ්, වස්තුවේ," ඇෆ්‍රොඩයිට් කිවුවා. "තවමත් නැහැ කියනව ද?"

කාරයෙන් පිටත ඒරීස් තනියම හිනා වෙනවා මට ඇහුණා. අපි කතා කරන හැම වචනයක් ම එයාට ඇහෙනවා ඇති කියලා මට හැඟුණා. එයා එතැන ඉන්න බව මතක් වෙද්දිත් මගේ තරහා ඇවිස්සුණා, ඒක මගේ හිත පැහැදිලි කර ගන්න උදවුවක් වුණා.

"ඔයා කියන්නේ මොනවා ගැන ද කියලා මම දන්නෙ නැහැ," මම කිවුවා.

"හොඳයි එහෙනම්, ඔයා මේ ගවේෂණයට ආවේ ඇයි?"

"ආර්ටෙමිස්ව හිර කරගෙන ඉන්න නිසා!"

ඇෆ්‍රොඩයිට් ඇස් කැරකුවා. "ඔහ්, ආර්ටෙමිස්. අනේ. ඒ ගැන කතා කරලා වැඩක් නැහැ. මං කියන්නේ, එයාලට දෙවඟනක්ව පැහැරගෙන යන්න ඕනෑ වුණා නම්, එයා හිතා ගන්නත් බැරි තරම් ලස්සන කෙනෙක් වෙන්න ඕනෑ කියලා ඔයාට හිතෙන්නෙ නැද්ද? ආර්ටෙමිස්ව හිර කරගෙන ඉන්න අසරණයෝ ගැන මට දුකයි. එපා වෙලා ඇති!"

"ඒත් එයා රාක්ෂයෙක්ව හොයාගෙනයි ගියේ," මම විරෝධය පෑවා. "නරකම නරක රාක්ෂයෙක්ව. අපිට ඌව හොයාගන්න තියෙනවා!"

ඇෆ්‍රොඩයිට් මට කණ්ණාඩිය තවත් ටිකක් ඉහළට ඔසවා අල්ල ගන්න සැලැස්වූවා. එයාට ඇස් කොණක ඇහැට නොපෙනෙන අඩුවක් හොයා ගන්න ලැබිලා වගේ ඇස් ආලේපන නැවත තැවරුවා. "හැම වෙලාවෙම මොකෙක්හරි රාක්ෂයෙක්. ඒත් මගේ ආදරණීය පර්සි, ඒ



නිසා තමයි අනිත් අය මේ ගවේෂණයට එකතු වුණේ. මම වැඩියෙන් උනන්දු වෙන්නෙ ඔයා ගැන."

මගේ හදවත වේගයෙන් ගැහෙන්න ගත්තා. මට උත්තර දෙන්න උවමනා නොවුණත්, එයාගේ ඇස් මගේ කටින් පිළිතුර ඇදලා ගත්තා. "ඇනබෙත් කරදරේක වැටිලා."

ඇෆ්‍රොඩයිට් උද්‍යෝගිමත් වුණා. "අන්න හරි!"

"මම එයාට උදවු කරන්න ඕනෑ," මම කිවුවා. "මට එහෙම හීන පෙනුණා."

"අහ්, ඔයා එයාව හීනෙනුත් දකිනවා! අනේ හරි ෂෝක් නේ!"

"නෑ! මං කිවුවේ... මං අදහස් කළේ ඒක නෙවෙයි."

එයා කටින් ට්ස්ක්-ට්ස්ක් හඬක් නැගුවා. "පර්සි, මම ඔයාගේ පැත්තේ. කොහොම හරි, ඔයා මෙතැන ඉන්නෙ මම නිසයි."

මම එයා දිහා පුදුමයෙන් බලා සිටියා. "මොකක්?"

"ස්ටොල් සහෝදරයෝ ෆීබිට දුන්න වස ගාපු ටී-ෂර්ට් එක," එයා කිවුවා. "ඔයා හිතුවෙ ඒක අහම්බෙන් වුණ දෙයක් කියල ද? ඔයාව හොයන්න බ්ලැක්ජැක්ව එවපු එක? ඔයාට කඳවුරෙන් හොරෙන් පනින්න උදවු කරපු එක?"

"ඔයා ද ඒවා කළේ?"

"ඇත්ත වශයෙන්ම! මොකද මේ දඩයක්කාරියෝ නම් කොච්චර එපා කරපු අය ද! කොහේවත් ඉන්න රාක්ෂයෙක් හොයන්න ගවේෂණයකුයි, බ්ලාහ්-බ්ලාහ්-බ්ලාහ්. ආර්ටෙමිස්ව බේරගන්නයි. මං කියන්නේ. එයා අතුරුදහන් වෙලා ම හිටපුදෙන්. ඒත් සැබෑ ආදරය වෙනුවෙන් ගවේෂණයක්-"

"තත්පරයක් ඉන්න, මම කීයටවත් කිවුවෙ නැහැ-"

"ඔහ්, මගෙ වස්තුවේ. ඔයා ඒක කියන්න උවමනා නැහැ. ඔයා දන්නව ද ඇනබෙත් දඩයක්කාරියන්ට එකතු වෙන්න කිට්ටු වෙලා හිටියෙ කියලා?"

මම රතු වුණා. "මට විශ්වාස නැහැ-"

"එයා ලෑස්ති වුණේ එයාගේ ජීවිතේ පැත්තකට විසි කරලා දාන්න! එතකොට ඔයා, මගෙ දරුවෝ, ඔයාට පුළුවන් එයාව ඒකෙන් ගලවා ගන්න. ඒක නම් හරිම රොමැන්ටික්!"

Scanned with CamScanner

"අහ්..."

"ඔහ්, ඔය කණ්ණාඩිය පැත්තකට දාන්න," ඇෆ්‍රොඩයිට් නියෝග කළා. "මගේ පෙනුම හොඳයි."

මම තවමත් ඒක අල්ලගෙන ඉන්න බව මට තේරුම් ගියේ එතකොටයි, ඒ වුණත් ඒක බිමින් තිබ්බට පස්සේ මගේ අත් රිදෙන්න ගත්තා.

"දූන්, අහන්න, පර්සි," ඇෆ්‍රොඩයිට් කිවුවා. "දඩයක්කාරියෝ කියන්නේ ඔයාගේ හතුරෝ. එයාලවයි, ආර්ටෙමිස්වයි, රාක්ෂයාවයි ඔක්කොම අමතක කරලා දාන්න. ඒවා වැදගත් නැහැ. ඔයා හිත යොදවන්න ඕනෑ ඇනබෙත්ව හොයාගෙන බේරගන්න එකටයි."

"එයා ඉන්නෙ කොහෙද කියලා ඔයා දන්නව ද?"

ඇෆ්‍රොඩයිට් නොරිස්සුමෙන් වගේ අතක් වැනුවා. "නෑ, නෑ, ඒ විස්තර මම ඔයාට ඉතුරු කළා. ඒත් අපිට යුග ගාණකින් හොඳ ශෝකාන්ත ආදර කතාවක් අහන්න දකින්න ලැබිලා නැහැ."

"හෝව්, ඔක්කෝටම කලින්, මම ආදරේ ගැන කිසිම දෙයක් කිවුවෙ නැහැ. ඊළඟ කාරණේ තමයි, ශෝකාන්තයක් මොකටද!"

"ආදරේට අතිත් හැමදේම යටයි," ඇෆ්‍රොඩයිට් පොරොන්දු වුණා. "බලන්න හෙලෙන් සහ පැරිස් දිහා. ඒ දෙන්නා අතරට වෙන කිසිම දේකට එන්න එයාලා ඉඩ දුන්න ද?"

"ඉතින් එයාලා නේද ට්‍රෝජන් යුද්දෙ පටන්ගෙන මිනිස්සු දාස් ගාණකට මැරෙන්න සැලැස්සුවේ?"

"පුහ්. ඒකෙන් වැඩක් නැහැ. ඔයා, ඔයාගේ හදවත අනුව යන්න."

"ඒත්... ඒක කොහේ යනව ද කියලා මම දන්නෙ නැහැ නේ. මගේ හදවත, මම කිවුවේ."

එයා අනුකම්පා සහගතව හිනාවුණා. එයා ඇත්තටම ලස්සනයි. ඒ එයාට ලස්සන මුහුණක් තිබුණු නිසා විතරක් ම නෙවෙයි. එයා ආදරය ගැන කොයි තරම් තදින් විශ්වාස කළා ද කියනවා නම්, එයා ඒ ගැන කතා කරද්දි ඔල්මාද නොවී ඉන්න කොහෙත්ම බැරි වුණා.

"ඒ ගැන නොදැන ඉන්න කොට සතුටු වෙන්නත් අමාරුයි," ඇෆ්‍රොඩයිට් කිවුවා. "ඒක මිහිරි වේදනාවක්, එහෙම නේද? ඔයා ආදරේ



කාටද, ඔයාට ආදරේ කවුද කියලා විශ්වාස නැතිව ඉන්න එක? ඔහ්, මේ ළමයි නම්! ඒක කොච්චර ලස්සන ද කියනවා නම් මට ඇඬෙන්න වගෙයි."

"එපා, එපා," මම කිවුවා. "අඬන්න නම් එපා."

"ඒ වගේම, බය වෙන්නෙපා," එයා කිවුවා. "ඔයාට මේක ලේසි කම්මැලි දෙයක් වෙන්න මම ඉඩ තියන්නෑ. ඉස්සරහට ඔයාව පුදුම කරන්න මම ගොඩක් දේවල් ලෑස්ති කරලා තියෙනවා. දුක. දෙගිඩියාව. ඔහ්, තව ටිකක් ඉවසගෙන ඉන්නකෝ."

"ඇත්තටම ඒකට කමක් නෑ," මම එයාට කිවුවා. "වැඩිය කරදර වෙන්නෙපා."

"ඔයා නම් හරිම ෂෝක් අනේ. ඔයා වගේ හොඳ කොල්ලෙක්ගේ හදවත කඩන්න මගේ හැම දුවෙක්ටම ඉඩ ලැබෙන්න කියලා මම ප්‍රාර්ථනා කරනවා."

ඇෆ්‍රොඩයිට් ඇස්වල කඳුළු පිරෙමින් තිබුණා. "දූන්, ඔයා ගියොත් හොඳයි. ඒ වගේම මගේ මහත්තයාගේ පළාතේ දී පරිස්සම් වෙන්න, පර්සි. කිසිම දෙයක් ගන්නෙපා. එයාගේ වැඩකට නැති කුණු කන්දල් ගැන එයා හරියට කලබල වෙනවා."

"මොකක්?" මම ඇසුවා. "ඔයා කිවුවේ හෙෆාස්ටස් ද?"

ඒත් කාරයේ දොර විවර කළ ඒරීස් මගේ උරහිසෙන් අල්ලා එළියට ඇද දැමුවා.

මගේ ආදරයට අධිපති දෙවඟන බැහැදැක්ම ඉවරයි.

★★★

"ඔහේ වාසනාවන්තයි, මැට්ටෝ," ඒරීස් මාව ලිමොසිනයෙන් ඉවතට තල්ලු කළා. "ඒකට සතුටු වෙනවා."

"මොකටද?"

"අපි හොඳට සලකපු එකට. මෙතැන මම විතරක් හිටියා නම්-"

"ඉතින් ඔයා තාම මාව මැරුවෙ නැත්තෙ ඇයි?" මම එකටෙක කිවුවා. ඒක යුද්ධයට අධිපති දෙවියන්ට කියන්න නුසුදුසු කතාවක් වුණත්, එයා ළඟ පාතක ඉන්න හැම වෙලාවකම මට කේන්තියක් සහ සාහසික බවක් දැනුණා.

අන්තිමේ දී මගෙන් බුද්ධිමත් කතාවක් අහන්න ලැබුණා වගේ ඒරිස් ඔළුව වැනුවා.

"ඇත්තටම, ඔහේව මරන්ඩ මං හරිම ආසයි," එයා කිවුවා. ''ඒත් පේනව නේ, මාව හිරවෙලා ඉන්නේ. සමහරවිට ඔහේ ඉතිහාසේ ලොකුම යුද්දෙ පටන් ගනීවි කියලා ඔලිම්පස්වල කතා වෙනවා. ඒ වගේ දෙයක් අවුල් කරන්ඩ තරම් අවදානමක් මට ගන්ඩ බැහැ. ඇරත්, ඇෆ්‍රොඩයිට් හිතන්නේ ඔහේ නළු බට්ටෙක් වගේ එකෙක් කියලා. ඉතින් ඔහේව මැරුවොත්, එයාට මාව නරක කෙනෙක් වගේ පෙනෙයි. ඒත් දුක් වෙන්ඩෙපා. මම, මගේ පොරොන්දුව අමතක කරලා නැහැ. ළඟදීම දවසක, පොඩි එකෝ- ඉක්මනටම- ඔහේට සටන් කරන්ඩ කඩුවක් උස්සන්ඩ වෙයි. අන්න එදාට ඔහේට ඒරිස්ගේ උදහස දැනෙයි."

මම අත් මිටි කරගත්තා. "මොකටද කල් අරින්නේ? මං එක සැරේකුත් ඔහේව පැරැද්දුවා නේ. කොහොමද, දැන් වළලුකරේ තුවාලේ සනීප ද?"

එයා කපටි ලෙස දත් නියෙව්වා. "වරදක් නෑ, මැට්ටෝ. ඒත් ඇනුම්පද කිවුවට ඔහේට ලැබෙන දෙයක් නැහැ. මම හොඳට ලෑස්ති වුණාම සටන පටන් ගන්නම්. එතකල්... මෙතැනින් මකබෑවෙනවා."

එයා අසුරක් ගසද්දී ලෝකයම රතු පාට දූවිලි වලාවක් මැද අංශක තුන්සිය හැටක් කැරකුණා. මම බිමට ඇද වැටුණා.

මම ආපසු නැගිටිද්දී ලිමොසිනය අතුරුදහන් වෙලා. තාර පාර, හෝටලය විතරක් නෙවෙයි මුළු ගිලා ක්ලොව් නගරයම අතුරුදහන් වෙලා. බලන බලන අත ලෝහ කඳු ගොඩ ගැසුණු කහළ ගොඩ මැද මමත්, මගේ යාළුවෝ ටිකත් හිටගෙන හිටියා.

★★★

"එයාට මොකටද ඔයාව ඕනෑ වුණේ?" මම ඇෆ්‍රොඩයිට් ගැන කිවුවාම බියන්කා ඇසුවා.

"ඔහ්, අහ්, දන්නෙ නෑ," මම බොරුවක් කිවුවා. "එයාගේ මහත්තයාගේ කහළ බඩු ගොඩේ දී පරිස්සම් වෙන්න කිවුවා. කිසිම දෙයක් අරගන්න එපා කියලත් කිවුවා."

ෂෝයිගේ ඇස් පටු වුණා. "තට ඒක විතරක් කියලා යන්න ආදරේට අධිපති දෙවඟන විශේෂ ගමනක් ආවා වෙන්න බැහැ.



පරිස්සමෙන්, පර්සි. ඇෆ්‍රොඩයිට් ගොඩක් වීරයන්ව නොමග යවලා තියෙනවා."

"ඒ කතාවට මමත් ෂෝයි එක්ක එකඟයි," තාලියා කිවුවා. " ඔයාට ඇෆ්‍රොඩයිට්ව විශ්වාස කරන්න බැහැ."

ග්‍රෝවර් කොලොප්පමට වගේ මගේ දිහා බලා සිටියා. සහකම්පන සම්බන්ධයයි අනෙක් දේවලුයි නිසා සාමාන්‍යයෙන් එයාට මගේ චිත්තවේග කියවන්න පුළුවන්, ඒ නිසා ඇෆ්‍රොඩයිට් මට කිවුවේ මොනවද කියලා එයා හරියටම දන්න බව මට හැඟුණා.

"ඉතින්," මාතෘකාව වෙනස් කරන්න උවමනාවෙන් මම කිවුවා. "අපි කොහොමද මෙතැනින් එළියට යන්නේ?"

"අර පැත්තට," ෂෝයි කිවුවා. "ඒක තමයි බටහිර."

"ඔයා කොහොමද දන්නේ?"

හඳ එළියෙන් වුණත් එයා ඇස් කරකවන හැටි කොච්චර හොඳින් පේනව ද හිතලා මම පුදුම වුණා. "මහ වලහා ඉන්නේ උතුරු පැත්තේ," එයා කිවුවා, "එතකොට අර පැත්ත බටහිර වෙන්න එපැයි."

එයා බටහිරටත්, ඉන්පසුව උතුරු අහසේ තරු රටාව දෙසටත් අත දිගු කර පෙන්වූවත් පායා තිබූ තරු ගොඩ මැදින් ඒක වෙන් කර හඳුනා ගන්න මට නම් අමාරු වුණා.

"ඔහ්, ඔව් නේ," මම කිවුවා. "අර වලස් මොටා."

ෂෝයි අමනාපයෙන් බැලුවා. "ටිකක් ගරු කරලා කතා කරනවා. ඌ සෑහෙන හොඳ වලහෙක්. වටිනා කියන ප්‍රතිමල්ලවයෙක්"

"ඔයා කතා කරන්නේ ඌ ඇත්තටම හිටියා වගෙයි නේ."

"මේ," ග්‍රෝවර් මැදට පැන්නා. "බලන්න."

අපි කුණු කන්දක් මුදුනට ළඟා වී සිටියා. ලෝහමය බඩු ගොඩවල් හඳ එළියට දිලිසෙමින් තිබුණා: ලෝකඩ අශ්වයින්ගේ කැඩුණු ඔළු, මිනිස් ප්‍රතිමාවල ලෝහ කකුල්, තැළුණු කරත්ත, කඩු, පලිහ සහ වෙනත් ආයුධ ටොන් ගාණකුත් එක්ක දිලිසෙන රන් සහ රිදී කාර්, ශීතකරණ, රෙදි සෝදන යන්ත්‍ර සහ පරිගණක කොටස් වගේ නවීන දේවලුත් එතැන තිබුණා.

"වාව්," බියන්කා කිවුවා. "අර බඩු... සමහර ඒවා ඇත්තම රත්තරන් වගෙයි නේ."

"එහෙම තමයි," තාලියා මූණ කළු කරගෙන කිවුවා. "පර්සි කිවුවත් වගේ, කිසිම දෙයක් අල්ලන්නවත් එපා. මේක තමයි දෙවිවරුන්ගේ කුණු එකතු කරන තැන."

"කුණු?" ග්‍රෝවර් රන්, රිදී සහ මැණික්වලින් සැදූ ලස්සන ඔටුන්නක් අහුල ගත්තා. එහි පැත්තක් කැඩී තිබුණේ හරියට පොරෝ පහරකින් දෙපළු වෙලා වගෙයි. "ඔයා මේවට කුණු කියල ද කියන්නේ?"

එයා එයින් කෑල්ලක් කඩාගෙන හපන්න ගත්තා. "මාර රහයි!"

තාලියා ඔටුන්න බිමට වැටෙන්න එයාගේ අතට ගැසුවා. "මම ඇත්තටම කිවුවේ!"

"බලන්න!" කෑගැසූ බියන්කා ලෝකඩ වළලුවල සහ රන් පිගන්වල හැප්පෙමින් කන්ද පහළට දුව ගොස් හඳ එළියට රිදී පාටින් දිලිසෙමින් තිබුණු දුන්නක් අහුල ගත්තා. "දඩයක්කාරියෙකුගේ දුන්නක්!"

දුන්න ඇකිළෙන්න පටන් ගනිද්දී එයා පුදුමයෙන් කෑගැසුවා. ඒක අඩ හඳක හැඩයේ කොණ්ඩා කටුවකට හැරුණා. "ඒක හරියට පර්සිගේ කඩුව වගෙයි!"

ෙZසෝයිගේ මූණ අඳුරු වුණා. "ඒක ආපහු දාන්න, බියන්කා."

"ඒත්-"

"ඒක මෙතැන තියෙන්නේ මොකක්හරි හේතුවක් නිසා. මේ කහළ ගොඩට විසි කරන ඕනෑම දෙයක් මෙතැනම තියෙන්න ඕනෑ. ඒකේ දෝෂයක් ඇති. නැත්නම් ශාපයක් ඇති."

බියන්කා අකමැත්තෙන් කොණ්ඩා කටුව බිමට දැමුවා.

"මම මේ තැනට කැමති නැහැ," තාලියා කිවුවා. එයා හෙල්ලයේ මිට තදින් අල්ල ගත්තා.

"ඔයා හිතන්නේ මිනීමරු ෆ්‍රිජ් එකක් අපිව මරන්න එයි කියල ද?" මම ඇසුවා.

එය මට තද බැල්මක් හෙළුවා. " ෙZසෝයි කිවුවා හරි, පර්සි. මෙතැනට බඩු විසි කරලා තියෙන්නේ මොකක්හරි හේතුවකට. දැන්, එන්න යමු, අපි මේකෙන් පිට වෙමු."

"ඒ ඔයා ෙZසෝයි එක්ක එකඟ වුණ දෙවෙනි පාර," මම කෙඳිරුවත් තාලියා ගණන් ගත්තෙ නැහැ.



අපි කුණු කඳු සහ නිම්න අතරින් පාර හොයාගෙන යන්න පටන් ගත්තා. මහ වලහා නොතිබෙන්න, අනන්තයටම පැතිරිලා වගේ පෙනුණු ඒ කුණු ගොඩේ අපිව අතරමං වෙන්න ඉඩ තිබුණේ ඒ කඳු ඔක්කොම එක වගේ නිසයි.

අපි එතැන තිබුණු ලටපට එහෙමම තියෙන්න ඇරිය බව මම කියන්න කැමතියි, ඒත් ඒ සමහරක් කොච්චර ආසා හිතෙන දේවල් ද කියනවා නම්, ඒවා අතට අරන් නොබලා ඉන්න අපිට බැරි වුණා. ඇපලෝගේ වීණාවේ හැඩයට සැදූ ඉලෙක්ට්‍රික් ගිටාරයක් මට හමු වුණා. ග්‍රෝවර් ලෝහවලින් සැදූ කැඩුණු ගහක් හොයාගත්තා. ඒක කෑලිවලට පෙති ගසා තිබුණත් එහි සමහර අතුවල තවමත් රන්වන් කුරුල්ලෝ වසා සිටියා. ග්‍රෝවර් උන්ව අතට ගනිද්දී උන් තටු ගහන්න උත්සාහ කරමින් කැරකුණා.

අන්තිමේ දී සැතපුම් බාගයක් විතර ඉදිරියෙන් කහළ ගොඩේ කෙළවර- කාන්තාරය හරහා දිවෙන අධිවේගී මාර්ගයේ විදුලි එළි අපිට දකින්න ලැබුණා. ඒත් අපිටත් පාරටත් අතරමැදින් තිබුණේ...

"ඒ මොකක්ද ඒ?" තාලියා හීල්ලුවා.

අපිට ඉදිරියෙන් තිබුණේ අනෙක් ඒවාට වඩා විශාල සහ දිග කන්දක්. ඒක පාපන්දු පිටියක් තරම් පළල සහ කණුවක් තරම් උස, තැනිතලා මුඳුන් හා ප්‍රපාත ඇති ලෝහ කන්දක් වගෙයි. කන්දේ එක් කෙළවරක කෙලින් සිටවූ මහත ලෝහ කුලුනු දහයක් එක පෙළට තිබුණා.

බියන්කා ඒ දිහාවට රැවුවා. "ඒවා හරියට-"

"කකුලේ ඇඟිලි වගේ," ග්‍රෝවර් කිවුවා.

බියන්කා ඔළුව වැනුවා. "ලොකුම ලොකු කකුල් දෙකක ඇඟිලි."

ෙZසෝයි සහ තාලියා සැකයෙන් පිරුණු බැල්මක් හුවමාරු කරගත්තා.

"අපි වටෙන් යමු," තාලියා කිවුවා. "ගොඩාක් ඈතින්."

"ඒත් පාර තියෙන්නෙ මෙතනින් එහා පැත්තෙ නේ." මම විරුද්ධ වුණා. "මේක නැගලා එහා පැත්තට යන එක ඉක්මන්."

ටොයිංංග්..!

Scanned with CamScanner

තාලියා හෙල්ලය මැනුවා, ෂෙසා්යි දුනුදිය ඇද්දා, ඒත් ඒක කළේ ග්‍රෝවර් කියලා ඒ වෙලාවේ මට තේරුණා. එයා ලෝහ කැල්ලකින් ඇඟිලිවලට දමා ගහලා, ඒක එක ඇඟිල්ලක වැදිලා ගැඹුරු දෝංකාරයක් නැගුණේ හරියට ඒ කුලුන බොල් වගෙයි.

"ඔයා මොකටද එහෙම කළේ?" ෂෙසා්යි ප්‍රශ්න කළා.

ග්‍රෝවර් ඇකිළුණා. "මං දන්නෑ. මම, අහ්, බොරු කකුල්වලට කැමති නැද්ද කොහෙදෝ."

"මෙහෙ එන්න." තාලියා මගේ දිහා බැලුවා. "වටෙන් යමු."

මම වාද කළේ නැහැ. ඒ ඇඟිලි ටික මාවත් බය ගන්වන්න පටන් ගෙන තිබුණා. මං කියන්නේ, අඩි දහයක් උස ලෝහ ඇඟිලි ටිකක් කැටයම් කරලා, ඒවා කුණු ගොඩක හිටවන්නෙ කවුද?

විනාඩි කීපයක ගමනකින් පස්සේ අන්තිමේ දී අපි අධිවේගී මාර්ගයට ළඟා වුණා- ඒක අත හැර දැමූ, එහෙත් හොඳින් ආලෝකමත් කළ කළු තාර පටියක්.

"අපි ඒකෙන් එළියට ආවා," ෂෙසා්යි කිවුවා. "දෙවිවරුන්ට ස්තුති වේවා."

ඒත් පෙනුණු හැටියට දෙවිවරුන්ට අපේ ස්තුතිය උවමනා වුණේ නැහැ වගෙයි. ඒ මොහොතේ කුණු පොඩි කරන යන්ත්‍ර දහසකින් ලෝහ අඹරනවා වගේ හඬක් මට ඇසුණා.

අපි වේගයෙන් හැරුණා. අපිට පිටුපසින්, කුණු කන්දක් කැකෑරෙමින් ඉහළ නැගුණා. ඇඟිලි දහය පහළට ඇල වුණා. ඒවා ඇඟිලි වගේ පෙනුණු හේතුව ඒ වේලාවේ මට තේරුම් ගියා; ඒවා කකුල් දෙකක ඇඟිලි තමයි. ලෝහ කඳු අතරින් ඉහළ නැගුණේ ග්‍රීක යුද සන්නාහයෙන් සැරසුණු ලෝකඩ යෝධයෙක්. එයා හිතා ගන්නත් බැරි තරම් උසයි- හරියට අත් කකුල් තියෙන උස ගොඩනැගිල්ලක් වගෙයි. එයා හඳ එළියෙන් දුෂ්ට ලෙස දිලිසුණා. අපි දිහා බලන්න පහළට හැරෙද්දී එයාගේ මූණ අංග විකල වී ඇති බව මට පෙනුණා. එයාගේ මූණේ වම් පැත්ත බාගෙට දිය වී ගොස් තිබුණා. එයාගේ මළ බැඳුණු සන්ධිවලින් කිරි කිරි හඬ නැගුණා. සන්නාහයෙන් ආවරණය වූ එයාගේ පපුවේ ඝන දූවිලි තට්ටුව උඩ යෝධ ඇඟිල්ලකින් යමක් ලියා තිබුණා: මාව හෝදන්න.

"ටාලෝස්!" ෂෙසා්යි හීල්ලුවා.



"කවුද- කවුද ටාලෝස්?" මට ගොත ගැහුණා.

"හෙෆාස්ටස් හදපු එකක්," තාලියා කිවුවා. "ඒත් මේක මුල්ම එක වෙන්න බැහැ. මේක චූටි වැඩියි. සමහරවිට මුල් එකේ ආකෘතියක් වෙන්න ඇති. දෝෂ තියෙන මොඩල් එකක්."

'දෝෂ තියෙන' කතාවට යෝධයා කැමති වුණේ නැහැ. ඉණ පටිය වෙතට අත ගෙන ගිය එයා කඩුව ඇදලා ගත්තා. කොපුව තුළින් එය ඇදී එද්දී ලෝහ මත ලෝහ ඇතිල්ලෙන හඬ බිහිසුණු වුණා. කඩු තලය අඩු තරමේ අඩි සියයක්වත් දිග වෙන්න ඇති. එයට මළ බැඳී මොට වූ පෙනුමක් තිබුණත් ඒක ප්‍රශ්නයක් වෙයි කියලා මට නම් හිතුනේ නැහැ. ඒකෙන් පාරක් වැදුනොත් යුද නැවක හැප්පුණා වගේ තියෙයි.

"කවුරුහරි මොනවාහරි අරගෙන," ෂෙසා්යි කිවුවා. "කවුද ඒ?"

එයා චෝදනාත්මක බැල්මෙන් මගේ දිහා බැලුවා.

මම ඔළුව හෙල්ලුවා. "මම මොනවා කළත්, හොරකම් නම් කරන්නෑ."

බියන්කා මුකුත් කිවුවේ නැහැ. ඒ වේලාවේ එයාගේ මුහුණේ වරදකාරී පෙනුමක් තිබුණා කියලා මට දිවුරන්න වුණත් පුළුවන්, ඒත් ඒ ගැන කල්පනා කරන්න තරම් කාලයක් මට තිබුණේ නැහැ. මොකද, යෝධ ටාලෝස් පොළොව දෙදරවමින්, දුරෙන් අඩක් එකවර ගෙවාගෙන අපි දිහාවට අඩියක් තැබුවේ ඒ මොහොතේ දියි.

"දුවන්න!" ග්‍රෝවර් බෙරිහන් දුන්නා.

ඒක හොඳ උපදේශයක් තමයි, ඒත් ඒකෙන් වැඩක් නැහැ. තිවාඩු පාඩුවේ හෙමින් ඇවිදගෙන ආවත් යෝධයාට අපිව අල්ලන එක කජු කනවා වගේ වැඩක්.

නේමියන් සිංහයා ළඟ දී කළ විදිහටම අපි බෙදිලා ගියා. තාලියා අධිවේගී පාර පහළට දුවන අතරේම එයාගේ පලිහ ඉහළට එසෙව්වා. යෝධයා විදුලි රැහැන් පේළියකට කඩු පහරක් ගසද්දී ඒවා විදුලි පුපුරු විසුරුවමින් තාලියාගේ පාර හරහා කඩා වැටුණා.

ෂෙසා්යිගේ ඊතල යෝධයාගේ මුහුණට ඇදී ගියත් ඒවා ලෝහයේ වැදී කුඩු වුණා විතරයි. ඒ අතරේ ග්‍රෝවර් එළු පැටියෙක් වගේ බෑ ගාමින් ලෝහ කන්දක් උඩට නඟින්න ගත්තා.

බියන්කායි මමයි කැඩුණු කරත්තයක් පිටුපස සැඟවුණා.

"ඔයා මොනවාහරි අරගෙන," මම කිවුවා. "අර දුන්න."

"නෑ!" එයා කිවුවත්, එයාගේ කටහඬ සැලුණා.

"ඒක ආපහු දාන්න!" මම කිවුවා. "ඒක විසි කරන්න!"

"මම... මම ඒ දුන්න ගත්තෙ නැහැ! අනික, දුන් පරක්කු වැඩියි."

"ඔයා මොනවද ගත්තේ?"

එයාට උත්තර දෙන්න ඉඩක් ලැබෙන්න කලින්, තද කිරි කිරි හඬක් සමග අපිට ඉහළින් අහස වසාගෙන කළු හෙවණැල්ලක් මතු වුණා.

"අයින් වෙන්න!" බියන්කා එක්ක මම කන්ද පහළට දුවද්දී අපි සැඟවී සිටිය තැන යෝධයාගේ කකුලට පෑගී ආවාටයක් හැදුණා.

"හේයි, ටාලෝස්!" ග්‍රෝවර් මොර ගැසුවා, ඒත් රාක්ෂයා අපි දෙන්නා දිහා බලාගෙන කඩුව එසෙව්වා.

ග්‍රෝවර්, එයාගේ බටනළා වලින් කඩිනම් තාලයක් වාදනය කළා. ඒත් එක්කම අධිවේගී පාර පුරා වැටී තිබුණු විදුලි රැහැන් නටන්න ගත්තා. ග්‍රෝවර් කරන්න යන දේ ඊට තත්පරයකට විතර කලින් මට තේරුම් ගියා. තවමත් විදුලි රැහැන් ඇමිණී තිබුණු එක කණුවක් ටාලෝස්ගේ කකුල පිටුපසට ඉගිලී ඇවිත් එයාගේ කෙණ්ඩය වෙලා ගත්තා. එසැණින්ම පුපුරු ගැසූ රැහැන්වලින් යෝධයාගේ පිටුපස පුරා විදුලි ධාරාවක් පැතිරුණා.

ටාලෝස් විදුලි පුපුරු විහිදුවමින් එක තැන කැරකෙන්න ගත්තා. ග්‍රෝවර් අපිට පණ බේරගන්න තත්පර කීපයක් අරන් දීලා තිබුණා.

"ඉක්මන් කරන්න!" මම බියන්කාට කතා කළා. ඒත් එයා ගල් ගැහිලා වගේ එතැනම සිටියා. එයා සාක්කුවෙන් චූටි ලෝහ අනුරුවක්-දෙවියෙකුගේ ප්‍රතිමාවක් එළියට ගත්තා. "මේක... මේක ගත්තේ නිකෝට දෙන්න. එයා ළඟ නැත්තෙ මේ පිළිමේ විතරයි."

"මේ වගේ වෙලාවක ඔයා කොහොමද මිතොමැජික් ගේම් එකක් ගැන හිතන්නේ?" මම ඇසුවා.

එයාගේ ඇස්වල කඳුළු පිරිලා තිබුණා.



"ඒක බිමට දාන්න," මම කිවුවා. "සමහරවිට එතකොට යෝධයා අපිට යන්න දෙයි."

එයා අදිමදි කරමින් ඒක බිමට දැමුවත් වෙනසක් වුණේ නැහැ.

යෝධයා දිගටම ග්‍රෝවර්ව ලුහුබඳිමින් සිටියා. එයා ගැසූ කඩු පහරක් ග්‍රෝවර්ව අඩි දෙක තුනකින් මග අරිමින් ලටපට කන්දක වැදුණා. ඒත් කන්දෙන් කඩා හැලුණු ලෝහ කෑලි ග්‍රෝවර්ව යට කරගෙන ගියා, ඊට පස්සෙ තව දුරටත් මට එයාව දකින්න ලැබුණේ නැහැ.

"නෑ!" තාලියා මොර දුන්නා. එයා හෙල්ලය දිගු කරද්දී එයින් පැන නැගුණු නිල් පාට විදුලියක් රාක්ෂයාගේ දණහිසේ වැදී ඒ කකුල බකල ගැහුණා. යෝධයා බිමට ඇද වැටුණත්, ඒ ඉක්මනින්ම වගේ ආපහු නැගිටින්න පටන් ගත්තා. එයාට කිසිම හැඟීමක් දැනීමක් දැනුණා ද කියන්න මට තේරුනේ නැහැ. එයාගේ බාගෙට දිය වුණ මුහුණේ කිසිම හැඟීමක් නොතිබුණත්, තට්ටු-විස්සක්-උස-ගොඩනැගිල්ලක්-වගේ යුද භටයෙකුගෙන් බලාපොරොත්තු විය හැකි තරමට එයාට කේන්ති ගිහින් කියලා මට හැඟුණා.

අපිව පාගා දමන්න කකුල ඔසවද්දී එයාගේ යටි පතුල ස්නිකර් සපත්තුවක අඩිය වගේ සාදා ඇති බව මට දකින්න ලැබුණා. එයාගේ විලුඹේ මනුස්සයෙකුට රිංගා යා හැකි තරම් විශාල සිදුරක් තිබුණා. එය වටා රතු පාටින් පින්තාරු කර තිබුණු වචන මම කියවා තේරුම් ගනිද්දී කකුල ආපසු බිමින් තියලා ඉවරයි: නඩත්තු කටයුතු සඳහා පමණි.

"පිස්සු අදහසක් ආවා," මම කිවුවා.

බියන්කා කලබලෙන් මගේ දිහා බැලුවා. "ඕනෑ දෙයක්."

මම එයාට නඩත්තු සිදුර ගැන කිවුවා. "සමහරවිට මේකව පාලනය කරන්න විදිහක් ඇති. ස්විච් එකක් වගේ දෙයක්. මම ඇතුළට යනවා."

"කොහොමද? ඔයාට එකාගේ කකුල යට හිටගෙන ඉන්න වෙනවා! ඔයාව චප්ප වෙයි."

"එයාව කලබල කරන්න," මම කිවුවා. "මට තියෙන්නෙ හරි වෙලාවට එතැන ඉන්න එක විතරයි."

බියන්කාගේ හනු තද වුණා. "නෑ. මම යන්නම්."

Scanned with CamScanner

"ඔයාට ඒක කරන්න බැහැ. ඔයා තාම මේවට අලුත්! ඔයාට මැරෙන්න වෙයි."

"මේ රාක්ෂයා අපේ පස්සෙ එන්නෙ මගේ වැරැද්ද නිසා," එයා කිවුවා. "ඒක මගේ වගකීමක්. මෙන්න." එයා චූටි දේව ප්‍රතිමාව අහුලාගෙන මගේ අතින් තැබුවා. "මොනවාහරි වුණොත්, මේක නිකෝට දෙන්න. එයාට කියන්න... එයාට කියන්න මට සමාව දෙන්න කියලා."

"බියන්කා, එපා!"

ඒත් එයා මං කියන දේ අහන්න නැවතුනේ නැහැ. එයා රාක්ෂයාගේ වම් කකුලට පහර දෙන්න පැන්නා.

මොහොතකට තාලියා යෝධයාගේ අවධානය ගත්තා. මේ යෝධයා සද්දන්ත වුණත් වේගවත් නැති බව එයා තේරුම් ගෙන තිබුණා. පැගිලා චප්ප වෙන්නේ නැතිව එයාට කිට්ටුවෙන් ඉන්න පුළුවන් නම්, ඔයාට මැරෙන්නෙ නැතිව එයාගේ වටේ දුවන්න වුණත් පුළුවන්. අඩු තරමේ, මේ තාක් දුරට ඒක හරි ගියා.

යෝධයාගේ කකුල ළඟට දුව ගිය බියන්කා එයාගේ බරට දෙදරන ලෝහ ගොඩ උඩ නොවැටී හිටගෙන ඉන්න උත්සාහ කළා.

"ඔයා මොනවද කරන්නේ?"ඉසෝයි එයාට මොර ගසා ඇසුවා.

"මේකගේ කකුල උස්සන්න බලන්න!" එයා කිවුවා.

ඉසෝයි රාක්ෂයාගේ මුහුණ ඉලක්ක කර විදපු ඊතලයක් කෙලින්ම නාස් පුඩුවක් ඇතුළට පියඹා ගියා. සීරුවෙන් හිටගත් යෝධයා ඔළුව හෙල්ලුවා.

"හේයි, කුණු කොල්ලා!" මම මොර දුන්නා. "මෙහෙ බලනවා."

එයාගේ කකුල ළඟට දුව ගිය මම මහපටැඟිල්ලට රිප්ටයිඩ්ගෙන් කෙටුවා. මගේ මායා කඩුවෙන් ලෝකඩ ඇඟිල්ලේ කොටසක් කැපුණා.

අවාසනාවට, මගේ සැලසුම වැඩ කළා. පහළට හැරී මගේ දිහා බැලූ ටාලෝස් මාව කුරුමිණියෙක් වගේ පොඩි කරලා දාන්න කකුල එසෙව්වා. බියන්කා මොනවා කරනවද මට පෙනුනේ නැහැ. මට ආපහු හැරිලා දුවන්න සිද්ධ වුණා. මට අඟල් දෙකකට විතර පිටුපසින් කකුල බිම වදිද්දී මාව පැත්තකට විසි වුණා. මාව මොකකදෝ තදින් වැදී බිම ඉන්දවුණා. මාව ඔලිම්පස් වායු සමීකරණ යන්ත්‍රයක හැප්පිලා.



රාක්ෂයා මාව ඉවර කරන්න ලෑස්ති වුණත්, කොහොමහරි කුණු ගොඩෙන් එළියට ආව ග්‍රෝවර් පිස්සුවෙන් වගේ නළා වාදනය කරන්න ගත්තා. එයාගේ සංගීතයේ බලේට ඇදී ආ තවත් විදුලි කණුවක් ටාලෝස්ගේ කකුලට පහර දෙන්න ගත්තා. රාක්ෂයා ආපසු හැරුණා. ග්‍රෝවර්ට තිබුණේ පණ බේරගෙන එතැනින් දුවන්නයි, ඒත් එයා මායාවන් කරලම මහන්සියෙන් හෙම්බත් වෙලා ඉන්න ඇති. අඩියක් දෙකක් අමාරුවෙන් තැබූ එයා බිමට ඇදගෙන වැටුණත්, ආයේ නැගිට්ටේ නැහැ.

"ග්‍රෝවර්!" තාලියායි මමයි දෙන්නම එයා දිහාවට දිවුවා, ඒත් අපි පරක්කු වැඩි වෙන බව මම දැන සිටියා.

ග්‍රෝවර්ව චප්ප කරන්න කඩුව එසවූ රාක්ෂයා හිටිවනම ගල් ගැහුණා.

ටාලෝස් ඔළුව දෙපැත්තට වනන්න ගත්තේ හරියට එයාට නුපුරුදු සංගීතයක් ඇහෙනවා වගෙයි. එයා අත පය අමුතු තාලෙට හරවමින්, කුකුළෙක් වගේ නටන්න ගත්තා. ඊට පස්සේ අත මිටි කරගෙන එයාගෙම මූණට ගහගත්තා.

"නියමයි, බියන්කා!" මම මොර දුන්නා.

ඉසෝයි තැති ගැන්විලා වගේ මගේ දිහා බැලුවා. "එයා ඇතුළෙ ද?"

යෝධ රාක්ෂයා එහෙ මෙහෙ විසි වෙද්දී අපි තවමත් ඉන්නේ අනතුරේ බව මට තේරුම් ගියා. තාලියායි මමයි ග්‍රෝවර්ව ඩැහැගෙන, අධිවේගී පාර පැත්තට දිවුවා. ඉසෝයි දැනටමත් අපිට ඉදිරියෙන් දුවමින් සිටියා. "බියන්කා එන්නෙ කොහොමද?" එයා මොර ගසා ඇසුවා.

තවත් වරක් ඔළුවට ගසා ගත් යෝධයා කඩුව බිම දැමුවා. එයාගේ ඇඟ පුරා වෙවුලීමක් පැතිර ගිහින් විදුලි රැහැන් දෙසට වැටෙන්න ගියා.

"බලාගෙන!" මම මොර දුන්නත් වැඩක් වුණේ නැහැ.

යෝධයාගේ වළලුකර රැහැන්වල පැටලෙද්දී, නිල් පාට විදුලි කම්පන එයාගේ ඇඟ පුරා පැතිරුණා. එයාගේ ඇඟ ඇතුළ විදුලි පරිවරණය කරලා ඇති කියලා මම බලාපොරොත්තු වුණා. ඇතුළේ මොනවා වෙනවා ඇති ද මට කිසිම අදහසක් තිබුණේ නැහැ. යෝධයා

Scanned with CamScanner

ආපසු කහළ ගොඩ පැත්තට ඇල වෙද්දී එයාගේ දකුණු අත ගැලවී බිහිසුණු හඬක් නගමින් ලෝහ ගොඩට ඇද වැටුණා - දඩෝංංං!

එයාගේ වම් අතත් ගැලවී වැටුණා. එයාව සන්ධිවලින් වෙන් වෙන්න ගත්තා.

ටාලෝස් දුවන්න ගත්තා.

"ඔහොම ඉන්නවා!" ෂෙසා්යි මොර දුන්නා. අපි එයා පසුපස දිවූවත්, එයාට කිට්ටු වෙන්න අපිට කොහෙත්ම බැරි වුණා. යකඩ යකාගේ කෑලි දිගින් දිගටම ගැලවී වැටෙමින් අපේ මග ඇහිරුවා.

යෝධයාගේ ඉහේ සිට කෑලි කැඩී වැටෙන්න ගත්තා: එයාගේ ඔළුවත්, පපුවත්, අන්තිමේ දී කකුල් දෙකත් කඩා වැටුණා.

සුන්බුන් ගොඩ අසලට දිවූ අපි බියන්කාගේ නම කියා කෑගසමින් පිස්සුවෙන් වගේ එයාව හෙව්වා. අපි අති විශාල හිස් කුහර තුළත්, කකුල් හා ඔළුව ඇතුළටත් රිංගමින් බැලුවා. ඉර පායාගෙන එන තුරුම හෙව්වත් අපිට එයාව හොයාගන්න ලැබුණේ නැහැ.

බිම ඉඳගත් ෂෙසා්යි වැලපෙන්න ගත්තා. එයා අඬනවා දැකලා මම ගොඩාක් පුදුම වුණා.

කේන්තියෙන් වියරු වැටී කෑගැසූ තාලියා, එයාගේ හෙල්ලයෙන් යෝධයාගේ තැළුණු මුහුණ උල තිබ්බා.

"අපි දිගටම හොයමු," මම කිවුවා. "දැන් එළිය වැටිලා නේ. අපිට එයාව හොයාගන්න පුළුවන් වෙයි."

"නෑ අපිට බැහැ," ග්‍රෝවර් මූසල හඬින් කිවුවා. "ඒක වෙන්න තිබුණ විදිහටම සිද්ධ වුණා."

"ඔයා මොනවද කියවන්නේ?" මම තදින් ඇසුවා.

එයා කඳුළු පිරුණු ඇස් දෙකෙන් මගේ දිහා බැලුවා. ''අනාවැකිය. *'වැසි නැති දේශයේ දී එකෙකු නැති වනු ඇත.'*''

ඇයි මට ඒක කලින් නොතේරුණේ? ඇයි මං වෙනුවට එයාට යන්න මම ඉඩ දුන්නේ?

මෙන්න දැන් අපි කාන්තාරයක් මැද. ඒ වගේම බියන්කා ඩි ආන්ජෙලෝ යන්න ගිහින්.

# 14

# මට 'ඩෑම්' ප්‍රශ්නයක් ඇති වුණා

කුණු ගොඩ කෙළවරක තිබිලා අපි පරණ ට්‍රක් රථයක් හොයා ගත්තා. ඒක කොච්චර පරණ ද කියනවා නම්, ඒක තමන්ගේ කැමැත්තෙන්ම කුණු ගොඩට පනින්න ඇති. ඒත් කොහොමදෝ එන්ජිම පණ ගැන්වුණා. ටැංකිය පිරෙන්නම ඉන්ධන තිබුණු නිසා ඒක ණයට අරන් යන්න අපි තීරණය කළා.

තාලියා එය පැදවූවා. ෂෙසා්යි, ග්‍රෝවර් හෝ මම තරමට එයා කම්පනය වෙලා නැහැ වගෙයි පෙනුණේ.

"ඇටකෝට්ටෝ මේ ළඟ පාතකම ඇති," එයා අපිට සිහිපත් කළා. "අපි දිගටම යන්න ඕනෑ."

පැහැදිලි නිල් අහස යටින්, ඇස් ගිනි කණ වට්ටන තරම් දීප්තිමත් වැල්ල උඩින් එයා අපිව කාන්තාරය හරහා රැගෙන ගියා. ෂෙසා්යි තාලියා එක්ක ඉදිරියෙන් වාඩි වුණා. ග්‍රෝවරුයි මමයි පිටුපස ගැලේ වාඩි වුණා. වාතය සිසිල් හා වියළි වුණා, ඒ වුණත් බියන්කා නැති වුණාට පස්සේ කාලගුණය මේ තරම් ප්‍රිය මනාප වෙන එක අපහාසයක් වගෙයි පෙනුණේ.

බියන්කාට ජීවිතයෙන් මිල ගෙවන්න සිද්ධ කළ පුංචි ප්‍රතිමාව වටේ මගේ ඇඟිලි වෙළුණා. ඒක මොන දෙවියන්ට අයිති ද කියලවත් මට හිතාගන්න බැරි වුණා. නිකෝ නම් දන්නවා ඇති.

''ඔහ්, දෙවියනේ... මම නිකෝට මොනවද කියන්නේ?''

Scanned with CamScanner

බියන්කා තවමත් කොහේ හරි ඇති කියලා විශ්වාස කරන්න මට ඕනෑ වුණා. ඒත් එයා යන්නම ගිහින් කියලා මට දැනුණා.

"ඒක වෙන්න තිබුණේ මට," මම කිව්වා. "යෝධයා ඇතුළට මට යන්න තිබුණා."

"එහෙම කියන්න එපා!" ග්‍රෝවර් බයෙන් කුලප්පු වුණා. "ඇනබෙත්ව නැති වුණා මදිවට, දැන් බියන්කාවත් නැති වෙලා. ඔයා හිතනව ද එහෙම වුණා නම් මට ඒක දරා ගන්න පුළුවන් වෙයි කියලා..." එයා නහය ඉහළට ඇද්දා. "ඔයා හිතනව ද වෙන කාටවත් මගේ හොඳම යාළුවා වෙන්න පුළුවන් කියලා?"

"අහ්, ග්‍රෝවර්..."

එයා තෙල් වැකුණු රෙදි කෑල්ලකින් ඇස් යට පිස දමද්දී, එහි තිබුණු තෙල් කුණු එයාගේ මූණේ තැවරුණේ හරියට එයා යුද්ධයකට යන්න මූණ පාට කරගෙන වගෙයි. "මම... මම හොඳින්."

ඒ වුණත් එයා හිටියේ හොඳින් නෙවෙයි. නිව් මෙක්සිකෝවේ දී සිදු වූ දේට පස්සේ- අර කැලෑ හුළඟ හමා ඇවිත් සිදු වූ දේට පස්සේ- එයා හිටියේ දුර්වල වෙලා වගේම වෙනදාටත් වඩා හැඟීම්බර වෙලා. ඒ ගැන එයා එක්ක කතා කරන්න මම බය වුණේ, එයා කෑ මොර දීලා අඬන්න ඉඩ තිබුණ නිසයි.

මට වඩා බය වෙලා කලබල වෙන යාළුවෙක් ඉන්න එකෙන් එක හොඳක් සිද්ධ වුණා. මට අධෛර්යමත් වෙලා දිගටම ඉන්න බැරි බව මම එයින් තේරුම් ගත්තා. බියන්කා ගැන කල්පනා කරන එක පැත්තකින් තියලා තාලියා වගේ ගමනට හිත යොදවන්න මට සිද්ධ වුණා. එයයි ෂෝයි දෙන්නා ට්‍රක් එකේ ඉස්සරහට වෙලා මොනවා කතා කරනවා ඇති ද හිතලා මම පුදුම වුණා.

***

ගැඹුරු දොරුවක් හරහා ගලා ගිය ගං ඉවුරක දී ට්‍රක් රථයේ ඉන්ධන අවසන් වුණා. එහෙම වුණ එකත් හොඳයි, මොකද පාරත් එතැනින් කෙළවර වුණා.

බිමට බැස්ස තාලියා දොර තදින් වසා දැමුවා. එසැණින්ම ටයරයකුත් පුපුරා ගියා. "මරු. දැන් මොකද කරන්නේ?"

මම ක්ෂිතිජය පරීක්ෂා කර බැලුවා. එහි බලන්න තරම් දෙයක් තිබුණේ නැහැ. අතරින් පතර පැන නැගුණු මුඩු කඳු ගැට සමග හතර



අතටම විහිදී ගිය කාන්තාරයේ උනන්දුව දනවන දේකට තිබුණේ ගැඹුරු දොරුව විතරයි. යාර පනහක් විතර පළල, කොළ පාට වතුර පිරුණු ගඟ ඒ තරම් විශාල නොවුණත්, එය කාන්තාරය හරහා යෝධ කැළැලක් කපා තිබුණා. අපේ දෙපතුල් යටින් ගල් ප්‍රපාතය පහළටම ඇදී ගියා.

"අතන පාරක් තියෙනවා," ග්‍රෝවර් කිව්වා. "අපිට ගඟ ළඟට බහින්න පුළුවන් වෙයි."

එයා කියපු පාර හොයා ගන්න උත්සාහ කළ මට අන්තිමේ දී දකින්න ලැබුණේ බෑවුම් මුහුණත දිගේ පහළට ඇදෙන පටු ගැට්ත්තක්. "ඒක එළුවන්ගේ පාරක්," මම කිව්වා.

"ඉතින්?" එයා ඇසුවා.

"අපේ ඉතුරු අය එළුවෝ නෙවෙයි නේ."

"අපිට ඒක කරන්න පුළුවන්," ග්‍රෝවර් කිව්වා. "මං හිතන්නේ."

මම ඒ ගැන කල්පනා කර බැලුවා. මීට කලිනුත් මම ප්‍රපාත බෑවුම්වලින් බැහැලා තිබුණා තමයි, ඒත් මම ඒකට කැමති වුණේ නම් නැහැ. ඒ වෙලාවේ තාලියා දිහා බලපු මට එයා කොයි තරම් සුදුමැලි වෙලා ද කියලා දකින්න ලැබුණා. උස් තැන්වලට එයාගේ ඇති බය නිසා... එයාට කවදාවත් ඒක කරන්න බැරි වෙයි.

"නෑ," මම කිව්වා. "මම, අහ්, හිතන්නේ අපි ගඟ දිගේ උඩට ගියොත් හොඳයි."

"ඒත්-" ග්‍රෝවර් කිව්වා.

"මෙහෙ එනවා," මම කිව්වා. "ඇවිද්දට කකුල් ගෙවෙන්නෑ."

මම තාලියා දිහාවට බැල්මක් හෙළුවා. එයා මට ඇස්වලින් ස්තුති කළා.

උඩු ගං බලා සැතපුම් බාගයක් විතර යද්දී පහසුවෙන් වතුරට බැසිය හැකි බෑවුමක් ළඟට අපි ආවා. ගං ඉවුරේ බෝට්ටු කුලියට දෙන තැනක් තිබුණත්, එය ශීත සෘතුව වෙනුවෙන් වසා දමා තිබුණා. ඒත් මම එහි කවුන්ටරය උඩ රන් ඩ්‍රැච්මා කීපයකුත්, අපි බෝට්ටු දෙකක් ණයට ගත් බව කියවෙන සටහනකුත් තැබුවා.

"අපි ගඟ උඩහට යන්න ඕනෑ," ෂෝයි කිව්වා. කහළ ගොඩෙන් පස්සෙ මට එයා කතා කරනවා ඇසුණු මුල්ම වතාව එයයි. හෙම්බිරිසා

උණක් හැදිලා වගේ එයා කතා කළ විදිහ මාව කණස්සල්ලට පත් කළා. "වතුර පාර සැර වැඩියි වගේ."

"ඒ වැඩේ මට බාර දෙන්නකෝ," මම කිවුවා. අපි බෝට්ටු වතුරට ඇද්දා.

හබල් ගන්න යද්දී තාලියා මාව පැත්තකට ඇදලා ගත්තා. ''ඉස්සෙල්ලා කරපු දේට ස්තුතියි."

"ඒක මතක් කරන්නෙපා."

"ඔයාට ඇත්තටම පුළුවන් ද..." එයා රළ පාර දෙසට ඔළුව දිගු කළා. "ඔයා දන්නව නේ."

"මං හිතනවා. සාමාන්‍යයෙන් මම වතුරෙ දී දක්ෂයි නේ."

"ඔයා ෂෙසා්යිව එක්ක යනව ද?" එයා ඇසුවා. "මං හිතන්නේ, අහ්, සමහරවිට ඔයාට පුළුවන් වෙයි එයාගේ හිත හදන්න."

"එයා ඒකට කැමති වෙන එකක් නැහැ."

"අනේ? මං දන්නෑ මට එයත් එක්ක එක බෝට්ටුවේ යන එක දරාගන්න පුළුවන් වෙයි ද කියලා. එයා... එයා මාව බය කරනවා."

මට කරන්න ඕනෑ වුණ අන්තිම දේ ඒක වුණත්, මම ඔළුව වැනුවා.

තාලියාගේ උරහිස් ඉහිල් වුණා. "මං ඔයාට මේකට ණයයි."

"දෙකකට."

"එක හමාරකට," තාලියා කිවුවා.

එයා මට කෑ මොර නොදෙන වෙලාවට මම ඇත්තටම එයාට කැමති බව එයා හිනා වෙද්දී එක තත්පරේකට මට සිහි වුණා. ආපසු හැරුණු එයා, එයාලගේ බෝට්ටුව වතුරට ගන්න ග්‍රෝවර්ට උදවු කරන්න ගියා.

ඇත්තම කියනවා නම්, මට රළ පහර පාලනය කරන්න කිසිම මහන්සියක් වෙන්න ඕනෑ වුණේ නැහැ. අපේ බෝට්ටු වතුරට දැමූ හැටියේම, බෝට්ටුවෙන් එපිට බැලූ මට ජල දෙවඟනෝ දෙන්නෙක් මගේ දිහා බලා ඉන්නවා දකින්න ලැබුණා. එයාලත් සාප්පු සංකීර්ණයක දී සාමාන්‍යයෙන් දකින්න ලැබෙන ගෑනු ළමයි වගේම වුණත්, වෙනසකට තිබුණේ එයාලා වතුර යට සිටි එකයි.



හේයි, මම කතා කළා.

එයාලා මට මුකුළු හිනාවක් විය හැකි බුබුළු පිට කිරීමක් කළා. ඒ ගැන මට සහතික නැත්තේ ජල දෙවඟනන්ව තේරුම් ගන්න මට ටිකක් අමාරු නිසයි.

*අපි ගඟ උඩට යන්න හදන්නේ,* මම එයාලට කිවුවා. *ඔයාලා හිතනව ද ඔයාලට-*

මම කියලා ඉවර වෙන්නත් කලින් ජල දෙවඟනෝ දෙන්නා බෝට්ටුව බැගින් තෝරාගෙන, අපිව ගඟ ඉහළට තල්ලු කරන්න පටන් ගත්තා. අපේ ගමන කොයි තරම් වේගයෙන් පටන් ගත්ත ද කියනවා නම් ආපස්සට ගැස්සුණ ග්‍රෝවර් බෝට්ටු පතුලේ කුර දෙකත් උඩ දාගෙන වැටිලා හිටියා.

"මට ජල දෙවඟනෝ පෙන්නන්න බැහැ," ෂෙසා්යි ගෙරෙව්වා.

බෝට්ටුව පිටුපසින් වතුර පාරක් ෂෙසා්යිගේ මූණට වේගයෙන් විදුණා.

"යක්ෂණියෝ!" ෂෙසා්යි දුන්නට අත යැවූවා.

"හෝව්, හෝව්," මම කිවුවා. "එයාලා සෙල්ලම් කරනවා විතරයි."

"තුච්ඡ දිය හොල්මන්. උන් කවදාවත් මට සමාව දුන්නෙ නැහැ."

"සමාව දෙන්නෙ මොකටද?"

එයා දුන්න ආපසු උරහිසේ එල්ලා ගත්තා. "ඒක සෑහෙන කාලෙකට කලින් වෙච්ච දෙයක්. ඒවගෙන් වැඩක් නැහැ."

අපිට දෙපසින් ප්‍රපාත බෑවුම් නැගී සිටිද්දී අපි වේගය වැඩි කරමින් ගඟේ ඉහළට ඇදුණා.

"බියන්කාට වුණ දේ ඔයාගේ වැරැද්දක් නෙවෙයි," මම එයාට කිවුවා. "ඒකට වග කියන්න ඕනෑ මමයි. මම නේ එයාට යන්න දුන්නේ."

එයින් මට බනින්න පටන් ගන්න ෂෙසා්යිට පොටක් පෑදෙයි කියලා මම හිතුවා. අඩු තරමේ ඒකෙන්වත් එයාගේ හිතේ දුක, කේන්තිය පිට වෙයි.

ඒත් ඒ වෙනුවට එයාගේ උරහිස් එල්ලා වැටුණා. "නෑ, පර්සි. මේ ගවේෂණයට එන්න එයාට බල කරේ මමයි. මම ඕනෑවටත් වඩා කලබල වෙලයි හිටියේ. එයා බලගතු අර්ධ-ලෝහිතයෙක්. එයාට

කරුණාවන්ත හදවතක් තිබුණා, ඒ ඇරත්... මම... මම හිතුවේ එයා ළඟ ලෙෆ්ටිනන්ට් වෙයි කියලා."

"ඒත් ඔයා නේ ලෙෆ්ටිනන්ට්."

එයා හී කොපුවේ පටිය තදින් මිරිකා ගත්තා. දැන් එයාට තිබුණේ මීට කලින් කවදාවත් මම එයාගෙන් දැකලා නැති තරම් විඩාපත් පෙනුමක්. "කිසිම දෙයක් සදාකාලික නෑ, පර්සි. අවුරුදු දෙදහකටත් වැඩි කාලයක් තිස්සෙ මම දඩයක්කාරියන්ව මෙහෙයවූවා, ඒ වුණත් මගේ නුවණ වැඩි දියුණු වෙලා නැහැ. දැන් ආර්ටෙමිස් අනතුරක වැටිලා."

"බලන්න, ඒකට ඔයාට දොස් පවරගන්න ඔයාට බැහැ."

"මමත් බලෙන් හරි එයා එක්ක ගියා නම්-"

"ඔයා හිතන්නේ ආර්ටෙමිස්ව පැහැරගෙන යන්න තරම් බලගතු දෙයක් එක්ක ඔයාට සටන් කරන්න පුළුවන් කියල ද? එහෙම වුණා නම් ඔයාට කරන්න කිසිම දෙයක් නැති වෙනවා."

Zසෝයි උත්තර දුන්නේ නැහැ.

ගඟ දෙපස බෑවුම් වඩ වඩාත් උස් වෙන්න ගත්තා. දහවල දීප්තිමත් වුණත් බෑවුම්වලින් දිගු සෙවණැලි වතුර හරහා වැටී වතුරේ සීතල තවත් වැඩි කළා. මම නොසිතාම මගේ සාක්කුවෙන් රිප්ටයිඩ් පිටට ගත්තා. පෑන දිහා බලද්දී Zසෝයිගේ බැල්ම වේදනාබර වුණා.

"මේක හැදුවෙ ඔයා නේ." මම කිවුවා.

"තට කිවුවේ කවුද?"

"මම හීනෙන් දැක්කා."

එයා මගේ දිහා සෝදිසියෙන් බලා සිටියා. මට පිස්සු කියලා බනින්න එයා ලෑස්ති වෙන බව මට සහතික වුණත් එයා කළේ සුසුමක් හෙළපු එක විතරයි. "ඒක තෑග්ගක්. ඒ වගේම අත් වැරැද්දක්."

"කවුද ඒ වීරයා?" මම ඇසුවා.

Zසෝයි ඔළුව හෙල්ලුවා. "මට එයාගේ නම කියන්න සිද්ධ කරන්න එපා. ආයේ කවදාවත් ඒක කියන්නෙ නැහැ කියලා මම දිවුරුවා."

"ඔයා හැසිරෙන්න හරියට එයා මම දන්න කෙනෙක් වගෙයි."



"තුඹ දන්නවා ඇති කියලා මට සහතිකයි, වීරයෝ. තුඹ වගේ කොල්ලෝ හැමෝටම ඕනෑ එයා වගේ වෙන්න නෙවෙයි ද?"

එයාගේ හඬ කොයි තරම් කර්කශ වුණා ද කියනවා නම්, ඒ කියූ දේ තේරුම අහන්නේ නැතිව ඉන්න මම තීරණය කළා. රිප්ටයිඩ් දිහා බැලූ මම මුල්ම වතාවට ඒක ශාප වැදුණු එකක් ද හිතලා පුදුම වුණා.

"ඔයාගේ අම්මා ජල දේවතාවියක් ද?" මම ඇසුවා.

"ඔව්, ඒලියෝති. එයාට දුවලා පස් දෙනයි. මගේ සහෝදරියෝ ටිකයි, මමයි. හෙස්පෙරිඩීස්ලා."

"බටහිර කෙළවරේ තියෙන උයනේ ඉන්න කෙල්ලො ටික නේද. අර රත්තරන් ඇපල් ගහකුයි, ඒක මුර කරන්න මකරෙකුයි ඉන්නේ."

"ඔව්," Zසෝයි කල්පනාබරව කිවුවා. "ලැඩොන්."

"ඒත් එතැන සහෝදරියෝ හතර දෙනෙක් විතරයි නේ ඉන්නේ?"

"දැන් එහෙම තමයි. මාව පිටුවහල් කරලා. අමතක කරලා දාලා. මම කියලා කෙනෙක් කවදාවත් නොහිටියා වගේ මාව මකලා දාලා."

"ඇයි?"

Zසෝයි මගේ පෑනට ඇඟිල්ල දිගු කළා. "මම, මගේ පවුලට ද්‍රෝහි වෙලා වීරයෙකුට උදවු කරපු නිසා. ඒ ගැන පුරාවෘත්තවලවත් හොයාගන්න නැහැ. ඒ වීරයා මං ගැන කිසිම සඳහනක් කළේ නැහැ. එයා ලැඩොන්ට කෙලින්ම පහර දෙන්න ගිහින් වැරදුණාම, මගේ තාත්තව රවට්ටලා ඇපල් හොරකම් කරන ක්‍රමය එයාට කියලා දුන්නෙ මමයි, ඒත් ඒකෙ නම්බුව එයා තනියම ගත්තා."

"ඒත්-"

*ගොර්-ගොර්, ගොර්-ගොර්*, මගේ හිත තුළ ජල දෙවඟනෝ කතා කළා. බෝට්ටුවල වේගය අඩු වෙමින් තිබුණා.

ඉදිරිය බැලූ මට එයට හේතුව දකින්න ලැබුණා.

එයාලට අපිව රැගෙන යන්න පුළුවන් උපරිම දුර මෙච්චරයි. ඉදිරියෙන් පාපන්දු ක්‍රීඩාංගනයක් තරම් විශාල වේල්ලක් අපේ පාර හරස් කරගෙන තිබුණා.

***

"හූවර් ඩෑම්," තාලියා කිවුවා. "ඒක ගොඩක් ලොකුයි නේ."

අපි ගං ඉවුරේ සිටගෙන ඉදිරියේ කඳු බෑවුම් දෙකක් අතරින් ඉහළට නැඟී සිටින අති විශාල කොන්ක්‍රීට් අඩ කවය දිහා බලා සිටියා. වෙල්ල මුදුනේ එහෙ මෙහෙ යමින් සිටි මිනිසුන්ව අපිට පෙනුණේ මැස්සෝ තරම් පොඩිවටයි.

ජල දෙවඟනෝ අසන්තෝෂයෙන් ගොරවමින් ආපසු යන්න ගියා. එයාලා කියපු වචනයක්වත් මට නොතේරුණත්, එයාලගේ ලස්සන ගඟ හරස් කරමින් සාදා ඇති මේ වෙල්ලට එයාලා වෛර කරන බව නම් පැහැදිලිවම පෙනුණා. වෙල්ලේ වාන් දොරෙන් පිටවන වතුර පහරකට හසු වී අපේ බෝට්ටු කැරකෙමින් ගඟ පහළට පාවී ගියා.

"අඩි හත්සියක් උසයි," මම කිවුවා. "මේක හදලා තියෙන්නේ 1930දී."

"සත අක්කර මිලියන පහක වතුර රඳවගන්න පුළුවන්," තාලියා කිවුවා.

ග්‍රෝවර් සුසුමක් පිට කළා. "මේක තමයි එක්සත් ජනපදයේ ලොකුම ඉදිකිරීම් ව්‍යාපෘතිය."

ෂෝයි අපිව කන්න වගේ බලන් හිටියා. "තුඹලා කොහොමද ඔච්චර දේවල් දන්නේ?"

"ඇනබෙත්," මම කිවුවා. "එයා ගෘහ නිර්මාණ ශිල්පයට ආසයි."

"මේ වගේ ස්මාරක ගැන එයා පිස්සු වැටිලා හිටියේ," තාලියා කිවුවා.

"හැම වෙලාවෙම දොඩවන්නේ ඒවා ගැන," ග්‍රෝවර් නහය ඉහළට ඇද්දා. "කනක් ඇහෙන්න නෑ."

"එයත් මෙතැන හිටියා නම්," මම කිවුවා.

අනෙක් අය ඔළුව වැනුවා. ෂෝයි තවමත් අපි දිහා අමුතු විදිහට බලාගෙන හිටියත් මම ගණන් ගත්තේ නැහැ. ඇනබෙත් පෞද්ගලිකව කැමතිම තැනක් වූ හූවර් වෙල්ලට අපිට එන්න ලැබිලත් ඒක බලාගන්න එයා මෙතැන නැති එක ඉරණමේ කෲරකමක් කියලයි මට හිතුණේ.



"අපි උඩට යන්න ඕනෑ," මම කිවුවා. "එයා වෙනුවෙන්. අඩු තරමේ, අපි මෙතැනට ආවා කියලා එයාට කියන්නවත්."

"තට පිස්සු තද වෙලා," ෂෝයි තීරණය කළා. "ඒත් පාර වැටිලා තියෙන්නෙත් එහෙන් තමයි." එයා වෙල්ල මුදුනේ තිබුණු විශාල රථ ගාලක් දෙසට අත දිගු කර පෙන්වුවා. "එහෙනම් ඒ ගමන්ම වටපිට බලාගන්නත් පුළුවන් වෙයි."

***

උඩට නගින්න අඩි පාරක් හොයාගන්න අපිට පැයක් විතර ඇවිදින්න සිද්ධ වුණා. ඒ අඩි පාර ගඟේ නැගෙනහිර පැත්තෙන් ඉහළට වැටී තිබුණා. එයින් උඩට ගිය අපි ඉන් පසුව වෙල්ල පැත්තට ඉබාගාතේ ඇවිද ගියා. එය මුදුනේ සීතල සහ සුළඟ තදබල වුණා. එහි එක් පැත්තකින් මුඩු කාන්තාර කඳුවලින් වට වූ ජලාශය ඈතින් ඈතට පැතිරී යද්දී, අනෙක් පැත්තෙන් ලෝකයේ භයානකම ස්කේට්බෝඩ් පදින බෑවුම වගේ වෙල්ල අඩි හත්සියක් පහළින් වූ ගඟට හා වාන් දොරටුවලින් පිටවෙන ජල කඳ අතරට ඇද වැටුණා.

තාලියා වෙල්ලේ ගැටිය අද්දරින් හැකි තරම් ඈතට වී පාර මැදින් ගමන් කළා. ග්‍රෝවර් දිගින් දිගටම සුළඟ ඉව කරමින් සිටියේ බය වෙලා වගෙයි, එයා කිසිවක් නොකීවත් එයාට රාක්ෂ ඉවක් දැනිලා කියලා මට තේරුණා.

"උන් කොයි තරම් කිට්ටුවෙන් ද ඉන්නේ?" මම එයාගෙන් ඇහුවා.

එයා ඔළුව හෙල්ලුවා. "සමහරවිට ඒ තරම් කිට්ටු නැතුව ඇති. මට හිතෙන්නෙ මේ ඩෑම් එකේ හුළඟයි, අපි වටේටම තියෙන කාන්තාරෙයි නිසා... උන්ගේ ගඳ හැතැප්ම ගාණක් දුරට පැතිරෙනවා ඇති. ඒත් ඒක පැති තුන හතරකින්ම දැනෙනවා. මං ඒකට නම් කැමති නැහැ."

මමත් ඒකට කැමති වුණේ නැහැ. දැනටමත් බදාදා වෙලා ඉවරයි, ඒ කියන්නේ දක්ෂිණායනයට තව දවස් දෙකයි තිබුණේ. ඒත් අපිට ගොඩක් දුර යන්න ඉතුරු වෙලා තිබුණා. ඒ නිසා අපිට තවත් රාක්ෂයෝ ඕනෑ වුණේ නැහැ.

"නැරඹුම් මැදිරියේ කෑම කඩයක් තියෙනවා," තාලියා කිවුවා.

"ඔයා මීට කලින් මෙහෙ ඇවිල්ලා තියෙනව ද?" මම ඇහුවා.

"එක පාරක්. ආරක්ෂකයෝ බලන්න ආවා." එයා වෙල්ලේ එහා කෙළවරට අත දිගු කර පෙන්වූවා. එතැන ලොකු ලෝකඩ ප්‍රතිමා දෙකක් තැබූ පොදු චතුරස්‍රයක් බැවුම තුළට කපා තිබුණා. ඒ ප්‍රතිමා පෙනුණේ තටු තියෙන ඔස්කාර් සම්මාන දෙකක් වගෙයි.

"ඒවා මේ ඩෑම් එක හදපු කාලේ සියුස්ට පූජා කරපුවා," තාලියා කිවුවා. "ඇතීනාගෙන් තෑග්ගක්."

ඒවා වටා සංචාරකයෝ රැස්කමින් සිටියා. එයාලා ප්‍රතිමාවල කකුල් දිහා බලන් ඉන්නවා වගෙයි පෙනුණේ.

"එයාලා මොකද කරන්නේ?" මම ඇහුවා.

"කකුලේ ඇඟිලි අත ගානවා," තාලියා කිවුවා. "එයාලා හිතන්නෙ ඒකෙන් වාසනාව ලැබෙනවා කියලා."

"ඒ ඇයි?"

එයා ඔළුව හෙල්ලුවා. "මිනිස්සුන්ට තියෙන්නෙ මහ පිස්සු අදහස් නේ. මේ පිළිම සියුස්ට කැප කරපුවා කියලා දන්නෙ නැති වුණාට, ඒවගේ මොකක්හරි විශේෂත්වයක් තියෙනවා කියලා එයාලා දන්නවා."

"ඔයා කලින් වතාවෙ ආවම ඒ පිළිම ඔයාට කතා කරේ එහෙම නැද්ද?"

එයාගේ මූණ අඳුරු වුණා. මීට කලින් එයා මෙතැනට එන්න ඇත්තේ හරියටම ඒ බලාපොරොත්තුවෙන්- එයාගේ තාත්තාගෙන් මොකක් හෝ සංඥාවක් බලාපොරොත්තුවෙන් කියලා මට තේරුණා. "නෑ. එයාලා මුකුත් කිවුවෙ නැහැ. ඒවා නිකංම තඹ පිළිම විතරයි."

අන්තිම වතාවට අපිට හමු වුණ තඹ පිළිමය මට මතක් වුණා. ඒක නම් නිකංම නිකං හිටියේ නැහැ. කොහොම වුණත් ඒ ගැන මතක් නොකර ඉන්න මම තීරණය කළා.

"අපි ඩෑම් කෑම කඩේ හොයාගමු," ෂෝයි කිවුවා. "ඉඩක් ලැබුණු වෙලාවේ අපි කෑම කමු."

ග්‍රෝවර්ට හිනා ගියා. "'ඩෑම්' කෑම කඩේ?" (Damn -කේන්තිය/ අපේක්ෂා භංගත්වය අඟවයි.)

ෂෝයි තදින් ඇහිපිය ගැහුවා. "ඔව්. මොකක්ද ඒකේ ඇති විහිළුව?"



"මුකුත් නෑ," ග්‍රෝවර් මූහුණ කෙළින් තියාගන්න දඟලමින් කිවුවා. "මටත් 'ඩෑම්' ෆ්‍රෙන්ච් ෆ්‍රයිස් ටිකක් කන්න තිබුණොත් හොඳයි."

ඒ කතාවට තාලියාටත් හිනා ගියා. "මටත් 'ඩෑම්' විවේක කාමරේ පාවිච්චි කරන්න ඕනෑ."

සමහරවිට අපි ශාරීරිකව වගේම මානසිකවත් හෙම්බත් වෙලා සිටි නිසා වෙන්න ඇති, මමත් හිනා වෙන්න පටන් ගත්තා. තාලියායි ග්‍රෝවරුයි මට එකතු වෙද්දී ෂෝයි අපි දිහා බලාගෙන හිටියා. "මට තේරෙන්නෑ."

"මට 'ඩෑම්' වතුර මල පාවිච්චි කරන්න ඕනෑ," ග්‍රෝවර් කිවුවා.

"තව..." තාලියා හුස්ම අල්ලන්න දඟලමින් කිවුවා. "මට 'ඩෑම්' ටී-ෂර්ට් එකක් ගන්න ඕනෑ."

මගේ හිනාව පුපුරා ගියා. මම මුළු දවසම වුණත් හිනා වෙවී ඉන්න ඉඩ තිබුණා, ඒත් ඒ වෙලාවේ මට හඬක් ඇහුණා:

"උම්බෑ."

මගේ මුහුණෙන් හිනාව දිය වී ගියා. ඒක මගේ ඔළුව ඇතුළෙන් ඇහුණු හඬක් ද හිතලා මම පුදුම වුණා, ඒත් ඒ වෙද්දී ග්‍රෝවරුත් හිනාව නවත්තලා. එයා අන්දුමන් වෙලා වගේ වටපිට බැලුවා. "මට ඒ ඇහුණේ හරකෙක් කෑගහනව ද?"

"'ඩෑම්' හරකෙක් ද?" තාලියා හිනා වුණා.

"නෑ," ග්‍රෝවර් කිවුවා. "මම ඇත්තටම කියන්නේ."

ෂෝයි කන් දීගෙන හිටියා. "මට නම් මුකුත් ඇහෙන්නෙ නැහැ."

තාලියා මගේ දිහා බැලුවා. "පර්සි, ඔයා හොඳින් ද?"

"ඔව්," මම කිවුවා. "ඔයාලා යන්නකෝ. මම ඉක්මනට එන්නම්."

"මොකක්ද ප්‍රශ්නේ?" ග්‍රෝවර් ඇහුවා.

"මුකුත් නෑ," මම කිවුවා. "මට... මට විනාඩියක් දෙන්නකෝ. ටිකක් කල්පනා කරන්න."

එයාලා අදිමදි කළත්, මගේ තිබුණු කලබල ගතිය දැකල ද කොහෙදෝ අන්තිමේ දී එයාලා මම නැතිව නැරඹුම් මැදිරියට යන්න

Scanned with CamScanner

ගියා. එයාලා නොපෙනී ගිය හැටියේ ම මම වේල්ලේ උතුරු කෙළවරට දුව ගොස් පහළ බැලුවා.

"උම්බෑ."

ජලාශයේ අඩි තිහක් විතර පහළින් හිටියත් මට එයාව පැහැදිලිව පෙනුණා: ලෝන්ග් අයිලන්ඩ්වල දී හමු වුණ මගේ යාළු සර්ප එළදෙන, බෙසී.

මම වටපිටාවට බැල්මක් හෙළුවා. එතැන ළමයි බුරුතු පිටින් වේල්ල දිගේ එහෙ මෙහෙ දුවමින් සිටියා. ඒ වගේම වැඩිහිටි උදවියත් හිටියා. නමුත් පවුල් කිපයකුත් හිටියත් මේ කිසිවෙක් බෙසීට කිසිම අවධානයක් දක්වන බවක් පෙනුනේ නැහැ.

"ඔයා මොනවද මෙහෙ කරන්නේ?" මම එයාගෙන් ඇසුවා.

"උම්බෑ!"

එයාගේ හඬට හදිසියක් එකතු වෙලා තිබුණේ හරියට එයා මොකක් හෝ දේකට මට අනතුරු අඟවන්න උත්සාහ කරනවා වගෙයි.

"ඔයා කොහොමද මෙහෙට ආවේ?" මම ඇසුවා. අපි හිටියේ ලෝන්ග් අයිලන්ඩ්වලින් සැතපුම් දහස් ගාණක් දුරින්, සැතපුම් සිය ගාණක් රට මැදට වෙන්නයි. එයාට මේ තරම් දුරක් පිනාගෙන එන්න කොහෙත්ම පුළුවන්කමක් නැහැ. ඒ කොහොම වුණත්, දැන් එයා මෙතැනට ඇවිත්.

එක තැන රවුමට පිහිනූ බෙසී වේල්ලේ බිත්තියකට ඔළුවෙන් තට්ටු කළා. "උම්බෑ!"

එයාට උවමනා වෙලා තිබුණේ මාව එක්ක යන්න. මට ඉක්මන් කරන්න කියලයි එයා කිවුවේ.

"මට බැහැ," මම එයාට කිවුවා. "මගේ යාළුවෝ ඇතුළේ."

එයා දුක්බර දුඹුරු පාට ඇස්වලින් මගේ දිහා බැලුවා. ඊට පස්සේ තවත් වරක් හදිසි "උම්බෑ!" හඬක් පිට කළ එයා කරණමක් ගසා වතුර තුළට අතුරුදහන් වුණා.

මට මොනවා කරන්න ද හිතා ගන්න බැරි වුණා. මෙතැන මොකක් හෝ වරදක් තිබුණා. එයා උත්සාහ කළේ මට ඒ ගැන කියන්නයි. පහළට පැනලා එයා පසුපස යන්න කල්පනා කළත්, එතකොටම මට අමුත්තක් දැනුණා. මගේ අත්වල රෝම කෙළින් වුණා. වේල්ලට එන



පාරේ නැගෙනහිර පැත්ත බැලූ මට, මගේ පැත්තට හෙමින් සීරුවේ ඇවිද එන පිරිමි දෙන්නෙක්ව දකින්න ලැබුණා. එයාලා අළු පාට හමුදා නිල ඇඳුම්වලින් ඇටසැකිලි පෙනෙන සිරුරු වසාගෙන සිටියා.

ළමයි කණ්ඩායමක් අතරින් ඇවිද ආ උන් ළමයින්ව පැත්තකට තල්ලු කළා. "හේයි!" ළමයෙක් මොර දෙද්දි එක සෙබළෙක් හැරී බැලුවා. එයාගේ මුහුණ එක මොහොතකට හිස් කබලකට හැරුණා.

"ආහ්!" ළමයා මොර දුන්නා, එයාගේ මුළු කණ්ඩායම ම ආපස්සට ගියා.

මම නැරඹුම් මැදිරිය හොයාගෙන දිවුවා.

පඩිපෙළට කිට්ටු වෙද්දිම මට වාහනයක රෝද තදින් පාරේ ඇතිල්ලෙන හඬ ඇසුණා. වේල්ලේ බටහිර පැත්තෙන් ඇදී ආ කළු වෑනයක් පාර මැද කැරකී නැවතුණේ වයසක මිනිස්සු කිප දෙනෙක්ව නූලෙන් බේරමිනුයි.

විවර වූ වෑනයේ දොරෙන් තවත් ඇටසැකිලි සෙබළු පොකුරක් එළියට පැන්නා. දැන් මාව වට කරලා.

මම පඩිපෙළ පහළටත්, කෞතුකාගාරයේ ඇතුළු වීමේ දොරටුව හරහාත් දිවුවා. "ඒයි, ළමයා!" ලෝහ පරීක්ෂක උපකරණය ළඟ සිටි ආරක්ෂක නිලධාරියා මොර දුන්නත් මම නැවතුනේ නැහැ.

මම ප්‍රදර්ශන භාණ්ඩ අතරින් දුව ගොස් සංචාරක කණ්ඩායමක් පිටුපස සැඟවුණා. මම, මගේ යාළුවන්ව සෙවුවත් එයාලා පේන්න හිටියෙ නැහැ. මේ 'ඩැම්' කෑම කඩේ මොන ලෝකෙ ද?

"නවතිනවා!" ආරක්ෂක නිලධාරියා කෑගැසුවා.

සංචාරක නඩයක් පිරුණු සෝපානය ඇර මට යන්න වෙන තැනක් තිබුණේ නැහැ. එහි වැහෙමින් තිබුණු දොරෙන් මම ඇතුළට රිංගා ගත්තා.

"අපි අඩි හත්සීයක් පහළට යන්නයි හදන්නේ," අපේ මාර්ගෝපදේශිකාව ප්‍රීතිමත් හඬින් කිවුවා. උද්‍යාන පාලිකාවක් වූ එයා කළු කොණ්ඩය පෝනිටේලයකට ගැට ගසා, වර්ණ ගැන්වූ කණ්ණාඩි කුට්ටමක් පැළඳගෙන සිටියා. මං හිතන්නේ, මාව එළවාගෙන කවුරුහරි ආව බවක් එයාට තේරිලා නැහැ. "බය වෙන්න එපා, නෝනාවරුනි මහත්වරුනි, මේ සෝපානය ලේසියෙන් කැඩෙන්නෙ නැහැ."

"මේක කෑම කඩේට යනව ද?" මම එයාගෙන් ඇහුවා.

ඒ කතාවට මට පිටුපසින් සිටි කීපදෙනෙක් හිනා වුණා. මාර්ගෝපදේශිකාව මගේ දිහා බැලුවා. එයාගේ බැල්මේ තිබුණු මොකක්දෝ දේකට මගේ ඇඟ කිලි පොළා ගියා.

"ටර්බයින්වලට, කොල්ලෝ," ගෑනු කෙනා කිවුවා. "උඩ දී මම කරපු හිත් ඇදගන්න විස්තරේට ඇහුම්කන් දුන්නෙ නැද්ද?"

"ඔහ්, අහ්, ඔව් නේ. ඩෑම් එකෙන් පිටවෙන්න වෙන පාරක් නැද්ද?"

"මේ පාර ඒ කෙළවරෙන් ඉවරයි," මට පිටුපසින් සිටි සංචාරකයෙක් කිවුවා. "මෙතැනින් පිට වෙන්න තියෙන එකම පාර තමයි අනිත් සෝපානේ."

එහි දොර විවෘත වුණා.

"ඉස්සරහට යන්න," මාර්ගෝපදේශිකාව කිවුවා. "ඔයාලව පිළිගන්න තව උපදේශකයෙක් කොරිඩෝව කෙළවර ඉන්නවා."

ඒ පිරිස සමග යනවා ඇර මට වෙන කරන්න දෙයක් තිබුණේ නැහැ.

"මේ, කොල්ලෝ," මාර්ගෝපදේශිකාව මට කතා කළා. මම ආපසු හැරී බලද්දී එයා කණ්ණාඩි කුට්ටම ගලවලා. එයාගේ ඇස්වල තිබුණේ වැහි කුණාටු වලාකුළක වගේ පුදුමාකාර අළු පාටක්. "මොළේ පාවිච්චි කරලා වැඩ කරන අය නිතරම තවත් පාරක් හොයා ගන්නවා."

මාව එතැන තනි කරමින් මාර්ගෝපදේශිකාව ඇතුළේ සිටිද්දී ම සෝපානයේ දොරවල් වැසුණා.

ඒ ගෑනු කෙනා ගැන වැඩි යමක් කල්පනා කරන්න ලැබෙන්න කලින් අනෙක් මුල්ලෙන් '**ඩින්ග්**' හඬක් නැගුණා. දෙවෙනි සෝපානයේ දොරවල් ඇරෙද්දී මට නොවැරදිය හැකි හඬක් - ඇටසැකිල්ලක දත් ඇඳි එකට වදින හඬක් ඇසුණා.

ඝන කළු ගලක් කපා සාදා තිබූ උමඟ තුළින් මම අනෙක් සංචාරකයෝ පසුපස දිවුවා. ඒක පෙනුණේ සදහටම දිවීමක් වගෙයි. එහි බිත්ති තෙත් වුණා, ඒ වගේම වාතය විදුලියෙන් සහ වතුරේ ගර්ජනාවෙන් ගුමු-ගුමු හඬ නැගුවා. මම යෝධ බඩු ගබඩාවකට ඉහළින් පිහිටි 'යූ' අකුරේ හැඩයේ සඳලුතලයකින් පිටට ආවා. ඊට අඩි පනහක්



පහළින් යෝධ ටර්බයින් කැරකෙමින් තිබුණා. එය විශාල කාමරයක් වුණත්, ඇඹරිලා විදුලිය නිපදවන ප්‍රභවයක් වෙන්න ටර්බයිනයට පනිනවා ඇරෙන්න වෙනත් පිටවීමේ දොරක් මට හොයාගන්න බැරි වුණා. මට ඒක කරන්න නම් කොහෙත්ම උවමනා වුණේ නැහැ.

තවත් සංචාරක මාර්ගෝපදේශකයෙක් මයික්‍රොෆෝනයකින් නෙවාඩාවේ ජල සැපයුම් ගැන විස්තර කරමින් සිටියා. තාලියාට, ග්‍රෝවර්ට සහ ටෙසෝයිට කරදරයක් වෙන්න එපා කියලා මම යාඥා කළා. සමහරවිට දැනටමත් එයාලව අල්ලගෙන ඇති, එහෙම නැත්නම් අපිව වට කරලා කියලා හාංකවිසියක්වත් දන්නෙ නැතිව එයාලා ආපන ශාලාවට වෙලා කෑම කනවා ඇති. එතකොට තකතීරු මම: අඩි සිය ගාණක් පොළොව යට ගුලක් ඇතුළේ හිර වෙලා.

අනෙක් අයට නොතේරෙන්න මම සෙනඟ වටෙන් ඉදිරියට ගියා. සඳලුතලයේ අනෙක් කෙළවරේ කොරිඩෝවක් තිබුණා- සමහරවිට එතැන මට හැංගෙන්න පුළුවන් වෙයි. මම පහර දීමකට සූදානමෙන් රිප්ටයිඩ් මත අතක් තබා ගත්තා.

සඳලුතලයේ අනෙක් කොණට ළඟා වෙද්දී මට හීන් දාඩිය දාලා තිබුණා. මම පුංචි කොරිඩෝවට ඇතුළු වෙලා උමඟ දිහා ආපසු හැරී බලා සිටියා.

ඒත් එක්කම මට පිටුපසින් තියුණු *ච්ස්!* හඬක් ඇසුණා. ඒක හරියටම ඇටකෝට්ටෙකුගේ හඬක් වගෙයි.

මම නොහිතාම රිප්ටයිඩ්ගේ කොපුව ගලවමින් අනෙක් පැත්ත හැරී කඩු පහරක් ගැසුවා.

මම දෙකට කපන්න ගිය ගෑනු ළමයා මරහඬ දෙමින්, අතේ තිබුණු මුහුණ පිස දමන කඩදාසි ලේන්සු පැකට්ටුව අත ඇරියා.

"ඔහ්, මගේ දෙයියනේ," එයා කෑගැසුවා. "ඔයා හැම වෙලාවෙම නහය හූරන මිනිස්සුන්ව මරනව ද?"

මගේ ඔළුව හරහා ගිය මුල්ම සිතුවිල්ල වුණේ එයාට කඩුවෙන් කිසිම හිරිහැරයක් වුණේ නැහැ කියන එකයි. ඒක කිසිම තුවාලයක් නොකර එයාගේ ඇඟ හරහා ගියා. "ඔයා මනුස්සයෙක්!"

එයා අවිශ්වාසයෙන් මගේ දිහා බැලුවා. "ඒ කතාවෙ තේරුම මොකක්ද? මම මනුස්සයෙක් නේන්නම්! ඔයා කොහොමද මුරකාරයාට අහු නොවී ඔය කඩුව අරන් ආවේ?"

Scanned with CamScanner

"මම එහෙම- පොඩ්ඩක් ඉන්න, මේක කඩුවක් කියලා ඔයාට පේනව ද?"

ගෑනු ළමයා ඇස් දෙක කැරකුවා, ඒවාත් මගේ ඇස් වගේම කොළ පාටයි. එයාට රතු-දුඹුරු පාට බොකුටු කොණ්ඩයක් තිබුණා. එයාගේ නහය රතු වෙලා තිබුණේ හෙම්බිරිසාව හැදිලා වගෙයි. එයා ලොකු මෙරූන් පාට කමිසයක් සහ කලිසමක් හැඳ සිටියා. ඒ කලිසම පුරා පෑන් ඉරි සහ චූටි හිල් වැටිලා තිබුණේ හරියට නිකං ඉන්න වෙලාවට එයා ගෑරුප්පුවකින් ඒකට ඇනලා වගෙයි.

"හොඳයි, ඕක කඩුවක්, එහෙම නැත්නම් ලෝකෙ ලොකුම දත් හාරන කූර." එයා කිවුවා. "එතකොට ඒකෙන් මට මුකුත් වුණේ නැත්තෙ ඇයි? මං කිවුවේ, එහෙම වුණා නම් මං කැමතියි කියලා එහෙම නෙවෙයි. ඔයා කවුද? එතකොට වාව්, මොකක්ද ඔයා ඔය ඇඳගෙන ඉන්නේ? ඒක හදලා තියෙන්නේ සිංහ ලොම්වලින් ද?"

එයා ප්‍රශ්න වට්ටෝරුවක් ම එක දිගට අහගෙන ගියේ මට ගල් ගහනවා වගෙයි. මොනවා කියන්න ද මට හිතාගන්න බැරි වුණා. නේමියන් සිංහ හම ආපහු ලොම්වලට හැරිලවත් ද හිතලා මම කබා අත දිහා බැලුවා, ඒත් මට නම් තවමත් ඒක පෙනුණේ දුඹුරු පාට සීත කබායක් වගෙයි.

ඇටසැකිලි සෙබළු තවමත් මාව ලුහුබැඳගෙන එන බව මම දන සිටියා. ඉතින් මට නාස්ති කරන්න කාලයක් තිබුණේ නැහැ. ඒත් මම කළේ රතු කොණ්ඩකාරි දිහා පුදුමයෙන් බලා සිටි එක විතරයි. වෙස්ටෝවර් ශාලාවේ දී ගුරුවරු රවට්ටන්න තාලියා කළ දේ ඒ වේලාවේ මට සිහි වුණා. සමහරවිට මටත් මීදුම හසුරුවන්න පුළුවන් වෙයි.

මම තදින් හිත ඒකාග්‍ර කරගෙන අසුරක් ගැසුවා. "ඔයාට කඩුවක් පේන්නෙ නැහැ," මම ගෑනු ළමයට කිවුවා. "ඒක නිකං බෝල්පොයින්ට් පෑනක් විතරයි."

එයා තදින් ඇහි පිය ගැසුවා. "ම්... නෑ, ඒක කඩුවක්, පිස්සෝ."

"ඔහේ කවුද?" මම ප්‍රශ්න කළා.

එයා සැරෙන් හුස්මක් පිට කළා. "රේචල් එලිසබෙත් ඩෙයාර්. දැන්, ඔයා මගේ ප්‍රශ්නවලට උත්තර දෙනව ද, නැත්නම් මම කෑගහලා මුරකාරයෝ ගෙන්නන්න ද?"



"නෑ!" මම කිවුවා. "මං කිවුවේ, මම ලොකු හදිස්සියක ඉන්නේ. මාව කරදරේක වැටිලා."

"හදිස්සියක් ද නැත්නම් කරදරයක් ද?"

"ම්, දෙකම වගේ."

මගේ උරහිසට උඩින් බැලූ එයාගේ ඇස් ලොකු වුණා. "නාන කාමරේ!"

"මොකක්?"

"නාන කාමරේට! මට පිටිපස්සෙන්! දැන්ම!"

ඒ ඇයි කියලා නොතේරුණත්, මම එයාට කීකරු වුණා. රේචල් එලිසබෙත් ඩෙයාර් පිටත සිටගෙන සිටිද්දී මම පිරිමි විවේකාගාරය තුළට ලිස්සා ගියා. පස්සේ, ඒක මහා බයගුලු වැඩක් වගේ පෙනුණත්, ඒ වෙලාවේ නම් එයින් මගේ ජීවිතේ බේරුණු බව මට සෑහෙන විශ්වාසයි.

ඇටකෝට්ටෝ ටිකෙන් ටික කිට්ටු වෙද්දී උන් දත් ඇඳි හප්පන සහ පිඹින හඬවල් මට ඇසුණා.

රිප්ටයිඩ් වටා මගේ ග්‍රහණය දැඩි වුණා. මං මොනව හිතල ද එහෙම කරේ? මම මනුස්ස ගෑනු ළමයෙකුට එළියේ මැරෙන්න ඇරියා. මම එළියට කඩා පැනලා සටන් කරන්න සූදානම් වෙද්දිම රේචල් එලිසබෙත් ඩෙයාර් මැෂින් තුවක්කුවක් වගේ කියවන්න පටන් ගන්නවා ඇසුණා:

"ඔහ්, මගෙ දෙයියනේ! ඔයාලා දැක්ක ද ඒ ළමයව? ඔයාලා හොඳ වෙලාවට ආවේ. එයා මාව මරන්න හැදුවා! දෙයියනේ, එයා ළඟ කඩුවකුත් තිබුණා. ඔයාලගේ මුරකාරයෝ කඩු ගත්ත පිස්සන්ටත් මේ වගේ ජාතික ස්මාරක ඇතුළට එන්න දෙනව ද? මං කියන්නේ, දෙයියනේ! එයා අර ටර්බයින් පැත්තට දිවුවා. මං හිතන්නෙ එයා අරකට උඩින් පැන්න ද කොහෙදෝ. සමහරවිට එයාව පහළට වැටෙන්න ඇති."

ඇටකෝට්ටෝ උනන්දුවෙන් කට-කට ගෑවා. උන් ඉදිරියට යන හඬ මට ඇසුණා.

රේචල් දොර ඇරියා. "ඔක්කොම හරි. ඒත් ඔයා ඉක්මන් කළොත් හොඳයි."

Scanned with CamScanner

එයා හිටියේ කම්පනය වෙලා වගෙයි. එයාගේ මූණ අළු පාට වෙලා දාඩිය දාලා තිබුණා.

මම කෙළවරෙන් එබී බැලුවා. ඇටසැකිලි සෙබළු තුන් දෙනෙක් සඳලුතලයේ අනෙක් අන්තයට දුවමින් සිටියා. තත්පර කීපයකට සෝපානයට යන පාර නිදහස් වී තිබුණා.

"මම ඔයාට ණයයි, රේචල් එලිසබෙත් ඩෙයාර්."

"උන් මොක්කු ද?" එයා ඇසුවා. "උන්ව පෙනුණේ හරියට-"

"ඇටසැකිලි වගේ ද?"

එයා නොසන්සුන්ව ඔළුව වැනුවා.

"ඔයා, ඔයාටම උදවුවක් කරගන්න," මම කිවුවා. "ඒක අමතක කරන්න. මාව දැක්කා කියන එකත් අමතක කරලා දාන්න."

"ඔයා මාව මරන්න හැදුවා කියලා අමතක කරන්න?"

"ඔව්. ඒකත්."

"ඒත්, කවුද ඔයා?"

"පර්සි-" මම කියන්න පටන් ගත්තත්, එතකොටම ඇටකෝට්ටෝ ආපසු හැරුණා. "මට යන්න වෙනවා!"

"පර්සි මට යන්න වෙනවා කියන්නෙ මොන වගේ නමක් ද?"

මම පිටවීම දෙසට දිවුවා.

***

සංචාරයේ හොඳම කොටස - 'ඩෑම්' දවල් කෑම රස විඳින ළමයින්ගෙන් ආපන ශාලාව ඇහිරී තිබුණා. තාලියා, ෂෙසෝයි සහ ග්‍රෝවර් කෑම අරගෙන වාඩි වෙමින් සිටියේ දැනුයි.

"අපි යන්න ඕනෑ," මම හුස්ම ඇල්ලුවා. "දැන්ම!"

"ඒත් අපි බියුරිටෝ ගත්තා විතරයි නේ!" තාලියා කිවුවා.

පෞරාණික ග්‍රීක ශාපයක් කොඳුරමින් ෂෙසෝයි නැගිට්ටා. "එයා හරි! බලන්න."

ආපන ශාලාව වටේටම සවි කර තිබූ වීදුරුවලින් ආවරණය කළ නිරීක්ෂණ කවුළු හරහා අපිට හාත්පස පෙනෙන ලස්සන දර්ශනයක්- අපිව මරන්න එන ඇටකෝටු හමුදාවක් දකින්න ලැබුණා.



ඇරිසෝනාවට යන වේල්ලේ නැගෙනහිර පාර අවහිර කරමින් එන දෙන්නෙකුත්, නෙවාඩාවට දිවෙන බටහිර පාර දිගේ එන තුන් දෙනෙකුත් මම ගණන් කළා. ඒ හැමෙකෙක්ම පිස්තෝල සහ බැටන් පොලුවලින් සන්නද්ධව සිටියා.

ඒ වුණත් අපේ ඊළඟ ප්‍රශ්නය තිබුණේ ඊට වඩා ගොඩාක් කිට්ටුවෙන්. ටර්බයින් කාමරයේ දී මාව ලුහුබැන්ද ඇටසැකිලි සෙබළු තුන්දෙනා දැන් පඩිපෙළ ළඟින් මතු වී සිටියා. ආපන ශාලාව හරහා මාව දැකපු උන් දත් ඇඟිලි එකට හැප්පුවා.

"සෝපානේ!" ග්‍රෝවර් කිවුවා. අපි ඒ පැත්තට දිවූවත්, මිහිරි 'ඩිංග්' හඬක් සමග විවර වූ සෝපාන දොර තුළින් තවත් සෙබළු තුන් දෙනෙක් එළියට අඩිය තැබුවා. නිව් මෙක්සිකෝවේ දී බියන්කා දවා අළු කළ සෙබළා ඇර අනෙක් ඔක්කොම එතැන සිටියා. දැන් අපිව හැම අතින්ම වට කරලා.

ඒ වෙලාවේ ග්‍රෝවර්ට සුපිරි, තනිකරම ග්‍රෝවර්-වර්ගයේ අදහසක් පහළ වුණා.

"බියුරිටෝ ෆයිට්!" මොර ගැසූ එයා අතේ තිබූ කෑම එකෙන් ළඟම සිටි ඇටකෝට්ටාට දමා ගැසුවා.

දැන්, ඔයා කවදාවත් පියාඹන බියුරිටෝ පාරක් කාලා නැත්නම්, ඔයා වාසනාවන්තයි කියලා හිතාගන්න. විසි කළ හැකි මාරාන්තික ආයුධ අතරේ ඒවාට අත් බෝම්බ සහ කාලතුවක්ක වෙඩිලි තරම් තැනක් ලැබෙනවා. ග්‍රෝවර්ගේ දවල් කෑම එක වැදිලා ඇටකෝට්ටාගේ හිස්කබල බෙල්ලෙන් ගැලවී බිමට වැටුණා. ආපන ශාලාවේ සිටි අනෙක් ළමයි දැක්කේ මොකක්ද මට විශ්වාස නැති වුණත්, එයාලත් පිස්සුවෙන් වගේ යටිගිරියෙන් කෑගසමින් බියුරිටෝ, චිප්ස් භාජන සහ සෝඩාවලින් එකිනෙකාට ගහගන්න පටන් ගත්තා.

ඇටසැකිලි සෙබළු, උන්ගේ තුවක්කු මානන්න උත්සාහ කළත් ළමයි, කෑම සහ බීම හැම තැනම පියාඹද්දී ඒක කොහෙත්ම කරන්න බැරි වුණා.

මේ අවුල් ජාලය මැද්දේ තාලියායි මමයි පඩිපෙළ මත සිටි අනෙක් ඇටසැකිලි දෙක පෙරළා කුළුබඩු මේසය මතට වැට්ටුවා. ඊට පස්සේ කෑම ජාති අපේ ඔළුවලට උඩින් පාවී යද්දී අපි පහත තට්ටුවට දිවුවා.

Scanned with CamScanner

"දැන් මොකද කරන්නේ?" අපි එළියට පැන ගත්තාට පසු ග්‍රෝවර් ඇසුවා.

එයාට දෙන්න උත්තරයක් මගේ ළඟ තිබුණේ නැහැ. පාරේ සිටි සෙබළු දෙපසින්ම ටිකෙන් ටික අපිට ළං වෙන්න ගත්තා. අපි පාර හරහා අනෙක් පැත්තේ ලෝකඩ ප්‍රතිමා දෙක තිබූ මණ්ඩපයට දිවූවත්, එයින් වුණේ අපිව කන්දත් සෙබළුත් අතරට කොටු වීම විතරයි.

අපිව වටකර අඩ කවයක් සාදමින් ඇටසැකිලි සෙබළු ඉදිරියට ආවා. ආපන ශාලාවේ සිටි උන්ගේ සහෝදරයෝ ටිකත් උන්ට එකතු වෙන්න දුවගෙන ආවා. එකෙක් තවමත් හිස් කබල ඔළුව උඩ රඳවා ගන්න දඟලමින් සිටියා. තවත් එකෙකුගේ මූණ තක්කාලි සෝස් සහ අබ ක්‍රීම්වලින් වැහිලා. තවත් දෙන්නෙකුගේ ඉළ ඇට අතරේ බියුරිටෝ හිරවී තිබුණා. උන් ඒකට සතුටු වුණු බවක් නම් පෙනුනේ නැහැ. බැටන් පොලු ඇද ගත් උන් අපිට පහර දෙන්න දුවගෙන ආවා.

"උන් එකොළහකට අපි හතර දෙනයි," ෆෙසෝයි කෙඳිරුවා. "ඒ මදිවට උන් මැරෙන්නෙත් නැහැ."

"ඔයාලත් එක්ක හිටපු කාලය නියමයි, යාළුවනේ," ග්‍රෝවර් වෙවුලන හඬින් කිවුවා.

මගේ ඇස් කොණට මොකක්දෝ දිලිසෙන යමක් හසු වුණා. මට පිටුපසින් තිබුණු ප්‍රතිමාවේ කකුල්වලට මම බැල්මක් හෙළුවා.

"වාව්," මම කිවුවා. "එයාලගේ ඇඟිලි නියමෙට දිලිසෙනවා නේ."

"පර්සි!" තාලියා කතා කළා. "මේ ඕවට වෙලාවක් නෙවෙයි."

ඒත් මට දිග තල වගේ පියාපත් ඇති ඒ යෝධ ප්‍රතිමා දිහා නොබලා ඉන්න බැරි වුණා. ඒවා අව් වැසි වැදී දුඹුරු පාට ගැන්වී තිබුණත්, ඒවාගේ කකුල්වල ඇඟිලි මිනිස්සු වාසනාව පතා අතගෑම නිසාම අලුත් පැන්සයේ කාසි වගේ දිලිසුණා.

වාසනාව. සියුස්ගේ ආශිර්වාදය.

සෝපානයේ සිටි සංචාරක මාර්ගෝපදේශිකාව ගැන මට සිහි වුණා. එයාගේ අළු පාට ඇස්, එයාගේ හිනාව. එයා කිවුවේ මොකක්ද? *මොළේ පාවිච්චි කරලා වැඩ කරන අය නිතරම තවත් පාරක් හොයාගන්නවා.*

"තාලියා," මම කතා කළා. "ඔයාගේ තාත්තට කතා කරන්න."



එයා මට රැවුවා. "එයා කවදාවත් උත්තර දෙන්නෙ නැහැ."

"මේ සැරේට විතරක්," මම ඉල්លුවා. "උදවු ඉල්ලන්න. මට හිතෙන්නේ... මට හිතෙන්නේ මේ පිළිමවලින් අපිට වාසනාව ලැබෙයි."

ඇටසැකිලි සෙබළු හය දෙනෙක් උන්ගේ තුවක්කු එසවූවා. ඉතිරි පස්දෙනා බැටන් පොලු අරගෙන ඉදිරියට ආවා. අඩි පනහක් දුරින්. අඩි හතළිහක්.

"ඒක කරනවා!" මම මොර දුන්නා.

"බෑ!" තාලියා කිවුවා. "එයා මට උත්තර දෙන්නෙ නැති වෙයි."

"මේ වෙලාව වෙනස්!"

"කවුද කියන්නේ?"

මම පැකිළුණා. "ඇතීනා, මං හිතන්නේ."

මට පිස්සු හැදිලා කියලා හොඳටෝම විශ්වාසයි වගේ තාලියා රවා බැලුවා.

"ඒක කරලා බලන්න," ග්‍රෝවර් බැගෑපත් වුණා.

තාලියා ඇස් වසා ගත්තා. එයාගේ තොල් නිහඬ යාඥාවකින් සෙලවුණා. මම, මගේ යාඥාව ඇනබෙත්ගේ අම්මට යොමු කළේ සෝපානයේ සිටියේ එයා කියලත්- එයා තමන්ගේ දුවව බේරගන්න අපිට උදවු කරන්න උත්සාහ කරනවා කියලත් මම හිතූ දේ හරි ඇති කියලා බලාපොරොත්තු වෙමින්.

ඒත් කිසිවක් සිදු වුණේ නැහැ.

ඇටකෝට්ටෝ අපිව වට කළා. මම, මගේ ආරක්ෂාවට රිප්ටයිඩ් එසෙව්වා. තාලියා, එයාගේ පලිහ එසෙව්වා. ෆෙසෝයි ග්‍රෝවර්ව එයාගේ පිටුපසට අරන් ඇටසැකිලි සෙබළෙකුගේ හිස්කබල ඉලක්ක කර ඊතලයක් මැනුවා.

ඒ වෙලාවේ මගේ උඩට හෙවණැල්ලක් වැටුණා. සමහරවිට ඒ මරණයේ හෙවණැල්ල වෙන්න ඇති කියලා මට හිතුණා. ඒත් ඒ හෙවණැල්ලට යෝධ තටු දෙකක් තියෙන බව ඊළඟ මොහොතේ මට තේරුණා. වේගයෙන් ඇදී ගිය දීප්තිමත් ලෝකඩ පහරකින් බැටන් ලෙළවමින් සිටි පස් දෙනාවම පැත්තකට විසි වුණා.

අනෙක් සෙබළු වෙඩි තියන්න පටන් ගත්තා. මම ආරක්ෂාවට මගේ සිංහ කබාය එසෙව්වත් ඒක උවමනා වුණේ නැහැ. අපි ඉදිරියට

අඩිය තැබූ ලෝකඩ දේව දූතයෝ දෙන්නා එයාලගේ තටු අපි ඉදිරියෙන් පලිහවල් වගේ නැමුවා. ඒවාගේ වැදී බිමට වැටුණු උණ්ඩවලින් තහඩු වහලයකට වැස්සක් වැටෙනවා වගේ හඬක් නැගුණා. දේව දූතයෝ දෙන්නම පිටට පහර ගසද්දී ඇටසැකිලි සෙබළු පාර හරහා විසි වුණා.

"කොල්ලෝ, නැගිටින්න ලැබිච්ච එක කොච්චර හොඳ ද!" පළවෙනි දේව දූතයා කිවුවා. එයාගේ හඬ අමිහිරි, මළ බැඳුණු හඬක් වුණේ හරියට එයාව හැදුවට පස්සේ උගුර තෙමා ගන්නම ලැබිලා නැහැ වගෙයි.

"මගේ කකුලේ ඇඟිලි දිහා බලනවකෝ?" අනෙකා කිවුවා. "සියුස්ටම ඔප්පු වෙච්චාවේ, අර සංචාරකයෝ මොනවා හිතල ද මෙහෙම කළේ?"

දේව දූතයෝ නිසා කොයි තරම් පුදුමයට පත් වුණත්, මම ඊටත් වඩා ඇටසැකිලි සෙබළු ගැන සැලකිල්ලෙනුයි හිටියේ. උන් කීප දෙනෙක් දැනටමත් නැවත එකලස් වෙමින්, ඇට පෑදුණු අත් ආයුධ වෙතට දිගු කරමින් සිටියා.

"මළ වදේ!" මම කිවුවා.

"අපිව මෙහෙන් අරන් යනවා!" තාලියා මොර දුන්නා.

දේව දූතයෝ දෙන්නම එයා දිහා බැලුවා. "සියුස්ගේ ළමයෙක්? ඔව් නේ!"

"ඔයා 'කරුණාකරලා'. කියලා ඉල්លුවොත් නරක ද, මිස් සියුස්ගේ ළමයෝ?" එක්කෙනෙක් ඇසුවා.

"කරුණාකරලා!"

එකිනෙකා දෙස බලාගත් දේව දූතයෝ උරහිස් ඇකිළුවා.

"ඇගේ පතේ හිරි ඇර ගන්නත් පුළුවන් නේ," එකෙක් තීරණය කළා.

එයාලගෙන් කෙනෙක් තාලියාව සහ මාවත්, අනෙකා ෂෙසෝයිව සහ ග්‍රෝවර්වත් ඩැහැගත්තා. අපි වේල්ලට සහ ගඟට ඉහළින් පියඹා යද්දී අපිට පහළින් ඇටසැකිලි සෙබළු චූටි තිත් තරමට ඇකිළුණා. උන්ගේ තුවක්කුවල හඬ කඳුවල වැදී දෝංකාර දෙනවා ඇසුණා.

# 15

# මම නත්තල් සීයාගේ දුෂ්ට නිවුන් සහෝදරයා සමග සටන් කළා

"මේක ඉවර වුණාම මට කියන්න," තාලියා කිවුවා. එයා සිටියේ තදින් ඇස් වසාගෙනයි. ප්‍රතිමාව අපිව නොවැටෙන්න අල්ලගෙන සිටියත්, තාලියා එයාගේ අත තදින් බදාගෙන සිටියේ මේ ලෝකේ තියෙන වැදගත් ම දේ ඒක වගෙයි.

"බය වෙන්නෙපා," මම එයාව අස්වැසුවා.

"අපි... අපි ගොඩක් උඩින් ද යන්නේ?"

මම පහළ බැලුවා. අපිට පහළින් හිමෙන් වැසුණු කඳු යායක් වැතිරී තිබුණා. මම කකුලක් දිගු කර එක් මුදුනක වූ හිමවලට පයින් ගැසුවා. "නැහ්," මම කිවුවා. "එච්චර උඩින් නෙවෙයි."

"අපි ඉන්නෙ සියෙරාවල," ෂෙසෝයි මොර දුන්නා. එයයි ග්‍රෝවරුයි අනෙක් ප්‍රතිමාවේ අත්වල එල්ලී සිටියා. "මම මීට කලින් මෙහෙ දඩයම් කරලා තියෙනවා. මේ වේගයෙන්ම ගියොත් තව පැය දෙක තුනකින් අපිට සැන් ෆ්‍රැන්සිස්කෝවලට යන්න පුළුවන් වෙයි."

"හේයි, හේයි, සැන් ෆ්‍රැන්සිස්කෝ!" අපේ දේව දූතයා කතා කළා. "ඒයි, චක්! අපිට ආයෙමත් අර මැකැනික් ස්මාරකේ ඉන්න පොරවල් මුණ ගැහෙන්න පුළුවන් වෙයි! එයාලා දන්නවා පාටි දාන විදිහ!"

"ඔහ්, කොල්ලෝ," අනෙක් දේව දූතයා කිවුවා. "එහෙ නම් නියමයි!"

"ඔයාලා මීට කලින් සැන් ෆ්‍රැන්සිස්කෝවලට ගිහින් තියෙනව ද?" මම ඇසුවා.

"අපි පිළිම වුණත් ඉඳලා හිටලා හරි ජොලියක් ගන්න එපැයි, නැද්ද?" අපේ ප්‍රතිමාව ඇසුවා. "ඒ මැකැනික්ලා අපිව ඩි යන්ග් කෞතුකාගාරෙට එක්ක ගිහින් එතන හිටපු කිරි ගරුඬ ගෑනු පිළිම ටිකක් හඳුන්වලා දුන්නා, හරිද. ඊට පස්සේ-"

"හැන්ක්!" අනෙක් ප්‍රතිමාව, චක් කතාව මැදට පැන්නා. "මෙයාලා තාම පොඩි එවුන්, මනුස්සයෝ."

"ඔහ්, හරි," ලෝකඩ ප්‍රතිමාවලටත් ලැජ්ජාවෙන් රතු වෙන්න පුළුවන් නම්, හැන්ක්ටත් එහෙම වුණා කියලා මට දිවුරන්න වුණත් පුළුවන්. "ආපසු ගමනට."

අපේ වේගය වැඩි වූ නිසා දේව දූතයෝ මේ ගමන ගැන උද්‍යෝගයෙන් සිටි බව මට කියන්න පුළුවන්. විශාල කඳු වැටි කුඩා කඳු ගැටවලට හැරුණා, ඊටත් පස්සේ අපිට පහතින් භූමිය වගා බිම්, නගර සහ අධිවේගී මාර්ගවලට හැරුණා.

ග්‍රෝවර් කාලය ගෙවාගන්න බට නළා වාදනය කළා. ටෙසා්යි කම්මැලිකමට අපි පසු කරගෙන යන දැන්වීම් පුවරුවලට ඊතල විදින්න පටන් ගත්තා. එයාට වෙළඳ සැලක් දකින්න ලැබෙන හැම වතාවකම- අපි ඒවා දුසිමකට වඩා පසු කළා- ඒවාගේ නාම පුවරු ඉලක්ක කර එයා විද්දේ පැයට සැතපුම් සියයක වේගයෙන් යන අතරේමයි.

තාලියා මුළු ගමන පුරාවටම තදින් ඇස් වසාගෙන සිටියා. ගොඩක් වෙලාවට එයා තනියම කොඳුරන්න ගත්තේ හරියට යාඥා කරනවා වගෙයි.

"අතන දී ඔයා වැඩේ හොඳට කළා," මම එයාට කිවුවා. "සියුස් ඇහුම්කන් දුන්නා."

ඇස් වසාගෙන සිටි නිසා එයා කල්පනා කරන්නේ මොනවද කියලා හිතාගන්න මට අමාරු වුණා.



"සමහරවිට," එයා කිවුවා. "කොහොම හරි, ජෙනරේටර් කාමරේ දී ඔයා ඇටකෝට්ටන්ගෙන් බේරිලා ආවෙ කොහොමද? උන් ඔයාව කොටු කරගත්තා කියලා ඔයා කිවුවා නේ."

මීදුම හරහා දැකීමේ හැකියාවක් තිබුණා වගේ පෙනුණු අරුම පුදුම මනුෂ්‍ය කෙල්ල, රේචල් එලිසබෙත් ඩෙයාර් ගැන මම එයාට කිවුවා. මට පිස්සු කියලා තාලියා බනිවි කියලා මට හිතුණත්, එයා ඔළුව වැනුවා.

"සමහර මිනිස්සු එහෙම තමයි," එයා කිවුවා. "ඒ ඇයි කියලා කවුරුවත් දන්නෑ."

හදිසියේම, මීට කලින් කවදාවත් කල්පනා නොවුණ දෙයක් මගේ හිතට ආවා. මගේ අම්මත් එහෙමයි නේ. අර්ධ-ලෝහිත කන්ද මුඳුනේ දී මිනටෝර්ව දැක්කාම, හරියටම ඒ මොකාද කියලා එයා තේරුම් ගත්තා. මගේ යාළුවා ටයිසන් ඇත්තටම සයික්ලොප්ස් කෙනෙක් කියලා ගිය අවුරුද්දේ මම කිවුවම එයා චුට්ටක්වත් පුදුම වුණේ නැහැ. සමහරවිට එයා මුල ඉඳලම ඒක දැනගෙන ඉන්න ඇති. මම ටිකෙන් ටික ලොකු වෙද්දී අම්මා ඒ තරම් බයවෙලා හිටපු එක ගැන පුදුම වෙන්න දේකුත් නැහැ. එයා මටත් වඩා හොඳට මීදුම හරහා දකින්න ඇති.

"මෙහෙමයි, ඒ කෙල්ල වදකාරියක් තමයි," මම කිවුවා. "ඒ වුණාට මම එයාව වාෂ්ප කරලා නොදැම්මෙ හොඳ වෙලාවට. එහෙම කළා නම් ඒක නරක දෙයක් වෙන්න ඉඩ තිබුණා."

තාලියා ඔළුව වැනුවා. "සාමාන්‍ය මනුස්සයෙක් වෙන්න ලැබෙන එක කොච්චර හොඳ ඇති ද?" එයා කිවුවේ ඒ ගැන සෑහෙන හිතලා තියෙනවා වගෙයි.

★★★

"ඔයාලට කොහෙන්ද බහින්න ඕනෑ?" මාව අඩ නින්දෙන් ඇහැරවමින් හැන්ක් ඇසුවා.

"හෝ," පහළ බැලූ මට කියවුණා.

මීට කලින් මම පින්තූරවලින් සැන් ෆ්‍රැන්සිස්කෝ දැක තිබුණත්, ඇත්තටම දැකලා තිබුණේ නැහැ. මට හිතුණ හැටියට, මට දකින්න ලැබුණු ලස්සනම නගරය එයයි: හරියට පුංචි, පිරිසුදු මැන්හැටන්

නගරයක් වගෙයි. හැබැයි ඒ මැන්හැටන් නගරයත් කොළ පාට කඳු ගැට සහ මීදුම් වලාවලින් වට වී තිබුණා නම් විතරයි. එහි විශාල මුහුදු බොක්කක් හා නෞකාත්, දූපත් හා රුවල් බෝට්ටුත්, මීදුම අතරින් ගෝල්ඩන් ගේට් පාලමත් පෙනුණා. මට හිතුණේ ඒ අපූරු ඡායාරූපයකට කොටු කරගන්න තිබුණා නම් හොඳයි කියලයි.

"අතන," ෂසෝයි යෝජනා කළා. "එම්බාකාඩෙරෝ ගොඩනැගිල්ල ළඟ."

"හොඳ තේරීමක්," චක් කිව්වා. "එතකොට මටයි හැන්ක්ටයි පුළුවන් පරෙයියෝ අතරේ හැංගෙන්න."

අපි හැමෝම එයා දිහා බැලුවා.

"විහිළුවක් කරේ," එයා කිව්වා. "මොකෝ, පිළිමවලට විහිළු කරන්න බෑ කියල ද හිතුවේ?"

ඇත්තම කියනවා නම්, කාටවත් පරෙයියෝ අතරේ හැංගෙන්න සිද්ධ වුණේ නැහැ. උදේ පාන්දර නිසා තවමත් මිනිස්සු දවසේ වැඩවලට එළියට බහින්න පටන්ගෙන තිබුණේ නැහැ. අපි ගොඩ බැස්ස තොටුපොළේ සිටි යාචක මනුස්සයෙක් නම් අපිව දැකලා බය වුණා. හැන්ක්ව සහ චක්ව දැකපු එයා අඟහරු ලෝකෙන් ගොඩ බැස්ස යකඩ දූතයෝ ගැන මොනවදෝ මොර දෙමින් එතැනින් පැනලා දිව්වා.

අපිව බැස්ස වූ පසු ප්‍රතිමා යාළුවෝ සොයා පියඹා ගිය ලෝකඩ දේව දූතයෝ දෙන්නට අපි සමු දුන්නා.

ඊළඟට මොනවා කරන්න ද අපිට කිසිම අදහසක් නැති බව මට මතක් වුණේ ඒ වේලාවෙයි.

අපි බටහිර වෙරළ දක්වාම ආවා. ආර්ටෙමිස් මේ කොහේ හරි ඇති. ඒ වගේම ඇනබෙතුත් ඇති කියලා මම බලාපොරොත්තු වුණා. ඒත් එයාලව කොහොම හොයාගන්න ද මට කිසිම අදහසක් තිබුණේ නැහැ, ඒ මදිවට දක්ෂිණායනය හෙටයි. ආර්ටෙමිස් දඩයම් කරන්න ගිය රාක්ෂයා ගැන කිසිම හෝඩුවාවක් අපිට තිබුණේ නැහැ. මේ ගවේෂණයේ දී ඌ අපිව සොයා එන බවත්, අපිට 'පියමං දක්වන' බවත් කියා තිබුණත්, ඒක සිද්ධ වුණේ නැහැ. දැන් අපි අතේ වැඩි සල්ලියකුත්, යාළුවෝවත්, වාසනාවත් නැතිව තොටුපොළක හිර වෙලා.



කෙටි සාකච්ඡාවකින් පස්සේ මේ අබිරහස් රාක්ෂයා මොකා ද කියලා හොයාගන්න අපි එකඟ වුණා.

"ඒත් කොහොමද?" මම ඇහුවා.

"නෙරෙයස්," ග්‍රෝවර් කිව්වා.

මම එයා දිහා බැලුවා. "මොකක්?"

"ඇපලෝ ඔයාට කරන්න කිව්වේ ඒක නේද? නෙරෙයස්ව හොයාගන්න?"

මම ඔළුව වැනුවා. හිරු දෙවියා එක්ක කළ අන්තිම කතාබහ මට සම්පූර්ණයෙන් ම අමතක වෙලයි තිබුණේ.

"මුහුදේ මහල්ලා," මම සිහි කළා. "මට කිව්වේ එයාව හොයාගෙන, එයා දන්න දේ බලෙන්ම අහගන්න කියලා. ඒත් මං කොහොමද එයාව හොයාගන්නේ?"

ෂසෝයි මූණ ඇද කළා. "නාකි නෙරෙයස්, අහ්?"

"ඔයා එයාව දන්නව ද?" තාලියා කිව්වා.

"මගේ අම්මා මුහුදු දෙවඟනක් නේ. ඔව්, මං එයාව දන්නවා. අවාසනාවට, එයාව හොයාගන්න එච්චර අමාරු නැහැ. කරන්න තියෙන්නෙ ගඳ පස්සේ යන එක විතරයි."

"ඒ කිව්වේ?" මම ඇහුවා.

"එන්න," එයා කිසිම උනන්දුවක් නැතිව කිව්වා. "මම තට පෙන්වන්නම්."

★★★

අපි පුණ්‍යාධාර බඩු පෙට්ටියක් ළඟ නතර වෙද්දී මම කරදරේක වැටෙන්න යන බව මට තේරුණා. විනාඩි පහකට පස්සේ ෂසෝයි මාව කඩමාලු වුණ ෆ්ලැනල් කමිසයකින්, ප්‍රමාණ තුනකින් ලොකු කලිසමකින්, තද රතු ස්නිකර් ජෝඩුවකින් සහ දේදුනු පාට වාටිය පළල් තොප්පියකින් සැරසුවා.

"ඔහ්, නියමයි නේ," ග්‍රෝවර් පුපුරා යන්න හදන හිනාව තද කරගෙන කිව්වා. "දැන් නම් ඔයාව කාටවත් අඳුනගන්න බැහැ."

ෂසෝයි තෘප්තිමත්ව ඔළුව වැනුවා. "නියම පාදඩ කොල්ලෙක්."

"බොහෝම ස්තුතියි," මම ගෙරෙව්වා. "ඇයි මං මේක කරන්නෙ කියලා ආපහු කිවුවා නම්."

"මං තට කිවුවා නේ. මිනිස්සු අතරට කලවම් වෙන්න."

එයා මාව ආපසු ජල තීරය වෙතට කැඳවාගෙන ගියා. බොහෝ වේලාවක් ජැටිය සෝදිසි කරමින් ගත කළ එයා අන්තිමේ දී එක තැනක නැවතුණා. සුප් ලබා දෙන මුළුතැන්ගෙය දහවල් කෑමට විවර කරන තුරු ජැටිය කෙළවර පොදි ගැසී සිටි යාචක පිරිසක් දෙසට එයා අත දිගු කර පෙන්වූවා.

"එයත් ඒ හරියෙ ඇති," ජෙසෝයි කිවුවා. "එයා කවදාවත් වතුරෙන් වැඩි ඈතට යන්නෙ නැහැ. දවල් වරුවට අව්ව තපින්න එයා ආසයි."

"එයා කොයි කෙනා ද කියලා මං අඳුන ගන්නෙ කොහොමද?"

"හොරෙන් එතැනට යන්න," එයා කිවුවා. "ඉන්න තැනක් නැති අනාථයෙක් වගේ රඟපාන්න. නුඹට එයා කවුද කියලා තේරෙයි, එයාගේ ගඳ... වෙනස්."

"නියමයි." එහි විශේෂත්වය ගැන අහන්න මට ඕනෑ වුණේ නැහැ. "මම එයාව හොයාගත්තට පස්සේ?"

"එයාව අල්ලගන්න," එයා කිවුවා. "අත අරින්න එපා. තගෙන් ගැලවෙන්න එයා පුළුවන් හැම විදිහටම උත්සාහ කරයි. එයා මොනවා කළත්, යන්න දෙන්න නම් එපා. රාක්ෂයා ගැන කියන්න එයාට බල කරන්න."

"අපි ඔයාගේ පස්සෙන්ම ඉන්නවා," තාලියා කිවුවා.

එයා මගේ කමිසය පිටුපස තිබූ යමක් අතට ගත්තා- කොහෙන් ආව ද කියලා නොදන්න මවිල් ගුළියක්. "ඊයා. එක්කෝ මට ඔයාගේ පස්සෙන් ඉන්න බැහැ. ඒත් අපි ඔයා ගැන බලාගන්නම්."

ග්‍රෝවර් මහපටැඟිලි ඔසවා මාව දිරිමත් කළා.

සුපිරි බල ඇති යාළුවෝ ඉන්න එක කොච්චර දෙයක් ද කියලා මම අවලාද නැඟුවා. ඊට පස්සේ මම ජැටිය දෙසට පිටත් වුණා.

මම තොප්පියේ වාටිය පහළට ඇදගෙන, දැන් සිහිය නැතිව වැටෙයි වගේ විසි වෙමින් අඩිය තැබුවා. මම මහන්සි වී සිටි තරමට



ඒක ඒ හැටි අමාරු වුණේ නැහැ. අඟහරුගෙන් ගොඩබෑව යකඩ දූතයෝ ගැන අනෙක් අයට අනතුරු අඟවන්න තවමත් උත්සාහ කරමින් සිටි එම්බාකාඩෙරෝවල උන් අපේ යාචක යාළුවාව පසු කරගෙන මම ඉදිරියට ගියා. එයා ළඟ ගඳේ අඩුවක් නැති වුණත්, ඒ ගඳේ වෙනසක් තිබුණේ නැති නිසා මම නොනැවති ගියා.

තොප්පි වෙනුවට ප්ලාස්ටික් මලු දෙකක් හිසේ දමාගෙන සිටි අපිරිසිදු මිනිස්සු ෙ ්නෙක් මං ළං වෙද්දී පරීක්ෂාකාරීව බැලුවා. "යනවා යන්ඩ, කොල්ලෝ!" එකෙක් කෙඳිරුවා.

මම එතැනින් ඉවත් වුණා. එයාලා ළඟ ගඳම ගඳයි, ඒත් ඒ ගඳ සාමාන්‍යයි. කිසිම අසාමාන්‍ය ගතියක් නැහැ.

ෂොපින් කරත්තයක ප්ලාස්ටික් කුරුල්ලෝ පුරවාගත් ගැහැනු කෙනෙක් එතැන සිටියා. මම එයාගේ කුරුල්ලෝ හොරකම් කරයි හිතලා වගේ එයා මට රැව්වා.

ජැටිය කෙළවර වයස අවුරුදු මිලියනයක් විතර වයසයි වගේ පෙනුණු මනුස්සයෙක් අව් රැල්ලක් මැද නින්දට වැටී සිටියා. එයා පිජාමා කලිසමක් සහ ඉස්සර සුදු පාටට තියෙන්න ඇති නාන කබායක් හැඳ සිටියා. එයාට කහ පාටට හැරුණු සුදු රැවුලක් තිබුණා. නත්තල් සීයාව ඇඳෙන් ඇදලා අරන් මඩ ගොඩක ඇදගෙන ගියොත් මේ වගේ ඉඳීවි.

එතකොට එයාගේ ගඳ?

එයාට කිට්ටු වෙද්දී මාව ගල් ගැහුණා. ඇත්තටම එයා ළඟ ගඳයි තමයි- ඒත් ඒක මුහුදු ගඳක්. හරියට පල් වූ මුහුදු පාසි, මැරුණ මාළු සහ කරදිය වගෙයි. මුහුදට අවලස්සන පැත්තක් තියෙනවා නම්... ඒ මේ මනුස්සයායි.

මහන්සියෙන් වගේ එයා ළඟින් වාඩි වූ මම නහය වහගන්නේ නැතුව හිටියේ බොහොම අමාරුවෙන්. නත්තල් සීයා සැකෙන් වගේ ඇහැක් ඇරලා බැලුවා. එයා මගේ දිහා බලා ඉන්න බව දැනුණත් මම එයා දිහා බැලුවේ නැහැ. මම මෝඩ අම්මලා තාත්තලා ගැනත්, මෝඩ ඉස්කෝල ගැනත් දෙඩෙව්වේ එහෙම කළොත් හොඳයි හිතුණ නිසයි.

නත්තල් සීයා ආයෙමත් නින්දට වැටුණා.

Scanned with CamScanner

මම අමාරුවෙන් ඉවසා සිටියා. මම කරන්න යන දේ අනුඅනුවට පෙනේවි කියලා මම දැන සිටියා. අනෙක් යාවක මිනිස්සු ඒකට කොහොම ප්‍රතිචාර දක්වයි ද මට හිතාගන්න බැරි වුණා. ඒත් මම නත්තල් සීයා උඩට පැන්නා.

"ආහ්හ්හ්!" එයා කෑගැසුවා. මම එයාව අල්ල ගන්න හිතාගෙන හිටියත්, ඒ වෙනුවට එයා මාව අල්ල ගත්තා වගෙයි පෙනුණේ. හරියට එයා කොහෙත්ම නිදාගෙන ඉඳලා නැහැ වගෙයි. ඒ වගේම එයා හැසිරුණේ කොහෙත්ම දුබල නාකි මනුස්සයෙක් වගේත් නෙවෙයි. එයාගේ ග්‍රහණය වානේ තරම් දැඩි වුණා. "මට උදවු කරපියෝ!" මාව මැරෙන්න මිරිකන අතරේම එයා බෙරිහන් දුන්නා.

"ඒක නම් අපරාධයක්!" යාවක මිනිස්සුන්ගෙන් කෙනෙක් මොර දුන්නා. "පොඩි එකෙක් නාකි මනුස්සයෙක්ව එහෙම පෙරළන එක!"

ඇත්තටම මම පෙරළුණා තමයි- මම ජැටිය පහළට පෙරළී යද්දී මගේ ඔළුව කණුවක හැප්පුණා. තත්පරයකට මගේ ඇස් අඳුරු වෙද්දී නෙරෙයස්ගේ ග්‍රහණය බුරුල් වුණා. එයා එතැනින් ගැලවෙන්නයි හැදුවේ. එයාට ඒකට ඉඩක් ලැබෙන්න කලින් මම සිහි එළවාගෙන එයාව පිටුපසින් අල්ල ගත්තා.

"මං ළඟ සල්ලි නැතෝ!" එයා නැගිටලා දුවන්න හැදුවත් මම එයාගේ පපුව වටේට අත් යවා එයාව තදින් බදා ගත්තා. එයා ළඟින් හැමුව කුණු මාළු ගඳ ඉවසන්න බැරි වුණත් මම අත ඇරියේ නැහැ.

"මට සල්ලි ඕනෑ නෑ," එයා පොර බදද්දී මම කිවුවා. "මං අර්ධ-ලෝහිතයෙක්! මට ඕනෑ තොරතුරක්."

ඒකෙන් වුණේ එයාගේ දඟලිල්ල තවත් වැඩි වුණු එකයි. "වීරයෝ! ඇයි උඹලා හැම වෙලාවෙම මාවම අල්ල ගන්නේ?"

"ඔයා හැම දේම දන්න නිසා!"

ගෙරවූ එයා මාව එයාගේ පිටෙන් හලන්න උත්සාහ කළා. ඒක [illegible]යට රෝලර් කෝස්ටරයක එල්ලී ඉන්නවා වගේ වැඩක්.

මට දෙපයින් හිටගෙන ඉන්න කොහෙත්ම බැරිවෙන්න එයා එහෙ මෙහෙ හැප්පෙමින් දඟලුවා, ඒත් මම දත්මිටි කාගෙන එයාව තවත් තදින් මිරිකුවා. අපි ජැටිය කෙළවරට විසි වෙද්දී මට අදහසක් ආවා.



"ඔහ්, එපා!" මම කිවුවා. "වතුරට නම් එපා!"

මගේ සැලසුම වැඩ කළා. එසැණින්ම ජයග්‍රාහීව මොර දුන් නෙරෙයස් ජැටියෙන් පැන්නා. අපි දෙන්නව සැන් ෆ්‍රැන්සිස්කෝ බොක්කට ඇද වැටුණා.

මම, මගේ ග්‍රහණය තවත් තද කරද්දී එයා පුදුම වෙන්න ඇති. මුහුද මට අතිරේක ශක්තියක් ලබා දුන්නා. ඒත් නෙරෙයස් ළඟත් තව උප්පරවැට්ටි කීපයක් ඉතිරිව තිබුණා. එයා පෙනුම වෙනස් කරන්න ගත්තා. මොහොතකින් මම අල්ලගෙන සිටියේ සිනිඳු කළු පාට සීල් මාළුවෙක්මයි.

ආදෙක් වගේ ලිස්සන්න දක්ෂ අය ගැන මිනිස්සු විහිළු කරනවා මම අහලා තිබුණා, ඒත් මම කියන්නේ වතුරේ දී සීල් මාළුවෙක් අල්ලගෙන ඉන්න එක ඊටත් වඩා අමාරුයි. නෙරෙයස් ඇඹරෙමින්, දඟලමින් අඳුරු වතුරේ ගැඹුරටම කිමිදෙන්න ගත්තා. මම පොසෙයිඩන්ගේ පුතා නොවුණා නම්, එයාව අල්ලගෙන ඉන්න එක මට කොහෙත්ම කරන්න බැරි වෙන්න තිබුණා.

වේගයෙන් කැරකුණු නෙරෙයස් මහත් වෙමින් තල්මහෙකුට හැරෙන්න ගත්තා. ඒත් එයා වතුරෙන් උඩට පනිද්දී මම එයාගේ පිටි වරලේ එල්ලුණා.

"වාව්!" සංචාරකයෝ කණ්ඩායමක් කෑගහන්න ගත්තා. මම එයාලට අතක් වැනුවා. *ඔව්. අපි සැන් ෆ්‍රැන්සිස්කෝවල හැමදාම මෙහෙම කරනවා.*

වතුරට පැන්න නෙරෙයස් ලිස්සන ආදෙකුට හැරුණා. මම එයාගෙන් ගැටයක් ගහද්දී සිද්ධ වෙන දේ තේරුම් ගත්ත නෙරෙයස් ආපසු මනුස්සයෙකුට හැරුණා. "උඹ ගිලිලා මැරෙන්නැත්තෙ ඇයි?" එයා අත් මිටි කර මට පහර දෙමින් විලාප තැබුවා.

"මම පොසෙයිඩන්ගේ පුතා," මම කිවුවා.

"ඒ අලුත් වණ්ඩියට හෙණම ගහපි! මේකෙ මුලින්ම හිටියේ මමයි!"

අන්තිමේ දී එයා නැව් තට්ටුවක් උඩට කඩා වැටුණා. අපිට ඉහළින් තිබුණේ පාවෙන සාප්පු සංකීර්ණයක් වගේ වෙළඳ සැල් පෙළ ගැසුණු සංචාරක ජැටියක්. මට බලවත් බවක් දැනෙමින් තිබුණා. මට මුළු දවසම වුණත් පොර බදමින් ඉන්න පුළුවන්කම තිබුණත්, මම

Scanned with CamScanner

එයාට ඒක කිවුවේ නැහැ. එයා මට හොඳ සටනක් දුන් බව එයාට දැනෙන්න අරින්න මට ඕනෑ වුණා.

මගේ යාළුවෝ ජැටිය පහළට දුවගෙන ආවා.

"නුඹ එයාව අල්ල ගත්තා!" ටෙසෝයි කිවුවා.

"ඒක ඔච්චර පුදුම වෙන්න දෙයක් යෑ," මම කිවුවා.

නෙරෙයස් අඳෝනා නැගුවා. "ඔහ්, නියමයි. මං අවනම්බු විඳිනවා බලන්න සෙනඟත් ඇවිල්ලා! මං හිතන්නේ, සාමාන්‍ය ගනුදෙනුව කරමු? මම උඹේ ප්‍රශ්නෙට උත්තර දුන්නොත් උඹ මට යන්න දෙනවා?"

"මට එක ප්‍රශ්නෙකට වඩා තියෙනවා නේ," මම කිවුවා.

"එක අල්ලා ගැනීමකට එක ප්‍රශ්නයයි! ඒක තමයි නීතිය."

මම මගේ යාළුවෝ දිහා බැලුවා.

මේක නම් හොඳ දෙයක් නෙවෙයි. මට ආර්ටෙමිස්ව හොයාගන්න ඕනෑ වුණා, ඒ වගේම මට ලෝකෙ විනාශ කරන සතා ගැනත් දැනගන්න ඕනෑ වුණා. තව, ඇනබෙත් ජීවතුන් අතර ද, එයාව බේරගන්නේ කොහොමද කියලත් මට දැනගන්න ඕනෑ වුණා. මම මේ ඔක්කොම එක ප්‍රශ්නයකින් අහන්නෙ කොහොමද?

මගේ හිතෙන් නැගුණු හඬක් ඇනබෙත් ගැන අහන්න කියලා මොර දුන්නා! මම වැඩිම සැලකිල්ලක් දැක්වූයේ ඒ ගැනයි.

ඒත් ඊට පස්සේ ඒ ගැන ඇනබෙත් කියන දේ මගේ හිතේ මැවුණා. මම එයාව බේරාගෙන ඔලිම්පස් බේරා නොගත්තොත් ඇනබෙත් කවදාවත් මට සමාව නොදේවි. ටෙසෝයිට ආර්ටෙමිස් ගැන අහන්න ඕනෑ ඇති, ඒත් කයිරොන් අපිට කියා තිබුණේ රාක්ෂයා වඩා වැදගත් කියලයි.

මම සුසුමක් හෙළුවා. "හරි එහෙනම්, නෙරෙයස්. දෙවිවරුන්ව විනාශ කරන්න තරම් භයානකයි කියන රාක්ෂයාව හොයාගන්නෙ කොහෙන්ද කියලා මට කියන්න. ආර්ටෙමිස් හොයාගෙන ගිය එකාව."

මුහුදේ මහල්ලා කොළ පාට දිය සෙවෙල් බැඳුණු දත් පෙන්වා හිනා වුණා. "ඔහ්, ඒක හරිම ලේසියි නේ," එයා දුෂ්ට ලෙස කිවුවා. "එයා මෙතැනම ඉන්නවා."



නෙරෙයස් මගේ දෙපා ළඟ වතුරට අත දිගු කළා.

"කොතන ද?" මම ඇසුවා.

"ගනුදෙනුව සම්පූර්ණයි!" නෙරෙයස් උදම් ඇනුවා. පොප් හඬක් එක්ක ගෝල්ඩ්ෆිෂ් කෙනෙකුට හැරුණ එයා වතුරට කරණමක් ගැසුවා.

"ඔහේ මාව රැවැට්ටුවා!" මම මොර දුන්නා.

"ඔහොම ඉන්න." තාලියාගේ ඇස් ලොකු වුණා. "අර මොකාද?"

"උම්බෑ!"

පහළ බැලූ මට දකින්න ලැබුණේ මගේ යාළු සර්ප එළදෙන නැව් තට්ටුව ළඟ පිහිනමින් ඉන්නා හැටියි. මගේ සපත්තුවට හොම්බෙන් ඇන්න එයා දුක්බර දුඹුරු පාට ඇස්වලින් මගේ දිහා බැලුවා.

"අහ්, බෙසී," මම කිවුවා. "දැන් බැහැ."

"උම්බෑ!"

ග්‍රෝවර් තදින් හුස්මක් ගත්තා. "ඒකා කියනවා ඌගේ නම බෙසී නෙවෙයිලු."

"ඔයාට ඒකිව... එර්, ඌව තේරෙනව ද?"

ග්‍රෝවර් ඔළුව වැනුවා. "ඒක ගොඩාක් පරණ සත්ත්ව භාෂාවක්. ඒත් ඌ කියනවා එයාගේ නම ඔෆියොටෝරස්ලු."

"ඔෆි- මොකක්?"

"ග්‍රීක භාෂාවෙන් ඒකෙ තේරුම සර්ප-ගොනා කියන එක," තාලියා කිවුවා. "ඒත් ඌ මෙහෙ මොනවද කරන්නේ?"

"උම්බෑ!"

"එයා කියනවා පර්සි එයාගේ ආරක්ෂකයාලු," ග්‍රෝවර් නිවේදනය කළා. "ඒ වගේම එයා නරක මිනිස්සුන්ගෙන් පැනලා දුවනවාලු. එයා කියනවා එයාලා කිට්ටුයිලු."

තනි උම්බෑ එකකින් ඔය ඔක්කොම එක පාර කියන්නෙ කොහොමද හිතලා මම පුදුම වුණා.

Scanned with CamScanner

"පොඩ්ඩක් ඉන්න," ෙZසා්යි මගේ දිහා බලමින් කිව්වා. "නුඹ මේ හරකව දන්නව ද?"

නොයිවසිලිවන්ත ගතියක් දැනුණත්, මම එයාලට කතාව කිව්වා.

තාලියා අවිශ්වාසයෙන් ඔළුව හෙල්ලුවා. "එතකොට මේ ගැන කලින් කියන්න ඔයාට අමතක වුණා?"

"හොඳයි... ඔව්." දැන් එයා අහද්දී ඒක මෝඩකමක් වගේ පෙනුණත්, අනෙක් හැම දෙයක්ම සිදු වුණ වේගයට බෙසී, එහෙමත් නැත්නම් ඔෆියොටෝරස්ව පෙනුණේ සුළු දෙයක් වගෙයි.

"මම මහා මෝඩියක්," හදිසියේම ෙZසා්යි කිව්වා. "මම මේ කතාව දන්නවා!"

"මොන කතාව ද?"

"ටයිටන්වරුන්ගේ යුද්ධය ගැන," එයා කිව්වා. "මගේ... මගේ තාත්තා අවුරුදු දහස් ගාණකට කලින් මේ කතන්දරේ මට කිව්වා. මූ තමයි අපි හොයපු සතා."

"බෙසී?" මම සර්ප-ගොනා දිහා බැලුවා. "ඒත්... එයා හරිම හුරතල් නේ. එයාට ලෝකෙ විනාශ කරන්න පුළුවන්කමක් නැහැ."

"අන්න එතනයි අපි වරද්ද ගත්තේ," ෙZසා්යි කිව්වා. "අපි බලාපොරොත්තු වුණේ යෝධ, භයානක රාක්ෂයෙක්ව. ඒත් ඔෆියොටෝරස් දෙවිවරුන්ව විනාශ කරන්නේ එහෙම නෙවෙයි. එයාව බිලි දෙන්න ඕනෑ."

"ම්ම්ම්." බෙසී තප්පු ලෑවා.

"එයා බි- වචනෙට කැමති නැහැ වගෙයි." ග්‍රෝවර් කිව්වා.

මම බෙසීගේ ඔළුවට තට්ටු කරලා, එයාව සනසවන්න උත්සාහ කළා. එයා මට එයාගේ කන අතගාන්න ඉඩ දුන්නත් එයා හිටියේ වෙවුලමිනුයි.

"කිසිම කෙනෙක් මෙයාට රිදවන්නෙ මොන හිතකින් ද?" මම කිව්වා. "එයා අහිංසකයි නේ."

ෙZසා්යි ඔළුව වැනුවා. "ඒත් අහිංසකයින්ව මරණ එකෙන් බලයක් තියෙනවා. භයානක බලයක්, යුග ගාණකට කලින් මේ සතා



ඉපදුනාම ඉරණම අනාවැකියක් පැනෙව්වා. එයාලා කිව්වා කවුරු හරි ඔෆියොටෝරස්ව මරලා, එයාගේ බඩවැල් ගින්නට පූජා කළොත් එයාට දෙවිවරුන්ව විනාශ කරන්න බලය ලැබෙනවා කියලා."

"ම්ම්ම්!"

"මේ," ග්‍රෝවර් කතා කළා. "අපි බඩවැල් ගැනත් කතා නොකර හිටියොත් හොඳයි."

තාලියා සර්ප-ගොනා දිහා පුදුමයෙන් බලා සිටියා. "දෙවිවරුන්ව විනාශ කරන බලය... කොහොමද? මං කියන්නේ, එතකොට මොනවා වෙයි ද?"

"ඒ ගැන කවුරුවත් දන්නෙ නැහැ," ෙZසා්යි කිව්වා. "ඇත්තටම මුල් වතාවේ ටයිටන් යුද්ධය අතරතුරේ දී, ටයිටන්ලගෙ මිතුරු පාක්ෂික යෝධයෝ ඔෆියොටෝරස්ව මැරුවා. ඒත් එයාලා බඩවැල් ගින්නට දාන්න කලින් තිගේ තාත්තා, සියුස් රාජාලියෙක්ව එවලා ඒ ටික ඩැහැගත්තා. එදා එයාලා අනූ නවයෙන් බේරුණේ. දැන්, අවුරුදු තුන් දාහකට පස්සේ ඔෆියොටෝරස් ආපහු ඉපදිලා."

තාලියා නැව් තට්ටුව මත වාඩි වුණා. එයා අතක් ඉදිරියට දිගු කරද්දී බෙසී කෙලින්ම එයා වෙතට ඇදී ගියා. තාලියා එයාගේ ඔළුව උඩින් අත තියද්දී බෙසී වෙවුලුවා.

තාලියාගේ මුහුණෙන් පළ වූ හැඟීම් මට හිරිහැර කළා. එයා බලා හිටියේ... කෑදරකමෙන් වගෙයි.

"අපි එයාව ආරක්ෂා කරන්න ඕනෑ," මම එයාට කිව්වා. "බැරි වෙලාවත් ලූක්ට එයාව අහු වුණොත්-"

"ලූක් පස්සෙ ගහන්නෙ නැති වෙයි," තාලියා කෙඳිරුවා. "ඔලිම්පස් පරාජය කරන්න තරම් බලයක්. ඒක... ඒක කොච්චර ලොකු දෙයක් ද."

"ඔව්, ඒක එහෙම තමයි, මගෙ කෙල්ලේ," බර ප්‍රංශ උච්චාරණයක් ඇති පිරිමි කටහඬක් කිව්වා. "ඒ වගේම, ඒක මුදා හරින්න ඔයාට පුළුවන්."

ඉකි බිඳුමක් වගේ හඬක් පිට කළ ඔෆියොටෝරස් වතුර යටට ගිලුණා.

මම ඔළුව ඔසවා බැලුවා. අපි කතා කර කර කල් මරලා, අපේ හතුරන්ට අපිව වට කරන්න ඉඩ දීලා තිබුණා.

අපිට පිටුපසින් සිටගෙන සිටියේ දුෂ්ට ලෙස දිලිසෙන පාට දෙකේ ඇස් ඇති ආචාර්ය තෝර්න් නොහොත් මැන්ටිකෝරයායි.

★★★

"මේක නම් නියමයි," මැන්ටිකෝරයා උදම් ඇනුවා.

එයා පැල්ලම් වැටී, ඉරී ගිය වෙස්ටෝවර් නිල ඇඳුමට උඩින් කළු පාට දිග උඩු කබායක් පැළඳගෙන සිටියා. හමුදා මෝස්තරයට කොට කර තිබුණු එයාගේ කොණ්ඩය වැවී, තෙල් පිරී තිබුණා. මෑතකදී රැවුල මුඩු කර නොතිබූ එයාගේ මුහුණේ රිදී පාට රැවුල් කොට වැවිලා. සරලව කියනවා නම් ජැටිය පහළ මුළුතැන්ගෙය ළඟ බලා සිටි උදවියට වඩා එයාගේ පෙනුමේ වෙනසක් තිබුණේ නැහැ.

"ගොඩාක් කාලෙකට කලින්, දෙවිවරු මාව පර්සියාවට පිටුවහල් කරා," මැන්ටිකෝරයා කිවුවා. "මට එහෙන් මෙහෙන් අහුලගන්න දේවල්වලින් බඩ පුරවා ගන්න සිද්ධ වුණා, කැලෑවල හැංගිලා ඉඳලා වැදගැම්මකට නැති මිනිස් ගොවියෝ දඩයම් කරගෙන කන්න වුණා. මට කවදාවත් ශ්‍රේෂ්ඨ වීරයෝ එක්ක සටන් කරන්න ලැබුණේ නැහැ. මට බය වෙලා, මාව අගය කරලා කතන්දර හැදුනේ නැහැ! ඒත් දැන් ඒක වෙනස් වෙයි. ටයිටන්ලා මට ගරු කරාවි, ඒ වගේම මට අර්ධ-ලෝහිතයන්ගේ මස්වලින් සතුටු වෙන්න ලැබේවි!"

එයාගේ දෙපැත්තෙන් අවි ගත් ආරක්ෂකයෝ දෙන්නෙක් සිටියා. එයාලා වොෂින්ටන්වල දී මට දකින්න ලැබුණු මනුෂ්‍ය කුලී හේවායෝයි. තවත් දෙන්නෙක් අනෙක් නැව් තට්ටුවේ සිටගෙන සිටියේ අපි ඒ පැත්තෙන් පැනලා යන්න උත්සාහ කරාවි හිතලා වෙන්න ඇති. බලන බලන අත සංචාරකයෝ පිරී සිටියා- එයාලා ජල තීරය දෙසට ඇවිද යමින්, අපිට ඉහළින් වූ ජැටියේ සාප්පු සවාරියේ යෙදෙමින් සිටියා- ඒත් ඒක මැන්ටිකෝරයා පහරදීම නවත්වන හේතුවක් නම් වෙන්නේ නැති බව මම දැන සිටියා.

"කෝ... කොහෙද ඇටකෝච්චෝ?" මම මැන්ටිකෝරයාගෙන් ඇසුවා.



එයා දත් විලිස්සුවා. "ඒ මෝඩ පිල්ලි මට ඕනෑ නැහැ! ජෙනරල් හිතන්නෙ මං වැදගැම්මකට නැති එකෙක් කියල ද? මං තනියම ඔහේව පැරැද්දුවා ම එයා හිත වෙනස් කර ගනියි!"

මට හිතන්න වෙලාවක් ඕනෑ වුණා. මම බෙසීව බේරාගන්න ඕනෑ. මට මුහුදට පනින්න හැකියාව තිබුණත්, මං කොහොමද රාත්තල් පන්සීයක් බර සර්ප-ගොනෙක්ව අරගෙන වේගයෙන් පැනලා යන්නේ? එතකොට මගේ යාළුවන්ට මොනවා වෙයි ද?

"අපි එක සැරේකුත් ඔහේව පැරැද්දුවා," මම කිවුවා.

"හා! ඔහේලත් එක්ක දෙවඟනක් ඉඳලත් ඔහේලට හරියට සටන් කරගන්න බැරි වුණා. එතකොට, අප්පොච්චියේ... ඒ දෙවඟනට මේ වෙලාවේ වෙන වැඩක් කරන්න වෙලා නේ. ඉතින් ඔහේලට කිසිම උදවුවක් ලැබෙන්නෙ නැහැ."

දුන්නට ඊතලයක් ඇමිණූ සෝයි ඒක කෙලින්ම මැන්ටිකෝරයාගේ ඔළුවට මැනුවා. අපි දෙපසින් සිටි ආරක්ෂකයෝ තුවක්කු අතට ගත්තා.

"ඔහොම ඉන්න!" මම කිවුවා. " සෝයි, එපා!"

මැන්ටිකෝරයා හිනා වුණා. "කොල්ලා හරි, සෝයි නයිට්ෂේඩ්. ඔහේගෙ දුන්න පැත්තකට දානවා."

"ඔහේ මොනවා ගැන ද කියවන්නේ?" තාලියා ගෙරෙව්වා. එයා, එයාගේ පලිහ සහ හෙල්ලය සූදානම් කරගෙන සිටියා.

"හැබෑටම ඒක හරිම පැහැදිලියි නේ," මැන්ටිකෝරයා කිවුවා. "මේක තමයි ඔහේගෙ වෙලාව. මේකට තමයි ක්‍රෝනොස් උතුමා ඔහේට ආපහු පණ දුන්නේ. ඔහේ ඔෆියොටෝරස්ව බිලි දෙනවා. ඔහේ ඒකගේ බඩවැල් කන්ද උඩ තියෙන ශුද්ධ වූ ගින්නට අරන් එනවා. ඒ වගේම ඔහේගේ දාසයවෙනි උපන්දිනේට ඔහේ ඔලිම්පස් බිඳ හෙළනවා."

කවුරුවත් වචනයක්වත් කතා කළේ නැහැ. මේ සියල්ලෙන්ම බිහිසුණු අරුතක් මතු වුණා. තාලියාට අවුරුදු දාසය ලබන්න තව දවස් දෙකයි තිබුණේ. එයත් ලොකු තුන්කට්ටුවේ දරුවෙක්. ඒ වගේම මෙතන තෝරාගැනීමක්- දෙවිවරුන්ගේ අවසානය තීරණය කළ හැකි භයානක තෝරාගැනීමක් තිබුණා. ඒක හරියටම අනාවැකියේ

කියවුණා වගෙයි. ඒ මොහොතේ මට දැනුණේ සහනයක් ද, භීතියක් ද, නැත්නම් බලාපොරොත්තු කඩ වීමක් ද කියලා මට විශ්වාස නැහැ. අන්තිමේ දී බලනකොට අනාවැකියේ කියවෙන ළමයා මම නෙවෙයි. ලෝක විනාශය සිද්ධ වෙන්න යන්නේ මේ දැනුයි.

තාලියා මැන්ටිකෝරයාව එතනින් එලවනකල් මම බලා සිටියා, ඒත් එයා පැකිළුණා. එයා පුදුමයෙන් තිගැස්සිලා වගෙයි පෙනුණේ.

"හරිම තේරීම ඒකයි කියලා ඔහේ දන්නවා," මැන්ටිකෝරයා එයාට කිවුවා. "ඔහේගෙ යාළුවා ලූක් ඒක හඳුනා ගත්තා. ඔහේට ආපහු එයත් එක්ක එකතු වෙන්න පුළුවන්. ටයිටන්ලගේ අනුග්‍රහය යටතේ ඔහේලා දෙන්නට එකතු වෙලා මේ ලෝකෙ පාලනය කරන්න පුළුවන්. ඔහේගෙ තාත්තා ඔහේව අත ඇරියා, තාලියා. එයා ඔහේව තඹ දොයිතුවකට මායිම් කරන්නෑ. දැන් ඔහේට එයාව යට කරන්න බලය ගන්න පුළුවන්. උන්ට කරන්න වටින විදිහටම, ඔලිම්පියානුවන්ව පාගලා දාන්න පුළුවන්. සතාට කතා කරනවා! ඌ ඔහේ ළඟට එයි. ඔහේගෙ හෙල්ල පාවිච්චි කරනවා."

"තාලියා," මම කතා කළා. "ඕකෙන් ගැලවෙන්න!"

එයා අර්ධ-ලෝහිත කඳු මුඳුනේ දී අවදි වුණු උදෑසන මගේ දිහා බැලූ විදිහටම අවසිහියෙන්, අඩමානයෙන් වගේ මගේ දිහා බැලුවා. එයා බලා සිටියේ මාව හඳුනන්නේ නැහැ වගෙයි. "මට... මට බැහැ-"

"ඔයාගේ තාත්තා ඔයාට උදවු කළා," මම කිවුවා. "එයා අර දේව දූතයෝ දෙන්න එව්වා. ඔයාව පරිස්සම් කරගන්න එයා ඔයාව ගහකට හැරෙව්වා."

හෙලි මිට වටා වූ එයාගේ ග්‍රහණය දැඩි වුණා.

මම උදවු ඉල්ලා ග්‍රෝවර් දිහා බැලුවා. දෙවිවරුන්ට ස්තුති වෙන්න, මට උවමනා කළ දේ එයාට තේරුණා. බට නළා තොල් මත තබා ගත් එයා ඉක්මන් තාලයක් වාදනය කළා.

"එයාව නවත්තනවා!" මැන්ටිකෝරයා මොර දුන්නා.

ටෙසෝයිට කුරුමානම් අල්ලමින් සිටි ආරක්ෂකයෝ බට නළා තියාගෙන සිටි කොල්ලා වඩාත් අනතුරුදායක බව තේරුම් ගන්නත්



කලින් එයාලගේ දෙපා යට තිබූ ලැලිවලින් අලුත් අතු රිකිළි මතු වෙලා, එයාලගේ කකුල් පටලවා ගත්තා. එසැණින්ම ටෙසෝයි මුදා හැරිය ඊතල දෙකක් එයාලා පාමුල පුපුරා කහ පාට ගෙන්දගම් ගඳ දුමක් පැතිරුණා. ෆාර්ට් ඊතල!

ආරක්ෂකයෝ කහින්න ගත්තා. මැන්ටිකෝරයා අපිට උල් කටු විද්දත්, මගේ සිංහ හම් කබායේ වැදී ඒවා ඉවතට විසි වුණා.

"ග්‍රෝවර්," මම කතා කළා. "බෙසීට කියන්න වතුරේ ගැඹුරටම කිමිදිලා, යටටම වෙලා ඉන්න කියලා."

"උම්බෑ...!" ග්‍රෝවර් ඒක පරිවර්තනය කළා. මට කරන්න ඉතිරිව තිබුණේ බෙසීට ඒ පණිවුඩය ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරන එක විතරයි.

"හරකා..." තවමත් තෝන්තුවෙන් සිටි තාලියා කෙඳිරුවා.

"මෙහෙ එන්න!" මම එයාව ඇදගෙන සාප්පු සංකීර්ණය ඇති ජැටිය දෙසට පඩිපෙළ දිගේ දිවුවා. අපි ළඟම තිබූ වෙළඳ සැල කෙළවරින් හැරී දුවද්දී, මැන්ටිකෝරයා එයාගේ දාසයින්ට මොර දෙනවා මට ඇසුණා, "උන්ව අල්ල ගනිල්ලා!" ඇස් නොපෙනුණු ආරක්ෂකයෝ හතර අතට වෙඩි තියද්දී සංචාරකයෝ මර හඬ දෙන්න ගත්තා.

ජැටිය කෙළවරට අමාරුවෙන් දිවූ අපි සිහිවටන විකිණීමට තැබූ බක්කියක් පිටුපස සැඟවුණා. එහි තබා තිබූ පළිඟු බඩු ඉර එළිය වැදී දිලිසෙමින් තිබුණා. අපි අසලම වතුර මලකින් වතුර විසිරුණා. පහළ ගල් මත මුහුදු සිංහයෝ රංචුවක් අව්ව තපිමින් සිටියා. අපිට ඉදිරියෙන් මුළු සැන් ෆ්‍රැන්සිස්කෝ බොක්කම විහිදී තිබුණා: ගෝල්ඩන් ගේට් පාලම, අල්කාට්‍රාස් දූපත සහ උතුරු දෙසට වන්නට තිබූ ඝන මීදුමෙන් වැසුණු කොළ පාට කඳු වැටි. ඒක හරියට පින්තූරයක් වගේ අංගසම්පූර්ණ මොහොතක් වුණත් අඩුවකට තිබුණේ අපි මැරෙන්න ඔන්න මෙන්න හිටපු එකයි, ලෝක විනාශය වෙන්න යන එකයි විතරයි.

"එහා පැත්තට යන්න!" ටෙසෝයි මට කිවුවා. "නුඹට මුහුදට පැනලා ගැලවෙන්න පුළුවන්, පර්සි. තගේ තාත්තගෙන් උදවු ඉල්ලන්න. සමහරවිට ඔෆියොටෝරස්ව බේරගන්න නුඹට පුළුවන් වෙයි."

එයා හරි තමයි. ඒත් මට ඒක කරන්න බැරි වුණා.

"මං ඔයාලව දාලා යන්නෑ," මම කිවුවා. "අපි එකට සටන් කරමු."

"ඔයා කදවුරට මේ ආරංචිය දෙන්න ඕනෑ!" ග්‍රෝවර් කිවුවා. "අඩු තරමේ, සිද්ධ වෙන්නෙ මොනවද කියලා එයාලට දැනගන්නවත් ඉඩ දෙන්න!"

ඒ වේලාවේ ඉර එළිය වැදී දේදුනු මැවෙන පළිඟුවලට මගේ ඇහැ ගියා. මට එහා පැත්තේ තියෙන වතුර මල...

"කදවුරට ආරංචිය දෙන්න," මම කෙඳිරුවා. "හොඳ අදහසක්."

රිප්ටයිඩ්ගේ කොපුව ගැලවූ මම වතුර මලේ මුදුනට කඩු පහරක් ගැසුවා. පුපුරා ගිය නළයෙන් විසිරුණු වතුරෙන් අපි හැමෝම නැවුණා.

වතුර වදිද්දී තාලියා හිල්ලුවා. එයාගේ ඇස්වල වූ අඳුර නැති වුණා වගේ පෙනුණා. "ඔයාට පිස්සු හැදිගෙන එනව ද?" එයා ඇසුවා.

ඒත් මම කරන්න ගිය දේ තේරුම් ගත් ග්‍රෝවර් දැනටමත් කාසියක් සොයා සාක්කු පීරමින් සිටියා. හිරිකඩෙන් මැවුණු දේදුන්න තුළට රන් ඩ්‍රච්මාවක් විසි කළ එයා මොර දුන්නා, "ඕ දේවතාවියනි මාගේ පූජාව බාරගන්න!"

මීදුම රැළිති නැංවූවා.

"අර්ධ-ලෝහිත කදවුර!" මම ඉල්ලුවා.

ඒත් එක්කම සැලෙන මීදුම අතරින් මතු වුණේ ම ඕනෑ කළ අන්තිම කෙනායිඃ කොටි පුල්ලි වැටුණු ඇඳුම් ක සැරසුණු මිස්ටර් ඩී ශීතකරණය අවුස්සමින් සිටියා.

එයා ඔළුව ඔසවා කම්මැලි බැල්මෙන් බැලුවා. "ෙ

"කයිරොන් කොහෙද?" මම කෑගැසුවා.

"කොච්චර තරක ද," මිස්ටර් ඩී මිදි යුෂ ජෝගුවකින් බිව්වා. "ඔයා හෙලෝ කියන්නෙ එහෙමද?"

"හෙලෝ," ම කිවුවා. "අපි මෙහෙ මැරෙන්න කයිරොන් කොහෙද?"



මිස්ටර් ඩී ඒ ගැන කල්පනා කර බැලුවා. ඉක්මන් කරන්න කියලා එයාට කෑගහන්න මට ඕනෑ වුණත්, එයින් පලක් නොවෙන බව මම දැන සිටියා. අපිට පිටුපසින් අඩි හඬවල් සහ කෑගහන හඬවල්- මැන්ටිකෝරයාගේ හේවායෝ ළඟ ළඟම එන හඬ ඇසුණා.

"මැරෙන්න යනවා," මිස්ටර් ඩී කල්පනාබරව කිවුවා. "මරුනේ. හැබැයි කයිරොන් නම් මෙහෙ නැහැ. ඔයා කැමති නම් පණිවුඩේ මං ගන්නම්?"

මම, මගේ යාළුවෝ දිහා බැලුවා. "අපි ඉවරයි."

තාලියා හෙල්ලය තදින් අල්ලා ගත්තා. එයා ආපහු පරණ පුරුදු කුකුල් කේන්තිකාරියට හැරිලා. "එහෙනම් අපි සටන් කරලා මැරෙමු."

"කොච්චර උතුම් ද," මිස්ටර් ඩී ඇනුමක් යටපත් කරමින් කිවුවා. "එතකොට මොකක්ද ප්‍රශ්නේ, ඇත්තටම?"

කියලා වැඩක් නැහැ වගේ පෙනුණත් මම එයාට ඔෆියොටෝරස් ගැන කිවුවා.

"ම්ම්..." එයා ශීතකරණය තුළ තිබුණු දේවල් පිරික්සුවා. "ඒකයි එහෙනම්."

"ඔයාට ඒ ගැන ගාණක්වත් නෑ!" මම බෙරිහන් දුන්නා. "ඔයා නිකංම අපි මැරෙන දිහා බලන් ඉඳියි!"

"ඉන්න බලමු, මං හිතන්නෙ අද රෑට මම පීසා එකක් කන්නයි බලන් ඉන්නේ."

දේදුන්නට කඩු පාරක් ගසා ඇමතුම විසන්ධි කර දමන්න මට ඕනෑ වුණත්, ඒකට වෙලාවක් තිබුණේ නැහැ. "අන්න ඉන්නවා!" මැන්ටිකෝරයා කෑගැසුවා. ඒත් එක්කම උන් අපිව වට කළා. මැන්ටිකෝරයාට පිටුපසින් ආරක්ෂකයෝ දෙන්නෙක් සිටගෙන සිටියා. අනෙක් දෙන්නා අපිට ඉහළින් කඩ සාප්පු වහලයක් මත ඉන්නවා පෙනුණා. කබාය ගලවා දැමූ මැන්ටිකෝරයා, එයාගේ සැබෑ ස්වරූපයට හැරුණා. එයාගේ සිංහ නිය ඉදිරියට වැඩෙද්දී, උල් වලිගය විෂ කටුවලින් දිලිසුණා.

"විශිෂ්ටයි," එයා කිවුවා. මීදුම මත මැවුණු රුව දිහා බැලූ එයා තහයෙන් පිම්බා. "හරිහමං උදවුවක් නැතුව තනි වෙලා. නියමයි."

"ඔයාට උදවු ඉල්ලන්න පුළුවන්," මිස්ටර් ඩී මට මුමුණා කිවුවේ හරියට ඒක විනෝදජනක සිතුවිල්ලක් වගෙයි. "ඔයාට පුළුවන් 'කරුණාකරලා' කියලා ඉල්ලන්න."

කළු කපුටෝ සුදු වුණ දවසට, මම හිතුවා. මිස්ටර් ඩී වගේ අමනයෙක්ට යාඥා කරමින් මැරෙන්න මම කොහෙත්ම සූදානම් වුණේ නැහැ. අපි වෙඩි කාලා වැටෙද්දී එයාට හිනා වෙන්න ඉඩ තියන්න මම ලෑස්ති වුණේ නැහැ.

ෂෙසාර්යි දුන්නට ඊතල ඇමිණුවා. ග්‍රෝවර්, එයාගේ බට නලා අතට ගත්තා. තාලියා හෙල්ලය එසෙව්වා, එයාගේ කම්මුල දිගේ කඳුළු බිඳුවක් ගලා යනවා මම දැක්කා. ඒත් එක්කම එයට හේතුව මගේ හිතට වැදුණා: මීට කලිනුත් එයාට මේ දේම සිදු වී තිබුණා. අර්ධ-ලෝහිත කඳු මුදුනේදීත් එයාව මේ විදිහටම කොටු වී තිබුණා. එදා එයා කැමැත්තෙන්ම එයාගේ ජීවිතේ යාළුවෝ වෙනුවෙන් කැප කළා. ඒත් මේ වතාවේ එයාට අපිව බේරගන්න පුළුවන්කමක් තිබුණේ නැහැ.

මං කොහොමද එයාට එහෙම වෙන්න ඉඩ දෙන්නේ?

"කරුණාකරලා, මිස්ටර් ඩී," මම කෙඳිරුවා. "උදවු කරන්න."

ඇත්ත වශයෙන්ම කිසිවක් සිදු වුණේ නැහැ.

මැන්ටිකෝරයා විරිත්තුවා. "සියුස්ගේ දුව ඉතුරු කරපල්ලා, එයා ඉක්මනටම අපිට එකතු වෙයි. අනිත් එවුන්ව මරපල්ලා."

මිනිස්සු තුවක්කු මානද්දී අසාමාන්‍ය දෙයක් සිදු වුණා. ඔයාව කකුල් දෙකෙන් එල්ලලා තියලා, ඉක්මනින්ම ආපසු හරි පැත්තට හැරෙව්වාම ඔළුවට වේගයෙන් ලේ ගලා එන හැඟීම දැනිලා තියෙනව ද? මගේ වටේටත් අන්න ඒ වගේ කලබලකාරී හැඟීමකුත් එක්ක යෝධ සුසුමක හඬක් පැතිරුණා. ඉර එළිය යාන්තමින් දම් පාටට හැරුණා. මට මිදි සුවඳත්, ඊටත් වඩා කැකෑරුණු සුවඳකුත් දැනුණා- වයින් සුවඳ.

*වකස්!*

ඒ කීප දෙනෙකුගේ සිහිය එක වර බිඳී යන හඬයි. ඔල්මාදයේ හඬයි. එක ආරක්ෂකයෙක් පිස්තෝලය මස් කටුවක් වගේ දත්වලින් අල්ලගෙන අත් පා හතරෙන්ම දුවන්න ගත්තා. තවත් දෙන්නෙක් තුවක්කු බිම දමා වෝල්ට්ස් නැටුමක් නටන්න ගත්තා. හතර වෙනියා



අයිරිෂ් නැටුමක් වගේ එකක් නටන්න පටන් ගත්තා. ඒ මොහොතේ අපි ඒ තරම් බය වෙලා නොහිටියා නම් ඒවා දැකලා ඉළ ඇදෙනකල් හිනා වෙන්න තිබුණා.

"නෑ!" මැන්ටිකෝරයා බෙරිහන් දුන්නා. "මම ම ඔහේලට වැඩේ දෙන්නම්කෝ!"

එයාගේ වලිගයේ කටු කෙලින් වුණත්, එයාගේ කකුල්වලට යටින් වූ ලෑලිවලින් පිට පැන්න මිදි වැල් එසැණින්ම රාක්ෂයාගේ ඇඟ වෙලාගන්න පටන් ගත්තා. මැන්ටිකෝරයා මර හඬ දෙද්දී ඒ වැල්වල අලුතින් දලු දමමින් පුංචි කොළ පාට මිදි ගෙඩි හටගෙන, තත්පර ගාණක් තුළ දී මේරුවා. මොහොතකින් එයාව වැල්, කොළ සහ දම් පාටින් ඉදුණු මිදි පොකුරු ගොඩක් මැද ගිලුණා. අන්තිමේ දී මිදි වැල්වල සෙලවීම නතර වුණත් ඒ වෙද්දි ඇතුළේ තව දුරටත් මැන්ටිකෝරයා ඉතුරු වී නැති බව මගේ හිත කිවුවා.

"හොදායි," ශීතකරණයේ දොර වසමින් ඩයනයිසියස් කිවුවා. "ඒක නම් ජොලි වැඩක්."

මම හීරාත්ත වෙලා එයා දිහා බලා සිටියා. "ඔයා කොහොමද... ඔයා කොහොමද-"

"මාර ස්තුතියක්," එයා කෙඳිරුවා. "මනුෂ්‍යයෝ ඒකෙන් ගැලවෙයි. එයාලා දැන් ඉන්න තත්ත්වේ ස්ථිරව තියන්න ගියොත් ඒකට හේතු පැහැදිලි කරන්නත් වෙනවා. තාත්තට වාර්තා ලියන එක මට පේන්න බැරි වැඩක්."

එයා තාලියාට නුරුස්නා බැල්මක් හෙළුවා. "ඔයා පාඩමක් ඉගෙන ගන්නැති කියලා මං හිතනවා, කෙල්ලේ. බලයට විරුද්ධ වෙන එක ලේසි වැඩක් නෙවෙයි නේද?"

තාලියා රතු වුණේ ලැජ්ජාවට පත්වෙලා වගෙයි.

"මිස්ටර් ඩී," ග්‍රෝවර් කිවුවේ විස්මයෙන්. "ඔයා... ඔයා අපිව බේරගත්තා."

"ම්ම්. මට ඒ ගැන පසු තැවෙන්න තියන්නෙපා, සැටර්. දැන්, ගියොත් හොඳයි, පර්සි ජැක්සන්. වැඩිම වුණොත් මං ඔයාලට පැය තුන හතරක් අරන් දෙන්න ඇති."

Scanned with CamScanner

"ඔෆියොටෝරස්," මම කිවුවා. "ඌව කඳවුරට ගෙනියන්න ඔයාට පුළුවන් ද?"

මිස්ටර් ඩී නහය ඉහළට ඇද්දා. "මං පශු සම්පත් ප්‍රවාහනය කරන්නෑ. ඒක ඔයාලගේ ප්‍රශ්නයක්."

"ඒත් අපි කොහෙද යන්නේ?"

ඩයනයිසියස් zසෝයි දිහා බැලුවා. "ඔන්, මං හිතන්නේ දඩයක්කාරි ඒක දන්නවා. ඔයාලා ඉර බහින වෙලාවට ඇතුළු වෙන්න ඕනෑ, ඔයා දන්නවා නේ. නැත්නම් ඔක්කොම වතුරේ. එහෙනම්, සුබ ගමන්. මගේ පිසා එක සීතල වෙනවා."

"මිස්ටර් ඩී," මම කතා කළා.

එයා ඇහි බැමක් එසෙව්වා.

"ඔයා මගේ නම හරියට කියලා මට කතා කළා," මම කිවුවා. "ඔයා මට පර්සි ජැක්සන් කියලා කතා කළා."

"මං කොහෙත්ම එහෙම කළේ නැහැ, පීටර් ජොන්සන්. දැන් යනවලා!"

එයා අතක් වනද්දි එයාගේ රුව ඇඳි තිබුණු මීදුම විසිරුණා.

මැන්ටිකෝරයාගේ දාසයෝ තවමත් සිටියේ පිස්සු නටමින්. එයාලගෙන් කෙනෙකුට අපේ යාළු යාචකයාව මුණ ගැහිලා, ඒ දෙන්නා අඟහරුගෙන් ගොඩ බැස්ස යකඩ දූතයෝ ගැන බරපතළ සාකච්ඡාවක් කරමින් සිටියා. අනෙක් අය සත්තු වගේ සද්ද කරමින්, සංචාරකයන්ගේ සපත්තු හොරකම් කරන්න දඟලමින්, සංචාරකයින්ට අඩන්තේට්ටම් කරමින් සිටියා.

මම zසෝයි දිහා බැලුවා. "එයා මොකක්ද කිවුවේ... යන්න ඕනෑ තැන ඔයා දන්නවා කියලා?"

එයාගේ මූණත් මීදුමේ පාටට හැරුණා. එයා මුහුදු බොක්ක හරහා ගෝල්ඩන් ගේට් පාලමෙන් එපිටට අත දිගු කර පෙන්වූවා. දුර ඈත වලාකුළු තට්ටුවක් මැදින් ඉහළ නැගුණු කඳු ගැටයක් පෙනුණා.

"මගේ සහෝදරියන්ගේ උයන," එයා කිවුවා. "මට ගෙදර යන්න වෙනවා."

# 16
# අපිට සදාකාලික කට ගඳ මකරා මුණ ගැසුණා

"අපිට ඒක කරන්න බැරි වෙයි," zසෝයි කිවුවා. "අපි යන්නෙ ගොඩක් හෙමින්. ඒත් අපිට ඔෆියොටෝරස්ව දාලා යන්නත් බැහැ."

"උම්බෑ..!" බෙසී කිවුවා. අපි ජල තීරය දිගේ දුවද්දි එයා මට සමාන්තරව පිහිනා ආවා. ඒ වෙද්දි අපි සාප්පු සංකීර්ණය ඇති ජැටිය පසු කර ගොඩක් දුර ඇවිත් තිබුණා. අපි ගෝල්ඩන් ගේට් පාලම දෙසට යන්න පටන් ගෙන තිබුණත්, ඒක තිබුණේ මම හිතුවට වඩා ගොඩාක් දුරින්. දැනටමත් ඉර බටහිර අහසේ පල්ලම් බහින්න පටන් ගෙන තිබුණා.

"මට තේරෙන්නෑ," මම කිවුවා. "ඇයි අපි ඉර බහිද්දි එහෙට යන්න ඕනෑ?"

"හෙස්පෙරිඩිස්ලා කියන්නේ ඉර බැසීමට අධිපති අප්සරාවියෝ," zසෝයි කිවුවා. "අපිට එයාලගේ උයනට ඇතුළු වෙන්න ලැබෙන්නේ දහවල රැයට හැරෙද්දි විතරයි."

"අපිට ඒ වෙලාව මග ඇරුණොත්?"

"දක්ෂිණායනය හෙට. අපිට අද ඉර බහින වෙලාව මග ඇරුණොත් හෙට හවස් වෙනකල් බලන් ඉන්න වෙනවා. ඒ වෙද්දි

Scanned with CamScanner

ඔලිම්පියානු මන්ත්‍රණ සභාව ඉවර වෙලා තියෙයි. අපි අද රෑට කොහොම හරි ආර්ටෙමිස් උත්තමාවියව නිදහස් කරන්න ඕනෑ."

එහෙම නොවුණොත් ඇනබෙත්ට මැරෙන්න වෙයි, මම හිතුවත් කිවුවේ නැහැ.

"අපිට කාර් එකක් ඕනෑ," තාලියා කිවුවා.

"ඒත් බෙසීට මොකද කරන්නේ?" මම ඇසුවා.

ග්‍රෝවර් හිටි තැනම නැවතුණා. "මට අදහසක් ආවා! ඔෆියොටෝරස්ට වතුර තියෙන ඕනෑම තැනකින් මතු වෙන්න පුළුවන්, නේද?"

"හොදයි, ඔව්," මම කිවුවා. "මං කිවුවේ, එයා ලෝන්ග් අයිලන්ඩ් මුහුදේ හිටියා. ඊට පස්සෙ එක පාරටම හූවර් ඩෑම් එකෙන් මතු වුණා. දැන් එයා මෙතැන."

"ඒ කියන්නේ සමහරවිට ආපහු ලෝන්ග් අයිලන්ඩ් මුහුදට යන්න එයාව කැමති කරවගන්න අපිට පුළුවන් වෙයි," ග්‍රෝවර් කිවුවා. "ඊට පස්සේ එයාව ඔලිම්පස්වලට ගෙනියන්න කයිරොන් අපිට උදවු කරයි."

"ඒත් එයා එන්නෙ මගේ පස්සෙන් නේ," මම කිවුවා. "මම නැතුව යන්නෙ කොහෙද කියලා එයාට හොයාගන්න පුළුවන් වෙයි ද?"

"උම්බෑ..." බෙසී අනාථයෙක් වගේ හඬ ගෑවා.

"මට... මට පුළුවන් එයාට පාර පෙන්නන්න," ග්‍රෝවර් කිවුවා. "මම එයත් එක්ක යන්නම්."

මම එයා දිහා පුදුමයෙන් බැලුවා. ග්‍රෝවර් කියන්නේ වතුරට කැමති කෙනෙක් නෙවෙයි. ගිය අවුරුද්දේ රාක්ෂ සයුරේ දී එයා තව පොඩ්ඩෙන් ගිලිලා මැරෙනවා, ඒ වගේම එළු කුර නිසා එයාට හොදට පීනන්නත් බැහැ.

"එයාට කතා කරන්න පුළුවන් එකම කෙනා මම නේ," ග්‍රෝවර් කිවුවා. "ඉතින් එහෙම කරන එකයි හොඳ."

එයා පහළට නැමී බෙසීගේ කනට මොනවදෝ කෙඳිරුවා. වෙව්ලා ගිය බෙසී ඊට පස්සේ තෘප්තිමත් තප්පුලෑමක් කළා.



"වනාන්තරයේ ආශිර්වාදයක්," ග්‍රෝවර් කිවුවා. "එයාට පරිස්සමෙන් යන්න ඒක උදවු කරයි. පර්සි, ඔයාගේ තාත්තාටත් යාඥා කරන්න. අපිට පරිස්සමෙන් මුහුද හරහා යන්න එයාගෙන් උදවුවක් ගන්න පුළුවන් වෙයි ද බලන්න."

එයාලා කැලිෆෝනියාවේ ඉඳන් ලෝන්ග් අයිලන්ඩ්වලට කොහොම පිහිනන්න යනව ද මට තේරුම් ගන්න බැරි වුණා. ඒත් ඉතින් රාක්ෂයෝ ගමන් කරන්නේ මිනිස්සු වගේ නෙවෙයි නේ. ඒක ඔප්පු කරන්න ඕනෑ තරම් සාක්ෂි මම දැකලා තිබුණා.

මම මුහුදේ රළවලට, සුවඳට, හඬට සිත ඒකාග්‍ර කරන්න උත්සාහ කළා.

"තාත්තේ," මම කතා කළා. "අපිට උදවු කරන්න. ඔෆියොටෝරස්වයි ග්‍රෝවර්වයි පරිස්සමෙන් කඳවුරට ඇරලවන්න. එයාලව මුහුදේ දී ආරක්ෂා කරන්න."

"ඒ වගේ යාඥාවක දී පූජාවක් දෙන්නත් ඕනෑ," තාලියා කිවුවා. "මොකක් හරි ලොකු දෙයක්."

තත්පරයක් කල්පනා කරපු මම ඊට පස්සෙ මගේ කබාය ගැලෙව්වා.

"පර්සි," ග්‍රෝවර් කතා කළා. "ඔයාට විශ්වාස ද? ඔය සිංහ හම... ඒක ගොඩක් ප්‍රයෝජනවත් නේ. හර්කියුලිසුත් ඕක පාවිච්චි කළා!"

එයා ඒ කතාව කියූ හැටියේම මට යමක් තේරුම් ගියා.

මගේ දිහා සෝදිසියෙන් බලා සිටි ෂෝයි දෙසට මම බැල්මක් හෙළුවා. ෂෝයිගේ වීරයා වී සිටි කෙනාව මම දැන සිටි බව මට තේරුම් ගියා- එයාගේ ජීවිතය විනාශ කරලා, එයාව පවුලෙන් එළවන තැනට වැඩ සලස්වලා, එයාගෙන් උදවු ගත් බව කවදාවත් සඳහනක්වත් නොකළ කෙනා: ඒ හර්කියුලිස්, මම ජීවිතය පුරාම අගය කළ වීරයා.

"මම මැරෙන්නැතුව බේරෙන්න යනවා නම්," මම කිවුවා. "ඒ මට සිංහ හම් කබායක් තිබුණු නිසා නෙවෙයි. මම හර්කියුලිස් නෙවෙයි."

මම කබාය මුහුදු බොක්කට විසි කළා. ඒක නැවතත් රන්වන් සිංහ හමකට හැරී ඉර එළියෙන් දිලිසෙන්න ගත්තා. ඊට පස්සේ, රළ අතරේ ගිලෙද්දී ඒක පෙනුණේ වතුරට වැටුණු ඉර එළිය තුළ දිය වී යනවා වගෙයි.

මුහුදු හුළඟක් හමා ආවා.

ග්‍රෝවර් ගැඹුරු හුස්මක් ගත්තා. "හොඳයි, එහෙනම් නාස්ති කරන්න වෙලාවක් නැහැ."

එයා මුහුදට පැන්නා, එසැණින්ම එයාව ගිලෙන්න පටන් ගත්තා. එයා අසලට පිහිනා ආ බෙසී, ග්‍රෝවර්ට එයාගේ බෙල්ලේ එල්ලෙන්න ඉඩ දුන්නා.

"පරිස්සමෙන්," මම එයාලට කිවුවා.

"හරි," ග්‍රෝවර් කිවුවා. "හොඳයි, මේ... බෙසී? අපි ලෝන්ග් අයිලන්ඩ්වලට යන්නයි හදන්නේ. ඒක තියෙන්නේ නැගෙනහිර. අන්න අර පැත්තේ."

"උම්බෑ?" බෙසී කිවුවා.

"ඔව්," ග්‍රෝවර් උත්තර දුන්නා. "ලෝන්ග් අයිලන්ඩ්. ඒක මේ දූපතක්. ඒ වගේම, ඒක දිගයි. ඔන්, අපි යන්න පටන් ගමුකෝ."

"උම්බෑ..!"

බෙසී ඉදිරියට පැන්නා. එයා වතුර යටට ගිලෙන්න පටන් ගනිද්දී ග්‍රෝවර් කෑගැසුවා, "මට වතුර යට හුස්ම ගන්න බැරියෝ! මං හිතුවෙ මම ඒක කලින් කිවුවා කි-" *ජබොග්!*

එයාලා වතුර යටට කිඳා බහිද්දී, මගේ තාත්තා ඒ වගේ පොඩි පොඩි දේවල් ගැන- ඒ කියන්නේ හුස්ම ගන්න එක ගැන එහෙම බලා ගනීවි කියලා මම බලාපොරොත්තු වුණා.

"හොඳයි, එක ප්‍රශ්නයක් නම් ඉවරයි," ෂෙසෝයි කිවුවා. "ඒත් අපි කොහොමද මගේ සහෝදරියන්ගේ උයනට යන්නේ?"

"තාලියා හරි," මම කිවුවා. "අපිට කාර් එකක් ඕනෑ. ඒත් අපිට උදවු කරන්න කෙනෙක් නැහැ නේ. එහෙම නැත්නම් අපිට වෙන්නේ, අහ්, එකක් ණයට ගන්න."



එහෙම කරන්න මම නම් කැමති වුණේ නැහැ. මං කියන්නේ, ඇත්තටම මේක ජීවිතයත්-මරණයත් අතර මොහොතක් තමයි, ඒ වුණත් ඒක හොරකමක් නේ. ඒ වගේම, ඒකෙන් වෙන්නේ අපිව මිනිස්සුන්ගේ අවධානයට ලක් වෙන එකයි.

"ඔහොම ඉන්න," කියූ තාලියා, එයාගේ ගමන් මල්ල අවුස්සන්න ගත්තා. "අපිට උදවු කරන්න පුළුවන් කෙනෙක් සැන් ෆ්‍රැන්සිස්කෝවල ඉන්නවා. මගේ ළඟ එයාගේ ඇඩ්‍රස් එක තිබුණා."

"ඒ කවුද?" මම ඇසුවා.

තාලියා සටහන් පොතකින් ඉරාගත් පොඩි වුණු කොළ කෑල්ලක් ඇදලා අරන් පෙන්වූවා. "මහාචාර්ය චේස්, ඇනබෙත්ගේ තාත්තා."

★★★

අවුරුදු දෙකක් පුරාවට ඇනබෙත්, එයාගේ තාත්තා ගැන කියපු දේවල් අහලා තිබුණු මම බලාපොරොත්තු වුණේ එයාට යක්ෂ අං දෙකකුයි උල් දතුයි ඇති කියලයි. එයා පරණ මෝස්තරයේ ගුවන් නාවිකයෙකුගේ තොප්පියක් සහ ගොග්ල්ස් යුවළක් පැලඳගෙන ඉන්නවා දකින්න නම් මම කොහෙත්ම බලාපොරොත්තු වුණේ නැහැ. ඇස් කණ්ණාඩි හරහා පිටට නෙරා ආව ඇස් ගෙඩිවලින් එයාට කොයි තරම් අමුතු පෙනුමක් ලැබී තිබුණා ද කියනවා නම් අපි හැමෝම දොර පඩියෙන් ආපස්සට අඩියක් තැබුවා.

"හෙලෝ," එයා මිත්‍රශීලී හඬකින් කිවුවා. "ඔයාලා මගේ එයාර් ප්ලේන් අරගෙන ආව අය ද?"

තාලියායි, ෂෙසෝයි මමයි පරිස්සමෙන් එකිනෙකාගේ මූණු බලාගත්තා.

"ම්, නෑ, සර්," මම කිවුවා.

"මං," එයා කිවුවා. "මට තව සොප්විත් කැමල් තුනක් ඕනෑ."

"හරි," මම කිවුවත්, එයා මොනවා කියවනවා ද මට කිසිම අදහසක් තිබුණේ නැහැ. "අපි ඇනබෙත්ගේ යාළුවෝ."

"ඇනබෙත්?" එයා කෙලින් වුණේ මගෙන් එයාට විදුලියක් වැදුණා වගෙයි. "එයා හොඳින් නේද? මොකක්හරි කරදරයක්වත් ද?"

Scanned with CamScanner

අපි කවුරුවත් එයාට උත්තර දුන්නේ නැහැ, ඒත් අපේ මුහුණු දැක්කම මොකක්හරි ලොකු දෙයක් සිද්ධ වී ඇති බව එයාට තේරුම් යන්න ඇති. එයා, එයාගේ කැප් එක සහ ගොග්ල්ස් දෙක ගැලෙව්වා. එයාට ඇනබෙත්ගේ වගේ තඹ පාට කොණ්ඩයකුත්, දුඹුරු පාට තියුණු ඇස් දෙකකුත් තිබුණා. මැදි වියේ කෙනෙක් විදිහට බලද්දී එයා කඩවසම් වුණත්, එයා දවස් දෙකකින් විතර රැවුල කපලා නැහැ වගෙයි පෙනුණේ. ඒ මදිවට, එයා කමිසයේ බොත්තම් සම්පූර්ණයෙන්ම වැරදියට පියවාගෙන සිටි නිසා එක් පැත්තක කොලරය අනෙක් පැත්තට වඩා ඉස්සී තිබුණා.

"ඔයාලා ඇතුළට ආවොත් හොඳයි," එයා කිවුවා.

★★★

ඒ ගෙදර එයාලා මෑතක දී පදිංචියට ආව තැනක් වගේ නම් පෙනුනේ නැහැ. එහි පඩිපෙළ මත දැමූ රොබෝලාත්, විසිත්ත කාමරයේ සෝපාව මත නිදා ඉන්නා පූසො දෙන්නෙකුත් දකින්න ලැබුණා. මේසයක් මත අඩුක් කළ සඟරා ගොඩකුත්, බිම දැමූ පොඩි ළමයෙකුගේ ශීත කබායකුත් තිබුණා. මුළු ගෙදර පුරාම උණු උණු චොකලට්-චිප් විස්කෝතු සුවඳක් හැමුවා. මුළුතැන්ගෙය තුළින් ජෑස් සංගීතයක් ඇසුණා. එතැන පෙනුණේ හැඩි වුණු, සතුටින් පිරුණු ගෙදරක් වගෙයි- හරියට කවදාවත් හිස්ව නොතිබුණු තැනක් වගෙයි.

"තාත්තේ!" පුංචි පිරිමි ළමයෙක් බෙරිහන් දුන්නා. "මෙයා මගේ රොබෝගේ කෑලි ගලවනවා!"

"බොබී," මහාචාර්ය චේස් සිහිකල්පනාවක් නැතිව කිවුවා. "අයියගේ රොබෝගේ කෑලි ගලවන්නෙපා."

"මම තමයි බොබී," පුංචි පිරිමි ළමයා ආපහු කිවුවා. "එයා මැතිව්!"

"මැතිව්," මහාචාර්ය චේස් කතා කළා, "මල්ලිගේ රොබෝගේ කෑලි ගලවන්නෙපා."

"හා, තාත්තේ!"

මහාචාර්ය චේස් අපි වෙතට හැරුණා. "අපි උඩ තට්ටුවේ මගේ කන්තෝරු කාමරේට යමු. මෙහෙත් එන්න."

"වස්තුවේ?" ගෑනු කෙනෙක් කතා කළා. ඇනබෙත්ගේ කුඩම්මා තුවායකින් දෑත් පිස දමමින් විසිත්ත කාමරයට ආවා. රතු පාටින් තැනින් තැන වර්ණ ගැන්වූ කොණ්ඩය ගෙඩියකට ගැට ගසාගෙන සිටි එයා ලස්සන ආසියානු ගැහැනු කෙනෙක්.



"කවුද මේ අපේ අමුත්තෝ?" එයා ඇසුවා.

"ඔහ්," මහාචාර්ය චේස් කිවුවා. "මේ ඉන්නේ..." එයා හිස් බැල්මෙන් අපි දිහා බලා සිටියා.

"ෆෙඩ්රික්," එයා දොස් කිවුවා. "ඔයාට එයාලගේ නම් අහන්නත් අමතක වුණා ද?"

තරමක අපහසුවකට ලක් වුණත්, අපි එයාට අපිව හඳුන්වා දුන්නා. කොහොම වුණත් මිසිස් චේස් ඇත්තටම හොඳ කෙනෙක් වගෙයි පෙනුණේ. අපිට බඩගිනි ද කියලා එයා ඇහුවා. අපි ඔව් කිවුවා ම, එයා අපිට විස්කෝතු, සැන්ඩ්විචස් සහ සෝඩා ගෙනත් දෙන්නම් කිවුවා.

"වස්තුවේ," මහාචාර්ය චේස් කතා කළා. "එයාලා ඇවිත් තියෙන්නේ ඇනබෙත් ගැන කියන්න."

සුළු-දුවගේ නම මතක් කරපු හැටියේ එයා පරල වෙලා කෑගහන්න පටන් ගනී කියලා මගේ හිතේ කොණක සැකයක් තිබුණා, ඒත් එයා තොල් දෙක තදින් පියවාගෙන බලවත් සැලකිල්ලෙන් බැලුවා. "හරි එහෙනම්. ඔයාලා උඩ කන්තෝරු කාමරේට යන්නකෝ, මම කෑම අරන් එන්නම්." එයා මට හිනාවක් පෑවා. "ඔයාව මුණ ගැහෙන්න ලැබුණට සතුටුයි, පර්සි. මට ඔයා ගැන ගොඩක් අහන්න ලැබිලා තියෙනවා."

★★★

උඩ තට්ටුවේ මහාචාර්ය චේස්ගේ කන්තෝරු කාමරයට ගියාම මගේ කට ඉබේටම ඇරුණා, "වාව්!"

ඒ කාමරයේ බිත්ති පිරෙන්න පොත් අසුරා තිබුණත්, මගේ අවධානය වඩාත්ම යොමු වුණේ යුද සෙල්ලම් බඩුවලටයි. එතැන නිල් පාටින් පින්තාරු කළ ගඟක් දිගේ සටන් කරන චූටි සෙබළු, යුද ටැංකි, කඳු ගැට සහ කෘත්‍රිම ගස් පිරුණු යෝධ මේසයක් තිබුණා. සිවිලිමේ නූල්වල එල්ලා තිබුණු පරණ මෝස්තරයේ ගගන යාත්‍රා විකාර කෝණවලට ඇල කර තිබුණේ හරියට ඒවා ගුවන් සටනක නියැලෙනවා වගෙයි.

මහාචාර්ය චේස් හිනාවුණා. "ඔව්. ඉප්‍රස්වල තුන්වෙනි සටන. මම ලියවිල්ලක් ලියනවා, ඔයාට පේනවා නේ, සතුරු හමුදාවලට බරපතළ හානි කරන සොප්විත් කැමල් (පැරණි සැහැල්ලු ප්‍රහාරක ගුවන් යානා වර්ගයක්) ගැන. මං විශ්වාස කරන විදිහට එයාලා කිවුවට වඩා ලොකු වැඩ කොටසක් ඒවා කළා."

ගුවන් යානයක් නූලකින් කඩා ගත් එයා ඒක යුද පිටිය හරහා ඇදගෙන යමින් පුංචි ජර්මානු සෙබළුන්ව පෙරළන අතරේම කටින් එන්ජිමක් වගේ ශබ්ද කළා.

"ඔහ්, හරි," මම කිවුවා. ඇනබෙත්ගේ තාත්තා යුද ඉතිහාසය සම්බන්ධ මහාචාර්යවරයෙක් බව මම දැන සිටියා. ඒත් එයා සෙල්ලම් සෙබළු එක්ක සෙල්ලම් කරනවා කියලා නම් ඇනබෙත් කවදාවත් කියලා තිබුණේ නැහැ.

ඉදිරියට ආව ෆෙසෝයි යුද භූමිය අධ්‍යයනය කළා. "ජර්මන් හමුදාව හිටියෙ ගඟෙන් ගොඩාක් ඈතට වෙන්න."

මහාචාර්ය චේස් එයා දිහා බැලුවේ පුදුමයෙන්. "ඔයා කොහොමද ඒක දන්නේ?"

"මමත් එතැන හිටියා," එයා හරිම සාමාන්‍ය විදිහට කිවුවා. "යුද්ධයක් කොච්චර දරුණුයි ද, මනුෂ්‍යයෝ එකිනෙකා සටන් කරගන්නේ කොහොමද කියලා අපිට පෙන්වන්න ආර්ටෙමිස්ට ඕනෑ වුණා. ඒ වගේම ඒක මොන තරම් මෝඩකමක් ද කියලත්. ඒ යුද්ධය තනිකර ම නාස්තියක්."

මහාචාර්ය චේස්ගේ කට පුදුමයෙන් ඇරුණා. "ඔයා-"

"එයා දඩයක්කාරියක්, සර්," තාලියා කිවුවා. "ඒත් අපි මෙහෙට ආවෙ ඒකට නෙවෙයි. අපිට ඕනෑ-"

"ඔයා සොප්විත් කැමල්ස් දැක්ක ද?" මහාචාර්ය චේස් ඇසුවා. "ඒවා කීයක් තිබුණ ද? ඒවා පියෑඹුවේ මොන හැඩේට ද?"

"සර්," තාලියා ආයෙමත් මැදට පැන්නා. "ඇනබෙත් කරදරේක වැටිලා ඉන්නේ."

එයින් එයාගේ අවධානය ගන්න පුළුවන් වුණා. එයා ගුවන් යානය බිමින් තැබුවා.

"ඇත්තටම," එයා කිවුවා. "මට හැමදේම කියන්න."



ඒක ලේසි පහසු වැඩක් නොවුණත්, අපි උත්සාහ කළා. ඒ අතරවාරයේ දී පිටත දහවල එළිය ටිකෙන් ටික මැකී යමින් තිබුණා. අපිට තිබුණු කාලය ගිලිහී යමින් තිබුණා.

අපේ කතාව ඉවර වුණාම මහාචාර්ය චේස්, එයාගේ ලෙදර් හාන්සි පුටුව උඩට කඩා වැටුණා. එයා ඇඟිලි බැඳ ගත්තා. "මගේ අසරණ, චණ්ඩි කෙල්ල, ඇනබෙත්. අපි ඉක්මන් කරන්න ඕනෑ."

"සර්, අපිට ටැමල්පයිස් කන්දට යන්න වාහනයක් ඕනෑ," ෆෙසෝයි කිවුවා. "ඒ වගේම අපිට ඒක පුළුවන් තරම් ඉක්මනට ඕනෑ."

"මම ඔයාලව අරන් යන්නම්. හ්ම්ම්. මගේ කැමල් එකෙන් පියාඹලා යන්න තිබුණා නම් ගොඩක් ඉක්මන්. ඒත් ඒකේ ඉඩ තියෙන්නේ දෙන්නෙකුට විතරයි."

"වාව්. ඔයාට ඇත්තටම ප්ලේන් එකක් තියෙනව ද?" මම ඇසුවා.

"පහළ ක්‍රිසි ෆීල්ඩ් එකේ," මහාචාර්ය චේස් ආඩම්බරයෙන් කිවුවා. "මම මෙහෙට ආව හේතුව ඒකයි. මගේ අනුග්‍රාහයා පළවෙනි ලෝක යුද්ධයේ හොඳම කෞතුක වස්තු පෞද්ගලිකව එකතු කරන කෙනෙක්. එයා මට සොප්විත් කැමල් එකක් හදාගන්න ඉඩ-"

"සර්," තාලියා කතා කළා. "කාර් එකක් විතරක් තිබුණොත් හොඳටම ඇති. ඒ වගේම ඔයා නැතුව අපි විතරක් මේ ගමන ගියොත් වඩාත් හොඳයි. ඒක ගොඩක් අනතුරුදායකයි."

මහාචාර්ය චේස් අපහසුවෙන් රවා බැලුවා. "දැන්, විනාඩියක් ඉන්න, පුංචි නෝනේ. ඇනබෙත් කියන්නෙ මගේ දුව. අනතුරුදායක වුණත් නැතත්, මට... මට බැහැ නිකංම-"

"කෑම ගෙනාවා," මිසිස් චේස් නිවේදනය කළා. එයා පීනට් බටර් සහ ජෙලි සැන්ඩ්විච්ස්, මේ දැන් පෝරණුවෙන් බෑව විස්කෝතු සහ කෝක් පිරවූ බන්දේසියක් රැගෙන දොරෙන් ඇතුළට ආවා. "මට තාලියායි මමයි විස්කෝතුවල සුවඳ බලද්දී ෆෙසෝයි කතා කළා, ඔයාගේ වාහන එළවන්න පුළුවන්, සර්. මම පේන තරම් පොඩි නැහැ. ඔයාගේ වාහනේට කරදරයක් කරන්නෑ කියලා මං පොරොන්දු වෙනවා."

මිසිස් චේස්ගේ ඇහි බැම් එකට හා වුණා. "මොකක් ගැන ද මේ කතාව?"

Scanned with CamScanner

"ඇනබෙත්ට කරදරයක් වෙලා," මහාචාර්ය චේස් කිවුවා. "ටැම් කන්ද උඩ. මට එයාලව අරන් යන්න පුළුවන්, ඒත්... පෙනෙන හැටියට ඒක මිනිස්සුන්ට යන්න හොඳ තැනක් නෙවෙයි වගේ."

එයා කතා කළ විදිහෙන් දනුණේ අන්තිම කොටස කියන්න එයාට ගොඩක් අමාරු වුණා වගෙයි.

මම බලා සිටියේ මිසිස් චේස් එපා කියන තුරුයි. මං කියන්නේ, බාල වයස්කාර ළමයි තුන් දෙනෙකුට තමන්ගේ කාරය අරන් යන්න ඉඩ දෙන්නෙ මොන මනුස්ස අම්මා ද? ඒත් මාව පුදුම කරමින් මිසිස් චේස් ඔළුව වැනුවා. "එහෙනම් ඔයාලා ඉක්මන් කළොත් හොඳයි."

"හරි!" පුටුවෙන් උඩ පැන්න මහාචාර්ය චේස් සාක්කු අතගාන්න පටන් ගත්තා. "මගේ යතුරු..."

එයාගේ නෝනා සුසුමක් පිට කළා. "ඇත්තටම, ෆෙඩ්රික්, ඔයාගේ තොප්පිය අස්සෙ හිර වෙලා නොතිබ්බා නම් ඔයා ඔළුවත් නැති කරගන්නවා. යතුරු ටික ඉස්සරහ දොර ළඟ කොක්කේ එල්ලලා ඇති."

"හරි!" මහාචාර්ය චේස් කිවුවා.

ෂෙසා්යි සැන්ඩ්විච් එකක් ඩැහැ ගත්තා. "නුඹලා දෙන්නටම ස්තුතියි. අපි යන්න ඕනෑ. දැන්ම."

අපි කඩිමුඩියේ තෙරපෙමින් දොරෙන් පිට වී පඩිපෙළ පහළට දිවුවා. චේස් යුවළ අපිත් එක්කම ආවා.

"පර්සි," මම පිට වී යද්දී මිසිස් චේස් කතා කළා, "ඇනබෙත්ට කියන්න... එයාට කියන්න එයාට තවමත් මෙහෙ ගෙදරක් තියෙනවා කියලා, හොඳද? එයාට ඒක මතක් කරලා දෙන්න."

මම හැඩි වුණ විසිත්ත කාමරය දිහා අන්තිම වතාවටත් බැලුවා, ඇනබෙත්ගේ අර්ධ සහෝදරයෝ සෙල්ලම් බඩු විසුරුවාගෙන රණ්ඩු කරමින් සිටියා. වාතය විස්කෝතු සුවඳින් පිරී තිබුණා. ඒක නරක තැනක් නම් නෙවෙයි, මට හිතුණා.

"මම එයාට කියන්නම්," මම පොරොන්දු වුණා.

අපි එළියේ ගාල් කර තිබුණු කහ පාට කාරයට දිවුවා. දැන් ඉර බැස යමින් තිබුණා. ඇනබෙත්ව බේරගන්න අපිට ඉතිරිව ඇත්තේ තව පැයකටත් අඩු කාලයක් බව මට තේරුම් ගියා.



★★★

"මේකට මීට වඩා වේගයෙන් යන්න බැරි ද?" තාලියා ප්‍රශ්න කළා.

ෂෙසා්යි එයාට රැවුවා. "වාහන තදබදේට මං මොනවා කරන්න ද."

"ඔය දෙන්නත් හරියට මගේ අම්මා වගේ," මම කිවුවා.

"කට වහගන්නවා!" ඒ දෙන්නම එකට කිවුවා.

ෂෙසා්යි ගෝල්ඩන් ගේට් පාලම දෙසට වාහන තදබදය අතරින් රිංගමින් ඇදුණා. අන්තිමේ දී අපි අධිවේගී මාර්ගයෙන් පිට වී මැරින් කන්ට්‍රිවලට ඇතුළු වෙද්දී ඉර ක්ෂිතිජයේ ගිලෙන්න පටන් ගෙන තිබුණා. වනාන්තර මැදින්, කඳු ගැට උඩින් සහ ගිරි කඳුරු වටෙන් ඇදී ගිය පාර හිතාගන්නත් බැරි තරම් පටු වුණත් ෂෙසා්යි වේගය නම් අඩු කළේ නැහැ.

"ඇයි මේ හැම තැනම කැස්සට බොන පැණිවල සුවඳ එන්නේ?" මම ඇසුවා.

"යුකැලිප්ටස්." ෂෙසා්යි අපිව වට කරගෙන තිබුණු රුස්ස ගස් පෙන්වූවා.

"කෝලා වලස්සු කන ඒව ද?"

"උනුයි, රාක්ෂයෝයි," එයා කිවුවා. "ඒවගේ කොළ කන්න උන් ආසයි. විශේෂයෙන්ම මකරු."

"මකරු යුකැලිප්ටස් කොළ කනවා?"

"මාව විශ්වාස කරන්න," ෂෙසා්යි කිවුවා. "නුඹටත් මකරුන්ට වගේ හුස්මක් තිබුණොත්, නුඹත් යුකැලිප්ටස් හපන්න ගනීවි."

එයාගෙන් වැඩි දුර ඒ ගැන අහන්න ගියේ නැතත්, මම වටපිටාව ගැන වඩාත් සෝදිසියෙන් යන්න පටන් ගත්තා. ටැමල්පයිස් කන්ද අපිට ඉදිරියෙන් නැඟී සිටියා. මං හිතන්නේ කන්දක් විදිහට බලද්දී ඒක පුංචි එකක් වුණත්, අපි ඒ දිහාවට වාහනය පදවාගෙන යද්දී නම් ඒක සෑහෙන ලොකුවටයි පෙනුණේ.

"එතකොට මේක ද දොම්නසේ කන්ද?" මම ඇසුවා.

"ඔව්," ෂෙසා්යි තදින් කිවුවා.

Scanned with CamScanner

"ඇයි ඒකට එහෙම කියන්නේ?"

එයා උත්තරයක් දුන්නේ හැතැප්මක් විතර යනකල් නිහඬව ඉඳලයි. "ටයිටන්ලගෙයි දෙවිවරුන්ගෙයි යුද්ධයෙන් පස්සේ, ගොඩක් ටයිටන්ලාට දඬුවම් දීලා සිරගත කළා. ක්‍රෝනොස්ව කෑලිවලට කපලා ටාටරස්වලට දැම්මා. ක්‍රෝනොස්ගේ දකුණු අත වගේ හිටපු කෙනා, එයාගේ හමුදාවල ජෙනරල්ව මේ කන්ද මුදුනේ, හෙස්පෙරිඩීස්ලගෙ උයනට එපිටින් හිර කළා."

"ජෙනරල්," මම කිව්වා. කඳු මුදුන වටා වලාකුළු කැකෑරෙනවා වගේ පෙනුණේ හරියට කන්දට ඒවා ඇද ගන්නවා වගෙයි. "උඩ මොනවද ඒ වෙන්නේ? කුණාටුවක් ද?"

ෂෙසොයි උත්තර දුන්නේ නැහැ. ඒ වුණත් ඒ වලාකුළුවල තේරුම එයා හරියටම දන්න බවත්, ඊට එයා අකමැති බවත් මට හැඟුණා.

"අපිට හිත් තදින් එකඟ කරගන්න වෙනවා," තාලියා කිව්වා. "මෙහෙ මීදුම ගොඩාක් බලවත්."

"මායා මීදුම ද, සොභාවික එක ද?" මම ඇසුවා.

"දෙකම."

කන්දට උඩින් අළු පාට වලාකුළු තව තවත් ගනට සුළි නංවද්දී අපි කෙලින්ම එය වෙත ඇදුණා. දැන් වනාන්තරයෙන් පිට වී සිටි අපි කඳු ප්‍රපාත, තණකොළ, ගල් කුළු සහ මීදුම පිරුණු පුළුල් විවෘත බිමකට ඇතුළු වී සිටියා.

සොභාවික වංගුවකින් හැරෙද්දී අහම්බයෙන් වගේ මුහුද දිහා බැලූ මට දකින්න ලැබුණු දෙයින් මාව උඩ ගියා.

"බලන්න!" ඒත් අපි වංගුව හැරී යද්දී කඳු ගැටවලින් මුහුද වැසුණා.

"මොකක්ද?" තාලියා ඇසුවා.

"සුදු පාට ලොකු නැවක්," මං කිව්වා. "වැල්ලට කිට්ටුවෙන් නැංගුරම් දාලා. ඒක සංචාරක නැවක් වගෙයි."

එයාගේ ඇස් ලොකු වුණා. "ලූක්ගේ නැව ද?"



මට ඕනෑ කළේ මට ඒක විශ්වාස නැති බව කියන්නයි. සමහරවිට ඒක අහඹු සිදුවීමක් වෙන්න ඇති. ඒත් මම ඊට වඩා දැන සිටියා. ප්‍රින්සස් ඇන්ඩ්‍රොමීඩා, ලූක්ගේ රාක්ෂයෝ පිරුණු නැව ඒ වෙරළේ නැංගුරම් දමලා. එයා නැව පැනමා ඇළ දක්වාම යවා තිබුණේ ඒකටයි. නැගෙනහිර වෙරළේ සිට කැලිෆෝනියාව දක්වා යාත්‍රා කරන්න ඇති එකම ක්‍රමය ඒකයි.

"එහෙනම්, අපිට උන් එක්ක හැප්පෙන්න වෙයි," ෂෙසොයි දරුණු ලෙස කිව්වා. "ක්‍රෝනොස්ගේ හමුදාව එක්ක."

මම ඊට යමක් කියන්න ලෑස්ති වෙද්දී, එක පාරටම මගේ බෙල්ල පිටුපස කෙස් කෙලින් වුණා. තාලියා කෑගැසුවා. "කාර් එක නවත්තනවා. දැන්ම!"

ෂෙසොයිටත් මොකක් හෝ වරදක් ඇති බව දැනිලා ද කොහෙදෝ එයා ප්‍රශ්න නොකරම තිරිංග පෑගුවා.

වේගයෙන් වට දෙකක් කැරකුණු කහ පාට කාරය ප්‍රපාතය අද්දර නැවතුණා.

"එළියට!" දොර විවර කළ තාලියා මාව එළියට තල්ලු කළා. අපි දෙන්නා පදික වේදිකාව මත පෙරළුණා. ඊළඟ තත්පරයේ දීඃ බූම්!

විදුලියක් කොටද්දී මහාචාර්ය චේස්ගේ වොක්ස්වැගනය කහ පාට අත් බෝම්බයක් වගේ පුපුරා ගියා. මට ඉහළින් මතු වූ තාලියාගේ පලිහ නොතිබෙන්න පිපුරුමෙන් විසි වුණු උණ්ඩ කැබලි වැදිලා මාව මැරෙන්න වුණත් ඉඩ තිබුණා. මට ලෝහ පොඩි පට්ටම් වෙන හඬක් ඇසුණා. ඇස් ඇරලා බලද්දී මට දකින්න ලැබුණේ අපිව සුන්බුන් ගොඩකින් වට වී ඇති හැටියි. කාරයේ බඳේ කොටසක් පාරට කිඳා බැස තිබුණා. දුම් දමන හුඩ් එක තවත් තැනක කැරකෙමින් තිබුණා. කහ පාට ලෝහ කෑලි පාර පුරා විසිරිලා.

කටට දැනුණු දුම් රස ගිල දැමූ මම තාලියා දිහා බැලුවා. "ඔයා මාව බේරුවා."

"'මව් පිය අතින් එකෙකු නැසෙනු ඇත,'" එයා කෙඳිරුවා. "එයාට හෙණම ගහපි. එයා මාව විනාශ කරනව ද? මේ මාව?"

එයා කතා කරන්නේ එයාගේ තාත්තා ගැන කියලා තේරුම් ගන්න මට තත්පරයක් ගියා. "ඔහ්, හේයි. ඒක සියුස්ගේ අකුණක් වෙන්න බැහැ. කොහෙත්ම බැහැ."

"එහෙනම් කාගෙ ද?" එයා ප්‍රශ්න කළා.

"මං දන්නෑ. ටෙසෝයි, ක්‍රෝනොස්ගේ නම කිවුවනේ. සමහරවිට එයා-"

තාලියා ඔළුව සොලවද්දී, එයාට තිබුණේ තරහා ගිය සහ පුදුමයෙන් තිගැස්සුණු පෙනුමක්. "නෑ. එහෙම නෙවෙයි."

"පොඩ්ඩක් ඉන්න," මම කිවුවා. "ටෙසෝයි කොහෙද? ටෙසෝයි!"

අපි දෙන්නම උන් තැන්වලින් නැගිටලා කුඩු වී ගිය කාරය වටේ දිවුවා. ඇතුළේ කිසිවක් නැහැ. පාර දෙපැත්තෙත් නැහැ. මම ප්‍රපාතය පහළටත් එබී බැලුවා. එයාගේ කිසිම ලකුණක් නැහැ.

"ටෙසෝයි!" මම කෑගැසුවා.

ඒත් එක්කම මගේ එහා පැත්තෙන් මතු වුණ එයා මගේ අතින් ඇද්දා. "කට වහ ගන්නවා, මෝඩයෝ! තට ඕනෑ ලැඩොන්ව ඇහැරවන්න ද?"

"ඒ කියන්නෙ අපි එහෙට ඇවිල්ල ද?"

"ගොඩක් කිට්ටුයි," එයා කිවුවා. "මගේ පස්සෙන් එනවා."

මීදුම් කැරලි පාර හරහා පාවී යමින් තිබුණා, ටෙසෝයි එයින් එකක් තුළට අඩිය තැබුවා. මොහොතකින් මීදුම ඉවත් වෙද්දී තව දුරටත් එයා එතැන සිටියේ නැහැ. තාලියායි මමයි මූණෙන් මූණ බලා ගත්තා.

"ටෙසෝයි ගැන තදින් හිතන්න," තාලියා උපදෙස් දුන්නා. "අපි එයා පස්සේ යනවා. ඒක හිතේ තියාගෙන කෙලින්ම මීදුමට යන්න."

"පොඩ්ඩක් ඉන්න, තාලියා. කලින් ජැටියෙදී සිද්ධ වුණ දේ... මං කිවුවේ, මැන්ටිකෝරයායි බිලි පූජාවයි-"

"මට ඒ ගැන කතා කරන්න ඕනෑ නෑ."

"ඔයා ඇත්තටම ඒක... ඔයා දන්නවනේ?"

එයා පසුබෑවා. "මං හිටියෙ ගැස්සිලා. එච්චරයි."

"කාර් එකට අකුණක් එවුවේ සියුස් නෙවෙයි. ඒක කළේ ක්‍රෝනොස්. ඔයාගේ හිතේ ඔයාගේ තාත්තා ගැන තරහක් ඇති කරලා එයා ඔයාව පාලනය කරන්නයි හදන්නේ."



එයා ගැඹුරු හුස්මක් ගත්තා. "පර්සි, ඔයා මගේ හිත හදන්න බලන්නේ කියලා මං දන්නවා. ස්තුතියි. ඒත් එන්න යමු. අපි යන්න ඕනෑ."

එයා ගන මීදුම තුළට අඩිය තබද්දී මම එයා පසුපස ගියා.

මීදුම පහ වී යද්දී මම තවමත් කලින් උන් තැනම සිටියත්, පාර ගුරු පාරකට හැරී තිබුණා. තණකොළ වඩාත් ඝනව වැඩී තිබුණා. බැස යන ඉරේ එළිය මුහුද හරහා ලේ රතු පාට පැල්ලමක් ඇන්දා. කුණාටු වලාකුළු සහ දළ බලයන් සුළි නංවමින් තිබුණු කඳු මුදුන දැන් වඩාත් ළං වී පෙනුණා. එයට ළඟා වීමට හැකි එකම පාර අපිට ඉදිරියෙන් ආරම්භ වුණා. ඒ අඩි පාර වැටී තිබුණේ සෙවණැලිවලින් මුවා වුණු සාරවත් තණ බිම් සහ මල් අතරිනුයි: මට හීනෙන් දකින්න ලැබුණු විදිහටම, ඒ අරුණෝදයේ උද්‍යානයයි.

***

සද්දන්ත මකරා නොහිටියා නම් ඒ උයන මම මේ තරම් කාලෙකට දැකපු ලස්සනම තැන වෙන්න ඉඩ තිබුණා. එහි තණකොළ සැඳෑවේ රිදී එළියෙන් දිලිසුණා, එහි පිපී තිබුණු මල්වල පාට කොයි තරම් දීප්තිමත් ද කියනවා නම්, ඒවා අඳුරේ දිලිසෙනවා වගෙයි පෙනුණේ. ඔප දැමූ කළු ගරුඬ ගලින් සෑදූ පිය ගැට තට්ටු-පහක්-උස-ඇපල් ගහක් දෙපැත්තෙන් වැටී තිබුණා. ඒ ගහේ හැම අත්තක්ම රත්තරන් ඇපල් ගෙඩිවලින් දිලිසුණා. මං අදහස් කළේ කඩවල්වල විකුණන කහ පාට ඒවා නෙවෙයි. මේවා ඇත්තම රත්තරන් ඇපල් ගෙඩි. ඒවා ඒ තරම් සිත් ඇදගන්නාසුලු වුණේ ඇයි කියලා විස්තර කරන්න මට බැහැ, ඒත් ඒ ගෙඩියකින් එක කෑල්ලක් කන්න ලැබුණොත් ඒක මම මේ තරම් කාලෙකට රස බැලූ ප්‍රණීතම දේ වෙන බව ඒවගේ සුවඳ දැනුණු හැටියේම මට තේරුම් ගියා.

"සදාකාලිකත්වයේ ඇපල්," තාලියා කිවුවා. "සියුස්ගෙන් හේරාට ලැබුණු මඟුල් තෑග්ග."

කෙලින්ම ගහ ළඟට ඇවිදගෙන ගිහින් ගෙඩියක් කඩා ගන්න මට ඕනෑ වුණත්, එහෙම කරන්න බැරි වුණේ ගහ වටේ දරණ ගසාගෙන සිටි මකරා නිසයි.

දැන්, මම මකරෙක් කියද්දී ඔයා මොනවා හිතාවි ද මම දන්නේ නැහැ. හැබැයි ඔයාගේ හිතේ මැවෙන දේ මොකක් වුණත්, ඒක හය

මේ සර්පයාගේ කඳ තඹ පාට කොරපොතුවලින් දිලිසුණා. මට ගණන් කර ගන්නත් බැරි තරම් ඔළු ගොඩක් ඌට තිබුණේ හරියට විසකුරු පොළොඟුන් සිය ගාණක් එකට හා වෙලා වගෙයි. එයා නිදාගෙන ඉන්නවා වගෙයි පෙනුණේ. ලොකු ගොඩැල්ලක් මත වැතිරී තිබුණු ඔළු ගොඩේ දෑස් සියල්ල පියවී තිබුණා.

ටිකකින් අපිට ඉදිරියෙන් වූ හෙවණැලි සෙලවෙන්න පටන් ගත්තා. ඒත් එක්කම ළිං පතුලකින් නැගෙන හඬක් වගේ ලස්සන, බිහිසුණු ගායනාවක් ඇසුණා. මම රිප්ටයිඩ් වෙත අත යැවුවත් ෆෙසෝයි මාව නැවැත්වුවා. රූප හතරක් සැලෙමින් දිලිසී ජීවමාන වුණා- පෙනුමෙන් ෆෙසෝයි වගේම තරුණ ගැහැනු හතර දෙනෙක්. එයාලා හැමෝම සුදු පාට ග්‍රීක කයිටෝනවලින් සැරසී සිටියා. එයාලගේ හම කැරමල් පාට ගත්තා. එයාලගේ සිනිඳු කළු කොණ්ඩා උරහිස් මතින් කඩා හැලුණා. ඒක අමුතු දෙයක් වුණත්, ෆෙසෝයිගේ සහෝදරියෝ, හෙස්පෙරිඩීස්ලා දකිනකල් මට ෆෙසෝයි කොයි තරම් ලස්සන ද කියලා තේරුම් ගන්න බැරි වුණා. එයාලා ෆෙසෝයිගේ කපාපු පළු වගේ ප්‍රභාවත්, ඒ වගේම පෙනුණු හැටියට ගොඩාක් අනතුරුදායක වෙන්නත් ඇති.

"සහෝදරී," ෆෙසෝයි කතා කළා.

"අපිට කිසිම සහෝදරියක් පේන්නෙ නැහැ," එක ගැහැනු ළමයෙක් තපුරු හඬින් කිවුවා. "අපිට පේන්නේ අර්ධ-ලෝහිතයෝ දෙන්නෙකුයි, දඩයක්කාරියෙකුයි විතරයි. ඒ හැමෝම ඉක්මනින් මැරිලා යන අය."

"ඔයාලට වැරදිලා." මම ඉදිරියට අඩියක් තැබුවා. "කවුරුවත් මැරෙන්නෙ නැහැ."

ගැහැනු ළමයි මාව පිරික්සා බැලුවා. එයාලගේ ඇස් යමහල් පාෂාණ වගේ තනි කළු පාටයි.

"පර්සියස් ජැක්සන්," එකියක් කිවුවා.

"ඔව්," තවෙකෙක් කල්පනාබරව කිවුවා. "ඔහුට බය වෙන්න කාරණයක් මට නම් පේන්නෙ නැහැ."

"කවුද කිවුවේ මට බය වෙන්න කියලා?"



පළවෙනි හෙස්පෙරිඩීස් ආපසු හැරී කඳු මුඳුන දිහා බැලුවා. "එයාලා තට බයයි. මැය තවම තාව නොමැරුවාට එයාලා ඉන්නේ අසතුටෙන්." එයා තාලියාට ඇඟිල්ල දිගු කළා.

"සමහර වෙලාවට එහෙම හිතෙනවා තමයි," තාලියා පිළිගත්තා. "ඒත් එපා. ස්තූතියි. එයා මගේ යාළුවෙක්."

"මෙහෙ යාළුවෝ නැහැ, සියුස්ගේ දියණිය," ගැහැනු ළමයා කිවුවා. "හතුරෝ විතරයි. ආපසු යනු."

"ඇනමෙත් නැතුව යන්නේ නෑ," තාලියා කිවුවා.

"ඒ වගේම ආර්ටෙමිස්වත්," ෆෙසෝයි කිවුවා. "අපි කන්දට යන්න ඕනෑ."

"ඔහු තීව මරාවි කියලා දන්නවා නේ," ගැහැනු ළමයා කිවුවා. "තට ඔහුත් එක්ක හැරෙන්නවත් බැහැ."

"ආර්ටෙමිස් නිදහස් වෙන්න ඕනෑ," ෆෙසෝයි තදින් කිවුවා. "අපිට යන්න දෙන්න."

ගැහැනු ළමයා ඔළුව හෙල්ලුවා. "තුඹට තව දුරටත් මෙහි කිසිම අයිතියක් නැහැ. අපිට කරන්න තියෙන්නෙ අපේ හඬ වැඩි කරන්න විතරයි. එතකොට ලැඩොන් අවදි වෙයි."

"එයා මට මුකුත් කරන්නේ නැහැ," ෆෙසෝයි කිවුවා.

"නෑ? එතකොට තීගේ යාළුවෝ කියන අයට මොකද වෙන්නෙ?"

ඒ වෙලාවේ ෆෙසෝයි කළේ මම කොහෙත්ම නොහිතු දෙයක්. එයා කෑගැහුවා, "ලැඩොන්! නැගිටිනවා!"

මකරා දඟලද්දී පැත්සයේ කාසි කන්දක් වගේ දිලිසුනා. බය වී කෑගැසූ හෙස්පෙරිඩීස්ලා විසිරුණා. "තිට පිස්සු ද?" එතැන මුල් තැන ගෙන සිටි ගෑනු ළමයා ඇසුවා.

"තුඹට කවදාවත් කිසිම ධෛර්යක් තිබුණෙ නැහැ, සහෝදරී," ෆෙසෝයි කිවුවා. "තීගේ ප්‍රශ්නය ඒකයි."

දැන් ඇඹරෙමින් සිටි ලැඩොන් මකරාගේ සිය ගාණක් ඔළු වටේටම කස පහර දෙමින්, දිවවල් දිගු කරමින් හුළඟේ රස බලන්න ගත්තා. ෆෙසෝයි අත් ඔසවාගෙන අඩියක් ඉදිරියට තැබුවා.

"Zසෝයි, එපා." තාලියා කිවුවා. "ඔයා දන් හෙස්පෙරිඩ් කෙනෙක් නෙවෙයි. එයා ඔයාව මරයි."

"ලැඩොන්ව පුරුදු කරලා තියෙන්නේ ගහ රකින්න," Zසෝයි කිවුවා. "උයන වටෙන් ගිහින් කන්ද උඩට යන්න. වඩාත් ලොකු තර්ජනයක් මගෙන් එල්ල වෙනකල්, එයා තාව නොසලකා අරින්න ඕනෑ."

"නොසලකා අරින්න ඕනෑ," මම කිවුවා. "ඒක නම් එච්චර හිත සනසවන දෙයක් නෙවෙයි."

"මේක තමයි එකම ක්‍රමය," එයා කිවුවා. "අපි තුන් දෙනාම එකතු වුණත් එයාට විරුද්ධව සටන් කරන්න බැහැ."

ලැඩොන්, ඌගේ කටවල් ඇරියා. සර්ප ඔළු සියයක් එක සැරේට ම පිඹින හඬට මගේ කොඳු නාරටිය දිගේ හිරියක් පැතිරුණා, ඒ ඌගේ හුස්ම මගේ ඇඟේ වදින්න කලිනුයි. ඒ ගඳ හරියට ඇසිඩ් වගෙයි. එයින් මගේ ඇස්වල දැවිල්ලකුත්, හමේ කැසිල්ලකුත් ඇති කළේ මගේ කෙස් පවා කෙලින් කරමින්. එක ගිම්හානයක් මැද අපේ ගේ ඇතුළේ මීයෙක් මැරිලා හිටපු කාලේ මට මතක් වුණා. මේ ගඳත් අන්න ඒ වගෙයි. හැබැයි ඊටත් වඩා සිය ගුණයක් විතර වැඩියි. ඒ වගේම ඒකට යුකැලිප්ටස් හපවල ගඳත් මුසු වී තිබුණා. මීට පස්සෙ කවදාවත් ඉස්කෝලේ හෙදියගෙන් කැස්සට බොන පැණි නම් ඉල්ලන්නෙ නැහැ කියලා මම ඒ වේලාවේ ම හිතා ගත්තා.

මට, මගේ කඩුව අතට ගන්න ඕනෑ වුණත්, Zසෝයි සහ හර්කියුලිස් ගැන දකපු හීනය ඒ වෙලාවේ මගේ මතකයට ආවා. මකරා එක්ක මුහුණට මුහුණ සටන් කරලා හර්කියුලිසුත් පැරදී තිබුණා. ඒ නිසා Zසෝයිගේ තීන්දුව විශ්වාස කරන්න මම තීරණය කළා.

තාලියා වම් පැත්තට යද්දී මම දකුණු පැත්තට ගියා. Zසෝයි කෙලින්ම රාක්ෂයා ඉදිරියට ඇවිද ගියා.

"මේ මම, මගේ චූටි මකරෝ," Zසෝයි කිවුවා. "Zසෝයි ආපහු ආවා."

ලැඩොන් ඉස්සරහටත් පස්සටත් මාරු වුණා. ඌගේ සමහර කටවල් වැසී යද්දී සමහර ඒවා නොනවත්වාම සූ හඬ ගෑවා. මකර පටලැවිල්ලක්. ඒ අතරේ හෙස්පෙරිඩීස්ලා සැලෙමින්



දිලිසී හෙවණැලිවලට හැරුණා. "මෝඩි." වැඩිමහල් කෙනාගේ හඬ කෙඳිරුවා.

"මං තට මගේ අතින්ම කන්න දීලා තියෙනවා," Zසෝයි නොනවත්වාම නැලවිලි හඬින් කතා කරමින් රත්තරන් ගහ දෙසට පිය මැන්නා. "නුඹ තවමත් බැටළු මස්වලට ආස ද?"

මකරාගේ ඇස් දීප්තිමත් වුණා.

තාලියායි මමයි උයන වටෙන් බාගයක් දුර ගොස් තිබුණා. ඉදිරියෙන් අඳුරු කඳු මුඳුන දක්වා ම දිවෙන, ගලින් සෑදූ තනි අඩි පාරක් මට දකින්න ලැබුණා. ඉහළින් කුණාටුවක් සුළි නංවමින් කඳු මුඳුන වටා කැරකෙමින් තිබුණේ මුළු ලෝකයේ ම අක්ෂය එතැන වගෙයි.

අපි තණ පිටියෙන් පිට වෙන්න ළං වෙද්දී ම මොකක් හෝ වරදක් සිදු වුණා. මකරාගේ හිත වෙනස් වෙනවා මට දැනුණා. සමහරවිට Zසෝයි ඕනෑවටත් වඩා ළඟට යන්න ඇති. එහෙමත් නැත්නම් බඩගිනියි කියලා මකරාට මතක් වෙන්න ඇති. හේතුව මොකක් වුණත්, ඌ Zසෝයිට පහර දෙන්න පැන්නා.

අවුරුදු දෙදහසක පුහුණුවීම් Zසෝයිගේ පණ බේරුවා. පහර දෙන දළ දෙකකින් අහකට පැන්න එයා තවත් කටක් යටින් රිංගා මකර ඔළු අතරින් කරණම් ගසමින් අපි දෙසට දුව ආවේ රාක්ෂයාගේ බිහිසුණු කට ගඳට හුස්ම හිර කරගෙනයි.

උදවු කරන්න මම රිප්ටයිඩ් ඇදලා ගත්තා.

"එපා!" Zසෝයි හති දැමුවා. "දුවන්න!"

මකරා එයාගේ පැත්තක් හපා කද්දී Zසෝයි වේදනාවෙන් කෑගැසුවා. තාලියා ඒගීස්ව ඉදිරියට දිගු කරද්දී මකරා පිම්බා. ඌ දෙගිඩියාවෙන් ඉන්න අතරේ Zසෝයි අපිව පසු කරගෙන කන්ද උඩට දිවුවා. අපි එයා පසුපස දිවුවා.

අපිව ලුහුබඳින්න මකරා උත්සාහ කළේ නැහැ. ඌ පිඹිමින් පොළොවේ අඩි හැප්පුවා, ඒත් මං හිතන්නේ ඌව ගහ රකින්න හොඳින් ම පුහුණු කරලයි තිබුණේ. අඩු තරමේ රස වීරයෝ තුන් දෙනෙක්ව කන්න ලැබුණත් එතැනින් යන්න ඌ සූදානම් වුනේ නැහැ.

අපි කන්ද ඉහළට දුවද්දී අපිට පිටුපස හෙවණැලි අතරේ උන් හෙස්පෙරිඩීස්ලා ආයෙමත් ගී ගයන්න පටන් ගත්තා. දැන් නම් මට ඒ ගී හඬ ඇසුණේ මළ අඳෝනා වගෙයි.

***

කඳු මුදුනේ වූ ගෙවල් තරම් ලොකු කළු ගල් සහ කිරි ගරුඬ කුට්ටි, බිඳී ගිය කුලුනු විසිරී තිබුණා. බාගෙට දිය වී ගිය ලෝකඩ ප්‍රතිමා තැන තැන දකින්න ලැබුණා.

"ඔත්‍රිස් කන්දේ නටබුන්," තාලියා විස්මයෙන් කෙඳිරුවා.

"ඔව්," ෂෙසෝයි කිවුවා. "මීට කලින් ඒක මෙහෙ තිබුණේ නැහැ. මේක නම් නරකයි."

"මොකක්ද ඔත්‍රිස් කන්ද කියන්නේ?" සුපුරුදු විදිහටම අමන ගතියක් දනෙද්දී මම ඇහුවා.

"ටයිටන්ලගේ කඳුකර බලකොටුව," ෂෙසෝයි කිවුවා. "පළවෙනි යුද්ධයේ දී ලෝකෙ ප්‍රධාන සතුරු මූලස්ථාන වුණේ ඔලිම්පස් කන්දයි ඔත්‍රිස් කන්දයි. ඔත්‍රිස් කියන්නේ-" එයා වේදනාවෙන් ඇකිළී ඇළපත අල්ල ගත්තා.

"ඔයාට තුවාල වෙලා," මම කිවුවා. "මට බලන්න දෙන්න."

"නෑ! ඒක ගණන් ගන්න දෙයක් නෙවෙයි. මං කිය කියා හිටියේ... පළවෙනි යුද්ධයේ දී ඔත්‍රිස් කෑලිවලට කුඩු කරලා දැම්මා."

"ඒත්... ඒක මෙතැන තියෙන්නෙ කොහොමද?"

අපි කිරිගරුඬ කුට්ටි සහ කැඩුණු ආරුක්කු පසු කරගෙන සුන්බුන් අතරින් ඉදිරියට යද්දී තාලියා පරිස්සමෙන් වටපිට බැලුවා. "ඒකත් ඔලිම්පස් වගේම තැනින් තැනට යනවා. ඒක හැම වෙලාවෙම තියෙන්නේ ශිෂ්ටාචාරය කෙළවරේ. ඒත් දැන් ඒක මෙතැන, මේ කන්ද උඩ තියෙන එක නම් කොහෙත්ම හොඳ දෙයක් නෙවෙයි."

"ඇයි?"

"මේක ඇට්ලස්ගේ කන්ද," ෂෙසෝයි කිවුවා. "මෙතැන තමයි එයා උස්සගෙන ඉන්නේ-" එයා උන් තැනම ගල් ගැසුණා. එයාගේ කටහඬ බලාපොරොත්තු කඩවීමෙන් කඩතොලු වී තිබුණා. "මෙතැන තමයි කලින් එයා අහස උස්සගෙන හිටියේ."



අපි කඳු මුදුනට ළඟා වී සිටියා. අපිට යාර කීපයක් ඉදිරියෙන් අළු පාට වලාකුළු ගන පුනීලයක හැඩයට සුළි නංවමින් කැකෑරුණා. ඒ සුළියේ පහළ අන්තය ගිරි හිසේ ගෑවෙන තරම් පහත්ව තිබුණත්, ඒ වෙනුවට එය රැඳී තිබුණේ රතු-දුඹුරු පාට කොණ්ඩයක් ඇති, කඩමාලු වූ රිදී පාට ඇඳුමකින් සැරසුණු අවුරුදු දොළහක් වයස ගෑනු ළමයෙකුගේ උරහිස් මතයි: ඒ ආර්ටෙමිස්. එයාගේ කකුල් දිවාමය ලෝකඩ දම්වැලකින් ගැට ගහලා. මට හීනෙන් දකින්න ලැබුණේ මේකයි. ආර්ටෙමිස්ට බලෙන්ම ඔසවාගෙන ඉන්න සලස්වා තිබුණේ ගුහාවක පියස්ස නෙවෙයි. මුළු ලෝකයේම පියස්සයි.

"මගේ උත්තමාවියනි!" ෂෙසෝයි ඉදිරියට දිව්වත් ආර්ටෙමිස් එයාව නැවැත්වූවා. "නවතින්න! මේක උගුලක්. ඔයා දැන් ම මෙහෙන් පිට වෙන්න ඕනෑ."

එයාගේ හඬ පීඩනයෙන් තෙරපුණා. එයා සිටියේ දහඩියෙන් නැහැවිලා. දෙවඟනක් වේදනාවෙන් ඉන්නවා මම මීට කලින් කවදාවත් දැකලා තිබුණේ නැහැ, ඒ වුණත් අහසේ බර ආර්ටෙමිස්ට දරා ගන්න බැරි බව පැහැදිලිවම පෙනුණා.

ෂෙසෝයි අඬන්න පටන් ගත්තා. ආර්ටෙමිස්ගේ විරෝධය නොතකා එයා වෙත දිවූ ෂෙසෝයි දම්වැල් අදින්න පටන් ගත්තා.

අපිට පිටුපසින් කටහඬක් දෝංකාර දුන්නා: "අහ්, කොච්චර දුක හිතෙනව ද?"

අපි ආපසු හැරුණා. එතැන සිටගෙන සිටියේ දුඹුරු පාට සිල්ක් ඇඳුම් කට්ටලයකින් සැරසුණු ජෙනරල්. එයාගේ පැත්තකින් ලූක් සහ ක්‍රෝනොස්ගේ රන් මිනී පෙට්ටිය ඔසවාගත් මකර ගැහැනු දුසිම් බාගයක් සිටගෙන සිටියා. ලූක් ළඟින්ම ඇනබෙත් සිටියා. එයාගේ අත් පිටුපසට කර ගැට ගසා, කට බැඳ තිබුණා. ලූක් එයාගේ බෙල්ලට කඩු තුඩක් එල්ල කරගෙන සිටියා.

මම ඇනබෙත්ගේ ඇස් දිහා බැලුවේ ප්‍රශ්න දාහක් අහන්න උත්සාහ කරමිනුයි. ඒත්, එයාගේ ඇස් මට කිවුවේ එක දෙයක් විතරයි: දුවන්න!

"ලූක්," තාලියා ගෙරෙව්වා. "එයාට යන්න දෙනවා."

ලූක්ගේ හිනාව දුර්වල සහ පාණ්ඩු පාට වුණා. දවස් තුනකට කලින් ඩී.සී.වල හිටියටත් වඩා දැන් එයාගේ පෙනුම දරුණු වුණා. "ඒ

Scanned with CamScanner

තීරණේ තියෙන්නෙ ජෙනරල්ගෙ අතේ, තාලියා. ඒ වුණත් ඔයාව ආපහු දකින්න ලැබුණට සතුටුයි."

තාලියා එයාට කෙළ ගැහුවා.

ජෙනරල් කෙකර ගෑවා. "හොඳ පරණ යාළුකම. එතකොට නුඹ, ෂෙසෝයි. ගොඩ කාලෙකට පස්සෙ නේ. මගේ පුංචි ද්‍රෝහියාට කොහොමද? නුඹව මරලා මට විනෝද වෙන්න පුළුවන්."

"මුකුත් කියන්නෙපා," ආර්ටෙමිස් කෙඳිරි ගෑවා. "එයාට අභියෝග කරන්න යන්න නම් එපා."

"පොඩ්ඩක් ඉන්න," මම කිවුවා. "ඔයා ඇට්ලස් ද?"

ජෙනරල් මට බැල්මක් හෙළුවා. "ඒ කියන්නේ, වීරයින්ගෙන් මොට්ටම එකාටත් යමක් කමක් තේරුම් ගන්න පුළුවන්. ඔව්, මම තමයි ඇට්ලස්, ටයිටන්වරුන්ගේ ජෙනරල් වගේම දෙවිවරුන්ගේ මාරයා. මගේ සුබ පැතුම්. මේ කාලකණ්ණි කෙල්ලව ඉවරයක් කළ හැටියෙම මම නුඹවත් ලස්සනට මරලා දාන්නම්."

"ෂෙසෝයිට කරදරයක් කරන්න ඔහේට ලැබෙන්නෙ නෑ," මම කිවුවා. "මම ඒකට ඉඩ දෙන්නෑ."

ජෙනරල් අවඥාවෙන් බැලුවා. "මේකට ඇඟිලි ගහන්න නුඹට කිසිම අයිතියක් නැහැ, පුංචි වීරයෝ. මේක පවුලේ ප්‍රශ්නයක්."

මම රවා බැලුවා. " පවුලේ ප්‍රශ්නයක්?"

"ඔව්," ෂෙසෝයි නීරසව කිවුවා. "ඇට්ලස් තමයි මගේ තාත්තා."

# 17

# මගේ බර රාත්තල් මිලියන කීපයකින් වැඩි වුණා

බිහිසුණුම දේ වුණේ: එයාලා දෙන්නගෙන් මට පවුලේ මුහුණුවර දැක ගන්න ලැබුණු එකයි. ෂෙසෝයිට තිබුණු රාජකීය පෙනුම ඇට්ලස්ගේ මුහුණෙත් නොඅඩුවම තිබුණා. සමහර වේලාවට ෂෙසෝයිට කේන්ති ගියාම එයාගේ ඇස්වලට එන නොසැලකිලිවන්ත ආඩම්බර පෙනුම ඇට්ලස්ගේ ඇස්වලත් තිබුණා, ඒත් එයාගේ මුහුණේ එහි නපුරු පෙනුම දහස් ගුණයකින් වැඩි වී පෙනුණා. මුල දී මම ෂෙසෝයිගේ අකමැති වූ හැම දෙයක්ම එයාට පිහිටා තිබුණත්, මම ෂෙසෝයිගේ අගය කළ කිසිම හොඳක් එයාට තිබුණේ නැහැ.

"ආර්ටෙමිස්ට යන්න දෙන්න," ෂෙසෝයි තදින් කිවුවා.

ඇට්ලස් දම්වැල් දැමූ දෙවඟන කිට්ටුවට ඇවිද ගියා. "බාගදා, එයා වෙනුවෙන් අහස උස්සගන්න නුඹ කැමති ඇති, එහෙනම්? මගේ කිසිම අමනාපයක් නැහැ."

ෂෙසෝයි කතා කරන්න කට ඇරියත්, ආර්ටෙමිස් ඉස්සර වුණා, "නෑ! ඉදිරිපත් වෙන්න එපා, ෂෙසෝයි! මම ඔයාට තහනම් කරනවා."

ඇට්ලස් බොරුවට හිනා වුණා. එයා ආර්ටෙමිස් ළඟ දණ ගහගෙන එයාගේ මූණ අල්ලන්න උත්සාහ කළත්, දෙවඟන එයාගේ ඇඟිලි කැඩෙන තරම් තදින් ඒ අත හපා කෑවා.



Scanned with CamScanner

"හෝ-හෝ," ඇට්ලස් කෙකර ගෑවා. "නුඹට පේනව ද, දුවේ? ආර්ටෙමිස් උත්තමාවි එයාගේ අලුත් රස්සාවට කැමතියි. මං හිතන්නේ, ක්‍රෝනොස් උතුමා ආපහු රජ වුණාම ඔලිම්පියානුවෝ ඔක්කොටම මගේ බරට කර ගහන්න දෙන්න ඕනෑ. එතකොට මෙතැන තමයි අපේ මාලිගාවේ මැද වෙන්නේ. ඒකෙන් අර නිවටයින්ට යටහත් පහත් වෙන්න පාඩමක් උගන්නයි."

මම ඇනබෙත් දිහා බැලුවා. එයා මට මොනවදෝ කියන්න තදින්ම උත්සාහ කරමින් සිටියා. එයා ලූක්ව ඔළුවෙන් පෙන්වුවා. ඒත් මට කරන්න පුළුවන් වුණේ එයා දිහාම බලා ඉන්න එක විතරයි. කලින් මගේ සැලකිල්ලට හසු වුණේ නැතත්, එයාගේ මොකක්දෝ වෙනසක් වෙලා තිබුණා. එයාගේ තඹ කොණ්ඩයේ දූන් අළු පාට ඉරි වැටිලා.

"අහස උස්සගෙන හිටපු නිසා," තාලියා කෙඳිරුවේ මගේ හිත කියෙව්වා වගෙයි. "ඒ බරට එයා මැරෙන්නැතුව බේරුණා ඇති."

"මට තේරෙන්නෑ," මම කිවුවා. "ඇයි ආර්ටෙමිස්ට බැරි අහස අත ඇරලා දාන්න?"

ඇට්ලස් මහ හඬින් හිනා වුණා. "නුඹට තේරෙන්නෙ කොච්චර වුව්ට ද, පොඩි එකෝ. මෙතැන දී තමයි අහසයි පොළොවයි මුලින් ම මුණ ගැහුණේ. යුරේනසුයි ගයියායි, එයාලගේ බලවත්ම දරුවෝ, ටයිටන්ලව මුලින්ම පිටතට ගෙනාවේ. අහස තවමත් පොළොව වැලඳ ගන්න ආසයි. කවුරු හරි ඒක ඈත් කරලා තියාගන්න ඕනෑ. නැත්තම් ඒක මෙතැනට කඩා වැටිලා මේ කන්දයි, ගව් සිය ගාණක් වටේට තියෙන දේවල් ඔක්කොමයි එක තත්පරේකින් සමතලා කරලා දමාවි. නුඹ සැරයක් මේ බර කරට ගත්තාම, ආයේ ගැලවීමක් නැහැ." ඇට්ලස් හිනාවුණා. "වෙන කවුරුහරි නුඹෙන් ඒක ගත්තොත් මිසක්."

අපිට ළං වුණු එයා තාලියා දෙසත් මගේ දෙසත් හොඳින් බැලුවා. "එතකොට මෙයාලා තමයි යුගයේ හොඳම වීරයෝ, එහ්? කිසිම අභියෝගයක් නම් නෙවෙයි."

"අපිත් එක්ක සටනට එනවා," මම කිවුවා. "එතකොට බලාගන්න පුළුවන්."

"දෙවිගොල්ලෝ නුඹට කිසිම දෙයක් කියලා දීලා නැද්ද? අමරණීය අය නිකං මනුෂ්‍යයෙක් එක්ක සටන් කරන්නෙ නැහැ. ඒක



අපේ ගෞරවයට නොහොබිනා දෙයක්. ඒ වෙනුවට නුඹව චප්ප කරලා දාන්න මට ලූක් ඉන්නවා."

"ඒ කියන්නෙ ඔහෙත් බයගුල්ලෙක්," මම කිවුවා.

ඇට්ලස්ගේ ඇස් ද්වේෂයෙන් දිලිසුණා. එයා අමාරුවෙන් තාලියා දෙසට හැරුණා.

"නුඹ ගැන කියනවා නම්, සියුස්ගේ දියණිය, ලූක් නුඹ ගැන හිතුවා වැරදියි වගේ."

"මම වැරදි නැහැ," ලූක් අමාරුවෙන් කියාගත්තා. එයා හිටියේ දරුණු ලෙස බෙලහීන වෙලා වගෙයි, ඒ වගේම එයා කතා කළේ කටින් පිට වෙන හැම වචනයක් ම වේදනාවක් වගෙයි. මම එයාට ඒ තරම් වෛර නොකළා නම් සමහරවිට මට එයා ගැන කණගාටු හිතෙන්නත් තිබුණා. "තාලියා, අපිට එකතු වෙන්න ඔයාට තවමත් පුළුවන්. ඔෆියොටෝරස්ට අඬගහන්න. ඌ ඔයා ළඟට එයි. බලන්න!"

එයා අතක් වැනුවා, ඒත් එක්කම අපි ළඟින් වතුර පිරුණු තටාකයක් මතු වුණා: කළු ගරුඬවලින් වට කළ ඔෆියොටෝරස්ගේ තරමට සෑහෙන පොකුණක්. බෙසී ඒ තටාකය තුළ ඉන්න හැටි මගේ හිතේ මැවුණා. ඇත්තටම, මම ඒ ගැන හිතන්න හිතන්න, බෙසී හඬගානවා මට ඇහෙනවා වගේ දැනුණා.

*එයා ගැන හිතන්න එපා!* හදිසියේම ග්‍රෝවර්ගේ හඬ මගේ හිත ඇතුළේ ඇසුණා- සහකම්පන සම්බන්ධය. මට එයාගේ හැඟීම් දැනුණා. එයා හිටියේ භීතියෙන් කැලඹිලා. *මට බෙසීව නැති වෙන්න යන්නේ. එයා ගැන හිතන එක නතර කරන්න!*

මම, මගේ හිත හිස් කරගන්න උත්සාහ කළා. මම පැසිපන්දු ක්‍රීඩකයෝ ගැන, ස්කේට් බෝඩ් ගැන, මගේ අම්මගෙ සාප්පුවේ තියෙන පැණි රස කෑම ජාති ගැන- බෙසී ගැන ඇර අනෙක් හැමදේම ගැන හිතුවා.

"තාලියා, ඔෆියොටෝරස්ට කතා කරන්න," ලූක් ආයෙමත් කිවුවා. "ඊට පස්සේ ඔයා දෙවිවරුන්ටත් වඩා බලවත් වෙයි."

"ලූක්..." තාලියාගේ කටහඬ පිරිලා තිබුණේ වේදනාවෙන්. "ඔයාට මොකද වුණේ?"

Scanned with CamScanner

"ඉස්සර අපි කතා කරපු කාලේ ඔයාට මතක නැද්ද? අපි දෙවිවැන්ට ශාප කරපු හැටි? අපේ තාත්තලා අපි වෙනුවෙන් කිසිම දෙයක් කරලා නැහැ. එයාලට මේ ලෝකේ පාලනේ කරන්න කිසිම අයිතියක් නැහැ!"

තාලියා ඔළුව හෙල්ලුවා. "ඇනබෙත්ව නිදහස් කරන්න. එයාට යන්න දෙන්න."

"ඔයා මට එකතු වෙනවා නම්," ලූක් පොරොන්දු වුණා. "ආයෙමත් ඉස්සර වගේම වෙයි. අපි තුන්දෙනා එකට. මීට වඩා හොඳ ලෝකයක් වෙනුවෙන් සටන් කරන්න. අනේ, තාලියා, ඔයා කැමති නොවුණොත්..."

එයාගේ හඬ ඇනහිටියා. "මේක මට ලැබෙන අන්තිම අවස්ථාව. ඔයා කැමති නොවුණොත් එයා අනිත් ක්‍රමේට වැඩේ කරයි. කරුණාකරලා."

එයා අදහස් කළ දේ මට නොතේරුණත්, එයාගේ කටහඬේ තිබුණු බය නම් මවාපෑමක් නෙවෙයි. ලූක් අනතුරක වැටිලා ඇති කියලා මම විශ්වාස කළා. එයාගේ ජීවිතය රැඳී තියෙන්න ඇත්තේ තාලියා එයාට එකතු වෙනවා ද, නැද්ද කියන කාරණය උඩයි. ඒ නිසාම තාලියාත් ඒක විශ්වාස කරයි ද හිතලා මම බය වුණා.

"එපා, තාලියා," ෙzසා්යි අනතුරු ඇඟෙව්වා. "අපි එයාලා එක්ක සටන් කරන්න ඕනෑ."

ලූක් නැවතත් අත වනද්දී ගිනි ගොඩක් මතු වුණා. කඳවුරේ තිබුණු විදිහේම ලෝකඩ ගිනි අඟුරු බඳුනක්. පුද පූජාවලට පාවිච්චි කරන ගින්නක්.

"තාලියා," මම කතා කළා. "එපා."

ලූක්ට පිටුපසින් රන් මිනී පෙට්ටිය දිලිසෙන්න පටන් ගත්තා. එහෙම වෙද්දී අපි වටේටම තිබුණු මීදුමේ රූප දකින්න ලැබුණා: කළු ගරුඬ බිත්ති ඉහළට එසවෙමින්, නටඹුන් සම්පූර්ණ වෙමින්, භීතියෙන් සහ හෙවණැලිවලින් සෑදුණු බිහිසුණු සුන්දර මාලිගාවක් අපි වට කර නැඟී සිටින්න ගත්තා.

"අපි ඔත්‍රිස් කන්ද මෙතැනම පහළ කරගන්නවා," ලූක් දිවුරුවේ, එයාගේ කියලා හිතන්නත් බැරි තරම් බැරෑඬි වූ කටහඬකින්. "ආයෙම වතාවක්, ඒක ඔලිම්පස්වලට වඩා ශක්තිමත්, බලවත් තැනක් වෙයි. බලන්න, තාලියා. අපි දුර්වල නැහැ."



එයා මුහුද දෙසට අත දිගු කරද්දී මගේ හිත කඩා වැටුණා. ඇන්ඩ්‍රොමීඩා නැංගුරම්ලා තිබුණු වෙරළේ සිට කන්දේ ඉහළට පා ගමනින් එමින් සිටියේ විශාල හමුදාවක්. මකර ගැහැනු සහ ලයිස්ට්‍රිගෝනියානුවෝ, රාක්ෂයෝ සහ අර්ධ ලෝහිතයෝ, යම බල්ලෝ, හාර්පිලා සහ මම නම් කරන්නවත් නොදන්නා තවත් එවුන් ගොඩක්. මුළු නැවම හිස්වෙලා ඇති කියලා මට හිතුණේ එතැන සිය ගාණක්, ගිය ගිම්හානයේ දී නැව් තට්ටුව උඩ මට දකින්න ලැබුණාටත් වඩා ගොඩක් එතැන සිටි නිසයි. ඒ වගේම එයාලා කෙලින්ම එමින් සිටියේ අපේ පැත්තටයි. තව විනාඩි කීපයකින් එයාලා මෙතැන ඉඳීවි.

"මේ ඉස්සරහට එන්න තියෙන ඒවායින් ඇබිත්තක් විතරයි," ලූක් කිවුවා. "ඉක්මනටම අපි අර්ධ-ලෝහිත කඳවුර පෙරළලා දාන්න ලෑස්ති වෙනවා. ඒකෙන් පස්සේ ඔලිම්පස්. අපිට උවමනා එකට දේ ඔයාගේ උදවු විතරයි."

එක බිහිසුණු මොහොතකට තාලියා දෙපැත්තට වැනුණා. එයා වේදනාව පිරුණු ඇස්වලින් ලූක් දිහා බැලුවේ හරියට මේ ලෝකේ එයාට කරන්න උවමනා එකම දේ ලූක්ව විශ්වාස කරන එක වගෙයි. ඊට පස්සේ එයා හෙල්ලය සමබර කළා. "ඔයා ලූක් නෙවෙයි. මම ඔයාව අඳුනන්නෙ නැහැ."

"ඔව්, ඔයා දන්නවා, තාලියා," ලූක් බැගෑපත් වුණා. "කරුණාකරලා. මට ඉඩ දෙන්න එපා... එයාට ඉඩ දෙන්න එපා ඔයාව විනාශ කරන්න."

අපිට තවත් කාලයක් ඉතිරිව තිබුණේ නැහැ. අර හමුදාව කඳු මුඳුනට ආවොත් අපි ඉවරෙටම ඉවරයි. මම ආයෙමත් ඇනබෙත්ගේ ඇස් දිහා බැලුවා. එයා ඔළුව වැනුවා.

තාලියා සහ ෙzසා්යි දිහා බැලූ මම තීරණය කළේ මේ වගේ යාළුවෝ එක්ක සටන් කරලා මැරෙන එක මේ ලෝකේ තියෙන නරකම දේ වෙන්න බැහැ කියලයි.

"දැන්," මම කිවුවා.

අපි එක්ව පහර දෙන්න පැන්නා.

★★★

තාලියා කෙලින්ම ලූක් වෙත ගියා. එයාගේ පලිහේ බලය කොයි තරම් ප්‍රබල වුණා ද කියනවා නම් ලූක්ගේ මකර-ගැහැනු ආරක්ෂකයෝ රන් මිනී පෙට්ටිය බිම දාලා, ලූක්ව තනි කරලා බයේ පැනලා දිව්වා. ඒත් එයාගේ ලෙඩ පෙනුම කෙසේ වෙතත්, ලූක් තවමත් හොඳින් කඩුව හැසිරුවා. කැලෑ සතෙක් වගේ දත් නියවා ගෙරවූ එයා ප්‍රති ප්‍රහාර එල්ල කළා. එයාගේ කඩුව, බැක්බයිටර් තාලියාගේ පලිහේ ගැටෙද්දී ඒ දෙක අතරින් අකුණු බෝලයක් හටගෙන, වාතය පවා දැවුවා.

මං ගැන කියනවා නම්, මම ජීවිතේට කරපු ලොකුම ගොන්කම කළා. මම ටයිටන් යෝධයා ඇට්ලස්ට පහර දුන්නා.

මම ළං වෙද්දී එයා මහ හඬින් හිනා වුණා. අති විශාල හෙල්ලයක් එයාගේ අතේ මතු වුණා. එයාගේ සිල්ක් ඇඳුම් කට්ටලය සම්පූර්ණ ග්‍රීක යුද සන්නාහයකට හැරුණා. "එනවා එහෙනම්!"

"පර්සි!" ෂෝයි කිව්වා. "බලාගෙන!"

එයා මට අනතුරු ඇඟවූ කාරණේ මම දැන සිටියා. මීට ගොඩක් කාලෙකට කලින් කයිරොන් මට ඒ ගැන කියා දී තිබුණා: අමරණීය අයව පෞරාණික නීතිවලින් හිර කරලයි තියෙන්නේ. ඒත් වීරයෙකුට හිතේ හයිය තියෙන තාක් ඕනෑම තැනක යන්නත්, ඕනෑම කෙනෙකුට අභියෝග කරන්නත් පුළුවන්. කොහොම වුණත්, වතාවක් මම පහර දුන්නාම, තමන්ගේ සියලුම ශක්තිය පාවිච්චි කරලා සෘජුව ප්‍රති ප්‍රහාර දෙන්න ඇට්ලස්ට නිදහස ලැබෙනවා.

මම කඩුව වනද්දී ඇට්ලස්, එයාගේ හෙලි මිටෙන් ගහලා මාව පැත්තකට තල්ලු කළා. උඩින් විසි වුණ මම කළු බිත්තියක හැප්පුණා. තවදුරටත් ඒක මීදුමෙන් සෑදුණු එකක් වුණේ නැහැ. ගඩොලෙන් ගඩොල මාලිගාව ඉහළ නඟිමින් තිබුණා. එය සැබෑවක් වෙමින් තිබුණා.

"මෝඩයා!" ෂෝයිගේ ඊතලයකට අතින් ගසමින් ඇට්ලස් බෙරිහන් දුන්නා. "අර වැඩකට නැති යුද දෙවියට ගහන්න පුළුවන් වුණ පළියට, මාත් එක්කත් සටන් කරන්න පුළුවන් කියලා නුඹ හිතුව ද?"

ඊරිස් ගැන මතක් කරද්දී මගේ ඇඟ පුරා ගැස්මක් පැතිරුණා. මම තෝන්තු ගතිය පලවා හැරලා ආයෙමත් පහර දෙන්න පැන්නා.



අර තටාකයට යා ගන්න පුළුවන් නම්, මට මගේ ශක්තිය වැඩි කරගන්න පුළුවන්. හෙල්ලයේ තුඩ දැකැත්තක් වගේ මගේ ඉදිරියේ වැනුණා. එයාගේ ආයුධය කඳෙන් කපලා දාන්න හිතාගෙන මම රිප්ටයිඩ් එසෙව්වා, ඒත් මගේ අත් ඊයම් බරු වගේ බරට දැනුණා. හදිසියේ ම මගේ කඩුව ටොන් එකක් විතර බර වුණා.

ඒ වේලාවේ, ගොඩාක් කාලෙකට කලින් ලොස් ඇන්ජලීස් වෙරළේ දි ඊරිස් කළ අනතුරු ඇඟවීම මගේ මතකයට ආවා: *ඔහේට වඩාත්ම උවමනා වෙන වෙලාවට, ඔහේගෙ කඩුව ඔහේට ද්‍රෝහී වෙයි.*

*දැන් එපා!* මම කන්නලව් කළත් වැඩක් වුණේ නැහැ. මම අහකට පනින්න උත්සාහ කළා, ඒත් මගේ පපුවේ වැදුණු හෙල්ලය මාව රෙදි බෝනික්කෙක් වගේ උඩින් විසි කර දැමුවා. පොළොවේ තදින් වැදුණු මගේ ඔළුව කැරකෙන්න ගත්තා. උඩ බලපු මට දකින්න ලැබුණේ තවමත් අහසේ බරින් මිරිකී ඉන්න ආර්ටෙමිස්ගේ කකුල් දෙක ළඟට මාව වැටී ඇති බවයි.

"දුවන්න, කොල්ලෝ," එයා මට කිව්වා. "ඔයා දුවන්න ඕනෑ!"

ඇට්ලස් හෙමින් සීරුවේ මගේ දිහාවට එමින් සිටියා. මගේ කඩුව නැති වෙලා. ඒක ප්‍රපාත බෑවුමකින් පහළට විසි වුණා. ඒක ආපහු මගේ සාක්කුවෙන් මතු වේවි- සමහරවිට තව තත්පර කීපයකින්- ඒත් ඒකෙන් වැඩක් නැහැ. ඒ වෙද්දී මම මැරිලා ඉදියි. ලූක් හා තාලියා යක්කු වගේ සටන් කරද්දී එයාලා වටේට අකුණු පිපිරුණා. බිම වැටී සිටි ඇනබෙත් අත්වල බැමි ලිහාගන්න දරුණු ලෙස දඟලමින් සිටියා.

"මැරියං, පුංචි වීරයෝ," ඇට්ලස් කිව්වා.

මාව උල තියන්න එයා හෙල්ලය එසෙව්වා.

"එපා!" ෂෝයි මොර දුන්නා, ඒත් එක්කම ඇට්ලස්ගේ යුද සන්නාහයේ කිහිල්ල ළඟ වූටි හිඩැසට රිදී ඊතල මුරයක් වැදුණා.

"ආර්ග්ග්හ්!" ගර්ජනා කළ එයා, එයාගේ දුව වෙතට හැරුණා.

මම පහළට අත ගෙන යද්දී රිප්ටයිඩ් ආපසු සාක්කුවේ තියෙනවා දැනුණා. ඒත් කඩුවක් තිබුණත්, මට ඇට්ලස්ට විරුද්ධව සටන් කරන්න බැහැ. ඒ වෙලාවේ කොඳු නාරටිය දිගේ පැතිරී ගිය හිරියක් සමග මට අනාවැකියේ කියවුණු පේළියක් සිහි වුණා: 'ටයිටන්ගේ

*ශාපයට එකෙකු එදිරි වනු ඇත.'* ඇට්ලස්ව පරදවන්න මට පුළුවන්කමක් තිබුණේ නැහැ. ඒත් ඒක කරන්න පුළුවන් වෙනත් කෙනෙක් එතැන සිටියා.

"අහස," මම දෙවඟනට කිවුවා. "මට දෙන්න."

"නෑ, කොල්ලෝ," ආර්ටෙමිස් කිවුවා. එයාගේ නළල පුරා රසදිය වගේ ලෝහමය දාඩිය බිඳු මතු වී තිබුණා. "ඔයා ඉල්ලන්නෙ මොකක්ද කියලා ඔයාම දන්නෙ නැහැ. ඒකෙන් ඔයාව චප්ප වෙයි!"

"ඇනබෙත් ඒක දරාගත්තා!"

"එයා පණ බේරගත්තෙත් අමාරුවෙන්. එයාට නියම දඩයක්කාරියෙකුගේ ධෛර බව තිබුණා. ඔයාට ඒ තරම් වෙලාවක් ඉන්න බැරි වෙයි."

"කොහොම වුණත් මට මැරෙන්න වෙනවා," මම කිවුවා. "මට අහසේ බර දෙන්න!" මම එයාගෙන් උත්තරයක් ලැබෙන තුරු බලා නොසිට රිප්ටයිඩ් එළියට අරන් එයාගේ දම්වැල් කපා දැමුවා. ඊට පස්සේ මම එයා ළඟට ගිහින් එක කකුලක් නමා දණ ගසාගෙන අත් ඉහළට ඔසවා සීතල, බර වලාකුළු ස්පර්ශ කළා. එක මොහොතකට ආර්ටෙමිස් සහ මම එක්ව ඒ බර උහුලාගෙන සිටියා. ඒ තරම් කාලෙකට මට දැනුණු බරම දේ ඒකයි, ඒක හරියට ගල් කුළු දාහකට යට වී මිරිකෙනවා වගෙයි. ඒ වේදනාවෙන් සිහිසුන් වෙන්න මට ඕනෑ වුණා, ඒත් මම ගැඹුරු හුස්මක් ගත්තා. මට මේක කරන්න පුළුවන්.

ඊට පස්සේ ආර්ටෙමිස් බර අත ඇරියාම මම තනියම ඒක දරාගෙන සිටියා.

පස්සෙ කාලෙක දී, මම බොහෝ වතාවක් ඒ හැඟීම විස්තර කරන්න උත්සාහ කළත්, මට බැරි වුණා.

මගේ ඇඟේ හැම පේශියක්ම ගිනි ගෙන දැවෙන්න වුණා. මගේ ඇටකටු දිය වෙනවා වගේ දැනුණා. බෙරිහන් දෙන්න ඕනෑ වුණත්, කට අරින්න තරම් ශක්තියක් මට තිබුණේ නැහැ. අහසේ බර මාව පොඩි කරද්දී මම පොළොවේ පහතටම ගිලා බහින්න පටන් ගත්තා.



*ආපස්සට සටන් කරන්න!* මගේ ඔළුව ඇතුළේ ග්‍රෝවර් කියනවා ඇහුණා. *පහුබහින්න එපා.*

මම හුස්ම ගැනීමට හිත යොමු කළා. මට තව තත්පර කීපයකට අහස උස්සගෙන ඉන්න පුළුවන් නම්. මම බියන්කා ගැන හිතුවා. අපිට මේ තරම් දුර එන්න ඉඩ දෙන්න එයා ජීවිතය කැප කළා. එයාට ඒ තරම් දෙයක් කරන්න පුළුවන් නම්, මටත් අහස උස්සගෙන ඉන්න පුළුවන්.

මගේ පෙනීම බොඳ වෙන්න ගත්තා. බලන බලන හැම තැනම රතු පාටින් සායම් වැටී පෙනුණා. මට සටන එහෙන් මෙහෙන් දකින්න ලැබුණත්, සිදුවෙමින් පැවතුණු දේ හරියටම දැක්ක ද මට විශ්වාස නැහැ. එතැන සම්පූර්ණ යුද සන්නාහයෙන් සැරසුණු ඇට්ලස් පිස්සුවෙන් වගේ හිනාවෙමින්, එයාගේ හෙල්ලයෙන් අනිමින් සිටියා. ආර්ටෙමිස්ව පෙනුණේ රිදී පාට මිරිඟුවක් වගෙයි. එයා අතක් තරම් දිගු දුෂ්ට පෙනුමැති දඩයම් පිහි දෙකක් දැතට අරන්, එහෙ මෙහෙ පනිමින් වියරු ලෙස ටයිටන්ට පහරවල් එල්ල කළේ අදහන්නත් බැරි තරම් දක්ෂ ලෙසයි. සටන් කරන අතරේම එයා රූපය වෙනස් කරනවා වගෙයි පෙනුණේ. එයා කොටියෙකුටත්, ගැස්ල් මුවෙකුටත්, වලහෙක්ට සහ උකුස්සෙකුටත් හැරුණා. එහෙම නැත්නම් සමහරවිට ඒ මගේ රත් වුණු මොළේ වෙන්න ඇති. ඇට්ලස්ගේ සන්නාහයේ සිදුරු ඇති තැන් බලමින් ෂෙසෝයි ඊතල විද්දා. ඒවා ඉලක්කයට වදින සෑම වතාවකම එයා වේදනාවෙන් ගිගුරුවත් ඒවාගෙන් එයාට වුණේ මී මැසි ප්‍රහාරයක් තරම් සුළු හානියක් විතරයි. එයින් තවත් ඇවිස්සුණු යෝධයා නොනවත්වාම සටන් කළා.

තාලියා සහ ලූක් හෙල්ලයෙන් සහ කඩුවෙන් සටන් කරද්දී එයාලා වටේට තවමත් අකුණු විදුලි පිපිරුවා. තාලියා, එයාගේ පලිහේ බලයෙන් ලූක්ව පස්සට තෙරපුවා. ඒකට බය නොවී ඉන්න ලූක්ට පවා බැරි වුණා. පසු බැස්ස එයා වේදනාවෙන් ඇකිළෙමින් ගෙරෙව්වා.

"යටත් වෙනවා!" තාලියා මොර දුන්නා. "ඔයාට මාව පරද්දන්න කවදාවත් බැහැ, ලූක්."

ලූක් දත් විලිස්සුවා. "හොඳයි බලමුකෝ, මගේ පරණ යාළුවා."

මගේ මූණ පුරා දාඩිය වැස්සුණා. මගේ අත් ලිස්සන්න ගත්තා. මගේ උරහිස්වලට හඬ පිට කරන්න පුළුවන්කමක් තිබුණා නම් ඒවා කටුක වේදනාවෙන් බෙරිහන් දෙන්න තිබුණා. මට දැනුණේ මගේ කොඳු ඇට පේළියේ කශේරුකා එකින් එකට කැපුම්-පන්දමකින් පාස්සනවා වගෙයි.

ඇට්ලස් ආර්ටෙමිස්ව තෙරපමින් ඉදිරියට ආවා. ආර්ටෙමිස් වේගවත් වුණත්, ඇට්ලස්ගේ ශක්තිය නැවැත්විය නොහැකි වුණා. මීට තත්පරේකින් පංගුවකට කලින් ආර්ටෙමිස් සිටගෙන සිටි තැන පොළොව තුළට ඇට්ලස්ගේ හෙල්ලය කිඳා බහිද්දී ගල් කුළුවල ඉරි තැළුමක් පැතිරුණා. ඉදිරියට පැන්න එයා නොනවත්වාම ආර්ටෙමිස්ව ලුහුබැන්දා. ආර්ටෙමිස් ආපසු එයාව මගේ පැත්තට රැගෙන එමින් සිටියා.

*ලැස්ති වෙන්න*, එයා මගේ හිත ඇතුළේ කතා කළා.

මගේ වේදනාව තුළින් කල්පනා කිරීමේ හැකියාව ගිලිහී යමින් තිබුණා. එයාට මගේ ප්‍රතිචාරය වුණේ - *ආග්ග්ග්හ්හ්... ඌඌඌවු!*

"කෙල්ලෙක් හැටියට නුඹ හොඳින් සටන් කරනවා," ඇට්ලස් හිනා වුණා. "ඒත් නුඹට බැහැ මාත් එක්ක කරට කර එන්න."

එයා හෙලි පහරක් ගහනවා වගේ බොරුවට අඟවද්දී ආර්ටෙමිස් ඉවතට පැන්නා. එයාගේ උපාය මට කලින්ම පෙනුණා. වේගයෙන් ඇදී ගිය ඇට්ලස්ගේ හෙල්ලය ආර්ටෙමිස්ගේ දෙපා පොළොවෙන් ඉවත් කළා. එයා බිමට වැටෙද්දී ඇට්ලස්ගේ හෙලි තුඩ එයාව මරා දමන්න පහළට ආවා.

"එපා!" ෂෙසෝයි බෙරිහන් දුන්නා. එයාගේ තාත්තා සහ ආර්ටෙමිස් අතරට පැන්න එයා ටයිටන්ගේ නළලට එල්ල කළ ඊතලය කඟවේන අඟක් වගේ එයාගේ නළලේ ඇමිනුණා. වියරුවෙන් ගර්ජනා කළ ඇට්ලස් පිටි අත්ලෙන් එයාගේ දුවට ගසද්දී එයාව උඩින් විසි වී ගොස් කළු ගලක වැදුණා.

මට එයාගේ නම කියලා කෑගහන්න, එයාගේ උදවුවට දුවන්න ඕනෑ වුණත් මට කතා කරන්නවත්, සෙලවෙන්නවත් බැරි වුණා. අඩු තරමේ ෂෙසෝයි වැටුණු තැනවත් මට දක ගන්න බැරි වුණා. ඊට පස්සේ විජයග්‍රාහී බැල්මක් එක්ක ඇට්ලස් ආර්ටෙමිස් වෙත හැරුණා.



ආර්ටෙමිස් හිටියේ තුවාල වෙලා වගෙයි. එයා එතැනින් නැගිට්ටේ නැහැ.

"අලුත් යුගය වෙනුවෙන් ගලන මුල්ම ලේ," උදම් ඇනූ ඇට්ලස් යටි අතට ඇන්නා.

සිතුවිල්ලක් තරම් වේගයෙන් ආර්ටෙමිස් එයාගේ හෙලි මිට ඩැහැ ගත්තා. එයා ළඟම පොළොව තුළට කිඳා බැහැපු හෙල්ලය ආපස්සට ඇදපු ආර්ටෙමිස් එය ලීවරයක් වගේ පාවිච්චි කරමින් ටයිටන් යෝධයාට පයින් පහරක් ගැසුවා. එයාට උඩින් විසි වුණ ටයිටන් මගේ උඩට වැටෙන්න එනවා පෙනෙද්දී, සිදු වන්නට යන දේ මට තේරුම් ගියා. මම අහස රඳවාගෙන සිටි ග්‍රහණය බුරුල් කළා. ඒත් එක්කම ඇට්ලස් මගේ ඇගේ හැප්පෙද්දී මම නොසැලී ඉන්න උත්සාහ කළේ නැහැ. මම, මාව එතැනින් ඉවතට විසි වෙන්න ඉඩ දී, පුළුවන් තරම් ඈතට පෙරළුණා.

ඇට්ලස්ගේ පිට මතට කඩා වැටුණු අහසේ බරට එයාව සමතලා වෙන්න ගියත්, ඉවසිය නොහැකි බරෙන් ගැලවෙන්න දඟලූ එයා අන්තිමේ දී දණහිස්වලින් නැගී සිටියා. ඒත් එතකොට පරක්කු වැඩියි.

"නෑ...!" එයා කන්දම දෙදරන තරම් හඬින් ගිගුරුවා. "ආයෙමත් නම් එපා!"

ඇට්ලස්, එයාගේ පරණ බරට නැවතත් කර ගසාගෙන සිටියා.

මම නැගිටින්න උත්සාහ කරද්දී වේදනාවෙන් සිහි නැති වී ආපසු ඇද වැටුණා. මට දැනුණේ මගේ මුළු ඇඟම ගිනි ගන්නවා වගෙයි.

තාලියා ලූක්ව ප්‍රපාතයක් අද්දරටම තල්ලු කර තිබුණත් ඒ දෙන්නාගේ සටන තවමත් නතර වී තිබුණේ නැහැ. තාලියාගේ ඇස්වල කඳුළු පිරිලා තිබුණා. ලූක්ගේ පපුව හරහා ඇති වී තිබූ කැපුමෙන් ලේ ගලද්දී එයාගේ මුහුණ දාඩියෙන් දිලිසුණා.

එයා තාලියාගේ ඇඟට පනිද්දී තාලියා, එයාගේ පලිහෙන් ලූක්ට ගැසුවා. ලූක්ගේ කඩුව අතින් ගිලිහී ගල් ගොඩක් උඩට වැටුණා. තාලියා, එයාගේ හෙලි තුඩ ලූක්ගේ බෙල්ලට තද කළා.

මොහොතකට සියල්ල නිහඬ වුණා.

Scanned with CamScanner

"හොඳයි?" ලූක් ඇසුවා. එයා සඟවා ගන්න උත්සාහ කළත්, එයාගේ කටහඬේ තිබුණු බය මට පැහැදිලිව ඇසුණා.

තාලියා වියරුවෙන් වෙවුලුවා.

අන්තිමේ දී බැම්මවලින් නිදහස් වී සිටි ඇනබෙත් තාලියාට පිටුපසින් හතර ගාතෙන් දණගාමින් ආවා. එයාගේ මුහුණ සීරී, කුණුවලින් වයිරම් වැටී තිබුණා. "එයාව මරන්න එපා!"

"එයා ද්‍රෝහියෙක්," තාලියා කිව්වා. "ද්‍රෝහියෙක්!"

අවසිහියෙන් සිටියත්, ආර්ටෙමිස් තවදුරටත් මගේ ළඟ නැති බව මට තේරුණා. එයා ෆෙසෝයි වැටී සිටි කළු ගල් ගොඩ අසලට දුව ගොස් තිබුණා.

"අපි ලූක්ව ආපහු අරන් යමු," ඇනබෙත් බැගෑපත් වුණා. "ඔලිම්පස්වලට. එයා.... එයාව ප්‍රයෝජනවත් වෙයි."

"ඔයාටත් ඕනෑ ඒක ද, තාලියා?" ලූක් විරිත්තුවා. "ජය පෙරහැරකින් ඔලිම්පස්වලට යන්න ද? ඔයාගේ තාත්තාව සතුටු කරන්න ද?"

තාලියා අඩමානයෙන් ඉන්නා අතරේ ලූක් එයාගේ හෙල්ලය ඩැහැ ගන්න බලාපොරොත්තු රහිත උත්සාහයක් ගත්තා.

"එපා!" ඇනබෙත් කෑගැසුවත්, එතකොට පරක්කු වැඩියි. තාලියා නොහිතාම ලූක්ට පයින් ගැසුවා. සමබරතාවය අහිමි වූ ලූක්ගේ මුහුණ භීතියෙන් වැසී යද්දී එයාව පහළට ඇද වැටුණා.

"ලූක්..!" ඇනබෙත් බෙරිහන් දුන්නා.

අපි ප්‍රපාතය අද්දරට දිව්වා. අපිට පහළින් ප්‍රින්සස් ඇන්ඩ්‍රොමීඩා සිට පැමිණි හමුදාව විස්මයෙන් නැවතී බලා සිටියේ ගල් මත වූ ලූක්ගේ බිඳුණු සිරුර දෙසයි. මම එයාට කොයි තරම් වෛර කළත්, මට ඒ දසුන දරාගන්න බැරි වුණා. එයා තවමත් පණ පිටින් කියලා විශ්වාස කරන්න මට ඕනෑ වුණා, ඒත් එහෙම වෙන්නෙ කොහොමද? එයා වැටුණු තැන අඩු තරමේ අඩි පනහක්වත් උසයි. පහළ ගල් කුළු මත සිටි එයා සෙලවුනේවත් නැහැ.

"උන්ව මරාපියව්!" උඩ බැලූ යෝධයින්ගෙන් එකෙක් ගිගිරුවා.



කම්පාවෙන් දරදඬුව සිටි තාලියාගේ කම්මුල් දිගේ කඳුළු වැල් ගලා ගියා, මම එයාව ආපස්සට ඇද ගනිද්දිම අපේ ඔළුවලට උඩින් හෙලි වරුසාවක් ඇදී ගියා. අපි ඇට්ලස්ගේ තර්ජන හා ගර්ජන නොසලකා හරිමින් ගල් කුළු දෙසට දිව්වා.

"ආර්ටෙමිස්!" මම මොර දුන්නා.

තාලියාගේ වගේම දුකින් බර වූ මුහුණින් දෙවඟන අපි දිහා බැලුවා. ෆෙසෝයි දෙවඟනගේ දෑතේ වැතිරී සිටියා. එයා තවමත් හුස්ම ගනිමින් සිටියා. එයාගේ ඇස් ඇරී තිබුණා. ඒ වුණත්...

"තුවාලෙන් විෂ ඇතුළු වෙලා," ආර්ටෙමිස් කිව්වා.

"ඇට්ලස් එයාට විෂ වද්දලා ද?" මම ඇසුවා.

"නෑ," දෙවඟන කිව්වා. "ඇට්ලස් නෙවෙයි."

එයා අපිට ෆෙසෝයිගේ ඇළපතේ වූ තුවාලය පෙන්වූවා. ලැඩොන් මකරාගෙන් එයාට සිදු වූ තුවාලය මට සහමුලින් ම අමතක වෙලයි තිබුණේ. මකරාගේ හපා කෑම ෆෙසෝයි පෙන්වූවාට වඩා ගොඩාක් බරපතළ වුණා. මට ඒ තුවාලය දිහා බලන්නවත් අමාරු වුණා. එයා, එයාගේ තාත්තා සමඟ සටන් කරලා තිබුණේ මේ තරම් දරුණු තුවාලයකින් ශක්තිය පිටට ගලන අතරේමයි.

"තරු," ෆෙසෝයි මිමිණුවා. "මට ඒවා පේන්නෙ නෑ."

"නෙක්ටාරුයි ඇම්බ්‍රෝසියායි," මම කිව්වා. "ඉක්මන් කරන්න! අපි කොහෙන්හරි එයාට ඒවා හොයලා දෙන්න ඕනෑ."

කිසිවෙක් සෙලවුනේ නැහැ. වටපිටාව පුරාවටම පැතිරී තිබුණේ දුක. කණගාටුව විතරයි. ක්‍රෝනොස්ගේ හමුදාව ඉහළට නැඟ එන්න ආසන්න වුණත් ආර්ටෙමිස් පවා එතැනින් සෙලවෙන්නවත් බැරි තරමට කම්පනය වෙලයි සිටියේ. අපි හැමෝගේම ඉරණම එතැනදී ම විසඳෙන්න ඉඩ තිබුණු ඒ වෙලාවේ මට අමුතු ගුම් හඬක් ඇහෙන්න ගත්තා.

රාක්ෂ හමුදාව කඳු මුඳුනට එද්දිම, සොප්විත් කැමල් යානයක් වේගයෙන් අහසින් පහළට බැස්සා.

"මගේ දුවගෙන් ඈත් වෙයල්ලා!" මහාචාර්ය චේස් කෑගසද්දී පණ ගැසූ එයාගේ මැෂින් තුවක්කුවලින් විසිරුණු උණ්ඩ පොළොව පුරා හිල් සෑදුවේ මුළු රාක්ෂ කණ්ඩායම ම සීසීකඩ විසුරුවමින්.

"තාත්තා?" ඇනබෙත් අදහා ගන්න බැරුව මොර දුන්නා.

"දුවන්න!" එයා ආපස්සට කෑගසා කියද්දී සැහැල්ලු ගුවන් යානයේ හඬින් එයාගේ කටහඬ යටපත් වුණා.

එයින් ආර්ටෙමිස් ගිලී සිටි දුකින් පිටට ආවා. තවත් වෙඩි මුරයක් තියන්න කැරකී එන පරණ ප්‍රහාරක යානය දිහා එයා ඇසි පිය නොහෙලා බලා සිටියා.

"නිර්භීත පිරිමියෙක්," ආර්ටෙමිස් අකැමැත්තෙන් වුණත් පිළිගත්තා. "එන්න, අපි ෂෙසෝයිව මෙතැනින් අරන් යන්න ඕනෑ."

එයා දඩයම් නළාව තොල් අතර තබා ගත්තා. එයින් විහිදුණු පැහැදිලි හඬ මැරින්වල නිම්න හරහා රැව් දුන්නා. ෂෙසෝයිගේ ඇස් ගැහෙන්න ගත්තා.

"අල්ලගෙන ඉන්න!" මම එයාට කිවුවා. "හැම දෙයක්ම හරි යයි!"

සොප්විත් කැමල් යානය නැවතත් පහළට ආවා. යෝධයෝ කීපදෙනෙක් එයට හෙලිවලින් දමා ගසද්දී එක හෙල්ලයක් කෙලින්ම ගුවන් යානයේ තටු දෙක අතරින් ඇදී ගියා. ඒත් මැෂින් තුවක්කු ආයෙමත් ප්‍රාණවත් වුණා. කොහොම හරි මහාචාර්ය චේස්, එයාගේ උණ්ඩ දිව්‍යමය ලෝකඩවලින් සාදා ඇති බව තේරුම් යද්දී මට පුදුම නොවී ඉන්න බැරි වුණා. මැෂින් තුවක්කුවේ වෙඩි මුරයක් වදිද්දී විලාප දුන් ඉදිරි පෙළ සිටි සර්ප ගැහැනු ගෙන්දගම් ගඳ කහ පාට කුඩුවලට පුපුරා ගියා.

"ඒ... මගේ තාත්තා!" ඇනබෙත් පුදුමයෙන් කිවුවා.

එයාගේ පියාසැරිය අගය කරන්න තරම් වේලාවක් අපිට තිබුනේ නැහැ. යෝධයෝ සහ සර්ප ගැහැනු දූනටමත් කම්පනයෙන් මිදෙමින් සිටියා. මහාචාර්ය චේස් ඉක්මනින්ම කරදරේක වැටෙන පාටක් තිබුණේ.

හරියටම ඒ වෙලාවේ වඩාත් දීප්තිමත් වූ හඳ එළිය මැදින් අහසේ රිදී පාට කරත්තයක් මතු වුණා. ඒක අදිමින් සිටියේ මම මෙතෙක් කාලයකට දැකපු ලස්සනම මුවා විසිනුයි. ඒක හරියටම අපි ළඟින් ගොඩ බෑවා.

"නගින්න," ආර්ටෙමිස් කිවුවා.



තාලියාව කරත්තයට නංවා ගන්න ඇනබෙත් මට උදවු කළා. ඊට පස්සේ මම ෂෙසෝයිව ගන්න ආර්ටෙමිස්ට උදවු කළා. අපි ෂෙසෝයිව බ්ලැන්කෙට්ටුවකින් ඔතන අතරේ තෝන් ලණු ඇද්ද ආර්ටෙමිස් අපිව කඳුවලින් ඉහළ අහසට වේගයෙන් රැගෙන ගියා.

"මේක හරියට නත්තල් සීයගේ කරත්තෙ වගේ," තවමත් වේදනාවෙන් තෝන්තු වී සිටි මම මිමිණුවා.

ආර්ටෙමිස් මගේ දිහා බලන්න ටික වේලාවක් ගත්තා. "ඇත්තටම, අර්ධ-ලෝහිතයෝ. ඒ ජනප්‍රවාදේ පටන් ගන්න ඇත්තෙ කොහෙන් කියල ද ඔයා හිතන්නේ?"

අපි ආරක්ෂිතව පිට වී යනවා දුටු මහාචාර්ය චේස් ප්‍රහාරක යානය ආපසු හරවාගෙන අපි පසුපස ආවේ රාජකීය ආරක්ෂකයෙක් වගෙයි. ඒක නම් පුදුමාකාරම දසුනක් වෙන්න ඇති: සොප්විත් කැමල් යානයක් පිරිවරාගෙන යන, මුවෙක් අදින රිදී කරත්තයක්.

අපිට පිටුපසින්, ටැමල්පයිස් කඳු මුදුනට රොක් වෙමින් සිටි ක්‍රෝනොස්ගේ හමුදාව වියරුවෙන් ගර්ජනා කළා, ඒත් ඒ හඬ පරදවමින් ඇසුණේ අහසේ බර දරාගන්න දඟලමින් දෙවිවරුන්ට දෙස් දෙවොල් තියන ඇට්ලස්ගේ හඬයි.

එයා කතා කළේ ඒක ඒ හැටි දෙයක් නෙවෙයි වගේ වුණත් එයාගේ ඇස් දිස්නය දෙමින් තිබුණා. ඇතිනා, අත්කම් සහ ප්‍රඥාවට අධිපති දෙවඟන මේ පිරිමියාට කැමති වූ හේතුව හදිසියේ ම මට තේරුම් ගන්න පුළුවන් වුණා. ඒ එයා හදවතින්ම විශිෂ්ට, පිස්සු විද්‍යාඥයෙක් නිසයි.

"තාත්තේ..." ඇනබෙත් ගොත ගැහුවා.

"ඇනබෙත්, පර්සි," තාලියා බාධා කළා. එයාගේ කටහඬ කලබලෙන් ඇවිස්සී තිබුණා. එයයි ආර්ටෙමිසුයි ෂෝයි ළඟ දණ ගසාගෙන, දඩයක්කාරියගේ තුවාල වෙලමින් සිටියා.

ඇනබෙතුයි මමයි එයාලට උදවු කරන්න දිවුවත්, අපිට කරන්න තරම් දෙයක් තිබුණේ නැහැ. අපි ළඟ ඇම්බ්‍රෝසියා හෝ නෙක්ටාර් තිබුණේ නැහැ. සාමාන්‍ය බෙහෙත්වලින් ප්‍රයෝජනයකුත් නැහැ. අඳුර වැටී තිබුණත්, ෂෝයි ඉන්නේ හොඳින් නොවෙන බව මට පෙනුණා. එයා සිටියේ වෙවුලමිනුයි, ඒ වගේම සාමාන්‍යයෙන් එයා වටා ඇති මඳ දිලිසුම දූන් මැකී යමින් තිබුණා.

"ඔයාට මායාවකින් එයාව සනීප කරන්න බැරි ද?" මම ආර්ටෙමිස්ගෙන් ඇසුවා. "මං කියන්නේ... ඔයා දෙවඟනක් නේ."

ආර්ටෙමිස් හිටියේ කරදරෙන් වගෙයි. "ජීවිතය කියන්නේ ලේසියෙන් බිඳිලා යන දෙයක්, පර්සි. ඉරණමේ කැමැත්ත ජීවිත කෙන්ද කපලා දාන්න නම්, එතැනින් එහාට මට කරන්න තරම් දෙයක් නැහැ. ඒත් මට උත්සාහ කරලා බලන්න පුළුවන්."

එයා ෂෝයිගේ ඇළපත මත අත තියන්න උත්සාහ කරද්දී ෂෝයි එයාගේ මැණික් කටුව තදින් අල්ල ගත්තා. එයා දෙවඟනගේ දෑස් දිහා බලද්දී ඒ දෙන්නා අතරේ මොකක්දෝ අවබෝධතාවයක් හුවමාරු වුණා.

"මම... ඔබතුමීට හොඳින් සේවය කළා ද?" ෂෝයි කොඳුරා ඇසුවා.

"ලොකු ගෞරවයක් එක්ක," ආර්ටෙමිස් මෘදුව කිවුවා. "මගේ පරිවාරිකාවන්ගෙන් හොඳම කෙනා."

ෂෝයිගේ මුහුණට සාමකාමී පෙනුමක් ආවා. "නිවාඩුවක්. අන්තිමේදී."

# 18
# මිතුරියක් සමු ගත්තා

ඉර බැසගෙන යද්දී අපි ක්‍රිසි ෆීල්ඩ්වලට ගොඩබෑවා.

මහාචාර්ය චේස් සොප්විත් කැමල් යානයෙන් බිමට බැහැපු හැටියේම එයා වෙතට දිවූ ඇනබෙත් එයාව වැලඳ ගත්තා. "තාත්තේ! ඔයා පියෑඹුවා... ඔයා වෙඩි තිබ්බා... ඔහ්, මගෙ දෙයියනේ! ඒක තමයි මම ජීවිතේටම දැකපු පුදුමාකාරම දේ!"

එයාගේ තාත්තා රතු වුණා. "හොඳයි, දෙගොඩහරි වයසේ මනුස්සයෙක් හැටියට ඒක ඒ හැටි නරක නැතුව ඇති, මං හිතන්නේ."

"ඒත් දිව්‍යමය ලෝකඩ උණ්ඩ! ඔයාට කොහෙන්ද ඒවා?"

"අහ්, හොඳයි. අන්තිම වතාවේ ඔයා... පිටවෙලා යනකොට, අර්ධ-ලෝහිත ආයුධ වගයක් වර්ජිනියාවල ඔයාගේ කාමරේ දාලා ගිහින් තිබුණා."

ඇනබෙත් අපහසුවෙන් බිම බලාගත්තා. එයා ගෙදරින් පැනලා ගියා කියන කතාව නොකියා ඉන්න මහාචාර්ය චේස් ගොඩක් සැලකිලිමත් වූ බව මට තේරුණා.

"ඒවා ටිකක් උණු කරලා උණ්ඩ කොපු හදලා බලන්න මට හිතුණා," එයා කියාගෙන ගියා. "ඒක මේ පොඩි අත්හදා බැලීමක් විතරයි."

Scanned with CamScanner

"ඔයාගේ විෂ හොඳ කරන්න මට උත්සාහ කරන්න පුළුවන්, මගේ නිර්භීත කෙල්ලේ."

ඒත් ඒ මොහොතේ, එයාගේ පණ නසන්නේ විෂෙන් විතරක් නොවෙන බව මට තේරුම් ගියා. ඒකට හේතුව වුණේ එයාගේ තාත්තාගෙන් වැදුණු අන්තිම පහරයි. ඔරකල් අනාවැකිය කිවුවේ එයා ගැන බවː එයාව මව් පිය අතින් නැසෙන බව මේ මුළු කාලය පුරාවටම ටෙසෝයි දැනගෙන ඉඳලා. ඒ බව දැන දැනත් එයා ගවේෂණයට එකතු වුණා. එයා මාව බේරගන්න තෝරගත්තා, දැන් ඇට්ලස්ගේ ක්‍රෝධය නිසා එල්ල වූ පහරින් එයාගේ ඇතුලාන්තය බිඳිලා.

තාලියා දුටු ටෙසෝයි එයාගේ අතින් අල්ලා ගත්තා.

"අපි රණ්ඩු කළාට මට කණගාටුයි," ටෙසෝයි කිවුවා. "අපිට සහෝදරියෝ වගේ ඉන්න තිබුණා."

"ඒක මගේ වැරැද්ද." තාලියා කිවුවේ තදින් ඇහි පිය ගසමිනුයි. "ලූක් ගැන, වීරයෝ ගැන, පිරිමි ගැන- හැම දෙයක් ගැනම ඔයා කිවුවා හරි."

"බාගදා, හැම පිරිමියා ම නෙවෙයි," මිමිණූ ටෙසෝයි මගේ දිහාවට දුබල බැල්මක් හෙළුවා. "නුඹ ළඟ තවමත් කඩුව තියෙනව ද, පර්සි?"

මට කතා කරගන්න බැරි වුණා, ඒ වුණත් මම රිප්ටයිඩ් පිටට අරගෙන එයාගේ අතින් තැබුවා. එයා ඒක තෘප්තිමත් ලෙස තදින් අල්ලා ගත්තා. "නුඹ කිවුවේ ඇත්ත, පර්සි ජැක්සන්. නුඹ කොහෙත්ම... කොහෙත්ම හර්කියුලිස් වගේ නෙවෙයි. නුඹ මේ කඩුව ගෙනියන එක මට ගෞරවයක්."

එයාගේ ඇඟ පුරා වෙවුලීමක් පැතිරුණා.

"ටෙසෝයි-" මම කතා කළා.

"තරු," එයා කෙඳිරුවා. "මට ආයෙමත් තරු බලන්න පුළුවන්, මගේ උත්තමාවිය."

ආර්ටෙමිස්ගේ කම්මුල පහළට කඳුළු බිඳුවක් රූටා ගියා. "ඔව්, මගේ නිර්භීත කෙල්ලේ. අද රෑ ඒවා ලස්සනට පායලා තියෙනවා."

"තරු." ටෙසෝයි නැවතත් කිවුවා. එයාගේ ඇස් රෑ අහස දෙසට හැරී නැවතුණා. ඊට පස්සේ එයා ආයෙම සෙලවුනේවත් නැහැ.



තාලියා ඔළුව පහළට හරවා ගත්තා. ඇනබෙත් ඉකියක් ගිල ගනිද්දී එයාගේ තාත්තා එයාගේ උරහිස් උඩින් අත් තැබුවා. ටෙසෝයිගේ කටට උඩින් අතක් ගොටු කර තැබූ ආර්ටෙමිස් පෞරාණික ග්‍රීක බසින් වචන කීපයක් මුමුණන දෙස මම බලා සිටියා. ටෙසෝයිගේ තොල් අතරින් ප්‍රාශ්වාස වූ රිදී පාට දුම් රොදක් දෙවඟනගේ අතේ රැඳුණා. ටෙසෝයිගේ සිරුර සැලෙමින් දිලිසී අතුරුදහන් වුණා.

නැගී සිටි ආර්ටෙමිස් ආශිර්වාදයක් වගේ යමක් කියා, ගුළි කරගෙන සිටි අත්ලට පිඹිද්දී රිදී පාට දූවිල්ලක් අහසට නිදහස් වුණා. ඉහළට පියඹා ගිය ඒවා දිලිසී අතුරුදහන් වුණා.

මොහොතක් ගතවන තුරු මට කිසිම වෙනසක් පෙනුනේ නැහැ. ටිකකින් ඇනබෙත් හීල්ලුවා. අහස දිහා බැලූ මට තරු වඩාත් දීප්තිමත් වී ඇති බව දකින්න ලැබුණා. ඒවායින් මම මීට කලින් දැක නොතිබූ රටාවක් මැවී තිබුණා- ගැහැනු ළමයෙකුගේ රුවක් වගේ පෙනෙන දිලිසෙන තරු රටාවක්- දුන්නක් අත දරාගෙන අහස හරහා දුවන කෙල්ලෙක්.

"ලෝකයම ඔබට ගරු කරාවි, මගේ දඩයක්කාරියේ," ආර්ටෙමිස් කිවුවා. "තරු අතරේ සදහටම වැජඹෙන්න."

★★★

එකිනෙකාගෙන් සමු ගැනීම අපිට පහසු කටයුත්තක් වුණේ නැහැ. උතුරු අහසේ ටැමල්පයිස් කඳු මුදුනට ඉහළින් තවමත් අකුණු විදුලි කොටමින් තිබුණා. ආර්ටෙමිස් කොයි තරම් හිත් තැවුලෙන් සිටියා ද කියනවා නම් එයාව රිදී පාටින් සැලුණා. ඒක දැකලා මම බය වුණේ හදිසියේවත් එයාට, එයාව පාලනය කරගන්න බැරි වෙලා, අපි ඉස්සරහා සම්පූර්ණ දිව්‍යමය ස්වරූපය ගත්තොත් එයා දිහා බලන් ඉන්න අපිව අළු වෙලා යාවි කියලා හිතුණ නිසයි.

"මම දැන්ම ඔලිම්පස්වලට යන්න ඕනෑ," ආර්ටෙමිස් කිවුවා. "මට ඔයාලව අරන් යන්න නම් බැරි වෙයි, ඒත් මම උදවු එවන්නම්."

දෙවඟන ඇනබෙත්ගේ උරහිස උඩින් අතක් තැබුවා. "ඔයා හිතාගන්නත් බැරි තරම් නිර්භීතයි, මගෙ කෙල්ලේ. ඔයා කරන්න උවමනා හරිම දේ කරයි."

ඊට පස්සේ එයා තාලියා දිහා විපරමෙන් බැලුවේ හරියට මේ සියුස්ගේ බාලම දුවත් එක්ක මොනවා කරන්න ද කියලා විශ්වාසයක්

Scanned with CamScanner

නැතුව වගෙයි. තාලියා එයා දිහා බලන්න අදි මදි කළත් මොකක්දෝ හේතුවකට ඔළුව එසවූ එයා දෙවඟනගේ ඇස් දිහා එක එල්ලේ බලා සිටියා. ඒ දෙන්නා අතරේ මොනවා හුවමාරු වුණා ද, මට විශ්වාස නැතත් ආර්ටෙමිස්ගේ බැල්ම අනුකම්පාවෙන් මෘදු වෙනවා මට දකින්න ලැබුණා. ඊට පස්සේ එයා මගේ දිහාවට හැරුණා.

"ඔයා හොඳට වැඩේ කළා," එයා කිවුවා. "පිරිමියෙක් හැටියට."

ඒ කතාවට විරෝධය පාන්න මට ඕනෑ වුණත්, ඒත් එක්කම මට තේරුම් ගියේ එයා මට කොල්ලා කියලා කතා නොකරපු පළවෙනි වතාව එය බවයි.

එයා කරත්තයට ගොඩ වුණාම ඒක දිලිසෙන්න ගත්තා. අපි ඇස් වසා ගත්තා. රිදී පාට ක්ෂණික එළියක් එක්ක දෙවඟන යන්න ගියා.

"හොඳයි," මහාචාර්ය චේස් සුසුමක් හෙළුවා. "එයා නම් හිත් ඇදගන්න කෙනෙක් තමයි, ඒ වුණාට මම තවමත් වැඩිපුර කැමති ඇතීනට කියලා මම කියන්නම ඕනෑ."

ඇනබෙත් එයා දිහාවට හැරුණා. "තාත්තේ, මට... මට සමා වෙන්න-"

"ෂ්ෂ්..." එයා ඇනබෙත්ව තුරුලු කරගත්තා. "ඔයා කරන්න ඕනෑ දේ කරන්න, මගේ දරුවෝ. මේක ඔයාට ලේසි පහසු දෙයක් නොවෙන විත්තිය මං දන්නවා."

එයාගේ කටහඬ යන්තමින් සැලුණත්, එයා ඇනබෙත්ව දිරි ගන්වන හිනාවක් පෑවා.

ඒ වෙලාවේ මට විශාල පියාපත් වදින වූෂ් හඬක් ඇසුණා. මීදුම තුළින් පෙගසිලා තුන්දෙනෙක්: සුදු පාට පියාඹන අශ්වයෝ දෙන්නෙක් සහ තනි කළු පාට එකෙක් මතු වුණා.

"බ්ලැක්ජැක්!" මට කියවුණා.

*යෝ, බොස්! එයා කතා කළා. මං නැතුව කොහොම හරි පණ ගැට ගහගෙන හිටිය ද?*

"ඒක ලේසි වුණේ නම් නැහැ," මම පිළිගත්තා.

*මම ගයිඩෝවයි, පෝක්පීවයි එක්ක ආවා.*



*කොහොමද ඉතින්?* අනෙක් පෙගසිලා දෙන්නත් මගේ හිත ඇතුළේ කතා කළා.

බලවත් සැලකිල්ලෙන් මගේ දිහා බැලූ බ්ලැක්ජැක් ඊට පස්සේ මහාචාර්ය චේස්ව, තාලියාව සහ ඇනබෙත්ව පරීක්ෂා කර බැලුවා. *මුන් එකෙක්ට හරි කුර පාරක් දීලා පොඩි කරලා දාන්න ඔයාට ඕනෑ ද?*

"නෑහ්," මම හඬ නගා කිවුවා. "මෙයාලා මගේ යාළුවෝ. අපිට පුළුවන් තරම් වේගයෙන් ඔලිම්පස්වලට යන්න ඕනෑ."

*අවුලක් නෑ,* බ්ලැක්ජැක් කිවුවා. *හැබැයි අර මිනිහව ඇරෙන්න. එයා යන්නෙ නැතුව ඇති නේ.*

මහාචාර්ය චේස් ගමන නොයන බව මම එයාට සහතික කළා. මහාචාර්යතුමා කට ඇරගෙන පෙගසිලා දිහා බලා සිටියා.

"හිතා ගන්නවත් බැහැ," එයා කිවුවා. "කොයි තරම් වේගවත් ද! අශ්ව ඇඟක බර දරා ගන්න තටු හැදිලා තියෙන්නේ කොහොමද කියලයි මට පුදුම?"

*මොකා...ක්?* බ්ලැක්ජැක් ඔළුව පැත්තකට ඇල කරා.

"ඇයි, ක්‍රිමියාවල සටනට බ්‍රිතාන්‍ය අශ්වාරෝහක හමුදාවට මේ පෙගසිලා හිටියා නම්," මහාචාර්ය චේස් කිවුවා, "සැහැල්ලු සේනාංකයේ පහරදීම්-"

"තාත්තේ," ඇනබෙත් එයාට බාධා කළා.

මහාචාර්ය චේස් තදින් ඇහිපිය ගැසුවා. එයාගේ දුව දිහා බැලූ එයා අමාරුවෙන් හිනා වුණා. "සමා වෙන්න, මගෙ දරුවෝ, මං දන්නවා, ඔයාලා දැන් යන්න ඕනෑ."

එයා අන්තිම වතාවටත් නුහුරට, ඒත් ආදරයෙන් ඇනබෙත්ව වැලඳ ගත්තා. එයා පෙගසස් ගයිඩෝගේ පිටට නගින්න හැරෙද්දී මහාචාර්ය චේස් ආපසු කතා කළා. "ඇනබෙත්, මං දන්නවා... මං දන්නවා සැන් ෆ්‍රැන්සිස්කෝ කියන්නේ ඔයාට ඉන්න අනතුරුදායක තැනක්. ඒත් අමතක කරන්නෙපා, ඔයාට ඕනෑම වෙලාවක අපිත් එක්ක ඉන්න ගෙදර එන්න පුළුවන්. අපි ඔයාව පරිස්සමෙන් බලා ගන්නම්."

ඇනබෙත් එයාට උත්තර දුන්නේ නැහැ, ඒ වුණත් ආපසු හැරෙද්දී එයාගේ ඇස් රතු වෙලා තිබුණා. මහාචාර්ය චේස් තව මොනවදෝ කියන්න හැදුවා, ඊට පස්සේ ඒක නොකියා ඉන්න එක

හොඳයි කියලා එයා හිතුවා වගෙයි. දුක්බරව අත වනා සමු දුන් එයා අඳුරු පිටිය හරහා කකුල් අද්දවමින් යන්න ගියා.

තාලියා, ඇනබෙත් සහ මම, අපේ පෙගසිලාගේ පිටට ගොඩ වුණා. මුහුදු බොක්ක ඉහළට එක්ව පියාසර කළ අපි තුන්දෙනා නැගෙනහිර කඳු වැටි දෙසට පියඹා ගියා. ඉක්මනින්ම, සැන් ෆ්‍රැන්සිස්කෝ අපිට පිටුපසින් විටින් විට උතුරු අහසේ අකුණක් කොටන දිලිසෙන අඩ හඳක් විතරක් වුණා.

★★★

හෙම්බත්ව සිටි තාලියා පෝක්පීගේ පිට උඩම නින්දට වැටුණා. උස් තැන්වලට ඇති බය පැත්තකට දාලා, මේ තරම් උසක දී නින්දට වැටෙන්න එයා කොයි තරම් මහන්සියෙන් ඉන්න ඇති ද මට හිතා ගන්න පුළුවන් වුණා. ඒත් ඒ ගැන එයාට බය වෙන්න තරම් දෙයක් තිබුණේ නැහැ. සැහැල්ලුවෙන් පියඹා ගිය එයාගේ පෙගසස් තාලියාව එයාගේ පිට මත ආරක්ෂිතව රැඳෙන්න විටින් විට සීරු මාරු වුණා.

ඇනබෙතුයි මමයි එක ළඟින් පියඹා ගියා.

"ඔයාගේ තාත්තා නම් හොඳ පාටයි," මම එයාට කිවුවා.

අඳුර නිසා මට එයාගේ මුහුණේ පළ වූ හැඟීම් දකගන්න බැරි වුණා. දැන් කැලිෆෝනියාව අපිට ගොඩක් පිටුපසින් තිබුණා වුණත් එයා ආපසු හැරී බැලුවා.

"මාත් එහෙම හිතනවා," එයා කිවුවා. "අපි අවුරුදු ගාණක්ම හිටියෙ රණ්ඩු කර කර."

"ඔව්, ඔයා කියලා තියෙනවා."

"ඔයා කියන්නේ මං ඒ කිවුවේ බොරු කියල ද?" එයා අභියෝග කරන්න වගේ ඇසුවත්, ඒක දැනුණේ එයා තමන්ගෙන්ම අහගන්නවා වගෙයි.

"ඔයා බොරු කිවුවා කියලා මං කිවුවේ නැහැ නේ. ඒක මේ... එයා ඇත්තටම හොඳයි වගෙයි. ඔයාගේ කුඩම්මත් එහෙමයි. සමහරවිට එයාලා ඔයා අන්තිම සැරේට දකිද්දී හිටියට වඩා හොඳ වෙලා ඇති."



එයා පැකිළුණා. "එයාලා තවමත් ඉන්නේ සැන් ෆ්‍රැන්සිස්කෝවල, පර්සි. මට කඳවුරෙන් එච්චර ඈතක ජීවත් වෙන්න බැහැ."

මට, මගේ ඊළඟ ප්‍රශ්නය අහන්න ඕනෑ වුණේ නැහැ. ඒකට එයා දෙන උත්තරය දැනගන්න මම බය වුණා. කොහොම වුණත් මම ඒක ඇහුවා. "එතකොට දැන් ඔයා මොනවද කරන්න යන්නේ?"

කළුවර මැදින් ආලෝකමත් වූ පුංචි දූපතක් වගේ නගරයකට ඉහළින් අපි පියඹා ගියා. ඒක කොයි තරම් වේගයෙන් පසු වී ගියා ද කියනවා නම්, අපි ගුවන් යානයක වේගයෙන් පියාසර කරන්න ඇති.

"මං දන්නේ නැහැ," එයා පිළිගත්තා. "ඒ කොහොම වුණත්, මාව බේරගත්තට ඔයාට ස්තුතියි."

"හේයි, ඒක ඒ හැටි දෙයක් නෙවෙයි. අපි යාළුවෝ නේ."

"මම මැරිලා කියලා ඔයා විශ්වාස කළේ නැද්ද?"

"කීයටවත් නෑ."

එයා පසුබට වුණා. "ඔයා දන්නව ද, ලූක්ත් එහෙමයි. මං කිවුවේ... එයා මැරිලා නැහැ."

මම එයා දිහා පුදුමයෙන් බලා සිටියා. එයා ආතතිය වැඩිකමට දොඩවනව ද මට තේරුනේ නැහැ. "ඇනබෙත්, එයා වැටුණේ ලොකු උසකින්. ඒක වෙන්න කොහෙත්ම විදිහක් නැහැ-"

"එයා මැරිලා නැහැ," එයා තදින්ම කියා සිටියා. "මං ඒක දන්නවා. ඔයා මං ගැන දැනගෙන හිටපු විදිහටම."

ඒ සංසන්දනය ගැන නම් මට සතුටු වෙන්න බැරි වුණා.

දැන් අපිට පහළින් වූ නගර වඩාත් වේගයෙන් පසු වී යද්දී විදුලි එළිවලින් සැදුණු දූපත් ටිකෙන් ටික පුළුල් වී අන්තිමේ දී අපිට පහළින් වූ සම්පූර්ණ භූමියම දිලිසෙන බුමුතුරුණක් වගේ වුණා. එළි වෙන්න ළඟ බව කියාපාමින් නැගෙනහිර අහස අළු පාටට හැරෙන්න ගත්තා. අපිට ඉදිරියෙන්, අති විශාල සුදු-කහ පාට දීප්තියක් පැතිරී තිබුණා- නිව්යෝක් නගරයේ විදුලි එළි.

*කොහොමද අපේ වේගෙ, බොස්? බ්ලැක්ජැක් පම්පෝරි ගැසුවා. අපිට උදේ කෑමට වැඩිපුර පිදුරු ටිකක්වත් දෙනව ද?*

"ඔයා තමයි නියම මිනිහා, බ්ලැක්ජැක්," මම එයාට කිවුවා. "එර්ර්, අශ්වයා, මං කිවුවේ."

"මං ලූක් ගැන කිවුව දේ ඔයා විශ්වාස කරන්නෙ නැහැ නේ," ඇනබෙත් කිවුවා. "ඒත් අපිට එයාව ආපහු දකින්න ලැබෙයි. එයා ඉන්නේ කරදරේක වැටිලා, පර්සි. එයා ක්‍රෝනොස්ගේ වශියකට අහුවෙලා ඉන්නේ."

මට වාද කරන්න හිතුනේ නැති වුණත්, එයින් මගේ තරහා ඇවිස්සුණා. ඒ ජරා සතා ගැන ඇනබෙත් මොකටද තවමත් හිතන්නේ? එයා වෙනුවෙන් නිදහසට කරුණු කියන්න ඇනබෙත්ට පුළුවන් වුණේ කොහොමද? එයා අර ප්‍රපාතයෙන් පහළට වැටුණට කමක් නැහැ. එයා... හොඳයි, මං ඒක කියන්නම්. එයා මැරුණට කමක් නැහැ. බියන්කාගේ, ෂෝයිගේ මරණයත් වගේ එයාගේ මරණය අපරාධයක් නෙවෙයි. ලූක් ජීවත් වෙන්න තරම් වටින්නේ නැහැ. ඒක සාධාරණ නැහැ.

"අර තියෙන්නේ ඒක," තාලියාගේ හඬ ඇසුණා. එයා නින්දෙන් ඇහැරිලා. අපේ දර්ශන පථයට වේගයෙන් ළං වෙන මැන්හැටන් දිහාවට එයා අත දිගු කළා. "ඒක පටන්ගෙන."

"මොකක්ද?" මම ඇසුවා.

ඊට පස්සේ මම එයා අත දිගු කර පෙන්වූ දිසාව බැලුවා. එම්පයර් ස්ටේට් ගොඩනැගිල්ලට ඉහළින් දැල්වෙන පන්දම් සහ ගිනි අඟුරු බඳුන්වලින් ආලෝකමත්ව, උදෑසන සුළඟ මැද දිලෙමින් ඔලිම්පස් කන්ද තිබුණා.

"දක්ෂිණායනය," තාලියා කිවුවා. "දෙවිවරුන්ගේ මහා මන්ත්‍රණ සභාව."

# 19
# දෙවිවරු අපිව මරන්න ඡන්දය දුන්නා

පොසෙයිඩන්ගේ පුතෙකුට උඩින් ගමන් යෑම කොහොමත් හොඳ දෙයක් නෙවෙයි, ඒත් වටේට අකුණු විදුලි සුළි නංවන සියුස්ගේ මාලිගාවට කෙළින්ම පියාසර කරන එක ඊටත් වඩා නරකයි.

අපි ඔලිම්පස් කන්ද වටා වටයක් සම්පූර්ණ කරමින් මැන්හැටන් නගරයට ඉහළින් රවුමට පියෑඹුවා. මීට කලින් මම එක් වරක් මෙහෙට ඇවිත් තිබුණා, ඒ එම්පයර් ස්ටේට් ගොඩනැගිල්ලේ සෝපානයෙන් රහසිගත හයසිය වෙනි තට්ටුව දක්වා ගමන් කරලයි. මේ වතාවේ, ඔලිම්පස් දැකලා මම තවත් පුදුම වුණා.

උදෑසන ලා අඳුර මැදින් දැල්වුණු පන්දම් සහ ගිනි මැලවල එළිවලින් මාලිගා ලේ රතු පාටේ සිට ඉන්ඩිගෝ පාට දක්වා වෙනස් පාට විස්සකින් විතර දිලිසුණා. පෙනුණු හැටියට නම් ඔලිම්පස්වල කවුරුවත් කවදාවත් නිදාගන්නේ නැහැ වගෙයි. දඟර ගැසෙමින් ඇදී ගිය මාවත් පිරී තිබුණේ කරත්තවලින් හෝ සයික්ලොප්ස්ලා විසින් ඔසවාගෙන යන දෝලවලින් ගමන් යන උප දෙවිවරු, ස්වාභාවික බලවේග සහ සුළු දෙවිවරුන්ගෙනුයි. එතැනට ශීත ඍතුවේ බලපෑමක් නැහැ වගෙයි. උයන් පිරී පිපුණු සමන් පිච්ච, රෝස සහ මම නම් කරන්න නොදන්නා මල්වල සුවඳ හැම අතින්ම හමා ආවා. වීණාවලින් සහ බට නළාවලින් නැගුණු මෘදු සංගීත නාද ජනේල තුළින් ඇදී ආවා.

මන්දිර අතරින් විශාලම මන්දිරය- දෙවිවරුන්ගේ දිලිසෙන ධවල ශාලාව කඳු මුඳුනේ නැඟී සිටියා.

Scanned with CamScanner

අපේ පෙගසිලා අපිව පිටත මිදුලේ යෝධ රිදී ගේට්ටුවක් ඉදිරිපිට බැස්සවූවා. මම තට්ටු කරන්න හිතන්නත් කලින් ඒවා ඉබේටම ඇරුණා.

*ජය වේවා, බොස්,* බ්ලැක්ජැක් කිවුවා.

"ඔව්," හේතුව නොතේරුණත් මට විනාශයක පෙර නිමිති දැනුණා. දෙවිවරු හැම දෙනාම එක තැන ඉන්නවා මීට කලින් කවදාවත් මම දැකලා තිබුණේ නැහැ. එයාලගෙන් ඕනෑම කෙනෙකුට මාව දූවිල්ලකට කුඩු කරන්න පුළුවන්කම ඇති බවත්, කීප දෙනෙක්ම එහෙම කරන්න කැමැත්තෙන් ඉන්න බවත් මම දැන සිටියා.

*හේයි, ඔයා ආපහු ආවේ නැත්නම් ඔයාගේ කැබින් එක මගේ ඉස්තාලෙට ගන්නට කමක් නැද්ද?*

මම පෙගසස් දිහා බැලුවා.

*මේ, නිකමට වගේ ඇහුවේ,* බ්ලැක්ජැක් කිවුවා. *සමා වෙන්න.*

තාලියාව, ඇනබෙත්ව සහ මාව එතැන තනි කරලා බ්ලැක්ජැක් සහ එයාගේ යාළුවෝ පියඹා ගියා. විනාඩියක් විතර ගතවෙන තුරු අපි එතැනම සිටගෙන මාලිගාව දිහා බලා සිටියේ, මීට අවුරුදු මිලියනයකට විතර කලින් දවසක වෙස්ටෝවර් ශාලාව ඉදිරියේ සිටි විදිහටමයි.

ඊට පස්සේ අපි තුන්දෙනා එක්ව සිංහාසන ශාලාව තුළට පිය මැන්නා.

★★★

මධ්‍යම උද්‍යාන වටා ඇති විශාල සිංහාසන දොළහක් යූ අකුරේ හැඩයට සකසා තිබුණේ කඳවුරේ කැබින් පිහිටුවා ඇති පිළිවෙළටමයි. ඊට ඉහළින් වූ සිවිලිමේ තරු රටා බැබළුණා- දුන්න මානාගෙන සුරපුරය හරහා දුවන ටෙසෝයි නම් දඩයක්කාරියගේ අලුත්ම තරු රටාව පවා එතැන තිබුණා.

අඩි පහළොවක් තරම් උස දෙවිවරු සහ දෙවඟනෝ හැම අසුනක්ම අරාගෙන සිටියා. මං ඔයාට කියන්නේ, මහා බලගතු, අති විශාල දෙවිවරු දූසිමක් එකවර ඔයා දිහා බලා ඉන්නවා නම්... හොඳයි, රාක්ෂයින්ට මූණ දෙන එක පික්නික් එකක් වගේ කියලා හදිසියේම ඔයාටත් හිතෙන්න ගනීවි.

"වීරයින්ව සාදරයෙන් පිළිගන්නවා," ආර්ටෙමිස් කිවුවා.



"උම්බෑ..!"

මම බෙසීව සහ ග්‍රෝවර්ව දැක්කේ එතකොටයි.

ශාලාව මැද ගිනි මැලය අසලම වතුර ගෝලයක් එල්ලෙමින් තිබුණා. බෙසී ඒක ඇතුළේ සතුටින් එහෙ මෙහෙ පීනමින්, සර්ප වලිගයෙන් වතුර කලතමින්, ගෝලයේ යටි පැත්තෙන් ඔළුව එළියට ඔබා බලමින් සෙල්ලම් කරකර සිටියා. මායා බුබුළ ඇතුළේ පිහිනන්න ලැබුණු අලුත් අද්දැකීමෙන් එයා ගොඩාක් විනෝද වුණා වගෙයි පෙනුණේ. සියුස්ගේ සිංහාසනය ළඟ දණ ගසාගෙන ග්‍රෝවර් වාර්තාවක් දෙනවා වගේ පෙනුණත්, අපිව දැකපු හැටියේ එයා කෑගැසුවා, "ඔයාලා ඒක කළා!"

එයා මගේ දිහාවට දුවගෙන එන්න පටන් ගත්තත්, එතකොට එයා සියුස්ට පස්ස හරවන බව එයාට මතක් වුණා. එයා අවසර ඉල්ලමින් සියුස් දිහා බැලුවා.

"යනවා," සියුස් කිවුවත්, එයා හිටියේ ග්‍රෝවර් ගැන කිසිම අවධානයකින් නෙවෙයි. අහසට අධිපති ඕනෑකමින් බලා සිටියේ තාලියා දෙසයි.

ග්‍රෝවර් හැල්මේ දුවගෙන ආවා. දෙවිවරුන්ගෙන් කිසිවෙක් හෝ කතා කළේ නැහැ. ග්‍රෝවර්ගේ කුර වදින ක්ලොප්-ක්ලොප් හඬ කිරි ගරුඬ පොළොව මත දෝංකාර දුන්නා. බෙසී ගෝලය තුළ වතුර කැලතුවා. ගිනි මැලය සට පට හඬින් ඇවිළුණා.

මම බයෙන් සැකෙන් මගේ තාත්තා, පොසෙයිඩන් දිහා බැලුවා. මම අන්තිම වතාවේ දකිනකොට එයා හැඳ සිටි ඇඳුමෙන්ම එයා සැරසී සිටියාඃ කොට කලිසමක්, හවායි කමිසයක් සහ සෙරෙප්පු දෙකක්. එයාට අව්වට පිළිස්සී, කාලගුණයෙන් පදම් වූ මුහුණක්, කළු රැවුලක් සහ තද කොළ පාට ඇස් දෙකක් තිබුණා. මාව ආයෙමත් දකින්න ලැබුණාම එයාට කොහොම දැනේවි ද මට විශ්වාසයක් තිබුණේ නැහැ, ඒත් එයාගේ ඇස් දෙකෙළවර හිනාවකින් රැළි ගැසුණා. හැමදෙයක්ම හරි කියලා අඟවන්න වගේ එයා ඔළුව වැනුවා.

ග්‍රෝවර් ඇනබෙත්ව හා තාලියාව තදින් බදාගත්තා. ඊට පස්සෙ එයා මගේ අත් අල්ලා ගත්තා. "පර්සි, බෙසියි මමයි ඒක කළා! ඒත් ඔයා එයාලට තේරුම් කරලා දෙන්න ඕනෑ! එයාලට එහෙම කරන්න බැහැ!"

Scanned with CamScanner

"මොකක් කරන්න ද?" මම ඇහුවා.

"වීරයිනි," ආර්ටෙමිස් කතා කළා.

සිංහාසනයෙන් බැස්ස දෙවඟන මනුෂ්‍ය ප්‍රමාණයට- රතු දුඹුරු පාට කොණ්ඩයක් ඇති තරුණ ගැහැනු ළමයෙකුට හැරිලා, යෝධ ඔලිම්පියානුවෝ මැද කිසිම අපහසුවක් නැතිව සැහැල්ලුවෙන් සිටියා. එයා අපි ඉදිරියට ඇවිද එද්දී එයාගේ රිදී ලෝගුව දිලිසුණා. එයාගේ මුහුණෙන් කිසිම හැඟීමක් පළ වුණේ නැහැ. එයා සඳ රැස් මැදින් ඇවිද එනවා වගෙයි පෙනුණේ.

"ඔයාලා කළ දේ ගැන සභාවට දන්වලයි තියෙන්නේ," ආර්ටෙමිස් අපිට කිවුවා. "බටහිර ඔත්‍රිස් කන්ද නැඟී සිටින බව එයාලා දන්නවා. ඇට්ලස් නිදහස් වෙන්න ගත් වෑයම ගැනත්, ක්‍රෝනොස්ගේ හමුදා රැස් කිරීම් ගැනත් එයාලා දන්නවා. ඒ සම්බන්ධව ක්‍රියාත්මක වෙන්න අපි ඡන්දය ප්‍රකාශ කරලයි තියෙන්නේ."

මේ සැලසුම ගැන වැඩි සතුටක් නැති බව අඟවන්න වගේ දෙවිවරු අතර කෙඳිරුමක් සහ නොසන්සුන්කමක් පැතිරුණත්, කිසිවෙක් විරෝධය පළ කරේ නැහැ.

"සියුස් උතුමාගේ නියෝගය පරිදී," ආර්ටෙමිස් කිවුවා, ''මගේ සහෝදරයා ඇපලෝ සහ මම බලගතුම රාක්ෂයින්ව සොයා ගිහින්, උන් ටයිටන්ගේ පිලට එකතු වෙන්න කලින් දඩයම් කරන්න බලාපොරොත්තු වෙනවා. ඇතීනා උත්තමාවිය අනෙක් ටයිටන්වරු, එයාලව රඳවා ඉන්න එක එක හිරගෙවල් පෞද්ගලිකවම පරීක්ෂා කරලා, උන් ඒවාගෙන් පැනලා නොයන බව සහතික කරාවි. ප්‍රින්සස් ඇන්ඩ්‍රොමීඩාට සම්පූර්ණ බලය මුදා හැරලා, ඒක මුහුදු පතුලට ගිල්වා දමන්න පොසෙයිඩන් උතුමාට අවසර ලැබී තියෙනවා. ඒ වගේම, ඔයාලා ගැන කියනවා නම්, මගේ වීරයිනි..."

අනෙක් අමරණීයයන්ට මුහුණ දෙන්න එයා ආපසු හැරුණා. "මේ අර්ධ-ලෝහිතයෝ ඔලිම්පස්වලට විශිෂ්ට සේවයක් කරලා තියෙනවා. මෙතැන ඉන්න කවුරුහරි ඒක ප්‍රතික්ෂේප කරනවා ද?"

එයා රැස් වී සිටි දෙවිවරු එකිනෙකාගේ මුහුණු දෙස බැලුවා. රැවුල පිළිවෙළට කපා, ඉරි මෝස්තරයක් වැටුණු තද පාට ඇඳුම් කට්ටලයකින් සැරසී සිටි සියුස්ගේ ඇස්වලින් ශක්තිය විහිදුණා. එයා ළඟින්ම වාඩි වී සිටියේ මොනර පිහාටුවේ පාටවලින් දිලිසෙන



ගවුමකින් සැරසුණු ලස්සන ගැහැනු කෙනෙක්. එයාගේ රිදී පාට කොණ්ඩය කරලකට ගොතා උරහිසක් මතින් ඉදිරියට දමාගෙන සිටියා. ඒ හේරා දෙවඟනයි.

සියුස්ගේ දකුණු පැත්තේ මගේ තාත්තා, පොසෙයිඩන් වාඩි වී සිටියා. එයා ළඟින් සිටියේ කකුලකට වානේ ආධාරක සවි කරගත්, විරූපී ඔළුවක් සහ අපිරිසිදු දුඹුරු පාට රැවුලක් ඇති තඩි මනුස්සයෙක්. එයාගේ රැවුල් ගස් අතරේ විටින් විට ගිනි දැලු නැටුවා. එයා තමයි කම්මල් දෙවියා, හෙෆාස්ටස්.

හර්මීස් මට ඇහැක් ගැසුවා. ව්‍යාපාරික ඇඳුම් කට්ටලයකින් සැරසී සිටි එයා කැඩූසියස් ජංගම දුරකථනයේ පණිවුඩ පරීක්ෂා කරමින් සිටියා. ඇපලෝ අව් කණ්ණාඩි පැලඳගෙන එයාගේ රන් සිංහාසනයේ ඇල වී සිටියා. එයා අයිපොඩ් එකක හෙඩ්ෆෝන් කනේ ගසාගෙන සිටි නිසා එතැන සිදු වූ කතාබහට එයා අඩු තරමේ ඇහුම්කන් දුන්නා ද කියලවත් මට හිතාගන්න බැරි වුණා. ඒ වුණත් එයා මට මහපටැඟිල්ල පෙන්වා ආචාර කළා. මිදි වැලක් ඇඟිලි අතරේ කරකවමින් ඩයනයිසියස් සිටියේ එපා වෙලා වගෙයි. එතකොට ඒරීස්, හොඳයි, ක්‍රෝමියම්-ලෙදර් සිංහාසනයේ වාඩි වී සිටි එයා පිහියක් මුවහත් කරමින් මට රවාගෙන සිටියා.

සිංහාසන ශාලාවේ කාන්තාවන්ගේ පැත්තේ හේරා අසල වූ ඇපල් අතු එකට වියා සෑදූ සිංහාසනයේ වාඩි වී සිටියේ කොළ පාට ලෝගුවකින් සැරසුණු කළු කොණ්ඩයක් ඇති දෙවඟනක්. ඒ ඩිමීටර්, අස්වැන්නට අධිපතිනිය. එයා ළඟින් සුදු පාට සුන්දර ගවුමකින් සැරසුණු, ලස්සන අළු පාට ඇස් ඇති ගැහැනු කෙනෙක් වාඩි වී සිටියා. එයා තමයි ඇනබෙත්ගේ අම්මා, ඇතීනා. එයා ළඟින්ම සිටි ඇෆ්‍රොඩයිට් හැමදේම දන්නා බව අඟවන්න වගේ මට පෑව හිනාව දැකලා මාව ඉබේටම රතු වුණා.

ඔලිම්පියානුවෝ හැමෝම එකම තැනක. මේ ශාලාව තුළ කොයි තරම් බලයක් එකතු වී තිබුණා ද කියනවා නම්, මුළු මාලිගාවම පුපුරා නොගිය එකම ප්‍රාතිහාර්යයක් වගෙයි.

"මං කියන්නම ඕනෑ-" ඇපලෝ නිහඬතාවය බින්දා. "-මේ ළමයි වැඩේ හොඳට කළා." උගුරේ රැල් බුරුල් කළ එයා ගායනයක් පටන් ගත්තා: *"වීරයෝ දිනති ලෝරල්-"*

"ම්, ඔව්, ඉහළින්ම," හර්මීස් මැදට පැන්නේ ඇපලෝගේ කවිවලින් ගැලවෙන්න හදිස්සියෙන් වගෙයි. "එයාලව කුඩු කරලා නොදාන්න හැමෝම එකඟයි ද?"

අත් කිපයක් අස්ථිර ලෙස ඉහළට එසවුණා- ඩිමීටර්ගේ, ඇෆ්‍රොඩයිට්ගේ.

"විනාඩියක් ඉන්නවා," ඒරීස් ගෙරෙව්වා. එයා තාලියාටත් මටත් ඇඟිල්ල දිගු කළා. "මුන් දෙන්නා භයානකයි. හොඳම වැඩේ තමයි, මුන් මෙතැන ඉන්න වෙලාවේ-"

"ඒරීස්," පොසෙයිඩන් එයාට බාධා කළා, "මෙයාලා වටිනා වීරයෝ. අපි මගේ පුතාව කෑලිවලට කුඩු කරන්නෙ නැහැ."

"මගේ දුවවත් නැහැ," සියුස් ගෙරෙව්වා. "එයා හොඳට වැඩේ කළා."

තාලියා මූණ රතු කරගෙන බිම බලාගත්තා. එයාට දැනුණු විදිහ මට තේරුම් ගන්න පුළුවන් වුණා. මගේ තාත්තාගෙන් මට ප්‍රශංසාවක් අහන්න ලැබෙනවා කෙසේ වෙතත්, මට එයා එක්ක කතා කරන්න ලැබෙන්නෙත් කලාතුරකින්.

ඇතීනා දෙවඟන උගුර පාදමින් අසුනේ ඉදිරියට නැමුණා. "මමත් මගේ දුව ගැන ගොඩාක් ආඩම්බර වෙනවා. ඒත්, අනිත් දෙන්නා ආරක්ෂාවට අවදානමක්."

"අම්මේ!" ඇනබෙත් කිවුවා. "ඔයා කොහොමද-"

ඇතීනා සන්සුන් එහෙත් දැඩි බැල්මකින් එයාව නිහඬ කළා. "මගේ තාත්තා සියුස්යි, මගේ බාප්පා පොසෙයිඩනුයි තවත් ළමයි නොහදා ඉන්න දුන්න දිවුරුම කැඩුව එක අවාසනාවක්. තමන්ගේ වචනය රැක්කේ හේඩීස් විතරයි, ඒක නම් මට විහිළුවක් වගෙයි. අපි හැමෝම දන්නවා, මහා අනාවැකියේ කියවෙන විදිහට, වැඩිමල් දෙවිවරු තුන්දෙනාගේ දරුවෝ... හරියට තාලියා, පර්සි වගේ අය... අනතුරුදායකයි. මොට්ටයෙක් වුණත්, ඒරීස් කියපු කතාවේ ඇත්තක් තියෙනවා."

"අන්න හරි!" ඒරීස් කිවුවා. "හේයි, පොඩ්ඩක් ඉන්නවා. ඔහේ කාට ද-"



එයා නැඟිට්ටන්න හැදුවත් ආසන පටියක් වගේ එයාගේ ඉණ වටේ එතුණු මිදි වැලකින් එයාව ආපස්සට ඇදලා ගත්තා.

"අයියෝ, ඒරීස්," ඩයනයිසියස් සුසුමක් හෙළුවා. "රණ්ඩු කරන ඒවා පස්සට තියාගන්න."

ඒරීස් අවලාද නගමින් වැල ගලවා දැමුවා. "ඔහේ ද මට කියනඩ එන්නෙ, නාකි බේබද්දා. මේ වදකාරයින්ව පරිස්සම් කරන්ඩ ඔහේට ඇත්තටම ඕනෑ ද?"

ඩයනයිසියස් අපි දිහාවට වෙහෙසකර බැල්මක් හෙළුවා. "මට නම් එයාලා ගැන කිසි කැක්කුමක් නැහැ. ඇතීනා, ඔයා ඇත්තටම හිතනව ද මෙයාලව විනාශ කරලා දාන එක තමයි හොඳම වැඩේ කියලා?"

"මම තීන්දු දෙන්නෙ නැහැ," ඇතීනා කිවුවා. "මම අවදානම පෙන්නලා දුන්නා විතරයි. අපි කරන්නේ මොනවද කියලා සභාව තීරණය කරන්න ඕනෑ."

"එයාලට දඬුවම් කරන්න මම ඉඩ තියන්නෑ," ආර්ටෙමිස් කිවුවා. "මට ඕනෑ එයාලට තෑගි දෙන්න. අපිට උදවු කරන හැම වීරයාවම අපි විනාශ කරනවා නම්, අපි ටයිටන්ලට වඩා හොඳ වෙන්නෙ කොහොමද? ඔලිම්පියානු යුක්තිය මේක නම්, මට ඒක නැතුවට කමක් නැහැ."

"සන්සුන් වෙන්න, සහෝ," ඇපලෝ කිවුවා. "දෙයියනේ, ඔයා ටිකක් සැහැල්ලු වෙන්න ඕනෑ."

"මට සහෝ කියන්න එපා කිවුවා නේ! මම එයාලට තෑගි දෙන්නම්."

"හොඳයි," සියුස් ගෙරෙව්වා. "සමහරවිට. ඒත් අඩු තරමේ, රාක්ෂයාව නම් විනාශ කරන්න ඕනෑ. ඒකට හැමෝගෙම කැමැත්ත ලැබෙනව ද?"

ඔළු ගොඩක් ඉහළට-පහළට වැනුණා.

එයාලා කියමින් සිටි දේ තේරුම් ගන්න මට තත්පරයක් ගියා. ඊට පස්සේ මගේ හදවත ඊයම් බරුවකට හැරුණා. "බෙසී? ඔයාලට ඕනෑ බෙසීව විනාශ කරන්න ද?"

"උම්බෑ...!" බෙසී විරෝධය පෑවා.

Scanned with CamScanner

මගේ තාත්තා රවා බැලුවා. "ඔයා ඔෆියොටෝරස්ට බෙසී කියලා නමකුත් දැම්ම ද?"

"තාත්තේ," මම කතා කළා, "එයා මුහුදෙ ඉන්න සතෙක් විතරයි. හරිම ෂෝක් සතෙක්. ඔයාට එයාව විනාශ කරන්න බැහැ."

පොසෙයිඩන් අපහසුවෙන් එහෙ මෙහෙ වුණා. "පර්සි, මේ රාක්ෂයාගේ බලය ගොඩාක් ලොකුයි. බැරි වෙලාවත් ටයිටන්ලා ඌව හොරකම් කළොත් එහෙම-"

"ඔයාට බැහැ," මම තදින් කියා සිටිමින් සියුස් දිහා බැලුවා. මම එයාට බය විය යුතු වුණත්, ඒ වෙනුවට මම එයාගේ ඇස් දිහා එක එල්ලයේ බැලුවා. "අනාවැකි පාලනේ කරන එක කවදාවත් හරියන්නෑ. එහෙම නේද? ඇරත්, බෙස්- ඔෆියොටෝරස් අහිංසකයි. ඒ වගේ එකෙක්ව මරණ එක වැරදියි. ඒකත් හරියට... හරියට තමන්ගේ ළමයි ඉස්සරහට කරන්න ඉඩ තිබුණු දේකට බයේ ක්‍රෝනොස් එයාගේ ළමයින්ව ගිල්ලා වගේම වැරදි වැඩක්. ඒක නරකයි!"

සියුස් ඒ ගැන කල්පනා කර බලන බව පෙනුණා. එයාගේ ඇස් එයාගේ දුව, තාලියා වෙතට ඇදුණා. "එතකොට අවදානමට මොකද කරන්නේ? ඔය දෙන්නගෙන් කෙනෙක් සතාගේ බඩවැල් බිලි දුන්නොත්, අපිව විනාශ කරන්න බලය ඔයාලට ලැබෙනවා කියලා ක්‍රෝනොස් හොඳටම දන්නවා. ඒ අවදානම තියෙන්න අරින්න අපිට පුළුවන් කියලා ඔයා හිතනව ද? ඔයාට, මගෙ දුවේ, අනාවැකියේ කියවෙන විදිහටම හෙට අවුරුදු දාසය ලබනවා."

"ඔයාට එයාලව විශ්වාස කරන්න වෙනවා," ඇනබෙත් කතා කළා. "සර්, ඔයාට එයාලව විශ්වාස කරන්න වෙනවා."

සියුස් රවා බැලුවා. "වීරයෙක්ව විශ්වාස කරන්න?"

"ඇනබෙත් හරි," ආර්ටෙමිස් කිවුවා. "අන්න ඒ නිසයි මම මුලින්ම මගේ තෑග්ග ප්‍රදානය කරන්න ඕනෑ. මගේ විශ්වාසවන්ත සහායිකාව, ෂෝයි නයිට්ෂේඩ් තරු අතරට එකතු වුණා. මම අලුත් ලෙෆ්ටිනන්ට් කෙනෙක් පත් කරගන්න ඕනෑ. ඒ වගේම මම කෙනෙක්ව තෝරාගන්න අදහස් කරගෙන ඉන්නවා. ඒත් මුලින්ම, සියුස් තාත්තේ, මට පුද්ගලිකව ඔයත් එක්ක කතා කරන්න ඕනෑ."

සියුස් ආර්ටෙමිස්ව ඉඟියෙන් ඉදිරියට කැඳෙව්වා. ආර්ටෙමිස් එයාගේ කනට කොඳුරද්දී සියුස් පහළට නැමී අසා සිටියා.



බයෙන් පිරුණු හැඟීමකින් මගේ ඇඟම හිරිවැටුණා. "ඇනබෙත්," මම කට යටින් කෙඳිරුවා. "එපා."

එයා මගේ දිහාවට රවා බැලුවා. "මොකක්ද?"

"බලන්න, මට ඔයාට දෙයක් කියන්න ඕනෑ," මම කියාගෙන යද්දි වචනත් පැටළුණා. "මට දරාගන්න බැරි වෙයි... මම කැමති නැහැ ඔයා-"

"පර්සි?" එයා කතා කළා. "ඔයා ඉන්නේ අසනීප වෙන්න වගෙයි නේ."

ඇත්තටම මට දැනෙමින් තිබුණෙත් එහෙමයි. මට තවත් කියන්න දේවල් තිබුණත් මගේ දිව මට ද්‍රෝහී වුණා. මගේ බඩ තුළ කැලතෙමින් තිබුණු බයට දිව හෙලවුනේවත් නැහැ. ඒත් එක්කම ආර්ටෙමිස් ආපසු හැරුණා.

"මම අලුත් ලෙෆ්ටිනන්ට්ව පත් කරගන්න කැමතියි," එයා නිවේදනය කළා. "එයා ඒක බාරගන්නවා නම්."

"එපා," මම මිමිණුවා.

"තාලියා," ආර්ටෙමිස් කිවුවා. "සියුස්ගේ දියණිය, ඔබ දඩයමට එකතු වෙනවා ද?"

පුදුමයෙන් පිරුණු නිහැඬියාවක් ශාලාව පුරා පැතිරුණා. ඇසුණු දේ අදහාගන්න බැරුව මම තාලියා දෙස බලා සිටියා. හිනාවුණු ඇනබෙත් තාලියාගේ අත මිරිකා අත්හැරියේ හරියට මේ මුළු කාලය පුරාවටම එයා ඒක බලාපොරොත්තුවෙන් සිටියා වගෙයි.

"මම කැමතියි," තාලියා ස්ථිර හඬින් කිවුවා.

නැගී සිටි සියුස්ගේ ඇස් සිතුවිලිවලින් පිරී තිබුණා. "මගෙ දුවේ, හොඳට හිතලා බලන්න-"

"තාත්තේ," එයා කිවුවා. "මට හෙටට අවුරුදු දාසය ලබන්නෙ නැහැ. මට කවදාවත් අවුරුදු දාසය ලබන්නේ නැහැ. මේ අනාවැකිය මගේ වෙන්න මම ඉඩ තියන්නෑ. මම, මගේ සහෝදරී ආර්ටෙමිස්ට එකතු වෙනවා. ආයේ කවදාවත් මාව වරදට පොළඹවන්න ක්‍රෝනොස්ට බැහැ."

දෙවඟන ඉදිරියේ දණ ගසාගත් එයා මීට ගොඩාක් කාලෙකට කලින් සිදු වූ දෙයක් වගේ දැනුණු බියන්කාගේ දිවුරුමෙන් මට මතක

Scanned with CamScanner

තිබුණු වචන කියන්න ගත්තා, "මම, මාව ආර්ටෙමිස් දෙවඟනට කැප කරනවා. මම පිරිමි ඇසුරට පිටුපා..."

★★★

ඊට පස්සේ, එයාගේ ප්‍රතිඥාව තරමටම මාව පුදුම කළ තවත් දෙයක් තාලියා කළා. මගේ ළඟට ආව එයා හිනාවෙලා, මුළු සභාවම ඉදිරියේ මාව වැලඳ ගත්තා.

මම රතු වුණා.

එයා ආපස්සට වෙලා මගේ උරහිස්වලින් අල්ල ගත්තාම මම කතා කළා, "මේ... මීට පස්සේ ඔයාට ඒ වගේ දේවල් කරන්න එපා කියලා නේද තියෙන්නේ? මං කිවුවේ, පිරිමි ළමයින්ව බදාගන්න එක?"

"මම යාළුවෙක්ට උපහාරයක් කළේ," එයා නිවැරදි කළා. "මම දඩයක්කාරියන්ට එකතු වෙන්නම ඕනෑ, පර්සි. මට... මට අර්ධ-ලෝහිත කන්දෙන් පස්සේ සමාදානෙන් ඉන්න ලැබිලම නැහැ. අන්තිමේ දී දූන් මට ගෙදරක් තියෙනවා කියලා දැනෙනවා. ඒත් ඔයා වීරයෙක්. අනාවැකියේ කියවෙන කෙනා ඔයා වෙයි."

"නියමයි," මම කෙඳිරුවා.

"ඔයාගේ යාළුවෙක් වෙන්න ලැබුණට මට ආඩම්බරයි."

එයා නාඩා ඉන්න තදින්ම උත්සාහ කරන ඇනබෙත්ව වැලඳ ගත්තා. ඊට පස්සේ දූන් කලන්තෙ දාලා වැටෙන්න වගේ හිටපු ග්‍රෝවර්වත් වැලඳ ගත් තාලියා ආර්ටෙමිස් ළඟින් සිටගත්තා.

"දූන් ඔෆියොටෝරස් ගැන," ආර්ටෙමිස් කිවුවා.

"මේ කොල්ලා තවමත් අනතුරුදායකයි," ඩයනයිසියස් අනතුරු ඇඟෙව්වා. "අර සතා මහා බලයකට පොළඹවනවා. අපි මේ කොල්ලට යන්න ඇරියත්-"

"එපා," මම වටේට සිටි සෑම දෙවි කෙනෙක් දිහාම බැලුවා. "කරුණාකරලා. ඔෆියොටෝරස්ව ආරක්ෂා කරන්න. මගේ තාත්තට පුළුවන් එයාව මුහුදු පතුලේ කොහේහරි හංගන්න, එහෙම නැත්නම් මෙහෙ ඔලිම්පස්වල මාළු ටැංකියක් හදලා එයාව දාන්න. ඒත් කොහොම හරි ඔයාලා එයාව ආරක්ෂා කරන්න ඕනෑ."

"ඒත් අපි මොකටද ඔයාව විශ්වාස කරන්නේ?" හෙෆාස්ටස් ගර්ජනා කළා.



"මට තවම දාහතරයි," මම කිවුවා. "මේ අනාවැකියේ කියවෙන්නේ මං ගැන නම්, ඒකට තව අවුරුදු දෙකක් තියෙනවා."

"ඔයාව රවට්ටගන්න ක්‍රෝනොස්ට තව අවුරුදු දෙකක් ලැබෙනවා," ඇතීනා කිවුවා. "අවුරුදු දෙකකදී ගොඩක් දේවල් වෙනස් වෙන්න පුළුවන්, මගේ තරුණ වීරයෝ."

"අම්මේ!" ඇනබෙත් කෑගැසුවේ කේන්තියෙන්.

"ඒක තමයි ඇත්ත, දරුවෝ. මේ සතාව පණ පිටින් තියාගන්න එක නරක උපායක්. කොල්ලවත් එහෙමයි."

මගේ තාත්තා නැගී සිටියා. "මට උදවු කරන්න පුළුවන්කමක් තියෙනවා නම්, මම මුහුදේ සතෙක්ව විනාශ කරන්න ඉඩ දෙන්නෑ. ඒ වගේම, ඇත්තටම මට ඌට උදවු කරන්න පුළුවන්."

එයා අතක් ඉදිරියට දිගු කරද්දී ත්‍රිශූලයක් මතු වුණාඃ තිල් පාට වතුර වගේ එළියකින් දිලිසෙන හෙලි තුඩු තුනක් ඇති අඩි විස්සක් දිග ලෝකඩ යෂ්ටියක්. "කොල්ලා ගැනත්, ඔෆියොටෝරස්ගේ ආරක්ෂාව ගැනත් මම සහතික වෙනවා."

"ඔයාට ඌව මුහුද යටට අරන් යන්න බැහැ!" හදිසියේම සියුස් නැගී සිටියා. "ඒ තරම් දෙයක් ඔයා සන්තකේ තියාගන්න මම ඉඩ දෙන්නෑ."

"සහෝදරයා, කරුණාකරලා," පොසෙයිඩන් සුසුමක් පිට කළා.

සියුස්ගේ ප්‍රධාන අකුණ එයාගේ අතේ මතු වුණා. ඒ විදුලි කඳ මුළු ශාලාවම ඕසෝන් වායුවේ ගඳින් පිරවූවා.

"හරි," පොසෙයිඩන් කිවුවා. "මම සතාට මෙහෙ මින්මැදුරක් හදලා දෙන්නම්. හෙෆාස්ටස් මට උදවු කරයි. අපි, අපේ සම්පූර්ණ බලයෙන් ඌව ආරක්ෂා කරමු. කොල්ලා අපිට ද්‍රෝහි වෙන්නෙ නැහැ. මම, මගේ නම්බුව ඇපේට තියලා ඒක සහතික කරනවා."

සියුස් මේ ගැන කල්පනා කර බැලුවා. "හැමෝම ඒකට එකඟයි ද?"

මාව පුදුම කරමින් ගොඩක් අයගේ අත් ඉහළට එසවුණා. ඩයනයිසියස් කැමැත්ත දීමෙන් වැළකී සිටියා. ඒ වගේම ඒරීස්ගේ සහ ඇතීනාගෙත් අත් එසවුනේ නැහැ. ඒ ඇරෙන්න අනෙක් හැමදෙනාම...

"අපිට බහුතරය තියෙනවා," සියුස් නිවේදනය කළා. ''එහෙනම් ඉතින්, අපි මේ වීරයෝ විනාශ කරන්නෙත් නැති එකේ... මට හිතෙන්නෙ අපි එයාලට ගෞරව කළොත් හොඳයි. අපි විජයග්‍රහණයේ සතුට සමරමු!"

★★★

ඔයාට කවදා හරි සාමාන්‍ය උත්සවයකින්, සුපිරි වර්ගයේ උත්සවයකින් සහ ඔලිම්පියානු උත්සවයකින් එකක් තෝරාගන්න සිදු වුණොත්, මං කියන්නේ, වරද්දන්නෙ නැතිව ඔලිම්පියානු එකට යන්න.

කලා දෙව්දූවරු නමදෙනා තාල තියන්න ගත්තා, ටික වේලාවකින් මට තේරුම් ගියේ එක එක්කෙනා කැමති සංගීත නාද එයින් වෙන වෙනම ඇසෙන බවයි: දෙවිවරු ශාස්ත්‍රීය සංගීතයට කන් දෙද්දී, තරුණ උප දෙවිවරු හිප්-හොප් සංගීතයට හෝ එයාලා කැමති වෙනත් ඕනෑම සංගීතයකට සවන් දුන්නා. ඒත් මේ සියල්ලම වාදනය වුණේ එකම හඬ පටියකයි. ඒ නිසා කිසිම වාද කිරීමක්වත්, රේඩියෝ නාලිකාව මාරු කරන්න රණ්ඩු කිරීමක්වත් සිදු වුණේ නැහැ.

බීම වර්ග පිරවූ මේස තැන තැන මවමින් ඩයනයිසියස් වටේ යද්දී, එයත් එක්ක අත්වැල් බැඳගෙන ලස්සන ගැහැනු කෙනෙකුත් යනවා දකින්න ලැබුණා- ඒ එයාගේ බිරිඳ, අරියඩ්නේ. ඩයනයිසියස් සතුටින් ඉන්නවා මට පළවෙනි වතාවට දකින්න ලැබුණා. නෙක්ටාර් සහ ඇම්බ්‍රෝසියා උල්පත්වලින් පිටාර ගැලුවා. බන්දේසි පිරවූ මිනිස් කෑම වර්ග මේස මත ගොඩ ගසා තිබුණා. ටින් කෑන් සහ එන්චිලඩා පිරවූ පිඟානක් එක අතකින් ගත් ග්‍රෝවර් අනෙක් අතට ඩබල්-එස්ප්‍රෙසෝ කෝපි පිරවූ කුසලානයක් අරගෙන, මන්තරයක් මතුරනවා වගේ නොනවත්වාම ඒකට කොඳුරමින් සිටියා: "පෑන්! පෑන්!"

දෙවිවරු එකිනෙකා ඇවිත් මට සුබ පැතුවා. හොඳ වේලාවට, දැන් එයාලා මිනිස් ප්‍රමාණයට පුංචි වී සිටි නිසා සාදයේ විනෝද වෙමින් සිටි අයට අහම්බෙන් පෑගිලා මැරෙන්න සිද්ධ වුණේ නැහැ. හර්මීස් මාත් එක්ක වල්පල් දොඩවන්න ගත්තා. එයා කොයි තරම් සතුටින් සිටියා ද කියනවා නම්, එයා අඩුවෙන්ම කැමති පුතා, ලූක්ට සිදු වූ දේ කොහොම කියන්න ද මට හිතා ගන්න බැරි වුණා. ඒත් මම ඒක කියන්න හිතට දිරි ගන්න කලින්, හර්මීස්ගේ කැඩූසියස් එකට ඇමතුමක් ඇවිත් එයා එතැනින් යන්න ගියා.



මට ඕනෑම වෙලාවක සූර්ය යානය පදවන්න පුළුවන් කියලා ඇපලෝ කිවුවා, ඒ වගේම මට කවදාහරි දුනු ශිල්පය ඉගෙන ගන්න උවමනා වුණොත්-

"ස්තුතියි," මම එයාට කිවුවා. "ඒත් ඇත්තටම, දුනු හරඹවලට නම් මම කොහෙත්ම දක්ෂ නැහැ."

"අහ්, විකාර," එයා කිවුවා. "ඇමරිකාවට උඩින් යානයේ පියාඹන ගමන් ඉලක්කවලට විදින එක තියෙනවා නේද? ඊට වඩා ජොලි වැඩක් නැහැ!"

මාලිගා අංගනයේ නටමින් සිටි සෙනඟ අතරින් රිංගමින් මම ඉදිරියට ඇදුණා. මම සොයමින් සිටියේ ඇනබෙත්වයි. මම අන්තිම වතාවට දකිද්දී එයා හිටියේ කවුදෝ පොඩි දෙවියෙක් එක්ක නටමිනුයි.

ඒ වේලාවේ මට පිටුපසින් පිරිමි කෙනෙක් කතා කළා, "ඔයා මට ලැජ්ජා කරන්නෙ නැති වෙයි, මං හිතන්නේ."

ආපසු හැරුණු මට දකින්න ලැබුණේ හිනාවෙමින් ඉන්නා පොසෙයිඩන්වයි.

"තාත්තේ... හේයි."

"හෙලෝ, පර්සි. ඔයා හොඳට වැඩේ කළා."

එයාගේ ප්‍රශංසාව මාව අපහසුවට පත් කළා. මං අදහස් කළේ, මට සතුටක් දැනුණා තමයි, ඒත් මං වෙනුවෙන් ඇප වෙලා එයා කොයි තරම් අවදානමක් ගත්ත ද කියලා මම දැන සිටියා. අනෙක් අයට මාව කුඩු කරලා දාන්න දීලා බලන් හිටියා නම් එයාට මීට වඩා ගොඩාක් ලේසි වෙන්න තිබුණා.

"මම ඔයාට ලැජ්ජා කරන්නෙ නැහැ," මම පොරොන්දු වුණා.

එයා ඔළුව වැනුවා. දෙවිවරුන්ගේ මුහුණුවලින් පළ වෙන හැඟීම් කියවන්න මට ටිකක් අමාරු වුණත්, එයාගේ හිතේ දෙගිඩියාවක් තිබුණ ද හිතලා මම පුදුම වුණා.

"ඔයාගේ යාළුවා ලූක්-"

"එයා මගේ යාළුවෙක් නෙවෙයි," මම එක පාරටම කිවුවා. එයාගේ කතාවට බාධා කිරීම නොහොබිනාකමක් කියලා මට තේරුම් ගියේ ඊට පස්සෙයි. "සමා වෙන්න."

Scanned with CamScanner

"ඔයාගේ ඉස්සර යාළුවා ලූක්," පොසෙයිඩන් නිවැරදි කළා. "එයත් එක සැරයක් ඔය වගේ දේවල් පොරොන්දු වුණා. එයා තමයි හර්මීස්ගේ ආඩම්බරය, සතුට වුණේ. අන්න ඒක හිතේ තියාගන්න, පර්සි. නිර්භීතම කෙනෙක් වුණත් වැටෙන්න ඉඩ තියෙනවා."

"ලූක් නම් වැටුණේ සෑහෙන ලොකු පල්ලමකින්," මම එකඟ වුණා. "එයා මැරුණා."

පොසෙයිඩන් ඔළුව හෙල්ලුවා. "නෑ, පර්සි. එයා මැරිලා නැහැ."

මම එයා දිහා පුදුමයෙන් බලා සිටියා. "මොකක්?"

"මං හිතන්නේ ඇනබෙත් ඔයාට මේ ගැන කියන්න ඇති. ලූක් තවමත් පණ පිටින්. මට ඒක දකින්න ලැබුණා. දැනටමත් එයාගේ බෝට්ටුව ක්‍රෝනොස්ගේ කෑලි ටිකත් අරගෙන සැන් ෆ්‍රැන්සිස්කෝවලින් ඈතට යනවා. ආයෙමත් ඔයාට පහර දෙන්න කලින් එයා පහු බැහැලා, ආපහු කණ්ඩායම් එකතු කරගනියි. එයාගේ බෝට්ටුව කුණාටුවලින් විනාශ කරන්න මම පුළුවන් උපරිමෙන් උත්සාහ කරන්නම්, ඒත් එයා මගේ හතුරෝ, පරණ සමුද්‍ර බලවේග එක්ක ගිවිසුම් ගහනවා. එයාලා ලූක්ව ආරක්ෂා කරන්න සටන් කරයි."

"එයා කොහොමද පණ පිටින් ඉන්නේ?" මම ඇසුවා. "අර වැටිල්ලෙන් එයා මැරෙන්න ඕනෑ!"

පොසෙයිඩන් හිටියේ කරදරෙන් වගෙයි. "මං දන්නෙ නැහැ, පර්සි. ඒත් එයාගෙන් පරිස්සම් වෙන්න. දැන් එයා ඉස්සරටත් වඩා භයානකයි. ඒ වගේම රත්තරන් මිනී පෙට්ටිය තවමත් එයා ළඟ, ඒකේ ශක්තිය වැඩි වෙනවා."

"එතකොට ඇට්ලස්?" මම ඇසුවා. "එයා ආයෙමත් පැනලා යන එක නවත්තන්නෙ කොහොමද? අහසේ බර එයාගෙන් ගන්න කියලා එයා යෝධයෙක්ට හරි, වෙන මොකෙක්ට හරි බල කරන්න ඉඩ තියෙනවා නේ?"

මගේ තාත්තා සමච්චලේට හිනා වුණා. "ඒක එච්චර ලේසි නම් එයා පැනලා යන්නේ මීට සෑහෙන කාලෙකට කලින්. නෑ, මගෙ පුතේ. අහසේ ශාපය දරාගන්න සිද්ධ කරලා තියෙන්නේ ටයිටන් කෙනෙක්ට-ගයියාගෙයි යුරේනස්ගෙයි දරුවන්ගෙන් කෙනෙකුට විතරයි. වෙන කවුරු හරි ඒ බර ඔසවා ගන්නවා නම් එයා තමන්ගෙම කැමැත්තෙන්



ඉදිරිපත් වෙන්න ඕනෑ. ශක්තිමත්, අවංක හදවතක් තියෙන, ගොඩාක් නිර්භීත වීරයෙකුට විතරයි ඒ වගේ දෙයක් කරන්න පුළුවන්. ඒ බර දරාගන්න තරම් එඩිතර කෙනෙක් ක්‍රෝනොස්ගේ හමුදාවෙ නැහැ, අඩු තරමේ මරණ දඬුවමට යටත් වෙන්න වුණත්."

"ලූක් ඒක කළා," මම කිවුවා. "එයා ඇට්ලස්ට යන්න ඉඩ දුන්නා. ඊට පස්සේ එයා උප්පරවැට්ටියකින් ඇනබෙත්ව ඒකට අහු කරලා, ආර්ටෙමිස්ට අහස උස්සගන්න සලස්වන්න එයාව පාවිච්චි කළා."

"ඔව්," පොසෙයිඩන් කිවුවා. "ලූක් කියන්නේ... අමුතුම චරිතයක්."

මං හිතන්නේ එයා තවත් මොනවදෝ කියන්නයි ගියේ, ඒත් ඒ වේලාවෙම මිදුලේ එහා කොණේ බෙසී හඬ ගාන්න ගත්තා. උප දෙවිවරු කීපදෙනෙක් එයාගේ වතුර ගෝලය සෙල්ලමට අරගෙන, ඒක සෙනඟට ඉහළින් ඉදිරියටත් පසුපසටත් විසි කරමින් සිටියා.

"මං ගිහින් ඒ ගැන බැලුවොත් හොඳයි වගේ," පොසෙයිඩන් ගෙරෙව්වා. "ඔෆියොටෝරස්ව බීච් බෝලයක් වගේ වටේට විසි කරන්න ඉඩ දෙන්න බැහැ නේ. හොඳින් ඉන්න, මගේ පුතේ. අපිට ටික කාලෙකට කතා කරන්න ලැබෙන්නෙ නැති වෙයි."

එහෙම කියපු එයා යන්න ගියා.

මම සෙනඟ අතරේ සෙවිල්ල ආපසු කරගෙන යන්න හිතනකොටම තවත් කෙනෙක් කතා කළා. "ඔයාගේ තාත්තා අරගත්තේ ලොකු අවදානමක්, ඔයා දන්නවා නේ."

මම මුහුණට-මුහුණ බලාගෙන සිටි අළු පාට ඇස් ඇති, ඇනබෙත් වගේම ගැහැනු කෙනාට තව පොඩ්ඩෙන් මම ඇනබෙත් කියලා කතා කරනවා.

"ඇතීනා," මන්ත්‍රණ සභාවේ දී එයා මාව පැත්තකට දාපු විදිහෙන් පස්සේ, එයාට නුරුස්නා හඬින් කතා නොකර ඉන්න මම උත්සාහ කළා, ඒත් මං හිතන්නේ මට ඒක හොඳින් හංගන්න බැරි වෙන්න ඇති.

එයා වියළි හිනාවක් පෑවා. "ඔය තරම් රළු විදිහට මාව මනින්න එපා, අර්ධ-ලෝහිතයෝ. බුද්ධිමත් උපදෙස් හැම වෙලාවෙම ජනප්‍රිය නැහැ. ඒත් මම කතා කළේ ඇත්ත. ඔයා අනතුරුදායකයි."

"ඔයා කවදාවත් අවදානමක් ගන්නෙ නැද්ද?"

එයා ඔළුව වැනුවා. "මං ඒක පිළිගන්නවා. සමහරවිට ඔයා ප්‍රයෝජනවත් වෙන්න පුළුවන්. ඒ වුණත්... ඔයාගේ මාරක වැරැද්ද ඔයාව වගේම අපිවත් විනාශ කරන්න පුළුවන්."

මගේ හදවත උගුරට ඇදී ආවා. අවුරුද්දකට කලින්, ඇනබෙතුයි මමයි මාරක වැරදි ගැන කතා කර තිබුණා. හැම වීරයෙකුටම එකක් තියෙනවාලු. ඇනබෙත් කියපු විදිහට, එයාගේ එක තමයි උඩඟුකම. එයා හිතන් හිටියේ එයාට ඕනෑම දෙයක් කරන්න පුළුවන් කියලා... හරියට, අහස උස්සගෙන ඉන්න පුළුවන් කියලා වගේ. එහෙම නැත්නම්, ලූක්ව බේරගන්න පුළුවන් කියලා. ඒත් මගේ එක මොකක්ද කියලා මම තවමත් දැන සිටියේ නැහැ.

ඇතීනා සිටියේ මං ගැන කණගාටුවෙන් වගෙයි. "ඔයා නොදන්නවා වුණත්, ක්‍රෝනොස් නම් ඔයාගේ වැරැද්ද දන්නවා. තමන්ගේ හතුරාව අධ්‍යයනය කරන හැටි එයා දන්නවා. හිතන්න, පර්සි. එයා කොහොමද ඔයාව මෙහෙයවලා තිබුණේ? මුලින්ම, එයා ඔයාගේ අම්මාව ඔයාගෙන් අරගත්තා. ඊට පස්සේ ඔයාගේ හොඳම යාළුවා, ග්‍රෝවර්ව. දැන් මගේ දුව, ඇනබෙත්ව." එයා අප්‍රසාදය පළ කරමින් නැවතුණා. "මේ හැම වතාවකදී ම ක්‍රෝනොස්ගේ උගුල්වලට ඔයාව අහු කරගන්න ඇමට පාවිච්චි කරලා තිබුණේ ඔයා ආදරේ කරන අයව. ඔයාගේ මාරක වැරැද්ද තමයි පුද්ගල පක්ෂපාතීකම, පර්සි. දෙයකට යන්න අරින්න ඕනෑ කොයි වෙලාවට ද කියලා ඔයා දන්නෙ නැහැ. යාළුවෙක්ව බේරගන්න ඔයා ලෝකයම කැප කරාවි, අනාවැකියේ කියවෙන වීරයාට ඒක ගොඩක්ම ගොඩාක් අනතුරුදායකයි."

මම අත් මිටි කරගත්තා. "ඒක වැරැද්දක් නෙවෙයි. මට, මගේ යාළුවන්ට උදවු කරන්න ඕනෑ වුණ පළියට-"

"පිටින් බලද්දී හොඳයි වගේ පෙනෙන ඒවා තමයි ගොඩක්ම භයානක වැරදි," එයා කිවුවා. "නපුර එක්ක සටන් කරන්න ලේසියි. නුවණ මදිකම... ඒක නම් ඇත්තටම අමාරුයි."

ඊට විරුද්ධව වාද කරන්න ඕනෑ වුණත් මට එහෙම කරන්න බැරි බව තේරුණා. ඇතීනා හිතාගන්නත් බැරි තරම් බුද්ධිමත්.

"සභාවේ තීරණය බුද්ධිමත් එකක් බව ඔප්පු වෙයි කියලා මම බලාපොරොත්තු වෙනවා," ඇතීනා කිවුවා. "හැබැයි මම සෝදිසියෙන් ඉන්නේ, පර්සි ජැක්සන්. මගේ දුවත් එක්ක තියෙන ඔයාගේ යාළුකම



මම අනුමත කරන්නෙ නැහැ. ඒක ඔය දෙන්නටම හොඳයි කියලා මං හිතන්නෙ නැහැ. ඒ වගේම, ඔයාගේ පක්ෂපාතිකම දෙපැත්තට වැනෙන්න ගත්තොත් එහෙම..."

එයා මට හෙළූ සීතල අළු පාට බැල්ම දකිද්දි, ඇතිනාට කොයි තරම් දරුණු එදිරිවාදියෙක් වෙන්න පුළුවන් ද කියලා මට තේරුම් ගියා. එයාට ඒරීස්ට, ඩයනයිසියස්ට, එහෙමත් නැත්නම් මගේ තාත්තටත් වඩා දහ ගුණයක් නරක ප්‍රතිවාදියෙක් වෙන්න හැකියාව තිබුණා. එයා ඔයාට වෛර කරන පළියට එයා කවදාවත් කලබලේට මෝඩ වැඩක් කරන්නේ නැති වෙයි, ඒ වගේම එයා ඔයාව විනාශ කරන්න සැලසුමක් හැදුවොත්, ඒක කවදාවත් වරදින්නේ නැති වෙයි.

"පර්සි!" සෙනඟ අතරින් දුව එමින් ඇනබෙත් කතා කළා. මම කතා කරමින් සිටි කෙනාව දැක්කම එයා හිටිවනම නතර වුණා. "ඔහ්... අම්මේ."

"මම ඔයාට යන්න දෙන්නම්," ඇතීනා කිවුවා. "දැනට."

ආපසු හැරුණ එයා දුර අඩි තබමින් යද්දී සෙනඟ දෙපසට වී එයාට ඉඩ දුන්නේ හරියට එයා ඒගීස්ව අරන් යනවා වගෙයි.

★★★

"එයා ඔයාට බැන්න ද?" ඇනබෙත් ඇසුවා.

"නෑ," මම කිවුවා. "ඒක... අවුලක් නැහැ."

එයා ඕනෑකමින් මගේ දිහා බලාගෙන සිටියා. එයා, එයාගේ කොණ්ඩයේ වූ වයිරමට හරියටම ගැළපෙන මගේ කෙස් අතරේ තිබුණු අලුත් අළු පාට වයිරම අත ගා බැලුවා- ඇට්ලස්ගේ බරට කර ගහලා අපි දෙන්නට ලැබුණු වේදනාබර සිහිවටනය. ඇනබෙත්ට කියන්න ගොඩක් දේවල් මගෙ හිතේ තිබුණා, ඒත් ඇතීනා මගේ ආත්ම විශ්වාසය මගෙන් අරන් ගිහින්. මට දැනුණේ මගේ බඩට පහරක් ගැහුවා වගෙයි.

*'මගේ දුවත් එක්ක තියෙන ඔයාගේ යාළුකම මම අනුමත කරන්නෙ නැහැ.'*

"ඉතින්," ඇනබෙත් කිවුවා. "ඉස්සර වෙලා ඔයා මට කියන්න හැදුවේ මොකක්ද?"

Scanned with CamScanner

සංගීතය තවමත් වාදනය වෙමින් තිබුණා. මිනිස්සු පාරවල්වල නටමින් සිටියා. "මම, අහ්, හිතහිතා හිටියේ වෙස්ටෝවර්වල දී අපිට බාධා වුණා නේ. ඒ නිසා... මං ඔයාට නැටුමක් ණයයි."

එයා හෙමින් සීරුවේ හිනාවුණා. "හරි එහෙනම්, පාසි මොළේ."

ඉතින් මම එයාගේ අත ගත්තා. ඒ වෙලාවේ අනෙක් අයට ඇහෙමින් තිබුණේ මොකක්ද කියලා මම දන්නෙ නැහැ. ඒත් මට නම් ඇහුණේ මන්දගාමී නැටුමකට ගැළපෙන තාලයක් වගෙයිඃ ටිකක් දුක්බර වුණත් සමහරවිට පොඩි බලාපොරොත්තුවකුත් ඇති එකක්.

# 20
# නත්තලට මට අලුත් තරහාකාරයෙක් ලැබුණා

ඔලිම්පස්වලින් යන්න කලින් ඇමතුම් කීපයක් ගන්න මම තීරණය කළා. ඒක පහසු දෙයක් නොවුණත්, අන්තිමේ දී සද්ද බද්ද නැති උයන් කෙළවරක වූ වතුර මලක් හොයාගත් මම මුහුද යට සිටි මගේ සහෝදරයා, ටයිසන්ට අයිරිස්-පණිවුඩයක් යැව්වා. අපේ වීර චාරිකාව ගැනත්, බෙසී ගැනත් මම එයාට කිවුවා- එයාට හුරතල් සර්ප-හරක් පැටියා ගැන හැම වචනයක් ම අහන්න ඕනෑ වුණා- ඒ වගේම ඇනබෙත් පරිස්සමෙන් ඉන්නවා කියලත් මම එයාට කිවුවා. පහුගිය ගිම්හානයේ දී එයා මට හදලා දුන්න පලිහ මැන්ටිකෝරයාගේ ප්‍රහාරයෙන් පලුදු වුණ බව එයාට කියන්න අන්තිමේ දී මට පුළුවන් වුණා.

"යේ!" ටයිසන් කිවුවා. "ඒ කියන්නේ ඒක හොඳයි! ඒක ඔයාගේ ජීවිතේ බේරුවා!"

"ඇත්තටම ඒක එහෙම කළා, ලොකු යාළුවා," මම කිවුවා. "ඒත් දැන් ඒකෙ ගන්න දෙයක් නැහැ."

"එහෙම නෑ!" ටයිසන් පොරොන්දු වුණා. "මම ඊළඟ ගිම්හානේ ඇවිල්ලා ඒක හදලා දෙන්නම්."

Scanned with CamScanner

ඒ අදහස ඉක්මනින්ම මගේ හිත් ගත්තා. මං හිතන්නේ ටයිසන් ළඟ පාතක නැතුව මට කොයි තරම් පාළුයි ද කියලා මම හරි හැටි තේරුම් ගෙන තිබිලා නැහැ.

"ඇත්තටම?" මම ඇසුවා. "එයාලා ඔයාට නිවාඩු ගන්න දෙයි ද?"

"ඔව්! මම මැජික් කඩු දෙදාස් හත්සිය හතළිස් එකක් හදලා තියෙන්නේ," අලුත්ම කඩු තලය මට පෙන්වමින් ටයිසන් කිවුවේ ආඩම්බරයෙන්. "ලොක්කා කිවුවා 'හොඳ වැඩක්!' කියලා. එයා මට මුළු ගිම්හානෙම නිවාඩු ගන්න දෙයි. මම කඳවුරට එනවෝ!"

පරණ මුහුදු බලවේග සමග අපේ තාත්තා යුද වදින්න සූදානම් වෙන හැටි ගැනත්, ඊළඟ ගිම්හාන නිවාඩුවේ දී අපිට කරන්න පුළුවන් ජොලි වැඩ ගැනත් අපි ගොඩක් වේලා කතා කළා. ඒත් ටිකකින් ටයිසන්ගේ ලොක්කා එයාට කෑගහන්න පටන් ගත් නිසා එයාට ආපහු වැඩ කරන්න යන්න වුණා.

මගේ ළඟ තිබුණු අන්තිම රන් ඩ්‍රච්මාව පිටට ගත් මම තව එක අයිරිස්-පණිවුඩයක් යැවුවා.

"සැලී ජැක්සන්," මම කිවුවා. "නැගෙනහිර ඉහළ කොටස, මැන්හැටන්."

සැලුණු මීදුම අතරින් මතු වුණේ අපේ මුළුතැන්ගෙයි මේසයේ වාඩි වී සිටි මගේ අම්මගේ රූපයයි. එයා, එයාගේ යාළුවා මිස්ටර් බ්ලෝෆිෂ්ගේ අත අල්ලගෙන හිනාවෙමින් සිටියා.

මම කොයි තරම් අපහසුතාවයකට පත් වුණා ද කියනවා නම්, මම සූදානම් වුණේ මීදුම අතරින් අත වනා සම්බන්ධතාවය විසන්ධි කර දමන්නයි. ඒත් මට ඒකට ඉඩක් ලැබෙන්න කලින් මගේ අම්මා මාව දැක්කා.

එයාගේ ඇස් ලොකු වුණා. එයා එසැණින්ම මිස්ටර් බ්ලෝෆිෂ්ගේ අත අත්හැරියා. "ඔහ්, පෝල්! දන්නව ද? මම ලියන පොත සාලේ දාලා ආවා. ඔයාට පුළුවන් ද ඒක ගෙනැත් දෙන්න?"

"හරි, සැලී. ප්‍රශ්නයක් නැහැ."

එයා කාමරයෙන් පිට වුණා, ඒත් එක්කම මගේ අම්මා අයිරිස්-පණිවුඩය දෙසට නැමුණා. "පර්සි! ඔයා හොඳින් ද?"



"මම, අහ්, හොඳින්. කොහොමද අර ලේඛන වැඩමුළුවේ වැඩ?"

එයා තොල් තද කරගත්තා. "ඒක හොඳින් වෙනවා. ඒත් ඒකෙන් වැඩක් නැහැ. මට කියන්න මොකද වුණේ කියලා!"

මම, මට පුළුවන් තරම් ඉක්මනින් එයාට විස්තරේ කිවුවා. ඇනබෙත් පරිස්සමෙන් ඉන්න බව දැන ගත්තාම එයා සැනසුම් සුසුමක් හෙළුවා.

"ඔයාට ඒක කරන්න පුළුවන් කියලා මං දැනගෙන හිටියා!" එයා කිවුවා. "මට ගොඩාක් ආඩම්බරයි."

"ඔව්, හොඳයි. ඔයාගේ ගෙදර වැඩ කරගන්න ඉඩ දීලා මම දැන් ගියොත් හොඳයි."

"පර්සි, මම... පෝලුයි මමයි-"

"අම්මේ, ඔයා සන්තෝසෙන් ද ඉන්නේ?"

ඒ ප්‍රශ්නයෙන් එයා පුදුම වුණා වගෙයි. එයා මොහොතක් කල්පනා කළා. "ඔව්. මම ගොඩක් සන්තෝසෙන් ඉන්නේ, පර්සි. එයත් එක්ක ඉන්නකොට මම ඉන්නේ සතුටින්."

"එහෙනම් කිසිම ප්‍රශ්නයක් නැහැ. ඇත්තටම. මං ගැන කරදර වෙන්න එපා."

අමුතුම දේ වුණේ, මම ඇත්තටම එය අදහස් කළ එකයි. මම ගිය ගවේෂණය ගැන සලකා බලද්දී, සමහරවිට මම, මගේ අම්මා ගැන දුක් විය යුතු වුණා. මිනිස්සු අනෙක් අයට කොයි තරම් පහත් විදිහට සලකනවා ද කියලා මට දකින්න ලැබී තිබුණා. හරියට හර්කියුලිස් ටෙසාර්යි නයිට්ෂේඩ්ට සැලකුවා වගේ, ලූක් තාලියාට කළ දේ වගේ. මට ආදරයේ දෙවඟන, ඇෆ්‍රොඩයිට්ව පෞද්ගලිකවම මුණ ගැසී තිබුණා. ඒ වගේම එයාගේ බලයන් මාව ඒරීස්ටත් වඩා බයට පත් කළා. ඒත් මගේ ජරා බාප්පා, ගේබ් අග්ලියානෝ නිසා අවුරුදු ගාණක් විඳවපු මගේ අම්මා දැන් හිනාවෙලා සතුටින් ඉන්නවා දැක්කාම එයා ගැන සතුටු නොවී ඉන්න මට බැරි වුණා.

"එයාට මිස්ටර් බ්ලෝෆිෂ් කියලා කතා නොකර ඉන්න ඔයා පොරොන්දු වෙනව ද?" එයා ඇසුවා.

මම උරහිස් ඇකිළුවා. "හොඳයි, එහෙනම්, එයාගේ මූණට ඒක නොකියා ඉන්නම්කෝ."

"සැලී?" අපේ සාලයේ සිට මිස්ටර් බ්ලෝෆිස් කතා කළා. "ඔයාට ඕනෑ කොළ පාට කවරේ තියෙන එක ද, රතු පාට එක ද?"

"මම දූන් ගියොත් හොඳයි," එයා මට කිවුවා. "නත්තලට ගෙදර එනවා නේද?"

"ඔයා මගේ ස්ටොකින් එක ඇතුළට නිල් පාට පැණි රස කෑම ජාති දානව ද?"

එයා හිනා වුණා. "ඔයා දූන් ඒවට ලොකු වැඩියි නේ."

"මම කවදාවත් කඩචෝරු කන්න බැරි තරම් ලොකු වෙන්නෙ නැහැ."

"හරි එහෙනම්. ඉක්මනට මුණ ගැහෙමු."

එයා මීදුම හරහා අත වැනුවා. එයාගේ රූපය නොපෙනී යද්දී, ගොඩක් දවසකට කලින් වෙස්ටෝවර් හෝල්වල දී තාලියා කියපු කතාව හරි කියලා මට හිතුණා: මගේ අම්මා නම් හරිම ෂෝයි.

★★★

ඔලිම්පස් කන්ද එක්ක බලද්දී මැන්හැටන් නිහඬ තැනක් වුණා. නත්තලට කලින් සිකුරාදා වුණත්, තවමත් එළිය වැටී වැඩි වේලාවක් නොගිය නිසා පස්වෙනි වීදියේ ඒ හැටි සෙනඟක් හිටියේ නැහැ. එම්පයර් ස්ටේට් ගොඩනැගිල්ල අසලින් ඇනබෙත්ව, ග්‍රෝවර්ව සහ මාව වාහනයට නංවා ගත් ආර්ගස්, ඇස්-ගොඩක් ඇති ආරක්ෂක නිලධාරියා, තුනී හිම කුණාටුව මැදින් අපිව ආපසු කඳවුරට රැගෙන ගියා. ලෝන්ග් අයිලන්ඩ් අධිවේගී පාර මුළුමනින්ම වගේ පාළුවට ගොස් තිබුණා. අපි අර්ධ-ලෝහිත කන්ද නැගලා, රන් බැටළු ලොම් සළුව දිලිසෙමින් තිබුණු පයින් ගහට කිට්ටු වෙද්දී අපි එනතුරු තාලියා එතැන බලා ඉඳීවි කියලා මගේ හිතේ බාගයක් බලාපොරොත්තු වුණා. ඒත් එයා හිටියේ නැහැ. එයා ආර්ටෙමිස් සහ අනෙක් දඩයක්කාරියෝ එක්ක ඊළඟ වික්‍රමාන්විතය සොයා පිට වී ගිහින්.

මහ ගෙදර දී කයිරොන් අපිව පිළිගත්තේ උණු චොකලට් සහ කර කළ චීස් සැන්ඩ්විච්වලින් සංග්‍රහ කරලයි. ග්‍රෝවර්ට අත්විඳින්න ලැබුණු පෑන්ගේ අමුතු මායාව ගැන සැටර් යාළුවන්ට කියන්න ග්‍රෝවර් දිව්වා. පැයක් ගතවෙන්නත් කලින් කුලප්පු වුණ සැටර්ලා ළඟම



තියෙන එස්ප්‍රෙසෝ කෝපි හල කොහෙද කියලා අහමින් හැම තැනම දුවන්න ගත්තා.

කයිරොන් සහ තවත් වැඩිමහල් කඳවුරුකරුවක් කිපදෙනෙක්- බෙකන්ඩොර්ෆ්, සිලේනා බියුරිගාර්ඩ් සහ ස්ටොල් සහෝදරයෝ එක්ක ඇනබෙතුයි මමයි වාඩි වුණා. රහසිගත මෙහෙයුමකට ගිහින් ආව ඒරීස් කැබිනයේ ක්ලැරිස් පවා එතැන සිටියා. එයා ගිය ගවේෂණය ගොඩාක් අමාරු එකක් වෙන්න ඇති කියලා මට හිතුණේ, එයා අඩු තරමේ මාව කුඩුපට්ටම් කරන්නවත් උත්සාහ නොකළ නිසයි. එයාගේ නිකටේ අලුත් තුවාල කැළැලක් දකින්න ලැබුණා. එයාගේ අපිරිසිදු තඹ කොණ්ඩය අපිළිවෙළට කොට කර තිබුණේ හරියට කවුරුහරි මොට්ට කතුරකින් ඒක කපලා වගෙයි.

"මගේ ළඟ ආරංචියක් තියෙනවා," එයා නොසන්සුන්ව මිමිණුවා. "නරක ආරංචියක්."

"මං ඔයාට ඒ ගැන පස්සෙ විස්තර කරන්නම්," කයිරොන් මවාගත් ප්‍රීතිමත් හඬකින් මට කිවුවා. "වැදගත්ම දේ තමයි ඔයාට වැඩේ කරන්න පුළුවන් වුණ එක. ඒ වගේම ඔයා ඇනබෙත්ව බේරගත්තා!"

ඇනබෙත් මට ස්තුතිවන්තව හිනා වෙද්දී මම අහක බලා ගත්තා.

මොකක්දෝ අසාමාන්‍ය හේතුවකට මම හූවර් වේල්ල ගැනත්, එතැන දී මට මුණ ගැසුණු අමුතු මනුස්ස කෙල්ල, රේචල් එලිසබෙත් ඩෙයාර් ගැනත් හිතමින් සිටියා. ඇයි කියලා හිතාගන්න බැරි වුණත්, එයා කියපු කට හැකර කතා මට දිගින් දිගටම සිහි වුණා. *'ඔයා හැම වෙලාවෙම නහය හුරන මිනිස්සුන්ව මරනව ද?'* මම තවමත් ජීවතුන් අතර සිටියේ මට ගොඩක් අය; ඒ අහම්බෙන් මුණ ගැහුණු මිනිස් ගැහැනු ළමයා පවා උදවු කළ නිසා විතරයි. අඩු තරමේ මම කවුද කියලවත් එයාට කියන්න මට ලැබුණේ නැහැ.

"ලූක් තවම පණ පිටින්," මම කිවුවා. "ඇනබෙත් කිවුවා හරි."

ඇනබෙත් කෙලින් වුණා. "ඔයා කොහොමද දන්නේ?"

එයාගේ උනන්දුව ගැන තරහා නොගෙන ඉන්න මම උත්සාහ කළා. ප්‍රින්සස් ඇන්ඩ්‍රොමීඩා ගැන මගේ තාත්තා කියා තිබුණු දේවල් මම එයාට කිවුවා.

Scanned with CamScanner

"හොඳයි." ඈතබෙත් වාඩි වී සිටි අසුනේ අපහසුවෙන් එහෙ මෙහෙ වුණා. "අන්තිම සටන සිද්ධ වෙන්නේ පර්සිට දාසයක් වුණාම නම්, අඩු තරමේ අපිට මොකක් හරි ක්‍රමයක් හොයාගන්න තව අවුරුදු දෙකක් තියෙනවා නේ."

එයා 'මොකක් හරි ක්‍රමයක්' කියලා අදහස් කළේ 'ලූක්ව හරි පාරට ගන්න ක්‍රමයක්' කියලා හැඟෙද්දි මගේ තරහව තවත් වැඩි වුණා.

කයිරොන්ගේ මුහුණ අඳුරු වුණා. ගිනි උඳුන ළඟ රෝද පුටුවේ වාඩි වී සිටි එයාව පෙනුණේ ගොඩක් වයසට ගිහින් වගෙයි. මං කිවුවේ... එයා ගොඩක් වයසයි තමයි, ඒත් සාමාන්‍යයෙන් එයාව වයසක කෙනෙක් වගේ පෙනුනේ නැහැ.

"අවුරුදු දෙකක් දිග කාලයක් වගේ පෙනෙන්න පුළුවන්," එයා කිවුවා. "ඒත් ඒක ඇහිපිල්ලම් ගහන පරක්කුවට ගෙවිලා යයි. අනාවැකියේ කියවෙන ළමයා ඔයා නෙවෙයි කියලා මම තවමත් බලාපොරොත්තු වෙනවා, පර්සි. ඒත් ඒ ඔයා නම්, දෙවෙනි ටයිටන් යුද්ධය අපේ කර මුලටම වගේ ඇවිල්ලා. ක්‍රෝනොස්ගේ මුල්ම ඉලක්කය මෙහෙ වෙයි."

"ඔයා කොහොමද දන්නේ?" මම ඇසුවා. "එයාට කඳවුරෙන් ඇති වැඩේ මොකක්ද?"

"මොකද දෙවිවරු, එයාලගේ ආයුධ විදිහට පාවිච්චි කරන්නේ වීරයින්ව නේ," කයිරොන් සරලව කිවුවා. "ආයුධ විනාශ කළාම, දෙවිවරු නිකංම දුර්වල වෙනවා. ලූක්ගේ හමුදාවල් මෙහෙට එයි. මිනිස්සු, උප දෙවිවරු, රාක්ෂයෝ... අපි ඒකට සූදානම් වෙන්න ඕනෑ. සමහරවිට ක්ලැරිස් ගෙනාව ආරංචියෙන් එයාලා අපිට පහර දෙන විදිහ ගැන හෝඩුවාවක් ලැබෙයි. ඒත්-"

කවුදෝ දොරට තට්ටු කළා, ඒත් එක්කම ඇතුළු සාලයට හති දමමින් ආවේ සීතලට කම්මුල් රතු කරගත් නිකෝ ඩී ආන්ජෙලෝයි.

හිනාවෙමින් සිටියත් එයා කලබලෙන් වටපිට බැලුවා. "හේයි! කෝ... කෝ මගේ අක්කා?"

එතැන සොහොන් පිටියක් වගේ නිහඬ වුණා. මම කයිරොන් දිහා පුදුමයෙන් බැලුවා. එයාට කවුරුවත් තවම ඒ ගැන දන්වලා නැහැ කියලා මට විශ්වාස කරන්නත් බැරි වුණා. ඒත් එක්කම ඊට හේතුව



මට තේරුම් ගියා. එයාලා බලා ඉන්න ඇත්තේ අපි ආපහු එන තුරුයි. ඇවිල්ලා අපිම එයාට කියන තුරුයි.

මට කරන්න උවමනා කළ අන්තිම දේ ඒකයි. ඒත් මම බියන්කා වෙනුවෙන් ඒ දේ කළ යුතු වුණා.

"හේයි, නිකෝ," මම, මගේ සුව පහසු පුටුවෙන් නැගිට්ටා. "අපි ටිකක් ඇවිදින්න යමු, හරි ද? අපි ටිකක් කතා කරන්න ඕනෑ."

***

එයා ඒ ආරංචිය නිහඬව බාරගත්තා, කොහොමහරි ඒ නිසා ඒක තවත් නරක අතට හැරුණා. මම නොනවත්වා කතා කරමින්, එය සිදු වූ විදිහ විස්තර කරන්නත්, ගවේෂණය බේරාගන්න බියන්කා ජීවිතය කැප කළ විදිහ ගැන විස්තර කරන්නත් උත්සාහ කළා. ඒත් මට දැනුණේ මම තත්ත්වය තවත් නරක අතට හරවනවා වගෙයි.

"එයා කිවුවා ඔයාට මේක දෙන්න කියලා," බියන්කා කහළ ගොඩෙන් හොයාගත් පුංචි දේව ප්‍රතිමාව මම එළියට ගත්තා. ඒක අත්ල උඩ තියාගත් නිකෝ ඒ දිහා බලා සිටියා.

අපි සිටගෙන සිටියේ භෝජන මණ්ඩපය ළඟයි. මම ගවේෂණයට පිටත් වෙන්න කලින් අපි දෙන්නා අන්තිමට කතා කළෙත් මෙතැනදීමයි. කඳවුරේ මායා බැම්වල ආරක්ෂාව තිබුණත්, හමා ආ සුළඟේ කටුක සීතලක් තිබුණා. කිරි ගරුඬ පඩි මතට යාන්තමින් හිම වැටුණා. කඳවුරු සීමාවෙන් පිට දරුණු හිම කුණාටුවක් හමා යනවා ඇති කියලා මට තේරුම් ගියා.

"එයාව පරිස්සම් කරනවා කියලා ඔයා පොරොන්දු වුණා," නිකෝ කිවුවා.

එයා මට මළකඩ කාපු පිහියකින් ඇන්නා නම් ඊට වඩා හොඳයි. මම දුන් පොරොන්දුව ගැන මට සිහි කර දෙනවා තරම් ඒක රිදෙන්නේ නැති වෙයි.

"නිකෝ," මම කතා කළා. "මම උත්සාහ කළා. ඒත් බියන්කා අපිව බේරගන්න එයාගේ ජීවිතේ කැප කළා. මම එයාට එහෙම කරන්න එපා කිවුවා. ඒත් එයා-"

"ඔයා පොරොන්දු වුණා!"

එයා රතු වුණ ඇස්වලින් මට රවා බැලුවා. එයාගේ චූටි අත දේව ප්‍රතිමාව වටේ තද වුණා.

"මං ඔයාව විශ්වාස කරන්නැතුව ඉන්න තිබ්බෙ," එයාගේ කටහඬ බිඳුණා. "ඔයා මට බොරු කිවුවා. මම දැකපු නරක හීන හරි!"

"පොඩ්ඩක් ඉන්න. මොන නරක හීන ද?"

එයා දේව ප්‍රතිමාව බිමට දමා ගැසුවා. එය මිදුණු කිරි ගරුඬ මත තදින් වැදුණා. "මං ඔයාට වෛර කරනවා!"

"සමහරවිට එයා තවමත් පණ පිටින් ඇති," මම බලාපොරොත්තු රහිතව කිවුවා. "මම හරියටම දන්නෙ නැහැ-"

"එයා මැරිලා." නිකෝ ඇස් වසාගත්තා. එයාගේ මුළු ඇඟම කේන්තියෙන් ගැහෙන්න ගත්තා. "මට ඒක කලින් ම තේරුම් ගන්නයි තිබුණේ. එයා ඇස්ෆොඩෙල් යායේ විනිශ්චයකාරයෝ ඉස්සරහ හිටගෙන, තීන්දුවක් ලැබෙනකල් බලන් ඉන්නවා. මට ඒක දැනෙනවා."

"මොකක්ද ඔයා කිවුවේ, ඔයාට ඒක දැනෙනවා කියලා?"

එයාට උත්තර දෙන්න ඉඩක් ලැබෙන්න කලින්, මට පිටුපසින් අලුත් හඬක් ඇසුණා. මම ඕනෑවටත් වඩා හොඳට හඳුනන පිඹින, දත් ඇඳි එකට වදින හඬක්.

මම කඩුව ඇද ගනිද්දී නිකෝ හීල්ලුවා. අනෙක් පැත්තට වේගයෙන් හැරුණු මට ඇටසැකිලි සෙබළු හතර දෙනෙකුට මුහුණ දෙන්න සිදු වුණා.

මස් නැති මුහුණවලින් දත් නියවූ උන් කඩු මානාගෙන ඉදිරියට එන්න ගත්තා. උන් කඳවුර ඇතුළට කොහොම ආව ද මට හිතාගන්න බැරි වුණා, ඒත් දැන් ඒකෙන් වැඩක් නැහැ. මට වේලාවට උදවු ගෙන්වා ගන්න කොහෙත්ම ඉඩක් නැති වෙයි.

"ඔයා හදන්නේ මාව මරන්න!" නිකෝ බෙරිහන් දුන්නා. " ඔයා ද මේ... මේ මෙවුන්ව අරන් ආවේ?"

"නෑ! මං කිවුවේ, ඔව්, උන් මගේ පස්සෙන් ආවේ, ඒත් නෑ! නිකෝ, දුවන්න. උන්ව විනාශ කරන්න බැහැ."

"මං ඔයාව විශ්වාස කරන්නෙ නෑ!"

පළවෙනි ඇටසැකිලි සෙබළා පහර දෙන්න පැන්නා. මම ඌගේ කඩුවට ගසා පැත්තකට විසි කර දැමුවා, ඒත් තව තුන්දෙනෙක්



නොනවත්වා එමින් සිටියා. මම එකෙක්ව දෙකට කපා දැමුවා, ඒත් එසැණින්ම ඌව ආපහු එකට ගෙතෙන්න පටන් ගත්තා. මම තවෙකෙකුගේ බෙල්ල කපා දැමුවත් ඌ නොනවත්වා සටන් කළා.

"දුවන්න, නිකෝ!" මම මොර දුන්නා. "උදවු අරන් එන්න!"

"නෑ!" එයා අත් කන් දෙකට තද කර ගත්තා.

මට එකවර හතර දෙනෙක්ට විරුද්ධව සටන් කරන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. උන් මැරෙන්නේ නැත්නම් එහෙම කරන්නේ කොහොමද? මම කපමින්, කොටමින්, කැරකෙමින්, පාරවල් වළක්වමින් පෙරළා පහර දුන්නා. ඒත් උන් දිගින් දිගටම ඉදිරියට ආවා. තවත් තත්පර ගාණකින් මේ පිල්ලි මාව විනාශ කරලා දමාවි.

"නෑ!" නිකෝ මහ හඬින් කෑගැසුවා. "යනවල්ලා යන්ඩ!"

මගේ දෙපතුල්වලට යටින් පොළොව ගිගුරුවා. ඇටකෝට්ටෝ ගල් ගැහුණා. සෙබළු හතරදෙනාගේ පාමුල පැළුමක් විවර වෙද්දිම මම පැත්තකට පෙරළුණා. කටක් ඇරෙනවා වගේ පොළොව වේගයෙන් දෙබෑ වුණා. විවරයෙන් ඉහළට ගිනි දළු මතුවුණා. එක 'කරස්!' හඬක් එක්ක ඇටකෝට්ටෝ හතර දෙනාව පොළොව ගිල ගත්තා.

සියල්ල නිහඬ වුණා.

මණ්ඩපයේ ඇටසැකිලි සෙබළු සිටගෙන සිටි තැන කිරි ගරුඬ පොළොව මත අඩි විස්සක් දිග පැල්ලමක් ඉතිරිව තිබුණා. ඒ ඇරෙන්න එතැන සෙබළුන්ගේ වෙන කිසිම ලකුණක් ඉතිරිව තිබුණේ නැහැ.

පුදුමයෙන් ගල් ගැසී මම නිකෝ දිහා බැලුවා. "ඔයා කොහොමද-"

"යනවා යන්ඩ!" එයා මොර දුන්නා. "මට ඔයාව පේන්ඩ බැහැ! ඔයත් මැරුණා නම් හොඳයි!"

පොළොව මාවත් ගිල ගත්තේ නම් නැහැ, ඒත් නිකෝ පඩි පෙළ පහළටත්, එතැනින් කැලය දිහාවටත් දිවුවා.

බියන්කා නිකෝට දෙන්න කහළ ගොඩෙන් ගත් දේව ප්‍රතිමාව මම අහුලා ගත්තා. *'එයා ළඟ නැත්තේ මේ පිළිමේ විතරයි,'* බියන්කා කිවුවේ එහෙමයි. නිකෝට, එයාගේ අක්කාගෙන් ලැබුණු අන්තිම තෑග්ග.

මම ඒක දිහා බයවෙලා බලා සිටියේ එහි මුහුණ හුරු පුරුදු ලෙස දැනුණේ ඇයි කියලා දැන් මට තේරුණ නිසයි. මම මීට කලින්

Scanned with CamScanner

ඒක දැකලා තිබුණා. ඒ ප්‍රතිමාවේ සිටියේ හේඩීස්, මරණයට අධිපති දෙවියා.

★★★

ඇනබෙත් සහ ග්‍රෝවර් එක්ක එකතු වෙලා මම පැය ගාණක් කැලෑව සෝදිසි කළත්, නිකෝ ඩී ආන්ජෙලෝගේ කිසිම සලකුණක් හොයාගන්න බැරි වුණා.

"අපිට කයිරොන්ට කියන්න වෙනවා," ඇනබෙත් කිවුවේ අමාරුවෙන් හුස්ම ගනිමින්.

"නෑ," මම කිවුවා.

එයයි ග්‍රෝවරුයි දෙන්නම පුදුමයෙන් මගේ දිහා බැලුවා.

"මේ," ග්‍රෝවර් කිවුවේ කලබලෙන්. "ඇයි ඔයා... නෑ කිවුවේ?"

මමත් උත්සාහ කරමින් සිටියේ මම එහෙම කිවුවේ ඇයි කියලා තේරුම් ගන්නයි, ඒත් මගේ වචන ඉබේම එළියට පැන්නා. ''අපිට වෙන කාටවත් දැනගන්න ඉඩ දෙන්න බැහැ. මං හිතන්නෙ නැහැ කාටවත් තේරිලා ඇති කියලා නිකෝ කියන්නේ-"

"හේඩීස්ගේ පුතෙක් කියලා," ඇනබෙත් කිවුවා. "පර්සි, මේක කොච්චර බරපතළ දෙයක් ද කියලා ඔයාට අදහසක්වත් තියෙනව ද? හේඩීසුත්, එයාගේ දිවුරුම කඩලා! මේක නම් හරිම දරුණුයි!"

"මම නම් එහෙම හිතන්නෙ නැහැ," මම කිවුවා. "හේඩීස් දිවුරුම කඩලා කියලා මම හිතන්නෑ!"

"මොකක්?"

"එයාලගේ තාත්තා එයා තමයි," මම කිවුවා. "ඒත් බියන්කායි, නිකෝයි සෑහෙන කාලයක් හිටියේ සාමාන්‍ය ලෝකයෙන් ඈත් වෙලා, දෙවෙනි ලෝක යුද්දෙ පටන් ගන්නත් කලින් ඉඳලම."

"ලෝටස් කැස්නෝ එක!" කියූ ග්‍රෝවර්, අපි ගවේෂණයට යන අතරේ දී බියන්කා සමග කළ කතාබහ ගැන ඇනබෙත්ට විස්තර කළා. "එයයි, නිකෝයි අවුරුදු හැට හැත්තෑ ගාණක් ඒක ඇතුළෙ හිරවෙලා ඉඳලා තියෙන්නේ. එයාලා ඉපදිලා තියෙන්නේ ඔය දිවුරුම දෙන්නත් කලින්."

මම ඔළුව වැනුවා.



"ඒත් එයාලා කොහොමද ඒකෙන් එළියට ආවේ?" ඇනබෙත් එයට විරුද්ධව අදහසක් පෑවා.

"මං දන්නෙ නැහැ," මම පිළිගත්තා. "බියන්කා කිවුවා නීතිඥයෙක් ඇවිල්ලා එයාලව එතැනින් එළියට අරගෙන, වෙස්ටෝවර් හෝල්වලට එක්ක ගියා කියලා. ඒ කෙනා කවුද කියලවත්, එහෙම කළේ ඇයි කියන්නවත් මං දන්නේ නැහැ. සමහරවිට ඒකත් මේ මහා කැලඹීමේ කොටසක් වෙන්න ඇති. ඒ කෙනාව නිකෝ දන්නවා ඇති කියලා මම නම් හිතන්නෙ නැහැ. ඒත් අපිට මේ ගැන වෙන කාටවත් කියන්න බැහැ. අඩු තරමේ කයිරොන්ටවත්. මේ ගැන ඔලිම්පියානුවෝ දැන ගත්තොත්-"

"එතකොට ආයෙමත් එයාලා අතරේ රණ්ඩු සරුවල් කරගන්න පටන් ගනියි," ඇනබෙත් කිවුවා. "ඒක තමයි මේ වෙලාවේ අපිට උවමනා අන්තිම දේ."

ග්‍රෝවර් බලා සිටියේ කරදරෙන් වගෙයි. "ඒත් ඔයාට මේ වගේ දේවල් දෙවිවරුන්ගෙන් හංගලා තියාගන්න බැහැ. හැමදාටම ඒක කරන්න බැහැ."

"මට හැමදාටම එහෙම කරන්න ඕනෑ නැහැ," මම කිවුවා. ''අවුරුදු දෙකකට විතරයි. මට අවුරුදු දාසය ලබනකල් විතරයි."

ඇනබෙත් සුදුමැලි වුණා. "ඒත්, පර්සි, මේකේ තේරුම අනාවැකියේ කියවෙන කෙනා ඔයා නොවෙන්නත් පුළුවන් කියන එක නේ. ඒක නිකෝ ගැන වෙන්නත් පුළුවන්. අපිට සිද්ධ වෙනවා-"

"නෑ" මම කිවුවා. "මම අනාවැකිය තෝරාගන්නවා. ඒකේ කියවෙන කෙනා මම වෙයි."

"ඇයි ඔයා එහෙම කියන්නේ?" එයා කෑගැසුවා. "ඔයාට මුළු ලෝකෙටම වග කියන කෙනා වෙන්න ඕනෑ ද?"

මට උවමනා කළ අන්තිම දේ ඒක වුණත්, මම ඒ බව කිවුවේ නැහැ. මට ඉදිරිපත් වෙලා, ඒකට හිමිකම් කියන්න වෙන බව මම දැන සිටියා.

"නිකෝව තවත් අනතුරේ වැටෙන්න අරින්න මට බැහැ," මම කිවුවා. "මම ඒ තරමට එයාගේ අක්කට ණයයි. මම... ඒ දෙන්නටම වැටෙන්න ඇරියා. අර අසරණ ළමයට තවත් විඳවන්න මම ඉඩ තියන්නෑ."

"ඔයාට වෛර කරන, ඔයා මැරෙනවා දකින්න කැමති අසරණ ළමයා," ග්‍රෝවර් මට සිහිපත් කළා.

"සමහරවිට අපිට එයාව හොයාගන්න පුළුවන් වෙයි," මම කිවුවා. "හැම දෙයක්ම හරියයි කියලා එයාට තේරුම් කරලා දීලා, එයාව පරිස්සම් තැනක හංගන්න අපිට පුළුවන් වෙයි."

ඇනබෙත් වෙවුලුවා. "බැරි වෙලාවත් ලූක්ගේ අතට එයාව ගියොත්-"

"ලූක්ට එච්චර දෙයක් ලැබෙන්නෙ නැහැ," මම කිවුවා. "එයාට කරදර වෙන්න ඊට වඩා දේවල් දෙන්න මම වගබලා ගන්නම්. ඒ කියන්නේ, මාව."

★★★

ඇනබෙත් කිවුව කතන්දරේ කයිරොන් විශ්වාස කළා ද මට සහතික නැහැ. නිකෝගේ අතුරුදහන් වීම ගැන අපි නොකියන දෙයක් තියෙනවා කියලා එයාට තේරෙන්න ඇති. ඒ කොහොම වුණත් අන්තිමේ දී, එයා ඒක පිළිගත්තා. අවාසනාවකට, අතුරුදහන් වුණ මුල්ම අර්ධ-ලෝහිතයා නිකෝ නෙවෙයි.

"කොච්චර පොඩියි ද," ඉදිරිපස පියස්සේ අත්වැට උඩ දෑත් තබාගෙන සිටි කයිරොන් සුසුමක් හෙළුවා. "අප්පොච්චියේ, එයාව රාක්ෂයෝ කෑවා නම් හොඳයි කියලා මට හිතෙනවා. ටයිටන්ලගේ හමුදාවට බඳවා ගන්නවට වඩා එහෙම වෙන එක හොඳයි."

ඒ අදහස මාව ගොඩාක් කලබල කළා. හිත වෙනස් කරගෙන කයිරොන්ට ඇත්ත කියන්න මට හිතුණත්, මම එහෙම කළේ නැහැ.

"උන් මුලින්ම මෙහෙට ගහන්න එයි කියලා ඔයා ඇත්තටම හිතනව ද?" මම ඇසුවා.

කයිරොන් කඳු මතට වැටෙන හිම දිහා බලා සිටියා. පයින් ගහේ මකර රැකවලාගේ දුමත්, ඈතින් දිලිසෙන රන් සළුවත් මට දැකගන්න ලැබුණා.

"අඩු ගාණේ, ගිම්හානෙට කලින් ඒක සිද්ධ වෙන එකක් නැහැ," කයිරොන් කිවුවා. "මේ ශීත කාලේ ගොඩක් දරුණු වෙයි... සියවස් ගාණකින් ඇති වුණ දරුණුම එක වෙයි. ඔයා ගෙදර යන එක තමයි හොඳම වැඩේ, පර්සි, ඉස්කෝලෙ වැඩ ගැන හිතන්න. ඒ වගේම විවේක ගන්න. ඔයාට විවේකය ඕනෑ වෙයි."



මම ඇනබෙත් දිහා බැලුවා. "එතකොට ඔයා?"

එයාගේ කම්මුල් රතු වුණා. "අන්තිමේ දී මම සැන් ෆ්‍රැන්සිස්කෝවල ඉන්න උත්සාහ කරන්නයි යන්නේ. සමහරවිට මට පුළුවන් වෙයි ටයිටන්ලා වෙන මොනවත් කරන්න දඟලනව ද කියලා දැනගන්න ටැම් කන්ද දිහාට ඇහැ ගහගෙන ඉන්න."

"මොකක් හරි අවුලක් වුණොත් ඔයා අයිරිස්-මැසේජ් එකක් එවනවා නේ?"

එයා ඔළුව වැනුවා. "ඒත් මං හිතන්නේ කයිරොන් හරි. ගිම්හානේ වෙනකල් මුකුත් වෙන්නෙ නැති වෙයි. ලූක්ට, එයාගේ ශක්තිය ආපහු ලබාගන්න කාලයක් ඕනෑ වෙයි."

ඒ තරම් කාලයක් බලාගෙන ඉන්නවා කියන අදහසට මම කැමති වුණේ නම් නැහැ. ඒත් ඒ වගේම, ඊළඟ අගෝස්තුවට මට පහළොව ලබනවා. දාසයට ඒ තරම් ළං වෙනවා කියලා මට හිතන්නවත් ඕනෑ වුණේ නැහැ.

"හරි එහෙනම්," මම කිවුවා. "පරිස්සමෙන් ඉන්න. ඒ වගේම සොප්විත් කැමල් එකෙන් පිස්සු චණ්ඩි වැඩ කරන්න එහෙම යන්නෙපා."

එයා අස්ථිර හිනාවක් පෑවා. "හරි. එතකොට, පර්සි-"

එයා කියන්න ගිය දේ මොකක් වුණත් ටින් කෑන්වල හැප්පි වැටෙමින් මහ ගෙදරින් පිටට දුව ආ ග්‍රෝවර්ගෙන් ඒකට බාධා වුණා. ග්‍රෝවර්ගේ මුහුණ වැරිලා, සුදුමැලි වෙලා තිබුණේ හරියට අවතාරයක් දැකලා වගෙයි.

"එයා කතා කළා." ග්‍රෝවර් කෑගැසුවා.

"සන්සුන් වෙන්න, මගෙ තරුණ සැටර්," කයිරොන් කිවුවේ ඇහි බැම් අකුළමින්. "මොකක්ද ප්‍රශ්නේ?"

"මම... මම ඇතුළු සාලෙට වෙලා සිංදුවක් ගගහා හිටියේ," එයා ගොත ගැහුවා, "ඒ වගේම කෝපි බිබී. කෝපි ගොඩාක් බිබී! එතකොට එයා මගේ හිත ඇතුළේ කතා කළා!"

"කවුද?" ඇනබෙත් ප්‍රශ්න කළා.

"පෑන්!" ග්‍රෝවර් විලාප දුන්නා. "වනාන්තරයට අධිපති. මට එයාව ඇහුණා! මම... මම සූට්කේස් එකක් හොයාගන්න ඕනෑ."

"හෝව්, හෝව්, හෝව්," මම කිව්වා. "එයා මොනවද කිව්වේ?"

ග්‍රෝවර් මගේ දිහා ඇස් ලොකු කරගෙන බලා සිටියා. "වචන හතරක් විතරයි. එයා කිව්වේ, '*මම නුඹව බලාපොරොත්තු වෙනවා...*'"

★★★

කඳවුරේ යුද ක්‍රීඩාවල යෙදෙන අතරේ දී අහම්බයෙන් වළක් තුළට ඇද වැටෙන පර්සි ජැක්සන්ට සහ ඇනබෙත් චේස්ට සොයා ගැනීමට ලැබෙන්නේ කුමක් ද? කඳවුර විනාශ කිරීමට ලූක් ගන්නා අලුත්ම උත්සහය වැළැක්වීමට ඔවුන්ට කරන්න සිදු වන්නේ මොනවා ද? ඔරැකල්ගේ අනාවැකියේ කියවෙන මළ ගිය ඇත්තා, ද්‍රෝහියා සහ නැති වූ තැනැත්තා කවුරුන් ද?

මේ ප්‍රශ්නවලට පිළිතුරු දැනගන්න 'පර්සි ජැක්සන් සහ වංගගිරියේ සටන' පොතෙන් ළඟදීම හමුවෙමු.

Scanned with CamScanner

"ඔෆියොටෝරස්," මම කිව්වා. "ඌව කඳවුරට ගෙනියන්න ඔයාට පුළුවන් ද?"

මිස්ටර් ඩී නහය ඉහළට ඇද්දා. "මං පශු සම්පත් ප්‍රවාහනය කරන්නෑ. ඒක ඔයාලගේ ප්‍රශ්නයක්."

"ඒත් අපි කොහෙද යන්නේ?"

ඩයනයිසියස් ෂෙසා්යි දිහා බැලුවා. "ඔහ්, මං හිතන්නෙ දඩයක්කාරි ඒක දන්නවා. ඔයාලා ඉර බහින වෙලාවට ඇතුළු වෙන්න ඕනෑ, ඔයා දන්නවා නේ. නැත්නම් ඔක්කොම වතුරේ. එහෙනම්, සුබ ගමන්. මගේ පිසා එක සීතල වෙනවා."

"මිස්ටර් ඩී," මම කතා කළා.

එයා ඇහි බැමක් එසෙව්වා.

"ඔයා මගේ නම හරියට කියලා මට කතා කළා," මම කිව්වා. "ඔයා මට පර්සි ජැක්සන් කියලා කතා කළා."

"මං කොහෙත්ම එහෙම කළේ නැහැ, පීටර් ජොන්සන්. දැන් යනවලා!"

එයා අතක් වනද්දි එයාගේ රුව ඇඳි තිබුණු මීදුම විසිරුණා.

මැන්ටිකෝර්යාගේ දාසයෝ තවමත් සිටියේ පිස්සු නටමින්. එයාලගෙන් කෙනෙකුට අපේ යාළු යාචකයාව මුණ ගැහිලා, ඒ දෙන්නා අගහරුගෙන් ගොඩ බැස්ස යකඩ දූතයෝ ගැන බරපතළ සාකච්ඡාවක් කරමින් සිටියා. අනෙක් අය සත්තු වගේ සද්ද කරමින්, සංචාරකයන්ගේ සපත්තු හොරකම් කරන්න දඟලමින්, සංචාරකයින්ට අඩන්තේට්ටම් කරමින් සිටියා.

මම ෂෙසා්යි දිහා බැලුවා. "එයා මොකක්ද කිව්වේ... යන්න ඕනෑ තැන ඔයා දන්නවා කියලා?"

එයාගේ මූණත් මීදුමේ පාටට හැරුණා. එයා මුහුදු බොක්ක හරහා ගෝල්ඩන් ගේට් පාලමෙන් එපිටට අත දිගු කර පෙන්වූවා. දුර ඈත වලාකුළු තට්ටුවක් මැදින් ඉහළ නැගුණු කඳු ගැටයක් පෙනුණා.

"මගේ සහෝදරියන්ගේ උයන," එයා කිව්වා. "මට ගෙදර යන්න වෙනවා."

# 16
# අපිට සදාකාලික කට ගඳ මකරා මුණ ගැසුණා

"අපිට ඒක කරන්න බැරි වෙයි," ෂෙසා්යි කිව්වා. "අපි යන්නෙ ගොඩක් හෙමින්. ඒත් අපිට ඔෆියොටෝරස්ව දාලා යන්නත් බැහැ."

"උම්බෑ..!" බෙසී කිව්වා. අපි ජල තීරය දිගේ දුවද්දි එයා මට සමාන්තරව පිහිනා ආවා. ඒ වෙද්දි අපි සාප්පු සංකීර්ණය ඇති ජැටිය පසු කර ගොඩක් දුර ඇවිත් තිබුණා. අපි ගෝල්ඩන් ගේට් පාලම දෙසට යන්න පටන් ගෙන තිබුණත්, ඒක තිබුණේ මම හිතුවට වඩා ගොඩාක් දුරින්. දැනටමත් ඉර බටහිර අහසේ පල්ලම් බහින්න පටන් ගෙන තිබුණා.

"මට තේරෙන්නෑ," මම කිව්වා. "ඇයි අපි ඉර බහිද්දි එහෙට යන්න ඕනෑ?"

"හෙස්පෙරිඩීස්ලා කියන්නේ ඉර බැසීමට අධිපති අප්සරාවියෝ," ෂෙසා්යි කිව්වා. "අපිට එයාලගේ උයනට ඇතුළු වෙන්න ලැබෙන්නේ දහවල රැයට හැරෙද්දි විතරයි."

"අපිට ඒ වෙලාව මග ඇරුනොත්?"

"දක්ෂිණායනය හෙට. අපිට අද ඉර බහින වෙලාව මග ඇරුනොත් හෙට හවස් වෙනකල් බලන් ඉන්න වෙනවා. ඒ වෙද්දි